# දෙනා විහර වත

## අනුරාධපුර ජේතවන විහාරයේ

## ඉතිහාසය හා වාස්තුවිද්‍යාව

කතෘගේ වෙනත් කෘති

- ශ්‍රී ලංකා සංස්කෘතියේ මුල් පියසටහන්- 2006
- මූලික කැනීම් ක්‍රම - 2008
- ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණය හා සම්පත් පරිහරණය - 2008
- පුරාවිද්‍යා ගවේෂණ කැනීම් හා කාල නීර්ණ ක්‍රම- 2015
- අනුරාධපුර දීඝ පාෂාණය ආශ්‍රිත මානව ජනාවසකරණය - 2016
- උරුම කළමනාකරණ ප්‍රවේශය - 2016
- අනුරාධපුර උරුමය නරඹමු - 2016
- පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය - 2017
- පුරාණ මැටිබඳුන් නිර්මාණ තාක්ෂණය හා ජේතවන විහාරය ආශ්‍රිතව හමුවන මැටිබඳුන් නිර්මාණය - 2017
- මධ්‍ය යාන් ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව - 2017
- මධ්‍ය දැදුරු ඔය හා මී ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව - 2019
- පුරාණ අනුරාධපුර සංස්කෘතික විකාශය හා භූ දර්ශනය - 2019
- ප්‍රාග් ඉතිහාසය සහ ශිලා මෙවලම් තාක්ෂණය - 2020
- ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික අවධියේ සංස්කෘතික විවිධතා හා ශවෝපචාර ක්‍රම - 2020
- ප්‍රාග් ඓතිහාසික සත්ව අස්ථි හා ශිලා මෙවලම් විශ්ලේෂණය - 2020



# දෙනා විහර වත

## අනුරාධපුර ජේතවන විහාරයේ ඉතිහාසය හා වාස්තුවිද්‍යාව

ඩී. තුසිත මැන්දිස්

ප්‍රථම මුද්‍රණය: 2021

දෙනා විහාර වත

© ඩී. තුසිත මෙන්දිස්

ISBN 978-955-42680-3-6

කවර නිර්මාණය:
ජයන්ත මල්ලිකාරත්න

පරිගණක පිටු සැකසුම :
වරුණ/මහේෂිකා

ප්‍රකාශනය

කතෘ ප්‍රකාශන



## පිදුම!

*අනුරාධපුර ජේතවන විහාරයේ*
*වැළලී ගිය ඉතිහාසය නැවත මතුකර ගැනීම සඳහා*
*පර්යේෂණ දායකත්වය දැක් වූ පර්යේෂකයින් සැමට*
*මෙම ග්‍රන්ථය පුදකරමි.*

# හැඳින්වීම

අනුරාධපුර ජේතවනාරාම විහාරය මහායාන මතවාදය පෙරටු කර නිර්මාණය වූ මහා විහාර සම්ප්‍රදායේ සංඝාරාමයකි. මූලාශ්‍රයගත තොරතුරු අනුව නන්දන උයන මූලික කරගෙන නිර්මාණය කර තිබූ මෙම විහාරය පිළිබඳ විවිධ උගතුන් පොත්පත් රාශියක් මේ වන විට රචනා කර තිබේ. ජේතවන විහාරය හා එහි ඉතිහාසය සම්බන්ධ යෙන් පුළුල් ව අධ්‍යයනය කර රචනා කරන ලද ග්‍රන්ථයක් මෙතෙක් ලියවී නොමැති බැවින් ඒ පිළිබඳ තොරතුරු ඇතුළත් ව මෙම ග්‍රන්ථය රචනා කර තිබේ.

විශේෂයෙන් ම වසර 15 ක පමණ කාලයක් මා ජේතවන ව්‍යාපෘතියේ පර්යේෂණ කටයුතුවලට සම්බන්ධ වෙමින් එම භූමියේ සිදු කරන ලද පර්යේෂණ කැනීම් ඇසුරෙන් භූමියේ ඉතිහාසය හඳුනාගැනීමට දායකත්වය දක්වා තිබේ. එබැවින් එම භූමියේ මානව ජනාවාසකරණ තත්ත්වයන් පුරාවිද්‍යා කරුණු ඔස්සේ සාකච්ඡා කර තාක්ෂණික සංස්කෘතික අවධි ඇසුරෙන් ජනාවාස වර්ධනය පිළිබඳ මෙම ග්‍රන්ථයේ මුලින් සාකච්ඡා කර තිබෙන අතර මීළඟට ජේතවන විහාරයේ වාස්තුවිද්‍යා නිර්මාණ සහ ජේතවන විහාර සැලැස්ම පිළිබඳ ව සාකච්ඡා කර තිබේ.

එහිදී ආගමික හා ආගමික නොවන වාස්තුවිද්‍යා නිර්මාණ වර්ග කර ජේතවන ස්තූපය, බෝධිඝරය, පඩිමාඝරය ආදී වූ ආගමික අංගවල වර්ධනය පිළිබඳ ව සාකච්ඡා කර තිබෙන අතර එයට අමතර ව ගොඩනැගිලි අලංකරණ අංග පිළිබඳ ව ද විස්තර ඇතුළත් කර තිබේ. එබැවින් මෙතෙක් මෙම විහාරය පිළිබඳ ව රචනා කර ඇති ග්‍රන්ථවල අන්තර්ගත තොරතුරුවලට වඩා පුළුල් හා නව තොරතුරු ප්‍රමාණයක් ජේතවන විහාරයේ ඉතිහාසය හා වාස්තුවිද්‍යාව පිළිබඳ ව මෙම ග්‍රන්ථයට ඇතුළත්

කර ඇත්තේ සාමාන්‍ය ජනතාව, විශ්වවිද්‍යාල සිසුන් හා ඉතිහාසය අධ්‍යයනට ලැදි පාඨකයන්ට වැදගත් වන ලෙස බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

**මහාචාර්ය ඩී. තුසිත මැන්දිස්**

අධ්‍යයනාංශ ප්‍රධාන,පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,මිහින්තලෙ
පුරාවිද්‍යා අධ්‍යක්ෂ
අනුරාධපුර තදාශ්‍රිත ප්‍රදේශ ව්‍යාපෘතිය
මධ්‍යම සංස්කෘතික අරමුදල
2022.07.15



## පටුන

**හැඳින්වීම** vii

**පළමු වැනි පරිච්ඡේදය** 11

**ශ්‍රී ලංකාවේ භූගෝලීය හා පාරිසරික පසුබිම**

1.1 ශ්‍රී ලංකාවේ ඓතිහාසික පසුබිම 14

1.2 විහාරාරාම ආරම්භය 31

1.3 ජේතවනාරාම විහාර සංවර්ධන කටයුතුවල ඉතිහාසය 39

1.4 යටත්විජිත යුගය තුළදී ජේතවනාරාම විහාරයේ පිළිසකර කටයුතු 45

**දෙ වැනි පරිච්ඡේදය** 55

**මහා සීමාව සහ මහා විහාරයේ සීමා හඳුනාගැනීම**

2.1 ජේතවනාරාම භූමියේ ස්ථානගත වීම 63

2.2 ජේතවනාරාමයේ පුරාණ සීමාව 79

2.3. ජේතවන විහාරාරාම භූමියේ ස්තරායනය 90

2.4 ප්‍රාග් ජේතවනාරාම අවධිය 103

**තුන් වැනි පරිච්ඡේදය** 116

**මහා විහාර සැලැස්ම**

3.1 ජේතවනාරාම විහාර සැලැස්ම 126

**සිව් වැනි පරිච්ඡේදය** 156

**ජේතවනාරාම විහාරයේ වාස්තුවිද්‍යා නිර්මාණ**

4.0 ස්තූපය 157

4.1 ජේතවන ස්තූපයේ නිර්මාණ තාක්ෂණය 197
4.2 ජේතවන ස්තූපයේ මිණුම් 212
4.3 ජේතවන විහාරයේ වාස්තුවිද්‍යා නිර්මාණ පිළිබඳ අධ්‍යයනය 233
4.4 ජේතවන විහාරයේ සනීපාරක්ෂක කටයුතු 281
4.5 ජේතවන විහාරයේ ජල කළමණාකාරණ කටයුතු 288

**පස් වැනි පරිච්ඡේදය** 295

**වාස්තුවිද්‍යා නිර්මාණයන්හි අලංකරණ අංග**

5.1 සඳකඩ පහණ 295
5.2 ජේතවනාරාමයේ මුරගල් 309
5.3 කොරවක්ගල 314
5.4 ජේතවනාරාම විහාර සංකීර්ණයේ බොරදම් 320

**පරිශීලනය කරන ලද ග්‍රන්ථ හා ලිපි නාමාවලිය** 328




# ශ්‍රී ලංකාවේ භූගෝලීය හා පාරිසරික පසුබිම

කවර ප්‍රදේශයක වුව ද සංස්කෘතික භූ දර්ශනය එනම්, මිනිසුන්ගේ වාස භූමි හා ක්‍රියාකාරකම් තේරුම් ගැනීමටත් විස්තර කිරීමටත් පළමු ව ස්වාභාවික භූ දර්ශනයන්ගේ තත්ත්වය හා විකාශනය පිළිබඳ ව නිවැරදි දැනීමක් ලබාගැනීම අත්‍යවශ්‍යය (ලං..වි..ලං..ඉ..i,1964:01). මානව ඉතිහාසයේ ප්‍රගමණය සඳහා බලපාන මූලික ම සාධකවලින් එකක් නම් භූ තලයේ ස්වරූපයයි. භූ තලයේ ස්වරූපය වනාහි, ඒ ප්‍රදේශයේ භූ විද්‍යාත්මක ඉතිහාසයේ ප්‍රතිඵලයකි. කවර හෙයින් ද යත් භූ තලයේ තත්ත්වය එහි ප්‍රභවයේ තත්ත්වය ම මූල් කර ඇති හෙයිනි (එම).

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි දිවයිනකි. උත්තර අක්ෂාංශ $5^{0}$ $55^{1}$ හා $9^{0}$ $51^{1}$ ත් නැගෙනහිර දේශාංශ $79^{0}$ $41^{1}$ හා $81^{0}$ $55^{1}$ ත් අතර පිහිටන මෙම කොදෙව්ව ඉන්දීය අර්ධද්වීපයේ දකුණු කෙළවරෙන් වෙන් ව ඇත්තේ මන්නාරම් බොක්කෙන් හා පෝක් සමුද්‍ර සන්ධියෙනි (එම). වර්‍ග කි.මී. 66,000 (වර්ග සැතපුම් 25,332) ක විශාලත්වයෙන් යුත් මෙම දිවයින (Cooray,1984:49). වර්තමානයේ දී සැතපුම් 22 ක පටු සමුද්‍ර මායිමකින් ඉන්දියාවෙන් වෙන් ව තිබේ. ප්ලයිස්ටෝසීන අවධියේ සිදු වූ ග්ලැසියර හා අන්තර් ග්ලැසියර ක්‍රියාකාරකම් නිසා මේ දෙරට අතර ගොඩබිම් සබඳතා කිහිප වතාවක් ම ඇති වී නැති වී ගොස් තිබෙන අතර වසර 10,000 කට පමණ පෙර සිට එම සබඳතා මුළුමනින් ම ඇණහිට තිබේ (Bossuyt,2004: 479- 481). ලංකාව හා ඉන්දියාව අතර මෙසේ ඇති වූ ගොඩබිම් සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස ආදිතම අවධියෙහි ජීවීන්ගේ සංක්‍රමණ, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර සිදු වූ බවට සම්බන්ධ සාධක ශ්‍රී ලංකාවේ ප්ලයිස්ටෝසීන

අවධියට සම්බන්ධ පාෂාණීභූත සත්ත්ව කොටස් මගින් පැහැදිලි වන බව P.E.P. දැරණියගල පෙන්වා දී ඇත (Deraniyagala, 1958:164).

විවිධ දේශ සංචාරකයින් විසින් පුරාණයේදී මෙම දිවයින සීලන්, සෙරන්ඩිබ්, ත්‍රැප්‍රෝබේන්, සිහළ දිව ආදී නාමයන්ගෙන් හඳුන්වා තිබේ (Cooray, 1984: 49). කිලෝමීටර් 434 ක් (සැතපුම් 270 ක්) දිගින් ද කිලෝමීටර් 227 ක් (සැතපුම් 140 ක්ද) පළලින් යුත් ශ්‍රී ලංකා දිවයින භූ විෂමතා ලක්ෂණ අනුව ප්‍රධාන තැනි තුනකට බෙදේ.

❖ වෙරළබඩ තැන්න

❖ අඩ තැන්න

❖ මධ්‍යම කඳුකරය (Cooray,1984:49; ප්‍රනාන්දු,1997;6-7).

පහත රට තෙත්, පහත රට වියළි, උඩරට තෙත්, උඩරට වියළි, ශුෂ්ක යන දේශගුණික කලාපයන්ගේ සමන්විත (ප්‍රනාන්දු, 1997: 6-7) ශ්‍රී ලංකාව තුළ දහයෙන් නව කොටසක් තුළ ම දැකගත හැකි වන්නේ ප්‍රාග් කේම්බ්‍රීය යුගයට අයත් ආග්නේය හා විපරිත පාෂාණ වේ (ලං.වි.වි.ලං.ඉ.i, 1964:03). ඒ අනුව ප්‍රාග් කේම්බ්‍රීය යුගයට අයත් පාෂාණ සංස්ථාව වන,

❖ විජයානු ශ්‍රේණිය (Vijayan group)

❖ උස්භූමි ශ්‍රේණිය (High land group)

❖ දකුණු බටහිර ශ්‍රේණිය (South western group)

මෙම භූ ස්කන්ධයේ බහුතර කලාපයට ව්‍යාප්තව පවතී. (Cooray, 1984:79).



## අනුරාධපුර හා තදාශ්‍රිත ප්‍රදේශයේ භූගෝලීය හා පාරිසරික පසුබිම

අධ්‍යයනයට අදාළ ජේතවනාරාම විහාර සංකීර්ණය පිහිටා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ විජයානු ශ්‍රේණිය නියෝජනය කරන පාෂාණ සංස්ථාවට අයත් ප්‍රදේශය තුළ ය (Cooray, 1984: 79). විජයානු ශ්‍රේණිය බයෝටයිට් හෝන්බ්ලේන්ඩ් නයිස්, චානොකයිට්, මිග්මටයිඩ් සහ ඇම්පිබෝලයිට් ඝණයට අයත් පාෂාණවලින් සෑදි තිබේ (Cooray, 1984:104; Wadia 1943:20).

කාලාන්තරයක් මුළුල්ලේ අධික ඛාදනයට භාජනය වූ ස්ඵටික පාෂාණ මණ්ඩලයක් මෙම කලාපය තුළ පිහිටන බැවින් ඛාදනයට ඔරොත්තු දෙන ගල්කුළු සහිත කඳුගැට කිහිපයක් අතුරින් පතර දක්නට ලැබේ (හෙට්ටිආරච්චි, 1970: 368). භූ විද්‍යාඥයින් පෙන්වා දී ඇත්තේ ශ්‍රී ලංකා භූමිය ස්ථායි භූ ස්කන්ධයක් සේ පවතිමින් දිගින් දිගට ම නග්නීකරණය වූ බව ය. එම නිසා විශේෂයෙන් ම උතුරු මැද පලාතේ හා ලංකාවේ සෙසු ප්‍රදේශවලත් දක්නට ලැබෙන්නේ නග්නීකරණ නිර්මාණ ලක්‍ෂතායනයන් ය (මවැවං. i: 1984).

උතුරු මැද පලාත පහත රට වියළි කලාපීය තැනිතලා ඝණයට අයත් වේ. සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය පැරන්හයිට් $80^0$ පමණ හා වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1500 ක් පමණ වේ. ඊසාන දිග මෝසම් සුළඟ සක්‍රිය වීම සමඟ අවුරුද්දේ අවසාන මාස කිහිපය තුළ උතුරු මැද පළාතට තද වැසි ඇති වේ (තම්බසියා, 1963: 19). වියළි කලාපීය වනාන්තර ඝණයට අයත් මේ ප්‍රදේශයේ ශාඛායනය පොදුවේ වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර ලෙස හඳුන්වනු ලබයි (ප්‍රනාන්දු, 1997: 17). ප්‍රදේශයට ආවේණික පස් ගොවිතැනට ඉතා හිතකර රතු දුඹුරු පසින් සැකසී ඇත (එම).

ආසියාතික ශිෂ්ඨාචාරය වැඩියක් ම ගංගා නිම්නවල ආරම්භ වූවා මෙන් ම ඒවා වියළි කලාපයට සීමා වූ බැව් පෙනේ (ලියනගමගේ, ගුණවර්ධනඃ 1965: 41). අනුරාධපුර ශිෂ්ටාචාරය ද පැන නැගුනේ ද මෙවැනි ප්‍රදේශයක ය. පැරණි නගරයට ආසන්නයේ මල්වතු ඔය ගලා බසින අතර අනුරාධපුර සමයේදී,

ගංගා නිම්නවල ප්‍රධාන  නගර ඇති වීමට බලපෑවේ එය ආරක්ෂා ස්ථාන වශයෙන් පැවතීමට පරිසරයේ භූ විෂමතා ලක්ෂණ මඟින් ලැබුණු රුකුල නිසා ය (එම). විශේෂයෙන් ම අනුරාධපුර නගරය අවට ආරක්ෂා ස්ථාන ඉදිකිරීමට පහසු වන අන්දමට නගරයට බටහිරින් ස්වාභාවික ගල්කඳු වැටියක් පිහිටියේ ය (එය දීඝ පාෂාණ නමින් ව්‍යවහාර වේ). නැගෙනහිරින් ඔයේ නැම්මක් විය. ප්‍රධාන වරාය වූ මාතොට නිසා මල්වතු ඔය ඔස්සේ ගමනාගමනය පහසු වීම අනුරාධපුර ශිෂ්ඨාචාරය දිගු කලක් පැවතීමට බලපාන ලදී (එම: 44)

## 1.1 ශ්‍රී ලංකාවේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ලේඛනගත වී ඇති මූලාශ්‍ර වන දීපවංසය හා මහාවංසයේ තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ ජනාවාස ගොඩනගනු ලබනුයේ ඉන්දියාවේ ලාට දේශයේ සිට ලංකාවට පැමිණි විජය කුමාරයා විසිනි (මව,7:3-4; *Dv*,1:1). වරින් වර ඉන්දියාවේ වයඹ දිග දොරටුවෙන් එහි ඇතුළු වූ ජන කණ්ඩායම් කිහිපයක් විසින් ඉන්දියාවේ යම් යම් ප්‍රදේශවල ජනපද පිහිටුවා ගනු ලැබූ බවට සාධක ඇත. එසේම ලංකාවේ ප්‍රදේශ කිහිපයක ම ජනපද පිහිටුවා ගන්නට ඇත්තේ ඉන්දියාවේ ප්‍රදේශ කිහිපයකින් වරින්වර පැමිණි ජන කණ්ඩායම් කිහිපයක් විසින් බව උපකල්පනය කළ හැකි ය (ලියනගමගේ, ගුණවර්ධන. 1965: 45). වංසකතා තොරතුරු අනුව ලංකාවට මුලින් ම ජන කණ්ඩායමක් සංක්‍රමණය වී ඇත්තේ ක්‍රි.පූ පස් වැනි හෝ හය වැනි සියවසේ දී බව සඳහන් වේ (මව පරි, 6-7). මහාවංසයට අනුව හැඟෙතත් ඊට ප්‍රථම ලංකාවට ඉන්දියාව හරහා ජන කණ්ඩායම් පැමිණෙන්නට ඇතැයි විශ්වාස කළ හැකි ය (ලියනගමගේ, ගුණවර්ධන, 1965: 45).

ලංකාවට ඉන්දියාවෙන් පැමිණි මුල් ම සංක්‍රමණික ජනකණ්ඩායම් පිළිබඳ තොරතුරු විජය කතා පුවත මඟින් හෙළි වන්නේ ද යන්න සැක සහිත ය. එයින් පිළිබිඹු වන ක්‍රි.පූ. හය වැනි ශත වර්ෂයට පෙර කාල පරිච්ඡේදවල ද ඉන්දියානු සංක්‍රමණික



කණ්ඩායම් ලංකාවට පැමිණෙන්නට ඉඩ තිබුණි (සිරිවීර, 2001. 40). ඍග්වේද යුගයේ දී (ක්‍රි.පූ. 1500-800) ඉන්දියාවේ ගෝත්‍රයක ගමක හෝ ප්‍රදේශයක පාලනය හා යුද්ධ කටයුතු පිළිබඳ ප්‍රධානියා හැඳින්වූයේ "ග්‍රාමණී" යනුවෙනි. ග්‍රාමණී යන පදය ලංකාවේ පැරණි ම රජවරුන් විසින් භාවිත කර ඇති බව ලෙන්ලිපි හා වෙනත් සෙල්ලිපිවලින් ඔප්පු වේ (ලියනගමගේ, ගුණවර්ධන, 1965: 41). වෛදික යුගයේ දී ඉන්දියාවේ "ග්‍රාමණී" රජු යටතේ ගම්නායක තනතුරු දැරූ රජයේ නිළධාරියෙකුගේ තත්ත්වය නිරූපණය කළ ද ලංකාවේ ග්‍රාමණීවරුන්ගේ තත්ත්වය එසේ නොවීය. ඍග්වේද යුගයේ දී අවසාන භාගයේ දී ආර්ය යන ජන කණ්ඩායම ඉන්දියාවේ දකුණු දෙසට පැමිණ අවසානයේ ලංකාවට සංක්‍රමණය වන්නට ඇති අතර එසේ ලංකාවට පැමිණි පිරිස ක්‍රිස්තු පූර්ව තුන් වැනි සියවස පමණ වන විට මෙහි රජවරුන් වශයෙන් පෙනී සිටි නමුත් ඔවුන් මෙහි එන විට රැගෙන ආ "ග්‍රාමණී" තනතුරු නාමය රජ වීමෙන් පසු ව වුව ද අත් නොහළ බව ලංකාවේ ශිලාලේඛනවල සඳහන් වීමෙන් පැහැදිලි වන බව උපකල්පනය කළ හැකි ය (එම: 45). එමෙන් ම ඍග්වේද යුගයේ ඉන්දියාවේ බලවත් ම ගෝත්‍රයක් වූ එහෙත් පශ්චාත් ඓතිහාසික යුගයේ අභාවයට ගියා වූ ද "භරත" ගෝත්‍රයට අයත් වූවන් ක්‍රිස්තු පූර්ව දෙ වැනි හා පළමු වැනි ශත වර්ෂයන්හිදී ලංකාවේ විසූ බව ලෙන් ලිපිවලින් පෙනී යන බැවින් මෙම තත්ත්වය තවත් පැහැදිලි වේ.

ඈත අතීතයේ සිට ම ඉන්දියාව හා ලංකාව අතර කිට්ටු සම්බන්ධතාවයක් පැවැති බව පෙනේ. මේ සම්බන්ධය මුල දී ඇති වූයේ වෙළෙඳාම නිසා යැයි උපකල්පනය කළ හැකි ය. මහාවංසයට අනුව ලංකාවට මුලින් ම පැමිණි ජන කණ්ඩායමේ නායකයා හැටියට සඳහන් විජය කුමාරයා උතුරු ඉන්දියාවේ වෙළෙන්දෙකුගේ පුත්‍රයෙකු බව දිව්‍යාවධානයේ සඳහන් වේ (දිව්‍යඅ., 523). ෆාහියන් දේශාටන වාර්තාවේ ද දැක්වෙන්නේ ලංකාව ජනාවාස වූයේ නොයෙක් රටවලින් පැමිණි වෙළෙන්ඳන් නිසා බවය (පා.දේ.වා: 110). ඉන්දියානු වෙළෙන්ඳන් වෙළෙඳාම පිණිස ගිය රටවල් කිහිපයක ම නාමයන් මහා නිද්දේසයෙහි සඳහන් වේ. තම්බපණ්ණි දේශය ද මෙයින් එක් රටකි. ක්‍රිස්තු පූර්ව

හය වැනි සියවස පමණ සිටම ඉන්දියාව හා ලංකාව සම්බන්ධ කර වෙළෙඳ මාර්ග තුනක් තිබී ඇත. මෙයින් එක් මාර්ගයක් උතුරු ඉන්දියාවේ සිට දකුණු ඉන්දියාව හරහා රට මැදින් වැටී තිබුණ ගොඩබිම් මාර්ගයක් වූ අතර අනෙක් දෙක මුහුදු මාර්ග විය (ලියනගමගේ, ගුණවර්ධන, 1965: 47). ඉන්දියාව හරහා ලංකාවට පැමිණි ජන පිරිස් ලංකාවට ගොඩබැසීමට ඇත්තේ ලංකාවේ වයඹදිග වෙරළේ පිහිටි මාතොට හෙවත් මහාතිත්ථ නමින් යුත් වරායෙන් විය යුතු ය. ඒ බව මහාවංසයේ විජය රජුට මදුරාපුරයෙන් රැගෙන ආ බිසව ගොඩබට තොට ලෙස මාතොට සඳහන් වීමෙන් ද පැහැදිලි වේ (මව, 7: 57). කෙසේ වෙතත් මෙසේ වෙළෙඳාම පිණිස පැමිණි ජන පිරිස් කල්යාමේදී ලංකාවේ පදිංචි ව ජනපද පිහිටුවීම ආරම්භ කරන්නට ඇතැයි ලියනගමගේ හා ගුණවර්ධන පෙන්වා දී තිබේ (ලියනගමගේ, ගුණවර්ධන 1965: 65). ඔවුහු වැඩිදුරටත් පෙන්වාදෙන ආකාරයට මෙසේ ලංකාවට වරින්වර පැමිණි ජන පිරිස් ලංකාවේ උතුරු කොටස හා බටහිර ප්‍රදේශයේ ජනපද පිහිටුවා තිබේ (එම). ක්‍රිස්තු පූර්ව හත් වැනි සියවස පමණ වන විට මුළු ඉන්දියාව ම ආර්යය ජනාවාසයක් බවට පත්වී තිබුණු බව පිළිගැනේ (එම: 49). මේ වකවානුවේ දී දකුණු ඉන්දියාවට පැමිණි ආර්යයන් වාසය කළ ගඟක් හා ඒ අවට ප්‍රදේශය ක්‍රිස්තු පූර්ව සිව් වැනි හෝ පස් වැනි සියවසේ දී හැඳින්වූයේ "තාම්‍රපණ්ණි" යනුවෙනි, මහා ඇලෙක්සැන්ඩර් (ක්‍රි.පූ. 336 - 303) රජුගේ අද්මිරාල් වරයෙකු වූ ඔනිසි ක්‍රීටස්ගේ වාර්තාවේ හා චන්ද්‍රගුප්ත (ක්‍රි.පූ. 324 - 300) රජුගේ රාජසභාවේ ග්‍රීක තානාපතියෙකු වූ මෙගස්තීනිස්ගේ ඉන්ඩිකාවෙහිත් "තප්‍රොබේන්" යනුවෙන් හඳුන්වා ඇත්තේ ලංකාව වේ (එම). තප්‍රොබේන් යන්න "තාම්‍රපණ්ණි" යන වචනයෙන් තත්සම වූ ග්‍රීක වචනයකි. අශෝක රජුගේ දෙ වැනි හා දහතුන් වැනි ගිරි ලිපි දෙක ම ලංකාව හඳුන්වා ඇත්තේ "**තම්බපණ්ණි**" යනුවෙනි. ක්‍රිස්තු වර්ෂ දෙ වැනි සියවසේදී ජීවත් වූ ටොලමි තප්‍රොබේන් යනුවෙන් ලංකාව හඳුන්වා ඇත. අතීතයේ දී එය "**සිමොන්දු**" හා " **පලෙයි සිමෙන්දු**" (පාරසමුද්‍ර) නමින් හැඳින්වූ නමුත් තමන්ගේ කාලයේ දී ලංකාව "**සලෙයි**" **(සිහළ)** යන නමින් හැඳුන්වා ඇත. සිහළදීප යන්න ලංකාවට භාවිත වීමට පටන් ගන්නට ඇත්තේ



ක්‍රි.ව. පළමු වැනි හෝ දෙ වැනි සියවසේ දී බව ගුණවර්ධන හා ලියනගමගේ පෙන්වා දෙයි (එම:50). ඉන්දියාවේ නාගර්ජුණ කොණ්ඩ ප්‍රදේශයේ තිබී හමු වූ ක්‍රි.ව. තුන් වැනි සියවසට අයත් සෙල්ලිපියක "**තම්බපණ්ණි**" දීපයේ සිහළ විහාරයක් ගැන සඳහන් වෙයි. එසේ ම සමුද්‍රගුප්ත රජුගේ අලහාබාද් ප්‍රශස්තියේ ලංකාව ගැන සඳහන් වන්නේ "**සෛංහල**" (සිංහල) යන නමිනි. ලංකාව "**සිංහළ දීපය**" යන නමින් ද හැඳින්වෙන්නට කලින් "තම්බපණ්ණි" හෙවත් "තාම්‍රපණ්ණි" යන නමින් හැඳින්වූ බව පරණවිතාන ද පෙන්වාදෙන බැවින් ආර්ය යන ජන පිරිස ඉන්දියාවේ තාම්‍රපණ්ණි ප්‍රදේශයේ සිට ලංකාවට පැමිණෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

විජය පුවතින් පිළිබිඹු වන විවිධ සංක්‍රමණික ජන කණ්ඩායම් ජනාවාස ව්‍යාප්ත කරන ලද්දේ මල්වතු ඔය, කලා ඔය සහ මහවැලි ගඟ ඔස්සේ ය. මෙම ආරම්භක ජනපද **මාන්තොට, තම්බපණ්ණි, අනුරාධ, උදේනි, උරුවෙල** සහ **විජිත ග්‍රාම** යන ස්ථානයන්හි පිහිටා තිබුණි (සිරිවීර, 2001: 41). වංසකතාවලට අනුව විජයට පසු උපතිස්ස ග්‍රාමය මුල්කර ඇමතිවරු එක් වසරක් රජෙකු නැති ව රට කරවූහ. ඉක්බිති පණ්ඩුවාසුදේව, අභය, පණ්ඩුකාභය, මුටසීව යන රජවරු දේවානම්පියතිස්ස රජවන තෙක් රට පාලනය කළහ. ලංකාවේ ඓතිහාසික සම්ප්‍රදාය වර්ධනය වූයේ දේවානම්පියතිස්ස යුගයේ සිට නිසා ඊට පෙර කාල පරිච්ඡේදයේ තොරතුරු ගළපා නිර්මාණයේ දී විවිධාකාරයේ ජනප්‍රවාද සහ වෘත්තාන්ත එම තොරතුරු කෙරෙහි බලපෑවේ ය (එම: 42).

වංසකතා විස්තරවලට අනුව අනුරාධපුරය නගරයක් දක්වා සංවර්ධනය කරන ලද්දේ පණ්ඩුකාභය රජු විසිනි (මව, 10: 103, දිව., 11: 03). මහාවංස විස්තරයට අනුව අනුරාධපුර නගරය විවිධ කොටස්වලට බෙදා සකස් කළ පණ්ඩුකාභය රජ නගරවාසීන්ගේ අවශ්‍යතාවයට සරිලන පරිදි වැවක්, සුසාන භූමියක් හා ආගමික සිද්ධස්ථාන ද තැන වූ බව මහාවංසයේ සඳහන් වේ (මව, 10: 88-102). මහාවංස විස්තරය සම්පූර්ණයෙන් නිරවද්‍ය යැයි පිළිග ැනීමට උගහට වුව ද එයින් අනුරාධපුරය මුලින් ම රාජධානියක් අගනුවරක් බවට පත්කළේ පණ්ඩුකාභය රජු විසින් බව පැහැදිලි වේ. මින් කලකට පසු ව රජ පැමිණි දේවානම්පියතිස්ස රජුට

වංසකතාවන්හි වැදගත් තැනක් ලැබෙන්නේ ඔහුගේ සමයේ දී ලක්දිවට මිහිඳු හිමියන් පැමිණි බැවිනි (ලියනගමගේ, ගුණවර්ධන 1965: 64). ඒ සමඟ ම ඇතිවන සංස්කෘතික ආගමික හා දේශපාලන ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ අගනුවරක් වශයෙන් ක්‍රි.ව. දස වැනි සියවස අවසාන භාගය දක්වා අනුරාධපුරය පැවති බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

ලංකාවෙහි ඉතිහාසය රචනා කළ හා පවත්වාගෙන ගිය ගිහි පැවිදි විද්වත්හු ලංකා දිවයිනේ ජනයා පදිංචිවීම පිළිබඳ සඳහන් කර ඇත්තේ උතුරු ඉන්දීය ජන කණ්ඩායම් මෙරටට පැමිණ පැළපදියම් වීමට සමපාත ව ය. මහාවංසයේ ලිඛිත ඉතිහාසය පෙළ ගැස්සීම තිරස් හා සිරස් යන තල දෙකකින් ම ක්‍රියාත්මක කර තිබෙන බව පෙනේ. එයින් සිරස් තලයේදී බුදුන් වහන්සේත්, උන්වහන්සේ මේ කොදෙව්වට වැඩම කර ලංකාව ශුද්ධ භූමියක් කිරීමත් ඉන් අනතුරු ව බුදුන් වහන්සේගේ පිරිනිවන් දා විජය ඇතුළු පිරිස පැමිණ ලංකාවේ ජනාවාස පිහිටුවීමත් සටහන් කර තිරස් තලය ඉංදියාවට සම්බන්ධ කර ආරම්භ කරමින් ශ්‍රී ලංකාවේ රාජ පරම්පරාවේ ඉතිහාසය විජය, වාසුදේව, අභය, පණ්ඩුකාභය, මුටසීව, දේවානම්පියතිස්ස, සද්ධාතිස්ස ආදි ලෙස විකාශනය වීම දක්වා තිබේ. මේ නිසා ම ලිඛිත ඉතිහාස සීමාවෙන් ඔබ්බෙහි වූ අප රටේ නිවැරදි ඉතිහාසය මහාවංසය ඇතුළු ලිඛිත මූලාශ්‍රයවල සංග්‍රහගත වී තිබේ දැයි මේ වන විට හමුවී ඇති පුරාවිද්‍යා සාධක නිසා ද ගැටළු පැන නැගී තිබේ. එසේ හෙයින් අපේ රටේ ඉතිහාසයේ නිවරදි අර්ථකථනයන් සොයා යෑමේ දී සාහිත්‍යමය ප්‍රභවයන්ට වඩා වැඩි ප්‍රමාණයක් කරුණු පුරාවිද්‍යාත්මක ප්‍රභවයන් තුළින් අනාවරණය කරගෙන තිබේ.

ශ්‍රී ලංකාවේ අතීතය සොයාගෙන අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය දක්නට ලැබෙනුයේ යටත්විජිත සමය තුළ හා පශ්චාත් යටත්විජිත සමය තුළ ය. දහනව වැනි සියවස අග හා විසි වැනි සියවස මුලදී ඇති වන මේ ආකල්පමය වෙනසට පසුබිම සැකසෙනුයේ යුරෝපයේ ක්‍රියාත්මක වූ සම්භාව්‍ය කලාවේ ගුරුකුල තුළ වූ අධිරාජ්‍යවාදි සංකල්පමය දෘෂ්ඨිකෝණය බව පෙනේ. විශේෂයෙන් දකුණු ආසියාතික කලාපයේ ඓතිහාසික ලිඛිත මූලාශ්‍රය උපයෝගී කර ගෙන යුරෝපීයයින් විසින් ඒ ඒ



රටවල ඉතිහාසය අධ්‍යයනය කරනු ලැබූ අතර යුරෝපය තුළ ඓතිහාසික කරුණු පදනමින් ඇරඹුණු කැනීම් මඟින් ට්‍රෝයි පුරවරය ඉලියඩ් හා ඔඩිසි කාව්‍යය ඇසුරින් මතුකර ගැනීම ද මෙයට තවත් නිදසුනකි. මේ තත්ත්වය මත ආසියාවේ රටවල තිබූ ලේඛනගත මූලාශ්‍රය ඔස්සේ මහාජාති, රාජකීය අගනුවරවල්, යෝධ වාරි ක්‍රම ආදිය පිළිබඳ ව සිත් අළලමින් විජිත පාලකයන් හා ප්‍රාචීණවේදීන් ශ්‍රී ලංකාවේ ද වීර රජ දරුවන් ඇතුළත් ආර්ථික, දේශපාලනික හා ආගමික ඉතිහාසය පිළිබඳ මත එලකර තිබේ (සෙනෙවිරත්න, 1996: 1-2).

යටත්විජිත යුගයෙන් අනතුරු ව අප රටේ ඉතිහාසය හැදෑරූ දේශීය විද්වතුන් බහු විෂයමය දෘෂ්ඨිකෝණයකින් පුරාවිද්‍යා පර්යේෂණ දියත් කිරීම සමඟ ශ්‍රී ලංකාවේ නිවරැදි ඉතිහාසය ලිඛිත මූලාශ්‍රය ග්‍රන්ථවල සඳහන් තොරතුරුවලට වඩා බොහෝ ඈතට විහිදෙන බව පෙන්වා දී ඇත. ඒ අනුව ඔවුන් පෙන්වා දී ඇති වැදගත් ම කරුණ වන්නේ අප රටේ ඉතිහාසය හැදෑරීමේ දී ඒ ඒ කාල වකවානු ඇසුරින් ක්‍රියාත්මක වූ තාක්ෂණික හා සංස්කෘතික අවස්ථා හඳුනාගැනීම මඟින් ඉතිහාසයේ නිවැරදි ගමන් මග පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැකි බව ය. ඒ තත්ත්වයන් ඔස්සේ දියත් කර ඇති පර්යේෂණ දත්තයන්ට අනුව අනුරාධපුරයේ දැනට පිළිගැනෙන ඉතිහාසය පහත සඳහන් වන්නා වූ තාක්ෂණික හා සංස්කෘතික අවධිවලින් සමන්විත වේ.

1. ප්‍රාග් ඓතිහාසික යුගය (ක්‍රි.පූ. 3900-1000)
2. පූර්ව ඓතිහාසික යුගය (ක්‍රි.පූ. 1000 - 300)
3. මුල් ඓතිහාසික යුගය (ක්‍රි.පූ. 300- ක්‍රි.ව. 100)
4. මධ්‍ය ඓතිහාසික යුගය (ක්‍රි.ව. 300 - 600)
5. පශ්චාත් ඓතිහාසික යුගය (ක්‍රි.ව. 600 -1250)

(Deraniyagala, 1992:709-715). ලක්දිව ආදිතම ජන පැලපදියම් වීම පිළිබඳ ව සාකච්ඡා කිරීමේදී අප ඉතා පුළුල් අයුරින් එය විග්‍රහයට ලක්කළ යුතු ය. විශේෂයෙන් ඉන්දීය උප අර්ධද්වීපය හුදකලා කර ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීම වැදගත් නොවන බව වර්තමාන පර්යේෂණ අනුව ද පෙන්වා දී ඇත.

සිරාන් දැරණියගල පෙන්වා දී ඇති ආකාරයට ඉන්දීය භූමි භාගය තුළ අවසන් මිලියනයක කාලය තුළ මානවයින් ජීවත් වූ බවට සාධක තිබේ (Deraniyagala, 2004:03). එම කාල පරාසය තුළදී ලංකාව හා ඉන්දියාව අතර වූ මුහුදු මට්ටමේ උච්ඡාවචනයන් අනුව නිරාවරණය වූ ගොඩබිම් පාලම් (Land Bridge) ඔස්සේ ශ්‍රී ලංකා භූමි ස්කන්ධයට මානවයින් පැමිණීමට ඇතැයි උපකල්පනය කළ හැකි ය (*ibid*). කෙසේ වෙතත් දැනට සිදු කර ඇති පුරාවිද්‍යා පර්යේෂණ අනුව ශ්‍රී ලංකාවේ මුල් මානව ජනාවාස පිළිබඳ ආදිතම සාධක අදින් වසර 125,000ක් තරම් ඈතට විහිදෙන බව පිළිගත හැකි නමුත් එම ජනාවාසමය තත්ත්වයන් බොහෝ විට අදින් වසර 300,000 ක් හෝ 500,000 ක් දක්වා ඈතට විහිදිය හැකි බව සිරාන් දැරණියගල පෙන්වා දී තිබේ. (Deraniyagala,1992:686). ශ්‍රී ලංකාවේ පහළ පුරාශිලා යුගයට (Lower Palaeolithic) අයත් ගල් අවි අදින් වසර 500,000 - 1,600,000 ත් අතර කාලයකට අයත් යැයි සැළකෙන අතර ඒවා ඉතා රළු බවින් යුක්ත ය. මේ ගල් අවි යාපන අර්ධද්වීපයේ මායක්කායි ක්ෂේත්‍රයෙන් හමු වී ඇත. මේ ගල් අවි බොහෝ විට අත්පොරෝ වැනි ආයුධ නිර්මාණය කළ හෝමෝ ඉරෙක්ටස් මානවයාගේ බව සැක කළ හැකි බව අදිකාරී සහ නිමල් පෙරේරා පෙන්වා දී ඇත (අදිකාරී,2005:20, පෙරේරා,2010). ග්ලැසියර් යුෂ්ටේසීය උච්ඡාවචන චක්‍ර සහ සම්බන්ධ වර්තමාන අවධියට වසර 125,000 කට පූර්ව අවධියේ අවසාන අන්තර් භෞමික ප්‍රධාන මොනාස්ටොරියානු සංසිද්ධියට පවරන ලද පතිරාජවෙළ මූලික බොරළුවලට මග පෙන් වූ වැල්ලංග ංගොඩ බොරළු නූතන අවධියට වසර 75,000 කට පූර්ව මෑත මොනාස්ටෝරියානු සංසිද්ධියට හා සමාන සහ සම්බන්ධතාවයක් දක්වන බව දැරණියගල ගේ මතය වේ (දැරණියගල,1990:223). ඉරණමඩු පස් සැකැස්මේ (Iranamadu Formation) බොරළු ටෙසරය තුළින් සොයා ගත් මෙම ගල් අවි මධ්‍ය පුරා ශිලා යුගය (Middle Palaeolalithic) නියෝජනය කරන අතර එම කාල පරාසය නියෝජනය කළ ශ්‍රී ලාංකික මානවයා ඍජු කය සහිත මිනිසා හෙවත් හෝමෝ ඉරෙක්ටස් නමින් හඳුන්වන මානවයා බව උපකල්පනය කළ හැකි බව ගාමිණී අදිකාරී පෙන්වාදී තිබේ (අදිකාරී, 2005:21). මේ අනුව ඉහළ පුරාශිලා යුගයේ සිට මධ්‍ය



පුරාශිලා යුගය වනවිට ශ්‍රී ලාංකික භූමි ස්කන්ධය තුළ මානව ජනාවාසවීම ක්‍රියාවලියක් පිළිබඳ ව සනිටුහන් වන අතර මෙය ඉතා පුළුල් ලෙස ඉන්දීය උප අර්ධද්වීපයේ සිදු වූ ක්‍රියාවලියක ප්‍රතිච්ඡින්න පැතිකඩක් බව විශ්වාස කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ ආදීතම ජන සංස්කෘතීන්වලින් මීළඟට වැදගත් ජන සංස්කෘතියක් වශයෙන් මධ්‍ය ශිලා යුගය (Mesolithic) එසේ නැතහොත් බලංගොඩ සංස්කෘතිය ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ භූමි ස්කන්ධය පුරා ම ව්‍යාප්ත වී තිබුණ බවට පිළිගැනෙන මෙම සංස්කෘතිය අදින් වසර 40,000 කට පෙර සිට ක්‍රියාත්මක වු සංස්කෘතියක් බව හැඳිනගෙන තිබේ (Deraniyagala,1992:687; Perera,2010). මේ සංස්කෘතිය නියෝජනය කල මානවයා පිළිබඳ මානව සාධක ෆාහියන් ලෙනෙන්, බටදොඹින්, බෙලිලෙනෙන්, අළු ලෙනෙන්, බෙල්ලන්බැඳි පැලැස්සෙන් දොරවකින් අලිගලින් අනුරාධපුරයෙන් හා මාතොටින් සන්තර්පණය කරන අතර මොහු ඉතා පැහැදිලි ලෙස හෝමෝ සේපියන් සේපියන් නම් ප්‍රාග් නූතන මානවයා වශයෙන් හැඳිනගෙන තිබේ (Deraniyagala,1992-690). ෆාහියන් ලෙන, බටදොඹ ලෙන හා කිතුල්ගල නූතන අවධියට පූර්ව 47000, 37000, 29000, 16000, 12500 දින වකවානු යෙදූ සමතලවලින් පුද්ගලයින් 38 දෙනෙකුට අධික සංඛ්‍යාවකගේ යැයි සැළකිය හැකි විස්තීරණ මානව නෂ්ඨාවශේෂ පෙළක් සොයා ගෙන ඇත (දැරණියගල,1990:225, පෙරේරා,2010). බටදොඹලෙන නූතන අවධියට 29,000 කට පූර්ව යැයි ගැණෙන ස්තරවලින් හමු වූ සප්ත පුද්ගල න්‍යාය දර්ශ දකුණු ආසියාවේ ආදිතම කාය ව්‍යවච්ඡේදීය නූතන මානවයා පිළිබඳ සාක්ෂ්‍ය සංස්ථාපනය කළේ ය. මේවා පෞරාණිකත්වයෙන් ලොව කවර තැනකින් වුව ද රැස්කර ගත් සමූහ තුනකට සමාන වේ (එම). එනම් ප්‍රංශයේ ලෙස්කොටෙස් (නූතන අවධියට වසර 30,000 කට පූර්ව චෙකොස්ලෝවැකියාවේ දොල්නි වෙස්ටෝනි (නූතන අවධියට වසර 29,000 කට පූර්ව) ඊජිප්තුවේ නස්ලේට් බෙට්ස් (නූතන අවධියට වසර 31,000 කට පූර්ව) වේ. (Kennedy & Deraniyagala, 1989:394-399) මෙහි තුලනාත්මක අධ්‍යයනය බටදොඹින් නියෝජනය වූ මෙසොලිතික බලංගොඩ මානවයාගේ පටන් මෑත අවධිවල වැදි දඩයම් රැස්කරන්නා අතරතුර සහසම්බන්ධතාවයක් මානවවංශ

විද්‍යාත්මක ව (Anthropology) දැකගත හැකි බව කේ.ඒ.ආර් කෙනඩි පෙන්වාදී තිබේ (Kennedy,1986:165-265). ජනගහනය ප්‍රවාහය සළකා බලන විට මෙයින් පැහැදිලි වන්නේ මෙම අවධියේ දී ජනගහනය අමිශ්‍ර ව පැවති ඇති බව යි. විවිධාකාරයේ මිශ්‍රවීම්වලට ලක් වී විවිධ කායික ලක්ෂණවලින් සමන්විත නව ජන ගහනයක් පසු කාලයේ දී ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන තුරු බලංගොඩ මානව පරපුර දිගු කාලයක් අමිශ්‍ර ව ඒකාකාරීත්වයෙන් පැවත ආ බව පෙනෙන අතර දැනට නිගමනය කර ඇති ආකාරයට බලංගොඩ මානව පරපුරේ පිරිමියෙකු සෙ.මී. 174 ක් ද ගැහැණියක් දළ වශයෙන් සෙ.මි. 166 ක් උසින් ද යුක්ත වෙයි (Deraniyagala,1992:330-334). මෙම කරුණු මෙසේ වුවත් මෙහිදී සැළකිල්ලට ගත යුතු කරුණක් වන්නේ පුරාතන ශිලා අවධියේ සිට ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර අනිවාර්යය ජාන ප්‍රවාහයන් හුවමාරු වූ බවට සැක සිතීමට ඉඩ ලැබෙනු ඇත. මෙයින් බලංගොඩ මිනිසා එක ම වර්ගයෙන් සමන්විත සජාතීත්ව ජෛව විද්‍යාත්මක පරපුරක් ලෙස දැනට තිබෙන මතය බිඳ වැටීමට ඉඩ තිබේ. (Deraniyagala,1992:17-20).

මධ්‍ය ශිලා යුගයෙන් ඉක්බිති එළඹිය යුතු නවශිලා යුගය පිළිබඳ සාධක ශ්‍රී ලංකාව ඇසුරින් පැවති බව තීරණාත්මක ව තව ම ඔප්පු කර නැත. විශේෂයෙන් ඉන්දීය අර්ධද්වීපයේ නියොලිතික යුගයට විශේෂිත වූ ඔප දැමූ ගල් පොරෝ හා මැටි බඳුන් පිළිබඳ සාධක ශ්‍රී ලංකාව ඇසුරින් තීරණාත්මක ලෙස තව ම හමු වී නොමැත (Narasimhaiah ; Sriraman, 2004 : 204-205). නමුත් ඩබ්.එච්. විජයපාලගේ දොරවක කන්ද කැනීම් මගින් මැටි භාජන භාවිත කළ බවට සාධක ලැබෙන අතර එම සන්දර්භවලින් ම ධාන්‍ය ශේෂ ද ලැබී තිබේ (දැරණියගල, 2000). එයට අමතරව ටී.ආර්. ප්‍රේමතිලකගේ හෝර්ටන් තැන්න පර්යේෂණ මගින් වසර 13000 - 16000 කට පෙර කෘෂි කර්මාන්තය සම්බන්ධ තොරතුරු (Premathilake, 2003) ලැබීම තුළින් නව ශිලා යුගය පිළිබඳ ආලෝකයක් ලැබුණ ද ඉදිරියේ දී සිදු කරන පර්යේෂණ ඔස්සේ මේ තත්ත්වය තීරණාත්මක ව ඔප්පු කළ යුතු ව තිබේ.

ලක්දිව ඉතිහාසය තුළ මධ්‍ය ශිලා යුගයෙන් අනතුරු ව එළැඹි යුගය වශයෙන් පිළිගනු ලබන්නේ පූර්ව ඓතිහාසික යකඩ යුගය



වේ (Deraniyagala,1992:709). ශිලා යුගයේ සංස්කෘතිය අතරට ක්‍රි.පූ. 1000 දී පමණ යකඩ යුගයේ සංස්කෘතිය අර්ධ මහද්වීපික ඉන්දියාවේ දකුණු දිගින් ශ්‍රී ලංකාවට කඩා වැදුණු බව දැරණියගල හා සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදී තිබේ (Deraniyagala, 1992: සෙනෙවිරත්න,1996). නමුත් රාජ් සෝමදේවගේ මතය වන්නේ ක්‍රි.පූ. 2400 දී මෙම සංස්කෘතිය ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ ආරම්භ ව පහළ කඳුකර හා වියළි තැනිතලාවට ව්‍යාප්ත වූ බවය (Somadeva:2018 in මනමේන්ද්‍රආරච්චි හා අදිකාරී 2014 : 227). යකඩ තාක්ෂණය, සත්ත්ව ගෘහකරණය, කාල රක්තවර්ණ මැටි බඳුන් මෙන් ම කාල වර්ණ මැටි බඳුන් සම්බන්ධ පිඟන් මැටි කර්මාන්තය, පබළු නිෂ්පාදන තාක්ෂණය, සරළ කෘෂිකර්මාන්තය, මූලික ජල කළමණාකරණය, ගැමි ජනපද පිහිටුවීම, පිළිස්සීමෙන් පසු මැටි බඳුන්වල කුරුටු සලකුණු යෙදීම. මෙම සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණ බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී ඇත (සෙනෙවිරත්න, 1996:12). දැරණියගල විසින් අනුරාධපුර ඇතුළුපුර ජනාවාස ගොඩැල්ල අළලා සිදු කර ඇති පුරාවිද්‍යා කැනීම් මාලාව මඟින් ඔප්පු කර ඇත්තේ පූර්ව ඓතිහාසික යකඩ යුගයේ සංස්කෘතිය අනුරාධපුර ඇතුළු නුවර ජනාවාසය තුළට ප්‍රවිෂ්ඨ වී ඇත්තේ එවකට එහි පැවති මධ්‍ය ශිලා ජනාවාසය අතරට පැමිණීමෙන් බවයි (Deraniyagala,1992:709). ජී.පසෙල් හා කේ.රාජන් වැනි ඉංදීය විද්වත්හු පෙන්වාදෙන ආකාරයට පූර්ව ඓතිහාසික සංස්කෘතිය දකුණු ඉන්දියාව තුළ හැඩගැසී ඇත්තේ ක්‍රි.පූ 1250 තරම් ඈත වකවානුවේ දී ය (Possehl :1990; Rajan 1990). මහා සංස්කෘතියක් ලෙස ඉන්දියාවේදී හැඩ ගැසීමෙන් අනතුරු ව ක්‍රි.පූ. 1000 දී පමණ එම සංස්කෘතිය ශ්‍රී ලංකාවට කඩා වැදී තිබෙන බව දැරණියගලගේ හා සෙනවිරත්නගේ මතය උවත් ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ එම සංස්කෘතිය ශ්‍රී ලංකාවට ආවේණික ලක්‍ෂණවලින් යුක්ත බවය (Deraniyagala,1992: Senaviratne:1996) සංස්කෘතියක් ලෙස ස්ථාපිත වීමෙන් අනතුරු ව යකඩ යුගයේ සංස්කෘතිය ශ්‍රී ලංකාව පුරා ම ව්‍යාප්ත ව තිබූ බව කරෙයිනගර්, මාන්තායි, පොම්පරිප්පුව, කදිරවේලි, මාමඩුව, ගුරුගල්හින්න, අනුරාධපුර, යාපහුව පින්වැව, ගල්ගමුව අන්දර වැව, ගල්කොක් එඹේ, ජනකුඹුර, ඉබ්බන්කටුව, පදවිගම්පොළ,

තිස්සමහාරාම, රංචාමඩම, හල්දුමුමුල්ල බෙරගල කළුපහණ වත්ත ආදී ප්‍රදේශ ඇසුරින් වාර්තා වීම තුළින් පැහැදිලි වේ (Seneviratne, 1984: 223-307, මැන්දිස්ඃ2017, මැන්දිස්ඃ2019). මේ ජනාවාසවල මුල් ව්‍යාප්ත වීම දෙස බැලීමේ දී කෘෂිකර්මාන්තයට හිතකර රතුදුඹුරු පාංශු කලාපයේ ජනාවාස ස්ථානගත වීම කැපීපෙනේ (සෙනෙවිරත්න, 1996ඃ184-196).

ශ්‍රී ලංකාවේ මුල් පදිංචිකරුවන් වූ ගල් යුගයේ වැසියන් සමඟ මිශ්‍ර වූ  පූර්ව ඓතිහාසික ප්‍රජාව මූලික සබඳතා සරල හුවමාරු පද්ධතියක් ඔස්සේ ආරම්භ කළ බවට සාධක ලැබේ. ප්‍රාථමික යකඩ යුගයේ ජනාවාසවල ව්‍යාප්තිය රට අභ්‍යන්තරය තුළ ඉහළ කඳුකර කලාපයේ ක්‍රි.පූ. 2000ට පෙර ආරම්භ වී පහළ කඳුකර කලාපවලට ව්‍යාප්ත වූ බව රාජ් සෝමදේව විසින් පෙන්වාදී තිබෙන අතර සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදී ඇත්තේ මෙම ජන පිරිස වියළි කලාපයේ සිට පහත් කඳුකර කලාපයට සේන් ද වී ඇති බවය. මෙය සිදු වන්නේ ඉතා කෙටි කාලයකින් නොවන බව ඔහු පෙන්වාදෙන අතර විශේෂයෙන් කඳුකර පළාත්වල පහළ සීමාවට මේ ග්‍රාමීය සංස්කෘතිය ප්‍රවේශවීමට අඩු ම තරමින් සියවස් තුනක්වත් ගතවන්නට ඇති බව පෙන්වාදී තිබේ (එම). වෙරළබඩ ප්‍රදේශයේ සිට ගංගා නිම්න ඔස්සේ රට තුළට ප්‍රවිෂ්ඨ වූ යකඩ යුගයේ වැසියන් ක්‍රි.පූ. 7 - 4 සියවස් වන විට පහළ කඳුකර කලාපවලට සම්ප්‍රාප්ත වන බව පුරාවිද්‍යා කාලනීර්ණවලින් තහවුරු වී තිබේ.මේ ආකාරයටම මේ වැසියන් දකුණේ ඉහළ වළවේ නිම්නයටත් උතුරින් ඉහළ කලාඔය නිම්නයටත්, බටහිරින් කැළණි සහ මහ ඔය නිම්නයටත්, යාන් ඔය ඉහළ නිම්නයටත් සංක්‍රමණය වීම මීට කදිම නිදසුන් වේ (එම,186-189; මැන්දිස්ඃ 2017). පූර්ව ඓතිහාසික ප්‍රජාව ඉතා සාරවත් කෘෂි භූමි පසුකර ඉහළ කඳුකර කලාපවලට ඇදී ඒමට මූලික හේතු ව ලෙස පුරාවිද්‍යාඥයින් පෙන්වා දී ඇත්තේ සම්පත් ලබාගැනීම ය. විශේෂයෙන් ඛනිජ සම්පත් ලබාගැනීමේ මූලික පරමාර්ථයෙන් බවය (එම). මූලික ව වියළි කලාපයේ සරල කෘෂිකර්මාන්තය හා පශු පාලනය සමඟ ජීවත් වූ මේ ප්‍රජාව ජන රේඛනයේ ප්‍රසාරණය හා සම්පත්වලට ඇති ඉල්ලුම වර්ධනය වීම මත අවශ්‍ය සම්පත් සොයා පහත් තැනිතලාවල සිට රට අභ්‍යන්තරයට යොමු වීම



කැපීපෙනේ. නමුත් අප රටේ ලිඛිත ඉතිහාසය තුළ විශේෂයෙන් සම්භාව්‍යය සාහිත්‍යය ග්‍රන්ථවල මේ කඳුකර කලාප පිළිබඳ දක්වා ඇත්තේ වඩා ඇල් මැරුණු ඉතිහාසයක් හිමි භූමි ප්‍රදේශයක් ලෙස ය.

අප රටේ ඉතිහාසයේ අවධානයට ලක් නොවූ එසේ ම බොහෝ දෙනෙකු විසින් අධ්‍යයනයට භාජනය නොකරන්නා වූ ප්‍රදේශයක් එලෙස කඳුකරය පේනවා දිය හැකිය. මධ්‍යම කඳුකරය. සම්භාව්‍යය සාහිත්‍යය මූලාශ්‍රවල හඳුන්වන්නේ මලය රට්ඨය, මහා මලය රට්ඨය යනුවෙනි. කන්ද උස් භූමිය යන අරුත් දෙන මලෙයි යන ද්‍රවිඩ වචනයෙන් බිඳී ආ මලය සහස්සවස්තුවේ හඳුන්වා ඇත්තේ ගිරි මණ්ඩල යනුවෙන් බව සුදර්ශන් සෙනවිරත්න පෙන්වා දී ඇත (එම). මෙම ප්‍රදේශය අනාදිමත් සමයක සිට ශ්‍රී ලංකාවේ සුවිශේෂ භෞමික පාරිසරික ක්ෂේත්‍රයක් ලෙස ඓතිහාසික වැදගත් කමක් ඉසිලීය. සතුරු උපද්‍රව, දේශපාලන  අර්බුද, දුර්භික්ෂ ඇති වූ විට රජවරන්ට පසු බැසීමට සුදුසු රැකවරණය සහිත විකල්ප ජනාවාසයක් ලෙස කඳුකරය වැදගත් කාර්යයක් ඉටු කළ ප්‍රදේශයකි. මහාවංසයේ බුදුන්ගේ යක්ෂ දමනයෙත්, විජය පුවතේ ඔහුට දාව කුවේණිට උපන් දරුවන් පසුබැස්ස ස්ථානය වශයෙන් මලය රට හඳුන්වා ඇත. මහාවංසයේ හා සහස්සවස්තුවේ මලය රට නිවැසි ජන පිරිස් පුලින්ද, ව්‍යාධ, මිලක්ඛ, මනුස්ස උපචරක වන චරක යන්නෙන් හඳුන්වා ඇති බව සුදර්ශන් සෙනවිරත්න පෙන්වාදී තිබේ (එම,185). මහා මලය දේශය එහි විස්තර කරන්නේ මෙසේ ය. එය විශාල කඳුවලින් බහුලය. තරණය කිරීමට අපහසු රුදුරු සතුන් ජීවත් වන ප්‍රදේශයකි. එහි වසන මිනිසුන් පවා බොහෝ දුරට හුදකලා ජීවිතයක් ගත කරති. ගමන් කළ හැක්කේ අඩි පාරවල් ඔස්සේ පමණි. මිනී කන කිඹුලන් හා ගැඹුරු ජලජ ස්ථාන එහි පිහිටා තිබේ (සෙනෙවිරත්න, 1996ඃ185ත චූව.,70ඃ 3 -5).

සම්භාව්‍ය සාහිත්‍ය මූලාශ්‍රයවල එන විස්තරවලට අනුව පසුගාමී සමාජයන්ට සීමා වී තිබූ බව පවසන මධ්‍යම කඳුකරය ඇත්ත වශයෙන් ම පසුගාමී සමාජයක් වශයෙන් නො තිබුණු බව නව පුරාවිද්‍යා පර්යේෂණ අනුව මේ වන විට සනාථ කර තිබේ. කාබන් දින 14 කාල නිර්ණ අනුව උත්තර මලයරට්ඨයේ දඹුල්ල ආශ්‍රිත ප්‍රදේශයේ අර්ධ සංචාරක ජන පිරිස් ක්‍රි.පූ. 7 - 4

සියවස් පමණ දී ජනාවාස පිහිට වූ බව ඉබ්බන්කටුව ජනාවාසය හා සුසානය ආශ්‍රයෙන් පැහැදිලි වේ (එම). දඹුල්ල ප්‍රදේශය අවට ජීවත් වූ මෙම පූර්ව ඓතිහාසික වැසියන් නකල්ස් වැටිය ආශ්‍රිත ව ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා වැසියන් සමඟ මූලික සබඳතා සරල හුවමාරුවක් ඔස්සේ ආරම්භ කළ බවට පුරාවිද්‍යා සාධක ලෙස දඹුල්ල ප්‍රදේශයට ආවේණික නොවන මධ්‍යම කඳුකරයේ සම්භවය ලබන ඛණිජ හා ඇත් දතින් නිමකළ පබළු ඉබ්බන්කටුවෙන් වාර්තා වීම තුළින් මැනවින් පැහැදිලි වේ.

පූර්ව ඓතිහාසික (Proto), මුල් ඓතිහාසික (Early) පරිවර්තන සමය වන විට මේ ජන පිරිස් සම්පත් ඇති ස්ථාන වන කඳුකර කලාපයේ මාතලේ, නාලන්ද ආදී ප්‍රදේශවල ජනාවාස පිහිටුවා ගැනීම කැපීපෙනේ. මෙය ඉල්ලුමට අනුව අඛණ්ඩ අමුද්‍රව්‍ය සැපයුමක් වියළි කලාපයේ ජනාවාස සඳහා සැපයීමට සිදු වීම මත සිදු වූවක් බව සිතිය හැකි අතර මැණික් ගල් ඇතුළු ඛනිජ පාෂාණ ලබාගැනීම උදෙසා ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ වන විට ඉහළ කඳුකර කලාපවලට මේ ජනාවාස ව්‍යාප්ත වූ බව මුල් බ්‍රාහ්මී ශිලාලේඛනවල එන තොරතුරුවලින් ද පැහැදිලි වේ (සෙනෙවිරත්න 1996:22).

මේ යුගය වන විට වියළි කලාපයේ උතුරු මැද ප්‍රදේශයේ පිහිටන අනුරාධපුරය ලංකාවේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වශයෙන් කළඑළි බැසීම සිදු වී හමාර වී තිබූ සමයක් විය. එබැවින් කඳුකර කලාපවලින් ලබාගන්නා සම්පත් ග්‍රාම නගර හා බෙදා හැරීම මධ්‍යස්ථාන ඔස්සේ අනුරාධපුරයට පරිවහනය වීම කැපීපෙනේ. ක්‍රි.පූ. පස් වැනි සියවසින් පසු කඳුකර කලාපවලට ආවේණික ඛණිජ පාෂාණවල විවිධත්වය වැඩි වී ඇති බව අනුරාධපුර ඇතුළු නගරයේ ජනාවාස ස්තරවලින් පැහැදිලි වී තිබේ (දැරණියගල 1992:707-714). ක්‍රි.පූ. 3-1 සියවස් වන විට ලංකාවේ උතුරු මැද හා අග්නිදිග කලාපයන් සීඝ්‍ර ලෙස දියුණු වන නගුල් කෘෂිකර්මාන්තය සඳහා මේ සමාජ සම්බන්ධතා හා ජනාවාසවල ඍජු බලපෑම ඇති වීම සුවිශේෂ වන අතර අනෙකුත් ජනාවාස සඳහා ද මේ සම්පත් හා බැඳුණු කාර්යය බද්ද වටිනාකම මූලික වී ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිදු කර ඇති ගවේෂණවලට අනුව (තොරතුරු අප්‍රකාශිතය) ක්‍රි.පූ. 5 - ක්‍රි.ව. 13 කාලයට අයත්



වන ප්‍රාග් ඓතිහාසික නොවන පුරාවිද්‍යා ස්ථාන ලක්ෂ දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් ලංකාව තුළ ඇති බව වාර්තා කර තිබේ. එම සමීක්ෂණවලට අනුව වියළි කලාපය තුළ වර්ග සැතපුම් එකක් තුළ පුරාවිද්‍යා ස්ථාන 6 - 10 ත් අතර ප්‍රමාණයක් ද අන්තර් කලාපය තුළ වර්ග සැතපුම් එකකට පුරාවිද්‍යා ස්ථාන 2 - 3 ප්‍රමාණයක් ද, තෙත් කලාපය තුළ වර්ග සැතපුම් දෙකකට එක් පුරාවිද්‍යා ස්ථානයක් ද පවතින බව සොයා ගෙන තිබේ. මේවා මානව ජනාවාසකරණය සමඟ සිදු වූ දෑ වන අතර අප රටේ ජනාවාස ව්‍යාප්තිය පිළිබඳ කදිම සාධක ද වේ. ශ්‍රී ලංකාවේ ජනාවාස මේ ආකාරයට ව්‍යාප්ත වීම සඳහා කාලානුරූප ව බලපා ඇත්තේ ආර්ථික තත්ත්වයේ නැගීම, ජන රේඛනයේ ප්‍රසාරණය, සම්පත්වලට ඇති ඉල්ලුම හා සමාජ සංස්කෘතික බලපෑම් ආදිය නිසා බැව් පර්යේෂණ අනුව පෙන්වා දී තිබේ. මේ අනුව ලිඛිත මූලාශ්‍රය සාධකවලට වඩා බොහෝ ඈතට ශ්‍රී ලංකාවේ මානව ජනාවාසකරණය ව්‍යාප්ත වන බව පුරාවිද්‍යා පර්යේෂණයන් අනුව සනාථ කර තිබේ. පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධියෙන් අනතුරු ව ශ්‍රී ලංකාවේ මුල්බැස ගනු ලබන්නේ මුල් ඓතිහාසික සමය වේ. මුල් ඓතිහාසික සමය ක්‍රි.පූ. 300- ක්‍රි.ව. 100 කාලයට අයත් වේ (සෙනෙවිරත්න 1996:12). මුල් ඓතිහාසික සමය තුළදී වඩා පැහැදිලි ලෙස ම දේශපාලන, ආර්ථික, ආගමික හා සමාජ වශයෙන් යුත් ආයතන සැදුමක් පිළිබඳ පුරාවිද්‍යාත්මක දත්ත හඳුනාගත හැකි ය. දැනට සිදු කරනු ලැබූ පුරාවිද්‍යා අධ්‍යයනයන්හී දී වඩා පැහැදිලි වී ඇත්තේ පූර්ව ඓතිහාසික යුගයේ සිට පැවත ආ ජන කණ්ඩායම් මුල් ඓතිහාසික යුගය තුළ සමාජ සැදුම තුළ (දේශපාලන, ආගමික, ආර්ථික, සංස්කෘතික) ප්‍රබල පිරිසක් වූ බව ය. මුල් ඓතිහාසික යුගයට සම්බන්ධ ලංකාවේ පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිවල සඳහන් වන පරුමක, ගහපති, ගමික, බත, බරත, අෂ යන ජන කණ්ඩායම් වඩා පැහැදිලි ලෙස ම පූර්ව ඓතිහාසික ජන කණ්ඩායම්වලින් සම්භවය ලැබූවන් ලෙස හඳුනාගෙන තිබේ (සෙනෙවිරත්න,1996:10-30). මේ තත්ත්වය වඩාත් පැහැදිලි වන්නේ පූර්ව ඓතිහාසික ජනාවාස හා සුසාන අවට දක්නට ලැබෙන කටාර කෙටූ මුල් බ්‍රාහ්මී අභිලේඛනවල මේ ජන පිරිස් පිළිබඳ ව සඳහන් වීම ය (එම). එසේ ම පූර්ව ඓතිහාසික යුගයට අයත් කාල

රක්ත වර්ණ මැටි බඳුන්වල හා සුසානවල ඇති බොහොමයක් සංකේත මුල් බ්‍රාහ්මී ලෙන් ලිපිවල අන්තර්ගත වීම ද මෙයට කදිම නිදසුනකි (එම). මෙයට උදාහරණ ලෙස දූවේගලින් හමු වන "**බරත සංඝරක්ඛිත්ෂ ලෙනේ**" වශයෙන් වන ශිලා ලිපියේ පසෙකින් ඇති නෞකාවක සංකේතය (Paranavithana,1970:270). පූර්ව ඓතිහාසික කාල රක්ත වර්ණ මැටි මෙවලම්වල ද දක්නට ලැබේ. අනුරාධපුර ඇතුළුපුරය හා රිදියගමින් හමු වූ මෙවැනි මැටි බඳුන්වල මෙම සංකේත බොහෝමයක් තිබේ (බණ්ඩාර,2002:55-65). මෙම නෞකාවක සංකේතයට සමාන සටහන් තමිල්නාඩු හා ආන්ද්‍රා ප්‍රදේශවලින් මතුකරගත් සාතවාහන කාසිවල දක්නට ලැබීම අතිශයින් වැදගත් බව පෙන්වාදෙන සුදර්ශන් සෙනෙවිරත්න මෙම මුහුදු යාත්‍රා විශේෂය තමිල්නාඩු හා ආන්ද්‍රා ප්‍රදේශවල මුහුදු ගමන් සඳහා යොදා ගත් නෙගටපම් සප්තදණ්ඩ යාත්‍රා වර්ගයට හා කාවේරි ඩෙල්ටාවේ වෙල්නාගපට්ටනම් සහ ශ්‍රී ලංකාවේ උතුරු වෙරළේ ගමන් සඳහා භාවිත කරන **කටමරං/කට්ටුමරං** යාත්‍රාවලට සමාන බව (සෙනෙවිරත්න,1987:74) පෙන්වාදෙන අතර ඒවා බරත ලිපිවල සංකේතානුසාරයෙන් දක්වා තිබෙන්නට ඇත්තේ වෙළෙඳාම හා සම්බන්ධ බරතයකු ඉන් ගම්‍ය කරන්නට විය හැකි යයි ඔහු උපකල්පනයන කර තිබේ(එම). එසේ ම මුල් ඓතිහාසික යුගයේ දී තවත් ජන කණ්ඩායමක් වූ "**පරුමකවරු**" වඩා පැහැදිලි ලෙස පෙළපත් ප්‍රධානීන් ලෙස සම්පත් පිහිටි ප්‍රදේශවල පාලන බලය හසුරුවා ඇත. මෙයට නිදසුන් ලෙස මාතලේ නෙළුවකන්දේ ශිලාලේඛනවල එන "**අභජි**" හා "**තිරිපාල**" යන පරුමක දෙදෙනාගේ නාම සීගිරියේ ශිලාලේඛනවල සඳහන්වීමෙන් මේ තත්ත්වය තහවුරු වේ (සෙනෙවිරත්න,1996:195). එසේ ම පරුමකවරුන් වෙළෙඳාම සම්බන්ධ ව ක්‍රියා කළ බවට පැහැදිලි වන ශිලාලේඛන කිහිපයක තොරතුරු ද තිබේ. ඒ අතරින් පරමාකන්දේ ඇති ශිලාලේඛනයක පරුමක නායකයන් වෙළෙඳ නැවියන් ලෙස ක්‍රියාකළ බවත් (Paranavithana,1970:1353-55) මොවුන් බරතවරු සමඟ සමීප ව කටයුතු කර ඇති ආකාරය කුරුණෑගල වල්ලෑව විහාරයේ ශිලා ලිපියක එන පරුමකවරයෙකුගේ නාමය සමඟ බරත දූතක වශයෙන් සඳහන් වීමෙන් දූතයන් ලෙස ක්‍රියාකරමින් වෙළෙඳුන්ගේ



සේවය ලබාගත් බව පැහැදිලි වන බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වා දී තිබේ (සෙනෙවිරත්න,1987:74). එසේ ම ගලගෙදර දුර්ග ප්‍රදේශයෙන් හමුවන හාරුකච්චයට ගමන් ගත් පරුමක කෙනෙකු ගැන සඳහන් වන ලිපිය තුළින් ද පරුමක වරු ඉන්දියාව සමඟ වෙළෙඳ ජාලයක ක්‍රියාකළ බව පැහැදිලි වේ (එම).

මුල් ඓතිහාසික සමාජ සැදුමේ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ ව ද පරුමකවරුන්ගේ ක්‍රියාකාරීත්වය කැපීපෙනේ. මේ අයුරින් වැව් හා තොටු පොළ පාලනය, නගුල් කෘෂිකර්මාන්තය ආදිය ප්‍රමුඛත්වයේ ලා ගත හැකි ය. ඒ බව ශිලාලේඛනවල සඳහන් වන "පරුමක තොට බොජික. (තොටු පොළ පාලනය කරන්නා) පරුමක නගුලි (නඟුල මෙහෙයවන්නා) "**පරුමක වපිහමික**" (වැව් භාර ව කටයුතු කරන්නා) "**පරුමක ගජද හුනක වච්හම්**" (වැව් අමුණු භාරව කටයුතු කරන්නා) (සෙනෙවිරත්න,1996:25) ආදී කෘෂිකර්මාන්තයට සම්බන්ධ පිරිස් ද එයට අමතර ව විවිධ කාර්යයන් සම්බන්ධ පරුමක පිරිස් ද සිටි බව ශිලාලේඛන තොරතුරු සනාථ කරයි. මහා ඇලගමුව ප්‍රදේශයෙන් වාර්තා වී ඇති ශිලාලේඛන අනුව "**නගරගුත**" (නගරපාලක) "**බඩගරික**" (ගබඩා පාලක) "**ගනිත**" (ගණන් තබන්නා) "**ධනිය**" (බැංකුකරු) "**චූඩ**" (මැණික්කරු) (එම) ආදි ලෙස පරුමකවරු කටයුතු කර ඇත. මින් සමහර පරුමකයින් මේ පදවි ලබන්නට ඇත්තේ පරම්පරාණුකූල ව නොව පදවිය හෙවත් නිල තත්ත්වය පෙන්නුම් කරන නිළනාමයක් ලෙස වන්නට ඇතැයි සිතිය හැකි ය (එම). ඒ බව දිවයිනේ අන් තැන්වලින් ද සාපේක්ෂ වශයෙන් පැහැදිලි ය (එම). එබඳු පුද්ගලයෝ මුල් ඓතිහාසික සමාජය තුළ වෙනත් ධනවත් කණ්ඩායම්වලින් සමාජ සම්භවය ලද්දෝ වෙති. මින් සමහර කණ්ඩායම් අෂ, ගහපති සහ ගමික යනාදී වශයෙන් හැඳින්විය හැකි ය (එම). මේ කණ්ඩායම් ඉස්මතු වූයේ ප්‍රධාන වශයෙන් ම කෘෂිකාර්මික ආර්ථිකයේ හෝ සීඝ්‍ර ව්‍යාප්තිය කරණ කරගෙනය යන බොහෝ දෙනා දරණ මතය අර්ධ වශයෙන් වෙනස් කළ යුතු ව ඇත (එම). මේ කන්ඩායම්වලට අයත් පුද්ගලයින් විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ වෙනත් පෙදෙස්වල තිබෙන මුල් ඓතිහාසික අභිලේඛනවල කර්මාන්ත ශිල්ප හා වෙළෙඳ කටයුතුවල යෙදුන අයවලුන් ලෙස හඳුන්වනු ලැබ ඇත (එම).

එසේ ම පරුමකවරුන් විවිධ ජන කණ්ඩායම් සමඟ සමාජ සම්බන්ධතා පැවැත්වීම පිළිබඳ ව සාධක තිබීම ද ඉතා වැදගත් වේ. මේ අතරින් ග්‍රාමිකයන් සමඟ විවාහ සබඳතා පැවැත්වූ බවට ද තොරතුරු දඹුල්ලේ හා රණගිරමඩ අභිලේඛනවල එයි. එහි විස්තර වන ආකාරයට ගමික වහබගේ දුව පරමකයෙකු සමඟ විවාහ වී ඇත (එම:26). මේ ආකාරයට සම්පත් ලබාගැනීම හා බෙදා හැරීම හා වෙළෙඳාමට සම්බන්ධ විවිධ ජන කණ්ඩායම් සමඟ පරුමකවරු සමාජ සම්බන්ධතා පවත්වා ඇති අතර මේ ජන කණ්ඩායම් පිළිබඳ තොරතුරු අභිලේඛනවල හැර වංසකතාවල සඳහන් නොවීම නිසා අපේ පුරාණ සමාජ සැදුම පිළිබඳ සාධක විශාල ප්‍රමාණයක් ගිලිහී තිබේ.

මහාවංසය ආශ්‍රයෙන් මූලාශ්‍රය සාධක අධ්‍යයනය කිරීමේදී මුල් ඓතිහාසික සමය තුළ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස මහින්දාගමනය පෙන්වාදිය හැකි ය (මව,පරි.14). මහින්දාගමනයෙන් අනතුරු ව මෙරට බුදු සමය මුල්බැස ගැනීම සමඟ බෞද්ධ සභ්‍යත්වය හා සංස්කෘතියක් බිහිවීම කැපීපෙනේ. ඒ සමඟ ම සිදුවන සුවිශේෂ ක්‍රියාවලියක් වන්නේ අනුරාධපුර පැරණි නගරය ආශ්‍රිත ව විහාරාම බිහි වීම වේ. අනුරාධපුර විහාර සැලැස්මේ මුල් සැලැස්ම මිහිඳු මාහිමියන්ගේ අනුදැනුම ඇති ව සිදු වූ බවට සිතිය හැකි හේතු තිබේ (රාහුල,1955:57). මහා විහාරය භික්ෂූන් වහන්සේලාට වාසස්ථානයට සුදුසු ආකාරයෙන් සකස් කර දීමට උපදෙස් දෙනු ලැබුවේ, මිහිඳු මාහිමි විසිනි (එම). උන්වහන්සේ මගධ මහා රාජ්‍යයේ ශෝභා සම්පන්න අගනුවර වූ පාටලීපුත්‍ර නගරයේ වාසය කර පුරුදු කෙනෙකි. සිය පියාණන් විසින් කරවන ලද අශෝකාරාමාදිය හා තම මෑණියන් විසින් විදිසාවේ කරවන ලද චේතියගිරි ආදී මහා ආරාමයන් දැක පුරුදු කෙනෙකි. වංසකතාවල එන ප්‍රාතිහාර්යය පිළිබඳ විස්තර ද මිථ්‍යා කතා ද කාව්‍යාලංකාර හා අතිශයෝක්තිය ද පැත්තකට කළවිට පැහැදිලි ව පෙනෙන්නේ මිහිඳු මාහිමි දෙවනපෑතිස්  රජු සමඟ මහා විහාර මූලික සැලසුම සකස් කරන ලද ආකාරයයි (එම:57-58). මෙම මූලික සැලසුම සකස් කිරීමට පෙර මිහිඳු මාහිමියන් වහන්සේ විසින් මහා සීමාව සම්මත කිරීමට කටයුතු කරන ලද බව මහාවංසයේ විස්තර වේ (මව,15 පරි 15).



## 1.2 විහාරාරාම ආරම්භය

ශ්‍රී ලංකා බුදු සසුනේ ප්‍රථම විහාරය වූ තිස්සාරාමය (පසු ව මහා විහාරය) මහා මහේන්ද්‍ර මහ රහතන් වහන්සේගේ උපදෙස් පරිදි මෙරට ප්‍රථම බෞද්ධ පාලකයා වූ දෙවනපෑතිස් රජතුමා විසින් මුලින් ම ගොඩනංවන ලදි (විජයසූරිය, 1995:84). ක්‍රි.පූ. 236 පොසොන් මස පුර පසලොස්වක දා මිස්සක පව්වට වැඩි මිහිඳු මාහිමි පසුදා අනුරාධපුරයට වැඩ රජ මාළිගාවට ගොස් රජගෙ දර පිරිසට දම් දෙසූහ (මව,14:51-64). එදින රජතුමාගේ ඉල්ලීම පරිදි නන්දන වනයෙහි වැඩ විසීම ප්‍රතික්ෂේප කළ උන්වහන්සේ මහමෙව්නා උයනේ වැඩ සිටීමට කී කල එය පිළිගත්තේ ය. (මව, 15:6-9). පසු ව රජතුමා මහ මෙව්නාව සංඝයාට පූජා කළේය (මව,15:24 - 25).

මහමෙව්නා උයන සංඝයාට පූජා කිරීමෙන් පසු මහින්ද ස්ථවිරයෝ ශාසනයේ මූලස්ථානය පිළියෙල කරන්නට යුහුසුලු ක්‍රියා කළාහු ය. පසු කාලයක දී මෙරට බෞද්ධ සභ්‍යත්වයෙහි හා සංස්කෘතියෙහි කේන්ද්‍රස්ථානය හා ථේරවාදයෙහි බලකොටුව වූ මහා විහාරය මෙසේ මිහිඳු මාහිමියන් ආරම්භ කළ ස්ථානයයි. පසු කලෙක අනුරාධපුර ශුද්ධ නගරය හැටියට සැලකුණු පෙදෙසේ මුල් සැලැස්ම හා වින්‍යාසය කරන ලද්දේ මිහිඳු මාහිමියන් විසිනැයි සිතීමට වැදගත් හේතු ඇත. මිහිඳු මාහිමියන්ට වඩා දේශ දේශාන්තරයෙහි සැරිසරා පුරුදු උන්වහන්සේට වඩා දැනුම ඇති වඩා උගත්, සභ්‍ය වඩා ශිෂ්ඨ සම්පන්න එක ම කෙනෙකුවත් එවකට ලංකාවේ සිටියේ නැත (රාහුල,1989:57). මහා විහාරය භික්ෂූන් වහන්සේට වාසස්ථානයට සුදුසු ආකාරයෙන් සකස් කරදීමට උපදෙස් දෙන ලද්දේ මිහිඳු මාහිමි විසිනි. උන්වහන්සේට මගධ රාජ්‍යයේ ශෝභාසම්පන්න අගනුවර වූ පාඨලීපුත්‍ර නගරයෙහි වාසය කර පුරුදු කෙනෙකි. උන්වහන්සේ සිය පියාණන් විසින් කරන ලද අශෝකාරාමාදිය හා තම මෑණියන් විසින් වේදිශාවේ කරවන ලද චේතියගිරි ආදී මහා ආරාමයන් දැක පුරුදු කෙනෙකි. එබැවින් ආරාමයක සැලසුම සකස් කිරීමට උන්වහන්සේට වඩා සුදුසුසෙක් නොවීය. වංසකතාවල එන ප්‍රාතිහාර්ය පිළිබඳ විස්තර ද මිත්‍යා කතා ද කාව්‍යාලංකාර හා අතිශයෝක්තිය ද

පැත්තකට කළ විට අපේ මනසට ගෝචර වන්නේ සංඝකර්ම සඳහා මාලකයක් උණු දිය නාන කාමරයක් සහිත පොකුණක් ශ්‍රී මහා බෝධියට ස්ථානයක්, සංඝයාට උපෝසථශාලාවක්, ලහබත් ගෙයක් (සංඝයාට බත්හලක්) සහ මහා ථූපය යන මේ එක එකට සුදුසු ස්ථානයන් දක්වමින් මිහිඳු මාහිමි දෙවනපෑතිස් රජු කැටි ව තැනින් තැනට වඩින සැටිය. මෙහි දී අපට මහා විහාර මූලික සැලැස්ම පෙනේ (රාහුල, 1989:58).

නෙබෝ දිනකින් දේවානම්පියතිස්ස රජු මහින්ද මහ රහතන් වහන්සේගෙන් බුදු සසුන මෙරට පිහිටියේ දැයි විචාළ විට මිහිඳු මාහිමි ඊට පිළිතුරු දුන් ආකාරය මූලාශ්‍රයවල විවිධ ආකාරයට සඳහන් වේ. මහාවංසයේ හා දීපවංසයේ සඳහන් පරිදි බුදු සසුන පිහිටුවීමට නම් උපෝසථ හා වෙනත් සංඝකර්ම සඳහා සීමාවක් අවශ්‍ය බව සඳහන් වී ඇත (මව,15:179-181, *Dv*, 1992:14:74). තමන්ට බුද්ධ ධර්මයට අනුකූල ව වෙසෙන්නට හැකි වණු පිණිස නගරය ඇතුළත් කර සීමාව බඳවන්නට (මව,15:83) රජු කරුණු කීමෙන් අනතුරු ව එම සීමාව සලකුණු කරන ලද අයුරු මහාවංසයේ දැක්වෙන්නේ මේ ආකාරයට ය. "මිහිඳු මාහිමි අනුරාධපුරයට වැඩි සිව් වැනි දින රජතුමා සීමා සම්මත කරන බව ජනතාවට දැන්වූහ" (මව,15:190).

"ඉන්පසු රජු මිහිඳු මාහිමියන් සමඟ උඩු ගං තොටට ගොස් පදුම හා කුඤ්ජර යන ඇතුන් යෙදූ රන් නගුලින් මෙසේ සීමා සම්මත කරන ලදි. කොලොම්හොය පහන තොට පහනෙහි කුඩා වලට ද එතනින් කුම්බල නම් වල අඟට ද මහ දුවට ද එතනින් කුඹුක් පෙළට ද එතනින් මහ මළුවට ද එතනින් කුදු මී රුකට ද එයින් මුරුත පොකුණට ද එයින් විජයාරාම නම් උයනෙහි උතුරු දොර කොටුවට ද එතනින් එතනින් ගජ කුම්භ නම් ගලට ද එතනින් තුස වැටිය මැදින් අභා උයනෙහි කොග්ගලට ද ගොස් මහා සෝන මැදට ද ගියේය, දිගු පහනණට ගොස් කම්මාර දෙවියාගේ බඩහැලට වමින් නුග මළුවට ගොස්, හීයගල සමීපයෙහි ගිණිකොන දියවස් බමුණාගේ දේවාලයට ද එතනින් නෙළුම් පොළට ද එතනින් තාල චතුෂ්කයට ගියේ, එතනින් අස්මඩුල්ලට වමින් සසවනයට ගියේය. එතැනින් බොරලු තොටට ගියේය. එතනින් මත්තෙහි නදියට ගියේය. පළමු සෑයෙන් නැගෙනහිර



කොළම් ගස් දෙකක් වූහ. සේන ගුත්තික රාජ්‍යයේ උදකශුද්ධික ද්‍රවිඩයෝ නදිය දුර යයි සිතා බැඳ එය නුවරට ආසන්න කළහ. එහි ජීවමාන කොළොන් රුක ඇතුළුකර සිංහස්ස නම් තොටින් උර්ධව භාගයට පැමිණ ඉවුරෙන් වඩනේ පහණ තොටට පැමිණ නිමිති ගැලපූ සේක" (මව,:15:190-212). ඉහත සඳහන් කළ මහා සීමාව පිළිබඳ විස්තරවලට සමාන විස්තරයක් මහා බෝධිවංසයේත් දීපවංසයේත් සඳහන් වේ (මබෝව,180:දීව.,14:74-75). මෙම සීමා සම්මතයෙන් පසු ව රජතුමා පිහිට වූ මහා සීමාව විශාල ප්‍රදේශයක් දක්වා පැතිරිණි. මහා සීමාවේ නැගෙනහිර මල්වතු ඔයයි. එතැන සිට වෘත්තාකාර වන මෙම සීමාව නැවත මල්වතු ඔයෙන් අවසන් වේ. එහි දුර නිශ්චිත නැත. බුදුහු අනුදැන වදාළ බද්ද සීමා අබද්ධ සිමා යන දෙවැදෑරුම් සීමා අතර මහින්ද මහරහතන් වහන්සේ පිහිට වූයේ බද්ධ සීමාවකි. ඒ ඒ දිනවල පිහිටි නිමිති පිළිවෙලින් නිර්ණය කර එකට එක ගලපා කර්ම වාක්‍යයෙන් සම්මත කරන හෙයින් එය බද්ධ සීමා නම් වේ (සිව්කෝ,720:738). ඉන් අනතුරු ව මිහිඳු මාහිමියන් දෙවනපෑතිස් රජුට ආරමයකට අවශ්‍ය ගොඩනැගිලි හා අනෙකුත් අංග පිහිටන ස්ථාන පෙන්වා දුන්නේ ය.

රජ මැඳුරට දකුණින් වූ පිචුල (පුලිල) ගස් පිහිටි තැන සංඝකර්ම කිරීමට අවශ්‍ය සීමා මාලකය ද, රජමැඳුරට උතුරින් පොකුණට වැඩම කර ගිණිහල් පොකුණ පිහිටු වීමට ද, රජ මැඳුර දොර කොටුවට වැඩ එහි එක්තරා තැනක් සලකුණු කර ජය ශ්‍රී මහා බෝධියේ දකුණු ශාඛාව පිහිටුවීමට ද මහා චූල මාලකයට වැඩ සංඝයාගේ උපෝසථඝරය පිහිටු වීමට ද, පැන් මළුවට වැඩ සංඝයාගේ ලාභයන් බෙදා ගන්නා ස්ථානය පිහිටුවීමට චතුස්ශාලා නම් දානශාලාව පිහිටුවා ගැනීම ද රජ උද්‍යානය ඇතුළත කුඩා කකුධ නම් වැව අසල ස්ථානයක් පෙන්වා මහා ථූපය පිහිටු වීමට ද පෙන්නා දෙන ලදී (ථූව,34:134).

ඉහත සඳහන් තොරතුරු සියල්ලෙහි සඳහන් වන්නා වූ අතිශයෝක්තිය බැහැර කළ කල්හි අපට පැහැදිලි ව පෙන්වාදිය හැක්කේ මිහිඳු මා හිමි විසින් දෙවනපෑතිස් රජුට විහාරාරාමයකට අවශ්‍ය කරන වාස්තුවිද්‍යාත්මක අංග පිළිබඳ ව පැහැදිලි කරන විස්තරයකි. මෙය ඉතා වැදගත් වන්නේ මෙම විහාරාරාම අංග

පසු කාලීන ව වර්ධනය වූ අනෙකුත් විහාරාරාම සඳහා යම් සැලැස්මක් ඇති කරන ලද බැවිනි. බෞද්ධාගම රටේ මුල්බැස ගැනීම සමඟ ම ධර්මාශෝක රජතුමා විසින් ශ්‍රී මහා බෝධිය සමඟ අටලොස් කුලයක පිරිසක් එවන ලද බව සඳහන් වේ (මව,පරි.19-20). මේ අටලෝස්කුලයට විවිධ ශිල්ප කර්ම ප්‍රගුණ කරන ලද පිරිස් වූ බව එහි වැඩි දුරටත් සඳහන් වන බැවින් මෙම පිරිස් උක්ත විහාර කර්මාන්තය නගා සිටුවන්නට විශේෂ මෙහෙයක් සිදු කරන්නට ඇතැයි අපට සිතිය හැකි ය. දෙවනපෑතිස් රාජ්‍ය යුගයේදී තිස්සාරාමය මූලික කරගෙන ඇරඹි විහාරය පසු ව මහා විහාරය නමින් ප්‍රකට විය (කුලතුංග,2001:01). මහා විහාරය ආරම්භ වූවායින් පසු ශ්‍රී ලංකාවේ රජ වූ විවිධ රජ දරුවන් විසින් විවිධ වූ සංවර්ධන කටයුතු විහාරය සඳහා කරවා ඇත. ඒ අතුරින් මහා විහාරය හා එහි දියුණුව සඳහා විශාල සේවයක් කළ රජතුමා ලෙස ඉතිහාස ගත වී ඇත්තේ දුටුගැමුණු රජතුමා ය.

මහාවංසයේ ඒ රජුගේ මෙම සේවය සඳහා පරිච්ඡේද 11 ක් වෙන් කර ඇත (මව, පරි:32- 33). මින් පසු ව රජ වූ සද්ධාතිස්ස, ලජ්ජතිස්ස, භාතිකාභය, ජේට්ඨතිස්ස ආදී රජවරු මහා විහාරයේ උන්නතියට සේවය කරන ලදී (මව, පරි:33-36). මහා විහාරය රාජ අනුග්‍රහය යටතේ සංවර්ධනය වීම සමඟ ම එහි අධ්‍යාපන අංශය ද දියුණු වූ බව පෙනේ. අනුරාධපුර යුගයේ පැවති ප්‍රධාන ගණයේ අධ්‍යාපන පීඨයක් ලෙස ද මහා විහාරය උසස් කීර්තියක් හා ප්‍රසිද්ධියක් ඉසිලීය. මජ්ජිමනිකාය අට්ඨකථාවේ දැක්වෙන එක් සඳහනකට අනුව වැරදි ලෙස අක්ෂර උච්චාරණය කළ එක් භික්ෂූන් වහන්සේ නමකට මහා විහාරයේ අක්ෂර විශාරදයන්ගේ නිවැරදි උච්චාරණය උගනිව් යනුවෙන් රහතන් වහන්සේ නමක් විසින් අවවාදයක් දී ඇත (සපා,220-221). තත්කාලීන උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස මහා විහාරය පිළිගත හැකි අතර එහි උගන්වනු ලැබූ විෂය ක්ෂේත්‍රය ධර්ම විනයට පමණකත් සීමා නොවී රාෂ්ට්‍ර පාලනය හා නීතිය පිළිබඳ ව පුහුණුවක් ලබාදුන් ආයතනයක් ද විය.

භාතිකාභය රජු විසින් අභිධම්මික ගෝදත්ත තෙරුණ් වහන්සේට ශ්‍රේෂ්ඨාධිකරණයේ අග විනිසුරු තත්ත්වයට පත්කිරීමෙන් ඒ බව තහවුරු වේ (පසුමනි,111:823). එසේ ම මහා



විහාර ආචාර්යවරු ලේඛන විශාරද පදවියෙන් සම්මාන ලැබූ බව ද දැක්වේ (සපා,305). මහා විහාර විෂය මාලාවේ කුමන විෂයයන් ඇතුළත් වුවාද යන්න නිශ්චිත නො වූව ද ව්‍යාකරණ, සාහිත්‍ය, භාෂාව යන විෂයන් ඉගැන්වූ බවට සාධක තිබේ. ඒ සඳහා නන් වැදෑරුම් වියතුන් මෙරට පැමිණීම අනුව එය පෙන්වාදිය හැකි ය. එසේ පැමිණි අය අතුරින් බුද්ධඝෝෂ හිමි විශේෂ අයෙකු ලෙස සඳහන් කළ හැකි ය. ඔහු හෙළ අටුවා පාලියට නගා ඇත්තේ මහා විහාරයේ සිට බව විශ්වාස කළ හැක්කේ හෙළ අට්ඨ කතා මහා විහාර වාසීන් සංගෘහිත ඒවා බැවිනි (මවටී. හැඳින්වීම). සිංහල භාෂා සාහිත්‍ය ප්‍රගතියට මහා විහාරයෙන් සැලසුණ සේවා අතුරින් හෙළ අටුවා වන පඤ්චචරීය අට්ඨ කථා, කුරුන්දි අට්ඨ කථා, විනය අට්ඨ කථා. මහ අට්ඨ කථා, ආදී අට්ඨ කථා පෙන්වාදිය හැකි ය. බුද්ධඝෝෂ හිමියන් විසින් මෙම හෙල අටුවා පාලියට නැගීමෙන් පසු ඒවා අභාවයට ගිය බව විචාරකයන්ගේ මතය වේ (එම).

මහා විහාරයෙන් පරිබාහිර ව අභයගිරිය ගොඩනැගුණු දා සිට එම උභය විහාරයන්ට අනුරාධපුර යේ සිටි විවිධ රජ දරුවන් අනුග්‍රහ දක්වා ඇත. ඒ අතර වළගම්බා, කණිට්ඨතිස්ස, වෝහාරික තිස්ස, මහාචූල, මහාසේන, මහාතිස්ස, භාතිකාභය, කූඨකණ්න, මහාදාඨික, මහානාග, අමණ්ඩ ගාමිණී අභය, පළමු වැනි මුගලන් ඒ සම්බන්ධයෙන් විශේෂ වේ (මව,පරි:34-36). වළගම්බා රාජ්‍ය සමයේදී රජු ද්‍රවිඩයන් සමඟ සටන් කර පැරදී පලා ගිය අවස්ථාවේ තමන්ට හා තම සේනාවට උපකාර කළ මහා තිස්ස තෙරුන්ට කෘත ගුණ සැලකීම සඳහා අභයගිරිය තනවා පූජා කළේය. එය පිරිවෙණ් දොළහකින් හා ඇමතිවරු හා සේවකයින් නමින් නම් කරන ලද විහාර කිහිපයකින් ද යුක්ත ය (මව, 33:29-105). මහා විහාරය අරඹා අවුරුදු 217 කට පසු සිදු වූ මෙම ආරාම පූජාව නිසා එයට විරෝධය පා මහා විහාර භික්ෂූන් තිස්ස තෙරුන්ට කුල සංසට්ඨ චෝදනා ඉදිරිපත් කර පබ්බාජනීය කර්මය කළහ (නිස, 10-11).

ස්වකීය ආචාර්යවරයාට කරන ලද අසාධාරණ දඬුවම නිසා කෝපයට පත් භික්ෂු පිරිසක් මහා විහාරයෙන් බිඳවා ගන්නා ලද භික්ෂු පිරිසක් සමඟ අභයගිරියට ගොස් පදිංචි විය. මෙම කරුණ පදනම් කර ගනිමින් මහා විහාරයට ප්‍රතිවිරුද්ධ පක්ෂයක් ඇති

විය. මේ අතර දඹදිව සිට ධම්මරුචි නම් වජ්ජිපුත්තක නිකායට අයත් භික්ෂුවක් අභයගිරියට පැමිණි අතර එම ධර්මය පිළිගත් අභයගිරි වාසීන් ධම්මරුචි නිකාය නමින් ප්‍රසිද්ධ විය (නිස,1960:10-11).ධම්ම රුචි නිකාය ඇරඹීම සමඟ ම මහා විහාරයේ භික්ෂු බලය හීන වන්නට විය. මහා තිස්ස තෙරුන් මහා විහාරයේ නෙරපීම නිසා වළගම්බා රජු ද බලවත් කලකිරීමට පත් විය. මේ කරුණ ඉතා හොඳින් පැහැදිලි වන්නේ මහා විහාර භික්ෂූන් ග්‍රන්ථාරූඪ සංඝායනාව සඳහා අනුරාධපුරයෙන් බැහැර ව මාතලේ ආලෝක ලෙන තෝරා ගැනීමෙනි. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලැබිය යුතු වුව ද වළගම්බා රජු මහා විහාරය කෙරෙහි දැක් වූ අනුග්‍රහය නිසා ප්‍රාදේශීය පාලකයෙකුගේ සහයෝගය ලබාගන්නට මහා විහාරීය භික්ෂූන්ට සිදු විය.

සමන්තපාසාදිකාවේ සඳහන් පරිදි භාතිකාභය රජු දවස මේ දෙපක්ෂය අතර මත භේද ඇති විය. එම මතභේද තමාට සැලවීමත් සමඟ ඒ පිළිබඳ ව කරුණු පරීක්ෂා කිරීමට දීඝකාරක ඇමතිවරයා පත්කරන ලදී (අදිකාරම්,1969:208). මේ පිළිබඳ ව වැඩි දුරටත් අදහස් දක්වන අදිකාරම් මෙය ධර්ම විනය පිළිබඳ ප්‍රශ්නයක් නොව භාෂාමය කරුණක් සම්බන්ධයෙන් මත භේදයක් විය හැකි යැයි ප්‍රකාශ කර තිබේ. වෝහාරික තිස්ස රාජ්‍ය යුගයේදී අභයගිරි වාසීහු වෛතුල්‍යවාදය පිළිගැනීමක් සමඟ මහා විහාරයේ භේදය උත්සන්න විය (මව,පරි:37; නිසඃ13). මේ ප්‍රශ්නය සම්බන්ධ ව සොයා බැලීමට ඇමතිවරයෙක් පත්කර වෛතුල්‍ය ධර්මය බුද්ධ භාෂිත ධර්මය නොවන බව ඔහු තීරණය කිරීමෙන් පසු ව වෛතුල්‍යවාදය සම්බන්ධ පොත් ගිනිබත් කළ බව සඳහන් වේ.

පසු ව ගෝඨාභය රාජ්‍ය යුගයේ දී වෛතුල්‍යවාදය නැවත ඉදිරිපත් කර එය බුද්ධ භාෂිත යයි ප්‍රකාශ කළහ. මෙම අවස්ථාවේ පඤ්ච මහා ආවාසයේ භික්ෂූන් රැස්කර විමසීමෙන් පසු ව එය මිත්‍යා වාදයක් බව තීරණය කර වෛතුල්‍යවාදීන් අල්ලා සිවුරු හරවා රටින් පිටුවහල් කරන ලදී (මව,36:11-12; නිස,12). ගෝඨාභය රජු පිටමං කරන ලද භික්ෂූන් ඉන්දියාවට පලා යන ලදී. එහිදී සංඝමිත්‍ර නම් භික්ෂුවක් එම රජුන් විසින් නිග්‍රහ කරන ලද පුවත අසා මහා විහාරය විනාශ කරමි. එසේ නොවුවහොත් මහා විහාර වාසීන්ට වෛතුල්‍යවාදය ගන්වමි යි සිතා ලංකාවට



පැමිණියේ ය. ඔහු අභයගිරිකයින් සමඟ එකතු වී වෛතුල්‍යවාදය ක්‍රියාත්මක කරන්නට වූහ.  නැවතත් මහා විහාරය හා අභයගිරිය අතර ප්‍රශ්න මතු වූ බැවින් ගෝඨාභය රජු මේ තත්ත්වය දුරලීම සඳහා ථූපාරාමයේ සර්ව පාක්ෂික සංඝ සම්මේලනයක් පැවැත්වීය. මෙහි දී අභයගිරි පක්ෂය වෙනුවෙන් සංඝමිත්‍ර භික්‍ෂුව ව්‍යක්ත ව කථා කළ අතර රජු ඒ මතය පිළිගන්නා ලදී. එයින් අභයගිරියට ජය අත්විය. ඉන් පසු සංඝමිත්‍ර භික්ෂුව රජුගේ පුතුන් දෙදෙනාට ඉගැන්වීමට අවස්ථාව සළසා ගන්නා ලදී (මව,36:116-117).

මේ අනුව ලක් ඉතිහාසයේ වෛතුල්‍යවාදය පිළිගත් ආදිතම රජු ලෙස ගෝඨාභය රජු සඳහන් කළ හැකි ය. නමුත් එරජු මහා විහාරයට හානියක් කළ බව සඳහන් නොවේ. ගෝඨාභයගෙන් පසු ජෙට්ඨතිස්ස රජ වූ අතර සංඝමිත්‍ර භික්‍ෂුව නැවතත් ඉන්දියාවට පලා ගියේ ය (අදිකාරම්, 1969:214). ඉතිහාසගත තොරතුරු අනුව ජෙට්ඨතිස්ස අභයගිරියට වඩා මහා විහාරයට විශාල සැළකිල්ලක් දක්වා තිබේ. ජෙට්ඨතිස්ස රජු ඇවෑමෙන් රාජ්‍යත්වය පත් වූයේ මහාසේන රජුය. රජුගේ අභිෂේකය සඳහා ඉන්දියාවේ සිට නැවත පැමිණි සංඝමිත්‍ර භික්ෂුව අභිෂේක මංගල්‍යයේ මුලසුන දැරුවේ ය (මව,37:1-3; වනරතන,1970:18). මෙම රජ සමයේ මහා විහාරයට උදාවූයේ අඳුරු සමයකි. මහා විහාරිකයින්යට දන්දීම දඩ ගැසිය යුතු වරදක් ලෙස රජු ප්‍රකාශ කරන ලද්දේ සංඝමිත්‍ර භික්‍ෂුෂුවගේ උපදෙස් පරිදි ය. ඉන් පසු මහා විහාරික භික්ෂූන්ට දන්දීම වැලකුණ බැවින් එම භික්ෂූන් මලය රටට හා රුහුණු රටට පලා ගියහ. ඉන් අනතුරු ව මහා විහාර වස්තුව රාජ සන්තක යයි රාජාඥාවක් පනවා මහා විහාරය විනාශ කරන ලදි.

මෙය පිළිබඳ ව සඳහන් කරන නිකාය සංග්‍රහය ලෝහ ප්‍රාසාදය ඇතුළු තුන්සිය සිව්සැටක් පමණ පිරිවෙණ් සහමුලින් ම උපුටා විහාර භූමියේ උඳු වපුරන ලදැයි සඳහන් කර තිබේ (මව,37:148). මෙම සිද්ධිය නිසා රජුට විපක්ෂ වූ මේඝවර්ණ ඇමති රජුට විරුද්ධ ව නැගී සිටියහ (නිසඃ13). මේ සමඟ රජුගේ බිසව වඩුවෙකු ලවා සංඝමිත්‍ර භික්‍ෂුව මරණයට පත්කරන ලදී. ප්‍රකෝප වූ ජනතාව අතින් සෝන ඇමතියා ද මරණයට පත්විය (මව,37:149; නිස,13). මෙම විනාශයෙන් පසුව රජුට තත්ත්වාබෝධ විය. ඉන්පසු මහා විහාරය අතහැර පලාගිය භික්ෂූන් ගෙන්වා

විනාශයටපත් ගොඩනැගිලි රජු නැවත ප්‍රතිසංස්කරණය කරන ලදි (මව,37:149-150). නමුත් මහා විහාරිකයින්ගේ විරෝධය නොතකා මහසෙන් රජු නැවත වතාවක් මහා විහාර භූමිය තුළ ජේතවන විහාරය තනවා තිස්ස තෙරුන්ට පූජා කරන ලදී. එසේ ම මහා විහාර සීමාවට උගුලුවා ලීමට කටයුතු කර තිබේ. නැවත් මහා විහාර භික්ෂූන් නව මසක් මහා විහාරය අත් හරින ලදී (මව,37:33-34; නිසඃ5-13). ජේතවනය පිළිගත් තිස්ස තෙරුන්ට ටික කලකින් අන්තිම වස්තුවෙන් සත්‍යාත්ථ චෝදනා ඉදිරිපත් විය. එම චෝදනා විභාග කළ ධාර්මික අමාත්‍යවරයා රජුගේ විරෝධය නොතකා තිස්ස හිමියන් උපැවදි කර සසුනෙන් නෙරපීය. ඉන්පසු සාගලික නිකායට අයත් භික්ෂූන් දක්ෂිණ විහාරයෙන් පැමිණ ජේතවනය තම වාසස්ථානය කර ගත්හ.

මොවුහු අබාසලමෙවන් රජු දක්වා වෛතුල්‍යවාදය පිළිනොගත් බව සඳහන් වේ (නිසඃ13). නිකාය සංග්‍රහයේ සඳහන් වන ලෙස අභයගිරි වාසී තිස්ස නම් තෙර කෙනෙක් වෛතුල්‍යවාදීන්ට කරන ලද නිග්‍රහ අසා 300 ක් සංඝයා සමඟ දක්ෂිණ ගිරි විහාරයට ගොස් පදිංචි වී ඇත. ඔවුන් අතරින් සාගල නම් භික්ෂුවක් ධර්මය ව්‍යාප්ත කිරිමේ නිරත වූ අතර මේ භික්ෂු පිරිස සාගල නිකාය නමින් ප්‍රසිද්ධ විය (නිසඃ13). මේ අනුව පැහැදිලි වන්නේ අභයගිරියෙන් දක්ෂිණ විහාරයට ගිය භික්ෂූන් සාගලික නිකාය ආරම්භ කරන ලද බවත් එයින් පසු තිස්ස තෙරුන්ගේ නෙරපීම සමඟ එම පිරිස ජේතවනාරාම විහාරයට පැමිණ සිය නිකාය පිහිටුවා ගත් බව ය. සද්ධර්මරත්නාකරයට අනුව බුදුන් පිරිනිවී සතානුස් අවුරුද්දක් ගිය පසු ගෝඨාභය රජු දවස ධම්මරුචි නිකායෙන් භින්නව දක්ෂිණ වෙහෙර භික්ෂූන් සඳහා දෙනා වෙහෙර මහසෙන් රජු දවස ජාත වූ බව සඳහන් වේ (සද්ර,305). එකල මහසෙන් රජු මහා විහාර සීමාව තුළ දෙනා වෙහෙර කරවා කොහොන් තිස්ස තෙරුන්ට දන් දිනි (එමඃ307). මහාසේන රජතුමා තමා මහායාන මතවාදයට දැක්වූ ලැදිකම නිසාදෝ තත්කාලීන ඉන්දියාවේ ද ප්‍රසිද්ධ වූ බව සම්බුද්ධ දන්ත ධාතුව ආරක්ෂාව සඳහා ඉන්දියාවෙන් ඔහු වෙත එවන ලද පුවතින් පැහැදිලි වේ. එය පැමිණෙන විට ඔහු මිය ගොස් සිටි බව දාඨාවංසයේ සඳහන් වේ (දාඨාවඃ301-302).



## 1.3 ජේතවනාරාම සංවර්ධන කටයුතුවල ඉතිහාසය

ක්‍රි.ව. 276 - 303 අතර කාලයේ මහසෙන් රජු විසින් අරඹන ලද ජේතවනාරාම විහාරය අනුරාධපුර ඇතුළු නගරයේ සිට ගිනිකොණ දිශාවට වන්නට පිහිටා තිබේ. ජේතවනාරමය ක්‍රි.ව. තුන් වැනි සියවසේ සිට දොළොස් වැනි සියවස දක්වා සාගලික නිකායේ මූලස්ථානය විය (වික්‍රමගමගේ,1995:137). ජේතවනාරාමය පිහිටා ඇති භූමි භාගය ක්‍රි.පූ. තුන් වැනි සියවසේ දී නන්දන වනය නමින් හඳුන්වනු ලැබීය. ඉන්දියාවේ ශ්‍රේෂ්ඨතම රජෙකු වූ අශෝක අධිරාජ්‍යාගේ පුත් මිහිඳු මහ රහතන් වහන්සේ පුරා දින 7 ක් නොකඩවා ධර්මය දේශනා කර ජනතාව දහමට නැඹුරු කරවූයේ මෙම උද්‍යානයේ බැවින් නන්දන උයන ඉන්පසු ව ජෝතිඋයන නමින් හැඳින්වින (රත්නායක,1998:330-31). මේ අනුව ජෝතිවනය යන්න උද්‍යානයක් බවත් නන්දන වන යන්න එනමින් වූ ආරාමයක් බවත් සිහි තබාගත යුතු බව චන්ද්‍රා වික්‍රම ගමගේ ප්‍රකාශ කර ඇත (වික්‍රමගමගේ,1995:157). කෙසේ වෙතත් ශරත් වත්තලගේ අදහස්වලට අනුව මෙම ආරාමයේ නම භාවිත කර ඇත්තේ වෙනත් ආකාරයකට බව පෙනේ.

නන්දන උයනේ මිහිඳු හිමියන් ධර්මය දේශනා කිරිමෙන් ධර්මාලෝකය රට පුරා ව්‍යාප්ත වී ගිය නිසා ආලෝකය ලබාදෙන අරුතින් ජෝති වන වී යයි ද, එම උයනේ මහසෙන් රජු වූ තැන ස්තූපය සහිත ආරාමය ජේතවනාරාමය වශයෙන් ව්‍යවහාර වී යයි ද වත්තල පෙන්වා දී ඇත (වත්තල,1991:22). කෙසේ වෙතත් චන්ද්‍රා වික්‍රමගමගේගේ අදහස වන්නේ බුදුරදුන් වැඩි කාලයක් වාසයකළ සැවැත්නුවර ජේතවනාරාමය අනුකරණය කරමින් අනුරාධපුරයේ ද ජේතවනාරාමයක් තනා ඇති බවය (වික්‍රමගමගේ,1995:137). ඉතිහාසගත තොරතුරු අනුව මහාසේන රජු ක්‍රි.ව. 276 - 303 අනුරාධපුර ජෝති වන උද්‍යානයේ ජේතවනාරාමය කරවූ බව සඳහන් වේ (මව,37:1-2). දැනට අනුරාධපුර ජේතවනාරාමයෙහි දක්නට ලැබෙන ගොඩනැගිලි සියල්ල ම මහාසේන රජු විසින් ම කරවන ලදැයි කිව නොහැකි ය. යටත් පිරිසෙයින් එහි සංඝාරාමයකට අත්‍යවශ්‍ය ගොඩනැගිලි එම රජු විසින් කරවන්නට ඇතැයි උපකල්පනය හැකි ය (වික්‍රමගමගේ,1995:137).

මහාවංසයට අනුව රජු එම ගොඩනැගිලි සියල්ල ම නිම කිරීමට අසමත් වූ බව එහි අඩංගු කරුණු අනුව පෙනෙන අතර ඔහුට පසු ව රාජ්‍යත්වයට පත් ඔහු පුත් කිත්සිරි මේඝවර්ණ රජු අඩාල ව පැවති ගොඩනැගිලි සම්පූර්ණ කළ බව සඳහන් වේ (මව,37:65).

මහාසේන රජුට පසු ව සිටි රජවරුන් විසින් ජේතවනාරාමයේ කරවන ලද සංවර්ධන කටයුතු ගැන ඉතිහාස පත පොතේ හා ශිලාලේඛනවල සඳහන් වී තිබේ. 1948 වර්ෂය වන තුරු අභයගිරිය ජේතවනාරාමය ලෙසත් ජේතවනය අභයගිරිය ලෙසත් වරදවා වටහා ගැනීමේ සම්ප්‍රදායයක් පැවතුණි. 1910 වර්ෂයේදී දී අභයගිරි ස්තූප මළුවේ දකුණු ආයකය අසලින් හමු වූ ශිලා ලිපියක එම විහාරය **"අභයගිරි වෙහෙර"** යනුවෙන් ද ස්තූපය **"උතර මහාචේත"** නමින් ද සනාථ විය (*Ez*, vo I : 154). මෙම වෙන්කර ගැනීමෙන් අනතුරු ව ලිඛිත ඉතිහාසගත තොරතුරු අනුව විවිධ සංවර්ධන කටයුතු සිදු කරන ලද රජවරුන් පිළිබඳ නිවැරදි කරගැනීමට හැකි වී තිබේ. විශේෂයෙන් ම ජේතවනාරාම විහාරය පිළිබඳ සමහර පුරාණ ඉතිහාස ග්‍රන්ථවල හා ශිලාලිපිවල සඳහන් වනුයේ **"දෙනා වෙහෙර"** හෝ **"දෙනානකය"** යනුවෙනි. ජේතවනාරාම බිමෙන් පමණක් නොව වෙනත් ස්ථානවලින් ද මෙම විහාරය පිළිබඳ ව සඳහන් ශිලාලේඛන හමු වී තිබේ. එම සෙල්ලිපිවලින් පැහැදිලි වනුයේ ජේතවනාරාම විහාරයේ විවිධ සංවර්ධන කටයුතු සඳහා විවිධ රජ දරුවන් දායකත්වය දක්වා ඇති බව ය. (Rathnayake:1984).

ඇටවීරගොල්ලෑව සෙල්ලිපියේ තොරතුරුවලට අනුව ජේතවනාරාමය සඳහා **සිරිසඟබෝ පිරිවෙණ හා වෙලන්ගම** පූජාකළ බව සඳහන් වේ. මෙම ලිපිය ක්‍රි.ව. 924 - 935 රජ වූ දෙ වැනි දප්පුල රජු කරවූ ලිපියකි.

ම(හ)රද්හු දරු අභා
සලමෙවන් මහ
(ර)ද්හු තුමා සත්ලැ
(ගු) දසවන හවු
රුදුයෙහි ...............
පස්හි ................



සබිමැ දෙනා (වෙ)
හෙර සිරිස(ග්)
බොරද්පි (වෙත්)
බද් වෙලන්(ගැ)
මැ අන්නා(ණි කනු)
හින්දිවා දෙවා(ව) (*Ez*,vol.II:45-46)

එසේ ම අනුරාධපුර ඇතුළු නගරයේ මහාපාලි නම් දාන ශාලාවේ ඇති ශිලාමය බත් ඔරුවේ කොටා ඇති ක්‍රි.ව. දස වැනි සියවසට අයත් සෙල්ලිපියක අඩංගු තොරතුරු අනුව ද දෙනා වෙහෙර විහාර කර්මාන්තයේ නවකම් කරන අය සඳහා මහාපාලියෙන් බත් ගන්නා භික්ෂූන් වහන්සේලා විසින් තම බත්පතින් කොටසක් පරිත්‍යාග කර ඇති බව සඳහන් වී ඇත්තේ මෙසේය.

(1) මේ ම (හ පෙළ) බත් (ග)

(2) න්නා තාක් දෙන මෝ

(3) අ (ප) ලද බත් (කො)ට

(4) ස් බත් දෙනා වෙහෙ (ර)

(5) දැගැබ න(කම්)

(6) නවකම් දන දෝ (*Ez*,Vol.I,1928:132 - 133)

එසේ ම ක්‍රි.ව. දස වැනි සියවසට අයත් ලෙස සැළකෙන ශිලා ලිපියක් ජේතවනාරාමයේ බෞද්ධ ගල් ගරාදි වැට (වර්තමානයේ මෙය බෝධිඝරය ලෙස හඳුනාගෙන ඇත) ළඟින් හමු වූ කැඩී ගිය සෙල් ලිපියේ තොරතුරුවලට අනුව ජේතවනාරාම විහාරයේ රත්නමහා පිරිවෙණේ වූ පැන් මඩියක් හා සම්බන්ධ නීතිරීති දැක්වීමක් කර ඇත.

01) පණ්ඩුවාස දෙව අභා මහ රජ් හු පරපුරෙන්

02) බට් සිරිසඟබෝන් - මහින්ද් මහ රජ හු

03) සත් ලන්ගු සත්වන හවුරුදුයෙහි සාගුලි

04) මහ හිමියන් නමින් පලව් අපිත් සතොස්

05) තිස් මහ ථෙරනන් පිහිටි දෙනාරජ මහා වෙහෙ

06) රෙහි රත්නමහා පිරිවෙනෙහි වසන සඟ් - මොක් - කම්

07) උවසුවන් විසින් තරු මෙ දොරටු පැන් - මඩි

08) යෙහි .......................... (*Ez*, vol. III :227 - 229).

ක්‍රි.ව. 1026 - 1042 අතර කාලයේ රජ වූ සිව් වැනි මහින්ද රජුගේ ජේතවනාරාම පුවරු ලිපිය අනුව ජේතවනාරාමයේ දියසෙන් මහ පෝගෙය නැවත සකස් කිරීමක් ගැන සඳහන් වේ.

(16) ළ්හි බද්ධයට බැහිල්හි මහහල් කරා උදා අග්බෝ.
මස්තොටු මි(ති) කසුබ්ගිරි නවකම් කරා සිරිවත්.
(දෙනා) වෙහෙරෙහි (මර) ..................

(17) (මිහි) මන්ති මුනිදේනම් පිලිසන් සිරි අල දියසෙන්
මහපොහො යැලිත් කරා නන් දැරුවන් නෙව් නා
රන් මෙර්මෙන් (ද) ...................... (*Ez*, vol. III :227 - 229)

එසේ ම ජේතවනාරාමයේ උතුරු ආයකය අසලින් සොයා ගන්නා ලද ගල් පුවරුවක වූ සෙල්ලිපියක් අනුව ඉහත දැක්වූ "දෙනා වෙහෙර" යන අරුත පැහැදිලි ලෙස ම ජේතවනාරාම විහාරය සඳහා භාවිත කළ බවට එහි සඳහන් තොරතුරුවලින් ද පැහැදිලි වේ.

| | |
|---|---|
| 01) කෙල්වල් බුද් දෙනා | 06) දෙනා වෙහෙ රැස |
| 02) වෙහෙරැ සල | 07) ලප (ක) ර කමටි ආ |
| 03) පතර කමටි දා | 08) සිත් (තිළිර) |
| 04) ජ්රස දස | 09) .............. දුන් රන් ස........ |
| 05) ත් කෙළවළ් සහ | 10) කළ දෙත් |

(Ratnayake, 1984:132)

ශිලාලේඛනවල සඳහන් වන්නා වූ තොරතුරුවලට අමතරව ජේතවන සංවර්ධන කටයුතු සඳහා රජවරුන් සිදුකළ සේවය පිළිබඳ තොරුතුරු රාශියක් ද වංසකතාවල සඳහන් වේ.

මහාවංසයේ තොරතුරු අනුව සිරිමේඝවර්ණ ක්‍රි.ව. 303 - 331 සිය පියාණන් විසින් අරඹන ලද ජේතවන විහාරයේ නොනිමි



කටයුතු සම්පූර්ණ කර තිබේ (මව,37:65). ක්‍රි.ව. 432 - 433 රජ වූ මිත්තසේන රජු ජේතවන ස්තූපයේ ඇත් පවුර හා ස්තූපය සඳහා තොරණ කළ බව සඳහන් වේ (එම,38:10). ක්‍රි.ව. 459 - 477 රජ වූ ධාතුසේන රජු මහා සෑ තුනෙහි දිරා ගිය ඡත්‍ර පිළිසකර කර සුණුකම් කරවා රන්සත් වීදුරු සුඹුලු ද ආලේප කර වූ බව සඳහන් වේ (එම,38:55 - 74). එසේ ම ක්‍රි.ව. 495 - 512 රජ පැමිණි පළමු වැනි මොග්ගල්ලාන සීගිරි දළහ නම් විහාරයක් ද දාඨාකොණ්ඩඤ්ඤ නම් විහාරය ද බගිරිනක දෙනානක භික්ෂූන්ට දුන් අතර රජින නම් මෙහෙණවරක් කර දෙනානක භික්ෂූනීන්ට දුන් බව ද සඳහන් වේ (එම,39:40 - 43).

ක්‍රි.ව. 573 - 575 රජ පැමිණි මහා නාග රජු මහා සෑ තුනෙහි සුනුකම් කරවා කොත් කැරළි කළේය. ඇත් පවුර ද කරවා සිතියම් කර උඩු ගමින් වැහැප්ගම ජේතවනයට ප්‍රදානය කර තුන් නිකාය සඳහා ම වස්ත්‍ර දානය පවත්වා ඇත (එම,40:95 - 98). මින් පසු රජ පැමිණි පළමු වැනි අග්ගබෝධි (ක්‍රි.ව. 575 - 608) දෙනානකයෙහි රිදී සුඹුලු ගෙය ද බෝ ගෙය වෙත ළිඳ ද කැනවීය. එසේ ම වේළුවන විහාරය කරවා සාගල නිකායට පූජා කරන ලද බවත් සඳහන් වේ (එම,41:43,66,67). දෙ වැනි අග්ගබෝධි රජු (ක්‍රි.ව. 608 - 618) තුන් නිකායට සත්කාර කර බව සඳහන් වේ (මව,42:64). එසේ ම පුණ්‍ය උපදනා ගම් දහසක් නිරවුල් කර දී ජේතවන විහාරයෙහි රජහුගේ නමැත්තා නම් වූ පිරිවෙණ ඉදිකර ඇත (එම,44:16 - 22). ක්‍රි.ව. 618 - 623 රජ වූ තුන් වැනි මොග්ගල්ලාන ස්තූපය ප්‍රතිසංස්කරණයකට දායක වී ඇත (*Mv*, 44:44). ක්‍රි.ව. 632 රජ වූ තුන් වැනි ජේට්ඨතිස්ස ගොඩිගමුව ජේතවනාරාමයට පූජාකර ඇත (*Mv*, 44:97). ක්‍රි.ව. 633 - 643 රජ වූ දෙ වැනි අග්ගබෝධි (ක්‍රි.ව. 667 - 683) රජුගේ පොත්තාසන ඇමති ජේතවන විහාරය සඳහා පිරිවෙණක් රජුගේ නමින් පූජාකර ඇත (*Mv*, 16, 22, 23).

එසේ ම ක්‍රි.ව. 718 - 724 ශ්‍රී ලංකාවේ රජ පැමිණි පස් වැනි අග්ගබෝධි රජු මහාසේන රජුගේ නමින් යුත් විහාරයට සල්වතු වෙහෙර කරවා ප්‍රදානය කර ඇති අතර ගොඩිගමුව වැව ද ප්‍රතිසංස්කරණය කර ඇත (*ibid*, 48:8 - 9). (ක්‍රි.ව. 772 - 777) රජ වූ හත් වැනි අග්ගබෝධි රජු මහා පිරිවෙණ නමින් ප්‍රාසාදයක් කරවා ඇත (*ibid*, 48;65). ක්‍රි.ව. 815 - 831 රජ වූ දෙ වැනි

දප්පුල රජු ජේතවනාරාම විහාරය සඳහා රත්තරනින් නිමකළ ප්‍රාසාදයක් ජේතවනාරාමයේ බුදු පිළිමය සඳහා තනා ඇති අතර තවත් ප්‍රාසාද කිහිපයක් අලුතින් තනා පූජාකර ඇත. එසේ ම මහා පිරිවෙණ ගින්නෙන් දැවී ගොස් තිබුණ බැවින් එය යළි පිළිසකර කිරීම ද එරජු සමයේ කර ඇත (*ibid*, 50: 65 - 68). ක්‍රි.ව. 853 - 887 රජ වූ දෙ වැනි සේන රජුගේ රාජ්‍ය කාලයේදී ජේතවනාරාම විහාරය සඳහා මණිමේඛලා නමින් ගොඩනැගිල්ලක් ද බෝධිසත්ව රූපයක් සඳහා තනා ඇත (*ibid*, 50: 6 - 78).

ක්‍රි.ව. 898 - 914 අතර කාලයේ ලංකාවේ රජ වූ සිව් වැනි කස්සප රජු කස්සප සේනාරාම නමින් ප්‍රාසාදයක් සාගලික නිකායේ ජේතවනාරාම භික්ෂූන් උදෙසා පූජාකර ඇත (*ibid*, 52:17). ක්‍රි.ව. 914-923 අතර කාලයේ රජ වූ පස් වැනි කස්සප රජු ජේතවනාරාම විහාරය සඳහා මණ්ඩපයක් තනා එහි ඇති පිංතූර විවිධ වර්ණවලින් සරසා ඇත. එසේ ම දානශාලාව සඳහා ගමක් ප්‍රදානය කර ඇත (*ibid*,52:35 - 59). ජේතවනාරාම විහාරය සඳහා දායකත්වය දැක්වූ රජවරුන් අතර ක්‍රි.ව. 946 - 954 රජ වූ සිව් වැනි උදය රජු ද වැදගත් වේ. එරජු විසින් මණිප්‍රාසාද මණ්ඩපය නැවත ප්‍රතිසංස්කරණය කර ඇත (*ibid*,53:51). එසේ ම ඔහුගේ ඇමතිවරුන් විසින් ජේතවනාරාම විහාරය සඳහා පිරිවෙණ් හතරක් පූජාකළ බව සඳහන් වේ (*ibid*,54:49 - 50). ක්‍රි.ව. 956 - 972 අතර කාලයේ රජ පැමිණි IV වැනි මිහිඳු රජු මණිමේඛලා ප්‍රාසාදයේ වැඩ අවසන් කර ඇත (*ibid*,48:49). ඔහුගේ ශිලා ලිපියකට අනුව ජේතවනාරාම විහාරය සඳහා දියසෙන් නමින් මහා පෝගෙයක් තැනූ බව සඳහන් වේ (*Ez*, vol. I: 227). ක්‍රි.ව. දස වැනි සියවසින් පසු පොළොන්නරු රාජධානි සමයේදී ලංකාවේ රජ වූ පළමු වැනි පරාක්‍රමබාහු (මහා පරාක්‍රමබාහු රජු) ජරාවාස වී තිබූ ජේතවනාරාම විහාරයේ ස්තූපය පිළිසකර කළ බව සඳහන් වේ (*Mv*, 78:102).

ශිලාලේඛන හා වංසකතා තොරතුරුවල අනාවරණය කර ඇති පරිදි රජ දරුවන් තමන්ගේ රාජ යුගවලදී ජේතවනාරාම විහාරයේ විවිධ සංවර්ධන කටයුතු සඳහා දායකත්වය දක්වා ඇති බව පෙනේ. පොළොන්නරු රාජධානි සමයෙන් අනතුරු ව නැවත වතාවක් වල්බිහි වී පැවති අනුරාධපුර පුරාණ නගරය පිළිබඳ ව



අවධානය යොමු වන්නේ බ්‍රිතාන්‍ය පාලන යුගයේදී ය. බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ දී විවිධ යටත්විජිත පාලකයන් විසින් ජේතවන ස්තූපය හා ආරාම සංකීර්ණය ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ වැඩ කටයුතු සිදුකළ බවට සාධක ඇත.

## 1.4 යටත්විජිත යුගය තුළදී ජේතවනාරාම විහාරයේ පිළිසකර කටයුතු

යටත්විජිත පාලන යුගය තුළ දී අනුරාධපුර ජේතවනාරාම විහාරය පිළිබඳ මුල්ම වාර්තා කිරීම මේජර් ෆෝබර්ස් (Major Forbes) විසින් තබා ඇත. ඔහු විසින් 1828 වසරේ දී අනුරාධපුර නගරයෙහි කරන ලද සංචාරයක දී ජේතවනාරාම ස්තූපය ඝණ කැලෑවකින් වැසී තිබුණ බව සඳහන් කර ඇත. ඔහුගේ දෙ වැනි සංචාරය 1932 දී සිදු වී ඇති අතර එහිදී මෙම ස්තූපයේ වසා සිටි කැලෑව භික්ෂූන් වහනක්සේ නමක් විසින් සුද්ද කරනු තමාට දැකගත හැකි වූ බව දක්වා ඇත. එසේ ම 1829 වසරේදී ඇද හැලුණු ධාරානිපාත වර්ෂාව නිසා ස්තූපයේ සුද්ද පවිත්‍ර කටයුතුවල නියැලී සිටි භික්ෂූන් වහන්සේ නමක් ගරා වැටුණු කොටසක් නිසා තුවාල වූ බව ද සඳහන් කර තිබේ (Ratnayake, 1984:17). එසේ ම 1833 වසරේදී මේජර් ස්කිනර් (Major Skinner) විසින් අනුරාධපුර පැරණි නගරයේ සැලසුමක් ඇඳ ජේතවන ස්තූපයේ උස අඩි 244 බව දක්වා ඇත. සර් එමසන් ටෙනට් (Emerson Tennet) විසින් එම සැලසුම උපයෝගී කරගත් බව ඔහුගේ ස්මාරක පිළිසකර කටයුතු (Monumental Work) ග්‍රන්ථයෙන් දක්වා ඇත (*ibid*).

1873 වර්ෂයේ දී සර් විලියම් ග්‍රෙගරි (Sir William Gregory) ආණ්ඩුකාරවරයාගේ කාලය තුළ දී අනුරාධපුර දාගැබ්වල උස සහ මිණුම් ලබාගෙන තිබේ (*ibid*). 1874 වසරේ උතුරුමැද පළාතේ ආණ්ඩුකාරවරයා වූ ජේ.එෆ්. ඩික්සන් (J.F Dickson) ස්තූපයේ ආයක සුද්ද පවිත්‍ර කර නැවත ගොඩනැගූ බව දක්වා ඇත. එසේ ම 1884/85 වසරේදී එස්.එම්. බරෝස් (S.M Burrows) නැගෙනහිර ආයකය කැනීම් කළ බව සඳහන් කර තිබේ. බ්‍රිතාන්‍ය ජාතික නිළධාරියෙකු වූ ෆිෂර් (Fisher) ඔහුගේ දින පොතේ

ජේතවනාරාම ස්තූපයේ ගරාවැටීම පිළිබඳ ව මෙසේ සඳහන් කර ඇත. "On 7th December 1885. A heavy slip occured on the west front of the abayagiri dagaba (Jethawana) last night damaging squre tower which has hitherto intact (MONCP.; 235).''

බ්‍රිතාන්‍ය ජාතික ආණ්ඩුකාරවරයෙකු වූ සර් ආතර් ගෝර්ඩන්ගේ (Arthur Gordon) අනුරාධපුර සංචාරවල ප්‍රතිඵලයක් ලෙස අභයගිරි දැගැබ (ජේතවන) ස්තූපයේ ගරාවැටී තිබූ හතරැස් කොටුව එහි පැරණි ස්වරූපයට අයත් ගල් ගරාදි වැටේ ආකාරයට නැවත තනා ඇති අතර එහි පැරණි චන්ද්‍රවංකය, සූර්යවංකය ආදිය ද ඒ සඳහා උපයෝගී කරගෙන ඇත. මෙම නැවත ඉදිකිරීම සඳහා ඔහු විසින් ඉතා ඝණ පාදමක් හුණු බදාම ඇසුරින් නිර්මාණය කළ බව දක්වා ඇති අතර ඔහු මෙම කාර්යය නිම කිරීම සඳහා සිරකරුවන් යෙදූ බව සඳහන් කර ඇත. එසේ ම එම කාර්යය 1890 වසරේදී නිමකළ බව ද දක්වා ඇත (*ibid*)

ජේ.එෆ්. ඩික්සන්ගේ යෝජනා අනුව ජේතවනාරාම ස්තූපයේ උමගක් හාරා එහි තැන්පත් කර ඇති ග්‍රන්ථ ගොඩගැනීමට 1887 දී ආර්.ඩබ්. ලිවර්ස් (R.W. Levers) කටයුතු කර ඇත. එහිදී ඔහුට දැකගත හැකි ය වී ඇත්තේ මුළු ස්තූපය ම ඉහළ දක්වා ගඩොලින් නිමවා ඇති ආකාරය බව වාර්තා කර තිබේ (*ibid*). බ්‍රිතාන්‍ය ජාතික වාස්තුවිද්‍යාඥයෙකු වූ ජේ.ජී. ස්මිදර් (J.G. Smither) ජේතවනාරාම ස්තූපය පිළිබඳ ව සවිස්තර වාර්තාවක් 1894 වසරේ දී ප්‍රකාශයට පත්කරන ලද (Architectural Remains Anuradhapura Sri Lanka) නමැති ග්‍රන්ථයෙන් දක්වා තිබීම ඉතා ම වැදගත් වේ. ඓතිහාසිකමය තොරතුරු ද අඩංගු කර ගනිමින් ඉතා පුළුල් අධ්‍යයනයක් කර ඇති මොහු තම කරුණු සනාථ කර ගැනීම සඳහා ස්තූපය ඇසුරින් කැනීම් කිහිපයක් ද සිදුකර ඇත. ඒ අතුරින් උතුරු හා දකුණු ආයක ඉදිරිපස ගඩොල් සුන්බුන් ඉවත් කර එහි පාදම මතු කරගැනීම වැදගත් වේ (Smither, 1884:69). ස්තූපයේ නිරිත දිග අන්තයේ පේසාව හා ගර්භය අළලා සිදු කරන ලද කැනීම්වල දී පේසාවේ උස අඩි 16 ක් බවත් එය රුවන්වැලි සෑයට සමාන ලෙස පඩි පෙළක ආකාරයට තනා තිබෙන බව හා එය අඩි 7ක පළලින් යුක්ත බව පෙන්වා දී තිබේ.



එසේ ම ස්තූපයේ පාදම, ගර්භය, හතරැස් කොටුව, කොත්කැරැල්ල යන ස්ථානවල මිණුම් ස්මිදර් දක්වා තිබීම ඉතා වැදගත් වන්නේ ඔහු දක්වා ඇති ඡායාරූපවලට අනුව ස්තූපයේ පැරණි ස්වරූපය එයින් විද්‍යමාන වන බැවිනි. මෙයට අමතර ව ආයකවල කැටයම් පිළිබඳ විස්තර හා ඒවායේ සැලසුම් ද ස්තූපයේ සැලසුම් ද ස්මිදර් ඇඳ තිබීම වැදගත් බව පෙන්වාදිය හැකි ය (*ibid*; 69 - 73). දහ අට වැනි සියවසින් පසු එළඹෙන දහ නව වැනි සියවස මුල් වකවානුවේ දී ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් වූ එච්.සී.පී. බෙල් විසින් 1890 වසරේ අනුරාධපුරයට පැමිණීමෙන් අනතුරු ව නටඹුන් ආශ්‍රිත ප්‍රදේශයේ ගවේෂණ කටයුතුවල නියැලී ඇත. ප්‍රථමයෙන් ඔහු විසින් ගවේෂණ කටයුතු පිළිබඳ වාර්තාවක් රජයට ඉදිරිපත් කර ඇති අතර එමඟින් අනුරාධපුරයෙහි අංග සම්පූර්ණ ගවේෂණ හා කැනීම් කටයුතු සිදුකළ යුතු බවට ද රජයට යෝජනා කර ඇත. අනුරාධපුරයෙහි ගවේෂණ සහ කැනීම් කටයුතු සඳහා බෙල් මෙම ජේතවන භූමි ප්‍රදේශය කොටස් 9 කට බෙදා ඇත. එය ඉංග්‍රීසි හෝඩියේ A, B, C, D, E, F, G, X, Y වශයෙන් දක්වා තිබේ. ඔහුගේ මෙම බෙදා වෙන්කිරීම අනුව ජේතවනාරාම ආශ්‍රිත ප්‍රදේශයේ වැඩ කටයුතුවල පහසුව සඳහා එම කොටස නැවතත් කොටස් 4 කට බෙදා ඇත.

1. පළමු වැනි කොටස - ස්තූපයට පිටරවුම් පාර හා ත්‍රිකුණාමලය පුත්තලම මාර්ගය අසල කොටසින් සීමාවේ.
2. දෙ වැනි කොටස - ස්තූපයේ බටහිර හාල්පානු ඇළ දක්වා ප්‍රදේශය මෙම කොටස උතුරෙන් පිළිම ගෙය, දකුණින් පිටරවුම් පාරෙනුත් සීමා වේ.
3. තුන් වැනි කොටස - ස්තූපයේ නැගෙනහිර කොටස. මෙය දකුණින් ත්‍රිකුණාමලය අනුරාධුපර මාර්ගයෙන් සීමා වේ.
4. හතර වැනි කොටස - අනුරාධපුර ත්‍රිකුණාමල මාර්ගයෙන් දකුණින් පිහිටි ප්‍රදේශය වේ.

මෙම කොටස්වලින් ඔහු මුලින් ම ගවේෂණ කටයුතු ආරම්භ කර ඇත්තේ පළමු වැනි කොටසේ ය. 1890 වන විට මෙම කොටස පුද්ගලික ඉඩම් හිමියන් සතු ව පැවති බවත් එහෙත්

ඔවුන් නටඹුන්වලට හානි පමුණුවා නොතිබුණු බව ද සඳහන් කරන බෙල් එකී ඉඩම් හිමියන් සිය ඉඩම්වල සීමාවන් ලකුණු කිරීම සඳහා එහි කැඩී බිඳී ගිය ගල් ගෙන ගොස් ඇති බව ද සඳහන් කරතිබේ. (*ASCAR*, 1890).

ජේතවනාරාම විහාරයට අයත් ගොඩනැගිලිවලින් බෙල් පාදාගත් ප්‍රථම ගොඩනැගිල්ල වූයේ පොහොය ගෙයයි. මෙය ඔහු සිය වාර්තාවන්හි A ගොඩනැගිල්ල ලෙස නම් කර ඇත. ත්‍රිකුණාමලය නුවර මාර්ගයට සමීප ව දේශීය තානායමේ සිට මීටර් 200 ක් දුරින් මෙම ගොඩනැගිල්ල පිහිටා ඇති බව ඔහු වාර්තා කර තිබේ. ඔහුගේ වාර්තාවට අනුව මෙහි පිහිටා තිබුනු ගල් කණු දළ වශයෙන් දිගු හතරැස් වූ අතර ඒවා ගෙබිම මට්ටමින් අඩි 6 ක් පමණ උසට දක්නට ලැබී තිබේ. මෙය අඩි 100 ක් දිග අඩි 50 ක පළල වූ ගොඩනැගිල්ලක් බව සඳහන් කරන බෙල් මෙහි කණු පිහිටා තිබූ ආකාරය අනුව මෙම ගොඩනැගිල්ලේ බිම්මහල ගබඩා කාමර ලෙස භාවිත කරන්නට ඇතැයි ද උපකල්පනය කර තිබේ. මෙම ගොඩනැගිල්ලට බටහිර පසින් සම්බන්ධ කොටස ආලින්දයක් ලෙස ඔහු හඳුනාගෙන ඇත. එමෙන් ම මෙම සැලැස්මට සමාන වෙනත් ගොඩනැගිල්ලක් ජේතවනාරාමය තුළ නොමැති බව ද බෙල් සඳහන් කර ඇත (*ibid*,1890).

ඉන් අනතුරු ව බෙල් විසින් ගවේෂණය කර ඇත්තේ බෞද්ධ ගල්ගරාදි වැට නමැති ගොඩනැගිල්ලයි. පිට රවුම් පාරට සමීප ව දාගැබට දකුණින් මෙම ස්ථානයේ තිබූ පඳුරු කපා දැමීමෙන් අනතුරු ව මෙම ගොඩනැගිල්ල ඔහු සොයා ගෙන ඇත. ගල්ගරාදි වැටේ දිග අඩි 140 ක් හා පළල අඩි 110 ක් වන බව සඳහන් කරන බෙල් මෙහි තිබී හමු වූ කණු හිස් පංචාස්‍රාකාර හැඩයෙන් යුත් බව ද සඳහන් කර තිබේ. ගරාදි වැට අසල වැටී තිබී හමු වූ ගොඩනැගිල්ලෙහි නිරිත දිගෙහි ගරාදි පිහිටිය යුතු අයුරින් සකස් කළ බව ද ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත. මෙම ගොඩනැගිල්ලේ ගිනිකොණ අන්තය කැනීම් කිරීමේ දී ගරාදිවල පදනම් වූ බොරදම් සහිත කොටස් ඒවා පිහිටි ස්ථානයත් හමු වී ඇත. තවත් ගරාදි කොටස් ගොඩනැගිල්ල සමීපයෙහි හමු වී ඇත. මෙම ගොඩනැගිල්ල චෝල ආක්‍රමණ නිසා විනාශ වන්නට ඇතැයි ඔහු සඳහන් කරයි. එක් අන්තයක සිට අනෙක් අන්තයට



කැනීම් කිරීමේ දී ගොඩනැගිල්ලේ පාදමට ළඟා වීමට ඇතැම් ස්ථානවල අඩි 12 ක් ගැඹුරට කැනීම් කිරීමට ඔහුට සිදු වූ බව ද බෙල් සඳහන් කර ඇත (*ibid*,1890 - 1891).

බෙල් විසින් ජේතවන විහාරයේ කැනීම්වලට භාජනය කරනු ලැබූ නටඹුන් ගොඩනැගිලි අතර අංක 01 ලෙස නම්කර ඇති පිළිම ගෙය ද කැනීම් කර ඇත. මෙම ගොඩනැගිල්ලේ උතුරු දිශාවේ ප්‍රධාන දොරටුවල ද සෙසු තැන්වල ඇතුළුවීමේ දොරටු තුනක් වූ බව ඔහු සඳහන් කර තිබේ. වේදිකාවක් මත ඉදිකර ඇති මෙම පිළිම ගෙය මධ්‍යයේ පූජාසනයක් වන බව ද සඳහන් කර ඇති අතර එහි පාදම් නෙළුම් කොළ සිහිත ලියවැලින් අලංකාර වී ඇති බව ද දක්වා තිබේ. ගොඩනැගිල්ල ඇතුළත පේළි තුනකට හුණුගල් කණු හැටක නටඹුන් හමු වූ බව ද බෙල් සඳහන් කර තිබේ (*ibid*,1891). 1892 වර්ෂයේ දී බෞද්ධ ගල් ගරාදි වැට නමැති ගොඩනැගිල්ලේ කැනීම් කටයුතු සිදු කර ඇත. එහිදී පහත සඳහන් තොරතුරු හෙළි කරගත හැකි වූ බව බෙල් වාර්තාවල දක්වා තිබේ.

01 ගල් ගරාදි වැට ගොඩනැගිල්ලේ දිග අඩි 138 ක් වන අතර පළල අඩි 112 කි.

02 ගරාදි කොටස් තුනකින් සමන්විත ය. එනම් කුළුණු හිස, සිරස් ගරාදි කණු හා බොරදමයි. මෙම බොරදම ද කොටස් පහකි. මෙය ඉන්දියාවෙන් හමුවන බෞද්ධ ගල් ගරාදිවලට සමාන වුව ද එහි මෙන් මෙම ගරාදිවල කැටයම් දැකිය නොහැකි ය.

03 ඇතුළුවීමේ දොරටු සිව් දිසාවෙන් ම තිබී ඇත. බටහිර හා නැගෙනහිර දොරටු පමණක් ගොඩනැගිල්ලෙහි හරි මැදට වන්නට පිහිටා ඇත.

04 පඩි පෙළින් ඇතුළත අඩි 6 ක් පළල ගල් වේදිකාවක් ගොඩනැගිල්ල වටා යයි.

05 ඇතුළත ගල් කණු 88 ක් තිබෙන්නට ඇති අතර ඉන් 54 ක් නිදහස් ව තිබී ඇත.

06 ගරාදි වැට මධ්‍යයේ වූ ගඩොල් ගොඩනැගිල්ල මධ්‍යයේ සිට එහි දකුණු බිත්තිය හරහා ඉදිරියට විහිදී යන කාණුවක් දැකිය හැකි ය (*ibid*,1892).

මෙම ස්ථානයේ කැනීම්වලින් අනතුරු ව පොහොය ගෙය (ගොඩනැගිල්ල A) යළිත් ඔහු කැනීම් කර ඇත. මෙම ගොඩනැගිල්ල ජේතවනාරාමයෙහි ප්‍රධාන පිරිවෙණ හෝ භික්ෂුවගේ නේවාසිකාගාර විය හැකි බව සඳහන් කර තිබේ. ගොඩනැගිල්ලට ඇතුළුවීමේ දොරටු උතුරු දිශාවෙන් ද නිරිත දිගින් ද වූ බව සඳහන් කරන බෙල් එම ගොඩනැගිල්ලට පෝටිකෝවක් ද තිබී ඇති බව වාර්තා කර තිබේ. මෙම ගොඩනැගිල්ල ඉදිරිපසින් වූ ප්‍රාකාර ද්වාරය ද බෙල් කැනීම් කර ඇති අතර ප්‍රාකාරයේ ද්වාරය ප්‍රාකාරය මධ්‍යයට වන්නට ඉදිකර තිබූ බව ද එය අඩි 51 × 53 ප්‍රමාණයෙන් යුතු ද්වාරයක් බව ද සඳහන් කර තිබේ. මෙම ද්වාරයේ පඩිපෙළේ මුදුනේ මුරගල්හි වාමන රූප කැටයම් කර ඇති බව ද ඔහු පෙන්වා දී ඇත (*ibid*,1892).

ප්‍රාකාරයට පිටතින් සහ බටහිරින් පිහිටි ගොඩනැගිල්ල ඉන් අනතුරුව බෙල් කැනීම් කර තිබේ. මෙය පිළිම ගෙය අංක 02 ලෙස නම්කර කර ඇත. මෙම ගොඩනැගිල්ලේ සැලැසුම් පිළිම ගෙය අංක 01 ගොඩනැගිල්ලේ සැලසුමට සමාන බවත්, ගොඩනැගිල්ල දිගින් අඩි 83 ක් හා පළලින් අඩි 66 ක් වන බව ද ඔහු සඳහන් කර තිබේ. මෙහි දැකිය හැකි ගල් කණු ශේෂ අනුව වහලය ගල් කණු 72 ක් මත දරා තිබෙන්නට ඇතැයි බෙල් උපකල්පනය කර තිබේ (*ibid*).

මෙම කොටසට අයත් අවසන් ගොඩනැගිලි සංකීර්ණය වූ පිට රවුම් පාරට සමීප වූ පංචාවාස ගොඩනැගිල්ලක් ද බෙල් කැනීම් කර ඇති අතර ඔහු විසින් අඳින ලද සැලැස්මේ මෙම ගොඩනැගිල් E ගොඩනැගිලි සංකීර්ණය ලෙස දක්වා තිබේ. මෙහි පළමු වැනි කොටස ඇතුළත පොහොය ගෙයට බටහිරින් පොකුණක් ද ඇති බව බෙල් සඳහන් කර තිබේ.

ඉන් අනතුරු ව බෙල් විසින් දෙ වැනි කොටසෙහි ගවේෂණ හා කැනීම් කටයුතු ආරම්භ කර ඇත. මෙම කොටස හාල්පානු ඇළ සහ දාගැබෙන් සීමා වෙයි. අදාළ වසරෙහි දෙසැම්බර්



වනවිට ගොඩනැගිලි 50 ක් පමණ ඔහුට සොයා ගැනීමට හැකි වූ බව ද E කොටසෙහි තිබී ගඩොලින් නිම වූ විශාල පිළිම ගෙයක් සොයා ගත් බව ද සඳහන් කරන අතර එම ගොඩනැගිල්ල පොළොන්නරුවෙහි දැකගත හැකි ගොඩනැගිලිවලට සමාන බව ද ඔහු දක්වා තිබේ. මෙම E කොටස කැනීම් කිරීමේ දී බෙල් අනුරාධපුරයෙහි නොසිටි අතර කැනීම් අධිකාරී වික්‍රමසිංහ එම කාලයේ කැනීම් කටයුතු භාර ව සිට ඇත. මෙහිදී හමු වූ ගොඩනැගිලි, සැලැස්ම අනුව C, D, E, F සංකීර්ණ සහ පිළිම ගෙය ලෙස නම් කර ඇත. මෙයින් විශාලතම සංකීර්ණය වූයේ C ගොඩනැගිලි සංකීර්ණයයි. නෙළුම් මල් සහිත සඳකඩ පහණක් ද මනරම් දොරටුපාල රූප සහිත මුරගල ද මෙහි දැකිය හැකි බව ඔහු සඳහන් කර තිබේ (*ibid*).

ගොඩනැගිලි අංක 2 D හි ගොඩනැගිලි 12 ක් බෙල් මතුකර ගෙන ඇත. ගොඩනැගිලි අංක E හි ගොඩනැගිලි 6 ක් මතු කරගෙන ඇත. මෙම කොටසෙහි මෑතක දී ඉදිකරන ලද කොළරා රෝහල ඉදිකර ඇති බව ද බෙල් වාර්තා කර තිබේ. එම කොටසෙහි පිහිටි වැදගත් ම ගොඩනැගිල්ල පිළිම ගෙයයි. මෙය ගෙඩිගෙයකි. කැනීමට ප්‍රථම මෙහි අඩි 8 ක් උසට වර්ග යාර 10 ක ප්‍රදේශයක් පස්වලින් පිරී තිබී ඇත. මෙය පොළොන්නරුවේ වාස්තුවිද්‍යාවට අයත් ගොඩනැගිල්ලක් බව සඳහන් කරන බෙල්, මැදගෙය වර්ග අඩි 32 කින් ද යුතු වූ බවත්, බිත්ති අඩි 5 ක ඝණකමකින් යුතු බව ද උළුවස්ස අඩි 26 ක් පමණ උස බව ද සඳහන් කර තිබෙන අතර එහි වූ යන්ත්‍ර ගල වර්ග අඩි 12 ක ප්‍රමාණයෙන් යුත් කොටස් 25 කින් සමන්විත බව ද පෙන්වා දී ඇත. ගොඩනැගිල්ලේ ස්වරූපය අනුව මෙහි තිබෙන්නට ඇතැයි සැක කරන බුදු පිළිමය අඩි 26 අඟල් 6 ක් පමණ උස් විය හැකි යැයි ද ඔහු උපකල්පනය කර තිබේ (*ibid*).

ජේතවන ආරාම සංකීර්ණයට අයත් තුන් වැනි කොටස නැතහොත් දාගැබෙන් නැගෙනහිර කොටස බෙල් විසින් කැනීම් කර පාදාගෙන ඇත. මෙම කොටස මල්වතු ඔය වම් ඉවුරේ සිට ස්තූපය අසල කොටසට ආසන්න වේ. මෙම කොටසේ ගොඩනැගිලි 40 ක පමණ නටඹුන් හමු වී තිබේ. ගොඩනැගිලි සැලසුම් එකක් මෑත කාලයට අයත් ස්වරූපයක් ගන්නා අතර

වට ප්‍රාකාර බැමි ඒ සඳහා පිහිටා ඊට සම්බන්ධ ව තිබූ බව ද ඔහු සඳහන් කර ඇත (*ibid;* 1893).

මෙම කොටසෙහි උතුරින් ම පිහිටි ගොඩනැගිලි සංකීර්ණය ඔහුගේ සැලසුමට අනුව G ලෙස ද එයට පහළින් කොටස H ලෙස ද ඊට දකුණින් පිහිටි ගොඩනැගිලි සංකීර්ණය I ලෙස ද එයට දකුණින් පිහිටි කොටස J ලෙස ද ඉන් අනතුරු ව දානශාලාව ද අවසන් වශයෙන් පිහිටි ගොඩනැගිලි සංකීර්ණය K ලෙස ද බෙල් විසින් බෙදා දක්වා ඇත. G ගොඩනැගිලි සංකීර්ණය තුළ ගොඩනැගිලි 7 ක් වූ බවත් එහි ප්‍රධාන ගොඩනැගිල්ලේ පඩිපෙළ මුදුනෙහි පුන්කලසක් වූ බව ද සඳහන් කර තිබේ. H ගොඩනැගිලි අංගණය ප්‍රමාණයෙන් විශාල ය. මෙහි පිවිසුම් දොරටු ඇතුළු ගොඩනැගිලි අංග 10 ක් පිහිටා තිබේ. මේවා උසස් නිමාවකින් යුක්ත වන අතර ද්වාර මණ්ඩපයට සමාන තවත් දොරටුවක් එහි ඇති අතර මධ්‍ය ගොඩනැගිල්ලෙහි පඩි සඳහා වාමන රූප කැටයම් කර තිබූ බව ද ඔහු වාර්තා කර තිබේ. J ගොඩනැගිලි සංකීර්ණයට ඇතුලුවීමට තිබූ දොරටු විශාල ය. මධ්‍ය ගොඩනැගිල්ලෙහි ඇති මුරගලෙහි නයි පෙණ 9 ක් සහිත දොරටු පාල රූපය ද වාමන රූප ද දැකිය හැකි බව දක්වා තිබේ (*ibid*).

ජේතවන විහාරයේ දානශාලාවේ දිග අඩි 96 කි. මෙය මැදමිදුලක් සහිතව නිර්මාණය කර ඇති අතර එය දිගින් අඩි 54 ක් හා පළලින් අඩි 40කි. ගල්කණුවල පිහිටීම අනුව වහලය මැද මිදුලට බෑවුම් ව තිබෙන්නට ඇති අතර මෙම වහලය සඳහා ගල් කණු 114 ක් තිබී ඇත. මෙහි බත් ඔරුව නැගෙනහිර පැත්තේ පිහිටා තිබේ. විශාල ඔරුව අඩි 36 ක් දිග අතර කුඩා ඔරුව අඩි 9 ක් දිගු වේ. නූතන මහා මාර්ගය ගොඩනැගිලි අංක K හරහා වැටී ඇත. මෙහි ද්වාර ගෘහය අඩි 53 ක් දිග හා අඩි 40 ක් පළල විය. මෙම ගොඩනැගිලි පංචායතන සැලැස්මට අනුව නිම වී ඇත. මෙම කොටස තුළ ගොඩනැගිලිවලට අමතර ව දකුණු පැත්තෙහි තවත් ගොඩනැගිල්ලක් පිහිටා තිබේ. ප්‍රධාන ගොඩනැගිල්ලට පිටුපසින් හා දකුණින් පිහිටිය යුතු ගොඩනැගිල්ල හරහා ප්‍රධාන මාර්ගය වැටී ඇත (*ibid*).

ජේතවනාරාමයට අයත් හතර වැනි කොටස පුත්තලම් ත්‍රිකුණාමල මාර්ගයට දකුණින් පිහිටා ඇත. මහා මාර්ගයට




ආසන්නයේ ම දැකිය හැකි ගොඩනැගිලි සංකීර්ණය බෙල් සැලැස්මට අනුව L ලෙස දක්වා තිබේ. එයට ගොඩනැගිලි 18 ක් අයත් වන අතර ප්‍රධාන පංචාවාස සැලැස්මට අමතර ව දෙපසින් තවත් ගොඩනැගිලි මෙයට සම්බන්ධ වේ. මෙම L සංකීර්ණයේ ගොඩනැගිලි සඳහා ආලින්දයක් දැකිය හැකි ය. මෙම කොටසෙහි පිහිටි එක් ගොඩනැගිලි සංකීර්ණයක් සඳහා ඉදිරිපසින් අමතර ගොඩනැගිලි දෙකක් එකතු කර ඇත. එයට බටහිරින් පිහිටි කොටස O ලෙස නම් කර තිබේ. මෙයට ඇතුළත් ඇතැම් ගොඩනැගිලි ගබඩා ගෙවල් ලෙස හෝ විනිශ්චය ශාලා ලෙස භාවිත කරන්නට ඇතැයි බෙල් අදහස් කරයි. එසේ නොමැති නම් මෙම ගෘහයන් විශේෂ භික්ෂූන් සඳහා ඉදිකළ ඒවා වන්නට ඇතැයි ද ඔහු උපකල්පනය කර තිබේ. මෙම කොටසට අයත් විශාල පිළිම ගෙය අයත් ගොඩනැගිලි සංකීර්ණය බෙල් සැලැස්මේ M ලෙස දක්වා ඇත. මෙය පුත්තලම ත්‍රිකුණාමල මාර්ගයට ආසන්නයෙහි ම පිහිටා තිබේ. මෙහි පිළිම ගෙය ගෙඩිගෙයක් වන්නට ඇතැයි බෙල් අදහස් කරන අතර එය ඉදිරිපස ද ගොඩනැගිලි දෙකක් පිහිටා ඇති බව වාර්තා කර තිබේ (*ibid*).

ජේතවනාරාම ආරාම සංකීර්ණයේ ගවේෂණ හා කැනීම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව බෙල් සිය අවධානය දාගැබට යොමු කර තිබේ. දාගැබ ආශ්‍රිත ව ඔහු සිදුකළ කාර්යයන් පහත සඳහන් ලෙස වාර්තා වේ.

1. වාහල්කඩ සතර සකස් කිරීම
2. පඩිපෙළ සකස් කිරීම සහ ප්‍රාකාරා දෙක පිරිසිදු කිරීම.
3. ආයක සහ පේසා වළළු පිරිසිදු කිරීම
4. වාහල්කඩ සතර කැනීම් කර තහවුරු කිරීම
5. දාගැබෙහි අත්තිවාරම පරීක්ෂා කිරීම (මෙය අඩි 26 ක් ගැඹුරෙහි සිට ගඩොලින් නිමවා තිබුණ බව සඳහන් කර ඇත)
6. මළුවෙහි දකුණු කොටසෙහි ගස් උදුරා පිරිසිදු කිරීම.
7. මළුවෙහි වයඹ දිග අන්තයෙහි පිහිටි ගොඩනැගිලි කැනීම් කිරීම.

(*ibid*,1894) ආදී වශයෙන් 1890 වර්ෂයේ සිට 1894 දක්වා කාලය තුළ අවසන් කළ බව සඳහන් කර තිබේ. මීට පසු ව නිකුත් කරන ලද පුරාවිද්‍යාත්මක වාර්තාවන්හි ජේතවනාරාමය තුළ සිදුකළ කාර්යයන් සඳහන් නොවේ. ඉන් අනතුරු ව සිදුකර ඇත්තේ නඩත්තු කිරීම් හා පිරිසිදු කිරීම් කටයුතු ය. මෙම පාලන වාර්තාවල ජේතවනාරාමය අභයගිරිය වශයෙන් හඳුන්වා තිබීම ද විශේෂ වේ.

මින් අනතුරු ව ජේතවනාරාම විහාරය පිළිබඳ ව අධ්‍යයනයන් සිදු කර ඇති උගතුන් අතර සේනක බණ්ඩාරණායක වැදගත් වේ. ඔහු විසින් මෙම විහාරයේ ගොඩනැගිලි පිළිබඳ ව අධ්‍යයනයක් සිදුකර ඇත (Bandaranayake;1974:53-57). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ 1980 දක්වා පැවති ජේතවන විහාර සංකීර්ණය 1981 සිට මධ්‍යම සංස්කෘතික අරමුදල හා යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ හේම රත්නායක යටතේ ද 2000 වසරේ සිට සුදර්ශන් සෙනෙවිරත්න යටතේ ද 2009 වසරේ සිට පියතිස්ස සේනානායක යටතේ ද පර්යේෂණ කටයුතු දියත් කරගෙන යමින් නව තොරතුරු විශාල ප්‍රමාණයක් මේ වන විට අනාවරණය කර ගෙන ඇත.



ස්මිද්ර්ගේ සැලසුම අනුව ජේතවන ස්තූපයේ හැඩය

දෙ වැනි

පරිච්ඡේදය

# මහා සීමාව සහ මහා විහාරයේ සීමාව

ජේතවනාරාම විහාරයේ සැලැස්ම අධ්‍යයනයේ දී එහි පුරාණ සීමාව අධ්‍යයනය කිරීම ද ඉතා ම වැදගත් වේ. වර්තමානයේ දක්නට ලැබෙන ආකාරයට මෙම මහා පරිමාණ ස්තූපය සහිත ජේවනාරාම සංඝාරාම සංකීර්ණය නැගෙනහිරින් හා දකුණින් මල්වතු ඔයෙන් ද බටහිරින් හාල්පානු ඇලෙන් ද උතුරින් මහා මාර්ගයෙන් ද සීමා වී ඇත (වික්‍රමගමගේ, 1995:137). මෙම ආරාම සංකීර්ණයේ වර්තමාන සීමා මෙසේ තිබුණ ද එහි පුරාණ සීමා හඳුනාගැනීමේ දී මහා සීමාව සහ මහා විහාර සීමාව හඳුනාගැනීම ඉතා වැදගත් වන බව පෙන්වාදිය හැකි ය. මහාවංසය, සිංහල බෝධිවංසය, දීපවංසය ආදී මූලාශ්‍රයවල සඳහන් වන ආකාරයට මිහිඳු මා හිමි මුලින් ම පිහිට වූ මහා සීමාව කදම්භ නදියේ පාෂාණ තිත්ථයෙන් ආරම්භ කර, කුම්භාකාර ආවාට, මහාදූව, කුඹුක් පෙළ, මහ මළුව කුදුමීරුක, මුරුත පොකුණ, විජයාරාම නම් උයනේ උතුරු දොර කොටුව ගජකුම්බ නම් ගල, කොග්ගල, මහාසෝන මැදට, දිගුපහණට ගොස් කම්මකාර දේවතාගේ බඩහැලට වමින් නුග මළුවට, දියවස් බමුණාගේ දෙවොලට, එතනින් නෙළුම් පොළට, තාලචතුස්කයට, එතැනින් අස්මඩුල්ලට, එයට වමින් සසවනයට, එතැනින් බොරළු තොටට, එතනින් මත්තෙහි නදියට හා නැවත පහණ තොටට පැමිණ සීමා නිමිති ගැළපූ බව මහාවංසයේ සඳහන් වේ (මව, 15:200 - 210). දීපවංසයේ සඳහන් වන තොරතුරු ද ඉහත සඳහන් සීමා සම්මත කිරීම් හා ගැළපේ (දීව,14:28 - 38). මෙම කරුණු සිංහල බෝධිවංසයේ ද සඳහන් වෙයි (සිබෝව, 202 - 203).

මහා සීමා ගමන් මාර්ගය පිළිබඳ විමර්ශනයක යෙදෙන හෙට්ටිආරච්චි මෙසේ විස්තර කර තිබේ. අභය වැව පණ්ඩුකාභය රජතුමා කරවූවකි. එය ඉතා පැරණි වැවකි. සීමා මාර්ගය වැව් දිය

මතින් ගිය බවක් සඳහන් නොවේ. අභය වැව බටහිර කෙළවරින් සීමා වන උතුරට හැරුණු හැම තැන ම කොග්ගල විය යුතු ය. පණ්ඩුකාභය රජු අනුරාධපුර නගරය සැලසුම් කිරීමේ දී චන්ඩාලයින් සඳහා සොහොනක් පිහිට වූ බවත් නිගන්ථාරාමයක් කරවූ බවත් මහාවංසය සඳහන් වේ. ඒවා පිහිටි ස්ථානය තීරණය කිරීමට පණ්ඩුකාභය රජු නගරයේ බටහිර පවුරෙන් පිටත වූ ප්‍රදේශයක පිහිට වූ ආයතනයන් සොයා බැලීම වැදගත් වේ. රජු බටහිර දොරටුව පැත්තේ පිහිට වූ ආයතන 7 ක් ගැන මහාවංසයේ සඳහන් වේ. මෙයින් 5 ක් ම ආගමික හා පොදු ගොඩනැඟිලි නිසා නගරයට ආසන්න ව ම පිහිටු වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. වධයට නියම වූවන් ඝාතනය කරන දංගෙඩිය නගරයට තරමක් ඈතින් බටහිරින් ද ඊටත් බටහිරට වන්නට මහා සුසානය පිහිට වූ බව ද පෙනේ. මහා සුසානය පිහිටුවා එහි කටයුතු කිරීමට යෙදූ චණ්ඩාලයින්ට වයඹ දිගින් කරවූ ගම හෙල්ලොලි (හැළලි) නමින් ප්‍රසිද්ධ විය. දැනට අභය වැවෙන් එගොඩ වැව් කෙළවරක වයඹ දිගින් පධානඝර සහිත තපෝවනය ආරම්භ වේ. තපෝවනයේ විසූයේ පාංශුකූලික භික්ෂූන් ය. ඔවුහු සොහොනින් අහුලාගත් වස්ත්‍ර දරණ බැවින් පාංශුකූලික නම් වූවා යැයි කිය වේ. එසේ නම් මහා සුසානයට වයඹ දිගින් හෙල්ළාලි ගම පිහිටිය යුතු ය. හෙල්ළොලි ගමට ඊසාන දෙසින් නැගෙනහිර දෙසින් නීච සුසානය වෑ මියරේ උතුරු දෙසට බර ව නැගෙනහිර පැත්තේ පිහිටියේ යැයි තීරණය කළ යුතුය (*Ac*.No. 06: 183) .

මහා නුගයට උතුරින් පුර දෙවොල විය. කොළොම්බ හාලක නම් ස්ථානයේ කඳවුරු බැඳගෙන සිටි හල්ලුක හා සටනට ගිය දුටුගැමුණු රජුගේ ඇතා සෙමින් සෙමින් පසු බැස ඇවිත් මහා සීමාව තුළ නොසැලී සිටිය බව මහාවංසයේ හා මහාවංස ටීකාවේ සඳහන් වේ. උතුරේ සිට දකුණට පසු බසින විට සොහොන මැද දී මහා සීමාව හමු වුණි නම් මේ ප්‍රදේශයේ දී සීමාව නැගෙනහිරට බර ව ගිය බව පවසන හෙට්ටිආරච්චි ඊළඟ සීමා ඉම වශයෙන් දීඝ පාෂාණය දක්වා තිබේ. මහා සීමාව සැඩොල් ගම වම් පැත්තෙන් ගොස් සුසානයට පැමිණි බව මහාවංසයේ සඳහන් වේ. දීඝ පාෂාණය මහා බෝධිවංස ගැටපදයේ දැක්වෙන්නේ දිගුගල් විල නමිනි. දිගු ගල් තලාවක් විලක ඉවුරක් දිගේ විහිදී



ගොස් ඇති නිසාත් ඒ විලට දිගු ගල් විල යැයි ව්‍යවහාර වන්නට ඇති බව උපකල්පනය කළ හැකි බව හෙට්ටිආරච්චි පෙන්වාදී තිබේ. බුලංකුලම වැවේ දකුණු කෙළවර නිරිත දිග ඉවුර ඔස්සේ මෙවැනි විශාල ගල් තලාවක් විහිදී යයි. එහි දිගු ගල් විල විය යුතු බව හෙට්ටිආරච්චිගේ මතයයි (*ibid*:184-185).

මහා සුසානය මැදින් නැගෙනහිරට බර ව ආ සීමාව සැඩොල් ගම මග හැරීමට බුලංකුල වැවේ (ගාමිණීවාපි) දකුණු කෙලවරේ තුඩුව පසුකර යාමටත් නැගෙනහිරින් නැමුණේ ය. මෙසේ ඉදිරියට ආ සීමාව කර්මාර දේවතා විමානයට වම්පසින් බුලංකුලම වැවේ දකුණු කෙළවර නැගෙනහිර අතට යන්නේ දකුණු පසින් නටඹුන් ගොඩනැගිලි සහිත භූමියකි. මේ භූමිය මාලිගය ලෙස පරණවිතාන පවසති. මෙය ගැටපදයේ එන මහාපාණන්ගේ භූමිය හා ගැළපෙන බැවින් අනුරාධපුර සමයේ යුව රජවරුන් විසූ මේ ස්ථානය සෙල්ලිපිවල '**හුලීගම**" ලෙසින් ද චූලවංසයේ "**සිත්ථගාම**" ලෙස සඳහන් වී ඇති බව හෙට්ටිආරච්චි පෙන්වා දී තිබේ (*ibid*:185). කර්මාර දේවාලෙන් පසු ව සීමාව පැමිණියේ නීච සුසානයට ය. බුලංකුලම වැවේ නැගෙනහිර නීච සුසානය බව කල්පනා කළ හැකි ය (*ibid*). මෙය නීච සුසානය බව දැක්වීමට සාධක ලෙස ගැටපදයේ දක්නට ලැබෙන පරිදි නීච සුසානය තිබූ තැන ගැටපදය ලියන කාලයේ වවුල් පොකුණ හෙවත් මස්තොට පොකුණ නමින් ව්‍යවහර කරන පොකුණ විය යුතු බව හෙට්ටිආරච්චිගේ මතය වේ. මස්තොට පොකුණ යැයි කියත් මෙය බුලංකුලම වැවට නැගෙනහිරින් වූ බිමේ උතුරු කොටසේ දක්නට ලැබෙන විශාල පොකුණ විය හැකි අතර එය බෙල් කැනීම් කර 1911-1912 වාර්තාවලට සැලසුමක් ද සපයා තිබේ. මෙහි ඉවුර හොඳින් ඇතත් ජලයෙන් හිස් ය. මෙය මස්තොට පොකුණ ලෙස හඳුනාගැනීම වැදගත් බව හෙට්ටිආරච්චිගේ මතයයි. පොකුණ පසුකළ පසු හමුවන්නේ පිරිවෙණ බවත් මස්තොට පොකුණ හා මාපා මාලිගාවත් අතර භූමියේ එනම් බුලංකුලම වෑ මියරයෙන් නැගෙනහිර ප්‍රදේශය පුරාණ නටඹුන් කිසිවක් හමු නොවේ. පෙර සුසාන භූමිවල ස්මාරක ඉදිකිරීමේ සිරිතක් නොවිණි. ඒ නිසා මෙය නීච සුසානය බව තීරණය කිරීමට හොඳ සාක්ෂියකි (*ibid*).

නීච සුසානයෙන් සීමාව ගියේ සීමා නුගයට ය. ගැටපදයේ විස්තර වන්නේ සීමා නිග්‍රෝධ ව ඉන් සීමා නුගයට ගියේ වර්තමාන අභයගිරි වෙහෙර මස්තොට පොකුණ ලෙස හඳුනාගත හොත් පොකුණේ උතුරේ ඊට යාව පිහිටි පිරිවෙණ වශයෙන් මස්තොට හඳුනාගත හැකි ය. මේ පිරිවෙණ් ස්ථානයේ සීමා මගේ ඉමක් වූ නුග ගසක් දෙවනපෑතිස් රජු දවස පැවතිණ. මේ නුගය අද දක්නට නැතත් නුගේ පැවති බවට සලකුණක් තිබේ. පිරිවෙණේ බටහිර පවුර සමගම අඩි 15ක් උසට මාලකයක් ඇත. ගල් කණු කිහිපයක් මැදී වී ඇති මේ මාලකයේ ඉවුරු උස්කර බැඳ ඇත. මාලකය මත ගොඩනැගිල්ලක නටඹුන් දැකිය නොහැකි ය. එයට නැගීමට පඩි පෙළක් ද නැත. එහෙයින් වන්දනා මාන සඳහා යමක් තිබුණු බව සිතීමට ද ඉඩ නැත. ඒ නිසා මෙය බෝකොටුවක් ලෙස තීරණය කළ නොහැකි ය. මේ කරුණු මත මේ සීමා නුගයේ මාලකය විය හැකි බව හෙට්ටිආරච්චි සඳහන් කර තිබේ (*ibid*:186).

මින් පසු සීමාව ගියේ හීයගල්ලේ දියවාස බමුණාගේ දෙවොලේ ගිණිකොණට ය. ගැටපදයේ දැක්වෙන පරිදි එය අභයගිරි මහා සැය පිහිටි තැනයි. දෙවොල ගිනිකොණ අභයගිරි සෑයේ ඇත් පවුර පිහිටි තැන බව බෝධිවංස ගැටපදය අනුව පෙනේ.. බෙල් අගනේ සිට අභයගිරි ඇත් පවුරට සීමාව යාමේ දී ජෝතියගිරි, කුම්භාණ්ඩ යන නිග්‍රෝධාරාම ඇතුළු වන්නේ ද පණ්ඩුකාභය රජු කර වූ නිග්‍රෝධාරමයට වම් පැත්තෙන් පිට ව ගමන් කළේය. දියවාස බමුණාගේ දෙවොලේ ගිණිකොණ අසුවිය යුත්තේ අභයගිරි දාගැබේ ඇත් පවුරයි. එහෙයින් සීමාව අභයගිරියෙන් උතුරට ගිය බව මහාවංස විමර්ශනයක දී පෙනේ. නැවත වතාවත් පාෂාණ තිත්ථයට පැමිණි පසු සීමාව සලකුණු විය (*ibid*:186). මේ අනුව මහා සිමාව පුළුල් ප්‍රදේශයක් කරා පවතින බවත්, උතුරින් අභයගිරියත්, දකුණින් දක්ෂිණගිරි විහාරයත් නැගෙනහිර මල්වතු ඔයෙන් ද බටහිර අභය වැවේ සිමා ගැටිය දක්වා පිහිටන බව ඓතිහාසික විස්තර අධ්‍යයනය කිරීමෙන් දැකගත හැකි ය. මෙම මහා සීමාව පිහිටුවනු ලබන්නේ ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටි බව ස්ථිර වශයෙන් තීරණය කිරීමට සංඝකර්ම හා උපෝසථකර්ම ආදි සිදු කිරීමට බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ (මව,15:14). එසේ ම මහාමේඝ වනය තුළ මුලින් ම



ඉදි වූ බෞද්ධ ආරාමය තිස්සාරාමය ලෙස ඉතිහාසගත වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ (මව,15:222).

ඓතිහාසික තොරතුරු අනුව තිස්සාරාමයට (පසු ව මහා විහාරය) අයත් භූමිය මහා සීමාව ඇතුළත වූ බව පෙනේ. එහෙත් මෙහිදී පැන නගින ගැටළුව නම් මහා විහාරය හා මහා සීමාව එකක් දැයි හඳුනාගැනීම දුෂ්කර කාර්යයක් බව ය. එනම් මහා සීමාවට ගිහි වාසස්ථානයක් වූ ඇතුළු නුවර ද ඇතුළත් වී තිබේ. සාමාන්‍යයෙන් විනය පිටකයට අනුව උපෝසථකර්ම සඳහා ඇති ස්ථානයන්ට ගිහි අයට ඇතුළු විය නොහැකි ය. එසේ වන කල ගිහි වාසස්ථානයක් මැදිවන සේ මහා සීමාව සම්මත කිරීම ගැටළුවකි. මෙහිදී මහාවංසයේ සඳහන් සීමාව නමිනි. මහා විහාර සීමාව හා ගැලපෙනවා ද යන්න ගැටළු සහගත වේ (වික්‍රමසිංහ, 1999: 54).

මහාවංසය ක්‍රි.ව. 5-6 සියවස්වලට අයත් වූවකි. ඊට වසර 700කට වඩා පැරණි සිද්ධියක් ලිවිමේ දී එම සීමා පිළිබඳ සාධක නිමිති කොතෙක් දුරට නිවැරදි ලෙස සටහන් වුයේ ද යන්න සැක සහිත ය. එසේ නමුත් මහාවංසකරු තම කාර්ය ආරම්භයේ දී ම පෙර සිටි අයවළුන් විසින් සැකවින් කී දේ විස්තර කරමින් ද වැඩියෙන් කී දේ අඩු කරමින් ද පුනරුත්ති නැති කරමින් ද මහාවංසය කරවූ බව සඳහන් කර තිබේ. ඒ අනුව මහාවංස කතුවරයා ම දකින පරිදි පැරණි ලේඛණවල අතිශෝක්තිය පුනරුත්තිය ආදි දොස් තිබිණි. ඒවා දුරුකිරීම සහ පාඨකයාගේ පහන් සංවේගය පිණිස ලියන මහාවංසයට නැවත අතිශෝක්තිය වද්දා ගැනීම සිදුකරයි ද යන්න සැක සහිත ය. කෙසේ වෙතත් ඔහුට මූලාශ්‍රය වන ලේඛනයන්හි සඳහන් ස්ථාන නාමාදිය තේරුම්ගැනීමේ දී හා හඳුනාගැනීමේ දී වැරදි සිදුවිය හැකි ය. තවත් අතකින් පැරණි ලේඛනවල තිබුණ සිංහල හෝ වෙනත් මූල භාෂාවක වචන පාලියට පරිවර්තනය කිරීමේ දි වැරදීම් වැඩිවිය හැකි ය. ඒ අනුව මහා සීමාව විහිදී යාමක් සිදුවූවා ද යන්න පුළුල්ව විමසිය යුතු ය (එම:54).

මහාවංස කතාව විස්තර කරන මහා සීමාව කෙසේ වුවත් එහි සඳහන් මහා විහාරයේ පූජ්‍ය ස්ථාන ඇතුළත් භූමිය සඳහා සීමාවක පිහිටි බව පෙනේ. එම සීමාව මහා සීමාවට වඩා කුඩා

සීමාවක් බව ඒ තුළ පූජ්‍ය ස්ථාන 8 ක් ඇතුළත් කිරීමෙන් පෙනේ. රංසිමාලකය, ජන්තාඝර පොකුණ, ශ්‍රී මහා බෝධිය, ලෝහ ප්‍රාසාදය, පැනබු මළුව, චතුස්ශාලාව, මහා සෑ භූමිය හා තිස්සාරාමාය මහා විහාර සීමාව වූයේ නම් පෙර සඳහන් කරණ ලද විශාල භූමියේ කොටසට පමණක් මෙම පූජ්‍ය ස්ථාන ස්ථාන ගත කරන්නේ මන්ද යැයි ගැටළුවක් බව පෙනේ. මහාවංසයට අනුව මහා විහාර සීමාව දැක්වීමේ දී අභයගිරිය, මිරිසවැටිය, ජේතවනය දක්ෂිණ ථූප ආදි ස්ථාන සියල්ල එම සීමාවට ඇතුළත් වූ බව පෙනේ. මෙය මහා විහාරයේ මහේශාක්‍ය බව හෝ ඒකාධිපතීත්වය හුවා දැක්වීම සඳහා මහාවංස කතුවරයා ගත් විශාල උත්සාහයක් දැයි ප්‍රශ්න කෙරිය යුතු ව ඇත. එහෙත් ඒ අනෙක් අතට තර්කාණුකූල ද යන්න පැහැදිලි නැත. මහාවංසය ලියන ලද යුගය වන විට අභයගිරිය හා ජේතවනය මහා විහාරයට අනුකූල නොවී වෙන ම සංවර්ධනය වූ ආයතන වශයෙන් පැවති බව එම මූලාශ්‍රයේ ම සඳහන් වේ. එසේ වන කල්හි මහාවංස කතුවරයාගේ වාදය වූයේ මහා විහාරය සතු භූමියේ අභයගිරිය හා ජේතවනය බිහිවූ බව පෙන්වීම ද යන්න තවත් ගැටළුවකි.

ක්‍රි.ව. තුන් වැනි සියවස වන විට (වර්තතමාන ජේතවන භූමිය) නන්දන උයන වශයෙන් හඳුන්වන ලදී (මව,15:07). මිහිඳු මහරහතන් වහන්සේ විසින් මෙම උද්‍යානයේදී සතියක් පුරා ධර්මය දේශනා කළ බව ද එහි සඳහන් වේ (එම). ඉතිහාස තොරතුරු අනුව මහා විහාර සීමාව උල්ලංඝනය කර මහාසේන රජ යුගයේ දී ජේතවන විහාරය ඉදිකර ඇත (මව,37:32-33). නිකාය සංග්‍රහයේ ද මහසෙන් රජු විසින් භික්ෂූන්ගේ විරුද්ධත්වය නොතකා මහා විහාර සීමාව උගුලුවා ජෝතිවන උයනේ ජේතවනරාමය කළ බව සඳහන් වේ (නිස,15). එම කරුණු අනුව පැහැදිලි වන්නේ මුල් යුගයේ දී ජේතවන භූමිය ද මහා විහාර භූමියට අයත් ව තිබූ බව ය. ක්‍රි.ව. 3-4 සියවස්වල ඉදිවන ජේතවනාරාම විහාරය නිසා මහා විහාර සීමාව උල්ලංඝනය වූ බව වංසකතාවල සඳහන් වුවත් අභයගිරිය නිර්මාණය කිරීම සම්බන්ධ සඳහන්වලදී එවැනි සීමා උල්ලංඝනයක් වූ බව සඳහන් නොවේ. මේ කරුණු සැළකිල්ලට ගැනීමේ දී මහා විහාරයට හෝ මහා සීමාවට අභයගිරිය ඉදි කරන ලද භූමි භාගය අයත් වූවා නම් එය ද සීමා උල්ලංඝනය කිරීමක්



විය යුතු ය. එසේ නම් කිනම් මූලාශ්‍රයක හෝ එය සඳහන් විය යුතු ය. එසේ හෙයින් අභයගිරි භූමිය මහා විහාරයට අයත් භූමියට අයත් නොවන බව පැහැදිලි ය. විශේෂයෙන් ම පුරාවිද්‍යාත්මක ව ලැබී තිබෙන සාධක අනුව අනුරාධපුර ඇතුළු නගරය ජනාවාස ආරම්භය හා ව්‍යාප්තිය ක්‍රි.පූ. 1000 සිට ක්‍රි.ව. 1250 දක්වා වූ ජනාවාස තොරතුරුවලින් සමන්විත වන බව සිරාන් දැරණියගල පෙන්වා දී ඇත. (Deraniyagala,1992:713). ඇතුළුනුවර ජනාවාසය ක්‍රමානුකූල ව අක්කර 250 ක් දක්වා වර්ධනය වූ බව වර්තමාන නටඹුන් ප්‍රකාරය පිරික්සීමෙන් ද පැහැදිලි වේ. ඇතුළුනුවර ජනාවාසය පවුරකින් ආරක්ෂා වී ඇති බැවින් පැහැදිලි ලෙස ම මහා විහාර සීමාව ඇතුළු නුවරට බටහිරින් ද එක් පසකින් අවසන් වූ බව සිතීම වඩාත් තර්කානුකූල වේ. එසේ ම උතුරු පස අනෙක් කොටසින් අභයගිරි දකුණු සීමාව දක්වා තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

මිහිඳු මහහිමියන්ට තිස්සාරාමය සඳහා දේවානම්පියතිස්ස රජතුමා විසින් පූජා කරන ලද්දේ මහමෙව්නා උයන ය. එය ඇතුළු නුවරින් දකුණු දිගින් පිහිටි බව දීපවංසයේ හා මහාවංසයේ සඳහන් වේ (මව,01, දීව,13:15). ඇතුළුනුවර දකුණු දොරටුවට ආසන්නයේ ම පිහිටි නන්දන උයන භික්ෂු වාසයට නොගැළපෙන ඝෝෂාකාරී පරිසරයක වූ නිසා මිහිඳු හිමියන් එය ප්‍රතික්ෂේප කළ බව මහාවංසයේ සඳහන් වේ (මව,15:7-8). මහා විහාරය බවට පරිවර්තනය වූ මහමෙව්නාව පිහිටියේ ඊටත් දකුණින් ය. මහාවංසයේ විස්තරයකට අනුව නන්දන උයනේ දහම් දෙසූ මිහිදු මා හිමි නන්දන උයනේ දකුණු පසින් පිට වී මහමෙව්නා උයනේ පෑදුම් දොරට (නැගෙනහිරට) පැමිණ එයට ඇතුළු වූ බව වංසකතාවේ දක්වා තිබේ (මව,15:10-12) මහමෙව්නා උයන වැටකින් මනා ව සුරක්ෂිත කරන ලදු ව දොරටුවලින් සමන්විත වූ බව ක්‍රි.ව. හතර වැනි සියවසේ ලියවුන දීපවංසයේ සඳහන් වේ. එසේ ම දෙ වැනි භාතිකාභය තිස්ස රජු මහා විහාරය වටා ප්‍රකාරයක් ඉදිකළ බව මහාවංසයේ සඳහන් ය (කුලතුංග 2001:5).

මහා විහාරයේ උතුරු සීමාව ථූපාරාමයට ආසන්න ව රුවන්වැලි සෑය දෙසට (දකුණු දෙසට) වූ බවට සාක්ෂි ඇත. මහා විහාරයත් ථූපාරමයත් විහාර දෙකක් බව දීපවංසයේ හා

මහාවංසයේත් පැහැදිලි ව සඳහන් වේ. එසේ හෙයින් ථූපාරාමය මහා විහාරය ඇතුළට අයත් නොවූවක් බව පෙනේ. එය මහා විහාර පාර්ශවයට අයත් ස්වාධීන ආරාමයකට අවශ්‍ය ස්තූපය, පිළිම ගෙය, බෝගෙය, පොහොය ගෙය, දානශාලාව ආදි සියලු ම අංගයන්ගෙන් සමන්විත වීමෙන් ඒ බව සනාථ වේ.

බටහිර දෙසින් මහා විහාරයේ සීමාව වූයේ පැරණි අභය වැව (බසවක්කුලම) ය. දකුණු සීමාව ශ්‍රී මහා බෝධියටත්, දක්ෂිණ ථූපයටත් අතර වූ බව පෙනේ. ශ්‍රී මහා බෝධියට දකුණින් මීටර් 150 ක් පමණ ඇති ප්‍රාකාරය එම සීමාව වන බව සෙනරත් පරණවිතාන ද පෙන්වා දී තිබේ. ක්‍රි.ව. දෙ වැනි සියවසේ මළුතිස් (කනිට්ඨතිස්ස) රජතුමා මෙම ප්‍රකාරයේ කොටසක් ඉවත් කර දක්ෂිණ ථූපයට යාමට මාර්ගයක් කළ බව මහාවංසයේ සඳහන් වේ. නැගෙනහිර දෙසින් ජේතවන විහාරයේ ඉදිකිරීම් වෙන් කෙරෙන දැනට හාල්පානු ඇළ හා වට රවුම් පාර අසලින් දිවෙන නටඹුන් වූ මහා ප්‍රකාරය නැගෙනහිර සීමාව වශයෙන් ඇත. පුරාතනයේ ඇතුළුනුවර සිට මලය දේශයට (කඳුරටට) යන මාර්ගය ඇතුළුනුවර දකුණු දොරටුවේ සිට දක්ෂිණ ථූපය, රන්මසු උයන, තිසා වැව, අසලින් වැටී තිබී ඇත (එම).

මහාවංසයේ සඳහන් වන පසුකාලීන ප්‍රවෘත්ති අනුව ද භාතිකතිස්ස රජතුමා (ක්‍රි.ව. 143-167) මහා විහාරය වටා පවුරක් ඉදි කර තිබේ (මව,36:02). පසු ව රජ පැමිණි කනිට්ඨතිස්ස රජතුමා (ක්‍රි.ව. 167-186) මහාමේඝවන මහා සීමාව මිරිකා දකුණු වෙහෙර බත්හල කළ බවත්, මහ වෙහෙර පවුර පාර්ශවයකින් බිඳ දකුණු වෙහෙර සඳහා යන මාර්ගය ද කළ බවත් සඳහන් වේ (මව,36:13-14). ඒ අනුව ඉතා පැහැදිලි ලෙස මහා විහාරය සඳහා වෙන් වූ සීමාවක් වෙන ම තිබුණු බව මූලාශ්‍රය අනුව ද පැහැදිලි වන අතර දැනට දක්නට ලැබෙන පුරාවිද්‍යා සාධක ද ඒ බව තහවුරු කරයි.



## 2.1 ජේතවනාරාම භූමියේ ස්ථානගත වීම

මහාවංසය, මහා බෝධිවංසය, සිංහළ බෝධිවංසය හා දීපවංසය ආදී මූලාශ්‍රයගත තොරතුරු අනුව ජේතවනාරාමය අයත් භූමිය එය ඉදිවීමට ප්‍රථම නන්දන වනයට අයත් බව ඓතිහාසික තොරතුරු අධ්‍යයනයේ දී පැහැදිලි වේ. මහාවංසයට අනුව ජේතවනාරාමය ක්‍රි.ව. 276 -303 අතර කාලයේ දී ලංකාවේ රජ පැමිණි මහාසේන රජුගේ නිර්මාණයකි (මව,37:33-34) මූලාශ්‍රය තොරතුරු අනුව මහාසේන රජු මෙම විහාරය ඉදිකිරීම සඳහා මහා විහාර සීමාව උල්ලංඝනය කළ බව සඳහන් වේ (මව,37:33, නිස,15).

අනුරාධපුර ඇතුළුනුවර දකුණු දොරටුවට හා එහි පවුරට දකුණින් පිහිටි භූමි භාගය ක්‍රි.පූ. තුන් වැනි සියවසින් පසු බෞද්ධ ආගමේ කේන්ද්‍රස්ථානය බවට පත්විය. ජේතවනාරාම විහාරය නිර්මාණයට පෙර නන්දන වනය වශයෙන් හැඳින් වූ මෙම සුවිශේෂී භූමි භාගය සුවිශේෂී කාර්යයන් සඳහා උපයෝගී කරගත් බව ඓතිහාසික කරුණු අධ්‍යයනයේ දී පෙනේ. ඒ අතර මිහිඳු හිමිගේ ප්‍රථම ධර්ම දේශනාව, මහ තෙරුන්ගේ ශුද්ධ භූමිය (ථේරානම්බන්ධ මාලක), සෘෂීන්ගේ ආදාහන මළුව ඉසිභූමංගන (රත්නායක,1988:331) ඒ අතර වැදගත් වේ. ඓතිහාසික වශයෙන් සළකන කළ ශ්‍රී ලංකාවේ ථේරවාදී නිකායත්‍රයේ වර්ධනයේ දී ජේතවනාරාමය වැදගත් තැනක් උසුලයි. ඉන්දියානු ලේඛනවල **"සාගලීය"** හෝ **"ජේතවනවාසීන්"** යනුවෙන් ද සිංහල මූලාශ්‍රයවල සහ සෙල්ලිපිවල **දෙනානක** යනුවෙන් ද හඳුන්වනු ලබන මහා විහාරයේ මතයන්ට වඩා විරුද්ධ මත දරණ නිකායන් බිහිවූයේ මහසෙන් රජ දවස මේ බිමේය (එම). ක්‍රි.පූ. තුන් වැනි සියවසේ නන්දන උයනේ පිහිටීම දීපවංසය මෙසේ දක්වයි **"මහා නන්දන නාම උධයානං දක්ඛිණපුරේ"** (දිව,13:11). මහාවංසය මෙම භූමිය පිළිබඳ ව සඳහන් කරන්නේ නන්දන වනය දකුණු දොරටුවට පිටතින් වූ බව ය. **"දක්ඛිණ ද්වාර තො බහි"** (මව,15.1). සමන්තපාසාදිකා විනය අටුවාට අනුව මෙම බිම්කඩ දකුණු දොරටුව හා සම්බන්ධ කර දක්වයි. **"දක්ෂිණ ද්වාරයේ නන්දන වන උද්‍යානයේ"** (සපා,83:71).

මේ අනුව මෙම බිම්කඩ මුලින් උද්‍යානයක් ලෙස සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකළ බව උපකල්පනය කළ හැකි ය. මුල් අවධියේ මේ ප්‍රදේශය උද්‍යානයක කාර්යය භාර්යය ඉටුකිරිමෙන් පෙනීයන්නේ නගරයට සම්බන්ධ ජනතාව විවිධ අරමුණු සහිත ව එක් රැස් වූ අවකාශය සහිත බිම්කඩක් ලෙස මෙම භූමිය හැසිරී ඇති බව ය. අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීම ආරම්භ වූ මුල් අවධියේ, එනම් පදනම් මුල් ඓතිහාසික අවධිය (Basal Early History) එහි වර්ධනයට ඍජු ව ම සම්බන්ධ වූ සාධක අතර මාර්ග ජාලය අතිශයින් ම වැදගත් වේ. එම මාර්ග ජාලය නගරයට සිව් දෙසින් ම සම්බන්ධ වූ බව ද මූලාශ්‍රය තොරතුරුවලින් ද පැහැදිලි වේ. මෙම මාර්ග ජාලයේ පිහිටීම ද ජේතවන භූමියේ (පෙර නන්දන උයන) ස්ථානගත වීම සඳහා බලපා ඇති බව පෙනේ. මෙහිලා අපගේ සුවිශේෂි අවධානය යොමු විය යුත්තේ නගරයෙහි දකුණු පසින් දකුණු දොරටුව හා සම්බන්ධ වූ මාර්ග පද්ධතිය පිළිබඳ ව ය.

මූලාශ්‍රයගත තොරතුරුවලට අනුව අනුරාධපුර නගරයේ දකුණු දෙසට දිවගිය මාර්ගය මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව පසුකර තිසා වැව, ඉසුරුමුණිය, වෙස්සගිරිය හරහා කඳුරටට දිවගිය බව සද්ධර්මාලංකාරයේ සඳහන් වේ (සද්මාලං,539). මෙසේ මලය දේශයේ සිට අනුරාධපුරයට පැමිණි ප්‍රධාන ගමන් මාර්ගය පූර්ව ඓතිහාසික යුගයේ ආර්ථික දේශපාලන වශයෙන් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකර ඇත. මලය දේශයේ සිට නාලන්ද, දඹුල්ල හරහා පැමිණි මෙම මාර්ගය දිගේ අනුරාධපුර නගරය වෙත සුවිශේෂි ඛණිජ පාෂාණ වර්ග හා කුළුබඩු ඇතුළු වෙනත් වෙළෙඳ භාණ්ඩ පරිවහනය කළ බවට තොරතුරු අනුරාධපුර ඇතුළුපුරයේ සිදුකර ඇති කැනීම් තුළින් ද පැහැදිලි වී ඇත (සෙනෙවිරත්න,1996:188).

විවිධ ප්‍රදේශවල පවතින විවිධ ස්වාභාවික සම්පත් තවත් ප්‍රදේශයක පරිහරණය සඳහා අනිවාර්යයෙන් ම ප්‍රදේශ අතර අන්තර් සමාජමය සබඳතා ඇති විය යුතු ය. ප්‍රාථමික සමාජ ආශ්‍රිත ජනාවාස සුවිශේෂී පාරිසරික ව්‍යුහයන් තුළ ස්ථානගත වීම හා සඳහා ජන පිරිස් හා සම්පත් ක්ෂේත්‍ර අතර ඇති වන්නා වූ සම්බන්ධීකරණයේ ප්‍රතිඵලය ඍජු ව බලපා තිබේ. ප්‍රාථමික



යකඩ යුගයේ ජනාවාස (Early iron age settlement) විවිධ භෞමික හා පාරිසරික ක්ෂේත්‍ර තුළ වර්ධනය වීම මත විෂම ලෙස පැවති සම්පත් සොයා ගැනීම හා පරිහරණය කිරීම සඳහා ජන ශ්‍රේබනයේ ප්‍රසාරණය, සමාජ ආයෝජනය වර්ධනය වීම යන කරුණු පදනම්ව හුවමාරු පද්ධතිය පුළුල් කළ බැව් පෙනේ. මෙය පදනම් කරගෙන ක්ෂේත්‍ර දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අළලා ඇති වන සම්බන්ධීකරණය ප්‍රධාන වශයෙන් සම්පත් බෙදාගැනීමේ ව්‍යවසාය මත රඳා පැවති එකක් බව පෙන්වාදිය හැකි ය (සෙනෙවිරත්න, 1996:185-186). අන්තර් සබඳතා ගොඩනැගීම මත විකල්ප භූමි සොයා පුරාණ සමාජ පහත් වියළි තැනිතලා බිම්වල සිට රට අභ්‍යන්තරයට ගමන් කර ඇති ආකාරය ක්‍රි.පූ. නව වැනි සියවසේ වියලි තැනිතලා ප්‍රදේශවල ඇති වන ප්‍රාථමික යකඩ යුගයේ ජනාවාස ක්‍රි.පූ. හය වැනි හා පස් වැනි සියවස වන විට පහළ කඳුකර ප්‍රදේශවලට හා ඉහළ වලවේ නිම්නයේත් කැළණි සහ මහ ඔය නිම්නයේත් ඉහළ කළා ඔය නිම්නය ආශ්‍රිතවත් ඉහළ යාන් ඔය හා ඉහළ දැදුරුඔය නිම්න ආශ්‍රිතවත් ජනාවාස පිහිටුවා ගත් බව දැක්වෙන සාධකවලින් තහවුරු වේ (Senaviratne, 1984:240-263,මැන්දිස් , 2019:1-14).

රට අභ්‍යන්තරයට ක්‍රි.පූ. 7-5 සියවස් වනවිට පූර්ව ඓතිහාසික ජනාවාසවල ප්‍රවිෂ්ටය පිළිබඳ ව වත්මන් පුරාවිද්‍යා අධ්‍යයනවලින් පෙන්වා දී ඇත්තේ එම ජන පිරිස් විශේෂයෙන් ඛනිජ සම්පත් සොයා රට අභ්‍යන්තරයට ප්‍රවිෂ්ට වූ බවය. මේ පිළිබඳ ව පැහැදිලි ව පෙන්වාදිය හැකි නිදර්ශනයක් ලෙස පහළ කඳුකර ප්‍රදේශයක් වන දඹුල්ල හා ඇලහැර ප්‍රදේශය අශ්‍රයෙන් අර්ධ සංචාරක ජන පිරිස් ක්‍රි.පූ. 7-4 සියවස්වල ජීවත් වූ බව කාබන් දින 14 කාලානුක්‍රම දින නියමයන් මඟින් පෙන්වා දී ඇත. සීගිරිය, ඉබ්බන්කටුව, රොටවැව, ආනකටාව, කණ්ඩලම, ඇලහැර කුරුවියාය ආදී ස්ථානවල ජීවත් වූ මෙවැනි ජන පිරිස් ඉහළ කඳුකර කලාපයක් වූ නකල්ස් කඳුවැටිය ආශ්‍රිත ව ජීවත් වූ මධ්‍යශිලා සංස්කෘතියේ මිනිසුන් සමඟ මූලික සබඳතා සරල හුවමාරු පද්ධතියක් ඔස්සේ ආරම්භ කළ බවට සාධක ලෙස ඉබ්බන්කටුවෙන් හා කුරුවියායෙන් හමුවන එම ප්‍රදේශයට ආවේණික නොවන කහඳ පාෂාණ හා වෙනත් ඛනිජ පාෂාණ

පරිහරණය කිරීමෙන් පැහැදිලි වේ (සෙනෙවිරත්න,1996 :188). මෙය ඉතා වැදගත් වන්නේ පරිසර කලාප දෙකක් තුළ ඇතිවන හුවමාරුවේ සංධිස්ථානයක් එයින් පිළිබිඹු වීම මිනිසුන්ගේ ජීවන රටාවට මැදිහත් වීම තුළ ය. විශේෂයෙන් ම සරල හුවමාරු රටාව දියුණු හුවමාරු හා පරිවහන ක්‍රමයකට පදනම දමන අතර එය අනෙක් සම්පත් ක්ෂේත්‍ර සොයා ඇදී ඒමට පසුබිමක් සකසනු ලැබේ. මේ තත්ත්වය යාන් ඔය හා දැදුරු ඔය නිම්නය ආශ්‍රිතයෙන් ද මේ වන විට පැහැදිලි වී තිබේ (මැන්දිස්, 2017).

1980 දශකයේ අනුරාධපුර ඇතුළු නගරයේ සිදු කරන ලද පුරාවිද්‍යා පර්යේෂණ කැනීම්වල දී ක්‍රි.පූ. 500 න් පසු යුගයේ ජනාවාස ස්තරවලින් එයට පෙර පැවති යුගයට වඩා පුළුල් තේරීමක් ඇති මැණික් ගල් වර්ග හා මැණික් කර්මාන්තය ආශ්‍රිත ශේෂිත කොටස් ද රත්රන් සහ තඹ වැනි ඛණිජ වර්ග ද සාපේක්ෂ ලෙස බහුල වශයෙන් හමුවන බවක් දක්නට ඇත. මේ හැර බාහිර ප්‍රදේශවලින් කඳුකරයට සහ රටේ වෙනත් ප්‍රදේශවලට ඇදී ගිය ශ්‍රී ලංකාවේ හමු නොවන්නා වූ ඛණිජ වර්ග ඉබ්බන්කටුව, කොක්එබේ, තම්මැන්නාගොඩැල්ල, වාහල්කඩ, පොල්පිතිගම, පින්වැව හා කුරුවියාය වැනි සුසාන තුළින් හමුවීම ද තවත් වැදගත් කරුණකි. කානීලියන් (Carnilian) හා ඇගේට් (Agate) නැතහොත් අගස්ති පබළු අතිවිශාල ප්‍රමාණයක් ඉබ්බන්කටුව සුසාන තුළින් වාර්තා වී ඇත. මෙම ඛනිජ වර්ගය ලංකාවට ගෙන එන ලද්දේ අර්ධ මහද්වීපමය ඉන්දියාවේ බටහිර හා නිරිත දිග දෙදිශාවෙනි. බාහිර ප්‍රදේශයකින් අමුද්‍රව්‍යයක් ලෙස අනුරාධපුරයට ආනයනය කළ මෙම පාෂාණය එහිදී පබළු වශයෙන් නිමකර පහළ කඳුකර ප්‍රදේශවල සිට ප්‍රාථමික යකඩ යුගයේ සමාජ ආශ්‍රිත ප්‍රභූ පිරිස් පරිහරණය කළ සුඛෝපභෝගී භාණ්ඩයක් ලෙස හෝ ඉහළ කඳුවල ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මිනිසුන් ආශ්‍රිත හුවාමාරු මාධ්‍යයක් සේ පරිහරණය වන්නට ඇත. අනෙක් අතට ඉහළ කඳුකරයේ සුලභ ව ඇති ඇමතෙස්ත (Amathist), පෙල්ස්ෆාර් (Peledspar), රත්රන් (Gold), තලාතු මිනිරන් (Mica), තඹ (Copper), ඇත් දළින් නිමකළ පබළු, ඉබ්බන්කටුව සුසානයෙන් ලැබීම වඩා වැදගත් වන්නේ දඹුල්ල ආශ්‍රිත ප්‍රදේශය ඉහළ කළාඔය නිම්නය හා සම්පත් ඇති කඳුකරය සම්පත් පරිහරණය



කරන තැනිතලා ප්‍රදේශ හා පැවති අන්තර් සබඳතා පිළිබිඹු කරන බැවිනි (එම: 188-190).

විවිධ සම්පත් ලබාගැනීම සමඟ ඇතිවන හුවමාරු නිසා කඳුකරය හා වෙනත් ප්‍රදේශ අතර සම්පත් හුවමාරුවට නිසි කළමණාකරණයක් ඇතිවීම සමඟ සම්පත් බෙදාහැරීමේ මධ්‍යස්ථාන බවට පරිවර්තනය වූ බව ද පුරාවිද්‍යා අධ්‍යයන මඟින් පෙන්වා දී ඇත. පර්යේෂණ මඟින් සනාථ කරගෙන ඇති තොරතුරු අනුව දඹුල්ලේ සිට නුවර සානුව දක්වා ඍජු ව විහිදෙන්නා වූ ස්වාභාවික මාර්ගයේ පිහිටා ඇති ශිලාලේඛනයන්ගේ අන්තර්ගතය අනුව මෙම මාර්ගය ඔස්සේ පැවති ජනාවාස, නිෂ්පාදන මධ්‍යස්ථාන, කළමනාකරණ මධ්‍යස්ථාන හා ඒ හා සම්බන්ධ වූ ජන පිරිස් ක්‍රි.පූ. තුන් වැනි සියවසින් පසු ව ඒ ප්‍රදේශවල මුල්බැස ගෙන ඇති බව පැහැදිලි වේ. බ්‍රාහ්මී සෙල්ලිපිවල හා ඉපැරණි වංසකතාවල සඳහන් වන **කට, කඩ, කඩක, කණ්ඩ** වැනි පද පිළිබඳ ව විමර්ශනය කිරීමෙන් මේ පිළිබඳ ව යම් අදහසක් ඇති කරගත හැකි ය. මහාවංසයේ සඳහන් වන පණ්ඩුකාභයගේ සංග්‍රාම ආශ්‍රිත ව "**ගිරි කණ්ඩ**" යන ප්‍රදේශය හා වට්ටගාමිණී අභය රජුගේ ගමන් මාර්ගය ආශ්‍රිත ව "**ශිලා සොබ්බකටක**" ප්‍රදේශ පිළිබඳ ව මූලාශ්‍රයවල සඳහන් වේ. දඹුල්ල හා බුදුගේහින්න ආශ්‍රිත ව ඇති බ්‍රාහ්මී ලිපිවල "**උපරිකඩ**" හා "**මතුකඩ**" යන වචනාර්ථ තුළින් මුල් ඓතිහාසික යුගයේ උතුරු කඳුබෑවුම තුළ ස්ථාපිතව තිබූ ජනාවාස ගැන සඳහන් වේ. මෙම "**කණ්ඩ**" සහ "**කඩ**" යන්නෙහි තේරුම සීමාව, ප්‍රවිෂ්ට වන ස්ථානය, හුවමාරු සිදුවන ස්ථානය, ද්වාරය, සුළු වෙළෙඳ පොළ යන්න අර්ථවත් කෙරේ ( *Ic*.Vol.I;1970). මෙම කරුණු මඟින් පාරිසරික ප්‍රදේශ දෙකක් වෙන් කරන්නා වූ එසේත් නැතහොත් හුවමාරුව සිදුවන ස්ථානය යන්න ගම්‍ය වන බව උපකල්පනය කළ හැකි ය. මෙමගින් පැහැදිලි ව පෙන්වාදිය හැකි වන්නේ පහළ කඳුකරයට පිවිසීමට ඇති පාරිසරික ක්ෂේත්‍ර සහ ප්‍රදේශ ආශ්‍රිත ඇති සම්පත් හුවමාරු කිරීමේ මධ්‍යස්ථාන "**කඩ**" යන අර්ථයෙන් මුල් ඓතිහාසික යුගයේදී වර්ධනය වූ බව ය. ක්‍රි.පූ. පළමු වැනි සියවසට අයත් කළාවැව ආශ්‍රිත ව ශිලාලිපියක "**කඩවපි**" යන්න සඳහන් වීම තවත් වැදගත් වන්නේ ක්‍රි.පූ. දෙ වැනි සියවස වනවිට කඳුරටට පිවිසෙන මෙම වැදගත් ප්‍රදේශය

"**කඩරජී**" නැමති ප්‍රාදේශීය පාලන කොටසක් ලෙස හඳුනාගැනීමට හැකි වීම මතය (එම,191-192). එසේ ම නාලන්ද ට නුදුරු ප්‍රදේශයක පිහිටන දෙමද ඔය ආශ්‍රිත ව හමුවන මුල් ඓතිහාසික යුගයට අයත් "**මහා චූඩ**" රජුගේ සෙල් ලිපිය තුළින් ද මෙම ප්‍රාදේශිය පාලන තත්ත්වය හා සම්පත් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය මැනවින් පැහැදිලි වේ ( *Ic*.Vol:1970: I; Senaviratne :1996).

හුවමාරු වර්ධනය විම සමඟ පුරාණයේ දී ගම, නිගම, නගර යන සංකල්පය දියුණු තත්ත්වයක් කරා වර්ධනය වීම පුළුල් අර්ථයෙන් ගත්කල පෙන්වාදිය හැකි ය. අන්තර් සබඳතා මත පරිවහනය සමඟ ඇතිවන සම්පත් පැවති ප්‍රදේශ හරහා මාර්ග ඇතිවීම මී ලඟට කැපීපෙනේ. මෙම මාර්ග අනුරාධපුරය හා කඳුකර කලාප හා අනෙකුත් ප්‍රදේශ අතර සබඳතා ඇති කළ බවට ද සාධක ඇත. මහාවංසයට අනුව ක්‍රි.පූ. තුන් වැනි සියවස දේවානම්පියතිස්ස රාජ්‍ය යුගයේ වාතපබ්බතයෙන් ලැබුණු සම්පත් පිළිබඳ ව සඳහන් කර තිබේ (මව. පරි, 29). දුටුගැමුණු රාජ්‍ය යුගයේ අනුරාධපුරයේ සිට ඉහළ දැඳුරු ඔය නිම්නයේ අම්බට්ඨකෝලයෙන් ලැබුණු රිදී පිළිබඳව සඳහන් වේ (සෙනෙවිරත්න 1996:194). මෙසේ සම්පත් පරිහරණය සඳහා යොදාගත් මාර්ග අතර දඹුල්ලේ සිට වයඹට දිවයන මාර්ගය කළා ඔය නිම්නයේ සිට උරුවෙල පට්ඨනයටත් දඹුල්ලේ සිට උතුරට දිවයන මාර්ගය අනුරාධපුරය ඔස්සේ වයඹ දිගින් මහාතීර්ථයටත් එතැනින් යාපනයටත්, දඹුල්ලේ සිට ඊසාන දිගින් දිවයන මාර්ගය කණ්ඩලම සීගිරිය පසු කරමින් මහඔය නදී නිම්නය ඔස්සේ ඊසාන දිග ගෝකණ්ණය සහ අනෙකුත් වරායන් වෙත යොමු වූ බව පෙනේ (එම:196). එසේ ම මෙම මාර්ග ජාලය ආශ්‍රිත ව සම්පත් කළමනාකරණය කළ පිරිස් පිළිබඳ ව ද පුරාවිද්‍යා සාධක ඇත. ඒ අතර කුඩාගල ශිලාලිපියේ එන "**පුග**" ශ්‍රේණිය, මාතලේ අසල නෙළුවකන්දේ ඇති ශිලාලිපියේ එන " **පරුමක අභජී**" යන නාමය දේශපාලනය හා වෙළෙඳාම සම්බන්ධ ප්‍රමුඛත්වයක් ගත් පිරිස් බව පෙනේ. මාතලේ අසල නෙළුවකන්දේ සෙල්ලිපියේ සඳහන් "**පරුමක අභජී**" හා "**තිරිපාල**" යන නම් සීගිරිය ශිලාලිපිවල සඳහන් වීමෙන් වානිජ කටයුතුවල අන්තර් සබඳතාව පැවතුණ බව මැනවින් පැහැදිලි වේ(එම:193-195).



ඉහත සඳහන් කරන ලද පුරාවිද්‍යාත්මක කරුණු අනුව පැහැදිලි ව පෙනෙන කාරණයක් නම් ලංකාවේ පූර්ව සහ මුල් ඓතිහාසික යුග අතරතුර අනුරාධපුරය වෙළෙඳ නගරයක් වශයෙන් කැපීපෙනී ඇති බවය. සද්ධර්මාලංකාරයේ සඳහන් පැරණි අනුරාධපුර නගරය හා ඉසුරුමුණිය හරහා කඳුකරය දක්වා තිබුණ මාර්ගය මෙම ඓතිහාසික සාධක අනුව පුරාණ දකුණු මාර්ගය බව සිතීම වඩාත් තර්කානුකූල වේ. මහාවංසයට අනුව නන්දන වනයේ දකුණු දිගින් පැමිණි මිහිඳු මාහිමි මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුවෙන් ඇතුළු වී ඇති බව ද සඳහන් කර තිබේ (මව,15:10-11). ඒ අනුව දකුණු දිගින් වූ මාර්ගය මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව අසලින් දකුණට ගමන්ගත් බව ඒ අනුව උපකල්පනය කළ හැකි ය.

අනුරාධපුර ඇතුළු නුවරට දකුණු දිගින් මාර්ග ජාලයක් ක්‍රියාත්මක වූවා මෙන් ම නැගෙනහිරින් ද මාර්ගයක් පැවතුණ බව මූලාශ්‍රය කරුණු අනුව පැහැදිලි වේ. අනුරාධපුරයට නැගෙනහිරින් පැමිණි ගමන් පථය කඩක චෛතිය හරහා මල්වතු ඔය එතෙර කර රජවීදිය හා සබඳ වී ඇත්තේ පුරයේ නැගෙනහිර දොරටුව සමීපයේදී ය. මෙම මාර්ගය මල්වතු ඔය හරහා මිහින්තලය දක්වා විහිදුණු බව මහාවංසයේ ද සඳහන් වන අතර මෙම මාර්ගය සුමන සාමණේර හිමි අකුධාතුව අනුරාධපුරයට රැගෙන එන විට ද භාවිත කළ බව එහි විස්තර කර තිබේ (මව,17:20-30). මහා සීමාව සළකුණු කිරීමේදී ද මල්වතු ඔය බටහිර ඉවුරට සමීප ව පැවති තොටුපලවල් කිහිපයක් ගැන ද සඳහන් වේ. මල්වතු ඔය බටහිර ඉවුරේ පිහිටි එම තොටුපලවල් හා සබඳ වු පුරාණ මාර්ගයක් බටහිර ඉවුර දිගේ තිබෙන්නට ඇති බව එම විස්තර අනුව උපකල්පනය කළ හැකි ය. මහාවංසයේ විස්තර වන ආකාරයට මිහිඳු මාහිමි සිංහස්ස තොටින් පැමිණ ඉවුරෙන් වැඩි බව (මව,15: 209-210) සඳහන් වේ. එය මාර්ගයක් වීමට ද බොහෝ දුරට ඉඩ ඇත. එසේ ම මහා සීමාව සළකුණු කිරීමේ දී සඳහන් "**පාෂාණ තිත්ථය**" නැතහොත් පහණතොට මේ මාර්ගය හා සබඳ වූ මල්වතු ඔයේ ගල් තලාවක් සහිත තොටුපලකි. එබඳු පාෂාණ බන්ධ කිහිපයක්ම නගරයෙන් නැගෙනහිර ප්‍රදේශයේ වර්තමානයේ මල්වතු ඔය ඉවුරේ දක්නට ඇත. ඉන් සමහරක් තුළ

අත්වැට සිටුවීමට කපන ලද කණු වලවල් හා ගල් පඩි පෙළ දක්නට ඇති අතර වර්තමාන යාපනය හන්දියට ප්‍රවේශවන මාර්ගය හා දුම්රිය පොළ ආසන්නයේ සිට ජේතවන විහාරයට ප්‍රවේශ වන මාර්ගය අතර ප්‍රදේශයේ පැරණි ගල් පාලමක නටඹුන් මල්වතු ඔය තුළ දක්නය ලැබේ (බාලසූරිය:2000). එම පුරාවිද්‍යා සාධක තුළින් පැහැදිලි වන්නේ පැරණි ගමන් මාර්ග ආශ්‍රිත තොරතුරු වේ. මෙසේ සඳහන් කරන ලද සියලු මාර්ගයන් ඍජු ව හා වක්‍ර ව අනුරාධපුර ඇතුළු නුවරට දකුණු දෙසින් වූ භූමි භාගය ස්ථානගත වීමේහිලා බලපා ඇති බව පැහැදිලි ය. එසේ නම් අප විසින් ඊළඟට නැගිය යුතු ප්‍රශ්නය නම් එම මාර්ග ජාලය ඇතුළු නුවරට දකුණින් ප්‍රවිෂ්ට කළ බිම්කඩ කුමක් ද යන්න ය. එසේ ම එම බිම් කඩ එනම් මල්වතු ඔයෙන් බටහිර සහ මහාමේඝවනයේ නැගෙනහිර ප්‍රදේශයේ දී කවරාකාරයේ සමාජ ආර්ථීක දේශපාලනික ආගමික කාර්යයන් හා කෙසේ සම්බන්ධ වී ද යන්න ද විමර්ශනය ඉතා වැදගත් වේ. මෑතකදී කරන ලද පුරාවිද්‍යා ගවේෂණ අනුව මල්වතු ඔය වම් ඉවුර (බටහිර) ඔයට බැසීමට කරන ලද ගලින් සකස් කර ඇති පඩිපෙළක් (වර්තමාන යාපනය හන්දියට යන පාලමට උතුරෙන්) වාර්තා වී ඇත (බාලසූරිය,2000). මෙම පඩිපෙළ මඟින් ඔයට බසින ස්ථානය ගල් තලාවන්ගෙන් යුක්ත වේ. එසේ ම මෙයට සමාන තවත් ගල් තලාවක් දැනට යාපනය හන්දියට යාමට තනා ඇති පාලම අසළ දකුණින් ද තිබේ. 2001 වසර තුළදී මල්වතු ඔය වම් ඉවුර ගවේෂණය කිරීමේ දී ඉහත සඳහන් කරන ලද පාලමට දකුණු දෙසින් පුරාණ පාලමක ගල්කණු ශේෂ වාර්තා කර ඇත (බාලසූරිය, 2001). මෙම පුරාවිද්‍යා සාධක තුළින් පැහැදිලි වන්නේ මේවා මල්වතු ඔයෙන් එතෙර වීමට තිබූ මාවත් පිළිඹිබු වන බව ය. එසේ නම් මල්වතු ඔයේ බටහිර දෙසින් තිබූ මාවතට මේ පුරාණ නටබුන් සහිත පාලම සම්බන්ධ වීමට බොහෝ දුරට ඉඩ තිබේ. කෙසේ වෙතත් ඇතුළු නුවර නැගෙනහිර දොරටුවට සම්බන්ධ වූ මාර්ගය අයත් පැරණි ගල්පාලමක ශේෂ වර්තමාන යාපනය හන්දියේ පිහිටි ඔරලෝසු කණුවේ සිට මීටර් 100 ක් පමණ උතුරට වන්නට පිහිටන නාගදීප විහාර මාවතින් බටහිර දෙසය ගමන් කිරීමේදී හඳුනාගත හැකි ය. මෙම ගල්පාලම බෙල් විසින් වාර්තාකර තිබේ.



ඇතුළු නගරයට සතර දෙසින් සම්බන්ධ මෙම මාර්ග ජාලය ඔස්සේ ඒ දෙසට වාණිජ පරමාර්ථ පෙරදැරි ව විවිධ භාණ්ඩ ඇදී ආ බවට සාධක පවතී. මෙසේ ඇදී ආ නිෂ්පාදන භාණ්ඩ හා අමුද්‍රව්‍යය නගර ප්‍රවේශයට පෙර එක් රොක් වූ තැන් පිළිබඳ ව මූලාශ්‍රයන්හි සඳහන් වේ. දුරකතර ප්‍රදේශවලින් ඇදි එන අතිරික්ත භාණ්ඩ හුවමාරු කර ගැනීම සඳහා වූ ස්ථාන පුරාණයේ දී **අන්තරාපන ද්වාරගාම, නිගම, නියමතන** නැතහොත් වෙළෙඳ පොළ වශයෙන් හඳුන්වා තිබේ (මව,10:88). මෙසේ වූ වෙළෙඳ මධ්‍යස්ථාන ගැන සඳහන් ශිලාලිපි තොරතුරු අනුව නගරයේ පැවති **"නිගම"** ගැන සඳහනක් ලබුඇටබැඳිගල, තෝනිගල හා වෙස්සගිරිය ශිලාලිපිවල සඳහන් වී තිබේ. ලබුඇටබැඳිගල සෙල්ලිපියට අනුව

> නකරහි පජින පසහි, මහා තඹක නියම තනහි
> දෙවගරිය මහ විහරහි අමෙති
> සගයනපුත................ (*Ez*,vol.III:180).

එක් වෙළඳ පොළක් ගැන ද නගරයෙහි උතුරු පසෙහි වූ වෙළෙඳපොළක් ගැන තෝනිගල ශිලාලිපියෙහි මෙසේ සඳහන් වේ.

> නකරක උති පසහි කලහුමනක
> නියම තනහි ........(*Ez*,vol III:177);

එසේම වෙස්සගිරිය සෙල්ලිපිය අනුව

> සිධ මුජිතගම නකරක නිගමෙ තලවිකව කුටුබික
> වච්ච (පර) මුහික වච්ච ගමිණි අයහ පුති
> අමෙච්යි ඉසිරමණ විහරහි බිකුසගන
> දිනෙ……….. (සේනානායක 2006:93)

වශයෙන් සඳහන් ව ඇත්තේ වෙළෙඳ මධ්‍යස්ථානයන් ගැන ය. දීපවංසයේ සඳහන් ආකාරයට අන්තරාපන හෙවත් වෙළෙඳපොළ ජනතාවගේ භාණ්ඩ හුවමාරු කරගන්නා වූ තැනක් නැතහොත් නිෂ්පාදකයා හා පාරිභෝගිකයා හමුවන සුවිශේෂ මධ්‍යස්ථානයක් ලෙස හදුන්වා ඇත (දීව.,9:36). මෙම වාණිජ මධ්‍යස්ථානය දිවයිනේ සෙසු දියුණු වූ මේ හා සමාන ජනාවාස අතර වෙළෙඳාම් කිරීමේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය

විය. වෙළෙඳපොළ ගැන කියවෙන සිව් වැනි සියවසට අයත් විස්තරයකින් මේ ස්ථානය හා සම්බන්ධ වූ විදේශීය වෙළෙඳුන් පිළිබඳ ව ද ප්‍රමාණවත් තොරතුරු සඳහන් වී තිබේ (මව,10:88-93).

අනුරාධපුර නගරය හා වෙළඳ පොළවල ස්ථානගත වීම කෙරෙහි බොහෝ විට ඉන්දීය ආභාසය හේතුවන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. ඉන්දියාවේ ද පැරණි අගනුවර වටා නිගම ස්ථාන තිබී ඇති බවට මූලාශ්‍රය සාධක තිබේ. උම්මග්ග ජාතකයට අනුව මිථිලා නුවර දොරටු අසළ ද්වාරගාම විය. මේවා මහාවංසයේ සඳහන් වන ද්වාරගාම, එසේත් නැතහොත් දොරගම් සේ ක්‍රියාකරන්නට ඇත. මේ අනුව මූලාශ්‍රය හා සෙල්ලිපි සාධකවලින් සනාථ වන්නේ අනුරාධපුර නගරය අසල වූ නිගම ඉතා සංවිධානාත්මක ව ක්‍රියාත්මක වී ඇති ආකාරයයි (Rathnayake, 1984:05). දීපවංසයේ සඳහන් තොරතුරක් අනුව **"උපටසම් නගරම් සවිභට්ටන නරාපනම්"** (*Dv*,09:36) මෙබඳු ද්වාර ගාම අනුරාධපුර නගරයේ සිව් දෙසින් ම ක්‍රියාත්මක වූවාට සැක නැත. මෙම ද්වාර ග්‍රාම අතර දක්ෂිණ ද්වාරය සම්බන්ධ වූ නිගමන සුවිශේෂ කාර්යයක් ඉටුකළ බව සිතිය හැකි ය. අනුරාධපුර නගරය කේන්ද්‍ර කරගෙන ස්ථානගත වූ නිගම ජාලය, කඩක හා ගාම ජාලයකට සබඳ ව වර්ධනය වන්නට ඇති බව සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදී තිබේ (සෙනවිරත්න, 1996:191-92). නගරයට ඇදී ආ පැරණි මාර්ගය ස්ථානගත වූයේ මෙම කඩක හා කණ්ඩ හරහා ය. අනුරාධපුර නගරයට නැගෙනහිර හා දකුණු දෙසින් වු එබඳු තත්ත්වයන් ද පැවති බව විශ්වාස කළ හැක්කේ වෙස්සගිරියේ හමුවන පර්වතයක ඇති ''සිධ මුජිනගම නකරක නිගම තලවිකව කුටුබික'' දක්ෂිණ මාර්ගය ආසන්නයේ පිහිටන නිගම පිළිබඳව සඳහන් කර ඇති බැවිනි (සේනානායක, 2006:93).

එසේ ම මිහින්තලය ආශ්‍රිතව පිහිටා ඇති කණ්ඨක චෛත්‍ය යන නාමය මුල් කාලයේ එහි ක්‍රියාත්මක වූ වෙළඳ පොළ මුල්කර ගනමින් කඩක යන වචනය ආදේශ කර කණ්ඨක ලෙස පසුව ව්‍යවහරයට පැමිණෙන්ට ඇතැයි ද එම වචනාර්ථ අර්ථනිරූපනය කිරීමෙන් පෙන්වාදිය හැකි ය. කණ්ඨක චෛත්‍ය පිහිටි ස්ථානය පසුකර නැගෙනහිර දෙසින් ඇදී ආ මාර්ගයට සම්බන්ධ සුවිශේෂ



භාණ්ඩ හුවමාරු ස්ථානයක් මෙම ස්ථානයේ පිහිටා තිබෙන්නට ඇති බැවින් කඩක නම් වචනයේ පර්වර්ථනයෙන් එම නම වැටෙන්නට ඇත කඩක කණ්ඩ යන වචනවලින් සීමාව, ප්‍රවිෂ්ට වන ස්ථානය, හුවමාරුව සිදුවන ස්ථානය, ද්වාරය, සුළු වෙළෙඳ පොළ යන්න අර්ථවත් කෙරෙන බව මීට ඉහතදී ද පෙන්වාදී තිබේ (සෙනෙවිරත්න, 1996:191-192). මෙම තේරුම අනුව යථෝක්ත ස්ථානය මිනිසුන් ආර්ථික හා වාණිජ පරමාර්ථ සහිත ව ග්‍රාමයන්ගෙන් එක්රැස් වන භාණ්ඩ හුවමාරු වූ මධ්‍යස්ථානයක් ලෙස අර්ථ දැක්විය හැකි ය. මෙම ස්ථානයේ ඇතිවුණ සමාජ ආර්ථික, ආගමික වර්ධනය හේතුකර ගෙන එහි පසුව ස්මාරකයක් ඉදිවන්නට ඇත. එය කඩක චේතිය ලෙස ව්‍යවහර වී පසු ව කණ්ඨක චේතිය ලෙස ව්‍යවහාර වන්නට ඇති බව විශ්වාස කළ හැකි ය. එසේ ම නගරයට දකුණ දෙසින් වූ ග්‍රාමයන් පිළිබඳ ව එන සඳහන් අනුව ඇටවීරගොල්ලෑව ස්ථම්භ ලිපියේ එන,

"දෙනා වෙහෙර සිරිසඟ බෝ පිරිවෙණ් බද්
වෙලන් ගැමැ....................(*Ez*,vol.II:45-46)

යනුවෙන් වෙළෙඳ ගමක් පිළිබඳ ව විස්තර ඇතුළත් ව තිබේ. එසේ ම නගරයට දකුණින් නගරය අසලින් ස්ථාන ගත ව තිබූ **"කුම්භකාර ග්‍රාමය"** ද තත්කාලීන භාණ්ඩ හුවමාරුවේ සුවිශේෂී නිෂ්පාදන කාර්යයක් ඉටුකළ ග්‍රාමයකි. එය උක්ත නිෂ්පාදන හා භාණ්ඩ බෙදාහැරීමට පහසු ස්ථානයක හා උපයෝගීතාවය බහුල ස්ථානයක ලෙස ස්ථානගත වීම වැදගත්ය. ඇටවීරගොල්ලෑව සෙල්ලිපියේ සඳහන් **"වෙලන්ගම"** මහාවංසයේ සඳහන් වළං ගම ද (කුම්භකාර ග්‍රාමය ද) යන්න සොයා බැලීම වැදගත් වේ. මේ ආකාරයට දිවයිනේ හාත්පසින් ඇදී ආ සම්පත් ඒකරාශී වූයේ සහ හුවමාරු වූයේ ද්වාර අසළ ඉහත සඳහන් කරන ලද නිගම තුළදී ය. මේ බවට පුරාවිද්‍යාත්මක සාධක ප්‍රමාණවත් ව හමුවී ඇත. අනුරාධපුර ඇතුළු නුවරින් හා ඒ අවටින් හමුවන පූර්ව හා මූල් ඓතිහාසික යුගයට (Proto and Early) අයත් පුරාවිද්‍යා සාධක පෙර කී වාණිජ සබඳතා හා ක්‍රියාකාරීත්වයන් මැනවින් තහවුරු කරයි. ඓතිහාසික යුගයේ දී සුවිශේෂ කාර්යභාරයක් ඉටුකළ **ජෝතිවනය** වශයෙන් මුල් ඓතිහාසික යුගයේ මූලාශයවල ව්‍යවහර වූ ඇතුළු නුවර දකුණු

දොරටුවට යාබද ව පිහිටි භූමි භාගය පූර්ව ඓතිහාසික යුගයේ ඉටුකළ කාර්යභාරය සහ ක්‍රි.ව. මුල් සියවස් කිහිපය තුළ ඉටුකළ කාර්යභාරය පිළිබඳ ව පුරාවිද්‍යාත්මක සාධක රාශියක් මේවන විට එම භූමියේ සිදුකළ පුරාවිද්‍යා පර්යේෂණවලින් හඳුනාගෙන තිබේ. ජේතවන ස්තූපයට උතුරින් ඇතුළු නුවර දකුණු දොරටුවට දකුණින් සිදු කරන ලද පර්යේෂණ කැනීම් සාධක හා ජේතවන ස්තූප සලපතර මළුවේ හා ඉන් පිටත සිදු කරන ලද පර්යේෂණ කැනීම් තුළින් සොයා ගන්නා ලද සාධක මේ සඳහා උදාහරණ ලෙස පෙන්වාදිය හැකි ය. ජේ.එස්.පී 1, 11, 2000, ජේ.එස්.එම්.පී. 2001/2002, ජේ.එස්.ඩබ්.එම්.ජී. 2003/2004 යන ස්ථාන නාම යටතේ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කැනීම්වලින් වාර්තාවී ඇති අඹතෙස්ත (Amathyst), කැල්සිඩෝනි (Calsidony), කානීලියන් (Carnilian), ඇගේට් (Agate), රඹස් (Garnet), ජැස්පර් (Jasper), ලැපිස්ලැසුලි වැනි පුරාණයේ දී භාවිත සුවිශේෂී මූල්‍ය වටිනාකම් සහිත ඛනිජ වර්ග ජේතවන භූමියේ පැරණි ක්‍රියාකාරිත්වය හා ස්ථානගත වීම හඳුනාගැනීමේ දී ඉතා වැදගත් වේ (මැන්දිස්,2004: රාජපක්ෂ,2000). මෙම ඛණිජ පාෂාණ මේ ප්‍රදේශයට ආවේණික පාෂාණ නොවේ. විශේෂයෙන් ම කැල්සිඩෝනි පාෂාණය දකුණු ඉන්දියාවේ අරිකමේඩු, අයිහොල් හා කැම්බේ යන ප්‍රදේශයෙන් කුට්ටි වශයෙන් ආනයනය කර මාන්තායිහි දී පබළු වශයෙන් තනා බෙදා හැර ඇත (දෙහිගම,1997:15). එසේ ම අර්ධ මහද්වීපමය ඉන්දියාවේ බටහිර හා නැගෙනහිර දෙදිසාවෙන් මෙම පාෂාණය ආනයනය කර අනුරාධපුර දී නිමි භාණ්ඩ බවට පත්කර බෙදා හරින්නට ඇති බව ද සෙනෙවිරත්නගේ අදහසයි (සෙනෙවිරත්න, 1996:188-190). මීට අමතර ව ලැපිස්ලැසුලි පුරාණ වයඹදිග ඉන්දියාවෙන් (වර්තමාන ඇෆ්ගනිස්ථානය) මෙරටට ආනයනය කරන ලද ඛනිජයකි.

ජේතවන භූමියේ සිදුකළ යථෝක්ත කැනීම්වලින් තහවුරු වී ඇත්තේ විශේෂයෙන් ම ප්‍රග් ජේතවන භූමියේ අමුද්‍රව්‍යය වශයෙන් භාවිත කර ඉවතලන ශේෂිත පාෂාණ කොටස් හා නිර්මාණ ලෙස වාර්තා වේ. මේවාහි භාවිතයේ ස්වරූපය බැලීමේ දී මේවා කර්මාන්තයක් වශයෙන් එම බිමෙහි පවත්වා ගෙන යැමට ඇතැයි සිතිය හැකි සාධක පවතී. එමෙන් ම මෙම පාෂාණ වර්ග හමුවන පහළ ස්තර අශ්‍රයෙන් කාල රක්ත වර්ණ මැටි බඳුන් (Black and



red ware) රතු මැටි බඳුන් (Red ware), කළු මැටි බඳුන් (Black ware) හා විචිත්‍ර ආශුක්ල මැටි බඳුන් (Rulated ware) ආදී මැටි බඳුන් ද වාර්තා වීමෙන් ප්‍රාග් ජේතවනාරාම යුගයේ ජනාවාස පැවති බව තහවුරු වේ. මෙම ස්තර ආශ්‍රිත ව හමු වූ ඇතා සහ ස්වස්තික කාසි, ලක්ෂ්මී තහඩු කාසි වානිජ කටයුතුවලට අදාළ තවත් සාක්ෂි සපයයි. එමෙන් ම දැරණියගලගේ මතයට අනුව අනුරාධපුර ඇතුළු නගරය තුළ මෙම සාධක හමුවන්නේ මධ්‍ය මුල් ඓතිහාසික යුගයේ ය (Middle early historic 250BC-100AD). මෙම වකවානුව ඇතුළු නුවර ජනාවාසය උපරිම ව්‍යාප්තිය පෙන්වන හෙක්ටයාර් 100 ක ව්‍යාප්තිය දක්වා ව්‍යාප්තවී තිබේ(Deraniyagala,1992:712-713).

ජේතවන භූමියේ සිදු කරන ලද පර්යේෂණ කැනීම් සාධකවලින් හමු වූ සාධක අතර ලෝහ සාධක ද ඉතා වැදගත් වේ. ලෝහ සාධක අතර තඹ, යකඩ ලෝහ ශේෂ හා ලෝහ නිර්මාණ ද කෝව, තඹ, බොර හා යකඩ බොර (Slag) ද විශාල ප්‍රමාණයක් ප්‍රාග් ජේතවනාරාම භූමියේ පහළ ස්තරවලින් ලැබී තිබේ (මැන්දිස්,2000: මැන්දිස්,2001/2004). වත්මන් පුරාවිද්‍යා අධ්‍යයන අනුව ප්‍රාථමික යකඩ යුගයේදී (Early iron age) භාවිත කළ ලෝපස් නිධියක් සේරුවිලින් සොයාගෙන ඇත. පුරාණයේ සේරුනුවර වශයෙන් හැඳින් වූ මෙම ප්‍රදේශයේ වූ ලොහ පස් නිධියේ ලෝහ පස් පොම්පරිප්පුව, යාපනය, මාච්චාල්ගම, යාන්ඔය ආදී ප්‍රොටෝ ඓතිහාසික ස්ථාන වෙත රැගෙන ගොස් ඇත (Senaviratne,1994:273).

අනුරාධපුර ඇතුළුනගරයේ සිදු කරනු ලැබූ කැනීම්වල දී 4 A සහ 4 B පස් ස්තරවලින් හමු වූ තඹ බොර සේරුනුවර තඹ නිධියේ තඹ සංයුතියට සමාන බව විද්‍යාත්මක ව ඔප්පුකර තිබේ (Deraniyagala,1972:145; Seneviratne,1984). ධාතුවංසයේ සඳහන් වන "**තම්බ තිර්ථ**" (තඹ හුවමාරු තොටුපල) ක්‍රි.ව. මුල් සියවසේ සෙල්ලිපිවල සඳහන් "ලෝහ ද්වාර" හා ධාතුවංසයේ සඳහන් "**මහා වාරිකා මග්ග**" පුරාණ සේරු නුවරට පිවිසෙන මාර්ග බව හඳුනාගෙන තිබේ. එම මාර්ග අතරින් අනුරාධපුරයේ සිට සේරුනුවරට පිවිසෙන මාර්ගය ආසන්නයේ ඇති ශිලාලිපි වන කහටගස්දිගිලිය, ලබුඇට බැදිගල, නැට්ටුක්කන්ද, බ්‍රහ්මණයාගම

ආදී ස්ථානවල ඇති ශිලාලිපිවල එන **කබර, තබර** හා **තොපෂ** යන විශේෂ ප්‍රාගුණ්‍යතාවය සහිත ශිල්පීන්ගේ නාමවලින් ලෝහ කර්මාන්තය හා සම්බන්ධ විශේෂ ප්‍රාගුණ්‍යතාවයක් දැක් වූ පිරිස් එම ප්‍රදේශ ඇසුරෙන් ස්ථානගත ව සිටි බව හඳුනාගෙන ඇත (Senaviratne,1994:275-276). පුරාවිද්‍යා පර්යේෂණ අනුව පෙන්වාදෙන වැදගත් ම කාරණය නම් අනුරාධපුර නගරය ආශ්‍රිත ප්‍රදේශය සඳහා සේරුනුවර ප්‍රදේශයේ තිබූ විවිධ සම්පත් පරිවහන මාර්ගවලින් වෙළඳ පොළ දක්වා පැමිණීම නිසා එම ප්‍රදේශ ඇසුරින් විවිධ කර්මාන්ත පවත්වාගෙන ගිය ජන පිරිස්වල ක්‍රියාකාරිත්වය ද ඉන් පැහැදිලි වන බව හඳුනාගත හැකි ය. එසේ ම ජේතවන භූමියේ පහළ ස්තරවලින් වාර්තාවන ලෝහ බොර හා කෝව මෙන් ම ලෝහ කර්මාන්තයේදී භාවිත කරන උඳුන් වාර්තා වීම මගින් ද පෙන්නුම් කරන්නේ උක්ත කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාවලියක්, විශේෂයෙන් නිෂ්පාදන ක්‍රියාවලියක් ප්‍රාග් ජේතවන යුගයේදී එම භූමිය ඇසුරින් සිදුවී තිබෙන බවට උපකල්පනය කළ හැකි බව ය. එම සාධක බොහෝ විට පූර්ව ඓතිහාසික යුගයේ අවසාන භාගයේ හෝ මුල් ඓතිහාසික යුගයේ මුල් භාගයට අයත්වීමට ඉඩ කඩ ඇත්තේ හමුවී ඇති මානව කෘති සන්සන්දනය කිරීමේදී එවන් තත්වයක් හඳුනාගැනීමට ඉඩ ප්‍රස්ථා තිබෙන බැවිනි.

එසේ ම ජේතවන භූමිය ඇසුරෙන් සිදුකළ ජේ.එස්.පී. 2000, ජේ.එස්.පී.11,2000, ජේ.එස්.එම්.පී.2001/2002, ජේ.එස්.ඩබ්.එම්.පී. 2003/2004 යන ස්ථාන නාම යටතේ සිදුකළ කැනීම් සාධක අනුව ප්‍රාග් ජේතවනාරාම අවධියේදී මෙකී භූමි භාගය ඇසුරෙන් මූල්‍යමය සංසරණයක් ප්‍රභල ව සිදුවී ඇති බව ද පැහැදිලි වන්නේ සෑම පර්යේෂණ කැණීමකින් ම හමුවී ඇති පුරාවිද්‍යා දත්ත පරීක්ෂාවෙන් විමසන විට ලැබී ඇති පැරණි කාසි අනුවය. ඒ අනුව ඉහත සඳහන් කරන ලද යථෝක්ත කැනීම් තොරතුරුවලට අනුව වඩා පැහැදිලි වන්නේ අනුරාධපුර ඇතුළු පුරයට දකුණින් පිහිටන බිම පුරාණයේ දී යම් කිසි වාණිජ කටයුතු පෙරදැරි කරගත් ක්‍රියාවලියක් සනිටුහන් කරන බව ය. අප විසින් මෙහිදී මීළඟට විමසිය යුතු කාරණය නම් පූර්ව ඓතිහාසික අවධියේ අනුරාධපුර නාගරික පසුබිමේ ආර්ථිකමය හා වාණිජමය ලෙස සුවිශේෂී කාර්යභාරයක් ඉසුලූ බිම්කඩක් එකී තත්ත්වය අභිබවා ආගමික



මධ්‍යස්ථානයක් ස්ථානගත වීමට බලපෑ ප්‍රවණතා කවරේදැයි යන්න පිළිබඳව ය.

මේ තත්ත්වය නිරූපණය කරන යථාර්ථය නම් තත්කාලීන දේශපාලන සමාජ ආර්ථික හා ආගමික ප්‍රවණතා සමගාමී ව ක්‍රියාකර ඇති බවකි. ශ්‍රී ලංකාවේ බොහෝ පුරාස්ථාන ගෙන බලන කල පැහැදිලි වන කාර්යයක් නම් ආර්ථික හා දේශපාලන වශයෙන් නැගී ආ මධ්‍යස්ථානයන් හා සම්බන්ධ වූ ප්‍රභූ පිරිස් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කෙරෙන ආගමික ස්ථාන ඉදිකිරිමේ නිරත වූ බවකි. මෙබඳු තත්කාලීන ප්‍රවණතාවයක් නිසා අනුරාධපුර ඇතුළු නගරය වටා වූ සුවිශේෂි ආකර්ෂණීය භූමි භාගය තුළ ආගමික මධ්‍යස්ථාන ස්ථානගත වීම දක්නට පිළිවන. එසේ ම මේ තත්ත්වයට තවත් හේතු වන්නට ඇති සාධක අතර රාජ්‍යත්වය හා අගම අතර සුවිශේෂි බැඳීමක් ද ඉවහල් වන්නට ඇත. පරිපාලන මධ්‍යස්ථානයේ ආරක්ෂාව උදෙසා සමීපයේ ම ඔවුන් ස්ථානගත වන්නට ඇත්තේ ඊට උපදෙස් සැපයූ පිරිසක් සමඟ වීම ද සැළකිය යුතු කරුණකි. පරිපාලන මධස්ථානයේ ආරක්ෂාවට ඒ වටා පවුරු දිය අගල් ඉදි වූව ද පසු ව පැමිණි දේශපාලන අභියෝගයන්ට මුහුණ දෙනු වස් ඒවා ප්‍රමාණාත්මක නොවූව හොත් ප්‍රභල නියමුවන් පිරිසක් පවුරක් ලෙසින් ස්ථානගත කරීම තුළ රාජ්‍යත්වය ආරක්‍ෂා කිරීමට පරිපාලනය පොළඹවන්නට ඇත. එවිට රාජ්‍යත්වය හා සෙසු සමාජයේ සුවිශේෂී අනුග්‍රහය මත අනුරාධපුර ඇතුළු නුවර වටා ආගමික මධ්‍යස්ථාන එනම් නිකායික මූලස්ථාන වර්ධනය වන්නට විය. මේ තත්ත්වය හමුවේ සුවිසල් ඉදිකිරීම් වන ස්තූප හා වාස්තුවිද්‍යා අංග ඉදිකිරීම සාමාන්‍ය තත්ත්වයකි. ඇතුළුනුවර වටා වූ මේ ප්‍රධාන ආරාම වන ජේතවන, අභයගිරි, මහා විහාරය, මිරිසවැටිය, දක්ඛිණ විහාරය තත්කාලීන සමාජයේ සුවිශේෂ කාර්යභාරයක් ඉටුකළ අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස ද පසුව වර්ධනය වී ඇති බව මූලාශ්‍රය සාධක තුළින් ද තහවුරු වේ. ඒ අනුව ජේතවන භූමිය ප්‍රාග් ජේතවනාරාම යුගයේ සිට ම සුවිශේෂී කටයුතු සඳහා ක්‍රියාත්මක වී ඇති අතර අවසන් වශයෙන් ආගමික මධ්‍යස්ථානයක ස්ථානගත වීමට පසුබිම් සකසා ඇති බව පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රය සාධක විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමෙන් තහවුරු කරගත හැකි වේ.



ප්‍රාග් ජේතවන පාංශු ස්තරවලින් හමුවන ශිලා මෙවලම්





ප්‍රාග් ජේතවන අවධියේ ලෝහ නිෂ්පාදන ක්ෂේත්‍රයක්

## 2.2 ජේතවනාරාමයේ පුරාණ සීමාව

පුරාණ ජේතවනාරාම භූමියේ ස්ථානගත විම ඉහත ආකාරයෙන් සිදුවීමේ දී එම භූමිය ආශ්‍රිත සීමාවන් හඳුනාගැනීම ද ඉතා වැදගත් වේ. මූලාශ්‍රය සාධක අනුව මහාමේඝ වනය මුටසීව රජු විසින් නිර්මාණය කරන ලදි (මව,11:1-2). මහාවංසයේ සඳහන් වන ආකාරයට පුරයට දකුණු පසින් නන්දන උයන ස්ථානගත වී තිබුණ බව පෙනේ (මව,15:1-3). නන්දන වනය පුරයට (නුවරට) ඉතා ම ආසන්නයේ පිහිටි ස්ථානයක් බව මිහිඳු හිමි විසින් පළමු වැනි ධර්ම දේශනයෙන් පසු එහි විසීමට අකමැත්ත ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි වේ. වංසකතාව විස්තර කර ඇති ආකාරයට මෙම උයන තුරුලතාවන්ගෙන් යුත් සිහිල් මනරම් උයනකි (එම:1-2). එසේ ම මෙම උයනට මහමෙවුනා උයන ඉතා ම ආසන්නයේ පිහිටි බව ද පෙනේ. එය පැහැදිලි වන්නේ මහාවංසයේ විස්තර කර ඇති විස්තරවලට අනුව නන්දන වනයේ බණ දෙසූ මිහිඳු හිමි එහි දකුණු දොරටුවෙන් පිටවී මහමෙවුනාවේ නැගෙනහිර දොරටුවෙන් එම උද්‍යානයට ඇතුළු වූ බව සඳහන් කිරිමෙනි (එම:10-12). මෙම කරුණු අනුව පැහැදිලි වන කාරණය වන්නේ නන්දන උයන යන්න මහාමේඝ වනය ආසන්නයේ වූ සුවිශේෂී

රාජකීය උද්‍යානයක් බව ය. එසේ නම් මෙම භූමිය රජ උයනක් ලෙස වෙන ම ස්ථානගත වී තිබෙන්නට ඇත්තේ සුවිශේෂී කාරණා පදනම් කර ගෙන විය යුතු ය. එසේ ස්ථානගත වීමේ දී අනිවාර්යයෙන් ම යම් සීමාවක් මෙයට ක්‍රියාත්මක වන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

ඓතිහාසික මූලාශ්‍රය අධ්‍යයනයේ දී පැහැදිලි ව අනාවරණය වන කරුණක් නම් ජේතවනය ස්ථානගතවීම පිළිබඳ පැහැදිලි තොරතුරු තිබෙන බව ය. දීපවංසයේ තොරතුරු අනුව නන්දන වනය නුවරට දකුණු දිගින් පිහිටි බව සඳහන් කර තිබේ (දීව.,15:11). මහාවංසය අනුව ද නන්දන වනය (උයන) දකුණු දොරටුවට පිටතින් වූ බව සඳහන් වේ. "**දක්ෂිණ ද්වාරේ ද්වාරතොබහි**"(මව, පරි.15). සමන්තපාසාදිකාව ද නන්දන උයන දකුණු දොරටුවට සම්බන්ධකර පෙන්වයි. "**දක්ෂිණ ද්වාරේ නන්දන වනං උද්‍යානෙ**" (සපා,83:71). ඓතිහාසික යුගයේ දී මේ ප්‍රදේශය අයත් බිම්කඩ සුවිශේෂී භූමියක් ලෙස පුරයේ දකුණු දොරටුවට දකුණින් පිහිටි බව මේ අනුව පැහැදිලි වේ. අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වූ පූර්ව ඓතිහාසික අවධියේ නගරය හා සම්බන්ධ මාර්ග ජාලයක් ක්‍රියාත්මක වූ බව ඉහත දී අවධාරණය කරන ලදී. ඒ අනුව ඇතුළුනුවර දකුණු දොරටුව දෙසින් දකුණට ඇදී ගිය මාර්ගය පිළිබඳ මූලාශ්‍රයන්හි සඳහන් තොරතුරු අනුව එය මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව ඉදිරියෙන් තිසාවැව, ඉසුරුමුණිය, වෙස්සගිරිය හරහා මලය රටට දිවගිය බව සඳහන් වේ (සද්ධර්‍මාලං,539). දැනට සිදුකර ඇති පුරාවිද්‍යා අධ්‍යයන අනුව ද දඹුල්ලේ සිට උතුරට දිවයන මාර්ගය අනුරාධපුරය ඔස්සේ වයඹ දිගින් මහා තිර්ථයටත් එතනින් යාපනයටත් සම්බන්ධ වූ බව පැහැදිලි වේ (සෙනෙවිරත්න,1996:193-185). මෙම මාර්ග ජාලය හරහා විවිධ සම්පත් පරිහරණය වූ ආකාරය ද පුරාවිද්‍යා පර්යේෂණයන් ගෙන් සනාථ කරගෙන ඇත (එම).

මෙම කරුණු අනුව පැහැදිලි වන කාරණය වන්නේ අනුරාධපුර ඇතුළු නගරයේ දකුණු දොරටුවෙන් දකුණට දිවගිය මාර්ගයක් පිළිබඳ ව යි. මෙම මාර්ගය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක ද යම් පමණකට ලැබී තිබිම ඉතා වැදගත් වේ. 1960 වසරේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් අනුරාධපුර ඇතුළු



නගරය දකුණු ප්‍රාකාරය මධ්‍යයේ (වත්මනෙහි සංඝමිත්තා මාවත) සිදු කරනු ලැබූ කැණීමක දී අනුරාධපුර ඇතුළු නගරය තුළට හා ඉන් දකුණට විහිදෙන්නා වු අඩි 57 ක් පමණ පළල මාර්ග යක් සොයාගත් බව වාර්තාකර ඇත. එසේ ම වැඩිදුරටත් එහි දක්වා ඇති අදහස් අනුව එම මාර්ගය මැද කළුගලින් තැනූ අත්තිවාරමක් සහිත පදනමක් මත අඩි 24×16 ප්‍රමාණයේ ගඩොළු ඉදිකිරීමක් දැකගත හැකි වූ බවත් එම ගඩොළු ඉදි කිරිම යම්කිසි මුර කපොල්ලක ස්වරූපයක් ගන්නා බවත් සඳහන් කර ඇත (*ASCAR*, 1960:64). එසේ ම නගර ප්‍රාකාරයෙන් දකුණු දෙසට එනම් රුවන්වැලි දාගැබ ඉදිරිපසින් එළාර සොහොන (දක්ෂිණ ථූපය) දෙසට රේඛීය ව ව්‍යාප්ත වන පැරණි මාර්ගය දෙපස වර්තමානයේ යම්කිසි ගොඩැලි ස්වරූපයක් දැකගත හැකි වූ බව ද එහි වැඩැදුරටත් සඳහන් කර තිබේ (*ASCAR*, 1978:7). මේවන විට මෙම ගොඩැලි කැනීම් කර මාර්ගය දෙපස වූ ප්‍රාකාරය මතුකර ගෙන සංරක්ෂණය කර ඇත. ඒ අනුව මෙම මෙම පුරාවිද්‍යා සාධක අනුව පැහැදිලි වන්නේ යම්කිසි පැරණි මාර්ග පද්ධතියක් පුරයෙන් දකුණු දෙසට විහිදී ගිය බව ය. ඇතුළු නුවර දකුණු දෙසින් පිහිටි එළාර සොහොන දෙසට රේඛීය ව මේ මාර්ගය දිවයන්නේ නම් මෙම පැරණි මාර්ගය ගමන් කෙරිය යුත්තේ රුවන්වැලි සෑය හා ශ්‍රී මහා බෝධිය දෙසින් වීමට ඉඩ තිබේ. මෙම පුරාවිද්‍යා සාධක අනුව අපට නිශ්චිත ලෙස ම අනුරාධපුර ඇතුළු නගරයේ දකුණු දොරටුව මෙය ම යැයි නිශ්චිත කිරීම තරමක් අපහසු වන්නේ එම වාර්තාවේ ම සඳහන් වන මාර්ගය මැද ගල් පාෂාණ පදනමින් යුත් අට්ටාලක ස්වරූපය ගන්නා ගොඩනැගිල්ලක් පිළිබඳ දක්වන අදහසයි. අඩි 57 පළල මාර්ගයක් මැද ඇතුළු නුවර තුළට හා ඉන් පිටතට විහිදෙන ප්‍රධාන මාර්ගයක් පිහිටා තිබීම පිළිබඳ සැළකිය යුතු ය. එසේ ම ප්‍රධාන ද්වාරය මධ්‍යයේ අට්ටාලයක් හෝ මුරකුටියක් පිහිටුවීම ගැටළු සහගත තත්ත්වයකි. එසේ ම එහි සඳහන් කරන මාර්ගය ක්‍රි.පූ. තුන් වැනි සියවසේ ඉදිවූ මහා විහාරයේ ශ්‍රී මහා බෝධියට නැගෙනහිරින් විහිදී ගියා ද යන්න පිළිබඳ තව ම පුරාවිද්‍යා සාධක හමු වී නැත. කෙසේ වෙතත් මුල් ඓතිහාසික යුගයේ සිට ම මෙම ද්වාර හා සම්බන්ධ තොරතුරු විවිධ මූලාශ්‍රයන් හි සඳහන් වන අතර, මෙම ද්වාරය හා සම්බන්ධ ගමන් මාර්ගය පිළිබඳ ව ද සඳහන් වේ. ක්‍රි.පූ. තුන් වැනි සියවසේ

ලංකාවට පැමිණි මහා මහින්ද මහ රහතන් වහන්සේ මහාමේඝ වනයට ඇතුළු වූයේ එහි නැගෙනහිර දොරටුවෙන් බව සඳහන් වේ (මව,15:10:12). ථූපවංසයට හා විසුද්ධි මග්ගයට අනුව ඇතුළු නගරයේ දකුණු දොරටුවේ සිට මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව සඳහා දුනු 500 ක් දුර බව රෝලන්ඩ් සිල්වා ප්‍රකාශ කර තිබේ (සිල්වා,2007:62). මහාවංසයේ සඳහන් වන පුවතක් අනුව මිහිඳු මහ රහතන් වහන්සේගේ ආදාහණය සඳහා උත්තිය රජු සෑගිරියේ සිට මිහිඳු මාහිමියන්ගේ දේහය නුවරට ගෙනවුත් නුවර රජ වීදියෙහි හසුරුවා මහ වෙහෙරට ගෙන ගොස් ඇති බව සඳහන් වේ.

> **''අලංකතෙන මග්ගෙන බහුලංකතං පුරං**
> **ආනයිත්වාන නගරෙ චාරෙත්වා රාජවීථියා''** (මව,20:38)

දක්ෂිණ ප්‍රධාන මාර්ගය මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව අසළින් තිසාවැව, ඉසුරුමුණිය, වෙස්සගිරිය දක්වා ද එතනින් මලය රට දක්වා ද ගමන්කර ඇත. මහාවංසයේ සඳහන් වන ආකාරයට දුටුගැමුණු රජතුමා ද රාජචාරිත්‍ර සඳහා තිසා වැවට යාමට මෙම මාර්ගය භාවිත කළ බවට වංසකතාවේ සඳහන් පුවත අනුව මෙම මාර්ගය තිසාවැව පසුකර ගිය බව පැහැදිලි වේ (මව,26:07). සද්ධර්මාලංකාරය අනුව ද අනුරාධපුරයේ සිට මලය දෙසට ගමන්ගත් මාර්ගයක් ගැන සඳහන් වේ. වංසකතා සාධක අනුව දකුණු දොරටුවෙන් පිට වූ වේළුසුමන යෝධයා ද තිසාවැවෙන් වතුර ගෙනයාමට දකුණු දොරටුවට දකුණු පසින් පිහිටි කුඹල් ගමෙන් කළයක් ගෙන තිසාවැවට ගිය පුවතක් පිළිබඳ ව සඳහන් වේ (Ratnayake;1984:06). මෙම තොරතුරු අනුව පැහැදිලි වෙන්නේ අනුරාධපුර ඇතුළු නගරයේ සිට දකුණට විහිදෙන මාර්ගය පැහැදිලි ලෙස ම මහා විහාරයේ නැගෙනහිර දොරටුව අසලින් ගමන් කර ඇති බව ය. එය එසේ නම් 1960 වසරේ සිදු කරනු ලැබූ කැනීම්වල දී අනාවරණය කරගනු ලැබූ මාර්ගය කුමක් ද එය මූලාශ්‍රයන්හි සඳහන් පුරයෙන් දකුණට විහිදුන මාර්ගය ම ද යන්න සැක සහිත ය. වර්තමානයේ ජේතවනයේ බටහිර සීමාව හා මහා විහාරයේ නැගෙනහිර සීමාව දැක්වෙන ප්‍රධාන ප්‍රකාර දෙකක් දැකගත හැකි වේ. මේ විහාර අතර කිසිදු ස්මාරකයක් හෝ නටබුන් කිසිවක් දැකගත නොහැකි භූමිය හිස්



භූමියක් පිහිටා තිබේ. නමුත් එහි මතුපිට බහුල ලෙස මැටි බඳුන් ව්‍යාප්තවී තිබීම හඳුනාගත හැකි ය. ජේතවනාරාම විහාරයේ බටහිර පවුරට දකුණින් පිහිටන හාල්පානු ඇලෙහි බටහිර ඉවුර පරීක්ෂාවෙන් බැලීමේ දී ඉවුර හරස්කඩ පැහැදිලි ලෙස ස්තර විහිදී ගිය බවක් දැකගත නොහැකි ය. එසේ ම හාල්පානු ඇළ වර්තමාන මට්ටමේ මව් පාෂාණය (Bed rock) හි පිහිටන බව පෙනේ. එසේ නම් එම භූමිය පුරාණයේ සිට ජනාවාසයෙන් තොර භූමියක් බව නිගමනය කිරීම සාධාරණ වේ. ඒ අනුව වංසකතා සාධක මඟින් සනාථ කරන දකුණු ද්වාරය හා සම්බන්ධ දකුණු ගමන් පථය මේ හරහා විහිදී ගිය බව පිළිගත හැකි ය. මූලාශ්‍රයන්හි සඳහන් වන කනිට්ඨතිස්ස දවස ඉදිවූ දක්ෂිණ විහාරය දක්වා කළ (මව,36:14) මාර්ගය පෙර කළ සිට පැවති මාර්ගය නැවත ප්‍රතිසංස්කරණය කිරීමක් වීමට බොහෝ සේ ඉඩ ඇත. ජේතවනාරාම විහාරය හා මහා විහාරය යන විහාරයන්හි සීමා අතරින් ඇතුළු නුවර දෙසට දිවයන මෙම මාර්ගය ඇතුළු නුවර දකුණු ප්‍රාකාරය දෙසට විහිදෙන අතර ඇතුළු නුවර දකුණු ප්‍රාකාරයේ දකුණින් දැනට දක්නට ඇති භූමිය හිස් භූමියක් ලෙස නටබුන් රහිත ව දැකගත හැකි වීම ද කැපීපෙනේ. මේ මඟින් පැහැදිලි වන්නේ ඇතුළු නුවර දක්ෂිණ ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ ද්වාරගාම වශයෙන් මහාවංසයේ හඳුන්වන (මව,10:88) වෙළෙඳපොළ දීපවංසය අන්තරාපන (දිව,9:36) වශයෙන් සඳහන් වන භාණ්ඩ හුවමාරු කරනු ලැබූ ස්ථානය හා ලබුඇටබැඳිගල හා තෝනිගල සෙල්ලිපිවල සඳහන් වන නිගම (*Ez*,vol.III:177-180) වෙළෙඳ පොළකට සුදුසු උස් භූමියකි. එබැවින් දකුණු දෙසින් පැමිණි ගමන් පථයක් මෙවැනි ස්ථානයක් දක්වා ඇදී ඒම පිළිගත හැකි කරුණකි. එසේ හෙයින් ඇතුළු නුවර දකුණු දොරටුව හා සම්බන්ධ පැරණි ම මාර්ගය 1960 වසරේ කැනීම් මඟින් හෙළි වූ පැරණි දකුණු දොරටුව ද යන්න ගැන තව ම තැබිය යුත්තේ ප්‍රශ්නාර්ථයකි. එසේම මහා විහාර ව්‍යාපෘතිය විසින් 2000 වසරේ මුල් භාගයේ දී මහා විහාර ප්‍රාකාරය කැනීමේදී ගල් පුවරුක වූ සෙල් ලිපියක් සොයා ගෙන තිබේ. එම සෙල් ලිපියේ අවසානයේ **"දෙවන විහර සිමි"** ලෙස සඳහන් වී තිබෙන බැවින් එමඟින් ජේතවන හා මහා විහාර සීමාව පැහැදිලිව සඳහන් වීමක් ද පෙන්වා තිබෙන බැවින් මෙම සීමා දෙක අතර මාර්ගයක් වූ බව පිළිගැනීමට ද එය වැදගත්

වේ. කෙසේ වෙතත් ක්‍රි.ව. පස් වැනි සියවස තුළදී බුද්ධඝෝෂ හිමි සඳහන් කරන ථූපාරාමය දෙසින් නැගෙනහිර දෙසට ගිය මාර්ගය දකුණු දොරටුව අසලින් උතුරට හැරුණු බව සඳහන් කර තිබීම නිසා (Rathnayaka,1984:06). එවැනි මාර්ගයක් ලෙස දැනට හඳුනාගත හැක්කේ 1960 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සොයා ගන්නා ලද මාර්ගය පමණි. එම නිසා ඇතුළුපුර දකුණු ප්‍රාකාරය ඔස්සේ පුරාවිද්‍යාත්මක කැනීම් කිහිපයක් හෝ භූ භෞතික ගවේෂණයක් සිදුකර ඇතුළු නගරයත් දක්ෂිණ ද්වාරයේ නිශ්චිත පිහිටීමත් සොයා ගන්නා තෙක් මෙම මාර්ගය නිශ්චිතව හඳුනාගැනිම විවාදාත්මක බව ඉහත සඳහන් තොරතුරු අනුව පෙන්වාදිය හැකි ය.

කෙසේ වෙතත් පැහැදිලි ව පෙනෙන කරුණ නම් කුම්භකාර ග්‍රාමය වූ ප්‍රදේශය දෙසට පුරයේ දකුණු දොරටුව හා සම්බන්ධ මාර්ගය මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව දෙසින් වෙස්සගිරිය දක්වා ගමන් කර ඇති බව ය. එසේ හෙයින් පූර්ව ඓතිහාසික යුගයේ සිට ම නන්දන වනය වෙන ම ස්ථානගත වූ සුවිශේෂී භූමියක් ලෙස කැපීපෙනුන බව පැහැදිලි වේ. ඓතිහාසික තොරතුරු අනුව ද වර්තමාන ජේතවනාරාමයට අයත් පුරාණ නන්දන වනය වෙන ම පැවති භූමියක් බව පෙනේ. ජේතවන ආරාම සංකීර්ණය පිහිටි භූමිය මුලින් හඳුන්වන ලද්දේ "**නන්දන උද්‍යානය**" නමිනි. එය මුල් වරට සඳහන් වනුයේ ක්‍රි.පූ. තුන් වැනි ශත වර්ෂයේ ඉන්දියාවේ ශ්‍රේෂ්ඨතම රජෙකු වූ අශෝක අධිරාජ්‍යාගේ පුත්‍ර මිහිඳු මහ රහතන් වහන්සේ සම්බන්ධ කරගෙන ය. උන්වහන්සේ දින 07 ක් නොකඩවා ධර්ම දේශනා කර හත් දහසකට අධික ජනකායක් බුදු දහම කෙරෙහි නැඹුරු කර වූයේ මෙම උද්‍යානයේදී ය (මව,15:216-219). එබැවින් නන්දන උයන පසු ව ජෝති උයන නමින් හැඳින් විය. එහි අර්ථය වූයේ ධර්මාලෝකය විහි දී ගිය ස්ථානය යන්න ය (රත්නායක, 1998:331). වංසකතා තොරතුරු අනුව දෙවනපෑතිස් රජතුමා මිහිඳු මාහිමිට නන්දන උයනෙහි වැඩ සිටිනා ලෙස පැවසූ විට මිහිඳු හිමි ප්‍රකාශ කරනුයේ නන්දන උයන පුරයට ආසන්න නිසා එහි ඝෝෂාකාරී භාවය වැඩි බැවින් වැඩ සිටිය නොහැකි බව ය. අනතුරු ව මිහිඳු මහ රහතන් වහන්සේ මහමෙව්නා උයනේ එදින



රාත්‍රිය ගතකිරීමට කැමැත්ත පලකර ඇත (මව,15:6-9). ඉන්පසු මිහිඳු මාහිමි නන්දන උයනේ දකුණු පසින් පිහිටි මාර්ගයෙන් ගොස් මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුවෙන් ඇතුළු වී ඇත (එම,15:10-12). මෙම තොරතුරු අනුව ද පැහැදිලි වන්නේ නන්දන වනය මහාමේඝ වනයෙන් වෙන් ව පිහිටි ස්ථානයක් බවයි. එසේ ම දකුණු ද්වාරය හා සම්බන්ධ ව තිබූ මාර්ගය නිසා මෙම භූමි දෙක වෙන්වී තිබෙන්නට ඇති බව මූලාශ්‍රය තොරතුරු තුළින් තවත් පැහැදිලි වේ. පසුකාලීන ව ලියවුන ග්‍රන්ථයක් වන මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව සිංහ වික්‍රාන්ත විහාර සැලසුම අයත් විහාරවල ප්‍රධාන දොරටුව නැගෙනහිරින් පිහිටිය යුතු බව ද දක්වා තිබේ (*Mvs*,230). මහා විහාරය අයත් වන්නේ සිංහ වික්‍රාන්ත සැලැස්මට බව සද්ධර්මාලංකාරයේ සඳහන් වේ (සද්ලං,409). මහා බෝධිවංසය අනුව ද මෙම විහාරය ඉහත සැලැස්මට අයත් බව සඳහන් කර ඇත (මබෝව,86). ටී.ජී. කුලතුංගගේ අදහස වන්නේ ද ක්‍රි.ව. දස වැනි සියවසේ ලියන ලද මහා බෝධිවංසයේ මහා විහාරයේ වැදගත් ස්ථාන සිංහ වික්‍රාන්තියෙන් වූ බව ය (කුලතුංග, 2001:02).

මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව සිංහ වික්‍රාන්ත සැලැස්ම අනුව මහා විහාරයේ ගොඩනැගිලි බොහෝ දුරට සමාන වුව ද එය අහඹු සිදුවීමක් බව පිළිගැනීමට සිදු වේ (මාරසිංහ,1989:15). මෙම තොරතුරු අනුව ඓතිහාසික තොරතුරු සමපාත බවක් නොදැක්වූ ව ද මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රය රචනා කරන සමය වන විටත් මහා විහාරයේ ප්‍රධාන දොරටුව නැගෙනහිර දෙසින් පිහිටි බව පිළිගැනීමට හැකි ය. බොහෝ විට මෙම ග්‍රන්ථය එම විහාරයේ ගොඩනැගිලි අධ්‍යයනය කර එම සැලැස්ම නිර්මාණය කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. කෙසේ වෙතත් මෙම කරුණු අනුව ද පැහැදිලි ව පෙනෙන්නේ මහා විහාරයේ නැගෙනහිර දොරටුව බොහෝ විට ඇතුළු නුවර දකුණු ද්වාරය හා සම්බන්ධ ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා තිබීමට ඉඩ ඇති බව ය. දැනට දක්නට ලැබෙන මහා විහාරයේ නටබුන් ප්‍රකාරය හා ජේතවනාරාමයේ නටබුන් ප්‍රකාරය අනුව ද මෙම උභය විහාර දෙක අතර වූ සීමා මේ තත්ත්වය සනාථ කරන සාධක වේ. ජේතවනාරාම සීමා හඳුනාගැනීමේ දී එහි පුරාණ භූමිය නැගෙනහිර පසින් මල්වතු ඔය බටහිර ඉවුර දක්වා

විහිදී තිබුණ බව පිළිගත හැකි ය. විශෙෂයෙන් නගරයට නැගෙනහිරින් වූ මාර්ග පද්ධතිය එහි තවත් සීමා ඉමක් වීමට ඉඩ ඇත. අනුරාධපුරයට නැගෙනහිර සිට පැමිණි ගමන් මාර්ගය කඩක චෛතිය හරහා මල්වතු ඔය එතෙර කර නගරයේ නැගෙනහිර දොරටුවට සම්බන්ධ වූ බව මහාවංසයේ සඳහන් වේ (මව,17:24-29). මේ මාර්ගය ඔස්සේ සුමන සාමනේර හිමි දකුණු අකුධාතුව රැගෙන ආ බව ද සඳහන් වේ (එම:6-29). මහා සීමාව සළකුණු කිරීමේ දී මල්වතු ඔය බටහිර ඉවුරට සමීප ව දිවගිය මාර්ගයක් ගැන සඳහන් වේ (මව,15:188-209). මේ මාර්ගය කුම්භකාර ග්‍රාමය අසළින් බටහිරට පැමිණි බව පෙනේ. මෙසේ මල්වතු ඔය බටහිර ඉවුර දිගේ දිවගිය මාර්ගය එක් පසකින් නන්දන උයනේ දකුණු පසින් මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුවට සම්බන්ධ වූ බව පෙනෙන්නේ මිහිදු මාහිමි නන්දන උයනේ දකුණු දෙසින් පැමිණ මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුවෙන් ඇතුළු වූ බවට මහාවංසයේ සඳහන් වන බැවිනි (මව,5:11-12). එසේ නම් මෙම මාර්ගවලින් වටවූ බිම පුරාණ නන්දන වනය, එසේත් නැතහොත් රාජකීය උද්‍යානය ලෙස භාවිත වූ උයන බව මුලාශ්‍රයගත තොරතුරු අනුව ද පැහැදලි වේ.

ජේතවන විහාරයේ බටහිර සීමාව තීරණය වීමේ දී එහි දැනට දැකගත හැකි සීමා පවුරට පිටතින් වන හාල්පානු ඇළ උපයෝගී වූවා දැයි විමසීම ද කාලෝචිත වේ. විශේෂයෙන් ම මෙම ඇළ මාර්ගය සමඟ පවතින නටබුන් වු ගල් පාලමක ශේෂ හා මූලාශ්‍රය තොරතුරු අනුව මේ ඇළ පුරාණ ඇළක් බවට ඇති සාධක වේ. මහාවංස සඳහනකට අනුව "**සේන ගුත්තික රාජ්‍යයේ උදක ශුද්ධික ද්‍රවිඩයෝ නදිය දුරයැයි සිතා බැඳ එය නුවරට ආසන්න කළහ**" (මව,15:205-208) යනුවෙන් සඳහන් වේ. දැනට දැකගත හැකි ආකාරයට මල්වතු ඔය සම්බන්ධ කර නිර්මාණ කර ඇති ජල මූලාශ්‍රයක් වන්නේ වර්තමාන හාල්පානු ඇළ යන්නෙන් ව්‍යවහාර කරන ඇළයි. මෙම ඇළ මාර්ගය හා සම්බන්ධ පුරාණ නටඹුන් වූ පාලමක ශේෂ ජේතවන විහාර වයඹ සීමාවේ තිබීමත් යටත්විජිත පාලන වාර්තා කිහිපයක ම මෙම ඇළ පිළිබඳ ව සඳහන් කර තිබීමත් අනුව මෙය පුරාණ ඇළක් බව මැනවින් පැහැදිලි වේ.



එසේම යටත්විජිත පාලන යුගයේ වාර්තා කහිපයකම හාල්පානු ඇළ පිළිබඳ ව සඳහන් කර ඇත. 1884 දී ඒ.එම්. පර්ගසන් විසින් සිලෝන් ඔබ්සවර් පත්‍රයට ලිපියක් ලියමින් අනුරාධපුරයේ පවතින වැව් සහ ඇළක් පිළිබඳ වාර්තා කරයි. එසේ ම 1884 දී එස්.සී.පී. බෙල් විසින් පුරාණ අනුරාධපුර නගරය අළලා හා ජේතවනාරාම විහාරය අළලා සපයා ඇති සිතියම්වල පැහැදිලි ලෙස ම මේ ඇළ දක්වා ඇත (*ASCAR*,1894). බෙල් විසින් මෙම හාල්පානු ඇළ මල්වතු ඔයට නැවත වැටෙන තැන හරහා පාලමක් ලකුණු කර තිබේ. එසේ ම ආර්.එල්. බ්‍රෝහියර් ද ඔහු විසින් අඳින ලද අනුරාධපුර නගරය ද වැව් පිහිටි ස්ථාන දක්වා ඇති සිතියමේ ද හාල්පානු ඇළ දක්වා ඇත (Brohier,1935). බෙල්ගේ පුරාවිද්‍යා පාලන වාර්තාවක සඳහන් ආකාරයට අභයගිරි (ජේතවන) දාගැබට මදක් වයඹින් පෙර කළ හාල්පානු ඇළ හරහා පැරණි ගල් පාලමක නටබුන් දක්නට ඇති බව සඳහන් කර තිබේ. අඩි 114 දිග මේ පාලම මුල දී ගඟ (ඇළ) හරහා වූ ආරුක්කු හැඩයකින් යුක්ත වු බව ද ආරුක්කුව හරස් අතට පිහිටි අඩි 15ක් දිග ගල් බාල්ක මඟින් ඒවා මත දික් අතට එකක් ළඟින් එකක් නැමුණු වඩා කෙටි බාල්ක 6 ක් හෝ 7ක එකට බැඳුණු කණු මත ගොඩනැගුණු පාලමේ වත්මන් අවුල් තත්ත්වයක් පෙන්නුම් කරන බව සඳහන් කර ඇති ඇති අතර මෙම පාලම බසවක්කුලමේ කුඩා ඔය හරහා තනා ඇති පාලමේ තත්ත්වයන්ට සමාන වන බැවින් පුරාණයේ සිත් කාවදින ලෙස නිර්මාණය කර ඇති මෙම පාලම මඟින් පෙන්නුම් කරන්නේ මෑත කාලයේ දී පවා පුරාතන නටබුන් නොසැලකිළිමත් ලෙස විනාශ කර ඇති අන්දම බව සඳහන් කර තිබේ (පූවිදෙඉ,1890 -1900:8). මෙම කරුණු ද හාල්පානු ඇළ හරහා ජේතවනාරාමය සම්බන්ධ කරන පැරණි මාර්ගයක තොරතුරු අනාවරණය කරයි. එසේ ම දැනට නටබුන් වී ඇති මහා විහාරයේ නැගෙනහිර ප්‍රාකාරයේ (බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ උතුරුපස ප්‍රාකාරයේ අසළ) යටින් තනා ඇති වතුර බැසීමට සකසා ඇති පැරණි ජල මාතිකාව අනුව ද පැහැදිලි වන්නේ මහා විහාර භූමියේ නැගෙනහිර පස කොටසට එකතු වූ අතිරික්ත ජලය එහි නැගෙනහිර ප්‍රාකාරය යටින් ගලාගොස් එම ජලය දැනට හාල්පාණු ඇළ වශයෙන් හඳුන්වන පැරණි කල තිබූ ඇළකට වැටෙන්නට සළසා ඇති බව ය.

එසේ ම මෙම ඇළ පවතින ප්‍රදේශය පුරාණයේ සිට ම ජේතවනාරාමය භූමිය පිහිටි නන්දන වනය වෙන ම භූමියක් ලෙස ස්ථානගතවීම සඳහා ද මූලික වූ බව මේ අනුව උපකල්පනය කළ හැකි ය. එලෙස ම දකුණු දොරටුවේ සිට දකුණු දෙසට දිවගිය පැරණි මාර්ගය ද මෙම ඇළ අසලින් ගමන් කරන්නට ඇති බව ජේතවනාරාම විහාරයේ බටහිර සිමා ප්‍රාකාරයේ හා මහා විහාරයේ නැගෙනහිර සීමා ප්‍රකාරයේ පිහිටිමේ ස්වරූපය හා එම භූමිය අතර පවතින හිඩැස අනුව හා හමු වී ඇති සෙල් ලිපිය අනුව පෙන්වාදිය හැකි ය. එසේ ම හාල්පානු ඇළ බටහිර ඉවුර පරීක්ෂාවෙන් බැලීමේ දී පැහැදිලි වන්නේ එම භූමියේ ස්තරායනය අනුව එම භූමිය ජනාවාස වීමකට ලක්වී නැති භූමියක් බවයි. හාල්පානු ඇළ ප්‍රදේශයේ දී පොළවේ මව් පාෂාණය (Bed Rock) ඉතා ඉහළින් පිහිටීම ද මේ ප්‍රදේශය ජනාවාස විම පිළිබඳ සාධක නොමැති බව සනාථ කරයි. මෙම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක අනුව පෙන්වාදිය හැක්කේ ජේතවනාරාම භූමියේ පුරාණයේ සිට ම සුවිශේෂී භූමි භාගයක් ලෙස ස්ථානගත වි තිබෙන අතර එහි සීමා තීරණය වීම උදෙසා පුරාණ මාර්ග පද්ධතිය හා පුරාණ ජලවහන පද්ධතිය බලපා ඇති බව ය. එමෙන් ම 2000 වර්ෂයේ මුල් දශකයේ දී මහා විහාර ව්‍යාපෘතිය මගින් මහා විහාර නැගෙනහිර ප්‍රාකාරය කැනීමේදී ප්‍රාකාරයේ තිබී සොයාගන්නා ලද ගල් පුවරුවක **“දෙවන විහර සිමි”** යනුවෙන් ජේතවනාරාමයේ සීමාව යන්න සඳහන් කර තිබීම ද තුළින් ඉතා පැහැදිලි ලෙස ජේතවනාරාමයේ බටහිර සීමාවේ ඉම හඳුනා ගැනීමට ඇති සාක්ෂියක් බව පෙන්වාදිය හැකි ය.





මහා විහාරයේ අතිරික්ත ජලය පිටකිරීමට තනා ඇති හොරොව්ව



හාල්පානු ඇළ ආරම්භ වන මල්වතුඔය අමුණ



හාල්පානු ඇළ ජේතවන විහාර සීමාව අසන්නයේදී

## 2.3. ජේතවන විහාරාරාම භූමියේ ස්තරායනය

ජේතවනාරාම විහාරාරාම සංකීර්ණය අයත් භූමි භාගයේ එහි ස්තරායනය අධ්‍යයන කිරීම සඳහා පර්යේෂණ කැනීම් රාශියක් පසුගිය දශක හතර තුළ දියත් කර ඇත. 1982 වර්ෂයේ ආරම්භ කරන ලද සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය යටතේ අරඹනු ලැබූ ජේතවන ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් අතර පර්යේෂණ වැඩසටහන් ප්‍රධාන පරමාර්ථය වූ බව 1982 ප්‍රථම පුරාවිද්‍යා කැනීම් වාර්තාව අනුව පෙනේ. එම පර්යේෂණ වැඩසටහන් අතර ප්‍රධාන පරමාර්ථයක් ලෙස සිරස් කැනීම් මගින් ස්තරායනය අධ්‍යයනය කර ඉතිහාසය ගොඩනැගීම ප්‍රධාන පරමාර්ථයක් සේ ද දක්වා ඇත. එසේ ම එයට අමතර ව මැටි බඳුන් අනුපිළිවෙලක් ස්තරායනය ඇසුරින් ගොඩනැගීම,පහළ ම ස්තරයේ සිට මානව කෘතිවල පරිණාමය අධ්‍යයනය කිරීම., ජේතවනාරාම භූමිය ඇසුරින් අභ්‍යන්තර කාල රාමුවක් සැකසීම යන අනෙකුත් පරමාර්ථ වේ.

එහෙත් ජේතවනාරාම භූමිය ඇසුරින් මේ දක්වා සිදු කරන ලද පර්යේෂණාත්මක අධ්‍යයන මගින් ඊට ආවේණික වූ සැලසුමක් ගොඩනගා ගැනීමට නොහැකි වී ඇත. මේ තත්ත්වයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ සිදු කරන ලද බොහෝමයක් මුල් කාලීන පර්යේෂණ කැනීම් සඳහා විද්‍යාත්මක කාලනීර්ණ ක්‍රම භාවිත නොකිරීමත් කැනීම් සඳහා පැහැදිලි ක්‍රමවේදයක් මුල් වකවානුවේ දී ව්‍යාපෘතිය අනුගමනය නොකිරිම බව පෙනේ. එසේ ම කැනීම් තුළින් අනාවරණය කරගනු ලැබූ දත්ත විශ්ලේෂණාත්මක අධ්‍යයනයට යොමු නොකිරීමත් ඉහත කාරණයට බලපා ඇත. නමුත් 2000 වසරින් පසුව සිදු කරන ලද පර්යේෂණ කැනීම්වලින් ජේතවනාරාම විහාරයේ ඉතිහාසය අධ්‍යයනයට විශාල පිටුවහලක් ලැබී තිබෙන අතර එම පර්යේෂණ කැනීම් ඇසුරින් ජේතවනාරාම භූමියේ ස්තරායනය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පහත සඳහන් පර්යේෂණ කැනීම් වැදගත් වේ. ජේ.පී.ටී,I, ජේ.පී.ටී, II, ජේ.එස්.පී,96, ජේ.එස්.පී,I, ජේ.සී.පී,96, ජේ.ජී.පී,96, ජේ.එල්.පී,96, ජේ.ඒ.පී,96, එස්$_{7}$ ඊ$_{6}$ ඒ$_{6}$, එස්$_{3}$ ඩබ්$_{4}$, එස්$_{10}$ ඩබ්$_{7}$ අයි$_{8}$, එස්$_{10}$ ඩබ්$_{1}$ අයි$_{8}$, එස්$_{6}$ ඊ$_{5}$ ඊ$_{1}$, ජේ.එස්.පී.,2000, ජේ.එස්.පී.II - 2000, ජේ.පී.එල්.,2000, ජේ.එස්.එම්.පී.,2001,2002, ජේ.එස්.ඩබ්.එම්.පී.,2003, 2004, 1982-



84 ජැක් ගූචර්ගේ කැනීම තෝරාගත් ඉහත පර්යේෂණ කැනීම් ජේතවන ස්තූපයෙන් උතුරට, දකුණට, නැගෙනහිරට හා බටහිර නියෝජනය වේ.

### මව් පාෂාණය (Bed Rock)

පුරාවිද්‍යා ක්ෂේත්‍රයන්හි ස්ථානගත වීම හා වර්ධනය සඳහා මව් පාෂාණයේ ස්වරූපය ප්‍රබල බලපෑමක් ඇතිකර ඇත. ජේතවන භූමියේ මව් පාෂාණයේ ස්වරූපය අධ්‍යයනයේ දී එය ප්‍රාග් ජේතවන අවධියේ දී හා ජේතවනාරාම ස්තූපය ස්ථානගත වූ අවධියේ දී එහි ස්ථානගත වීමට බලපෑමක් සිදුකර තිබේ ද යන්න විමසීම ඉතා ම වැදගත් වේ. විශේෂයෙන් ම සුවිසල් ස්තූපයක් ඉදි කිරීමේ දී එම ස්තූපයේ බර දරා සිටීමට තරම් ශක්තිමත් භූමියක් පොළොව අභ්‍යන්තරයේ තිබීම පිළිබඳ පැහැදිලි දැණුමකින් පැරැණ්නන් කටයුතු කර ඇති බව ජේතවන ස්තූපය ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයේ දී දැකගත හැකි ය. ජේතවන ස්තූපය ආශ්‍රිත ව සිදු කරන ලද පර්යේෂණ කැනීම්වල දී ස්තූපය ඉදිකර ඇත්තේ මව් පාෂාණයේ සිට බව අනාවරණය කරගෙන තිබේ. ජේතවනාරාම ස්තූප භූමිය ආශ්‍රිත ව මව් පාෂාණයේ ස්වරූපය ඉතා දැඩි ලෙස වෙනස් වීමක් දක්නට ලැබෙන බව පෙනේ. ජේ.එස්.ජී. 2000, ජේ.එස්.පී. II 2000, ජේ.එස්.එම්.පී. 2001, 2002 හා ආයක ඉදිරිපස සිදුකළ කැනීම් දත්තයන් මඟින් අනාවරණය වූ කරුණ නම් ජේතවන ස්තූපයෙන් උතුරු පසට වන්නට මව් පාෂාණයේ පිහිටීම තරමක එසවීමක් ගෙන ස්තූපයට උතුරින් මීටර් 300 ක් පමණ ඈත දී අවතල ස්වරූපයක් ගෙන ඉන් අනතුරු ව ඇතුළු නුවර දෙසට නැවත ඉස්සීමක් දක්නට ලැබෙන බව හඳුනාගත හැකිය. මේ බව ඇතුළු නුවර සිදු කරන ලද පර්යේෂණ කැනීම්හි මව් පාෂාණ පිරික්සීමෙන් ද පැහැදිලි වේ.

ස්තූපයේ සිට බටහිර පසට දිවෙන මව් පාෂාණය ස්තූප සමීපයේ දී පහළ මට්ටමින් බටහිර දෙසට දිවෙන අතර හාල්පානු ඇළ දෙසට ගමන් කිරීමේ දී එය නැවත පොළොව මතුපිටට (ඉහළට) උස්වීමක් දක්නට ඇත. ඒ බව එස්$_{1}$ඩබ්$_{3}$, එස්$_{1}$ඩබ්$_{4}$, එස්$_{1}$ඩබ්$_{5}$, එස්$_{1}$ඩබ්$_{6}$, එස්$_{1}$ඩබ්$_{7}$ යන ග්‍රිඩ් අංක තුළ සිදු කරන ලද පර්යේෂණ කැනීම්වලින් පැහැදිලි වේ. ස්තූපයේ නැගෙනහිර

පස මව් පාෂාණය ස්තූපය ආසන්නයේ දී තරමක් පහළින් පිහිටා ඇත. එය ස්තූපයේ නැගෙනහිර පසට එනම් මල්වතු ඔය දෙසට වන්නට තරමක් බෑස්මක ස්වරූපයකින් ගමන් කරන ආකාරය ජේ.සී.පී. 96, ජේ.ආර්.පී. 96, ජේ.ටී.පී. 96, ආදී පර්යේෂණ පුරාවිද්‍යා කැනීම් අනුව හා 1996 සිදුකළ භූ භෞතික ගවේෂණය මඟින් අනාවරණය කරගෙන ඇත. කෙසේ වෙතත් මව් පාෂාණ යේ ස්වරූපය ජේතවන භූමිය සම්බන්ධ ව නිසි පරිදි අධ්‍යයනය උදෙසා මුළු භූමිය ම නියෝජනය වන පරිදි කැනීම් වළවල් කිහිපයක් හෝ ඕගර් උපකරණය භාවිත කර පරික්ෂණ කිහිපයක් සිදු කිරීම වැදගත් ලෙස පෙන්වාදිය හැකි ය.

දැනට සිදුකර ඇති පර්යේෂණ කැනීම් තොරතුරු අනුව ජේතවන භූමියේ මව් පාෂාණයට මතුපිටින් හමු වන්නේ මව් පාෂාණයේ ජීර්ණය වූ විපරිත පාෂාණ සහිත (Decomposed Bed Rock) කලාපයයි. ජේතවනාරාම භූමියේ සමහර ස්ථානවල මේ තත්ත්වය දැකගත හැකි නොවීමට ඇති තැන් ද තිබේ. ස්තූපයට වයඹ දිග කෝණයේ සිදු කරන ලද ජේ.එස්.එම්.පී 2001 පර්යේෂණ කැණීමට අනුව මව් පාෂාණයේ මෙම ජීරණය වූ මතුපිට සමඟ මිශ්‍ර වී සංස්කෘතික අවශේෂ වන ගඩොල් කැබළි හා මැටි බඳුන් අවශේෂ හමුවීම ගැටළු සහගත තත්ත්වයකි. මව් පාෂාණයේ මතුපිටින් සංස්කෘතික අවශේෂ හමුවීම කලාතුරකින් සිදුවන දෙයක් වන අතර, මෙය ඉතාමත් ම පරික්ෂාකාරී ව අධ්‍යයනය කළ යුතු කාරණයකි. එම සංස්කෘතික ද්‍රව්‍යය සමඟ හමු වූ රොන්මඩ හා මිරිදිය බෙළි කටු අවශේෂ (ජලජ බෙල්ලන්) වර්ග ද රවුම් වූ තිරිවානා ගල් ද මේ තත්ත්වය තරමක් පැහැදිලි කරගැනීමට උපකාර වේ. විශේෂයෙන් මෙහි භූ අභ්‍යන්තරය යම් කාල වකවානුවක දී යම්කිසි ජල ගැලීමකට ලක්වී ඇති බව ඉහත කරුණු අනුව අනාවරණය වන බව උපකල්පනය කළ හැකි ය.

## මව් පාෂාණයේ මතුපිට ඇති සංස්කෘතික අවශේෂ සහිත පාංශු කලාපය

මෙතෙක් ජේතවන විහාර භූමියේ සිදු කරන ලද පර්යේෂණ කැනීම් සාධකවලට අනුව මව් පාෂාණයට මතු පිටින් පවතින ජීරණය වූ පාංශු කොටස් සහිත පාංශු කලාපයට මතුපිටින්



අළු පැහැති පස් ස්තරයක් දක්නට ඇත. මෙම ස්තරය කොටස් දෙකකින් සමන්විත වේ. එහි යට කොටස තරමක් දීප්තිමත් අළු වර්ණයක් ගන්නා අතර, උඩ කොටස තද අළු වර්ණයක් උසුලයි. මෙම පාංශු කලාපයේ දක්නට ලැබෙන විශේෂත්වය නම් එම පස සමඟ මිශ්‍ර වූ කිවුල් ගල් නොහොත් කැල්සියම් කාබනේට් පාෂාණ කොටස් වාර්තාවීමය. මෙය විද්‍යානුකූල ව බලන විට වියළි කලාපයේ පාංශු ස්තරායනයේ දැකගත හැකි පොදු තත්ත්වයක් ලෙස සැළකීමට පුළුවන. මෙම කිවුල් ගල් නිර්මාණය වන්නේ ජලයේ පවත්නා කැල්සියම් කාබනේට් ($CaCO_3$) ඝන වීමෙන් බව පස් පරික්ෂාවෙන් පැහැදිලි වේ. එසේ ම මෙහි පාංශු පැතිකඩක් පරීක්‍ෂා කර බැලීමේ දී ස්ථාන කිහිපයක ම ($CaCO_3$) තැන්පත් ව ඇති බව දැකගත හැකි වෙයි. මෙහි තවත් විශේෂත්වයක් නම් ඒ සමඟ බහුල ලෙස මිරදිය බෙලි කටු වාර්තා වීමය. මිරිදිය ජලයේ ජීවත් වන (Cerithidia) සෙරිතෙඩියා (Melzanoides s.p) යන බෙල්ලන් වර්ගවල තැන්පත් වීම බහුලව දැකගත හැකි අතර මෙය කාලයක් ක්‍රමික ව මෙම භූමියේ සිදුවී ඇති බව පෙනේ. මේ අනුව මෙම තත්ත්වය, පෙර කාලයක දී මෙම ප්‍රදේශය යම් ජල ගැලීමකට ලක් වූ ප්‍රදේශයක් බව උපකල්පනය කළ හැකි තත්ත්වයක පිළිබිඹුවකි. මෙවැනි තත්ත්වයක් ජේ.එස්.පී. 2000, ජේ.එස්.පී.II 2000, ජේ.එස්.එම්.පී. 2001 කැනීම්වලින් ද වාර්තා වී ඇත (මැන්දිස් 2000, රාජපක්ෂ 2000).

## මුල් ම සංස්කෘතික අවශේෂ වාර්තා වන ස්තර

ජේතවන භූමියේ මුල් ම සංස්කෘතික දත්ත සහිත ස්තර වාර්තා වන්නේ රතු පැහැයට හුරු වැලි මිශ්‍ර පාංශු කලාපයේ පහළ කොටසේ ය. මෙම ස්තරය බොරළු සහිත පස් ස්තරක් වන අතර දුඹුරු වර්ණයෙන් යුක්ත වේ. එම ස්තරය තුළින් කහඳ පාෂාණ පතුරු, තිරුවානා පතුරු මෙන් ම සත්ත්ව අස්ථි වාර්තා වීම සුවිශේෂී වේ. මෙම ශිලා පතුරු අතර ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් ද වාර්තා වේ. මෙම පාෂාණ පතුරු ජේ.එස්.එම්.පී. 2002, ජේ.එස්.ඩබ්.එම්.පී. 2003, ජේ.එස්.ඕ.ඩබ්.පී. 2003 පර්යේෂණ කැනීම්වලින් වාර්තා වී ඇත.

මින් පසු ජේතවන භූමියේ දැකගත හැක්කේ තද අළු පැහැ පාංශු කලාපයකි. එහි බහුල ව කැල්සියම් කාබනේට් අඩංගු ($CaCO_3$) වේ. එම පාංශු කලාපයේ ඉහළ කොටසේ දැකගත හැකි දීප්තිමත් අළු පැහැ පාංශු කලාපයේ බහුල ව සංස්කෘතික සාධක හමු වේ. ඒවා අතර කුඩා මැටි බඳුන් කැබළි හා කුඩා ගඩොළු කැබළි ද සත්ත්ව අස්ථි ද දැකගත හැකි වීම සුවිශේෂී වේ. ජේ.එස්.පී. 2000, ජේ.එස්.පී.II 2000, ජේ.පී.ටී. 2, ජේ.එස්.පී. 96 ජේ.එස්.එම්.පී. 2003 යන පර්යේෂණ කැනීම් මගින් මෙම මැටි බඳුන් කැබළි පිළිස්සුණු ගඩොල් කැබළි වාර්තාවී තිබේ. මෙම සංස්කෘතික තොරතුරු එම භූමියේ පෞරාණිකත්වය විදහා දක්වන පුරාවිද්‍යා සාධක වේ. මෙම ස්තරයට සමකාලීන ව මේ ප්‍රදේශයට ආසන්න ප්‍රදේශයක් වන ඇතුළුපුරය ජනාවාසකරණයට ලක් වී ඇති බව මේ සම්බන්ධයෙන් සිදු කරන ලද සන්සන්දනාත්මක අධ්‍යයනවලදී පැහැදිලි වි ඇත. සිරාන් දැරණියගල විසින් අනුරාධපුර ඇතුළු නුවර සිදු කරන ලද කැනීම්වලට අනුව පදනම් මුල් ඓතිහාසික යුගය (Basel early history 600 – 500 BC) පහළ මුල් ඓතිහාසික අවධිය (Lower early historic 500 - 250 BC) අනුරාධපුරය ජනාවාස වී නගරයක් මූලික ව ම සැලසුම් වන අවධිය බව ප්‍රකාශ කර තිබේ (Deraniyagala, 1992: 709-713) . එසේ ම අනුරාධපුර ඇතුළු නුවර ජනාවාසය පහළ මුල් ඓතිහාසික යුගයේ දී හෙක්ටයාර් 50 ක ව්‍යාප්තියක් දක්වන බව ද ඔහු සඳහන් කර ඇත. ඔහුගේ ඒ.එම්.පී. 85, ඒ.එස්.ඩබ්. 88, ඒ.ජී. 69 යන කැනීම් අනුව ද මේ බව තහවුරු කර ඇත (*ibid*). ඓතිහාසික මූලාශ්‍රයවලට අනුව පණ්ඩුකාභය රජු මූලික ව නගරය සැලසුම් ගත කරන්නේ මේ යුගයට සමගාමී ව බව පෙනේ (Deraniyagala, 1992:711 -712). මූලාශ්‍රය අනුව පණ්ඩුකාභය රජු මූලික ව ම නගරය සැලසුම් කරන අවධියේ එයට හාත්පස ප්‍රදේශය කෙසේ පැවතියේ ද යන්න විමසීමෙන් ජේතවන භූමිය ආශ්‍රිත පහළ ස්තරවලින් හමු වන ජනාවාස තොරතුරු පිළිබඳ ව යම් අදහසක් ලබාගත හැකි ය.

ජේතවන විහාර භූමිය ආශ්‍රිත ව සිදු කරනු ලැබූ කැනීම්වල දී පහළ ස්තරවලින් ලැබුණු සංස්කෘතික අවශේෂ තුළින් දැනට ඇතුළු නුවර සීමාවට පිටතින් මානව ක්‍රියාකාරකම් වූ බවට ඉඟි



සපයා තිබේ. මෙම ජනාවාස තත්ත්වයන් අප දැනට පිළිගත් සීමාවන්ගෙන් එපිට අනුරාධපුර ජනාවාස ව්‍යාප්තියක් ඇති වී ද එසේ නොවන්නේ නම් ඇතුළු නුවර ජනාවාසය හාත්පස සුළු පරිමාණයේ ජනාවාස ස්ථානගත වීමක් සිදු වූවා ද යන්න ගැන විමසීමේ දී මූලාශ්‍රගත තොරතුරු ද ඉතා වැදගත් වේ. මහාවංසයට අනුව පණ්ඩුකාභය රජු මූලික ව නගරය සැලසුම් කරන අවධියේ දී කේන්ද්‍රයේ පිහිටි නගරයට පිටතින් ග්‍රාම ස්ථාපිත කළ බව වංසකතාවේ සඳහන් කර ඇත. එනම් සොහොනින් වයඹ දිග හැඩොල්ගම (චණ්ඩාලගම) උතුරුදිග නොයෙක් තවුසන්ගේ අසපු නිව සුසානයට උතුරින් වැදි ජනයාගේ ගෙවල්පෙළ ආදී ලෙස දක්වා තිබේ (මව,.11:84 - 101). මීට සමකාලින ව පුරයට දකුණු ප්‍රදේශයෙන් සුළු පරිමාණ ගම් කිහිපයක් ස්ථානගත නොවීමට හේතුවක් නැත. මෙසේ අවට ග්‍රාමවල විසූ ජනතාව නිරන්තරයෙන් ම නගරය හා සබඳ වන්නට ඇත. ඒ හේතුවෙන් නුවර සමීපයෙහි පිහිටි ගම් වර්ධනය සිදු වන්නට ඇති අතර ගම් හා නිෂ්පාදකයින් ද පාරිභෝගිකයින් ද බිහිවීම සමඟ භාණ්ඩ හුවමාරු පදනමින් වෙළෙඳ පොළවල් වර්ධනය වන්නට ඇත. එම වෙළෙඳ පොළ පසුව නිගම, ද්වාරගම, අත්තරාපාන ලෙස වර්ධනය වූ බවට සාධක වංසකතා තෙරතුරු හා ශිලා ලේඛනවලින් පැහැදිලි වී තිබේ.

මහාවංසයට අනුව ක්‍රි.පූ. තුන් වැනි සියවසේදී මහා මහින්ද මහ රහතන් වහන්සේට නන්දන වනය එසේත් නැතහොත් ඇතුළු නුවරට දකුණින් පිහිටි රජ උයනේ නතර වන ලෙස දෙවනපෑතිස් රජු අයැද සිටි විට මහ තෙරුන් එය ප්‍රතික්ෂේප කරන්නේ නුවරට ආසන්නව පිහිටන එම ස්ථානය ශබ්ද ඇති ස්ථානයක් වන නිසා එහි විසීමට අකමැත්ත ප්‍රකාශ කරමිනි (මව,15: 6 - 9). මෙසේ ශබ්ද අධික පරිසරයක් නිර්මාණය වූයේ සංකීර්ණ ක්‍රියාවලියක් මේ ප්‍රදේශයේ සිදු වූ බැවිනි. මේ තත්ත්වය රාජකීය උයනක් වූ නිසා පැවති තත්ත්වයක් ද නැතහොත් භාණ්ඩ හුවමාරු වන වෙළෙඳ පොළක ක්‍රියාකාරීත්වය නිසා ඇති වූ තත්ත්වයක් දැයි විමසිය යුතු වේ. එසේ ම මහින්ද තෙරුන් නන්දන වනය ප්‍රතික්ෂේප කර තෝරා ගනු ලැබවේ නිස්කලංක මහාමේඝ වනයයි. එය නුවරට එතරම් නුදුරින් නොවන ළඟිනුත් නොවන ආකාරයට

පිහිටි බව මහාවංසයේ විස්තර වේ (මව,15: 8-9). මහාමේඝවනයට මහින්ද තෙරුන් ප්‍රවිෂ්ට වී ඇත්තේ නන්දන වනයේ දකුණු දිගින් පිහිටි දෙරටුවෙන් පිටවී ගොස් මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුවෙනි. එසේ ම නුවර දකුණු දොරටුවට දකුණු දිගින් කුම්භකාර ග්‍රාමය ස්ථාපිත වී තිබුණු බව ද මූලාශ්‍රය සඳහන් කර ඇති බව හේම රත්නායක පෙන්වාදී තිබේ (Rathnayake 1984:07). පසු කලෙක වේළුසුමන යෝධයා තිසාවැවෙන් ජලය ගෙන ඒමට මෙම ගමින් මැටි බඳුනක් ලබාගැනීමට ගිය බව ද වංසකතාවේ සඳහන් වේ (*Ibid*) මේ කාරණා අනුව පැහැදිලි වන්නේ නුවරින් දකුණුපස මුල් ඓතිහාසික සමය වනවිට යම් කිසි ග්‍රාම තත්ත්වයක් වර්ධනය වී තිබූ බව ය. මේ තත්ත්වය අනුව පැහැදිලි වන පුරාවිද්‍යාත්මක සාධක බොහොමයක් වර්තමාන පුරාවිද්‍යා කැනීම්වලින් ලැබී තිබේ. ජේතවනාරාම පාංශු ස්තරායනයේ පෙර සඳහන් කළ පාංශු ස්තරයට ඉහළින් පිහිටන තද අළු මිශ්‍ර කළු වර්ණයක් උසුලන පාංශු ස්තරය ද ඉතා වැදගත් ස්තරයකි. මෙය ජේතවන භූමියට පොදු ස්තරයක් බව කැනීම් සාධක අනුව පෙනේ. ජේ.එස්.පී. 96, ජේ.එස්.පී. 2000, ජේ.එස්.පී.II 2000, ජේ.එස්.එම්.පී. 2001/2002, ජේ.එස්.ඩබ්.එම්.පී. 2003/2004 කැනීම් තොරතුරුවලට අනුව මෙම ස්තරය ආශ්‍රයෙන් කාල රක්ත වර්ණ මැටි බඳුන් (BRW), ලක්ෂ්මී කාසි, ස්වස්තික කාසි වාර්තාවීම වැදගත් වේ. අනුරාධපුර ඇතුළු නුවර කැනීම් සාධක අනුව හස් එබු කාසි, ඇතා සහ ස්වස්තික කාසි, ලක්ෂ්මි තහඩු කාසි හමුවන්නේ මධ්‍ය මුල් ඓතිහාසික යුගයේ ය (Middle early historic 250 B.C - 100 A.D). එනම් ඇතුළු නුවර ජනාවාස ව්‍යාප්තියේ උපරිම ව්‍යාප්තිය වන හෙක්ටයාර් 100 ක් සහිත කාලය තුළයි. මේ බව ඇතුළු නුවර ඒ.ජී. 85, ඒ.ඩී.බී. 87/88, ඒ.එම්.පී. 88, ඒ.එස්.ඩබ්. 88 පර්යේෂණ කැනීම් සාධක අනුව ද පැහැදිලි වේ (Deraniyagala,1992:711-712). ජේතවනාරාම ස්තූපයට උතුරින් ජේතවනාරාම ස්තූපයේ සළපතර මළුවේ සිදු කරන ලද පර්යේෂණ කැනීම් වන ජේ.එස්.පී. 2000, ජේ.එස්.පී.II 2000, ජේ.එස්.එම්.පී. 2001, ජේ.එස්.ඩබ්.එම්.ජී. 2004 කැනීම්වලට අනුව කාල රක්ත වර්ණ මැටි බඳුන් (B.R.W.) ලක්ෂ්මී කාසි හා ස්වස්තික කාසි ආදී මානවකෘති හමු වේ. විශේෂයෙන් ඉහත කාසි වර්ගවලට යටින් කාල රක්ත වර්ණ මැටි බඳුන් වාර්තා



වීමෙන් පෙනෙන්නේ ඒවා වඩා පැරණි බව ය. කළු රතු මැටි බඳුන් ක්‍රි.පූ. 800 සිට ක්‍රි.ව. 300 අවසානය දක්වා භාවිත වූ බව පෙනේ (*ibid* : 704-714). එසේ නම් ජේතවන භූමියේ හමු වන මෙම පුරා සාධක අනුව පෙන්වා දෙන්නේ සමකාලීන ව ලක්ෂ්මී, ස්වස්තික කාසි හා කළු රතු බඳුන් භාවිතය පැවති බවය. ඇතුළු නුවර කාලනිර්ණයන්ට සාපේක්ෂ ව උක්ත සමකාලීන පුරාවස්තු හමු වන ස්තර මධ්‍ය පූර්ව ඓතිහාසික යුගයට (Middle early historic 250 B.C. - 100 A.D.) අයත්වීමට බොහෝ සේ ඉඩ ඇති බව සාපේක්ෂ කාලනිර්ණයන්ට යොමු වීමෙන් උපකල්පනය කළ හැකි ය.

එසේ නම් මෙම තතු අනුව පැහැදිලි වන්නේ ජේතවනාරාම භූමිය පූර්ව ඓතිහාසික අවධියේ ප්‍රබල ක්‍රියාකාරීත්වයකට නතු වූ බව ය. මීටර් 3 x 3 ප්‍රමාණයේ කුඩා කැනීම් පරිශ්‍රයකින් එක ම ස්තරයක තිබී ලක්ෂ්මී කාසි හතරක් ස්වස්තික කාසි දෙකක් ලැබීම මේ භූමිය පසුබිම් කරගෙන පූර්ව හා මුල් ඓතිහාසික යුගයේ විනිමය සංසරණයේ ක්‍රියාකාරීත්වයට යොමු වීම හසු කරයි. එසේ ම ජේතවනාරාම භූමියේ කාසි හමු වීමේ ප්‍රවණතාව අධ්‍යයනය කරන විට පැහැදිලි වන තවත් සුවිශේෂී කරුණක් නම් පර්යේෂණ කැනීම් පරිශ්‍රවල පහළින් ම බහුල ව හමු වී ඇත්තේ ලක්ෂ්මී කාසි බව පැහැදිලි වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ භාවිත කරන ලද දේශීය ප්‍රභවයන් සහිත පැරණි ම කාසිය ලක්ෂ්මී තහඩු කාසිය බව මේ පිළිබඳ ව පර්යේෂණ සිදුකර ඇති උගතුන් හඳුනාගෙන තිබේ. ඒ අනුව මෙම කාලය වනවිට අනුරාධපුර හා එහි අවට කලාපය තුළ කාසි භාවිතයේ හා නිෂ්පාදනයේ මූලිකත්වයක් ගෙන තිබෙන බව ද මින් පැහැදිලි වේ.

**සංසිද්ධි බහුල ස්තර සහිත පාංශු කලාපය:**

ඉහත සඳහන් කළ අළු පැහැ ස්තරය මතුපිට දක්නට ඇත්තේ සංසිද්ධි බහුල ඝණත්වයේ යුක්ත වූ දුඹුරු වර්ණ පාංශු කලාපයකි. ජේතවනයේ සිදුකර ඇති පර්යේෂණ කැනීම්වලට අනුව ඝණත්වයේ වැඩිම ස්තරය ලෙස මෙම පාංශු ස්තරය පෙන්වාදිය හැකි ය. මෙම කලාපයට ගැනෙන පාංශු දුඹුරු, තද දුඹුරු, අඳුරු දුඹුරු, අළු දුඹුරු, රතු දුඹුරු, කහ දුඹුරු, ලා

දුඹුරු, දීප්තිමත් රතු දුඹුරු ආදී වර්ණයන්ගෙන් යුක්ත වන බව හඳුනාගත හැකි ය. පොදුවේ ගත්කළ මෙම පාංශු කලාපය දුඹුරු පැහැ වේ. මෙම කලාපයෙන් හමුවන මානවකෘතීවල විවිධත්වය සංකීර්ණත්වය මෙන් ම ප්‍රමාණය හා ඝණත්වය ද බහුල වේ. පුරාවිද්‍යාත්මක ව ගත්කල මෙම පාංශු ස්තරය සහිත කලාපයේ සංසිද්ධි බහුල බවක් දක්නට ලැබේ. එසේ ම විවිධ උපයෝගීතාවන් උදෙසා සිදුකළ කැපුම් (Cut), පිරවුම් (Fill) දක්නට ලැබේ. එසේ ම හමුවන සුන්බුන් අතර විවිධ ප්‍රමාණ සහිත ගඩොල් කැබළි ඉතා අධික ය. එසේ ම හමු වන විවිධ වාස්තුවිද්‍යාත්මක නිර්මාණයන්හි ගරා වැටුණු කොටස් හා විවිධ ශිල්ප කර්මාන්ත උදෙසා භාවිත කරන ලද පුරාසාධක ද වෙයි. මෙ සංසිද්ධි (Context) මගින් අනාවරණය වන්නේ ජේතවනාරාම භූමියේ මුල්කාලීන අවධියේ දී සංකීර්ණ ජනාවාස ක්‍රියාවලියක් සිදු වී ඇති බව ය. යථෝක්ත සංසිද්ධි පුරාවිද්‍යාත්මක ව විමර්ශනයක යෙදෙන කිරීමෙන් පැහැදිලි වන්නේ ඒවා පුළුල් කාල පරාසයක විහිදෙන බව ය. එසේ හමු වන සංසිද්ධි සරල ලෙස මෙසේ පෙළ ගැස්විය හැකි ය.

මෑත කාලීන (ම.සං.අ) ක්‍රියාකාරීත්ව

↓

අතහැර දැමීම්

↓

ඉදිකිරීම්/භාවිතයන්/ විනාශවීම්

↓

විනාශ වීම්/අතහැර දැමීම්

↓

ඉදිකිරීම්/විනාශවීම්

↓

විනාශ වීම්/අතහැර දැමීම්


↓

ඉදිකිරීම්/සුළු පරිමාණ, ප්‍රාථමික, ව්‍යාප්තිය සීමිතය



පුරාවිද්‍යාත්මක ව මෙසේ පෙළ ගස්වන ලද සංසිද්ධි අර්ථකථනයකට ලක්කිරීමේදී පැහැදිලි වන්නේ භූමියේ පහළින් ම හමු වන ස්තරවල ඇති ඉදිකිරීම් සාධක ඉතා ප්‍රාථමික මට්ටමේ රළු නිමාවක් සහිත ඉදිකිරීම් වන බව ය. බොහෝ විට දැවයෙන් කළ ඉදිකිරීම්වලට කණු වළවල් හෝ ගඩොලින් කළ රළු නිමාවක සහිත බැමි ඒ අතර වේ. මේවායේ ව්‍යාප්තිය ඉතා සීමා සහිත ය. එම ඉදිකිරීම් ප්‍රාග් ජේතවන අවධියේ මෙම භූමියේ සිදු වූ ජනාවාස සාධක බව හඳුනාගත හැකි ය. නිශ්චිත ලෙස ම මෙම ගොඩනැගිලි අවශේෂවල දින වකවානු ලබාගැනීමට එම පාංශු කලාපයන්හි හමු අඟුරු, අස්ථි අවශේෂ හෝ ගඩොළු විද්‍යාත්මක කාලනිර්ණයන් ලක්කිරීමට අවශ්‍ය වනු ඇත.

ඉන්පසු පිහිටන ස්තර තුළ ඉදිකිරීම් හා විනාශ වීම් වැනි සංසිද්ධි දක්නට ලැබේ. මේවා අතර ව්‍යුහයන් හා සුන්බුන් ප්‍රමාණය වැඩි වන බව පෙනේ (ජේ.එස්.පී.96, ජේ.එල්.පී.96, ජේ.සී.පී.96, ජේඑස්.පී.2000, ජේ.පී.එල්.2000, ජේ.එස්.ඩබ්.එම්.පී.2004 යන කැනීම් තොරතුරු අනුව ප්‍රාග් ජේතවන ඉදිකිරීම් හා ජේතවනාරාමයේ මූලික ඉදිකිරීම් අනුව එම භූමියේ ජනාවාසකරණයේ ක්‍රමික සංවර්ධනයේ ලක්ෂණයන් ඉන් පෙන්වනු ලැබේ. මෙම ලක්ෂණයන්ගේ සංකීර්ණත්වය, ප්‍රමාණාත්මකභාවය, විවිධත්වය, ව්‍යාප්තිය පහළ ස්තරවල සිට ඉහළට පැමිණීමේ දී වර්ධනය වීමක් දක්නට ලැබේ. එසේ ම ජේතවන ස්තූපය කේන්ද්‍ර කරගත් භූමිය තුළ ඉදිකිරීම් ආශ්‍රිත සංසිද්ධීන්ගේ සංකීර්ණත්වයේ බහුල බව එම භූමියෙන් වාර්තා වන ස්මාරක ප්‍රමාණය අනුව පෙනේ. ඒ අනුව පරිධියට යනවිට ස්තරවල ඝණත්වය සාපේක්ෂ ව අඩු වන බව පැහැදිලි වේ. ස්තූපයට නැගෙනහිරින් හා දකුණින් මල්වතු ඔයට බටහිරින් හාල්පානු ඇළ දෙසටත් උතුරින් ඇතුළුනුවර දෙසටත් මේ තත්ත්වය දක්නට ලැබේ. එය රූප සටහනකින් මෙසේ පෙන්වාදිය හැකි ය.




ස්තර ඇසුරින් ගොඩනැගිය හැකි මෙබඳු ජනාවාස ප්‍රාථමික මට්ටමේ සිට සංකීර්ණ තත්ත්වයන් කරා ප්‍රාග් ජේතවන අවධියේ සිට ජේතවනාරාමය අවධිය දක්වා වර්ධනය වී ඇති බව පෙන්වාදිය හැකි අතර ජේතවන විහාරයේ වර්ධනය මහාවංසය, දීපවංසය, සමන්තපාසාදිකාව, මහාවංසටීකාව, නිකාය සංග්‍රහය, සද්ධර්මාලංකාරය හා අභිලේඛන සාධක ඔස්සේ කදිමට පැහැදිලි කර තිබේ. එසේ ම පර්යේෂණ කැනීම් තුළින් හමු වී ඇති කාසි අනුපිළිවෙළ අනුව ප්‍රාග් ජේතවන තාක්ෂණික සංස්කෘතික තත්ත්වයන් වර්ධනය වූ ආකාරය ග්‍රහණය කරගැනීමට ද විශාල පිටුවහලක් වේ. කාසි වාර්තාවීමේ ස්වභාවය අනුව පෙන්නුම් කරන තවත් සුවිශේෂත්වයක් නම් ජේතවනාරාමයේ සිදුකර ඇති පර්යේෂණ කැනීම් තුළින් හමු වූ හස්එබූ කාසි ස්තරායනයේ ඉහළ ස්තර තුළින් ද වාර්තා වීම කැපීපෙනේ. එමඟින් පෙන්නුම් කරනුයේ ජේතවන විහාරයේ පාංශු තැන්පතුවේ ඉහළ ස්තරවල අවුල් වීමක් වීමට ඉඩ තිබෙන අතර එසේ නොවන්නේ නම් සමහර කාසි වර්ගයන්ගේ අඛණ්ඩ පරිහරණයක් ප්‍රාග් ජේතවන අවධියේ සිට සිදුවීමක් ලෙස ද පෙන්වාදිය හැකි ය . කෙසේ වෙතත් හස්එබූ කාසි නිර්මාණය කළ රිදී වැනි ලෝහවල මූල්‍යමය අගය නිසා ඒවා දූරාතීතයේ සිට අඛණ්ඩ ව ඉන්පසු කාලය දක්වා ම සංසරණය වීමට ද වැඩි අවකාශයක් පවතී. ජේතවන භූමිය විහාරයක් ලෙස ස්ථානගත වීමෙන් අනතුරු ව ඉදි වූ විවිධ ස්මාරක විවිධ වකවානුවල විවිධ උපයෝගීතා සඳහා භාවිත කළ බව පෙනේ. ආරාම 'සී' හි ද්වාර අට්ටාලය අසළ ඇති ළිඳ අවධි කිහිපයක ඉදිකිරීම් සාධකවලින් යුක්ත වේ. ළිඳ මුලින් ම ඉදිකර



භාවිතයට ගෙන ඇති අතර ඉන් පසු ව එය වසා දමා ප්‍රාකාරයක් බැඳ වෙනත් උපයෝගීතාවයක් භාවිත කර ඇති අතර. ඉන් පසු නැවත පසුකලක දී ප්‍රාකාරය නැවත ඉවත් කර ළිඳ භාවිතයට ගත් බවට සාධක තිබේ.

එසේ ම ජේතවනාරාම භූමියේ ඓතිහාසික වර්ධනයට තවත් කදිම නිදසුනක් ලෙස ස්තූපයට ගිණිකොන දෙසින් ස්ථානගත වූ පිළිම ගෙයක් සහිත ස්මාරක භූමිය පෙන්වාදිය හැකි ය. මෙම ස්ථානය ආශ්‍රිත ව සිදු කරන ලද පර්යේෂණ කැනීම්වලට අනුව යථෝක්ත ස්ථානයේ භූමිය මතුපිට පිළිමගෙ දැකගත හැකි අතර එම මට්ටම්වලට පහළින් ඊට පෙර කළ සිදුකළ ප්‍රාථමික ඉදිකිරීම් වාර්තා වී ඇත. පිළිම ගෙයට යටින් වාර්තා වී ඇති සාධක අතර අට්ටාලයක ස්වරූපයෙන් යුත් වාස්තුවිද්‍යාත්මක අංගය සිවු දිශාවටම ගමන් කල හැකි පරිදි නිර්මාණය කර තිබෙන ද්වාර මාර්ග සහිත ප්‍රවේශ ද්වාරයක ලක්ෂණවලින් ද යුක්ත වේ. එහි උපයෝගීතාවය නිශ්චිත ව හඳුනාගෙන නොමැති වුව ද එය ඉතා පැහැදිලි ලෙස පිළිම ගෙය එම ස්ථානයේ ස්ථානගත වීමට පෙර නිර්මාණය කරන ලද නිර්මාණයක් ලෙස හඳුනාගත හැකි ය. එසේ ම බෝධිඝරය සංකීර්ණය ආශ්‍රිත කැනීම්වලින් බෝධිඝරයට වඩා පහළ මට්ටම්වලදී වූ විවිධ ඉදිකිරීම් කිහිපයක් හමු වී තිබේ. මේවා ප්‍රාග් ජේතන යුගයට අයත් නිර්මාණ ලෙස හඳුනාගත හැකි ය. ජේතවන විහාරය ආරම්භවීමෙන් අනතුරු ව එහි සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු මූලාශ්‍රයවල සඳහන් වී තිබේ. ඒ අනුව විහාරයේ විවිධ වාස්තුවිද්‍යා අංගයන්හි වර්ධනය සඳහා රජ දරුවන් දක්වා ඇති දායකත්වය අනුව ඒවා විවිධ කාල පරාස තුළ නිර්මාණය වී ඇති ආකාරය පහත වගුවට අනුව පෙන්වාදිය හැකි ය.

| රජවරු සහ අවධිය | ඉදිකළ ස්මාරකය | මූලාශ්‍රය |
|---|---|---|
| මිත්‍ර සේන<br>ක්‍රි.ව. 432 - 433 | ස්තූපයට තොරණ්, ස්තූපයේ ඡත්‍ර, ස්තූපය, සුනුකම් කිරීම | මව,37:65 |
| මහානාග<br>ක්‍රි.ව. 573 - 575 | ස්තූපයට සැරසිලි සහ හත්ථි වේදිය | මව,41:95-98 |

| | | |
|---|---|---|
| පළමු වැනි අග්බෝ ක්‍රි.ව. 575 - 608 | ස්තූපයට රන් ඡත්‍ර, සිරිසඟබෝ පිරිවෙණ, රිදී සුබුළුගෙය සෑදීම | මව,42:10-11 |
| දෙ වැනි අග්බෝ ක්‍රි.ව. 608 - 618 | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හා බෝධිඝරය අසල ළිඳක් තැනවීම | මව,42:66 |
| තුන් වැනි මොග්ගල්ලාන ක්‍රි.ව. 618 - 623 | සෑයට සත්කාර | මව,44:44 |
| දෙ වැනි දප්පුල ක්‍රි.ව. 815 - 831 | බෝධිඝරයේ බෝසත් පිළිමයට රනිසිවි ගෙයක් | මව,49:77 |
| පළමු වැනි සේන ක්‍රි.ව. 833 - 853 | විශාල පිරිවෙණක් | මව,50:65-67 |
| දෙ වැනි සේන ක්‍රි.ව. 853 - 887 | මණි ප්‍රාසාදය | මව,51:77-78 |
| සිව් වැනි කස්සප ක්‍රි.ව. 898 - 917 | තුන්නිකායේ සෙල් මුවා පිළිමවල රන් මුවා රැස් වළළු | මව,52:17 |
| පස් වැනි කස්සප ක්‍රි.ව. 914 - 923 | තුන් නිකායට විජයෝත්පාය බඳු විසිතුරු මණ්ඩප | මව,52:35-59 |
| සිව් වැනි උදය ක්‍රි.ව. 946-954 | මණිප්‍රාසාදය නැවත ප්‍රතිසං-ස්කරණය කරන ලදී. | මව,53:51 |
| සිව් වැනි මහින්ද ක්‍රි.ව. 956 - 972 | දියසෙන් මහා පෝයගෙය, මහාප්‍රසාද පිරිවෙණ, දොරටු පැන්මඩිය, රත්න මහා ප්‍රාසාදය | ජේතවන පුවරු ලිපිය *Ez*. Vol. I :227 |
| සිවු වැනි මහින්දගේ ඇමතිවරු | පිරිවෙණ් 4 ක් | මව,54:48-49 |
| මහා පරාක්‍රමබාහු ක්‍රි.ව. 1153 - 1186 | ස්තූපය ප්‍රතිසංස්කරණය | මව,78:98 |



## 2.4 ප්‍රාග් ජේතවනාරාම අවධිය

ලොව සුවිසල් ගඩොල්මුවා ස්මාරකය ලෙස සැළකෙන අනුරාධපුර ජේතවනාරාම ස්තූපය ඇතුළු මහා පරිමාණ සංඝාරාමය ක්‍රි.ව. 276 සිට 303 අතර කාලයේ ලංකාවේ රජ පැමිණි ශ්‍රේෂ්ඨතම වැව් තනන්නෙකු වූ මහසෙන් රජුගේ නිර්මාණයක් ලෙස වංසකතාවල සඳහන් වේ (මව,37:1-2). යථෝක්ත සංඝාරාමය ඉදිවී ඇති භූමි භාගය එම විහාරය ඉදි වීමට ප්‍රථම කුමන ආකාරයෙන් භාවිත වූවා ද එහි ඇති පුරාවිද්‍යාත්මක වටිනාකම කෙබඳු දැයි සෙවීම ද ඉතා ම වැදගත් වේ. ප්‍රාග් ජේතවන යුගය අධ්‍යයනය කිරීමේ දී ඓතිහාසික ප්‍රභවයන් හා පුරාවිද්‍යාත්මක ප්‍රභවයන් ඔස්සේ විශාල තොරතුරු රාශියක් එක්රැස් කරගත හැකි ය.

මධ්‍ය ඓතිහාසික වංසකාවක් වන මහාවංසයට අනුව ක්‍රි.පූ. තුන් වැනි සියවස වන විට ප්‍රාග් ජේතවන භූමිය නන්දන උයන නමින් හඳුන්වා තිබේ. ඉන්දියාවේ ශ්‍රේෂ්ඨතම රජෙකු වූ අශෝක අධිරාජ්‍යාගේ පුත් මහින්ද මහ රහතන් වහන්සේ මෙරටට වැඩම කරන ලද කතා පුවත හා සම්බන්ධ විස්තරයේ මේ පිළිබඳ ව සඳහන් වේ. එහි සඳහන් වන ආකාරයට මිහිඳු මාහිමියන් අනුරාධපුරයට වැඩමවා පුරා දින හතක් ධර්මය දේශනා කරන ලද්දේ නන්දන උද්‍යානයේ බව සඳහන් කර ඇත (එම:6-9). අති විශාල පිරිසක් මෙම උද්‍යානයේ දී බුදුදහමට නැඹුරු වූ බැවින් ඉන් අනතුරු ව මෙම භූමිය ජෝති උයන නමින් අර්ථ තිබේ. මෙම අර්ථ දැක්වීමට පාදක වී ඇත්තේ බෞද්ධ ධර්මය දේශනා කිරීමෙන් ධර්මාලෝකය විහිදී ගිය ස්ථානය යන අරුතින් නිසා බව විද්වත් මතය වේ. මිහිඳු මහ රහතන් වහන්සේ දීපජෝතක යන අන්වර්ථ නාමයෙන් ද හඳුන්වන ලබන හෙයින් ඉන් ද ලංකාදීපයේ පහන යන්න ගම්‍ය වන නිසා ය. උන්වහන්සේ සමඟ සම්බන්ධ වූ මෙම භූමිය ඉන් පසු ථේරානම්බන්ධ මාලක (මහ තෙරුන්ගේ ශුද්ධ භූමිය) වශයෙන් ද හඳුන්වා ඇති අතර පසු කලක දී මහරහතන් වහන්සේලාගේ ආදාහණ කටයුතු සඳහා මෙම භූමිය භාවිත කරන ලද බැවින් ඉසිභූමංගන යනුවෙන් ද මූලාශ්‍රයවල සඳහන් වන බවත් රත්නායක පෙන්වා දී තිබේ (රත්නායක ; 1998)

මූලාශ්‍රය අධ්‍යනයේ දී පෙනී යන්නේ ක්‍රි.පූ. තුන් වැනි සියවස පමණ වන විට රාජකීයයන්ගේ අවශ්‍යතා උදෙසා භාවිත කරන ලද මෙම බිම බෞද්ධාගම ලක්දිව මුල්බැස ගැනීමත් සමඟ බෞද්ධ කටයුතු උදෙසා සම්බන්ධ වෙමින් ක්‍රි.ව. තුන් වැනි සියවස අගභාගයේ දී සාගලික නිකායන්ගේ කේන්ද්‍රස්ථානය බවට පත්වන බව ය (මව,37:1-2, නිස,13). මූලාශ්‍රය සාධකවලින් බැහැර වී පුරාවිද්‍යා ප්‍රභවයන් ඔස්සේ කරුණු අධ්‍යයනය කිරීමේ දී වඩා පැහැදිලි වන්නේ මූලාශ්‍රය සාධකවලින් ඈතට විහිදුන ඉතිහාසයක් මෙම භූමි ඛණ්ඩය ඇසුරින් හඳුනාගත හැකි බව ය. මෙම වැළලී ගිය ඉතිහාසය නැවත මතුකර ගැනීම උදෙසා 1980 දශකයේ සංස්කෘතික ත්‍රිකෝණය ව්‍යාපෘතිය ආරම්භ කිරීම සමඟ සිදු කරනු ලැබූ පුරාවිද්‍යා පර්යේෂණ හා ගවේෂණ වඩා වැදගත් වී ඇත.

1982 වසරේ ජේතවනාරාම ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් අනතුරු ව මේ දක්වා සිදු කරනු ලැබූ පුරාවිද්‍යා අධ්‍යයනයන් ගෙන් අනාවරණය කරනු ලැබූ මානවකෘති හා ජීවී පරිසර දත්තවලින් මේ භූමි භාගය තුළ විහාරාරාමය ස්ථානගත වීමට බොහෝ කලක සිට ජනාවාසයක් ලෙස හැසිරී ඇති බවත්, ජනාවාසකරණ ලක්ෂණ පුළුල්වීම සමඟ ශිල්ප නිෂ්පාදන කාර්යයන් පවත්වා ගෙන ගිය බවට තොරතුරු සොයා ගැනීමට හැකි වී තිබේ. ජේතවනාරාම භූමි ඛණ්ඩයේ එහි පහළ ම ස්තරයේ සිට ඉහළ ම ස්තරය දක්වා වන විද්‍යාත්මක කාල රාමුවක් මේ වන විට ගොඩනගා නැති අතර ඒ සඳහා වන පසුබිමක් යථොක්ත ජීවී පරිසර දත්ත හා මානව කෘතිවලින් හඳුනාගත හැකි වී තිබේ.

දශක හතරක කාලයක් මෙම භූමියේ විවිධ පැති අළලා මව් පාෂාණය දක්වා සිදු කරනු ලැබූ පර්යේෂණ කැනීම් ඔස්සේ අධ්‍යයනය කිරීමේ දී මෙම තත්ත්වය අනාවරණය කරගැනීමට අවකාශ ලැබී තිබේ. එම පර්යේෂණ කැනීම් අතර 1982- 84 ප්‍රංශ ජාතික පුරාවිද්‍යාඥයෙකු වන ජැක් ගුචර්ගේ කැණීම ජේ.එස්.පී.96, ජේ.සී.පී.96, ජේ.ටී.පී.96, ජේ.ආර්.පී. 96, ජේ.එල්.පී, 96, ජේ.ජී.පී. 96, ජේ.එස්.පී. 96, ජේ.එස්.පී. I 2000, ජේ.එස්.පී .11 2000, ජේ.පී.එල්. 2000, ජේ.එස්.එම්.පී. 2001, ජේ.පී.එල්. 2001, ජේ.එස්.එම්.පී .2002, ජේ.එස්.ඩබ්.එම්.පී. 2003, ජේ.එස්.ඕ.ඩබ්.පී. 2003, ජේ.එස්.ඩබ්.එම්.පී.



2004 වැදගත් වේ. මෙයින් සමහර කැනීම් මව්පාෂාණය දක්වා සිදු කරනු ලැබූ ඒවා වන අතර එම පර්යේෂණ පුරාවිද්‍යා කැනීම්හි දත්තයන් අධ්‍යයනයේ දී වඩා පැහැදිලි වන්නේ ජේතවන ස්තූපය දැනට පිහිටන ස්ථානය හාත්පස ප්‍රදේශය තුළ සංස්කෘතික ස්තාරායනයේ ඝණත්වය වැඩි වන බවත්, ඉන් පිටතට විහිදීමේ දී සංස්කෘතික ස්තරායනයේ ඝණත්වය අඩු වන බව ය. ලැබී ඇති දත්ත ඔස්සේ විශ්ලේෂණාත්මක දෘෂ්ඨි කෝණයෙන් විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ විහාරාරාමය මෙහි ස්ථානගත වීමට පෙර හා ඉන් පසු තත්ත්වය පිළිබඳ සාපේක්ෂ කාල රාමුවක් ගොඩනැගීමට යථෝක්ත කැනීම් දත්තවලින් හැකියාව ලැබී තිබෙන බව ය.

ජේතවනාරාම පුරාණ භූමියේ ස්තරායනය අධ්‍යයනය කිරීමේ දී මව් පාෂාණය (Bed Rock) මත සිට ඇරඹෙන පාංශු ස්තරය මව්පාෂාණ දිරාපත් වීමෙන් (Decomposet Bed Rock) සෑදුණු ඓන්ද්‍රීය ද්‍රව්‍යයන්ගෙන් අන්තර්ගත බව හඳුනාගත හැකි ය. මෙම ස්තරයට පසු ව ඇරඹෙන ස්තරයන් ඉතා වැදගත් වන්නේ සංස්කෘතික ද්‍රව්‍යයන් අඩංගු ස්තර වන බැවිනි. විශේෂයෙන් මීටර් 1 සෙන්ටිමීටර් 60 ක පමණ ඝණත්වයෙන් හෝ ඊට මදක් ඝණත්වය දක්වන පාංශු කලාපය මෙම භූමියේ මීළඟට දැකගත හැකි ය. මෙකී පාංශු කලාපය ගඩොල් වර්ණ රතු පැහැයට හුරුවක් ගන්නා අතර මෙහි බොරළු දැකගත හැකි වීම විශේෂ වේ. භූ විද්‍යා අධ්‍යයනය අනුව පෙන්වාදෙන ආකාරයට උතුරුමැද කලාපයේ දැකගත හැකි පාංශු තැන්පතු අතර මෙම තැන්පතුව රතු දුඹුරු පාංශු කලාපය (Reddish brown earths) වශයෙන් හඳුන්වයි (Cooray, 1982:140-142) ජේතවන භූමියේ මෙම රතු දුඹුරු පාංශු කලාපය තුළින් කහඳ පතුරු (Chert), දීප්තිමත් තිරිවානා පතුරු (Clear quartz), දුම් පැහැ තිරිවානා පතුරු (Smokey quartz) හා සාමාන්‍ය තිරිවානා පතුරු ජේ.එස්.එම්.පී. 2002, ජේ.එච්.ඩබ්.එම්.පී. 2003, ජේ.එස්.ඕ.ඩබ්.පී. 2003 ස්ථාන නාමය යටතේ ස්තූප සලපතර මළුවේ සහ වැලිමළුවේ සිදු කරන ලද කැනීම්වල දී වාර්තා වී තිබේ. යථෝක්ත පාෂාණ පතුරු විශ්ලේෂණයට බඳුන් කිරීමේ දී හෙළිවන්නේ ඒවා යම් සකස් කිරීමකට ලක්කර ඇති බව ය. මෙහි අනෙක් කරුණ වන්නේ එම සියලු පාෂාණ වර්ගයන් අනුරාධපුර ප්‍රදේශයට ආගන්තුක වේ. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන

ආකාරයට තිරුවානා හා කහඳ පාෂාණ වර්ගයන් බහුල වශයෙන් දැකගත හැකි වන්නේ කඳුකර කලාපය තුළින් වන අතර මීට අමතර ව කහඳ පාෂාණ විල්පත්තු ප්‍රදේශය තුළින් හඳුනාගත හැකි වේ (සෙනෙවිරත්න 1996:188-90). එසේ හෙයින් ජේතවනාරාම විහාර භූමියේ පහළ ම ස්තරවලින් හමුවන්නා වූ මෙම පාෂාණ පතුරු පිළිබඳ ව විමසිය යුතු ය. ජේතවනාරාම විහාර භූමියට උතුරු දෙසින් පිහිටන අනුරාධපුර ඇතුළු නගරය තුළ සිරාන් දැරණියගල විසින් සිදු කරන ලද කැනීම්වලින් එම භූමිය ඇසුරින් ක්‍රියත්මක වූ මධ්‍ය ශිලා සංස්කෘතියක ශිලා මෙවලම් සොයා ගෙන ඇත. ඔහු වැඩිදුරටත් පෙන්වාදෙන ආකාරයට මෙම ශිලා මෙවලම් හමු වන්නේ රතු දුඹුරු පාංශු කලාපයේ (RBE) තුළ බව සඳහන් කරයි (Deraniyagala, 1992.689-700). මෙය ඉතා ම වැදගත් වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයක තොරතුරු ජේතවන භූමියට ඉතා ආසන්න ව පිහිටන භූමියකින් ද වාර්තා වන නිසා ය. එසේ නම් ප්‍රාග් ජේතවනාරාම භූමියේ මුල් ම සංස්කෘතියට හිමිකම් කියන්නේ ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියක් ද යන්න ගැන මේ අනුව විමසා බැලිය යුතු වේ. කෙසේ වෙතත් මෙම භෞතික සංස්කෘතික තොරතුරු අනුව විශ්වාස කළ හැකි කරුණක් නම් සංස්කෘතියක් එක තැන හුදකලා නොවන බව ය. බොහෝ විට එක් සංස්කෘතියක් නියෝජනය කරන පිරිස් ඊට ආසන්න භූමි ප්‍රදේශවල තම වාසස්ථාන සකසා ගැනීම දැකගත හැකි ය. එසේ නම් ජේතවනාරාමය ඇසුරින් හමු වන්නේ ඇතුළු නගර ජනාවාසය තුළ වූ මධ්‍ය ශිලා සංස්කෘතියේ ව්‍යාප්තිය දක්වන කොටසක් ද එසේත් නොවන්නේ නම් එයට සමගාමී ව ක්‍රියාත්මක සංස්කෘතියක් ද විය හැකි ය. පුරාවිද්‍යා අධ්‍යයනයන් අනුව පෙන්වාදෙන වැදගත් ම කරුණ වන්නේ මධ්‍ය ශිලා යුගයේ විසූවන් තම සංස්කෘතියේ සමගාමි පිරිස් සමඟ මෙන් ම ඊට පසු ව ඇති වන ප්‍රාථමික යකඩ යුගයේ සංස්කෘතික පිරිස් සමඟ ද සබඳතා පවත්වා ඇති බව ය (සෙනෙවිරත්න,1996:188). එසේ හෙයින් ජේතවනාරාම විහාරයෙන් වාර්තා වන මෙම තිරිවානා පතුරු හා කහඳ පතුරු ආශ්‍රයෙන් තැනූ ශිලා මෙවලම් ප්‍රාග් ඓතිහාසික යුගයක් ග්‍රහණය කර ගත හැකි සාධක ලෙස උපකල්පනය කිරීම වඩා සාධාරණ ය.



ප්‍රාග් ජේතවන භූමියේ ශිලා මෙවලම් සංස්කෘතියෙන් අනතුරු ව හමු වන පාංශු කලාපය යකඩ ඔක්සයිඩ (Iron oxide) හා කිවුල් ගල් වශයෙන් හඳුන්වන කැල්සියම් කාබනේට් ($CaCO_3$ ) මිශ්‍රිත සංස්කෘතික නොවන ද්‍රව්‍යයන් අඩංගු පාංශු කලාපයක් වේ. සෙන්ටිමීටර් 50 ක පමණ ඝණත්වයක් දක්වන මෙම කලාපයට මතුපිට කොටසේ සංස්කෘතික ද්‍රව්‍යය අන්තර්ගත වේ. දීප්තිමත් අළු පැහැ (Light gray) මෙම පාංශු කලාපය තුළින් පුළුස්සන ලද ගඩොල්, මැටි බඳුන් අවශේෂ, අඟුරු හා අස්ථි අවශේෂ වාර්තා වීම කැපීපෙනේ. මෙම භෞතික සාධක අනුව වඩා පැහැදිලි වන කරුණක් වන්නේ එම තැන්පතුව තුලද යම් මානව ජනාවාසකරණයකට ලක් වී ඇති සාධක සහිත බව ය. මෙම ජනාවාසකරණ ලක්ෂණ මෙම භූමියේ කුමන වකවානුවක් නියෝජනය කරන්නේ දැයි විමසිය යුත්තේ හමු වන මැටි බඳුන් එතරම් දියුණු තත්ත්වයක් නොපෙන්වන බැවිනි. සිරාන් දැරණියගල විසින් අනුරාධපුර ඇතුළු නගරයේ සිදු කර ඇති ඒ.ජී.69, ඒ.එම්.ජී.88, ඒ.එස්.ඩබ්.88 යන කැනීම් සාධක අනුව එම ස්ථානයන්හි ක්‍රි.පූ. 600 - 500 කාලය පදනම් මුල් ඓතිහාසික යුගය (Basel early history) හා ඉන් පසු යුගය පහළ මුල් ඓතිහාසික යුගය ක්‍රි.පූ. 500 - 250 (Lower early history) ඇතුළු නගර පුරාණ ජනාවාසය හෙක්ටයාර 50 ක සීමාවකින් යුක්ත වන්නට ඇතැයි අදහස් කරයි (*Ibid*:711). මූලාශ්‍රය සාධක අනුව මෙම යුගය පණ්ඩුකාභය රජු මූලික ව නගරය සැලසුම් කරන වකවානුව හා සම වේ (මව,10:73-88) එරජු විසින් නගරය සැලසුම් ගත කිරීමේ දී නගරයේ සතර දිශාවේ පිහිටන ද්වාර අසල ද්වාර ග්‍රාම පිහිටවූ බව ද සඳහන් වේ (එම,10:88). මෙම දොර ගම් සතරට අමතර ව විවිධ කාර්යයන් පදනමින් නගරයෙන් පිටත ග්‍රාම ස්ථාන ගතකළ බවට ද විස්තර එහි සඳහන් වේ (එම,10:88-104). එසේ හෙයින් මූලාශ්‍රය සාධක පිළිබඳ ව විමසීමේ දි පැහැදිලි වන්නේ ක්‍රි.පූ. හය වැනි හෝ පස් වැනි සියවස් වන විට ජේතවනාරාම භූමිය අවට යම් කිසි ග්‍රාම තත්ත්වයක් නිර්මාණය වී තිබූ බවට මෙම දත්තවලින් පැහැදිලි වන බව ය. එසේ නම් සිරාන් දැරණියගල ප්‍රකාශ කර ඇති ආකාරයට ඇතුළු නුවර ජනාවාස හෙක්ටයාර 50 ක සීමාවකින් යුක්ත වන සමයේ ඊට පිටතින් සුළු පරිමාණ ග්‍රාමයන් ස්ථාන ගත වීම බෝදුරට සිදු වීමට අවකාශ තිබෙන

අතර, ජේතවන බිමෙන් වාර්තා වන මෙම සංස්කෘතික දත්ත අනුව එම ජනාවාස තත්ත්වය බොහෝ විට පහළ මුල් ඓතිහාසික යුගය ක්‍රි.පූ. 500 - 250 සිදු වීමට ඇතැයි උපකල්පනය කළ හැකි ය. කෙසේ වෙතත් ජේතවන භූමියේ පහළ ම ස්තරවලින් වාර්තා වන මෙම පුරාණ ජනාවාසකරණ ලක්ෂණ බොහෝ විට පූර්ව ඓතිහාසික යුගය නියෝජනය කරන සාධක බවට උපකල්පනය කළ හැකි බව පෙන්වාදිය හැකි වේ.

ජේතවනාරාම භූමියේ මීළඟට වාර්තා වන පාංශු කලාපය ද ඉතා වැදගත් පාංශු කලාපයක් වේ. මෙම පාංශු කලාපය දුඹුරු (Brown) හා අඳුරු දුඹුරු (Dark brown) පැහැවන අතර උක්ත තැන්පතුව තුළින් දියුණු මැටි බඳුන් අවශේෂ වන කාල රක්ත වර්ණ මැටි බඳුන් අවශේෂ, රක්ත වර්ණ මැටි බඳුන් අවශේෂ වාර්තා වීම කැපීපෙනේ. එසේ ම ගොඩනැගිලි ඉදිකිරීම් හා සම්බන්ධ ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම, වීදුරු හා ලෝහ භාවිත කර නිර්මාණය කර ඇති නිර්මාණ, මෙන් ම ස්වස්තික කාසි ද හස් එබූ හා ලක්ෂ්මී කාසි ද මෙම තැන්පතුව තුළින් වාර්තා වන අනෙක් භෞතික සංස්කෘතික තොරතුරු වේ. සිරාන් දැරණියගලට අනුව ඇතුළුපුර ජනාවාසය තුළින් මෙවැනි තොරතුරු වාර්තා වන්නේ මධ්‍ය මුල් ඓතිහාසික යුගය ක්‍රි.පූ. 250 - ක්‍රි.ව. 100 (Mid early history) තුළින් බව පෙන්වා දෙයි (Deraniyagala, 1992;712) ඔහු සඳහන් කරන ආකාරයට ඇතුළුපුර ජනාවාසය එවකට හෙක්ටයාර 100 සීමාවකින් යුක්ත වී ඇත (*Ibid*). මෙම වකවානුවට සමකාලීනතාවයක් දක්වන ගඩොල්මුවා ස්මාරකයක් ද ජේතවන ස්තූප සළපතර මළුවෙන් වාර්තා වී ඇත. හේම රත්නායක පෙන්වාදෙන ආකාරයට මැටි හා පුළුස්සන ලද ගඩොළු යොදා නිර්මාණය කර ඇති මෙම ස්මාරකයේ ගඩොළු තාපසංදීප්තතා කාලනීර්ණයට (Thermoluminescence dating) බඳුන් කිරීමෙන් එම ගඩොළු ක්‍රි.පූ. තුන් වැනි සියවස මැද භාගයට එනම් ක්‍රි.පු 250 කාලයට අයත් වූ බව සඳහන් කර ඇති අතර රත්නායක වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ මෙය මිහිඳු මාහිමියන්ගේ ආදාහන කටයුතු සිදු වන වකවානු හා සමානාත්වයක් ගන්නා බැවින් එය මිහිඳු මාහිමියන් අදාහනය කරන ලද මාලකය විය හැකි බව ය (Rathnayake, 1993:66). මෙම තත්ත්වය අනුව පැහැදිලි



ලෙස ම මුල් ඓතිහාසික යුගය තුළදී ජේතවන බිම දියුණු ජනාවාසකරණ ලක්ෂණ පෙන්වන ක්‍රියාකාරී භූමියක් බවට පත් ව තිබූ බව පෙන්වාදිය හැකි ය. මූලාශ්‍රය කරුණු ඔස්සේ ද මේ බව සනාථ කළ හැකි සාධක තිබේ. ක්‍රි.පූ. තුන් වැනි සියවස මහින්ද මහ රහතන් වහන්සේ අනුරාධපුරයට වැඩම කරන ලද දිනයේදී දෙවනපෑතිස් රජු මහින්ද මාහිමිට රාත්‍රිය ගත කිරීමට නන්දන උයන යෝජනා කළ විට මහ රහතන් වහන්සේ එය ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නුවරට ඉතා ආසන්න ව එම ස්ථානය පිහිටන බැවින් එම ප්‍රදේශය තුළ ඝෝෂාකාරී බවක් ඇති බව පවසමිනි (මව,15:6-8) එසේ ම බුද්ධඝෝෂ හිමිගේ විසුද්ධි මග්ගයේ සඳහන් වන පුවතක් උපුටා දක්වන හේම රත්නායක නගරයේ දකුණු දොරටුවෙන් පිටවූ මහින්ද තෙරුන් කුම්භකාර ග්‍රාමය දෙසට ගිය බව සඳහන් කර තිබේ (Rathnayake, 1984:10). මෙම ඓතිහාසික පුවත් මගින් සනාථ කරන කාරණයක් නම් මහින්ද මාහිමි අනුරාධපුරයට වැඩි කාලය වන විට කුඹල් ගමක් දකුණින් ක්‍රියාත්මක වී තිබීමයි. මෙය ද ජනාවාසකරණ ලක්ෂණ පැහැදිලි ලෙස ම පෙන්නුම් කරන්නක් වන අතර එම වකවානුව වන විට ජේතවන භූමිය ආශ්‍රිත ජනාවාසකරණ ලක්ෂණ පුළුල් වී තිබූ බවට කදිම ඉඟි සපයන අවස්ථාවක් ලෙස ද එය පෙන්වාදිය හැකි ය.

මෙම තැන්පතුවට අනතුරුව ජේතවනාරාම විහාර භූමිය ඇසුරින් දැකගත හැකි වන්නේ මහසෙන් රජුට පෙර පැවති අවසන් ජනාවාසකරණ ලක්ෂණ වේ. මෙම පාංශු කලාපය තුළින් හමුවන ගොඩනැගිලි ඉදිකිරීම් සාධක කාල රක්ත වර්ණ මැටි බඳුන්, රක්ත වර්ණ මැටි බඳුන් අවශේෂ, කාල වර්ණ මැටි බඳුන්, අවශේෂ මෙන් ම විදේශීය මැටි බඳුන් වර්ග අඩංගු පිඟන් මැටි කර්මාන්තය ආශ්‍රිත නිර්මාණ ද දියුණු ජල කළමණාකරණ ලක්ෂණ හා ඛනිජ සම්පත් භාවිත නිර්මාණ හා තඹ, රත්තරන් යකඩ ආදී ලෝහ භාවිත නිර්මාණ ද බහුල ලෙස වාර්තාවීම කැපීපෙනේ. මේවා බොහෝ විට ආරාමීය වාස්තුවිද්‍යා නිර්මාණ මෙම බිමේ ස්ථානගත වීමට පූර්වයෙහි ක්‍රියාත්මක වූ තත්ත්වයක් වන අතර, මූලාශ්‍රය සාධක අනුව හමු වන ගොඩනැගිලි බොහෝ විට ජේතවන වාස්තුවිද්‍යා නිර්මාණවලට පෙර කාලයට අයත් බව පැහැදිලි ය.

ජේතවනාරාම පුරාණ විහාරයේ දක්නට ලැබෙන ප්‍රාග් ජේතවනාරාම ජනාවාසකරණ ලක්ෂණ සමග ශිල්ප නිෂ්පාදන කටයුතු පිළිබඳ ව පුරා සාධක විශාල ප්‍රමාණයක් ලැබීම ද ඉතා ම වැදගත් වේ. මෙම ශිල්ප නිෂ්පාදන කටයුතු පිළිබඳ පැහැදිලි තොරතුරු දැකගත හැකි වන්නේ අප ඉහත දී විස්තර කරන ලද මුල් ඓතිහාසික යුගය නියෝජනය කරන තැන්පතුවලින් බව පෙන්වාදිය යුතු ය. එම කාල වකවානුවේදී උක්ත භූමිය ඇසුරින් ලෝහ, ඛණිජ, පාෂාණ, දළකඩ උපයෝගී කරගෙන නිර්මාණය කරන ලද නිෂ්පාදන කටයුතු පිළිබඳ පුරා සාධක විශාල ප්‍රමාණයක් ලැබී ඇත. මේවා පැහැදිලි ලෙස ම ශිල්ප කර්මාන්ත ප්‍රාග් ජේතවන යුගය තුළ පැවති බවට ලැබෙන පුරා සාධක වේ.

දැනට අනාවරණය කරගෙන ඇති පුරාවිද්‍යා තොරතුරු අනුව ක්‍රි.පූ. පස් වැනි සියවසින් පසු අනුරාධපුර නගරය ලංකාවේ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය ලෙස හඳුනාගෙන ඇත (Deraniyagala,1992:700- 712). එසේ ම අනුරාධපුර පැවති ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය සඳහා නිමිභාණ්ඩ හා අමුද්‍රව්‍යය ලංකාවේ මධ්‍ය කඳුකරය හා නැගෙනහිර කලාපය මෙන් ම ඉන්දියාව ඇතුළු විදේශ රටවලින් ද ආයාත කර තිබේ (සෙනෙවිරත්න,1996:188- 192). විශේෂයෙන් අනුරාධපුරයට ආයාත කරන ලද අමුද්‍රව්‍යය අතර ලෝහ කර්මාන්තය සඳහා ලෝපස් හා ඛණිජ පාෂාණ ආශ්‍රිත කර්මාන්ත සඳහා කානීලියන්, ඇගට් ඇතුළු විදේශීය පාෂාණ ද රඹහ, ඇමතෙස්ත, ෆෙල්ස්පාර්, කහඳ, තිරිවානා ආදී දේශීය ඛණිජ හා පාෂාණ වර්ග ද කැපීපෙනේ (එම). මෙසේ ආයාත කරන ලද සම්පත් උපයෝගී කරගෙන ශිල්ප නිෂ්පාදන කටයුතු අනුරාධපුරයේ කුමන ස්ථානයක සිදුකර ඇත් ද යන්න පිළිබඳ ව හඳුනාගත හැකි ශිල්ප නිෂ්පාදනාගාරයක් මෙතෙක් නිශ්චිත ලෙස අනාවරණය කරගෙන නැති අතර, අනුරාධපුර ඇතුළු නගරයෙන් මෙන් ම ජේතවන හා අභයගිරි බිමෙන් ද ඒ ආශ්‍රිත තොරතුරු රාශියක් ලැබීම ඉතා වැදගත් වේ.

ජේතවනාරාමයේ පහළ ම ස්තරවලින් හමුවන ශිල්ප නිෂ්පාදන කටයුතු පිළිබඳ සාධක අතර, ලෝහ කර්මාන්තය හා සම්බන්ධ තඹ බොර, තඹ නිර්මාණ, යබොර හා යකඩ නිර්මාණ හා ලෝහ උණු කිරීමට භාවිත කරන උඳුන් හා කෝව කොටස්



හමුවීම ඉතා වැදගත් වේ. ජේ.එස්.ඩබ්.එම්.පී, 2003, ජේ.එස්.ඕ.ඩබ්.පී. 2003, ජේ.එස්.එම්.පී. 2001, ජේ.එස්.පී. 2000, ජේ.එස්.පී. 96 යන කැනීම් සාධක අනුව උඳුන් හා යබොර මෙන් ම තඹ බොර ද ඒ ආශ්‍රිත නිර්මාණ රාශියක් සොයා ගැනීමට හැකියාව ලැබී තිබේ. මෙම භෞතික සංස්කෘතික තොරතුරු අනුව ඒවා විවිධ නිෂ්පාදන හා නිර්මාණ කාර්යය සඳහා භාවිත කරන ලද සාධක බව පැහැදිලි වේ. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට පූර්ව ඓතිහාසික යුගය තුළදී අනුරාධපුරයට ලෝහ සම්පත් ලබාදුන් ප්‍රධාන ස්ථානයක් සේරුවිල පැවති බව සොයා ගෙන ඇත (Senaviratne,1994:273). සිරාන් දැරණියගල විසින් ඇතුළුපුර සිදු කරනු ලැබූ AG 9 කැනීමේ 4A හා 4B පස් ස්තරවලින් හමු වූ තඹ බොර (Copper slag) රසායනික විද්‍යාත්මක විශ්ලේෂණයන්ට බඳුන් කර ඇති සුදර්ශන් සෙනවිරත්න හා මල්ලියසේන යන විද්වත්හු එම තඹ සේරුනුවර ලෝපස් නිධියේ ලෝපස් සංයුතියට සමාන බව විද්‍යාත්මක ව ඔප්පු කර ඇත (Deraniyagala, 1972:145; Senaviratne:1996). මූලාශ්‍රය සාධක අනුව ද මෙම නිධියේ ලෝපස් පුරාණ අනුරාධපුරයට ඇදී ආ ආකාරය පිළිබඳව වංසකතාවල ද සඳහන් වී තිබේ.

ඒ අතර ධාතුවංසයේ සඳහන් තම්බතීර්ථ හා ක්‍රි.ව. මුල් සියවස්වල ශිලාලිපිවල සඳහන් ලෝහ ද්වාර සේරුනුවරට අනුරාධපුරයේ සිට තිබූ පුරාණ ගමන් මාර්ග වන අතර ඒ හා සම්බන්ධ ව ශිල්ප කර්මාන්ත පවත්වාගෙන ගිය පිරිස් එම මාර්ගය පිහිටි ප්‍රදේශ ආශ්‍රිත ව තඹර, කඹර, තොපෂ යන නාමයන්ගෙන් කහටගස්දිගිලිය ලබුඇටබැඳිගල, නැට්ටුක්කන්ද යන ස්ථානවල ඇති අභිලේඛනයන්හි සඳහන් වන බව සුදර්ශන් සෙනවිරත්න පෙන්වාදී තිබේ (Senaviratne,1994:275-278). එසේ හෙයින් අනුරාධපුරය ඇසුරින් භාවිත වූ ශිල්ප කර්මාන්ත අතර ලෝහ කර්මාන්තය ප්‍රධාන වී ඇති අතර ජේතවනාරාම විහාර භූමිය තුළින් ද අති පුරාණයේදී ලෝහ නිෂ්පාදන කටයුතු පැවති බව ඉන් හඳුනාගත හැකි ය.

ජේතවනාරාම භූමිය ඇසුරින් දක්නට ලැබෙන ශිල්ප නිෂ්පාදන කටයුතු අතර ඛණිජ, පාෂාණ භාවිත කටයුතු ද බහුල වශයෙන් වාර්තා වීම කැපීපෙනේ. ජේතවන විහාර භූමියේ පහළ

ම ස්තරවලින් වාර්තා වන බණිජ නිෂ්පාදන අතර, විදේශීය පාෂාණ වන කැල්සිඩෝනි (මෙය කානීලියන් පාෂාණ රත් කිරීමට පෙර මුල් පාෂාණ තත්ත්වය) හා ඇගේට් ඉතා වැදගත් වේ. උක්ත පාෂාණ ද්වය ම ලංකාවට ආයාත කරවන ලද්දේ අර්ධද්වීපික ඉන්දියාවේ බටහිර හා නිරිත දිග දෙදිශාවෙනි. අමුද්‍රව්‍යයක් ලෙස මාන්තායි වරාය හරහා අනුරාධපුරයට ආයාත කර ඇති මෙම පාෂාණ අනුරාධපුරයේදී ශිල්ප කටයුතු සඳහා භාවිත කිරීමෙන් අනතුරු ව අනෙකුත් ප්‍රදේශවලට බෙදාහැර ඇත (සෙනෙවිරත්න,1996:188-190). ජේතවනාරාමය කැනීම්වලදී හමුවන මෙම පාෂාණ වර්ග එහි මුල් ස්වරූපයෙන් හා නිර්මාණ කටයුතුවලදී ඉවතලන පතුරු වශයෙන් ද නිර්මාණ වශයෙන් ද වාර්තා වීම තුළ ඒවා ශිල්ප නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කළ බවට ලැබෙන සාධක වේ.

එසේ ම අනුරාධපුරයට ආගන්තුක දේශීය බණිජ පාෂාණ වන අඹතෙස්ත, රඹහ කහඳ, තිරුවානා ආදී පාෂාණ වර්ග හා ඒවායේ ඉවත් කරන ලද පතුරු කොටස් හා නිර්මාණ වශයෙන් ද හමුවීම එම කර්මාන්තය මෙම භූමිය ආශ්‍රිත ව පැවතීම තහවුරු කරන කරුණක් ද වේ. මෙම පාෂාණ නිර්මාණවලට අමතර ව දක්නට ලැබෙන තවත් සුවිශේෂී කර්මාන්තයක් වශයෙන් දළකඩ කර්මාන්තය පෙන්වාදිය හැකි ය. මේ සඳහා මුව, ගෝන, ඌරු ඇත් ආදී සතුන්ගේ දළවලින් ලබා ගන්නා කොටස් ද මුහුදු ආශ්‍රිතව හමු වන බෙල්ලන් උපයෝගි කරගෙන තනන ලද නිර්මාණ හා ශේෂ ද වේ. හමු වූ පුරා භෞතික සාධක අතර, අං කොටස් කපා ඉතිරි වූ ශේෂ හා මුහුදු බෙල්ලන්ගේ කවච කපා අවසන් නිර්මාණ විශාල ප්‍රමාණයක් මෙම භූමිය තුළින් වාර්තාවී අනුව පැහැදිලි ලෙස ප්‍රාග් ජේතවන යුගයේ කාර්මික තත්ත්වය ඉන් කියා පාන බව පෙන්වාදිය හැකි ය. එසේ ම ශිල්ප නිෂ්පාදන කටයුතු පැවති බවට සාධක පිළිබඳ ව විමර්ශනය කිරීමේදී මූලාශ්‍රය කරුණු අධ්‍යයනය ද ඉතා වැදගත් වේ. මහාවංසයට අනුව පණ්ඩුකාභය රජු දවස **ද්වාරග්‍රාම** පිහිට වූ බව සඳහන් වේ (මව,10:88). මෙම ද්වාරග්‍රාම (දොරගම්) රටේ ඇතිවන ආර්ථික සංස්කෘතික හා දේශපාලන පුනරුදයන් සමඟ නිගමස්ථාන (මෙයින් වෙළෙඳපොළ අර්ථවත් කෙරේ) දක්වා ක්‍රියාත්මක වූ ආකාරය පසු කාලීන අභිලේඛන



තොරතුරුවලින් ද තහවුරු වේ. ලබුඇටබැඳිගල ශිලාලේඛනයට අනුව අනුරාධපුර නගරයෙහි පජිනපස (නැගෙනහිර) **මහාතඹක** නම් නියමතන (නිගම) පිහිටා තිබී ඇත (*Ez*,vol.II:180). එසේ ම තෝනිගල ශිලාලේඛනයට අනුව නගරයේ උතුරුපස **කළහුමනක** නම් නියමතන ක්‍රියාත්මක වී ඇත. (*Ez*,vol.III:No:17).

අභිලේඛනවල නියමතන (නිගම, නිගමස්ථාන) යන අර්ථයෙන් වර්ධනය වූ වෙළෙඳ පොළ දීපවංසයේ සඳහන් වන්නේ **අන්තරාපන** ලෙස ය. එහි විස්තර වන ආකාරයට නිෂ්පාදකයා හා පාරිභෝගිකයා හමු වී භාණ්ඩ හුවමාරු කරගන්නා ස්ථානය අන්තරාපන ලෙස හඳුන්වාදී තිබේ (දීව,9:36). මේ ආකාරයට අනුරාධපුර සතර දිශාවේ ක්‍රියාත්මක වූ ද්වාර ගාම වෙළෙඳ පොළ සඳහා අවශ්‍ය නිෂ්පාදන ද්‍රව්‍යය සඳහා ඉඩකඩ පහසුව බහුල වශයෙන් ප්‍රාග් ජේතවන භූමිය ඇසුරින් තිබෙන්නට ඇති බව පෙනේ. පුරාවිද්‍යා අධ්‍යයන අනුව පෙන්වාදෙන වැදගත් ම කරුණක් වන්නේ මෙම වෙළෙඳ පොළවල් සඳහා එයට පිටතින් සතර දිශාවෙන් පිහිටි සුළු වෙළෙඳ පොළවල්වලින් නිමි භාණ්ඩ හා අමුද්‍රව්‍යය ප්‍රධාන වෙළෙඳ පොළට ලබාදුන් බව ය. සුදර්ශන් සෙනෙවිරත්න පෙන්වාදෙන ආකාරයට මෙවන් සුළු වෙළෙඳ පොළවල් හා හුවමාරු මධ්‍යස්ථාන කඩ, කඩක, කටක, කණ්ඩ යන අර්ථයන්ගෙන් ක්‍රි.පූ. මුල් සියවස්වල අභිලේඛනයන්හි හා මූලාශ්‍රයවල සඳහන් වී තිබේ (සෙනෙවිරත්න, 1996:191 - 192). පුරාණ අනුරාධපුර නගරය හා සම්බන්ධ ව පැවති මාර්ග ජාලය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේදී ද වඩා පැහැදිලි වන්නේ ජේතවන භූමිය එවකට සුවිශේෂී භූමියක් ලෙස මාර්ග පද්ධතියෙන් වටවී තිබී ඇති බවයි. ඒ ආකාරයට සුවිශේෂීභාවයක් ලබාදෙමින් මාර්ග පද්ධතිය භූමිය වටවන ආකාරයෙන් නිර්මාණය කර ඇත්තේ එම භූමිය ඇසුරින් සුවිශේෂී කාර්යයන් ඉටු වූ බැවින් බව පෙනේ.

නගරය හා සම්බන්ධ වූ පුරාණ මාර්ග ජාලය පිළිබඳ තොරතුරු මූලාශ්‍රයන්හි සඳහන් වේ. මූලාශ්‍රයවල සඳහන් වන ආකරයට නගරයේ දකුණුපසට දිවගිය මාර්ගය මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුව ඉදිරිපසින් ඉසුරුමුණිය හා වෙස්සගිරිය හරහා මලය රටට ගිය බව සඳහන් වේ (සද්ලං:140-143). බුද්ධඝෝෂ හිමියන්ගේ විසුද්ධි මග්ගයට අනුව දේවානම්පියතිස්ස රජු දවස

මහින්ද මහ රහතන් වහන්සේ නගරයේ දකුණු දොරටුවෙන් පිටවී කුම්භකාර ග්‍රාමය දෙසට ගමන් කර ඇත්තේ ද මේ මාර්ගයේ විය යුතු ය (Rathnayake, 1984:10). එසේ ම ථූපාරාමය දෙස සිට කදම්බ නදිය දෙසට පැමිණි ගමන් මාර්ගය එක් පසකින් නැගෙනහිර දොරටුව ද අනෙක් පසින් කදම්බ නදියේ බටහිර ඉවුර දිගේ ගොස් නැවත මහාමේඝ වනයේ නැගෙනහිර දොරටුවට ද සම්බන්ධ වී තිබේ (*ibid*). එසේ ම මිහින්තලය කඩකචෛතිය දෙස සිට පැමිණි මාර්ගය නිවත්තක චෛතිය හරහා පැමිණ කදම්බ නදියේ පහණතොට එතෙර කර මල්වතු ඔය බටහිර ඉවුර දිගේ ගමන් කරන ලද මාර්ගයට සම්බන්ධ වී ඇත (*ibid*). සුමන සාමනේර හිමියන් විසින් දකුණු අකුධාතුව ලංකාවට වැඩම වීමේ දී මෙම මාර්ගය භාවිත කළ බව මහාවංසයේ සඳහන් වේ (මව,17:15-31). බුද්ධඝෝෂ හිමිගේ විසුද්ධි මග්ගයට අනුව ද නුවර දකුණු දෙසින් කුම්භකාර ග්‍රාමය ක්‍රියාත්මක වූ බව පෙනේ. කුම්භකාර ග්‍රාමය පුරාණ පිඟන් මැටි කර්මාන්තය හා ශිල්ප නිෂ්පාදන කරන ලද ග්‍රාමයකි. මෙය ගමක් වශයෙන් හුදකලා වී නොතිබීමට ඇති අතර මේ හා සමඟ ශිල්ප නිෂ්පාදන කටයුතු කෙරෙන තවත් ස්ථාන මෙහි පෙර සඳහන් කළ ආකාරයට ක්‍රියාත්මක වන්නට ඇත.

ඇටවීරගොල්ලෑව සෙල්ලිපියේ එන තොරතුරු අනුව ද මෙයට යම් අදහසක් එකතු කරගත හැකි ය. එම සෙල්ලිපියට අනුව ජේතවන විහාරය සඳහා **වෙළන්ගම** නමැති ගමක් පූජාකර ඇත (*Ez*,vol.II:47). මෙම සෙල්ලිපිය පශ්චාත් කාලීන වුව ද මෙහි එන වෙළන්ගම යන වචනයෙහි වචනාර්ථය බැලීමේ දී මෙයින් **වළංගම** හෝ වෙළෙඳ ගම අර්ථවත් වූවා යැයි හැඟේ. මෙයින් වළංගම අර්ථවත් වන්නේ නම් එය පුරාණ නගරයෙහි දකුණු දෙස පිහිටි වළංගම වීමට ඉඩ ඇති අතර, එම කටයුත්ත එසේ නොවී වෙළෙඳ ගමක් වශයෙන් තිබුණානම් ශිල්ප නිෂ්පාදන කටයුතු සිදු කරන ලද ගමක් වීමට ඇතැයි ද උපකල්පනය කළ හැකි ය. මෙහි මුලින් පෙන්වාදී ඇති ආකාරයට මෙම භූමියේ පහළ ම ස්තරවලින් වාර්තා වන කාසි අතර හස්එබු කාසි, ඇතා සහ ස්වස්තික කාසි හා ලක්ෂ්මී කාසි වේ. මෙවැනි කාසි අතර, ඇතා සහ ස්වස්තික කාසි හා ලක්ෂ්මී කාසි ලංකාවේ පැරණි ම කාසි වශයෙන් පුරාවිද්‍යාඥයන් හඳුන්වන අතර, මෙම බිමේ පහළ



ම ස්තරවලින් බහුල වශයෙන් උක්ත කාසි වර්ග තුන සංසරණය වූ බව පෙනේ. මෙය ඉතා වැදගත් වන්නේ ඒ ප්‍රදේශය ආශ්‍රයෙන් යම්කිසි වාණිජමය කටයුතු පෙරදැරි කරගත් ක්‍රියාවලියක් සිදු වූ බවට ඉන් ඉඟි ලැබෙන නිසා ය. පුරාවිද්‍යා ප්‍රභවයන් හා ලේඛනගත ප්‍රභවයන් ඔස්සේ කරුණු විමර්ශනය කිරීමේදී ප්‍රාග් ජේතවන භූමිය ඉතා වැදගත් භූමියක් බව පෙන්වාදිය හැකි අතර මෙම භූමිය තුළ වූ ඉතිහාසය ලේඛනගත ප්‍රභවයන් ගෙන් නිසි ලෙස එළිදැක්වී නැති අතර පුරාවිද්‍යා ප්‍රභයන් තුළින් එළිදැක්වී ඇති බව පෙනේ. ශ්‍රී ලාංකේය පුරාවිද්‍යා ක්ෂේත්‍ර අතර, ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට ගොඩනැගී ඇති අඛණ්ඩ ඉතිහාසයක් ජේතවන පුරාවිද්‍යා භූමිය ඇසුරින් මේවන විට සොයා ගෙන ඇති අතර එසේ සොයා ගන්නා ලද දත්ත නිශ්චිත කාලයක් වෙත ස්ථානගත කිරිම සඳහා විද්‍යාත්මක කාලනිර්ණ භාවිත කල යුතු අතර එමගින් ජේතවන විහාර භූමියේ ඇති සැගවී ගිය ඉතිහාසය සඳහා කාල රාමුවක් ගොඩනැගීමට මේ වන විට ලැබී ඇති දත්තවලට හැකියාව තිබේ.

# තුන් වැනි
# පරිච්ඡේදය

## 3.0 මහා විහාර සැලැස්ම

ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වන කරුණු අනුව ජේතවනාරාම විහාරයේ පිහිටීමේ සැලැස්ම මහා විහාර වර්ගයට අයත් බව විවිධ විද්වතුන්ගේ මතය වේ. ජේතවනාරාම විහාරාරාම සංකීර්ණය ඉදිකිරීමට ප්‍රථම අනුරාධපුර නගරය ආශ්‍රිත ව මහා විහාරය, මිරිසවැටිය, අභයගිරිය, දක්ෂිණ විහාරය වශයෙන් විශාල විහාර හතරක් පැවති බව ඉතිහාසගත තොරතුරු අනුව අනාවරණය වේ. ශ්‍රී ලංකාවේ විහාර කර්මාන්තයන්ගේ සැලැස්ම අධ්‍යයනය කිරීමේ දී පැරණි මූලාශ්‍රය අපට ඉතා වැදගත් වන්නේ එම මූලාශ්‍රය ආශ්‍රයෙන් එවකට පැවති විහාර සැලසුම් පිළිබඳ යම් අවබෝධයක් ලබාගැනීමට හැකි වන බැවිනි. ශ්‍රී ලංකා බුදු සසුනේ ප්‍රථම මූලස්ථානය වූ මහා විහාරය පිළිබඳ වංසකතාවල ලියැවී ඇති තොරතුරු අනුව මහා විහාර සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනය කිරීමට හැකියාව තිබේ. මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම ධූතයන් වහන්සේලා මිහින්තලාවට මුලින් ම වැඩම කරවූ නමුත් සිය ධර්ම ප්‍රචාරක කටයුතු හා රජතුමා අතර පැවති සම්බන්ධතාවය ගොඩනගා ගැනීමට මහාමේඝ වනය කේන්ද්‍ර කරගෙන තිස්සාරාමය පිහිටුවා ගන්නා ලදී (මව,පරි15). මෙයින් පසු ලක් බුදු සසුනේ මුල්බැස ගැනීම ලෙස මහා අරිට්ඨ ඇමති ප්‍රමුඛ පිරිස පැවිදි වී උපසම්පදාවට පත්වීම සිදු වී තිබේ (මව,16:10-17). දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී මිහිඳු මහරහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවේ බුද්ධාගම ස්ථාපිත කිරීමේ දී ඇති කළ ප්‍රථම විහාරය ආරම්භයේ දී තිස්සාරාමය යනුවෙන් හැඳින් වුව ද පසු ව එය මහා විහාරය නමින් ප්‍රකට විය (කුලතුංග, 2001:01). මිහිඳු මා හිමියන් විසින් ඉසින ලද මල් පතිත වීමෙන් පොළොව කම්පා වූ ස්ථාන අදාළ කරගෙන පූජනීය ස්ථාන පිහිටුවීම සඳහා ස්ථාන අටක් වෙන් කරන ලද බව මූලාශ්‍රයවල සඳහන් වේ. දේවානම්පියතිස්ස



රජතුමා විසින් මිහිඳු හිමියන්ට තිස්සාරාමය පූජා කිරීම සඳහා රන් කෙණ්ඩියෙන් පැන් වත්කර මහමෙව්නා උයන පූජාකිරීමේ දී පැන් පතිත ව මහ පොළොව කම්පා වූ ස්ථානය යනුවෙන් පූජනීය ස්ථාන අටක් මුල් ම කාලයේ මහා විහාරයට අයත් ව තිබුණි. ඒවා තිස්සාරාමය, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි සෑය, ජන්තාඝර පොකුණ, ලෝවාමහාපාය, ලහබත්ගෙය, දානශාලාව (චතුශාලාව) කම්මමාලකය යනුවෙන් මූලාශ්‍රයවල සඳහන් වේ. (එම:1-2)

මූලාශ්‍රයන්හි මහා විහාර අයත් විහාර අංග ඇතුළත් ස්ථාන දක්වා ඇත්තේ මෙසේ ය.

- පිචුල මාලකය (පුලිල මළුව) - සංඝකම්ම මාලකය සඳහා (රජෙ ගෙට දකුණින්) (මව,15:29, දිව,13:35-36).
- චාරු (චාරුත්ත) පොක්ඛරනි - ගිනිහල් පොකුණ (මව,15:30-31, දිව,13:39-42)
- රජගෙයි දොරටුව - ජය ශ්‍රී මහා බෝධිය සඳහා (මව,32-35 දිව,13:50)
- මහා මවුල මාලකය (මහ මිදෙල් මළුව) - උපෝසථාඝරය සඳහා (දිව,14:60-61, මව,15:36:37)
- පන්හම්භමාලකය (පැන්ඹු මළුව) පිරිකර ලාභ බෙදා ගන්නා ස්ථානය (මව,15:38-46, දිව,14:63-64)
- චතුස්ශාලාව - දන්ගෙය (මව,15:47-50)
- කතුධ වාපි (කුඹුක්කන් නම් කඳු බඳ ඉස්මත්ත) මහා ථූපය සඳහා (මව,15:52-57)

මෙම සැලැස්ම මගින් ප්‍රකාශ වන්නේ මහා විහාර සංකීර්ණයට අයත් ප්‍රධාන ගොඩනැගිලි පිළිබඳ ව ය. ඉහත සඳහන් මූලාශ්‍රයන්ගේ විස්තර අනුව පැහැදිලි වන කරුණක් වන්නේ ලංකාවේ මුල් ම විහාරය වශයෙන් හැඳින්වෙන මහා විහාරයේ ගොඩනැගිලි ස්ථානගත කිරීමෙහි ලා මුල් ම තොරතුරු මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුට පෙන්වා දී ඇති බව ය. මිහිඳු මා හිමියන් විසින් දේවානම්පියතිස්ස රජුට ගොඩනැගිලි ඉදිකිරීමට ස්ථාන පෙන්වා දීමෙන් හා ඒවාට උපදෙස්

ලබාදීමෙන් පැහැදිලි ව පෙන්වාදිය හැකි කරුණ වන්නේ ලංකාවේ ඉදිවූ මුල් ම විහාරයේ සැලසුම ඉදිරිපත් කිරීමේ ගෞරවය මිහිඳු මහ රහතන් වහන්සේට හිමි වන බව ය. පසු කලෙක අනුරාධපුර ශුද්ධ නගරය හැටියට සැළකුණු කොටසෙහි මුල් සැලැස්ම හා වින්‍යාසය කරන ලද්දේ මිහිඳු මා හිමියන් විසිනැයි සිතීමට වැදගත් හේතු ඇත. මිහිඳු මා හිමියන්ට වඩා දේශ දේශාන්තරයෙහි සැරිසරා පුරුදු උන්වහන්සේට වඩා දැණුම ඇති වඩා උගත් වඩා ශිෂ්ඨ සම්පන්න එක ම කෙනෙකුවත් ලංකාවේ එවකට සිටියේ නැත (රාහුල,1989:57).

උන්වහන්සේ මගධ මහා රාජ්‍යයේ සෝභා සම්පන්න අගනුවර වූ පාටලීපුත්‍ර නගරයේ වාසය කර පුරුදු කෙනෙකි. උන්වහන්සේ සිය පියාණන් විසින් කරවන ලද අශෝකාරාමාදීය හා මෑණියන් විසින් විදිසාවේ කරවන ලද චෛතියගිරි ආදී මහා ආරාමයක් දැක පුරුදු කෙනෙකි. එබැවින් ආරාමයක සැලැස්ම සකස් කිරීමේ දී උන්වහන්සේට වඩා සුදුස්සෙකු මෙරට නොවීය. වංසකතාවල එන ප්‍රාතිහාර්යය පිළිබඳ විස්තර ද මිත්‍යා කතා ද කාව්‍යාලංකාර හා අතිශයෝක්තිය ද පැත්තට කළ විට පැහැදිලි වන්නේ සංඝකර්ම සඳහා මාලයක්, උණුදිය නෑම සඳහා පොකුණක්, ශ්‍රී මහා බෝධියට ස්ථානයක්, සංඝයාගේ උපෝසත ශාලාවට ස්ථානයක්, බත්හලට සුදුසු ස්ථානයක් හා මහාථූපය යන මේ එක් එක් ගොඩනැගිලිවලට සුදුසු ස්ථානයන් දකවමින් මිහිඳු මාහිමියන් දෙවනපෑතිස් රජුට පැහැදිලි කර දෙන ආකාරයයි. මෙහිදී අපට මහා විහාරයේ මූලික සැලැස්ම හඳුනාගත හැකි ය (එම:58).

ක්‍රි.ව. පස් වැනි ශත වර්ෂයේ ලියවුණු පාලි අටුවාවල සඳහන් වන මහා විහාරය යන වචනය අනුරාධපුරයේ මහා විහාරයට මුත් අන් කිසිම ස්ථානයකට යොදා නැත. මහා විහාරයේ වාසයකරන භික්ෂූන් මහා විහාර වාසීන් වශයෙන් හැඳින්විත. මුල් කාලයේ විසූ සියලු ම භික්ෂූන් කොතැනක විසූව ද අනුරාධපුරයේ මහා විහාරයට ආගමික වශයෙන් සම්බන්ධ විය. ක්‍රි.පූ. පළමු වැනි ශත වර්ෂයේ අභයගිරියත් ක්‍රි.ව. තුන් වැනි ශත වර්ෂයේ ජේතවනයත් ඇති වීමෙන් පසු සංඝයාගේ සමඟිය බිඳී අනෙක් නිකාය ද පහළ විය. ක්‍රි.ව. පස් වැනි සියවසේ දී බුද්ධඝෝෂ



හිමියන් පාලි අටුවාවල මහා විහාරය යන්නෙන් අදහස් කළේ එය අභයගිරියෙන් හා ජේතවනයෙන් වෙන්කර පෙන්වීමට ය. මහා විහාර වාසීන් යනුවෙන් අදහස් කළේ මහා විහාරයේ විසූවන් පමණි. එහෙත් පසු ව කොතැනක විසූවත් මහා විහාරයට සම්බන්ධකම් ඇති සියලු ම භික්ෂූන් මේ ව්‍යවහරයට ඇතුලත් වූහ (එම:316).

පසු අවධියේ දී අනුරාධපුරයෙහි තිබූ මහා විහාරයට පමණක් මහා විහාර යන නම නොයෙදිණි. ක්‍රි.ව. දස වැනි සියවසේ දී පමණ අනුරාධපුර රාජධානිය අවුල් වියවුල් වූ කාලයේ ලංකාවේ අනෙක් පළාත්වල ද මහා විහාර යනුවෙන් සඳහන් විහාර තිබුණි. පස් වැනි දප්පුල (ක්‍රි.ව. 923 - 934) රජුගේ සවැනි අවුරුද්දේ සඳහන් වන කතරගම සෙල්ලිපියේ මහා විහාරය යන වචනය සඳහන් වේ. නිසැක ව ම මෙයින් අදහස් කරන්නට ඇත්තේ තිස්සමහාරාමයයි. රසවාහිනියට අනුව අරියගාලතිස්ස නම් මිනිසෙක් භික්ෂූන්ට ආරාධනා කිරීමට රෝහණයේ මහා විහාරයට ගොස් ඇත. මෙය බොහෝ විට තිස්සමහාරාමය විය හැකි ය. නව වැනි ශතවර්ෂයට අයත් මන්නාරම් කච්චේරියේ ඇති ටැම්ලිපියක මහා විහාරයේ බහදුරුසෙන් පියංගල නම් ආරාමයකට දුන් පූජා ගැන සඳහන් වේ (*Ez*,vol.III:103). කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි කෝරලයේ ගොන්නෑව දේවාලයේ තිබෙන දස වැනි ශත වර්ෂයට අයත් ටැම් ලිපියක මහා විහාරයේ ඇති ඉඩමක් ගැන ද සඳහන් වේ (*Ez*,vol.IV:188-89). මේ ටැම් ලිපිවල දැක්වෙන මහා විහාර යන වචනයෙන් ගැනෙන්නේ මහා විහාරය ද අනුරාධපුරයේ මුල් ස්ථානයට අයත් ඇතැම් ප්‍රාදේශික විහාරයන් ද නොඑසේ නම් ඒ ඒ පළාත්වල මහා විහාර නමින් හැඳින්වුන විහාරයක් දැයි නිශ්චිත ව ම අපි නො දනිමු. මහා විහාර යන ප්‍රසිද්ධ නාමය ප්‍රාදේශික ආරාමයක් හැඳින්වීමෙන් පසු ව යොදා ගන්නට ඇත (රාහුල, 1989:317).

මහා විහාර යන විහාරාරාම වර්ගය ක්‍රි.ව. තුන් වැනි සියවස සිට ක්‍රි.ව. නව වැනි සියවස දක්වා කාලය තුළ දී විවිධ වචනාර්ථවලින් යුක්ත ව භාවිත වී ඇත. කෙසේ වෙතත් ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වන තොරතුරු අනුව මහා විහාර යන්න මුලින් ම භාවිත කර ඇත්තේ අනුරාධපුර මහා විහාරයට බව පැහැදිලි වේ. එබැවින්

එම ව්‍යවහාරය අනුගමනය කර සැලසුම්ගත විහාරාරාම පසු ව මහා විහාර යන සම්ප්‍රදායට තැනුණ වෙහෙර ලෙස ව්‍යවහර වූ බව උපකල්පනය කළ හැකි ය.

මහා විහාරයේ ගොඩනැගිලි ස්ථානගත කිරීම පිළිබඳ ව ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් තොරතුරු පිළිබඳ ව අධ්‍යයනයක යෙදෙන සේනක බණ්ඩාරණායක එම විහාර සැලැස්මේ සමහර ගොඩනැගිලි ස්ථානගත වීම පිළිගත හැකි බවත්, මහාථූපය හා ලෝහප්‍රාසාද යන ගොඩනැගිලි පිහිටීම පිළිබඳ ඓතිහාසික තොරතුරු එකිනෙකට සම්බන්ධතාවයක් නොදැක්වෙන බව ද සඳහන් කර තිබේ. (Bandaranayake, 1974:47- 48) කෙසේ වෙතත් විවිධ විද්වතුන්ගේ අදහස් සියල්ල සැළකිල්ලට ගැනීමෙන් මෙම විහාර සැලැස්ම අධ්‍යයනය කිරීම ඉතා ම වැදගත් වේ.

දස වැනි සියවසේ දී රචිත යයි සැළකෙන මහා බෝධිවංසයේ තොරතුරු අනුව මහා විහාරයේ සැලැස්ම සිංහ වික්‍රාන්ත නම් සැලැස්මක් අනුව ඉදිකරන ලද බව සඳහන් වේ. (මබෝව,86) එමෙන් ම අන්තර්ගතයෙන් ද මහායාන ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයක් වූ මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ දැක්වෙන විහාරාරාම වර්ග විසි හතරින් එකක් වන සිංහාරාම විහාරාම සැලැස්මට මහා විහාරය අයත් වන බව එහි විස්තර අනුව පෙනේ. (*Mvs*:230 -32). සිංහ වික්‍රාන්ති ශෛලිය පිළිබඳ විස්තර කරන දහහතර වැනි සියවසේ රචිත ග්‍රන්ථයක් වන සද්ධර්මාලංකාරයේ දක්වා ඇති විස්තරය අනුව මෙම සැලැස්ම උතුරු දෙසට හැරුණු සිංහයෙකුගේ වලිගය දිගු කරගත් පා නොසරි ලෙස ඉදිරියට පිහිටුවා තබා දක්ෂිණ පාර්ශවයෙන් ආපසු බලා සිටින්නා වැනි යයි දක්වා ඇත. (සද්ලං,448). සිංහ වික්‍රාන්ත සැලැස්ම සිංහල බෝධිවංසයේ විස්තර කර දක්වා ඇත්තේ යම් සේ සිංහයාගේ වාලාධි කෙළවර වැදහොත් තෙන මහා බෝධිගෙය වේ ද, දකුණු පය පිහිටි තෙන මහා ප්‍රාසාදය වේ ද, වම්පය පිහිටි තෙන සන්නිපාත ශාලාව පිහිටියේ ද, නාභි ස්ථානයේ ධාතුගෙය වේ ද, වම් ඇළයේ රංසි මාලකය වේ ද, දකුණත පිහිටි තෙන චෛත්‍යය වේ ද, ග්‍රීවය පිහිටි තෙන කණ්ඨක නම් පුෂ්කරණීය වේ ද පෙරළා දකුණැලයෙන් බලන්නා හූ ඒ දෘෂ්ඨිය හුණු තෙන පිළිම ගෙය වේ ද, එපරිද්දෙන් සිංහ වික්‍රීඩිත යනුවෙනි (සිංබෝව,209-210).



ඉහතින් සඳහන් කරන ලද සිංහ වික්‍රාන්ත/සිංහ වික්‍රිඩිත සැලස්ම පිළිබඳ විවිධ මතවාද පවතින බව උගතුන් දක්වා ඇති අදහස් අනුව පෙනේ. මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ දැක්වෙන විහාරාරාම වර්ග 24 න් එකක් වන සිංහ වික්‍රාන්ත විහාර වින්‍යාසයන් මෙම පශ්චාත් සිංහ වික්‍රාන්ත නිර්මාණ සැලැස්මත් අතර පෙනෙන සම අසමතාවයන් එය සකසා ප්‍රකාශයට පත්කළ වෝල්ටර් මාරසිංහ විසින් පැහැදිලි කර ඇත. සිංහාරාම වින්‍යාසයේ ප්‍රධාන ද්වාරය බටහිරිනුත් අනුරාධපුර මහා විහාර නිර්මාණයේ දී එය නැගෙනහිරිනුත් පිහිටා ඇති බව (දොළොස් වැනි චිත්‍රයෙන්) එළි දැක්වේ. එසේ මහා විහාරයේ පිහිටි ගොඩනැගිලි නවයෙන් බෝධිඝරය, ප්‍රාසාද, සන්නිපාත ශාලා, ධාතුඝර, රංසිමාලක, හත්ථශාලා, මහාථූපය මෙන් ම ප්‍රතිමාඝරය ද වැදහොත් සිංහයෙකුගේ අවයව පිහිටි තැන්වලට එක්කිරීම සිංහාරාම ක්‍රමය හා ගැළපෙන බව ද මාරසිංහ පෙන්වාදී ඇත. කෙසේ වුව ද පිළිම ගෙය වැනි විහාර අංගයෙහි ආරම්භය කිසිසේත් එම සැලැස්ම හා සම්බන්ධ කළ නොහැක්කේ ඒවා ක්‍රි.ව දෙ වැනි හෝ තුන් වැනි සියවස්වලට පස ව බිහි වූ ඒවා වන බැවිනි. එබැවින් මෙයින් පැහැදිලි වන්නේ සිංහ වික්‍රීඩිත සැලැස්ම ආදිත ම යුගයේ මහා විහාර ගොඩනැගිලි සැලැස්මට අයත් නොවන බව ය. විශේෂයෙන් පිළිම ගෙය මහායානය මෙරට ව්‍යාප්ත වු පසු ඇති වන අංගයකි. වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ කතුවරයා එම අංගය අතීතයට එකතු කර දැක්වීමට උත්සාහ දරා ඇති බව පැහැදිලි ය (විජයසූරිය,1995:87).

මහා විහාරයේ මෙම ගොඩනැගිලි ඉදිකෙරුණේ කිසියම් සැලැස්මක් අනුව නොවන බව අප දන්නා නමුදු එහි එම ගොඩනැගිලි පිහිටා ඇති ආකාරය මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ විස්තර වන සිංහ වික්‍රාන්ත සැලැස්මට බොහෝ දුරට සමාන වීම අහඹු සිදුවීමක් බව පිළිගැනිමට සිදු වේ (මාරසිංහ,1993:15). මේ යුගයට අයත් තවත් සිංහල සම්භාව්‍ය ග්‍රන්ථයක් වූ සද්ධර්මරත්නාකරයේ මහා විහාරය සිංහ වික්‍රාන්ත සැලැස්මට අනුව නිර්මාණය කරන ලද්දේ දුටුගැමුණු රජතුමා විසින් බව දක්වා තිබේ (සද්රත්,409). එය පිළිගත නොහැකි කරුණක් වන්නේ මහා විහාරය දේවානම්පියතිස්ස රජු විසින් ආරම්භ කිරීමෙන් පසු ව සංවර්ධනය වන ආරාමයක් බැවිනි.

ආරාමයක පවතින අංග අතර, අවශ්‍ය ම ගොඩනැගිල්ලක් ලෙස මේ වනවිට නොපිළිගැනුණ ධාතුඝරය එම විහාරයෙන් ඉවත් කර තිබුණි. ථූපය වෙනුවට කණ්ඨක ස්තූපය යොදා තිබීමත් සැළකිල්ලට ගැනීමේදී. ලක්දිව බිහිවූ ප්‍රථම ආරාමය පිළිබඳ අපට හමුවන මුල් ම මූලාශ්‍රය මෙය වෙයි. එය කිසියම් සැලැස්මකට අනුව ගොඩනැගුණු බවක් හගවන්නට යත්න දරා ඇතත් ඒ තරම් ඈත අතීතයේ  දී දෙවනපෑතිස්  රජු හෝ දුටුගැමුණු රජු මෙවැනි ශිල්ප ශාස්ත්‍ර ශ්‍රැතියක් පිළිබඳ ව දැනසිටියේ ද යන්න සැක සහිත ය. එසේ හෙයින් මහා බෝධිවංසයේ එන විස්තරය අනුව විමර්ශනය කරන විට පැහැදිලි වන්නේ ඒ වනවිට ස්ථාපිත ව තිබුණු විහාර කර්මාන්තයක් සම්බන්ධ සැලැස්මට විද්‍යාත්මක පදනමක් ආරෝපණය කිරීමට එවකට සාහිත්‍ය ප්‍රභවයන් තුළින් දැරූ උත්සාහයක් ලෙස මෙය හැඳින්විය හැකි බව ය (මාරසිංහ,1989:15).

අනුරාධපුරය හා ඒ අවට බිහිවී අට වැනි සියවසේ දී පමණක් පූර්ණ වර්ධනයට පත් වූ ආරාම ප්‍රභේද සතර අතුරින් මහා විහාරය, මිරිසවැටි විහාරය  අභයගිරිය, දක්ෂිණ විහාරය හා ජේතවනාරාමය මගින් නියෝජනය වන ක්‍රමයෙන් වර්ධනය වූ ආරාම විශේෂය අනුරාධපුරයේ හා ලංකාවේ බිහිවන පැරණිතම ආරාම ප්‍රභේදය වේ. ඒවායේ ප්‍රභවය ක්‍රි.පූ. තුන් වැනි සියවස තරම් ඈතට දිවයයි. මෙම ආරාම ප්‍රභේද ස්තූප, බෝධි, බෝධිඝර, උපෝසතඝර හා තරමක් පමාවී එම ගොඩට එකතු වූ ප්‍රතිමාඝර යන ගොඩනැගිලි සතර ආශ්‍රය කර බිහි වුව ද ඒවා කලින් සකස් කරන ලද සැලැස්මක් අනුව නිර්මාණය වූයේ දැයි කීම විද්වතුන්හට හා පුරාවිද්‍යාඥයන්ට දුෂ්කර වී ඇත (එම:14). මහාබෝධිවංසය නම් පාලි කෘතියෙහි හා සද්ධර්මාලංකාරය නම් සම්භාව්‍ය සිංහල කෘතියේ මහා විහාරය නිර්මාණය කරන ලද්දේ දෙවනපෑතිස්  රජුගේ අණ පරිදි සිංහ වික්‍රාන්ත සැලැස්මක් අනුව යයි සඳහන් වේ. මෙම සිංහ වික්‍රාන්ත සැලැස්ම මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර ග්‍රන්ථයේ දැක්වෙන සූවිසි ආරාම ප්‍රභේදවලින් එකකි. ඉහත ග්‍රන්ථ දෙකේ දැක්වෙන විස්තර අනුව සිංහ වික්‍රාන්ත සැලැස්ම මනඃකල්පිත සිංහයකුගේ ඉරියව් අනුව ප්‍රධාන ගොඩනැගිලි පිහිටියා වූ සැලැස්ම මත සකස් කරන ලද්දක් බව පෙනීයයි (එම:14-15).



සිංහ වික්‍රාන්ත සැලසුම තුළ මිහිඳු හිමියන් පෙන්වා දුන් ස්ථාන හතෙන් සමහර ඒවා ඇතුළත් ව නැති අතර, මෙය අවුල් සහගත කරුණකි. මෙය පසුකාලීන ගත්කතුවරුන් මහා විහාරයේ සැලැස්මට සිංහ යන්න ඈඳා ගැනීම සිංහලයා සිංහයා ගෙන් උපන් බව පෙන්වීමට සිංහ කොඩිය නිර්මාණය කිරිම වැනි වැඩකි (හෙට්ටිආරච්චි, 1996:56). එසේ ම මිහිඳු මා හිමි දේවානම්පියතිස්ස රජුට ඒ ඒ ගොැඩනැගිලි ස්ථානගත විය යුතු තැන් පෙන්වා දෙන්නේ ක්‍රි.පූ. තුන් වැනි සියවසේ දී පමණ වේ. සද්ධර්මරත්නාකතරයෙහි මහා විහාරය සිංහ වික්‍රාන්ත සැලැස්මට නිර්මාණය කළ පුද්ගලයා ලෙස දක්වන්නේ දුටුගැමුණු රජතුමා ය (සද්ර,358). එබැවින් මහා විහාරයේ මුල් සැලැස්ම සිංහ වික්‍රාන්ත නම් සැලසුමකට තිබුණේ දැයි යන්න පිළිබඳ ව ගැටළුවක් පැන නැගේ. ඒ අනුව පෙන්වාදිය හැකිකේ ලක්දිව බිහි වූ ප්‍රථම විහාරාරාම පිළිබඳ මූලාශ්‍රයවල සඳහන් කරුණු මගින් පිළිගත් විහාර සැලසුමකට මහා විහාර සැලසුම ගොඩනැගීමට යත්න දරා ඇති බවයි. නමුත් මහා විහාරයේ සැලැස්ම බොහෝ දුරට විහාරය සංවර්ධනය වීම සමඟ අනුරාධපුර රාජධානි සමය තුළදී විවිධ රජ දරුවන් එකතු කරන ලද වාස්තුවිද්‍යා නිර්මාණ ඔසසේ සංවර්ධනයට ලක් වී ඇති වූවක් යයි පිළිගැනීම වඩාත් තර්කානුකූල වේ.

මහා විහාරය බිහිවීමෙන් අනතුරු ව අවුරුදු 217 යි මාස 10 ක් දින 10 ක් ගිය තැන අභයගිරි විහාරය පිහිටුවා ගන්නා ලදී (වික්‍රමගමගේ,1995:111) එම විහාරයේ නිර්මාතෘවරයා ලෙස මහාවංසයේ සඳහන් වන්නේ ක්‍රි.පූ. 89 දී ලංකාවේ රජ පැමිණි වට්ටගාමිණී අභය රජු ය (මව,33:34-35) වංසකතාවන්ට අනුව අභයාරාම (දීව:22:14) අභයුත්තර (මව,35:119). උත්තර විහාර (මවටී.,1) යනුවෙන් ද ශිලාලේඛනවල අභයගිරි විහාර (*Ez*,vol.I:154) වශයෙන් ද හඳුන්වා ඇත. වංසකතාවේ සඳහන් වන ආකාරයට වට්ටගාමිණී අභය රජු, සතුරන්ට බියේ ගිරි නිගන්ඨාරාමය ඉදිරියෙන් පලා යද්දී එහි විසූ නිඝන්ඨයා ඔහු පලායන බව හඬනගා කියා ඇත (මව,33:45, දීව.,22:83). අවුරුදු 14 ක් වන ගත ව සිට සතුරන් නසා රාජ්‍යත්වයට පත් වූ වට්ටගාමිණී අභය රජු ගිරි නිගන්ඨාරාමය විනාශ කර එහි අභයගිරි විහාරය

කරවා සැඟ ව සිටි කාලයේදී තමන්ට උදව් උපකර කළ කුපික්කල මහා තිස්ස හිමියන්ට පූජා කරන ලද බව මහාවංසයේ සඳහන් වේ (මව,33:83-84, දීව,19:14-17). වට්ටගාමිණී අභය රජු බලයෙන් පහ ව සිටි කාලයේ ඔහුට උපකාර කළ මහා තිස්ස හිමිට චෝදනා කර උන්වහන්සේ මහා විහාරයෙන් නෙරපා ඇත (මව,33:96). එම තත්ත්වය මත මහා විහාර වාසී භික්ෂූන් 500 ක් සමඟ මහා තිස්ස තෙරුන් අභයගිරි විහාරයේ පදිංචි වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ (වික්‍රමගමගේ,1995:112). පසු කලෙක විවිධ රජ දරුවන් යටතේ සංවර්ධනයට ලක්වූ අභයගිරි ව්‍යවහාරය මහා විහාරයට වඩා මුල් තැන ගත් බව පෙනේ.

මේ ආකාරයට මහා විහාරයෙන් කැඩී ගිය භික්ෂූන් වහන්සේලා විසින් අභයගිරි විහාරය ඇරඹීම සමඟ මහා විහාර සම්ප්‍රදායේ තවත් විහාරයක් අනුරාධපුරයේ බිහි වූ බව පෙනේ. ප්‍රමාණයෙන් මෙන් ම විශාලත්වයෙන් ද අභයගිරි විහාරය මහා විහාරය මෙන් විශාල විහාර කර්මාන්තයක් බව පෙනේ. මෙයට පසුව ක්‍රි.ව. 276 - 303 අතර කාලයේ මහාසේන රජු විසින් ජේතවනාරාම විහාරය අරඹන ලදි (මව,37:33-34). මෙම විහාරය මහා විහාර සීමාව උල්ලංඝණය කර ඉදි වූ විහාරයක් වන අතර සාගලීය නිකායේ තිස්ස තෙරුන්ට එම විහාරය පූජාකර ඇත (මව,37-38). ජේතවනාරාමය බිහිවීමත් සමඟ ම මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය යනුවෙන් විශාල විහාරාරාම තුනක් ඉදි වූ අතර මෙම විහාරවල ඉදි වූ ගොඩනැගිලිවල ආකාරය හා එහි සැලැස්මේ ස්වභාවයන් අනුව මහා විහාර සම්ප්‍රදායේ විහාරයන් ලෙස හඳුන්වන ලදී. මහා විහාර සැලසුම් නිර්මාණ අතර සෑම විහාරයක ම සුවිසල් ස්තූපය එහි කේන්ද්‍රීය ලක්ෂණ කරගත් පැහැදිලි ආරාම සැලැස්මකි. ස්තූපය වටා පිහිටි භූමිය මනා ව සැලසුම් කර පරිවෘත්තයක පිහිටන සේ අංගන මාලාවකට බෙදා ඇත. ස්තූපයට මුහුණ ලා දොරටු හතර පැත්තට විහිදී යන අතර ඉහත දැක්වූ පරිදි සැලසුම් කළ අංගනයන් තුළ වූ විවිධ වූ උපයෝගීතාවයන් මුල්කර ගනිමින් වාස්තුවිද්‍යාත්මක අංග ස්ථානගත කර තිබේ. ඒවා අතර



1. බෝධි ගෘහය
2. උපෝසථඝරය
3. සන්නිපාත ශාලාව
4. පිළිම ගෙය
5. ධර්ම ශාලාව
6. දාන ශාලාව
7. ලැගුම් ගෙවල්
8. ජන්තාඝර දැකගත හැකි ය(සිල්වා, 1995:298).

මහා විහාරය බිහිකිරීමේ දී මහා මහින්ද මහරහතන් වහන්සේගේ සමයේ දී ස්තූපය කේන්ද්‍ර නොවූ අතර අනෙකුත් ඉදි වූ ගොඩනැගිලිවලට ස්තූපය පසු ව එක්කර ඇත (Wijesooriya,1998:49). නමුත් සියවස් කිහිපයකට පසුව ඉදිකරන ලද මහා විහාර සම්ප්‍රදායේ විහාරවල මුලින් ස්තූපය ඉදිකර එය වටා අනෙකුත් ගොඩනැගිලි ඉදි කර ඇත. මෙම විහාරය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි ලෙස ම විහාරයේ කේන්ද්‍රය ස්තූපය වී තිබේ (*ibid*:49). මහා විහාර සම්ප්‍රදායේ විහාරවල ස්තූපය (කේන්ද්‍රස්ථානය) වටා පූජනීය හා නේවාසික අංග ඉදිවීම පැහැදිලි ව ම දැකගත හැකි වේ (Bandarnayake,1974:49). මහා විහාර මූලික සැලැස්මක මුඛ්‍ය අංගය වන උස් ව නැගී සිටින ස්තූපය සුවිසල් නිර්මාණයකි. අක්කර දහයක් පහළවක් තරම් භූමි ප්‍රදේශයක් ඊට අයත් වේ. අනුරාධපුරයේ විශාලතම ආරාමවල සුවිසල් ස්තූපයන් බුබුලාකාර හෝ ධාන්‍යාකාර ආකෘතියෙන් ඉදි කරන ලදී. ගණිත ශාස්ත්‍රය අනුව පැහැදිලි කිරීමේ දි ඒවා පරාවලයාකාර චක්‍රයක් ගනී. මේ වක්‍ර ඒවයේ දර්පණ ප්‍රතිබිම්බයට විස්තාරණ වුවොත් එයින් සෑදෙන ගෝලාකාර හැඩය විශ්වයේ හමුවන ස්වාභාවික ආකෘති සමඟ මනා ව ගැළපෙන බවට විද්‍යානුකූල ව නිරීක්ෂණය කර ඇත (සිල්වා,1995:299).

## 3.1 ජේතවනාරාම විහාර සැලැස්ම

ජේතවනාරාමය ස්තූපය හා ආරාමය ක්‍රි.ව. 276 - 303 ලංකාවේ රජ පැමිණි මහාසේන රජුගේ නිර්මාණයකි (මව,37:1-6). නිකාය සංග්‍රහයට අනුව ජේතවනාරාම ස්තූපය මහා විහාර සීමාව ඇතුළත මහසෙන් රජු ඉදිකළ බව සඳහන් වේ (නිස,15). සද්ධර්මරත්නාකරය අනුව ද මෙම විහාරය මහසෙන් රජු කරවූ බව මෙසේ සඳහන් වේ.

"එකළ මහසෙන් රජ ......................

සීමාව ඇතුළත දෙනා වෙහෙර කරවා කොහොන්තිස්ස

මහ තෙරුන්ට දන්දින" (සද්ර,30-7)

ඓතිහාසික මූලාශ්‍රය තොරතුරුවල සඳහන් වන ආකාරයට ජේතවනාරාමය මහසෙන් රජු කරවූ විහාරයක් බව පිළිගත හැකි ය. මේ සම්බන්ධ ව ඇති පුරාවිද්‍යාත්මක සාධක අතර, අභිලේඛන සාධක ද වැදගත් වේ. මීට සියවසකට පමණ පෙර ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා වශයෙන් පත් වූ එච්.සී.පී. බෙල් ජේතවනාරාම ස්තූපයේ දකුණු පස පිහිටි බෞද්ධ ගල් ගරාදි වැට වශයෙන් හඳුන්වනු ලබන ස්මාරක පිහිටි ප්‍රදේශයේ කරනු ලැබූ ගවේෂණයක දී කිරිගරුඬ වැනි පාෂාණ විශේෂයකින් නිමවා තිබූ ලිපියක් සොයා ගන්නා ලදී. උවමනාවෙන් ම විකෘති කරන ලද බව පෙනෙන මෙම ලිපියේ සමහර කොටස් කියවිය නොහැකි වන සේ කඩා බිඳ දමා තිබිණ. මෙම ලිපිය මුලින් ඩී.එම්.ඩී. ඉසැඩ් වික්‍රමසිංහ විසින් පිටපත් කර කියවා ඇත (*Ez*,vol.IV:273). ඔහු විසින් පේළි අටක් කියවා ඇති අතර, ඉතිරි ව ඇති සියලු ම අක්ෂර පේළිවලින් හෙළි වන්නේ එම ලිපිය නිසැක වශයෙන් ම ක්‍රි.ව තුන් වැනි සියවසේ අවසාන භාගයට අයත් වන බව ය (*ibid*: 275). ලිපියේ සඳහන් පෙළ මෙසේ ය.

1. ............ හ පදමක අවනක පනකය බිතු - සගනය -
2. .............. අතරෙහි ගතිය හමනක මහ අවන බෙවින් න
3. .....මහ - අවසහි ගතිය හමනකව සව සග
4. ...... අවන කන පි ච නන - මගිනි පවෙ (න න) .......... ස-



5. ............. ක - ම ග - කර - වය (තුදල) තුතුලකඹ පොතොහි ලි
6. ........... චි(ච)ත - පහනෙනිච බිකු - සඟහි ච තුම හි ච හද නෙවි
7. .......... (ෂ) තජ ලයිනක පොතජ පච - මහ අවසහි ජ ච
8. .......... නත අනනු බව කරන කෙනනක පදි අලුවල කරනක
9. ......... (න) තට ෂ තුමහට ෂ වෙඪ ඉවනක රජ - කෙනෙක වරත යමෙ
10. ......... (වි) වනක අවෙය තුමනට පුනී වඩනක - කර - තුම - කිවෙය මෙ(කි)
11. .......අබගිරි - මහ විහරෙහි

එම පෙළෙහි සිංහල තේරුම

1. ............ පළමු වැන්නෙහි ප්‍රකාශිත ය ................ භික්ෂු සංඝයා අතරෙ හි
2. ............... අයත් භික්ෂු නානා මත ගත් බැවින්
3. ............... මහා ආවාසයන්හි භික්ෂු සංඝයා ද
4. .................... තරවටු කතරනු ලැබූ නමුදු නානා මාර්ගයෙන් - පච්කරන - නානා
5. ................ මාර්ගය ඇති කරවන (එනම් පෙන්වාදෙන) වයතු දළය පොත්වල ලියා
6. ............... තම සිත් පහදා ගෙන - භික්ෂු සංඝයා කෙරෙහි ද හද ඇතිව
7. ..................... අර්ථය ද ලියන ලද පොත් ද විවරණය කරමින් - පංච මහා ආවාසයන්හි ද.
8. ................... ඔවුනොවුන් අතරෙහි කළබල ඇති කරන්නන් කෙරෙහි ද
9. .................... යමෙක් (අනුන්ට) තමන්ට ද රජ කැමැති රජකුගේ වාරයේ
10. ................. සිය පින වර්ධනය කරන සිය යුතුකම්
11. ............. අභයගිරි මහා - මහා විහාරයෙහි ................ වශයෙන් දක්වා ඇත (*ibid*:282).

මෙම ලිපියෙන් ප්‍රකාශ කර ඇත්තේ පංච මහා ආවාසයන්හි භික්ෂූන්ට දෝෂාරෝපණයකි. රාජාඥාවක් බව පැහැදිලි ව ම ඉතිරි ව තිබෙන වැකිවලින් ප්‍රකාශ වන මෙම ලිපියේ බොහෝ කොටස් විනාශ වී තිබෙන හෙයින් ආඥාව නිකුත් කළ රජුගේ නම කියවා ගත නොහැකි ය. නමුත් අක්ෂර අනුසාරයෙන් ගත හැකි කාලනිර්ණය අනුව එය ක්‍රි.ව. තුන් වැනි සියවස අවසාන භාගයට හෝ ක්‍රි.ව. හතර වැනි සියවස මුල් භාගයට අයත් යයි උපකල්පනය කළ හැකි ය. මේ කාල වකවානුව මහසෙන් රජුගේ රාජකාලයට අයත් වේ (*Ez*,vol.IV: 247 -275).

කිරිගරුඬ වැනි පාෂාණයෙන් කරන ලද ලිපියේ අන්තර්ගත කරුණු අනුව එය මහාසේන රජුගේ කාලයට අයත් විය හැකි බව මූලාශ්‍රය අධ්‍යයනයේ දී පෙනේ. එහි එන **වයතුදලක** යන වචනය මගින් අන්තර්ගත වන්නේ වෛතුල්‍ය යන අර්ථය බව පෙනේ. නිකාය සංග්‍රහයට අනුව අභයගිරි වාසීන් වෛතුල්‍යවාදීන් ලෙස හඳුන්වා ඇත (නිස,12). තව දුරටත් නිකාය සංග්‍රහයේ අදහස් විමසන විට අභයගිරි වෛතුල්‍ය වාදයෙන් හෙබි ධම්මරුචි නිකායෙන් බිඳුණු උස්සිලියා තිස්ස නම් මහ තෙර කෙනෙකු දකුණු ගිරි වෙහෙරට ගොස් ඇත (එම,12). ඔවුන් අතුරින් සාගල නම් මහ තෙර කෙනෙක් එහි ම හිඳ ආගම වාඛයාත කළහ. එතැන් පටන් ඔවුන් අතර එහි වසන භික්ෂූහු එම නමින් සාගලීය නම් වූහ. මෙසේ සාගලීය නම් නිකාය බුදුන් පිරිනිවී සත්සිය වස් අනු අවුරුද්දක් ගිය පසු ගොළු අබා රජු දවස ධම්මරුචි නිකායෙන් භින්න ව දකුණු ගිරි වෙහෙර සඤ්ජාත විය. පසු ව මහසෙන් රජු දවස දෙනානක වෙහෙර ව්‍යාප්ත විය. ලංකා ඉතිහාසායේ පළමු වරට වෝහාරික තිස්ස රජුගේ කාලයේදී වේතුල්ල හෙවත් වෛතුල්‍ය නම් අලුත් නිකායක් ගැන අසන්නට ලැබේ.

"වෙතුල්ලවාදං මද්දිත්වා කාරෙත්වා පාප නිග්ගහං
කලිලෙන අමච්චේන සාසනං ජෝතයිථ සො"
(මව,36-41)

මහාවංසයේ සඳහන් වන ආකාරයට වෝහාරිකතිස්ස රජු දවස ධම්මරුචි නම් වූ අභයගිරි වාසිහු ශාසනය නසනු පිණිස මහණ වෙස්ගත් වෛතුල්‍ය නම් තීර්තක බ්‍රාහ්මණයන් විසින්



වෛතුල්‍ය පිටකය ගෙන බුදුන් වදාළ ධර්මය මේ යැයි දැන්වූහ. ථේරීය නිකාය භික්ෂූන් එය අධර්මය බව පවසා ඇත. එබස් ඇසූ රජු කපිල ඇමති ගෙන්වා එය විනිශ්චය කර බුද්ධ භාෂිත නොවන බව පවසා එම වෛතුල්‍යවාදී ග්‍රන්ථය පුළුස්සා පාප භික්ෂූන්ට නිග්‍රහ කළ බව මහාවංසටීකාවේ හා නිකාය සංග්‍රහයේ ද සඳහන් වේ (මවටී.,535, නිස,12). අභයගිරිවාසීන් ධර්ම රුචිකයන්ටත් වඩා අභිධර්මවාදීන් හැටියට ගැණුනු මේ වෛතුල්‍යවාදීහු කවරෙකු දැයි ඔවුන්ගේ ධර්මය කෙබඳු දැයි දැනගැනීමට වංසකතාවලින් කිසිම පිහිටක් නොලැබේ (රාහුල,1989:91).

වෛතුල්‍යවාදයට **මහසුඤ්ඤවාදී** යන නම ද ව්‍යවහාර වුණු බව බුද්ධඝෝෂාර්යයෝ සඳහන් කර තිබේ. ඔවුන්ගේ වාදය මෙසේ ය. බුදුහු තුසිත දෙව්ලෙවෙහි ඉපිද එහි ම වැඩවසන විනා කිසි ම කලෙක මිනිස් ලොව පහළ නොවෙති. ලෝකයා අතර පහළ වන්නේ, බුදුන් ම නොව නිර්මිත රූප නාම මාත්‍රයක් පමණි. මේ නිර්මිත රූපයෙන් ඉගෙන ගත් ආනන්ද ස්ථවිරයෝ දෙදෙන ධර්මය දේශනා කළෝ ය. බුදු දහම දේශනා නොකළහු ය. තව ද මේ වාදයේ හැටියට බුදුහු කිසිම දෙයක් පරිභෝග නොකරත් උන්වහන්සේ ලෝකානුවර්ණය පිණිස පූජා පිළිග න්නා බවක් අඟවනවා පමණි. එබැවින් උන්වහන්සේට දෙන දෙයක් උපකාරයක් නොවන බැවින් ඵලක් ද නොවේ. එසේ ම ඔවුන්ගේ වාදයේ හැටියට පරිසමාප්ත අර්ථයෙන් ගැනෙන විට සංඝයා යනු මාර්ග ඵල පමණි. මාර්ග ඵලයෙන් බැහැර සංඝයෙක් නොමැත. එහෙත් මාර්ග ඵල කිසිවක් පිළිගන්නේ නැත. එබැවින් සංඝයා දක්ෂිණා පිළිගන්නැයි හෝ දක්ෂිණාව පිරිසිදු කරතැයි හෝ කීම වැරදි ය. එබැවින් සංඝයාට දියහැකි කිසිවක් නැත. සංඝයාට දෙන ලද කිසිවක් ඵලක් නොවේ. ඕනෑ ම ස්ත්‍රී පුරුෂ දෙදෙනෙකු අන්‍යෝන්‍ය කැමැත්තෙන් කාම සම්භයෝගයෙහි යෙදීම වරදක් නොවේ යයි ඔවුන්ගේ වාදයයි (එම:91-92). මහාවංසයට වඩා පැරණි දීපවංසයේ වෛතුල්‍යවාදය **විතාන්ඩවාදී** යන අර්ථයෙන් දක්වා තිබේ (දීව.,22:41- 42).

පාලි අට්ඨකතාවල ද ඉඳහිට විතන්ඩවාදීන් ගැන සඳහන් වේ. මොවුන් කර්මයෙහි විශේෂයෙන් ම අභිධර්මයෙහි සූක්ෂම ස්ථාන පිළිබඳ ව පිළිගත් මතයට වඩා වෙනත් මත දැරූ

ආචාර්යවාදයක් එසේ ම පිළිනොගත් බෞද්ධ නිකායක් විය යුතු ය. විතන්ඩවාදීහු ද, ථේරවාදීහු ද රූපක්ෂයට තම තමන්ගේ මත සනාථ කිරීම පිණිස එක ම පූර්ණාචාර්ය වාදයෙන් පෙළ උපුටා දක්වමින් ත්‍රිපිටකයේ සූත්‍ර දහම් කර කියති. වෙනස ඇති වන්නේ අරුත් බිහිවීමේ දී පමණි (රාහුල,1989:92). වෝහාරිකතිස්ස රජුගේ කාලයේ දී ලංකාවට පැමිණි වෛතුල්‍යවාදීන් ගැන නිකාය සංග්‍රහයේ සඳහන් වීමෙන් ඇඟෙන්නේ ලංකාවට ගෙනෙන ලද මේ වෛතුල්‍ය පිටකය සංස්කෘතයෙන් කරන ලද්දක් බව යි. මහායාන සූත්‍ර සියල්ලක් ම සංස්කෘතයෙන් ලියා ඇති බව ද අපි දනිමු (එම:93).

මහායාන සූත්‍රය ඇඟවීමට බොහෝ විට **වෛතුල්‍ය** පදය ව්‍යවහාර වන නමුදු "වෛතුල්‍ය" පදය ද එසේ ම ව්‍යවහාර වේ. අසංඝ ස්ථවිරයන්ගේ අභිධර්මය සමුච්චයෙහි සඳහන් වන ආකාරයට **වෛපුල්‍ය, වෛදය්‍ය හා වෛතුල්‍ය** යන මේ පද තුනෙන් ම කියවෙන්නේ එක ම අදහසයි. "**වෛතුල්‍ය**" යන්නට උන්වහන්සේ දෙන නිර්වචනය බෝධිසත්ත්ව පිටකය යනුයි. වෛතුල්‍යවාදීහු මහායානිකයෝත් එක ම යැයි යන මේ මතය ගැන සැක කිරීමට හේතුවක් නැතැයි කර්න් හා පරණවිතාන යන දෙදෙනා ම කල්පනා කරති (එම:93). මහාවංස කතෘ "**වෛතුල්‍ය**" පදය පාවිච්චි කිරීමෙන් එක ම විශේෂ බෞද්ධ නිකායක් අදහස් නොකළ බවත් ථේරීය නිකායට ථේරිය මත දැරූ මහා විහාරයට පිළිගත නොහැකි අර්ථකථනය කළ ඕනෑ ම මහායානික නිකායක් අඟවන්නට එම පදය ව්‍යවහාර කළ බවත් පෙනේ (එම,93).

වෛතුල්‍යවාදීන් ලංකාවේ තම ව්‍යාපාරය පවත්වාගෙන ගිය අවධීන් හා ඉන්දියාවේ මහායානා ධර්මයෙහි සංවර්ධන ක්‍රියාදාමය සිදු වූ අවධීන් මෙහිදී සිහිපත් කළ යුතු බව පෙනේ. ක්‍රි.ව. දෙ වැනි ශත වර්ෂයේ දී වෝහාරික තිස්ස රාජ්‍ය කාලයේ අග භාගයේ දී දඹදිව වැජඹුන් නාගාර්ජුණ නම් ශ්‍රේෂ්ඨ මහායානා ආචාර්යවරයාගේ කාලය තුළ මහායාන ලංකාවට පැමිණ ඇත. වෛතුල්‍යවාදීන් හෙවත් මහායානිකයන් ලංකාවේ තම කටයුතුවලට එළඹි සැමවිටදී ම මේ අලුත් නිකායන් සංවිහිත ආයතනයක් හැටියට මර්ධනය කරන ලද අවස්ථා ද ඇත (එම:94). ගෝඨාභය රජ දවස විනිශ්චයක් පවත්වා වෛතුල්‍යවාදින් මැඩ



ඔවුන්ගේ පොත් ගිනිබත් කර ඔවුන්ගේ නායකයන් හැට දෙනෙකු රටින් නෙරපා තිබේ. ඔවුන් පසු ව දකුණු ඉන්දියාවේ කාවේරි පටුනෙහි රැඳී සිටියෝ ය (මව,36:110-112, නිස,1). ලංකාව හැර ගොස් කාවේරි පටුනෙහි විසූ සිංහල භික්ෂූහු සංඝමිත්‍ර නම් භික්ෂුවක් සමඟ ආශ්‍රයට වැටී පසු කලෙක ලංකාවේ මහායානවාදය පැතිරවීමට පුරෝගාමී විය. සංඝමිත්‍ර භික්ෂුව භූත විද්‍යාවේ කෙළ පැමිණියෙකු යැයි මහාවංසයේ සඳහන් වේ (මව,36:113).

ඉන්දියාවේ සිට ලංකාවට පමිණි සංඝමිත්‍ර භික්ෂුව කෙරෙහි පැහැදුණ ගෝඨාභය රජු ඔහුගේ පුතුන් දෙදෙනාට ශිල්ප ඉගැන්වීමට පැවරූ අතර, මොවුන්ගෙන් වැඩිමලා වන ජෙට්ඨතිස්ස රජ වූ තැන ඉන්දියාවට ගොස් ඔවුන්ගෙන් පසු රජ වූ මහසෙන් දවස සංඝමිත්‍ර භික්‍ෂුව පෙරලා ලක්දිවට පැමිණ තිබේ (මව,36:113 0-117, නිස,11-12). තම ශිෂ්‍යයා වූ මහසෙන් රජු තමාගේ මතවාදයට නම්මවා ගත් සංඝමිත්‍ර භික්ෂුව ඔහු ලවා මහවෙහෙරවාසී මහණුන් හා රජු බිඳුවනු ලදී. රජුගේ විධානයෙන් මහවෙහෙරවාසී භික්ෂූන් තම පහර දුන් අයට දඩුවම් පැමිණ වූ අතර, මහා විහාරය අතහැර භික්ෂූන් රුහුණු රටට හා මලය රටට පලාගොස් ඇත. මින් අනතුරු ව රජුගේ සහය ලබාගත් සංඝමිත්‍ර භික්ෂුව ලෝවාමහාපාය ඇතුළු මහා විහාරයෙහි ගොඩනැගිලි බිඳ හෙළා භූමිය සාවා උඳු වපුරන ලද බව මහාවංසයේ සඳහන් වේ(මව,37:1-16, නිස,12-13).

මෙම ඓතිහාසික කරුණු අනුව පැහැදිලි වන්නේ ලංකාවේ වෛතුල්‍යවාදය යන්න ගැන ව්‍යවහාර වී ඇත්තේ එතෙක් ලංකාවේ පැවති ථේරවාදී නිකායට විරුද්ධව ආ කොටසක් සඳහා ය. නිකාය සංග්‍රහය ආදී මූලාශ්‍රය කරුණු අනුව වඩා පැහැදිලි වන්නේ ජේතවනාරාමයේ විසූ සාගලික නිකාය ද වෛතුල්‍යවාදීන් හැටියට හැඳින් වූ බවයි. එසේ නම් ජේතවනාරාම විහාරයේ බෞද්ධ ගල් ගරාදී වැට අසලින් සොයා ගන්නා ලද ලිපියේ සඳහන් **වයතුදල** යන්න වෛතුල්‍ය යන්න සඳහා ක්‍රි.ව. තුන් වැනි සියවසේ අගභාගයේදී භාවිත කළ ප්‍රකාශයක් බව සඳහන් සෙනරත් පරණවිතානගේ මතය පිළිගත හැකි වේ. ඒ අනුව ජේතවනාරාමය මහාසේන රජුගේ නිර්මාණයක් ලෙස පිළිගැනීමට මූලාශ්‍රය හා පුරාවිද්‍යා සාධක පවතින බව පෙන්වාදිය හැකි ය.

එසේ ම වෛතුල්‍යවාදීන් ලංකාවේ තම මතවාදය පවත්වා ගෙන ගිය කාලයත් ඉන්දියාවේ මහායාන ධර්මයේ සංවර්ධන අවධියත් එක් කාලයකට අයත් බව පෙනේ (රාහුල,1989:93). පසුගිය යුගයේ මධ්‍යම සංස්කෘතික අරමුදල (සංස්කෘතික ත්‍රිකෝණය) ජේතවන ව්‍යාපෘතිය මගින් ජේතවන ස්තූපයෙන් දකුණු පෙදෙසෙහි සිදු කරන ලද කැනීම්වලදී පෙර සඳහන් කරන ලද පුවරු ලිපියට සමාන පාෂාණයෙන් නිමවන ලද කැටයම් ගල් කිහිපයක් සොයා ගන්නා ලදී. එය බෙල් විසින් පුවරුලිපිය සොයාගත් ස්ථානය අසලදී සොයා ගනු ලැබූ අතර ලිපියේ කොටසක් කඩා බිඳ දමා තිබූ අයුරින් ම එම කැටයම් කැබළි ද කඩා බිඳ දමා තිබුණි. එහි දැක්වෙන කැටයම්වල ආභාසය ආන්ද්‍ර දේශීය අමරාවතී සම්ප්‍රදාය සිහියට නංවයි (වත්තල,1994:36). ඉහතදී අප සඳහන් කරන ලද මහසෙන් රජුගේ ගුරුවරයා වූ සංඝමිත්‍ර භික්ෂුව ද ආන්ද්‍ර දේශීය භික්ෂුවකි. මහායානය දියුණු වූ අවධියට මෙවැනි කැටයම් හා පාෂාණ ලංකාවට ආනයනය කරන්නට ඇතැයි සිතීම වඩාත් තර්කානුකූල වේ. එය ගල් පුවරු ආන්ද්‍ර දේශයට ආවේණික අමරාවතී කඩප්පා හෙවත් අමරාවතී මාබල් යන හුණුගල් පාෂාණ විශේෂය බව පුරාවිද්‍යාඥයෝ හඳුනාගෙන ඇති අතර, පුවරුලිපිය හා මෙම කැටයම් මගින් සනාථ කරන්නේ මහාසේන රජුගේ කාලයේ දී සිදු වූ ශාසන විලෝපනය පිළිබඳ දක්වන ප්‍රවෘත්තිය වීමට ඇතැයි ද වත්තල අදහස් කරයි (එම).

ජේතවනාරාම ආරාම සංකීර්ණය ගොඩනැගීමට ප්‍රථම මහායාන මතවාදයන් අනුගමනය කරමින් අභයගිරිය ප්‍රතිෂ්ඨාපනය වී ඇත. එය ක්‍රි.ව. පළමු වැනි සියවස තුළදී ආරම්භ වූ බව මූලාශ්‍රය තොරතුරු අනුව පෙනේ (මව,33:84-85). අනුරාධපුර ඇතුළු නුවරට උතුරින් අභයගිරිය පිහිටි හෙයින් එය **උත්තර විහාර, උතුරොද විහාර, අභය උත්තර විහාරය** හා පසු කාලයේදී භයාගිරිය වශයෙන් ද හඳුන්වා තිබේ(කුලතුංග,1998:314). ඉහත විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලබන මෙම විහාරය මුලින් කරවන ලද්දේ වට්ටගාමිණී රජු විසිනි (මව,33:85, නිස,11). එය පිරිවෙණ් 12 කින් යුක්ත විය (මවටී.,33:79). වළගම්බා රජු (ක්‍රි.ව. 89 - 77) විසින් ගිරි නිගන්ඨාරාමය විනාශ කර එම ස්ථානයේ



තමන්ගේ නමත් නිගන්ඨයාගේ නමත් එකතු කර අභයගිරි ස්තූපය හා පිරිවෙණ් දොළසක් නිර්මාණය කරන ලද බව මහාවංසයේ සඳහන් වේ. (මව,33:81). මෙම විහාරය තැනීමෙන් අනතුරු ව එරජු විසින් එය සතුරන්ගෙන් ගැලවී පලා යාමේ දී තමාට උදව් කළ කුපික්කල මහා තිස්ස හිමියන්ට පූජාකර ඇත (මව,33:84, නිස,11).

වළගම්බා අවධියේදී මහා විහාර පාර්ශවයෙන් බිඳී ගිය භික්ෂු පිරිසක් විසින් අභයගිරි නම් නව භික්ෂු පාර්ශවයක් ආරම්භ කළේ ය (මව,33:81). මෙසේ සමාරම්භයේ දී අභයගිරි පාර්ශවය බවට පත් වු මහා විහාරීය භික්ෂු සමූහය තම නේවාසික ස්ථානය වෙනස් කළ ද වත්පිළිවෙත් හා පිළිගත් ධර්මයේ වෙනසක් කළ බවට සාක්ෂ්‍ය නැත (කුලතුංග,1998:314). නිකාය සංග්‍රහයට අනුව අභයගිරි විහාරය ධම්මරුචි නමින් හැඳින්වූ බව පෙනේ (නිස,12). හතර වැනි මිහිඳු රජුගේ අභයගිරි විහාර ලිපියේ ද එහි විසූ භික්ෂූන් අභයගිරිය ධම්මරුචි භික්ෂූන් නමින් හඳුන්වා ඇත (ශිලේසං,II:134-143). නමුත් නිකාය සංග්‍රහයේ සඳහන් වන්නේ ධර්මරුචි නම් අභයගිරි වාසීහු වෛතුල්‍යවාදය ප්‍රචාරය කළ බව ය (නිස,12). වෛතුල්‍යවාදය යනු මහායානික ධර්මයක් ලෙස සැළකේ. නිකාය සංග්‍රහකරු වාර්තා කරන හැටියට එක් එක් අවස්ථාවේ ලංකාවට පැමිණි මහායානික ආචාර්යවරුන්ගේ ධර්මය තත් අභයගිරි වාසීන් විසින් සම්පූර්ණයෙන් පිළිගෙන ඇතැයි සිතනවාට වඩා මධ්‍යස්ථ ලේඛකයන් පෙන්වාදෙන පරිදි අභයගිරි ආයතනය පෙර කී පරිදි ම ථේරවාදී ධර්මයේ පිහිටන අතර, විවිධ රටවලින් පැමිණි විවිධ නිකායින්ට නවාතැන් දෙමින් ඔවුන්ගේ ධර්මයන් ප්‍රකාශ කිරීමට ඉඩ සළසා ඇති බව පෙනේ (ලංවිලඉ,1.1:224). ඉත්සිං නමැති විදේශීය සංචාරකයා අභයගිරියේ මෙන් ම මහා විහාරයේ ද පැවතියේ ථේරවාදයක් බවත් දෙපාර්ශවය ම එක ම ත්‍රිපිටකය හැදෑරු බවත් සඳහන් කර තිබේ (කුලතුංග,1998:315). හත් වැනි සියවසේ දී මෙරටට පැමිණි හියුංසාන් වාර්තා කර ඇති ආකාරයට අභයගිරි වාසීන් හීනයාන මහායාන යන උභයයානයන් ම ඉගෙන ගනිමින් ත්‍රිපිටක ධර්මය ඉතා පෘථුල අන්දමින් ප්‍රචාරයට පත්කළ බව ප්‍රකාශ කර ඇත (වනරතන,1970:112-113).

දඹදිව නාගර්ජුන ස්ථවිරයෝ යටතේ දර්ශවාදය හැදෑරූ අභයගිරියෙහි පදිංචි ව සිටි ආරියදේව භික්ෂුව චතුශ්ශතකය, අක්ෂරශතකය යන බෞද්ධ දර්ශන පිළිබඳ ව ග්‍රන්ථ සංස්කෘත භාෂාවෙන් ලියන ලද බව කියවේ (කුලතුංග,1998:15). පාලකකාරකාදීන්ගේ අනුග්‍රහය වැඩි වැඩියෙන් ලැබීම නිසා අභයගිරි විහාරය නොබෝ කලකින් ම මහා විහාරය අභිබවා යන තරඟකාරී ආයතනයක් බවට පත් ව ඇත (එම,15). චීන ජාතික ෆාහියන් හිමි මෙහි සිටි ක්‍රි.ව. 411 - 413 කාලයේ දී අභයගිරියේ භික්ෂූන් 5000 ක් ද මහා විහාරයේ භික්ෂූන් 3000 ක් ද සිටි බව සඳහන් කර තිබේ. ෆාහියන් හිමියන් විසින් සඳහන් කරන ආකාරයට තමා වෙනත් විදෙස් භික්ෂුවකගේ මහායාන ධර්ම දේශනයකට සවන් දුන් බව ද සඳහන් කර ඇත (ෆාහියන් දේ.වා: 92-97) . එසේ ම ඉන්දියාව, කාශ්මීරය, ජාවා ආදී රටවල් සමඟ සමීප සබඳතාවයක් මේ යුගයේ ඇතිකර ගත් බව ද පෙනේ. එය බෞද්ධ දර්ශනවාදයන් තුළනාත්මක ව අධ්‍යයනය කිරීමට අභයගිරි විහාරය තුළ ඉඩප්‍රස්ථා ලැබුණු බවට නිදසුන් වේ (කුලතුංග,1998:315). මේ ආකාරයට අභයගිරි විහාරය මහායාන මතවාදය පමණක් නොදැරූ විහාරයක් බව ඓතිහාසික කරුණුවලින් ඔප්පු වන අතර, විහාරයේ වාස්තුවිද්‍යා අංග සැලසුම් කිරීමේදී වළගම්බා රජු එවකට ඉදි ව තිබූ මහා විහාරයේ සැලසුම තුළ අඩංගු මූලික ප්‍රභේද පිළිබඳ ව සැලකිල්ලක් දක්වා විහාරබිමේ උපයෝගීතාවය අනුව මූලික වාස්තුවිද්‍යා අංග නිර්මාණය කරන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

විහාර භූමියේ විශාලත්වය හා අභයගිරි විහාරය දිනෙන් දින පාලකකාරකාදීන්ගෙන් ලැබුණු උපදෙස් අනුව විවිධ වාස්තුවිද්‍යා අංග නිර්මාණය වූ බවට ඓතිහාසික පුරාවිද්‍යා මූලාශ්‍රය කරුණු සාක්ෂ්‍ය සපයයි. ඒ අනුව අභයගිරි විහාරයේ වාස්තුවිද්‍යාත්මක සැලැස්ම එකවිට ඇති වූවක් නොව විවිධ අවස්ථාවල වූ දේශපාලන ආගමික හා හා සාමාජීය හේතු පදනමින් සිදු වී ඇති බව පෙනේ. අභයගිරි ආරාම සංකීර්ණය මූලික සැලැස්ම වළගම්බා රජු ගොඩනැංවීමෙන් අනතුරු ව එහි සංවර්ධනය සඳහා විවිධ රජ දරුවන් දායක වී ඇත. වළගම්බා රජු අභයගිරි මහා සෑය බඳවා එහි සතර දොරටුවල ආදිමුඛ නොහොත් තොරන් කරවා



ඇත (මව,35:119). කනිට්ඨතිස්ස රජු (ක්‍රි.ව. 164 - 192) වාහල්කඩ සතර කරවා උත්තර මහා චෛත්‍යයට ප්‍රදානය කර ඇත. ඔහු විසින් රත්න ප්‍රාසාදය, මහා පිරිවෙණ, අභයගිරි ස්තූප පවුරත් කළ බව ද සඳහන් වේ (මව,36,7-9). ක්‍රි.ව. 214 - 236 රජ වූ වෝහාරික තිස්ස රජු ස්තූපයේ ඡත්‍ර කරවා ඇත. එසේ ම මණ්ඩප ද කර ඇත (මව36:32). ක්‍රි.ව. 276 - 303 ලංකාවේ රජ පැමිණි මහාසේන රජ පැදුම් තිස් පව්වෙන් ශෛලමය පිළිමය ගෙන්වා අභයගිරි විහාරයට ගෙන ගොස් පඨිමාඝරයක් තනවා එහි තැන්පත් කර ඇත.

එසේ ම පිළිම ගෙය, බෝධිගෙය, ධාතුශාලාව, දානශාලාව හා හතරැස් ශාලාව යන ගොඩනැගිලි ද තනා ඇත. එම රජුගේ රාජ්‍ය යුගයේ දී අභයගිරි විහාරය දැකුම්කළු ලෙස දක්නට ලැබුණු බව මහාවංසයේ දක්වා ඇත (මව,37:14-16). මොහුට පසු ව රජ වූ මොහුගේ පුත් කිත්සිරි මේඝවණ්න රජු (ක්‍රි.ව. 303 - 331) දන්තධාතුව අභයගිරියට වැඩමවා පූජා පවත්වා ඇත (මව,37:95-96). ක්‍රි.ව. 437 - 455 රජ පැමිණි මිත්‍රසේන රජු ස්තූප ඡත්‍රය අළුත්වැඩියා කර එය වටා වජිර වළල්ලක් තනවා ඇත. එසේ ම එහි මැණික් අල්ලා බදාම වැඩ ද කර ඇත (මව,38:9-10). එසේ ම ධාතුසේන (ක්‍රි.ව. 459 - 476) රජු ද අභයගිරි විහාරය සඳහා බොහෝ පිරියම් කටයුතු ද සලපිළිමයට මන්දිරයක් කළ බව ද මහාවංසයේ සඳහන් වේ (මව,38:61 -62). මෙයට අමතර ව විවිධ රජ දරුවන් ගොඩනගන ලද ගොඩනැගිලි ගැන වංසකතාවල ද සඳහන් වේ. (ක්‍රි.ව. 573 - 575) රජ පැමිණි මහානාග රජු අභයගිරි විහාරයේ මහ පොකුණක් කරවා ඇත (මව,46:28). පළමු වැනි අග්බෝ (ක්‍රි.ව. 575 - 607) තමන් හා බිසවගේ නම එකතු කර දළඅග්බෝ නම් ආවාසය තනා ඇත (මව,42:64). එසේ ම (ක්‍රි.ව. 659 - 667) රජ පැමිණි දෙ වැනි දාඨෝපතිස්ස රජු කපාරා පිරිවෙණ කරවා ඇත (මව,43:28). එසේ ම ක්‍රි.ව. (668 - 682) රජ පැමිණි හතර වැනි අග්බෝ රජු කපාරා පිරිවෙණට ප්‍රාසාදයක් කර ඇත (මව,44:20). පළමු වැනි සේන (ක්‍රි.ව. 833 - 853) කපාරා පිරිවෙණට කුටියක් ද කරවීය. කපාරා පිරිවෙණ් දෙකක් ගැන සෙල්ලිපිවල එයි. මහා කපාරා හා කුඩා කපාරා වශයෙන් ඒ දෙක හඳුන්වන තිබේ. මීට අමතර ව කපාරා මූලයක් ද විය. පළමු වැනි විජයබාහු රජුගේ බිසව එහි

විශාල පයිමාසරයක් කරවා ඇත (වික්‍රමගමගේ,1995:117). එසේ ම මානවම්ම රජු (ක්‍රි.ව. 684 - 718) විසින් ඉදිකරන ලද උත්තර මූල පිරිවෙණක් ගැන සඳහන් වේ. පළමු වැනි සේන රජු මේ සඳහා කුටියක් ද දෙ වැනි සේන රජු මෙයට ප්‍රාසාදයක් ද එක්කර ඇත (එම,118). අභයගිරි ධම්මරුචි භික්ෂූන්ට ආවාස කරවා ඇත (මව,46:01). එරජු දවසෙහි අභයගිරියෙහි මහලේඛ නම් පිරිවෙණ ද නොයෙක් මහල් ඇති කර වෛජන්ත ප්‍රාසාදය කළ බව ද සඳහන් වේ (මව,46:132-134). දෙ වැනි මහින්ද (ක්‍රි.ව. 778 - 796) මහාලේඛ පිරිවෙණ කර ඇත. පළමු වැනි සේන දවස සංඝාවාස පහක් ද කරවන ලදී. මූලසෝ විහාරයට සම්බන්ධ එම සංඝාරාම පහ වීරාංකුරාමය, මහින්ද සේන, උත්තර සේණ. වීර සේනක, රක්ඛස යන නම්වලින් හැඳින්වේ (වික්‍රමගමගේ,1995:118).

ඉහත සඳහන් වීරාංකුරාරාමය එකළ විවිධ බෞද්ධ නිකායන්ට අයත් ධර්මය හැදෑරූ ස්ථානයක් විය. පළමු වැනි සේන රජුගේ යැයි සැලකෙන ශිලා ලිපියක එකල ප්‍රචලිත ව තිබූ ප්‍රධාන නිකායන් සතරකින් එක් නිකායකින් භික්ෂූන් 25 බැගින් ද ශාස්ත්‍රාභි යුක්ත භික්ෂූන් හතලිහක් ද එහි අධ්‍යයනය කළ බව සඳහන් වෙයි. මහාවංසයට අනුව පළමු වැනි සේන රජු වීරාංකුරාරාමය කරවා මහා සාංඝික හා ස්ථවිර භික්ෂූන්ට පිදුවේය. මෙහි ස්ථවිර භික්ෂූන් වශයෙන් හඳුනාගන්නට ඇත්තේ අභයගිරි භික්ෂූන් විය යුතු ය (එම,118). සංඝ සේන පරිබ්බත පිරිවෙණ දෙ වැනි සේන (ක්‍රි.ව. 853 - 886) කස්සප ප්‍රාසාදය සිව් වැනි කස්සප රජු (ක්‍රි.පූ. 898 - 914) කරවන ලදී. සිව් වැනි කස්සප රජු (ක්‍රි.ව. 914 - 923) භණ්ඩිකා පිරිවෙණ හා සීලමේඝ පබ්බිත විහාරය කරවීය. එය කපාරාරාමයට අයත් පුබ්බාරාමයේ කොටසකි. සිව් වැනි මහින්ද (ක්‍රි.ව. 955 -971) පුසර්බා පහ කරවීය. මේ ආකාරයට අභයගිරි විහාරයේ ගොඩනැගිලි පිළිබඳ වාර්තා වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. ඊට වඩා විශාල ප්‍රමාණයක් ගොඩනැගිලි එහි වෙයි. ඒවා කවදා කවුරුන් විසින් කරවන ලද්දේ දැයි තවමත් සොයා ගෙන නැත (වික්‍රමගමගේ,1995:118).

අභයගිරි විහාරය තුළ රත්න ප්‍රසාදයට නිරිත දිගින් හා ඊටත් නිරිත දිගින් මහායාන සම්බන්ධතාවය දැක්වෙන ස්තූප දෙකක් ද වෙයි. මෙම ස්තූප වර්ගය චීනය, ජපානය, කොරියාව



හා තායිලන්තය වැනි රටවල ඇති පැගෝඩා වර්ගයට නෑකම් කියයි. එසේ ම රත්නප්‍රසාදය අසළ ඇති බෝධිඝරය තුළ ඇති අත් කැඩී ගොස් ඇති හිඳි පිළිමය අමරාවතී ශෛලියෙන් තනන ලද එකක් බව පෙනේ. එය වැලිගලින් කරන ලද්දක් වන අතර, බදාම වර්ගය හා වර්ණ ආලේප කර තිබුණ බවට ද සාධක සපයයි. එසේ ම දෙ වැනි සමාධිය වශයෙන් හඳුන්වන ස්ථානයේ ඇති බුදු පිළිමය ද ආන්ද්‍ර ශෛලියෙන් යුක්ත ය (එම,121). මේ අනුව පැහැදිලි ව පෙනෙන කරුණක් වන්නේ අභයගිරි විහාරය තුළ මහායාන මතවාදය ක්‍රියාත්මක වූ බවට විසඳුම් මෙවැනි නිර්මාණවලින් ද හෙළි වන බව ය. එසේ ම මහායානයට අයත් විය හැකි නිර්මාණවලට අමතර ව හීනයානයට අයත් විය හැකි නිර්මාණ ද අභයගිරි විහාරය තුළින් සොයා ගෙන ඇත. ඒ අතර 1981-1987 වසරවල සිදු කරනු ලැබූ පුරාවිද්‍යා කැනීම්වලින් හමු වූ ස්තූප වැලිමළුවේ දකුණු පස පිහිටි බුදු පිළිම තුන මහා විහාර ථේරවාදී සම්ප්‍රදායයට නෑකම් කියයි. මෙම පිළිමවල මහායාන උෂ්ණීෂය වෙනුවට සිරස්පත දක්වා තිබේ. එසේ ම දානශාලාව අසලින් සොයා ගනු ලැබූ ලෝකඩ සමාධි බුදු පිළිමය ද මහා විහාර බුදු පිළිම සම්ප්‍රදායයට අයත් වේ. මෙයට අමතර ව හුණු ගලින් නිපදවන ලද කුඩා බුදු පිළිමයක් ද අභයගිරි කැනීම්වලින් සොයා ගෙන ඇති අතර ඒවා ද මහා විහාර ථේරවාදී සම්ප්‍රදායයට අයත් වේ (එම,122).

මෙම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව වඩාත් ම පැහැදිලි වන්නේ අභයගිරි විහාරය මහායාන මතවාදයේ පමණක් පිහිටා කටයුතු කරන ලද ආයතනයක් නොවන අතර ඔවුන් මුලින් අනුගමනය කරන ලද මහා විහාර ථේරවාදී සම්ප්‍රදාය ද ගරුකර ක්‍රියාකර ඇති බව ය. ඒ අනුව මහා විහාර සම්ප්‍රදාය අනුව මූලික ව අභයගිරිය සැලසුම් වී ඇති බව සිතිය හැක්කේ විහාරයේ මූලිකාංග අතරින් ප්‍රධානත්වය ගන්නා ස්තූප කේන්ද්‍ර කරගෙන විහාරයේ අනෙකුත් වාස්තුවිද්‍යා අංග ස්ථානගත කර ඇති බැවිනි. මෙය මහා විහාර සම්ප්‍රදායේ ප්‍රධාන ක්‍රමයක් වන අතර, එය අභයගිරි විහාරයේ ද අනුගමනය කර ඇත. එසේ ම අභයගිරි විහාරයේ සැලසුම සඳහා විවිධ පාලකයන් විසින් විවිධ වකවානුවලදී දැක්වූ දායකත්වය මත එහි ගොඩනැගිලි හා

අනෙකුත් අංග ඉදි වූ බව පෙනේ. කෙසේ වෙතත් මහා විහාර සැලසුමට වඩා ඉතා ක්‍රමවත් ආකාරයෙන් අභයගිරි සැලසුම ස්තූපය කේන්ද්‍ර කරගෙන නිර්මාණය වීම ද ඔවුන් ඇදහූ මහායාන ධර්මතාවය ද යම් බලපෑමක් කරන්නට ඇතැයි ඓතිහාසික පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව සනාථ වේ. එසේ ම අභයගරි විහාරයේ කේන්ද්‍රස්ථානය ලෙස අභයගිරි ස්තූපය සළකමින් ඒ වටා විශාල භූමියක් තුළ ආරාම වර්ධනය වූ බව ද මැනවින් අවබෝධ කරගත හැකි ය. අභයගිරි විහාරය ඉදි වී සියවස් තුනකට පසු ව ක්‍රි.ව. 276 - 303 මහාසේන රජු දවස ඉදිවන ජේතවනාරාම විහාරය ද මහායාන මතවාදයක් ගරු කරගත් සාගලික නිකායේ කොහොන් තිස්ස තෙරුන්ට පූජාකළ බව නිකාය සංග්‍රහයේ සඳහන් වේ (නිස, 15). සද්ධර්මරත්නාකරයේ සඳහන් ආකාරයට සාගලික නම් නිකායත් බුදුන් පිරිනිවී සත්සියසතානුස් හවුරුද්දක් ගිය පසු ගෝඨාභය රජු දවස ධර්මරුචි නිකායෙන් බින්න ව දකුණුගිරි වෙහෙර සජ්ජාත ව මහසෙන් රජු දවස දෙනා වෙහෙර ජාත විය වශයෙන් දක්වා තිබේ (සද්රක,305). සාගලික නිකාය පිහිටුවන ලද්දේ ලක්දිව බුදු සසුන පිහිටුවා 558 අවුරුද්දක් ගිය තැන යැයි වංසත්ථප්පකාසිනියේ සඳහන් වේ (වික්‍රමගේ,1995:104). සාගලීය නිකායේ ආරම්භ වන්නේ අභයගිරි ධම්මරුචි නිකායෙන් බිඳී ගිය 300 ක් පමණ භික්ෂූන් වහන්සේලා අතර වූ සාගල නම් තෙර කෙනෙකුගේ නායකත්වයෙනි (එම,1995:140). මේ අනුව උපකල්පනය කළ හැකි වන්නේ ජේතවනාරාමයේ සැලැස්ම බොහෝ විට අභයගිරි අනුගමනය කරමින් සිදු වීමට ඉඩ ඇති බව ය. විශේෂයෙන් ම මහාසේන රජු මහා විහාර විරෝධී බව මහාවංසයේ එන තොරතුරු අනුව පැහැදිලි වේ. මහාවංසයට අනුව මහාසේන රජු මහා විහාරය කඩා බිඳ දමා විහාරයේ වස්තුව අභයගිරියට ගෙන ගොස් ඇත (මව,37:10-12). නිකාය සංග්‍රහයට අනුව ලෝවාමහාපාය ඇතුළු සිව්සැටක් පිරිවෙණ් මුලිනුපුටා විහාර භූමිය සාවා උඳු වපුරා ඇත (නිස,14). මූලාශ්‍රය කරුණු මගින් පැහැදිලි වන්නේ මහා විහාරය සමඟ මහාසේන රජු දැක්වූ දැඩි විරෝධය යි. පසු ව මේඝවර්ණාභය ඇමතිගේ සමාග මෙන් රජු මහා විහාරය නැවත ප්‍රතිසංස්කරණය කළ බව නිකාය සංග්‍රහයේ සහ මහාවංසයේ සඳහන් වේ (නිස,14; මව,37:29-30). නමුත් එම ප්‍රතිසංස්කරණ රජතුමා විසන් සිදු කරන ලද්දේ තමාගේ



වුවමනාවට නොවන බව ඉහත කරුණ මගින් සනාථ වේ. ශ්‍රී ලංකා ඉතිහාසයේ මහායානය වැළඳගත් ප්‍රථම සිංහල රජු මහාසේන රජු මේ අනුව මහායාන මත දැරූ සාගල නිකායට විහාරයක් මහා විහාරය අසළ ම ඉදි කිරීමේ දී එම විහාරයේ සැලසුම යොදාගත් බව සිතිය නොහැකි ය. එසේ නම් ඔහු බොහෝ විට මොහුගේ කුළුපග ආයතනය වූ අභයගිරි සැලසුම සැළකිල්ලට ගනිමින් ජේතවනය සැලසුම් කරන්නට ඇතැයි සිතීම වඩාත් සාධාරණ ය.

මහා විහාරය, අභයගිරිය, ජේතවනය යන විහාරයන් තුනෙහි වර්තමාන සැලසුම පරික්ෂා කිරීමේ දී වඩාත් පැහැදිලි ව පෙනෙන කාරණය වන්නේ ජේතවනාරාම විහාර සැලසුම යම්තාක් දුරට අභයගිරි විහාර සැලසුමට සමානතාවයක් දක්වන බවයි. මෙහිදී අප අනිවාර්යයෙන් අවධානය යොමු කළ යුතු කාරණයක් වන්නේ විහාර දෙකේ පවතින ඉඩ සැලසුම්කරණය පදනම් කරගනිමින් ගොඩනැගිලි ස්ථානගත කර ඇති අයුරු පිළිබඳ ව ය. අභයගිරි විහාරය අක්කර 500 ක පමණ භූමි භාගයක ව්‍යාප්ත වන බව දැනට පිළිගැනෙන අතර ජේතවනාරාමය අක්කර 200 ක පමණ භූමි භාගයක ව්‍යාප්ත වූ බව පිළිගැනේ. මේ අනුව විහාර භූමි දෙකෙහි පවත්නා විෂමතා ව පැහැදිලි වන අතර, ඉඩ සැලසුම්කරණය අතින් අභයගිරි විහාරය ප්‍රමුඛස්ථානයක් ගනී. ඒ සඳහා විහාරය ව්‍යාප්ත වීමට ඇති භූමියේ ප්‍රමාණය විශාල කිරීමට අභයගිරි විහාරයට ඉඩ තිබුණ අතර, ජේතවන භූමිය තුළ විහාර ස්ථාපනය කිරීමේ දී එක් පසකින් මල්වතු ඔයෙන් ද අනෙක් පසින් මහා විහාර හා ඇතුළු නුවර යන සීමාවලින් ද සීමා වි තිබීම මත විහාර භූමිය සැලසුම් කිරීමෙන් අනතුරු ව වැඩි ව්‍යාප්තියක් දැකගත නොහැකි ය. නමුත් විහාර දෙකේ ම විශේෂත්වය වන්නේ විශාල ස්තූප කේන්ද්‍රගත කරමින් ආරාමීය අංග ගොඩනගා තිබීම වේ.

අභයගිරි විහාරයේ ගොඩැගිලි එහි විශාලත්වය පදනම් කරගනිමින් සමූහ වශයෙන් කොටස් හතරකට බෙදී ගිය බව පෙනේ. පස් වැනි කසුප් රජතුමාගේ හා හතර වැනි මහින්ද රජතුමාගේ ශිලාලිපි සාධක අනුව හා සාහිත්‍යමය තොරතුරුවලින් අනාවරණය වන කරුණු අනුව උත්තර මූල, කපරා මූල, මනෙත්පා මුල, වාදු මුල, නම් මූල හතරකට අභයගිරි විහාරය බෙදී තිබුණ බව පෙනේ.

එම විශේෂ මූල පිළිබඳ ව පස් වැනි කසුප් රජතුමාගේ (ක්‍රි.ව. 914 - 923) අභයගිරි පුවරු ලිපියේ "අබහස් වෙහෙර ඉසා පිළිම ගෙයි ඉසා දාගැබ් හි ඉසා, මහා බෝ ගෙයි ඉසා, රුවන් පහා හි බගෙයි ඉසා......" යනුවෙන් සඳහන් වේ. මේ ස්ථාන අද බොහොමයක් නිවැරදි ව හඳුනාගෙන ඇත (කුලතුංග,1998:322). අභයගිරි විහාරය තුළ වූ මූල හතරට තවත් මූල හතරක් එකතු වී "අෂ්ඨායනය" හෙවත් "අටමූල" ක්‍රියාත්මක වූ බව විමල් පී. බලගල්ලේ සඳහන් කරයි. ඉහත සඳහන් මූල හතරට අමතර ව මූල හතර ලෙස දක්ඛිණ මූල, සෙල්ලක්කාර මූල, සරෝගා මූල, සේනාපති මූල අයත් වේ (බලගල්ලේ,1995:448-53). බෞද්ධ ශාසනික ඉතිහාසය අතින් බලන විට මෙකී අෂ්ඨ ආයතන ලක්දිවෙහි ම උපත ලබා සීඝ්‍රයෙන් විකාශයට පත් ව සියවස් කිහිපයක් ඇතුළත අපවත් ව ගිය බව පෙනේ. දහස් ගණන් භික්ෂූන්ට නිවාසස්ථාන වූ තිස්සාරාමය, අභයගිරි ආදී මහා විහාරවල නැතහොත් තදානුබද්ධ ව පිහිටි සියගණන් අනේවාසික භික්ෂු සමූහයා සහිත කීර්තිමත් ආචාර්යවරුන් හෝ රාජ පූජිත මහා තෙරුන් හෝ විසූ ආවාස මුල් කරගෙන නේවාසික භික්ෂු සංඛ්‍යාව අතින් ද ගොඩනැගිලි පුන්‍ය පහසුව අතින් ද ක්‍රමයෙන් දියුණු වීමේ හා රාජ්‍ය අනුග්‍රහයේ ප්‍රතිඵලයක් වශයෙන් ආයතනයන් පහළ වන්නට ඇතැයි සිතිය හැකි ය (එම,445).

ප්‍රතිපත්ති මාර්ග වශයෙන් හෝ අධ්‍යාපනාදී නියුක්ති වශයෙන් හෝ ඇති සමානතාව සමානාධ්‍යශයනාව, ඈත අතීතයේ දී සිට ම විශාල භික්ෂු ගණනක් සමූහයක් වශයෙන් එක්කර බැඳ තබන්නට අනුරාධපුර අවසාන භාගයේ දී පොදු පිළිවෙතක් මගින් හෝ අධ්‍යාපනිකාදී පොදු අරමුණකින් හෝ බැඳුණු මෙබඳු භික්ෂු සමූහ හැඳින්වුණු ජනප්‍රිය නාමය වූයේ "මූළ" යන්නය (එම,446).

ආයතනවල මූලාරම්භය වෙන වෙන ම සිදු වූ බවත්, සැහෙන කාලයක් තුළ අනුක්‍රමයෙන් සිදු වූ දියුණු වූ හා උසස් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපන මධ්‍යස්ථාන වශයෙන් හෝ ගුණගරුක මහා තෙරුන්ගේ නිවාසස්ථාන වශයෙන් ද රාජාදී ප්‍රභූජනයා ඇතුළු බහු ජනයාගේ සාදර ගෞරවයට පාත්‍රවීමේ ප්‍රතිඵලයක් ලෙස අනුරාධපුර අවසාන භාගය වනවිට සමහරක් ආයතන තත්ත්වය



ලැබ සිටි බව පෙන්වන සාධක ඇත. අභිලේඛන වංසකතාමය සාධක අනුව ආයතන අටක් පැවති බව පෙනේ (එම,446).

අභයගිරි විහාරයේ පැවති මූල ආයතන හතර වන උත්තර මූල, මහනෙත්පා මූල, කපරා මූල, වාදු මූල යන ආයතනවලට සම්බන්ධ වූ මූල දෙකක් ජේතවනාරාමය සතු ව පැවති බව බලගල්ලේගේ අදහස වේ. ඔහු පවසන අන්දමට මහාවංසයේ එන,

**"අට්ඨායතන වාසිනං - ථෙරානං ථිරසීලිනං**
**මහග්ඝං අට්ඨපාසාදෙ - කරාපේසි නිභූමතේ"**

යන්නෙන් ඒ රජතෙමේ එකී ජේතවන විහාරයෙහි අෂ්ඨායතන වාසි වූ ස්ථිර ශිල ගුණයෙන් යුක්ත වූ තෙරුන් වහන්සේලාට බොහෝ සෙයින් අගනා තුන් මහල්ප්‍රාසාද දහයක් කරවීය. "මහාවංසයේ හා චූලවංසයේ මේ කොටස පළමු වැනි පැරකුම්බා රජුගේ අභාවයෙන් මෑත කාලයකට පසු ව ලියන ලද්දක් හෙයින් මේ විස්තර කතුවරයා සියසින් ම දැන කෙරෙන වර්ණනාවක් සෙයින් සැළකිය හැකි ය. මීන් බොහෝ කලකට පසු දඹදෙණි යුගයේ විසූ පූජාවලිය කතුවරයා ද එහි සුතිස් වන පරිච්ඡේදය වශයෙන් ලියූ ලංකා ශාසන ඉතිහාසය කතාවෙහි ලා පළමු වැනි පැරකුම් රජු අට ආයතනයක මාපා කරවා අට ආයතනයට පොළොන්නරුවරු පොතින් වටනාපය ලැබූ බව කියමින් ඒ බව තහවුරු කරයි. කතුවරුන් දෙදෙනා ගෙන් එක් අයෙකු ද මේ තැන්හිලා අෂ්ඨායතනය නම් කර නැති නමුත් ඔවුන්ට ආයතන නොහොත් "මූල" පිළිබඳ ව කර ඇති විස්තරවලින් අට මූල හඳුනාගත හැකි ය (එම,446).

පළමු වැනි පැරකුම්බා රජු (ක්‍රි.ව. 1153 - 1186) ස්වකීය රාජ්‍ය බලය යොදා කළ නිකාය සමගියට පෙර පැවති තුන් නිකායට මූලස්ථාන වූ අනුරාධපුර (තිස්සාරාම) මහා විහාරය, අභයගිරි මහා විහාරය, ජේතවන මහා විහාරය යන මහා විහාරත්‍රයට ම අනුබද්ධ ව ආයතන පැන නැගුණු බවත්, ඒවා අඩු වැඩි වශයෙන් ශාසනික අධ්‍යාපන සේවාවෙහි යෙදී සිටි බවත් උපකල්පනය කළ හැකි ය. මෙයින් **උතුරු මූල, මහනෙත්පා මූල, කපරා මූල, වාදු මූල** යන ආයතන හතර ම අනුබද්ධ වූයේ අභයගිරි මහා විහාරයට ය. දකුණු මූල පළමු ව ජේතවනාරාම විහාරයට අනුබද්ධ ව තිබී පසු

ව අභයගිරිය හා සම්බන්ධ වු බව පෙනේ. මේ අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විට ආයතන පහක් හෙවත් මූල පහක් අභයගිරි නිකායට අයත් ව පැවති අතර, සෙනෙවිරද් මුළ ජේතවන නිකායට අයත් විය (එම,447).

දක්ඛිණ මූලායතනයට හෙවත් දකුණු මූලයට දක්ඛිණ විහාරයට පාදක වන්නට ඇතැයි සමහර උගතුන් ප්‍රකාශ කරන අතර, වැඩි දෙනාගේ මතය වන්නේ දක්ඛිණගිරි විහාරය එයට පාදක වූ බවයි. දක්ඛිණගිරි විහාරය සද්ධාතිස්ස (ක්‍රි.පූ. 137 - 119) රජු විසින් කරවන ලද බව මහාවංසයේ සඳහන් වේ. වෝහාරික තිස්ස (ක්‍රි.ව. 209 - 231) රජු ද දක්ෂිණ මූලයෙහි ථූපයට ඡත්‍රයක් කරවී ය. ධාතුසේන (ක්‍රි.ව. 455 - 473) රජු කරවූ විහාර 18 න් එකක් ලෙස දක්ෂිණගිරිය හැඳින්වේ. එය ඉහත කී දක්ෂිණ මූලය ම ද යනු අවිනිශ්චිත ය (එම,451).

ගෝඨාභය රජු (ක්‍රි.ව. 249 - 262) දවස උස්සිලිය තිස්ස තෙර අභයගිරියෙහි සඟුන් 300 ක් සමඟ දක්ෂිණගිරියේ වාසයට ගියේ ය. පසු ව එහි සාගලික නිකාය පහළ විය. මහසෙන් රජු (ක්‍රි.ව. 276 - 303) දකුණු ගිරි වෙහෙර වැසි කොහොන් තිස්ස තෙරුන් කෙරෙහි පහන් ව ජේතවනාරාමය කරවීමෙන් පසු සාගලිකයෝ එහි වාසයට ගියහ. හතර වැනි කසුප් (ක්‍රි.ව. 914 - 923) එයට ගමක් පිදී ය (එම:451).

හතර වැනි සේන (ක්‍රි.ව. 954 - 956) රජුගේ යයි සැලකෙන කළුදිය පොකුණ සෙල්ලිපිය දකුණුගිරි රජමහා වෙහෙරට අදාළ කතිකාවතකි. මෙය හමු වූ මාතලේ දිසාවේ එරවල්ගල පාමුල විශාල ප්‍රදේශයක් පුරා විසිරී ඇති නස්ඨාවශේෂ දකුණු ගිරි වෙහෙරට අයත් වූ බව සැළකේ. දකුණුගිරිය, මුල පටන් ම අභයගිරිය හා සම්බන්ධතා පැවැත් වූ අතර සාගලිකයන් ජේතවනයට යාමෙන් එම සබඳතා දැඩි වූ බවක් පෙනේ (එම:451). සේනාපති මූල ආයතනය හෙවත් සෙනෙවිරද් මුලට පාදක වු බව පෙනෙන්නේ සෙනෙවිරද් මූල පිරිවෙණකි. "**සේනාපති රාජ නකාමං - පිරිවෙණාං අකාරයි**" යනුවෙන් මහවංසයේ සඳහන් වන්නේ පළමු වැනි අග්බෝ රජු සමයේ පොත්ථසාන ඇමති විසින් කරවන ලදැයි සැළකෙන පිරිවෙණ සේනාධිපති රජ නම් වී යැයි ගත හැකි නම් ඒ මෙහි ලා අභිප්‍රේත පිරිවෙණ ද විය හැකි ය. දෙ වැනි සේන රජුගේ (ක්‍රි.ව. 853 - 887) සේනපති වූ සේනයන් විසින් කරවූ පිරිවෙණක් ගැන ද මහාවංසයේ සඳහන් වේ. ඉතිරිපින්නියාව ටැම්ලිපියේ හා රඹෑව ටැම් ලිපියේ සඳහන් දෙ වැනි උදය (ක්‍රි.ව. 878 - 887) රජ කාලයේදී කුංඨා සෙනෙවිරදුන් කරවූ බව කියන සෙනෙවිරත් පිරිවෙණෙත්, ප්‍රතිමෝක්තය මද යනු අවිනිශ්චිත ය. ආගමික ආයතනයක් පිළිසකර කර වූවන් මෙන් ම එයට නවාංගයක් එකතු කරවූවන් ද ඇතැම් විට එහි නිර්මාපකයන් ලෙස හැඳින්වීම ඉතිහාසයෙහි දුර්ලභ සිද්ධියක් නොවන හෙයිනි. කල්‍යාණවතී (ක්‍රි.ව. 1292 - 1308) රැජිනගේ බතලගොඩ පුවරු ලිපියෙන් පැවසෙන්නේ සෙනෙවිරද් පිරිවෙණ මුලින් කරවූයේ ලක්විජය සිඟු සෙනෙවිනාවන් විසින් බවත්, ඇය එය පිළිසකර කරවූ බවත් ය. කෙසේ වුව ද සෙනෙවිරද් පිරිවෙණ අනුරාධපුරයෙහි පිහිටි බව නම් සැකයක් නැත. දෙ වැනි පැරකුම්බා (ක්‍රි.ව. 1236 - 1270) රජුහු පුත් විජයබාහු යුව රජු රුවන්වැලි සෑයේ පිළිසකර ඇරඹුවේ සේනානාථ (සේනාපති) පිරුවන්පති ප්‍රමුඛ මහා සංඝයාට දන් දීමෙන් පසු ව බව මහාවංසයේ සඳහන් වේ. මහාවංසයේ ආ මේ පුවත සෙනෙවිරද් පිරිවෙණ් ආදී මහා සංඝයාට යනුවෙන් පූජාවලියේ දැක්වෙන බැවින් දෙනමින් අභිප්‍රේත වූයේ එක ම ආයතනය බව තහවුරු වෙයි (එම:453).



ක්‍රි.ව. දස වැනි සියවසේ දී සෙනෙවිරද් පිරිවෙණ මුලක් ව පැවති බවත් එය ජේතවන විහාරයට අනුබද්ධව පැවති බවත් හතර වැනි මිහිඳු (ක්‍රි.ව. 956 - 972) රජුගේ කාලයට අයත් අනුරාධපුර ජේතවන ගල්ගරාදිවැට සෙල්ලිපියේ එන "**සාගුලි මා හිමියන් නමින් පාපවූ අපිස් සතොස් තිස් මහා තෙරනම් පිහිට දෙනා රජමහ වෙහෙරෙහි රත්නමහා පිරිවෙණ්හි ................ සෙනෙවිරද් මූල වුවන සග්මළු සඟුන් විසින් දොරටු පැන් මඩියෙහි**" යන පාඨයෙන් පැවසේ. ඉහත කී වුත්ත මාලාවේ සේනාධිපති මූල මහා තෙරුන් ද වර්ණිත වන හෙයින් යටත් පිරිසෙයින් ක්‍රි.ව. දහහතර වැනි සියවස තෙක් සෙනෙවිරද් මූල සක්‍රීය ව පැවති බව පෙනේ (එම:453). සෙනෙවිරද් මුළ ජේතවන නිකායට අයත් ආයතනයක් වූ හෙයින් නිකාය සමඟියට පෙර එය අභයගරික ආයතනය සමඟ සමීප ආශ්‍රයක් පැවැත්වී ය. එය පළමු වැනි පැරකුම්බා (ක්‍රි.ව. 1153 - 1186) කරවූ නිකාය සමඟියෙන් පසු එය ආදියෙහි පටන් ම ථේරවාදී ව සිටි මහා විහාරික ආයතනයක් දෙසට වඩ වඩා නැඹුරු වන්නට සෙයක් පෙනේ (බලගල්ලේ,1998:453).

ඉහත සඳහන් කරන ලද ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව වඩා පැහැදිලි වන්නේ ජේතවනාරාම විහාරය අභයගිරි විහාරය සමඟ වඩා සමීප ව කටයුතු කර ඇති ආකාරයයි. මේ සඳහා බොහෝ විට ඔවුන් අනුගමනය කරන ලද මහායාන මතවාදය රුකුලක් වීමට ඉඩ ඇති අතර, ජේතවනාරාමයේ ආරාම හා අනෙකුත් ගොඩනැගිලි සැලසුම් කිරීමේදී අභයගිරි විහාරයේ සැලසුම බොහෝ විට සැළකිල්ලට ගන්නට ඇතැයි අපට උපකල්පනය කළ හැකි ය. ජේතවන විහාරයේ ආරම්භය (ක්‍රි.ව. 276 - 303) රජ පැමිණි මහසෙන් රජුගේ නිර්මාණයක් බව මහාවංසයේ සඳහන් වෙයි (මව,37:32-34). එසේ ම මෙහි මුල් සැලසුම මහාසේන රජුගේ බව සනාථ කළ හැකි පුරාවිද්‍යාත්මක සාධක අතර, ජේතවන පුවරු ලිපිය ද වෙයි (*Ez*,vol.IV:275). ඒ රජු අරඹන ලද මෙම විහාරය සඳහා ඔහු විසින් ජේතවන ස්තූපය හා රත්නමහා පිරිවෙණ ද මහා පිරිවෙණ ද අයත් වූ බව මූලාශ්‍රය තොරතුරු අනුව සනාථ වෙයි (*Ez*,vol.III:228-229). මහාසේන රජු ඇරඹි මෙම විහාරය ඉන් අනතුරු ව සියවස් කිහිපයක් ඇතුළත අනුරාධපුර යුගයේ අවසාන භාගය හා පොළොන්නරු යුගයේ මුල් භාගය තුළ විවිධ රජ දරුවන් යටතේ විවිධ වාස්තුවිද්‍යාංග එකතු කරමින් දියුණු තත්ත්වයට පත් වූ බව මූලාශ්‍රය තොරතුරු අනුව පෙනේ.

මහසෙන් රජුගෙන් පසු ව රජ පැමිණි ඔහුගේ පුත් කිත්සිරි මේඝවර්ණ රජු (ක්‍රි.ව. 303 - 331) සිය පියා විසින් දෙනා වෙහෙර සදා කරන ලද කර්මාන්තයේ ඉතිරි කොටස් සම්පූර්ණ කර ඇත (මව,37:65). (ක්‍රි.ව. 432 - 433) රජ පැමිණි මිත්තසේන රජු ස්තූපයට තොරණ හා ඡත්‍ර කළ බව සඳහන් වේ (මව,38:10). එසේ ම මහානාග රජු (ක්‍රි.ව. 573 - 575) ස්තූපය සඳහා හත්පීවේදය කරවා සිතුවම් කර ඇත (මව,41:95-99). පළමු වැනි අග්බෝ රජු (ක්‍රි.ව. 575 - 608) සිරිසඟබෝ පිරිවෙණ හා රිදී සුසුලුගෙය කර ඇත (*Mv*,42:10 -31) එසේ ම (ක්‍රි.ව. 608 - 618) රජ පැමිණි දෙ වැනි අග්ගබෝධි බෝධිඝරය අසල ළිඳ තනවා ඇත (*Mv*,42:66). තුන් වැනි මොග්ගල්ලාන (ක්‍රි.ව. 618 - 623) ස්තූපයට සත්කාර කර ඇත (*Mv*,42:64). II වන දප්පුල (ක්‍රි.ව. 825 - 831) බෝධිඝරයේ බෝසත් පිළිමයට රන්සිවි ගෙයක් කර ඇත (*Mv*,42:77-78). එසේ ම (ක්‍රි.ව. 833 - 853) රජ පැමිණි පළමු වැනි සේන



විශාල පිරිවෙණක් කර ඇත. (*Mv*,50:65-68) දෙ වැනි සේන මණිප්‍රාසාදය කර ඇත (*Mv*,50:76-78). සිව් වැනි කස්සප (ක්‍රි.ව. 898 - 914) සෙල්මුවා පිළිමවල රන් ඡත්‍ර කරවා ඇත (*Mv*,52:7). V වන කස්සප (ක්‍රි.ව. 914 - 923) විජයෝත්පාය බඳු විසිතුරු මණ්ඩප කර ඇත (*Mv*,52:35-59). එසේ ම සිව් වැනි මහින්ද (දොරටු පැන් මඩිය හා මහා පොහොය ගෙය කර ඇත (*Ez*,vol. III: 226 - 229). ඒ රජුගේ ඇමතිවරු පිරිවෙණ් හතරක් කළ බව ද මහාවංසයේ සඳහන් වේ (*Mv*,53:49-80). එසේ ම අවසාන වශයෙන් මහා පරාක්‍රමබාහු රජතුමා රියන් 160 ක් වන ලෙස ජේතවන ස්තූපය ප්‍රතිසංස්කරණය කළ බව මහාවංසයේ සඳහන් වේ. (*Mv*,78:98).

මෙම තොරතුරු අනුව වඩාත් පැහැදිලි ව පෙනෙන කාරණය නම් විහාරයේ දක්නට ලැබෙන ගොඩනැගිලි විවිධ රජ දරුවන් යටතේ එකතු වෙමින් සංවර්ධනය වී ඇති බව ය. ඓතිහාසික තොරතුරු අනුව විහාරය ආශ්‍රයෙන් පවතින වාස්තුවිද්‍යා නිර්මාණ හඳුනාගත හැක්කේ කිහිපයක් වන අතර, ඓතිහාසික තොරතුරුවලට ඇතුළත් නොවන තවත් විශාල ප්‍රමාණයක් වාස්තුවිද්‍යා නිර්මාණ මේ වන තුරුත් හඳුනාගෙන නොමැත. එබැවින් ජේතවන විහාරය සතු ව ඉදිවී ඇති ස්මාරක පිළිබඳ ව හා ඒවා ඉදි වී ඇති කාලය හඳුනාගත හැක්කේ ඉතා සීමිත ප්‍රමාණයකින් පමණ ය.

ජේතවනාරාම විහාරයේ සැලසුම අධ්‍යයනය කිරීමේදී එය පැහැදිලි ලෙස ම මහා විහාර සැලසුම අඩංගු වන සිංහ වික්‍රාන්ත සැලැස්මට අයත් නොවන බව පෙනෙන අතර විහාරය තුළ පවතින වාස්තුවිද්‍යා නිර්මාණ ස්ථානගත වීම සඳහා බොහෝ විට මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ සඳහන් වන විහාරාරාම වර්ගවලට ජේතවන සැලසුම අයත් කර පෙන්විය නොහැකි බව පෙනේ. විශේෂයෙන් මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ සඳහන් කරුණු අනුව එහි විස්තර කර ඇති ආරාම ප්‍රභේද විශ්වාසදායක ලෙස ක්‍රි.ව. හත් වැනි හා දස වැනි සියවස් අතර කාලයට අයත් යැයි සැළකිය හැකි පබ්බත විහාරවල ආදී ම ස්වරූපය පිළිබිඹු කරන බවත් ඒ අනුව මෙම ග්‍රන්ථය බොහෝ විට ක්‍රි.ව. පස් වැනි හා නව වැනි ශත වර්ෂ අතර කාලය තුළ රචිත

බවට නිගමනය කිරීම යුක්ති සහගත යයි වෝල්ටර් මාරසිංහ පෙන්වාදී තිබේ (මාරසිංහ,1989:19-20). එබැවින් මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර ග්‍රන්ථය රචිත කාලය වන විට මහා විහාරය, අභයගිරි හා ජේතවනය යන මහා විහාර තුන ම ප්‍රතිෂ්ඨාපනය වී අවසන් ව ඇත. එසේ හෙයින් මේ මහා විහාර සැලසුම සඳහා ඉහත ග්‍රන්ථයේ සැලසුම් භාවිත කළ බවට පලවන අදහස් පිළිබඳ උගතුන් අතර මත පවතී. කෙසේ වෙතත් අනුරාධපුරය ඇසුරින් බිහිවූ මහා විහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය ක්‍රමයෙන් වර්ධනය වූ පැරණිතම ආරාම ප්‍රභේදය වශයෙන් පිළිගැනේ (එම:14). විශේෂයෙන් ම ජේතවනාරාම විහාරය මහා විහාරයට වඩා අභයගිරි විහාරයේ සැලසුම උපයෝගී කරගන්නට ඇතැයි සිතීම වඩාත් තර්කානුකූල වේ. ජේතවනාරාම විහාරයේ සැලසුම අධ්‍යනයේ දී එහි ප්‍රධාන වාස්තුවිද්‍යා අංග දෙකක් යටතේ ගොඩනැගිලි නිර්මාණය වී ඇති බව පෙන්වාදිය හැකි ය. එම ප්‍රධාන අංග දෙක නම්,

1. ආගමික වාස්තුවිද්‍යා අංග
2. ආගමික නොවන නේවාසික වාස්තුවිද්‍යා අංග වශයෙනි.

ආරාම සංකීර්ණයේ වාස්තුවිද්‍යා අංගෝපාංග ස්තූපය වටා සැලසුම් කර ඇති අතර, පහත දැක්වෙන පරිදි ස්ථානගත වී ඇත. බෝධිඝරය, උපෝසථඝරය, සන්නිපාත ශාලාව දකුණු දිශාවේ ඇත. බෝධිඝරයට නැගෙනහිර පසින් වඩා පැරණියයි සැළකෙන පිළිම ගෙය පිහිටා ඇති අතර නේවාසික විහාර අංග භූමියේ ඉඩ සැලසුම්කරණය අනුව බටහිරින් දකුණු දිගින් නැගෙනහිරින් ස්ථාන ගත වී තිබේ. විහාර සැලස්ම තුළ අන්තර්ගත වන ආගමික වාස්තුවිද්‍යා අංග අතරට,

1. ස්තූපය
2. ධර්ම ශාලාව
3. පොහොය ගෙය
4. බෝගෙය
5. පිළිම ගෙය
6. සභා ශාලාව අයත් වන බව පෙන්වාදිය හැකි ය.



එසේ ම නේවාසික වාස්තුවිද්‍යා අංග අතරට,

1. දානශාලාව
2. පංචාවාස (පිරිවෙණ්)
3. පොකුණු හා ළිං
4. ජන්තාඝර

5. වැසිකිළි හා කැසිකිළි වැනි වාස්තුවිද්‍යා අංග උයත් වන බව පෙන්වාදිය හැකි ය. මහා විහාරය සතු ව පැවතිය යුතු මෙම මූලික පූජනීය හා නේවාසික අංග පිළිබඳ ව මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ සඳහන් වන්නේ ආරාමයක සියලු ම ගොඩනැගිලි " **මුඛ්‍ය**" සහ "**ගෞණ**" යනුවෙන් කොටස් දෙකකට බෙදෙන බවයි. "මුඛ්‍ය" හෙවත් ප්‍රධාන ගොඩනැගිලි පස් වැදෑරුම් වේ. ඒවා නම් චෛත්‍යය, බෝධි වේෂ්මය, ප්‍රතිමාලය සහ සභා යන අතිශයින් පූජනීය ගොඩනැගිලි සතරත් භික්ෂූන් වහන්සේලාගේ වාසභවන වූ ප්‍රාසාදයන් හා ආරාමයේ පිහිටි සෙසු ගොඩනැගිලි "ගෞණ'' යන ඝණයට අයත් වන බව වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ පැහැදිලි කරයි. වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ ප්‍රාසාද යන වචනය ආගමික ගොඩනැගිලි හා භික්ෂූන් වහන්සේලා ජීවත් වූ විහාර ශාලා හැඳින්වීම සඳහා භේදයෙන් තොර ව යොදනු ලැබ ඇත. ඇතැම් විට ඕනෑ ම ගොඩනැගිල්ලක් සඳහා ප්‍රාසාදය යන වචනය භාවිත කරනු ලැබ ඇත. එහෙත් වාස්තුවිද්‍යා ශාස්ත්‍රය පැහැදිලි ව ම සඳහන් කරන්නේ ප්‍රාසාදය භික්ෂූන් වහන්සේලාගේ නේවාසිකාගාරය වශයෙන් ය (මාරසිංහ,1993:30-31).

මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව ආරාම නිර්මාණයේ දී නිශ්චිත සැලසුමක් පදනම් කරගනිමින් එම නිර්මාණ කළ බවට මූලික සාක්ෂ්‍ය ලැබේ. මෙහි මූලික පදනම වශයෙන් ගැනෙනුයේ **වාස්තු මණ්ඩලය** නමින් හැඳින්වෙන ගුප්ත භූමි සටහනකි. මෙම භූමි මණ්ඩලය කෝෂ්ඨ නවයකට හෝ විසිපහකට බෙදනු ලැබේ. කෝෂ්ඨ නවයකින් යුත් වාස්තු මණ්ඩල **පීඨ** වශයෙන් ද කෝෂ්ඨ 25 කින් යුත් වාස්තු මණ්ඩලය **උප පීඨ** නමින් ද හැඳින් වේ. මෙහිදී ආරාම විධි දොළොසෙන් හයක් පිහිටා ඇත්තේ පීඨ වාස්තු මණ්ඩලය අනුව ය. ඉතිරි හය සැලසුම් කර ඇත්තේ උප පීඨ සැලසුම අනුව ය. හත්ත සංඝාරාම

හා ගෝකුලාරාම උප පීඨ සැලසුමට අනුව ඉදි වී ඇති අතර සිංහාරාම සැලැස්ම පීඨ සැලැස්ම අනුව සැලසුම් කරන ලදී. වාස්තු මණ්ඩලයක කිසියම් කෝෂ්ඨයක් අධිගෘහිත දේවතාවාගේ නමින් හඳුන්වනු ලැබේ (මාරසිංහ,1993:30). එය මෙසේ පෙන්වා දී ඇත.

| | | |
|---|---|---|
| වායු | සෝම | ඉස |
| වරුණ | බ්‍රහ්ම | ආදිත්‍ය |
| නිරිත | යම | අග්නි |

**පීඨ සැලැස්ම**

| | | | | |
|---|---|---|---|---|
| වායු | මූඛ්‍ය | සෝම | අදිති | ඉස |
| සෝස | රුද්‍ර | බහුමින්ද | අපවත්ස | ජයන්ත |
| වරුණ | මිත්‍ර | බ්‍රහ්ම | ආර්ය | බර්ස |
| සුග්‍රීව | ඉන්දු | විවස්වත් | සාමිකර් | ආදිත්‍ය |
| නිරිත | බරන්තරාජ | යම | විතත | අග්නි |

**උප පීඨ සැලැස්ම** (*Mvs* :215 - 216)



මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව ආරාමයක ගොඩනැගිලි හා කෝෂ්ඨ වෙන් කිරීමේ දී පිළිපැදිය යුතු ප්‍රධාන නීතියක් නම් එක් ගොඩනැගිල්ලක එක් කෝෂ්ඨයකට පමණක් සීමා විය යුතු අතර, එහි සීමා උල්ලංඝණය නොකළ යුතු ය. යම් හෙයකින් අසල්වැසි කෝෂ්ඨයක් ආක්‍රමණය කරනු ලැබුව හොත් ඉන් ලැබෙන විපාක භයානක වනු ඇති බව මෙහි දක්වා තිබේ. මේ අනුව උප පීඨ සැලැස්මක එක කෝෂ්ඨයක් තුළ එක් ප්‍රධාන ගොඩනැගිල්ලක් තැනිය යුතු වේ. එසේ වුවත් වැදගත්කමින් අඩු ගොඩනැගිලි කිහිපයක් එක් කෝෂ්ඨයක් තුළ තැනීමට හැකි අතර, එය සාමාන්‍ය ප්‍රතිපත්තිය නොවේ. පීඨ සැලැස්මක ඇත්තේ කෝෂ්ඨ නවයකි. එක් කෝෂ්ඨයක ගොඩනැගිලි එකකට වඩා ඇතුළත් කිරීමට සිදු වනු ඇත. එහෙත් මෙහිදී පවා හැකි සෑම විට ම එක් කෝෂ්ඨයක් එක් ප්‍රධාන ගොඩනැගිල්ලක් සඳහා පමණක් වෙන් කිරීමට වගබලා ගෙන ඇත (මාරසිංහ,1989:30).

මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ සඳහන් ආරාම සැලසුම් පිළිබඳ අධ්‍යනයේ දී විශේෂයෙන් ම පබ්බත විහාර උප පීඨ සැලසුමක් මත නිර්මාණය කර ඇති ක්‍රියාවලියක් බව එහි පැහැදිලි ව දක්වා ඇත. එය දැක්වීමේ දි වඩාත් පැහැදිලි වන්නේ එම ග්‍රන්ථය රචනා කළ අවධිය වන විට පබ්බත විහාර සැලසුම පිළිබඳ ව කතුවරයා පුළුල් අවබෝධයකින් සිට ඇති බව ය. නමුත් පීඨ සැලසුම පිළිබඳ ග්‍රන්ථ කතුවරයා එතරම් විස්තරයක් දක්වා නැති අතර පීඨ සැලසුම මහා විහාර සම්ප්‍රදායට අයත් ලෙස විස්තර කිරීමට උත්සාහ කර ඇති බව ග්‍රන්ථයේ සඳහන් සිංහාරාම සැලසුම පීඨ සැලැස්මට අයත් බව දක්වා තිබීමෙන් පෙනේ. එසේ ම පීඨ සැලැස්ම තුළ ගොඩනැගිලි ස්ථානගත කිරීමේ දී කෝෂ්ඨ සඳහා එතරම් බලපෑමක් කිරීමට කතුවරයා පෙළඹී නැති අතර එයින් ගම්‍ය වන්නේ එම ග්‍රන්ථය රචනා කරන කාලය වන විට අනුරාධපුර මහා විහාර ත්‍රිත්වය ම ඉදි වී අවසන් බැවින් මහා විහාර සැලසුම සඳහා කතුවරයා යම් ලිහිල් බවක් දක්වා ඇති බව ය. කෙසේ වෙතත් මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ග්‍රන්ථයට අදාළ ආරාම වර්ග විසිහතර සඳහා ජේතවනාරාම විහාරයේ වාස්තුවිද්‍යා සැලැස්ම ගැළපෙන බවක් නොපෙනේ. විශේෂයෙන් ම මහා විහාර සම්ප්‍රදායට අයත් සේ එහි විස්තර කරන සිංහාරාම

සැලැස්ම ජේතවනාරාම විහාරය හා කිසිත් සැසඳිමක් නැති බව පැහැදිලි වේ. කෙසේ වෙතත් පසු කාලීන ව විවිධ ගොඩනැගිලි ඉදි වීමේදී මහායාන අදහස් පදනම් කරගනිමින් විහාර භූමියේ ගොඩනැගිලි ස්ථාපනය කිරීම සඳහා වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ සඳහන් ගොඩනැගිලි ද යම් පමණකට උපයෝගී කර ගන්නට ඇතැයි සිතිය හැකි සාධක ඇත. වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ සඳහන් වන සභා ශාලා යන්න පිහිටිය යුත්තේ වාස්තු භූමියේ හරි මැද ය. සභා යන වචනයෙන් ම එය භික්ෂූන් වහන්සේලාගේ විනය කර්ම ආදිය සඳහා රැස් වූ ශාලාවක් වන බව සඳහන් වේ (මාරසිංහ,1993:31). මෙම ගොඩනැගිල්ල පිළිබඳ අධ්‍යයනයේ දී පැහැදිලි වන කරුණක් නම් ජේතවනාරාම සන්නිපාත ශාලාව (සභාශාලාව) හා අභයගිරි ශාලාව සභාශාලාව ආරාම භූමිවල මැදට වන්නට පිහිටන බව ය.

මහා විහාර සැලසුමට අයත් සිංහාරාම වික්‍රාන්තයේ ප්‍රධාන ප්‍රවේශ ද්වාරය පිහිටන්නේ නැගෙනහිරින් හෝ බටහිරින් බව මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍ර අනුව පැහැදිලි කර ඇත (මාරසිංහ,1989:05). එසේ ම එම විහාරයේ ප්‍රාකාරයේ උස දිග රියන් හය හමාරක්, නවයක්, හා එකොලොසක් ලෙස ද දක්වා තිබේ (එම:10). සිංහාරාම සැලැස්මට ජේතවනාරාමය අයත් නොවුව ද මහා විහාර සම්ප්‍රදායේ විහාර ඝනයට ජේතවනාරාමය අයත් වේ. එබැවින් මෙහි ප්‍රධාන ප්‍රවේශ ද්වාරය කුමන පසකින් පිහිටන්නේ දැයි විමසීම ද ඉතා වැදගත් වේ. දැනට දක්නට ලැබෙන විහාර සිමාවන් පරික්ෂා කිරීමේදී ජේතවන විහාරය ප්‍රධාන ප්‍රවේශ දොරටු පිහිටීම පිළිබඳ ව යම් අවබෝධයක් ලබාගත හැකි පුරාවිද්‍යාත්මක සාධක ඇත මහාවංසයට අනුව ක්‍රි.පූ. තුන් වැනි සියවසේ ලංකාවට පැමිණි ඉන්දියාවේ ශ්‍රේෂ්ඨතම නරපතියෙකු වන අශෝක අධිරාජ්‍යාගේ පුත් මිහිඳු මහ රහතන් වහන්සේ නන්දන උයනේ දකුණු පසින් පැමිණ මහාමේඝ වනයේ නැගෙනහිරින් එයට ඇතුළු වූ බව සඳහන් වේ (මව,15:10-11). එසේ ම මහාවංසයේ සඳහන් වන තවත් පුවතකින් මිහිඳු මහ රහතන් වහන්සේ ආදාහණය කළ තැන උත්තිය රජු සෑගිරියේ සිට මිහිඳු දෙන නුවරට රැගෙන විත් නුවර රජ වීථියේ හසුරුවා මහාවෙහෙරට ගෙන ගොස් ඇති බව සඳහන් වේ (මව,20:38). එම ප්‍රධාන මාර්ගය මහාමේඝ



වනයේ නැගෙනහිර දොරටුව අසලින් තිසා වැව, ඉසුරුමුණිය, වෙස්සගිරිය දක්වා ද ගමන් කර ඇත. දුටුගැමුණු රජතුමා සිය රජ චාරිත්‍ර සඳහා තිසා වැවට යාමට මෙම ගමන් මාර්ගය භාවිත කර ඇත (මව,26:07). සද්ධර්මාලංකාරය අනුව ද පුරයේ දක්ෂිණ ද්වාරයේ සිට මලය දෙසට වූ මාර්ගයක් ගැන සඳහන් වේ (සද්,ලං.:539). කනිට්ඨතිස්ස රජු මහා විහාර පවුර පර්වයකින් දකුණු වෙහෙර බලා යන මාර්ගය සකස් කළ බව ද එහි සඳහන් වේ (මව,36:13). එසේ ම මහා විහාරය සඳහා මුල් ම ප්‍රාකාරය භාතියතිස්ස රජු දවස කළ බව වංසකථාවෙහි එයි (මව,36:01-02).

එබැවින් දැනට ජේතවන විහාරය හා මහා විහාරය අතර පවතින නටඹුන් ඇති ප්‍රාකාර දෙක අතුරින් පැරණි මාර්ගය දිව යන්නට ඇති බව අප ඉහත පරිච්ඡේදයේ දී අවධාරණය කරන ලදී. එසේ ම එම මාර්ගයට මුහුණලා මහා විහාරයේ නැගෙනහිර දොරටුව පිහිටි බව සඳහන් වේ. මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍ර ග්‍රන්ථය අනුව මහා විහාරය සිංහාරාම සැලසුමට අයත් බව පෙනේ (මාරසිංහ,193:15). එසේ ම එහි වැඩිදුරට විස්තර කර ඇත්තේ මහා විහාරයක ප්‍රධාන දොරටුව නැගෙනහිරට හෝ බටහිරට පිහිටිය යුතු බවත් විහාරයක් ස්ථානගත කළ යුත්තේ රාජධානියක හෝ නගර උද්‍යානයක හෝ පර්වතයක් සමීපයේ බවත් දක්වා ඇත (එම:3-5). එම කරුණු අනුව මහා විහාරය සිංහ වික්‍රාන්ත සැලසුම තුළ දොරටුව නැගෙනහිරට පිහිටන්නට ඇතැයි සිතීමට පුළුවන. නමුත් නිශ්චිත ලෙස මේ වන විට මහා විහාරයේ ප්‍රධාන ප්‍රවේශ ද්වාරය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක හමු වී නැත.

ජේතවනාරාම විහාරයේ ප්‍රවේශ ද්වාරයේ පිහිටීම කෙබඳු පසෙකින් වන්නට ඇතැයි සිතීමේ දී ඒ සඳහා ස්ථාන දෙකකින් සාධක ලැබේ. එයින් එක් ස්ථානයක් ප්‍රධාන සැලසුමේ නම් කිරීම් අනුව ආරාම "ජී" සහ ආරාම "එච්" අතරින් පිහිටයි. එම පංචාවාස ගොඩනැගිලි අතර අඩි අටක පමණ ප්‍රමාණයකින් යුත් මාර්ග යක් ඇත. එම මාර්ගය ගඩොල් අතුරා සකස් කර තිබූ බව එම ප්‍රදේශය ආශ්‍රයෙන් සිදුකළ පුරාවිද්‍යා කැනීම් වාර්තා වේ දක්වා ඇත (වීරපාන,1997). ආරාම "ජී" සහ "එච්" යන පංචාවාස අතුරින් ස්තූපයට මුහුණ ලා ඇති සීමා ප්‍රාකාරය ද වෙන්වන ලෙස මෙම මාර්ගය සැකසී ඇත. එය කෙලින් ම සම්බන්ධ වන්නේ නැගෙ

නහිර ප්‍රාකාරය වශයෙන් දැනට හඳුනාගෙන ඇති නටඹුන් ව පවතින බැම්මේ දෙපසින් දැකිය හැකි ගොඩනැගිල්ලක සමග ය. මෙය පැහැදිලි ලෙස ම නැගෙනහිර පසින් විහාරයට සම්බන්ධ වූ මාර්ගයේ ප්‍රවේශ ද්වාරයක් ලෙස හඳුනාගත හැකි අතර මාර්ග යේ අඩු පුළුල් කම මත ප්‍රධාන ප්‍රවේශ මාර්ගයක් ද යන්න පිළිබඳ ව ගැටළුවක් ඇත. කෙසේ වෙතත් ද්වාර මණ්ඩපයක් බඳු එම ගොඩනැගිල්ල මතට දකුණු පසින් ප්‍රාකාරය සම්බන්ධ වන අතර උතුරු පසින් ද සම්බන්ධ වීම අප ඉහත ප්‍රකාශ කළ කාරණය පැහැදිලි කරවන්නකි. ජේතවන විහාරයේ නැගෙනහිර පසින් වූ පැරණි ප්‍රධාන මාර්ගයක් පිළිබඳව මූලාශ්‍රය සාධක තිබීම ද විහාරයේ නැගෙනහිර දොරටුවට පිහිටීම සඳහා බලපෑමට ඉඩ ඇත. වංසකතා සාධක අනුව කදම්භ නදියේ (මල්වතු ඔයේ) බටහිර ඉවුරට සමාන්තර ව දිවගිය මාර්ගයක් පිළිබඳ ව සඳහන් වේ. මේ මාර්ගය මල්වතු ඔය එතෙර කර මිහින්තලය දක්වා විහිදුන බව ද සුමන සාමනේර හිමි අකුධාතුව රැගෙන එන විට මෙම මාර්ගය භාවිත කළ බව ද මහාවංසයේ සඳහන් වේ (මව,17:6-22). මහා විහාර සීමාව සළකුණු කිරීමේ විස්තරයේ දී ද මල්වතු ඔයේ බටහිර ඉවුරට සමීප ව දිවගිය මාර්ගයක් ගැන සඳහන් වේ. මේ මාර්ගය කුම්භකාර ග්‍රාමය අසලින් බටහිරට පැමිණි බව පෙනේ. පූර්ව ඓතිහාසික යුගයේ සිට ක්‍රියාත්මක මේ මාර්ගය ජේතවනාරාම ස්තූපය ගොඩනැගුණු ක්‍රි.ව. තුන් වැනි සියවස තුළ දී හා ඊට පසු යුගයේ දී භාවිත වන්නට ඇත. එම මාර්ගය පදනම් කරගෙන බොහෝ විට නැගෙනහිර පසින් ප්‍රවේශ ද්වාරයක් විහාරය සඳහා තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. අනෙක් අතට වියළි කලාපයක පිහිටි ඉතා විහාල විහාර කර්මාන්තයක් සඳහා අවශ්‍ය ජල පහසුව ද විහාරයේ පැවති ළිං, පොකුණුවලට අමතර ව මල්වතු ඔය මගින් ද ලබා ගන්නට ඇත. ඒ සඳහා ද මාර්ග යක් නැගෙනහිර පසින් පිහිටීම අවශ්‍ය බැවින් විහාරයේ ද්වාර මාර්ගයක් නැගෙනහිරින් පිහිටන්නට ඇතැයි සිතිය හැකි ය. ඉහත සඳහන් ද්වාරය හා මාර්ගය ප්‍රධාන ද්වාරය ලෙස නිශ්චිත ව ම පිළිගැනීමට නොහැකි වී ඇත්තේ දැනට නැගෙනහිර ප්‍රාකාරයේ කැනීම් කටයුතු නිම නොවී ඇති බැවිනි.


එසේ ම විහාරයේ වයඹ පසින් හාල්පානු ඇළ හරහා පාලමක් තිබූ බවට ද පුරාණ ගල් කණු ශේෂ මගින් සනාථ



වේ. 1890 - 1990 පුරාවිද්‍යා දෙපාර්තමේන්තු පාලන වාර්තාවල දක්වා ඇති කරුණු අනුව එය මෙසේ ය. ජේතවන දාගැබට මදක් වයඹින් පෙර කළ හාල්පානු ඇළ හරහා වැටී තිබූ පැරණි ගල් පාලමක නටඹුන් දක්නට ඇත. අඩි 114 ක් දිග මේ පාලම මුලදී ඇළ හරහා වූ ආරුක්කු නවයකින් යුතු විය. එක් එක් ආරුක්කුව හරස් අතට පිහිටි අඩි 15 ක් දිග ගල් බාල්ක මගින් ද ඒවා මත දික් අතට එකක් ළඟින් එකක් තැබූ හා හා ඊට වඩා කෙටි බාල්ක 6 ක් 7 ක් මගින් එකට බැඳුණු කණු මත මෙය ගොඩනැගිණ (පුවිදෙඉ:1890-1900:8). මෙම පැරණි ගල් කණු ශේෂ අනුව හාල් පානු ඇළ හරහා වූ පැරණි පාලමක සාධක මතු වේ. මෙය බොහෝ විට ඇතුළු නුවර දකුණු දොරටුව දෙසට යොමු වන බවත් දැකගත හැකි අතර පැහැදිලි ලෙස ම ජේතවන විහාර යුගයේ දී භාවිත කළ පාලමක් විමට ඉඩ තිබෙනුයේ පාලම තැනීමට උපයෝගී කර ගනු ලැබූ මාධ්‍ය වන පාෂාණ ගැන සළකන විට ය. ලංකාවේ පාෂාණ භාවිතය බහුල වශයෙන් භාවිත වී ඇත්තේ ක්‍රි.ව. පස් වැනි හා ඉන්පසු යුගවල දී බව සේනක බණ්ඩාරණායක සඳහන් කරයි (Bandaranayaka, 1974: 25) එසේ හෙයින් මෙම ගල් පාලම සහිත මාර්ගය බොහෝ විට විහාරයට ඇතුළුවීමට තිබූ අමතර මාර්ගයක් වීමට ඉඩ තිබේ. බණ්ඩාරණායකගේ අදහස්වලට අනුව මහා විහාර සැලසුමක් තුළ අංගන කිහිපයකට ගොඩනැගිලි ස්ථාන ගත වී ඇත. ඒවා,

01. කේන්ද්‍රය (ථූපය)
02. විවෘත භූමිය
03. පූජනීය අංගනය (ඒ සඳහා පොහොය ගෙය, පිළිම ගෙය, ධර්මශාලාව, සභාශාලාව (සන්නිපාත ශාලාව) බෝධිඝරය අයත් භූමිය වේ.)
04. නේවාසික අංගනය (මේ සඳහා සියලුම නේවාසික ගොඩනැගිලි අයත් බව පෙනේ) (Bandarayake,1974;49).

ඉහත විස්තරය සැලසුමකින් මෙසේ පෙන්විය හැකි ය.




## මහා විහාර සැලසුමක මූලික අංගනවල පිහිටීම

සේනක බණ්ඩාරණායක විසින් දක්වනු ලබන ඉහත සැලසුම්කරණය මහා විහාර භූමියක තිබෙන බව පෙන්වා දී ඇත. ජේතවනාරාම සැලසුම් අධ්‍යයනයේ දී පැහැදිලි වන්නේ පූජනීය අංග ස්තූපයට තරමක් සමීප ව පිහිටන ආකාරයක් නේවාසික අංග තරමක් ඈතින් පිහිටන ආකාරයටත් සැලසුම් වී ඇති බව ය. ජේතවනාරාම විහාර සැලසුම, භූමියේ ඉඩ සැලසුම්කරණය පදනම් කරගනිමින් සැකසී ඇති බව එහි ගොඩනැගිලි ස්ථාන ගත කර ඇති රටාව අනුව පැහැදිලි වේ.

විහාරයේ සැලසුම පුළුල් ලෙස අධ්‍යයනය කිරීමේ දී ස්තූපයට නැගෙනහිර පස එය භූමි භාගය ස්තූපය හා ආරාමීය ගොඩනැගිලි අතර වැඩි ඉඩකඩකින් යුක්ත ව විවෘත භූමියක් ලෙස දැකගත හැකි ය. නමුත් බටහිර පසින්, දකුණු හා උතුරු ආදී දිශාවල දී මෙම විවෘත භූමිය පටු වේ. මෙසේ වැඩි ඉඩකඩක් මෙම බිම සඳහා වෙන් කරන ලද්දේ ඇයි ද යන්න විමසිය යුතු ය. විශේෂයෙන් ම මෙහිදී අපට පැහැදිලි වන්නේ විහාරය සඳහා පැමිණෙන බැතිමතුන් සඳහා ඉඩකඩක් විහාර භූමියක අවශ්‍ය බැවින් විවෘත භූමිය ඒ සඳහා සැලසුම් කරන්නට ඇති බව ය. මේ



අනුව ජේතවන විහාරයේ සැලැස්ම අධ්‍යයනයේ දී වඩා පැහැදිලි වන්නේ මහා විහාර සැලසුම් ආර ජේතවන විහාරය සඳහා යොදා ගෙන තිබෙන අතර ඒ සඳහා බොහෝ විට මහා විහාරයට වඩා අභයගිරි විහාරයේ සැලසුමේ අංග බලපා ඇති බව විහාර සැලසුම අධ්‍යනයේ දී පැහැදිලි වේ.

## සිව් වැනි පරිච්ඡේදය

# ජේතවනාරාම විහාරයේ වාස්තුවිද්‍යා නිර්මාණ


ජේතවනාරාම විහාර සංකීර්ණයේ දැකිය හැකි වාස්තුවිද්‍යා නිර්මාණ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකි ය. ඒ අනුව විහාරය තුළ දැකිය හැකි වාස්තුවිද්‍යාත්මක අංග,

1. ආගමික වාස්තුවිද්‍යා නිර්මාණ

2.ආගමික නොවන වාස්තුවිද්‍යා නිර්මාණ ලෙස වර්ග කළ හැකි ය. මෙයින් ආගමික වාස්තුවිද්‍යා නිර්මාණ සණයට අයත් අංග යටතට ස්තූපය, බෝධිඝරය, උපෝසථඝරය, පටිමාඝරය, සභාශාලාව (සන්නිපාත ශාලාව) ධර්මශාලාව අයත් වේ.

පූජනීය නොවන වාස්තුවිද්‍යාත්මක නිර්මාණ සණයට භික්ෂු ආවාස, දානශාලාව, ළිං, පොකුණු, වැසිකිළි, කැසිකිළි, ජන්තාඝර ආදිය අයත් වන බව පෙන්වාදිය හැකි ය.

ජේතවනාරාම මහා විහාර සැලැස්ම




The layout of the monastery complex

මූලාශ්‍රය : ජේතවන ව්‍යාපෘති ප්‍රධාන සැලසුම සැලසුම් අංක 01



## 4.0 ස්තූපය

### ලක්දිව ස්තූපයේ විකාශය ජේතවනාරාම යුගය දක්වා

සිංහලෙන් "දාගැබ" නමින් හැඳින්වෙන ස්තූපය වූකලී ශ්‍රී ලංකාවේ මෙන් ම බුරුමය, සියම හා කාම්බෝජය යන දකුණු දිග ආසියාවේ අනකුත් බෞද්ධ රටවල ද පිහිටුවා ඇති සෑම බෞද්ධ විහාරයක ම අත්‍යාවශ්‍ය අංගයකි. මෙකල ඉදිකරනු ලැබූ දාගැබ ඇතුළු සියලු ම ස්තූපවල බුදුන්ගේ හෝ වෙනයම් රහත් නමකගේ බොහෝ විට ලේශමාත්‍රයක් පමණ වූ ශාරීරික ධාතුවක් තැන්පත් කර ඇතැයි බෞද්ධයින් විශ්වාස කරණු ලැබේ(පරණවිතාන,1963:01). පෙරදිග හා දකුණු දිග ආසියාතික රටවල බුදු සමය සමඟ ස්තූප නිර්මාණය පැතිර ගියේ ඉන්දියාවේ සිට ය. ස්තූපය ව්‍යවහාර බෞද්ධ පූජාවිධි පිළිබඳ කේන්ද්‍රයක් වශයෙන් සුප්‍රසිද්ධ වුව ද එය බෞද්ධයන්ගේ නිර්මාණයක් නොව මහා ශාස්තෘන්ගේ ජීවමාන කාල සමයේ නිර්මාණයක් බව විදිවතුන්ගේ පිළිගැනීම වේ. චෛත්‍ය (පාලි චේතිය) නමින් හැඳින්වූ සිද්ධස්ථාන තිබූ බව බෞද්ධයන්ගේ ආදි ම ත්‍රිපිටක ග්‍රන්ථයෙහි සඳහන් වේ. ඒ අනුව චෛත්‍යය යනු ස්තූපයේ පර්යාය නාමයක් බව ප්‍රසිද්ධ ය. එහෙත් චෛත්‍යය යන්න හුදු ස්තූපය යන්න යෙදෙන නාමයක් නොවේ. ආගමික පුද පූජා පැවැත්වීම සඳහා යොදා ගන්නා ලැබූ වෘක්ෂයක් ද ඇතැම් ප්‍රාග් බෞද්ධ චෛත්‍යයන් ලෙස සැළකූ බව බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් වේ. කෙසේ වුව ද ඇතැම් චෛත්‍යයන් නිශ්චිත වශයෙන් ස්තූපයෝ වූහ. බුද්ධ, ප්‍රත්‍යෙක බුද්ධ, අරහත්ථ, චක්‍රවර්ති, මහාරාජ යන සතර කොට්ඨාසවලට අයත් පුද්ගලයන්ගේ ධාතූන් තැන්පත් කර ස්තූපයක් තැනීමෙන් ඔවුන්ට ගෞරව සම්මාන දැක්වීම සුදුසු යයි බුදුන් විසින් වදාළ බවක් මහා පරිනිර්වාණ සූත්‍රයේ සඳහන් වේ (එම).

බුදුන් ලොව පහළ වීමට බොහෝ කලකට පෙර වාසය කළේ යැයි විශ්වාස කරන සක්විති රජ දරුවන්ගේ මෘත ශරීරයන් තැන්පත් කර ඇතැම් චෛත්‍යයන් ඉදි කර ඇත. බුදුන්ගේ ජ්‍යෙෂ්ඨ සමකාලීනයෙකු විසින් ආරම්භ කළ ජෛනාගමට අයත් ස්තූපයෝ නිර්මාණ ලක්ෂණ අනුව සමකාලීන බෞද්ධ ස්තූපවලට වැඩි වෙනසක් නොවී ය. උතුරු ඉන්දියාවේ ඇතැම් ස්ථානවලින්

ප්‍රාග් බෞද්ධ ස්තූපයන්ගේ නෂ්ඨාවශේෂ සොයාගෙන තිබේ. ස්තූපය ස්මාරකයක් වශයෙන් සැළකීම ඉන්දියාවට සීමා වූ අදහසක් නොවන බව ද පෙනේ. එය වූ කලී පුරාතන ලෝකයේ ව්‍යාප්ත ව පැවති එක්තරා ස්මාරක විශේෂයක් පිළිබඳ ව ඉන්දීය ප්‍රකාශනයකි. දුරාතීතයේ දී නානාවිධ මනුෂ්‍යය වර්ගයන් විසින් මහා පුරුෂයන්ගේ මෘත දේහයන් මත කරන ලද ගොඩනැගිලිවලින් ස්තූපයේ ආරම්භය සිදු වී යැයි වර්තමාන පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති (එම:02).

ඉන්දියාවේ පැරණි බෞද්ධයන් විසින් ස්තූපය යොදාගනු ලැබූයේ ඔවුන්ගේ ආගමික කතෘවරයාට ගෞරව දැක්වීමේ මාර්ගය වශයෙනි. ආගමික පුරාවෘත්තවලට අනුව කුසිනාරා නගරයේ දී මහාශාස්තෘන් වහන්සේ ආදාහණය කිරීමෙන් පසු ඉතිරි වූ ශාරීරික ධාතුන් අට භාගයකට වෙන්කර උන්වහන්සේගේ අවමංගුල් කෘත්‍යයට සහභාගි වූ රටවල් අටක නියෝජිතයන් අතර බෙදා දෙනු ලැබිණ. සර්වඥ ධාතු කොටස් අට ලබාගත්තවුන් ඒවා තම තමන්ගේ නගරවලට ගෙන ගොස් නිදන් කර ස්තූප ඉදිකළ බව කියනු ලැබේ. සර්වඥ ධාතුන්ගේ පැතිරීම පිළිබඳ ව වූ මෙම කතා පුවත්වල කවර ඓතිහාසික සත්‍යයක් ගැබ් වුව ද අශෝක කාලය වන විට ශාස්තෘන් වහන්සේගේ ශාරීරික ධාතු තැන්පත් වී යයි සැළකෙන ස්තූප ඉන්දියාවේ බොහෝ ප්‍රදේශවල පිහිටා තිබූ බවත් සැදැහැවත් බෞද්ධයන් ඒවාට පුදසත්කාර කළ බවත් ප්‍රත්‍යක්ෂ වේ. විශේෂයෙන් අශෝක රජුගේ ධර්ම ප්‍රචාරක කටයුතු නිසා බුදු සමය ප්‍රචලිත වත් ම ධාතු වන්දනාව හා ඒ සමඟ ස්තූප පිළිබඳ අදහස ද ඉන්දියානු දේශ සීමාවෙන් පිටස්තර රටවලට ද ව්‍යාප්ත වී එම රටවල පවත්නා ආගමික වත්පිළිවෙත්හි වැදගත් අංගයක් බවට පත් විය. ඉන්දියාවෙන් පිටස්ථර රටවල දී ඇති බෞද්ධ ධර්මයෙහි විපර්යාසයන් රටවැසියාගේ කලා සම්ප්‍රදායන්ගේ හා අවශේෂ විවිධ හේතුන්ගේ ආභාසය ලැබ ඒ රටවලට විශේෂ වූ ලක්ෂණ අනුව විකාශනයට පත් වී තිබේ (එම:03).

සිංහලයන්ගේ සම්මත පුරාවෘත්තය වන මහාවංසය අනුව බුදු සමය ලක්දිව රාජ්‍ය ආගම ලෙස භාරගනු ලැබුවේ අශෝක මහා අධිරාජ්‍යාගේ කාලයේදී ය (මව,14:5-14). අශෝක මහ රජු



විසින් මෙරටට එවන ලද ධර්ම දූත සේවාවේ නායකත්වය දරනු ලැබුවේ මහා මහින්ද හිමියන් ය (මව,14:11-12). දෙවනපෑතිස් රජු සමයේ දී මිහිඳු ආගමනයත් සමඟ අනුරාධපුර රාජධානිය තුළ භික්ෂූන් වාසය පිණිස විහාරයන් ගොඩනංවන ලදී (මව,පරි:15). තිස්සාරාමය වශයෙන් ඇරඹි ලංකාවේ මුල් ම විහාරය පසු ව මහා විහාරය වශයෙන් ප්‍රකාශයට පත් වූ අතර මහා විහාරය තුළ දේවානම්පියතිස්ස රජතුමා ලක්දිව පළමු වැනි ස්තූපය වන ථූපාරාමය බැඳ වූහ (මව,17:31-64). වර්ෂ දෙදහසකටත් වඩා ඉතිහාසයක් ඇති මෙම ස්තූපය බොහෝ වාරවලදී ප්‍රතිසංස්කරණයට භාජනය වී තිබේ. එහෙයින් ක්‍රි.පූ. තෙ වැනි සියවස කාලයේ දී පැවති ආකෘතිය වර්තමාන ථූපාරාම ස්තූපයේ ආරක්ෂා වී නොමැත (පරණවිතාන,1963:03). වංසකතා තොරතුරු අනුව මෙම ස්තූපයේ බුදුරජාරණන් වහන්සේගේ දකුණු අකුධාතුව නිදන්කර ඇති බව සඳහන් වේ (මව,18:50-55). දේවානම්පියතිස්ස රජුගෙන් පසු ව රජ පැමිණි රජුගේ සොහොයුරු උත්තිය රජු මහින්ද මහරහතන් වහන්සේ පිරිනිවීමෙන් අනතුරු ව උන්වහන්සේගේ භෂ්මාවශේෂ තැන්පත් කර ස්තූප කිහිපයක් තනා ඇත (මව,20:46). මින් එක් ස්තූපයක් නැගෙනහිරින් (මිහින්තලයේ) කඳු මුදුනෙහි පිහිටා ඇත. මෙය අද අම්බස්තල දාගැබ නමින් හැඳින්වේ (පරණවිතාන,1963:04).

දෙවනපෑතිස් රජු හා ඔහුගෙන් පසු රජ පැමිණියවුන් විසින් අළුතින් සමයක් වැළඳ ගත්තවුන් හට ඇතිවන උද්යෝග යෙන් යුක්ත ව විහාර සහ ස්තූප ඉදිකිරීම සඳහා මුළු ශක්තිය යෙදවූ අතර ඔවුන් විසින් රාජ්‍යය ආරක්ෂා කිරීම සඳහා කළ යුතු දෑ අමතක කරන ලද බව පෙනේ. මේ හේතු කරගෙන ලක්දිව බුදුසමය ආරම්භ වී දශක කිහිපයක් ඇවෑමෙන් අසල්වැසි මහාද්වීපයට අයත් දමිළයන්ගෙන් පළමු වැනි ලංකාක්‍රමණය සිදු විය. අනුරාධපුර රාජධානියේ ආධිපත්‍යය මෙම ආක්‍රමණිකයන් අතට පත්විය. මොවුන් බ්‍රහ්මණාගමිකයන් වූ හෙයින් දමිළ ආධිපත්‍ය සමයේ දී අනුරාධපුරයේ සහ අවට ප්‍රදේශවල කිසිවක් ඉදි නොවී ය. එසේ වුව ද බුදු සමය වැළඳ ගත් රජ කුමරුවෝ ලක්දිව ගිණිකොණ දෙස පිහිටි මහාගාම හෙවත් තිස්සමහාරාමය ද බටහිර දෙසින් පිහිටි කැළණිය නගරයේ ද රජකම් කළහ. ලක්දිව

උතුරු කොටස ප්‍රාදේශීය ආක්‍රමණිකයන් යටතේ පැවති මේ වකවානුවේ දී ඔවුන් තම තමන්ගේ රාජධානි තුළ ස්තූප බැඳවූහ. කැළණියේ පිහිටි ස්තූපය නා රජකුගේ ආරාධනයෙන් බුදුන් වැඩි ගමන සිහි කරන වස් නිමකරන ලදැයි අදහස් කෙරේ. මාගම පිහිටි ස්තූපය හා නැගෙනහිර පළාතට අයත් සේරුවාවිල පිහිටි ස්තූපය ද මුඛ පරම්පරාගත කතා අනුව මේ කාල පරිච්ඡේදයට අයත් සේ සැළකේ (පරණවිතාරණ,1963:4-5).

මින් අනතුරුව අනුරාධපුරයේ පැවති ආක්‍රමණ මැඩ පවත්වමින් මාගම රජ පෙළපතකින් පැවත ආ දුටුගැමුණු රජතුමා (ක්‍රි.පූ. 161 - 138) බෞද්ධාගම හා එහි පුනර්ජීවය සඳහා මනා වැඩ කොටසක් අනුරාධපුරය ආශ්‍රයෙන් සිදු කරයි. බුදු සමයේ මහා අනුග්‍රාහකයෙකු වූ මේ රජු අනුරාධපුරයේ කරවන ලද ස්තූප අතරින් මිරිසවැටි දාගැබ ප්‍රධාන ස්ථානයක් ගනී. එය මෙරජු විසින් ඉදි කරන ලද මුල් ම දාගැබ වන අතර එහි රජුගේ සධාතුක රාජ යෂ්ඨිය තැන්පත් කර බඳවන ලද බව සඳහන් වේ (මව,26:6-13). මිරිසවැටි ස්තූපයේ උස වඩු රියන් අසූවක් (අඩි 200) වූ බව සඳහන් වේ (පරණවිතාන,1963-1963:05). දුටුගැමුණු රජුගේ විශාලතම කෘතිය වූයේ දැනට රුවන්වැලි (රත්නමාලි) දාගැබ නමින් හැඳින්වෙන ස්තූපයයි. මෙහි උස වඩු රියන් 120 කි (අඩි 300 කි) (එම:05). ථූපවංසයේ සඳහන් වන කරුණු අනුව මෙම ස්තූපයේ තැන්පත් කරන ලද්දේ රාමගම ස්තූපයේ නිදන් කර තිබූ සර්වඥ ධාතු බව සඳහන් වේ (ථූව,252-302). මහාවංසයේ සඳහන් වන ආකාරයට රත්නමාලි ස්ථූපය නිමවීමට ප්‍රථම රජතුමා රෝගාතුර වී මරණාසන්න වී ඇත. එබැවින් ස්තූපය සම්පූර්ණ නිම වූ බව පෙන්වීමට ඔහු ඔහු මල් සද්ධාතිස්ස කුමරු සැට්ටයකින් එය නිමවා සම්පූර්ණ කරන ලද බව වංසකතාවේ සඳහන් වේ (මව,32:1-3). පළමු වැනි ස්ථූපය වර්තමාන ප්‍රමාණයන් හා බොහෝ දුරට සමාන වන අතර එහි, එහි පාදමේ වර්තමාන විෂ්කම්භය අඩි 298 කි. පසුකාලයේ දී මෙම ස්තූපය සඳහා විවිධ රජවරුන් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ ද එය මුල් ප්‍රමාණයෙන් වෙනස් නො වූ බව ඔප්පු කිරීමට පුරාවිද්‍යා සාධක තිබේ. ඉදිවීමෙන් පසු මෙම ස්තූපයේ ප්‍රමාණය පරදවන තරම් අන් එබඳු නිර්මාණයක් ලංකාවේ පමණක් නොව මුළු බෞද්ධ ලෝකයේ ම නොතිබුණි. එබැවින් මෙම ස්තූපය හැඳින්වීමට යෙදූ මහාථූප



නාමය එයට උචිත වූවකි (පරණවිතාන, 1963:05). මහා ථූපයේ වැඩ නිමවීමෙන් ලක්දිව රජ පැමිණි දුටුගැමුණු රජුගේ මල් සොහොයුරු සද්ධාතිස්ස රජතුමා අනුරාධපුරය ආශ්‍රයෙන් ස්තූප ඉදිකළ බවක් වංසකතාවේ සඳහන් නොවේ. එරජු විසින් ලක්දිව දකුණු ප්‍රදේශයේ දීඝවාපී චෛත්‍ය ඇතුළු ස්තූප කිහිපයක් ම ඉදි කළ බව සඳහන් වේ (මව,33:10).

මින් අනතුරු ව ලංකාවේ ස්තූප නිර්මාණයේ විකාශය සම්බන්ධයෙන් වලගම්බා රජුගේ රාජ්‍යය සමය (ක්‍රි.පූ. 89 - 75) ඉතා වැදගත් කාල පරිච්ඡේදයකි. මෙරජු විසින් අභයගිරි විහාරය කරවා ඇත (මව,33:82). රජතුමාට අභයගිරි විහාරය ගොඩනැංවීමට පාදක වී ඇත්තේ තමන් සතුරන්ට බියේ පලා යන අවස්ථාවක දී දැනට අභයගිරි ස්තූපය නිමවා ඇති ස්ථානයේ නිගණ්ඨාරාමයේ සිටි ගිරි නිගණ්ඨයා රජතුමා පලා යන බව හඬනගා කීම පදනම් කරගෙන ය. පලා ගොස් අවුරුදු 14 කට පසු නැවත රජ වී එයට තමන්ගේ නාමයත් නිගණ්ඨාරාමයේ නමත් එකතු කර අභයගිරි යන නම තබා ඇති බව මහාවංසයේ සඳහන් වේ (මව,33,82- 85). අභයගිරි ස්තූපය වට්ටගාමිණී අභයගේ නිර්මාණයක් බව සෙනරත් පරණවිතාරණ ද ප්‍රකාශ කර ඇත (පරණවිතාණ,1963:06). ජේ.පී. ස්මිදර් ද මෙම ස්තූපය වළගම්බා රජුගේ බව පෙන්වාදී තිබේ (Smither, 1894:45-47). නමුත් මෙය සනාථ කිරීමට සාධක නැති බව චන්ද්‍රා වික්‍රම ගමගේගේ මතයයි. ඔහු විසින් පෙන්වාදෙන්නේ විහාරය "**අභයගිරි විහාරය**" යනුවෙන් ද ස්තූපය "**උත්තර මහ චෙත**" නමින් ද සඳහන් වන බව ය. වංසකතා තොරතුරු අනුව අභයගිරි විහාර වට්ටගාමිණී අභය රජු කරවූ බව ද ස්තූපය "**සිලාසොබ්භකණ්ඩක**" ස්තූපය නමින් හැඳින්වේ. සිලාසොබ්භකණ්ඩක ස්තූපය වංසකතාකරුවන් පෙන්වාදෙන ආකාරයට ලංකාරාම ස්තූපය බව පෙනේ (වික්‍රමගමගේ,1995:113-114). වික්‍රමගමගේගේ මතය අනුව අභයගිරි ස්තූපය පළමු වැනි ගජබා රජුගේ නිර්මාණයක් බව සඳහන් වේ. මේ සඳහා ඔහු විසින් වංසකතා තොරතුරු හා අභයගිරි විහාරයේ රත්න ප්‍රාසාදය අසලින් හමු වූ ශිලා ලිපියක එන "**අබය ගමණී උතුරු මහ චෙත**" යනුවෙන් සඳහන් වෙන සඳහනේ අබයගමනි හා එම ලිපියේ තවත් තැනක "**ගමණී අභය**˜ යනුවෙන් හැඳින්වෙන්නේ පළමු වැනි ගජයබාහුක ගාමිණී බව සඳහන් කර තිබේ (එම:113).

සෙනරත් පරණවිතානගේ මතයට අනුව ද අභයගිරි ස්තූපය මුලින් ඉදිකළ විට පසු කාලයේ දී තරම් විශාල ප්‍රමාණයකින් යුක්ත නොවූ බව ද පරණවිතාන සඳහන් කර තිබේ (පරණවිතාන,1963:06). පසු වාරයන් දෙකකදී ම විශාල කිරීම්වලට මෙම ස්තූපය බඳුන් වූ බව වංසකතාවල සඳහන් වේ (පරණවිතාන,1963:06). උසින් රියන් එකසිය හතලිහක් (අඩි 350) උස් වූ අභයගිරි ස්තූපයේ පාදම අඩි 355 ක විෂ්කම්භයකින් යුක්ත වේ. මහා ථූපයට වඩා අභයගිරි ස්තූපය විශාලත්වයෙන් වැඩි ය. ස්තූපය තුළ කිසියම් ධාතුවක් තැන්පත් කර ඇති බවක් සඳහන් නොවේ (එමඃ06). එසේ ම දැනට එළාර සොහොන යැයි වරදවා හැඳින්වෙන දක්ෂිණ ස්තූපය ද වළගම්බා රජුගේ කාලයට අයත් උත්තර යෝධයාගේ නිර්මාණයක් වේ (එමඃ06). ක්‍රිස්තු වර්ෂයෙන් මුල් සියවස් තුන තුළ ලක්දිව ස්තූප තැනීම පිළිබඳ මහත් උනන්දුවක් පැවති අතර බොහෝ ස්තූප ගැන වංසකකාවන්හි සඳහන් වේ (එමඃ06). ක්‍රි.ව. 09 - 20 රජ පැමිණි මහාදාඨික මහානාග රජු මිහින්තලා පර්වත කඳු මුදුනේ පිහිටි අඹතලා පර්වත මහා සෑය නැමැති දාගැබ කරවූ බව මහාවංසයේ සඳහන් වේ (මව,34:71). තරමක් විශාලත්වයෙන් යුත් මෙම ස්තූපයේ පාදමේ විෂ්කම්භය අඩි 136 ක් පමණ වේ (එමඃ06). මින් අනතුරු ව වසභ රජු (ක්‍රි.ව. 66 - 109) ස්තූප රාශියක් කළ බව සඳහන් වේ. ඒ අතරින් සිතුල්පව් විහාරයේ සෑ දහයක් කර ඇත (මව,35:81). මෙයට අමතර ව එරජු ථූපාරාමය සඳහා චේතියඝරයක් ද කළ බව සඳහන් වේ (එමඃ79). එසේ ම (ක්‍රි.ව. 113 - 134) ලංකාවේ පැමිණි පළමු වැනි ගජබා රජු අභයගිරි ස්තූපය විශාල කරවා එහි සතර දොරටුවේ ආදිමුඛ සතරක් කළ බව සඳහන් වේ (මව,35:119). (ක්‍රි.ව. 165 - 192) ලක්දිව රජ පැමිණ කණිෂ්ඨ තිස්ස රජු අභයගිරි ස්තූපයේ වාහල්කඩ ඉදිකළ බව සඳහන් වේ (වික්‍රමගේ,1995:114). මේ ආකාරයට ස්තූපය ලංකාවේ බෞද්ධ ආගමේ ප්‍රධාන අංගයක් වූ පසු ව ඒ සඳහා විවිධ අංගයන් විටින් විට එකතු වූ බව පෙනේ.

ලංකාවේ පැරණි යුගයේ අවසාන මහා ස්තූපය ගොඩනැංවූයේ මහසෙන් රජු ය (පරණවිතාන,1963:07). ක්‍රි.ව. 276 - 303 අතර ලංකාවේ රජ පැමිණි මෙරජුගේ රාජ්‍ය සමය බෞද්ධ ඉතිහාසයේ ඉතා වැදගත් අවධියක් ලෙස සැලකිය



හැකි ය. මූලාශ්‍රය සාධක අනුව මහාසේන රජු ජේතවන ආරාම සංකීර්ණයේ නිර්මාතෘවරයා වේ (මව,37:33). නිකාය සංග්‍රහයට අනුව මෙම රජු ජේතවනාරාමය මහා විහාර සීමාව ඇතුළත ගොඩනගා ඇත (නිසඃ15). දාහතර වැනි සියවසේ රචිත ග්‍රන්ථයක් වන සද්ධර්මරත්නාකරය නම් ග්‍රන්ථයේ ද ජේතවන ස්තූපය මහාසේන රජුගේ නිර්මාණයක් බව සඳහන් කර ඇත (සද්රකඃ307). වංසකතාවන්ට අනුව ජේතවන දැගැබේ උස එකසිය සැට රියනක් (අඩි 400) විය. දැනට ස්තූප පාදමේ විෂ්කම්භය අඩි 370 කින් යුක්ත වේ (පරණවිතාන,1963:07). සද්ධර්මරත්නාකරයට අනුව ජේතවන ස්තූපයේ තැන්පත් කර ඇත්තේ බුදුරදුන්ගේ පටී ධාතුවෙන් කොටසක් බව සඳහන් වේ. (සද්රකඃ307). ජේතවන ස්තූපය ඉදිකරන ලද කාලය වන තුරු අනුරාධපුරයේ සියලු ම ස්තූප ඉදිකර ඇත්තේ ධාතූන් වහන්සේලා නිදන් කිරිමට හෝ ස්තූපය ගොඩනගන ස්ථානය සම්බන්ධ සිද්ධියක් අනුස්මරණය කිරීමට පමණි. පිරිසිදු ථේරවාදී සම්ප්‍රදායේ භාරකරුවන් වශයෙන් සිටි පාරම්පරික ආයතනයක් වූ මහා විහාරයේ අයිතිය කියාපාන ලද ස්ථානයක ආරවුලක් ඇති කර ගනිමින් ජේතවන ස්තූපය ඉදිකිරීම සඳහා මහසෙන් රජතුමා විසින් එම ස්ථානය තෝරා ගන්නා ලද්දේ ඇයි ද යන්න පිළිබඳ ව කිසිදු සටහනක් හෝ අඩු ම වශයෙන් ඉඟියක්වත් වංසකතාවන්හි නොදැක්වේ. ආශ්චර්මය ලෙස ලබාගන්නා ලද බුදුන් වහන්සේගේ බඳ පටියේ කොටසක් එහි නිදන් කර ඇති බව සඳහන් වන්නේ දහ තුන් වැනි ශත වර්ෂයේ කරන ලද සාහිත්‍ය ග්‍රන්ථවල පමණි. මෙහිදී අපගේ සැළකිල්ලට ලක්විය යුතු කරුණු කිහිපයක් ඇත. ප්‍රධාන වශයෙන් මහාවංසය වැනි වංසකතා රචනා කර ඇත්තේ යම් යම් සිද්ධි මහා විහාර වාසීන්ගේ දෘෂ්ඨි කෝණයේ කියා පෑම සඳහා ය. ක්‍රි.ව. තුන් වැනි ශත වර්ෂය අවසාන කාර්තුවේ දී ජේතවනාරාමය ඉදි කිරීමත් සමඟ මහා විහාරයේ බලය බිඳී වැටුණ අතර නව නිකායේ මධ්‍යස්ථානය ජේතවනාරාමය බවට පත්විය (රත්නායක, 1998:332 - 333).

ශ්‍රී ලංකාවේ මෙන් ම දකුණු දිග ආසියාවේ ඕනෑ ම බෞද්ධ රටක බෞද්ධ ආරාමයක අවශ්‍යය අංගය වනුයේ ස්තූපය යි. මෑත කාලීන ව ඉදි කරන ලද ස්තූප ඇතුළු ව පැරණි ස්තූපවල බුදුන්

වහන්සේ හෝ මහ රහතන් වහන්සේ නමකගේ ශාරීරික ධාතුවල අංශු මාත්‍රයක් හෝ අන්තර්ගත විය යුතු ය යන්න සාමාන්‍යය සම්ප්‍රදායයි. එමෙන් ම ආගම හා සම්බන්ධ වැදගත් සිද්ධි වූ ස්ථානවල සථූප ඉදි කර ඇත. නමුත් ජෝතිවන යන නාමයෙන් හඳුන්වනු ලබන නන්දන උයනේ එබඳු ස්මාරකයක් ඉදිකළ බවට වංසකාවන්හි හෝ සාහිත්‍යය පොත්වල කිසිඳු සඳහනක් දක්නට නැත (එම:331). මිහින්තලයේ දී පිරිනිවන් පෑමෙන් අනතුරු ව මිහිඳු මහ රහතන් වහන්සේගේ ශ්‍රී දේහය කොතැනක ආදාහණය කරන ලද්දේ ද යන්න පිළිබඳ ව මහාවංසය හා දීපවංසය යන වංසකතා දෙකේ ම නිශ්චිත තොරතුරක් ඇතුලත් නොවේ. උත්තිය රජු මිහිඳු මහ රහතන් වහන්සේ ආදාහණය කළ ස්ථානයේ උන්වහන්සේගේ ධාතූන් ඇතුළත් කර ස්තූපයක් ඉදි කරන ලද්දේ යැයි යන්න මහාවංසයේ හා දීපවංසයේ සඳහන් වේ. (මව,21:46-47; *Dv*,17:121). එසේ ම එම ස්ථානය තිස්සාරාමයෙන් නැගෙනහිර පිහිටියේ යැයි ද සඳහන් කර ඇත (*Dv*,17:101). මහා විහාර සීමාව තුළ උපෝසත ශාලාව හා දානශාලාව අතර ස්ථානයක් වු පත්තම්භ මාලකයේ දී මිහිඳු මහ රහතන් වහන්සේගේ ශ්‍රී දේහය රැගත් රන්සිවි ගෙය තැන්පත්කරන ලද බව යථෝක්ත වංසකතා දෙකෙහි ම සඳහන් වේ (මව,21:41; *Dv*,17:99). එහි තබා අවසන් ගෞරව දැක්වීමෙන් පසු ශ්‍රී දේහය රැගත් රන්සිවි ගෙය මහා ථූපය එනම් ථූපාරාමය පැදකුණු කිරීමට සැළැස්වූ බව ද අනතුරු ව තිස්සාරාමයට නැගෙනහිර ස්ථානයක දී ආදාහණය කළ බව ද සඳහන් වේ. වඩාත් පැරණි වංසකතාව වන දීපවංසයට අනුව තිස්සාරාමය යනු මිහිඳු මහ රහතන් වහන්සේ වැඩ විසූ මුල් ම ආරාමය යි (*Dv*,14:19). ආදාහන උත්සවයට සහභාගී වූ නගර වැසියෝ නගරයේ නැගෙනහිර දොරටුවෙන් පැමිණ ඇත (*Dv*,17:102). මේ පිළිබඳව මහාවංස විස්තරයේ ථූපාරාම ගැන කිසිම සඳහනක් දක්වා නැත (රත්නායක,1998:332).

ජේතවනාරාම ආරාම සංකීර්ණය පිහිටි භූමිය මුලින් හඳුන්වන ලද්දේ නන්දන උයන නමිනි (මව,15:1-2). එය පළමු වරට සඳහන් වන්නේ මිහිඳු මහ රහතන් වහන්සේ සම්බන්ධ කරගෙන ය. උන්වහන්සේ දින හතක් නොකඩවා ධර්මය දේශනා කර අති විශාල ජනකායක් බුදු දහම කෙරෙහි නැඹුරු කරවූයේ



මෙම උද්‍යානයේදී ය (*Dv*,13:11-16; මව,15:1-5). එබැවින් නන්දන උයන පසු ව ජෝති උයන යන නමින් හැඳින්වින. එහි අර්ථය වූයේ ධර්මාලෝකය විහිදී ගිය ස්ථානය යන්න ය. මිහිඳු මහ රහතන් වහන්සේ **දීපජෝතක** එනම් ලංකාදීපයේ පහණ යන අර්ථයෙන් ද හැඳින්වින (රත්නායක,1998:332). මිහිඳු මහ රහතන් වහන්සේ සමඟ සම්බන්ධ වූ මෙම භූමිය "**ඡේරානම්බන්ධ මාලක**" යනුවෙන් ද හැඳින්විණ. එහි අදහස මහ තෙරුන්ගේ ශුද්ධ භූමිය යන්නයි (එම). මිහිඳු මහ රහතන් වහන්සේට සමකාලීන මහ රහතන් වහන්සේලා පරිනිර්වාණයෙන් පසු ව ආදාහණය කරන ලද්දේ මෙම ශුද්ධ භූමියේ ය. එබැවින් එය පසු කලෙක **ඉසිභූමංගණ** යනුවෙන් ද එම භූමිය හැඳින්වූ බව සඳහන් වේ (මව,21:49).

මහා විහාරය පිළිගැනීම පිළිබඳ කතාවේ දී හෝ මිහිඳු මහ රහතන් වහන්සේ විසින් සීමා සලකුණු කරන ලද මාලක 32 අතර හෝ ඡේරානම්බන්ධ මාලකයක් පිළිබඳ සඳහනක් නැත. එබැවින් ඡේරානම්බන්ධ මාලකය මහාමේඝ වනයෙන් පිටස්තර ව පිහිටි බව නිගමනය කිරීම සාධාරණ ය. මිහිඳු මහ රහතන් වහන්සේ ආදාහණය කරන ලද්දේ අවමගුල් ස්ථානයට සහභාගී වීමට පැමිණි අතිවිශාල ජනකායට පහසුකම් තිබුණා වු විශාල ප්‍රදේශයක විය යුතු බව පැහැදිලි වේ. එසේ ම එය මහාථූපයේ (ථූපාරාමය) සහ මහාමේඝ වනයටත් නැගෙනහරින් විය (*Dv*,17:101). ඡේරානම්බන්ධ මාලකය යථෝක්ත කරුණු අනුව ධර්මාලෝකය විහිදී ගිය නන්දන උයනේ තිබුණා විය හැකි ය. වංසකතාවන්හි සඳහන් වන මෙම අවිනිශ්චිත තොරතුරු මහාපරිනිබ්බාන සූත්‍රයට බුද්ධඝෝෂගේ අටුවාව වූ සුමංගල විලාසිනියට අනුව කුසිනාරාවේ බුදුරදුන්ගේ දේහය ආදාහණය කරන ලද ස්ථානය හා සමාන්ත්වයක් දක්වන බව පෙනේ. එවැනි සමානකමක් දක්නට ලැබෙන්නේ අනුරාධපුරයේ පැරණි නගරයට දකුණු ප්‍රදේශයේ පිහිටන ජේතවන ස්තූපය පිහිටි බිමේ වේ (රත්නායක,1998:332).

යථෝක්ත හඳුනාගැනීම පිළිගන්නේ නම් මිහිඳු මහ රහතන් වහන්සේට ගරු කිරිමක් වශයෙන් පසු කලෙක ඉසිභූමංගන වශයෙන් හඳුන්වන ලද ඡේරානම්බන්ධ මාලකයේ දී මහසෙන්

රජු ලෝකයේ විශාලතම ස්තූපය ගොඩනැගූ බව පිළිගත හැකි ය (එම:332). මෙම කරුණු පිළිගත හැකි පුරාවිද්‍යාත්මක සාධක ද ජේතවන ස්තූපයේ සළපතර මළුවේ දකුණු පස ප්‍රදේශයේ සිදු කරන ලද කැනීම්වල දී අනාවරණය කරගත හැකි විය. මහසෙන් යුගයට පෙර ඉදි කරන ලද කුඩා ස්තූපයකට අයත් විය හැකි සාධක එහිදී හමු වී තිබේ. මෙම ගඩොළු ගොඩනැගිල්ලේ වූ මීටර් 1 ක් ඝණකමකින් යුක්ත බැම්මක් තුළ අළු සහ අඟුරු වාර්තා වූ බව හේම රත්නායක සඳහන් කරන අතර මෙම බැම්මේ පහළ ම කොටස්වලින් ලබාගත් ගඩොළු සාම්පල තාපසංදීප්තතා කාලනීර්ණයට බඳුන් කිරිමෙන් එම ගඩොළු ක්‍රි.පූ. තුන් වැනි සියවසේ මැද භාගයට අයත් වූ බව තහවුරු කරගෙන තිබේ (Ratnayake,1993:66). ඉහත සඳහන් කරන ලද වංසකතා විස්තර අනුව මෙම කරුණ තහවුරු වන්නේ උත්තිය රජු විසින් මිහිඳු හිමියන්ගේ භස්මාවශේෂ තැන්පත් කර ස්තූපයක් තැනූ බව මහාවංසයේ හා දීපවංසයේ ද සඳහන් වන බැවින් එම ස්තූපය බොහෝවිට වර්තමාන ජේතවන ස්තූපය පිහිටි ස්ථානයේ ඉදි කරන්නට ඇති බව ද උපකල්පනය කළ හැකි ය (මව,20:46, *Dv*,17:101) ඉන් පසු ව මහාසේන රාජ යුගයේ දී රජතුමා මෙම ස්ථානය හැඳිනගෙන ජේතවන ස්තූපය ඉදි කරන්නට ඇති අතර ජේතවන ස්තූපය මුල් මිහිඳු ස්තූපයේ ප්‍රතිසංස්කරණයක් වීමට ද බොහෝ ඉඩ තිබේ (වික්‍රමගමගේ,1995,138). හේම රත්නායකගේ මතය වන්නේ වංසකතාවල ඉසිභූමංගන යනුවෙන් හඳුන්වන ලද **ථේරානම්බන්ධ** මාලකයේ දී මහසෙන් රජු ලෝකයේ විශාලතම ස්තූපය ගොඩනැගූ බව පිළිගත හැකි බව ය (රත්නායක,1998:332).

මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව ජේතවන ස්තූපය හා සම්බන්ධ ව මෙවැනි කරුණු වාර්තාවී තිබේ. අක්කර අටක පමණ භූමි භාගයක සම සතරැස් වේදිකාවක් මත ජේතවන ස්තූපය වර්තමානයේ පිහිටා තිබේ. දැනට පිළිගැනෙන ලෙස මුළු ලෝකයේ ම තිබෙන ගඩොලින් තනන ලද උස ම හා විශාලතම ස්මාරකය මෙය වේ. අති දැවැන්ත ධවල ගොඩනැගිල්ලක් ලෙස එය මුලින් ම ඉදි කරන ලද අවස්ථාවේ එහි උස අඩි 400 වන්නට ඇති බව පරණවිතාන පෙන්වාදී ඇත (පරණවිතාන : 1969). ජේසා වළළු 03 කින් ද ගර්භයකින් හා දැවැන්ත සම සතරැස්



කොටුවකින් ද කොත්කැරැල්ලකින් ද මෙම ස්තූපය සමන්විත වේ (රත්නායක,1998:330). වර්ෂ 1700 කට වඩා වැඩි කාලයක් ස්වාභාවික ධර්මයාගේ පීඩනයට ඔරොත්තු දෙමින් පැවතී එන මෙම මහා ස්මාරකය ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි නිර්මාණකරුවන්ගේ විද්‍යා තාක්ෂණ විෂයෙහි තිබූ හසල දැණුම පිළිබඳ හොඳ ම නිදර්ශනය වේ (එම:330).

ලංකාවේ ශ්‍රේෂ්ටතම වැව් තනන්නෙකු ලෙස ද ප්‍රකට මහසෙන් රජතුමා වසින් ඉදිකළ ජේතවනාරාම ස්තූපය සඳහා විවිධ වකවානුවලදි විවිධ ප්‍රතිසංස්කරණයන් හා අලංකරණ අංගයන් විටින් විට එකතු වූ බවට ඓතිහාසික සාධක තිබේ (ක්‍රි.ව. 432 - 433) රජ පැමිණි මිත්තසේන රජු විසින් ස්තූපයේ ඇත් පවුර හා තොරණ කළ බව සඳහන් වේ (මව,38:10). එසේ ම (ක්‍රි.ව. 573 - 575) රජ වූ මහානාග රජතුමා ස්තූපය සඳහා හුණු පිරියම් කටයුතු කර හත්පීවේදිය සහ චිත්‍ර අළුත්වැඩියා කර ඇත (*Mv*,41:95-98). පළමු වැනි අග්බෝ රජු (ක්‍රි.ව. 576 - 608) ස්තූපයේ ඡත්‍ර සඳහා රන් ආලේප කර ඇත (*Mv*,42:10-11). තුන් වැනි මොග්ගල්ලාන රජු (ක්‍රි.ව. 618 - 623) ස්තූපය සඳහා පිරිසකර කටයුතු කර ඇත (*Mv*,44:44). චෝල ආක්‍රමණවලින් අනතුරු ව අනුරාධපුර රාජධානිය වල්බිහිවී ගිය පසු එය පොළොන්නරුවට සංක්‍රමණය විය. පොළොන්නරු රාජධානියේ රජ පැමිණි පළමු වැනි පැරකුම්බා (ක්‍රි.ව. 1153 - 1186) ජේතවන ස්තූපය රියන් 160ක් උසට ප්‍රතිසංස්කරණය කරන ලද බව මහාවංසයේ සඳහන් වේ (මව,78:102). මේ ආකාරයට ක්‍රි.ව. 276 - 303 රජ වූ මහසෙන් රජු විසින් අරඹන ලද ජේතවන ස්තූපය විවිධ කාල වකවානුවල දී විවිධ රජදරුවන් යටතේ විවිධ කලාත්මක අංග එකතු වෙමින් වැඩි දියුණු වී ඇති බව පෙන්වා දිය හැකි ය.

## ස්තූපයේ වාස්තුවිද්‍යාත්මක සැලැස්ම

ජේතවනාරාම ස්තූපයේ සැලැස්ම අධ්‍යයනයේ දී එම ස්තූපය නිර්මාණය වීමට බොහෝ කලකට පෙර ලක්දිව ස්තූප නිර්මාණය වූ බැවින් එම සැලසුම් පිළිබඳව අවබෝධයක් ලබා ජේතවන ස්තූපයේ සැලසුම අධ්‍යයනය කිරීම වැදගත් වේ. බුදු දහමත් සමඟ ස්තූපය ඉන්දියාවෙන් මෙරටට ගෙන එන ලද්දක්

බැවින් ඉපැරණි දාගැබ් ඉන්දියාවේ ආදී බෞද්ධ යුගයේ ස්තූපවලට සමාන වූ බව සිතීම යුක්ති සහගතය (පරණවිතාන,1963:10). ලංකාවේ පැරණි ස්තූපවල පැවති විවිධ නිර්මාණ ලක්ෂණයන් පිළිබඳ ව ලංකාවේ වංසකතාවන්හි අහම්බෙන් ඇතුළත් වී ඇති කරුණු බොහෝ තිබේ. නෂ්ඨාවශේෂයන් හා ඉන්දියානු ගල් කැටයම් සසඳා බලමින් වංසකතාවල ඇතුළත් නිර්මාණ ලක්ෂණ හැඳෑරීමෙන් සිංහල දාගැබ්වල ආදී ම ස්වරූපය ඒවායේ ඉන්දියානු මූලාදර්ශයනට වඩා වෙනස් නොවී ඇත යන අනුමාන නිගමනය ස්ථිර කිරීමට ආධාර ලැබේ (එම:10).

මහාවංසයේ දැක්වෙන කථා පුවත් අනුව ලක්දිවට බුදු දහම දේශනා කිරීමට මුලින් ම පැමිණි මහින්ද මහ රහතන් වහන්සේ විදිසාවේ උපන් අයෙකි (මව,13:8-12). විදිසාව සාංචි, භාරුත් ආදී ස්තූප නෂ්ටාවශේෂවලට නුදුරින් පිහිටන ස්ථානයකි. මිහිඳු හිමි ලක්දිවට වැඩියේ මේ නගරයට නුදුරින් පිහිටි විහාරයක සිට බව වංසකතාවේ සඳහන් වේ (මව,13:18-20). එය පැරණි සාංචි විහාරය විය හැකි ය (පරණවිතාන,1963:10). සෑහෙන හොඳ තත්ත්වයකින් ආරක්ෂා වී තිබෙන ඉන්දියානු ස්තූප අතරින් ආදි ම නිර්මාණය වන්නේ සාංචියේ පිහිටි මහා ථූපයයි (එම:10). එබැවින් ලංකාවේ ආදිතම ස්තූපයන් ගොඩනැංවූවන් විසින් විදිසා නගරය හා ඒ අවට පිහිටි ස්තූප වර්ගය අනුකරණය කළ බව හෝ යටත් පිරිසෙයින් දිවයිනේ පැරණි ස්තූප නිර්මාණයක් කෙරෙහි එහි ආභාසය බෙහෙවින් ලැබී ඇති බව හෝ අනුමාන වශයෙන් සිතා ගැනීම යුක්ති සහගත වේ (එම:11).

දැනට ශේෂ ව ඇති නටඹුන් හා ගල් කැටයම්වල නිරූපණයන් අනුව උතුරු ඉන්දියාවේ පැරණිතම නිර්මාණයක් වූ සාංචි ස්තූපය තිබෙන්නේ මේ අයුරිනි. එය මුදුනින් පැතලි වූ මුළුමනින් ම පාහේ අර්ධ ගෝලාකාර වූ ගර්භයකින් යුක්ත ය. පුරාතනයෙහි පැදකුණු මගක් (ප්‍රදක්ෂිණා පථ) මෙන් සැළකූ විශාල පේසාවකින් (මේධි) එහි පාදය වටවී තිබේ. ප්‍රදක්ෂිණ පථයට පිවිසීම සඳහා පියගැට පෙළ (සෝපාන) පේළි තුනක් විය. ස්තූපය වටකර ඇති විශාල ගරාදි වැටකින් (වේදිකා) ආවරණය වූ දෙ වැනි ප්‍රදක්ෂිණා පථය වේ. ගර්භයේ ගල් ගරාදි වැටකින් වට වූ පීඨයක් (හර්මිකා) පිහිටා තිබේ. මෙම පීඨය මත ශිලාඡත්‍රය



හෝ ඡත්‍රාවලිය දරා සිටි ශිලා යෂ්ඨිය පිහිටියේ ය. කලින් නම් කළ බාහිර ගරාදි වැට පසු කාලයේ දී ස්තූප අලංකාර වීම පිණිස ඉදිකරන ලද දොරටු (තොරණ) සතරකින් යුක්ත විය (එම:11).

ලංකාවේ දාගැබ්වල විකාශයේ පසු අවධිවල දී ඒවා ඉහත කී සැලැස්මට වඩා බොහෝ දුරට වෙනස් වූ බව නෂ්ඨාවශේෂවලින් ද පෙනේ. එසේ වුව ද පසු ව අනුක්‍රමයෙන් දැක්වෙන අයුරු මහාවංසයේ සඳහන් පැරණි ස්තූපයන්ගේ නිර්මාණ ලක්ෂණ හැරුණු විට ක්‍රි.ව. පළමු හා ක්‍රිස්තු වර්ෂයේ මුල් සියවස තුළ දී නිමවන ලද ලංකාවේ ස්තූපයන් හා ඉන්දීය මූලාදර්ශනයන් අතර බොහෝ සමානකම් තිබූ බව පැහැදිලි වේ (එම:11). ලංකාවේ පැරණිම ස්තූපය වූ ථූපාරාමයේ නිර්මාණ ලක්ෂණයන් ගැන වංසකතාවන්ගේ කරුණු සොයාගත හැක්කේ ඉතා ස්වල්ප වශයෙනි. ථූපාරාමයේ හැඩය වී ගොඩක ආකාරය ගත්බව ථූපාවංසයේ සඳහන් වේ (ථූව,234-235). වී ගොඩේ හැඩය (ධාන්‍යාකාර) පැරණි ලාංකීය ශිල්පීන් විසින් අනුමත කර ගනු ලැබූ සය වැදෑරුම් ස්තූප ආකාරයන් අතුරින් එකකි (පරණවිතාණ, 1963:11). දැනට ශ්‍රී ලංකාවේ ලැබී ඇති ක්‍රි.ව. හත් වැනි ශතවර්ෂයට පමණ අයත් මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍ර ග්‍රන්ථයෙහි ස්තූප වර්ග පහක් ගැන සඳහන් වේ (වික්‍රමගමගේ,1992:29). ඒවා එනම්, 1. එලාන්ඩාකාර 2. ධාන්‍යාකාර 3. පද්මාකාර 4. ඝණ්ඨාකාර 5. බුබ්බුලාකාර වශයෙනි (මවාවිශා;65). නමුත් හෙන්රි පාකර් විසින් සඳහන් කෙරෙන අත්පිටපතක ගර්භයේ හැඩය අනුව දාගැබ් වර්ග හයක් ගැන සඳහන් කර ඇත. එනම්,

සන්ධ්‍යාකාර ඝටාකාරං

බුබ්බුලාකාර ධාන්‍යකං

පද්මාකාරම්බල ෂඩ් - විධං (Parker,1902:337)

මේවායින් 1 හා 4 ගැන මහාවංසයේ හා වංසත්ථප්පකාසිනියේ ද අනාවරණය වෙයි (මව,30,11-12, මවටී.,371). මෙකී සය වැදෑරුම් ස්තූප අතරින් මෙකල ලක්දිව බහුල ව දක්නට ලැබෙන්නේ ඝණ්ඨාකාර ස්තූපයයි (පරණවිතාන,1963:22). බුරුමයේ මෙන් ම සියමේ ද ඉතාමත් ජනප්‍රිය ආකෘතිය සන්ධ්‍යාකාරය බව

පෙනේ (එම:22). මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ අඩංගු නොවන ස්තූප වර්ගයක් ලෙස හෙන්රි පාකර් වෛද්‍යාන්ත පොත නමැති පොතට අනුව අම්ලාකාර නමැති ස්තූප වර්ගය හඳුන්වා දෙයි. මෙයට අමතර ව මහායාන බෞද්ධ රටවල (චීනය, ජපානය, කොරියාව වැනි) යට සිට ඉහළට කුඩා වන මහල් ගණනාවකින් යුත් පොළොන්නරුවේ සත් මහල් ප්‍රාසාදය ලෙස වරදවා හඳුන්වනු ලබන ස්තූපය, අනුරාධපුර නබා වෙහෙර හා අභයගිරියේ ඇති එවැනි චතුරස්‍රාකාර ස්තූප ද තවත් වර්ගයකි. ස්තූපයක ප්‍රධාන කොටස වූ උදරය අණ්ඩ නමින් දිව්‍යාවදානයේ සඳහන් වේ (වික්‍රමගමගේ,1990:39). අණ්ඩ යනු බිත්තරය යන තේරුම ඇති වචනයකි. මේ නමින් පෙනී යන්නේ අණ්ඩාකාර ස්තූප වර්ගයක් ද තිබුණු බවයි (එම:39). මාරසිංහ පෙන්වාදෙන එලාණ්ඩාකාර වර්ගය නමැති මංජු ශ්‍රී වාස්තුවිද්‍යාවේ එන ස්තූප වර්ගය ලූණු ගෙඩියක හැඩැති බව සළකයි (මාරසිංහ, 1993:48). මේ හැරුණු විට අෂ්ටාඝාකාර ස්තූප ද වෙයි. ඉන්දුනීසියාවේ ලිංගාකාර ස්තූප වර්ගයක් සමඟ මෙසේ ආකෘතිමය වශයෙන් ස්තූප වර්ග දොළොසක් වෙයි. මූලික වර්ග දෙකකකින් ඒවා විකාශය වී තිබේ. වෘත්තාකාර හා චතුරස්‍රාකාර යනු ඒ මූලික වර්ග දෙකවේ (වික්‍රමගමගේ,1990:48). ස්තූප ආකෘති නියම කර ඇත්තේ ස්තූප චෛතිය යන නම්වලින් ද හඳුන්වනු ලබන කොටසේ හැඩය පදනම් කරගෙනය (එම:39). ඒ අනුව ස්තූප වර්ග දොළහකට යටතට **ධාන්‍යාකාර, පද්මාකාර, ඝණ්ඨාකාර, බුද්බුලාකාර, පලාන්ඩවලාකාර, ඝටාකාර, අම්ලාකාර, අණ්ඩාකාර, චතුරස්‍රාකාර, අෂ්ට්‍රාස්‍රාකාර, සිලිණ්ඩරාකාර**, ආදී වශයෙන් පෙන්වාදිය හැකි ය (එම:34-43).යථෝක්ත ස්තූප හැඩ අතුරින් ලංකාවේ දැකගත හැකි ස්තූප ආකෘති පහතින් විස්තර වේ.




## ධාන්‍යාකාර හෙවත් ධාන්‍යරාශී හැඩති ස්තූප

වී ගොඩක හැඩය ගන්නා ස්තූප මින් අදහස් කෙරේ. ක්‍රි.ව. තුන් වැනි සියවසේ දී දේවානම්පියතිස්ස රජු ථූපාරාමය පළමුවෙන් ම ගොඩනැගූ කාලයේ දී මේ හැඩයෙන් යුක්ත වූ බව සඳහන් වේ (ථූව:190) එම ස්තූප ආකෘතිය මුල් වරට ලංකාවට හඳුන්වා දෙන ලද්දේ මිහිඳු හිමි විසින් බව පෙනේ. දෙවනපෑතිස් රජතුමා විසින් මිහිඳු හිමියන්ගෙන් කෙබඳු සෑයක් ඉදි කළ යුතු දැයි විමසන ලදු ව මිහිඳු මහ රහතන් වහන්සේ පවසා ඇත්තේ වී ගොඩක් අයුරින් විය යුතු බවයි (මවටී :295). ථූපාරාම දැගැබ 1842 දී ප්‍රකෘතිමත් කිරීමෙන් පසු ව ඝණ්ඨාකාර හැඩයෙන් යුක්ත විය (පරණවිතාන,1969:22). උතුරුමැද පළාතේ ඔට්ටප්පුව නම් වූ ස්ථානයේ පිහිටි පැරණි දාගැබක් දැකගත හැකි අතර දාගැබ අසලින් හමු වූ සෙල්ලිපියක් මගින් එය ක්‍රි.පූ. යුගයට අයත් බව සැළකිය හැකි බව පරණවිතාන පවසයි. එම දාගැබේ ද ගර්භය කේතුකාකාර හැඩයෙන් යුක්ත වන බැවින් ධාන්‍යාකාර දැගැබක් පිළිබඳ ව පැරණි නිදසුනක් පිළිබිඹු වන බව ද ඔහුගේ අදහස වේ (පරණවිතාන,1969:22). අටලොස් වැනි සියවස අවසානයේ දී කැළණි දාගැබ ප්‍රකෘතිමත් කරවූවත් එය නන්වනු ලැබූවේ යට කී හැඩයට ම වේ. එහෙත් එම දාගැබේ ආදී ස්වරූපය එම හැඩයෙන් ම යුක්ත වී දැයි නිශ්චය කිරීමට උපයෝගී වන සාක්ෂ්‍ය නොමැත්තේය (එම:22). කැබැල්ලෑලෙන, පනික්කන්කුලම යන ස්ථානවල ස්තූප ද මේ වර්ගයට අයත් බව රෝලන්ඩ් සිල්වා පවසන අතර, අභයගිරි හා ජේතවන ස්තූප ද මේ හැඩයෙන් තිබෙන්නට ඇතැයි ඔහු උපකල්පනය කර තිබේ (වික්‍රමගමගේ,1992:40).

## බුබ්බුලාකාර හැඩය

මෙම ස්තූප වර්ගය දිය බුබුලක හැඩයට අයත් වේ. ක්‍රි.පූ. 161 - 138 ලංකාවේ රජ පැමිණි දුට්ඨගාමිණී රජු රුවන්වැලි සෑය මේ ආකාරයට කළ බව මහාවංසයේ සඳහන් වේ (මව,30:11-13). මෙම ආකෘතිය රජුගේ ප්‍රධාන වඩුවා විසින් රන් තලියක් ජලයෙන් පුරවා අතින් දිය ගෙන දිය පිට ගසා දිය බුබුලක් නැගීමෙන් මතුකර

පෙන්වූ බව ද එහි සඳහන් වේ (එම:11-13). පොළොන්නරුවේ කිරිවෙහෙර හා රන්කොත් වෙහෙර ද මේ වර්ගයට අයත් බව රෝලන්ඩ් සිල්වා සඳහන් කර ඇත (Silva, 1988: 34).



**බුබ්බුලාකාර ස්තූප ආකෘතිය**


**උපුටා ගැනීම - (කුලතුංග, 2004)**

### පද්මාකාර ස්තූප

පද්මාකාර හැඩයෙන් යුත් ස්තූප ලක්දිවෙහි නොදක්නා බැව් සෙනරත් පරණවිතාන ප්‍රකාශ කර තිබේ (පරණවිතාන,1963:23). නමුත් මිහින්තලේ ඉඳිකටු සෑය වැනි දිගටි ගර්භවලින් යුත් ස්තූපයන්ගේ පාදම්වල නෙළුම් පෙති බොරදම් යොදා ඇති අතර, මෙම දාගැබ් පද්මාකාර හැඩ දාගැබ් වශයෙන් හැඳින්වෙන්නේ යැයි ඔහු ප්‍රකාශ කර ඇත (එම:23). මෙයට පසු යුගයේ දී චාර්ල්ස් ගොඩකුඹුර දැදිගම කොටවෙහෙරෙන් ගඩොලින් තනා තිබුණ පද්මාකාර හැඩ ස්තූපයන් සොයා ගෙන තිබේ (වික්‍රමගමගේ,1994:40). ස්තූපයක හැඩය තීරණය වන්නේ එහි ගර්භය



අනුව බැවින් පොළොන්නරුවේ දෙමළ මහා සෑය හා යුධගනා ස්තූපය මේ වර්ගයට අයත් බව පරණවිතාන ප්‍රකාශ කර තිබේ (එම:40).




**පද්මාකාර ස්තූප ආකෘතිය**

**උපුටා ගැනීම - (කුලතුංග, 2004)**

### ඝණ්ඨාකාර හැඩ ස්තූප

මෙම සථූපයේ ආකෘතිය ඝ්ණඨාකාර හැඩය ගන්නා බැවින් ඝණ්ඨාකාර වශයෙන් හැඳින්වේ (වික්‍රමගමගේ,1994: 41). ක්‍රි.ව. 8 - 10 සියවස්වල දී ලංකාවේ ප්‍රචලිත ව තිබුණු දිගටි හැඩයන්ගෙන් යුත් ස්තූප මේ වර්ගයට අයත් විය හැකි යැයි සෙනරත් පරණවිතාන පවසා තිබේ (පරණවිතාන,1963:22). බුරුමේ හා සියමේ මේ ස්තූප ආකෘතිය බෙහෙවින් ජනප්‍රිය බැවින් සියම් හා බුරුම බලපෑම උඩ ශ්‍රී ලංකාවේ මෙම ආකෘතිය ජනප්‍රිය වන්නට ඇත්තේ




**ඝණ්ඨාකාර ස්තූප ආකෘතිය**

**උපුටා ගැනීම - (කුලතුංග, 2004)**

අටලොස් වැනි සියවසේ අවසාන සමයේ දී ඇති වූ උපසම්පදාව මෙහි ගෙන ඒමේ ප්‍රතිඵලයක් වශයෙන් බව ඔහු පවසයි (එම:22). රෝලන්ඩ් සිල්වාගේ මතයට අනුව ද මහියංගන ස්තූපය ද මේ වර්ගයට අයත් වේ (Silva,1998:34).

## සටාකාර හැඩ ස්තූප

සඨාකාර හැඩ ස්තූප වර්ගය පැරණි ලක්දිව පැවති බව පෙනේ (පරණවිතාන,1963:23). ලක්දිව ඇතැම් පැරණි දාගැබ් තුළ ඉහත කී ස්තූප වර්ගයේ හැඩයෙන් නිමවන ලද පැරණි කරඬු හමු වී තිබේ. මේවා එකල පැවති දාගැබ්වල කුඩා ආදර්ශ ලෙස ගිනිය හැකි ය (එම:22). 1883 තිස්සමහාරාමයේ යටාල දැගැබ ප්‍රකෘතිමත් කිරීම ආරම්භ කළ අවධියේ දී එහි නෂ්ඨාවශේෂයන් අසලින් මෙවැනි හැඩයේ ස්තූප කරඬු හමු වී තිබේ (එම:22). සට හෙවත් කලයක හැඩය ස්තූප වර්ගය මූල සර්වාස්තිවාදීන් අතර ජනප්‍රිය ව පැවති බව ඔවුනගේ ස්තූප ගර්භය කුම්භ යනුවෙන් හඳුන්වා දී තිබීමෙන් පැහැදිලි වේ (වික්‍රමගමගේ,1990:42). මේ හැඩැති ධාතු කරඬුවක් වයඹ පලාතේ නිකවැව කන්ද ප්‍රදේශයෙන් සොයාගත් බව හෙන්රි පාකර් සඳහන් කර ඇති බව සෙනරත් පරණවිතාන ප්‍රකාශ කර තබේ (පරණවිතාන,1963:23). කතරගම කිරි වෙහෙර, සෝමාවතී චෛත්‍යය සිතුල්පව්වේ මඟුල් මහා විහාරය තුළ වූ ස්තූපය ද මේ වර්ගයට අයත් බව රෝලන්ඩ් සිල්වාගේ මතයයි (Silva,1998:34)ග මේ වර්ගයේ ස්තූප ඉතා ජනප්‍රිය ඒවා වේ (වික්‍රමගමගේ,1990:42).




**සඨාකාර ස්තූප ආකෘතිය**

**උපුටා ගැනීම - (කුලතුංග, 2004)**



## ආමලාකාර හැඩ ස්තූප

ආමලක යන්න බ්‍රහ්මණාගමික දේව මන්දිර නිර්මාණයේ යෙදෙණු ලබන පාරිභාෂිත ශබ්දයකි. උතුරු ඉන්දියානු දෙවොල්වල ඊනියා ශිඛරයන් මත පිහිටි පැතළි මුදුන් ගල සඳහා මෙය පාවිච්චි කර ඇත. සමහර ස්තූපයන්හි එබඳු හැඩයෙන් යුත් ගර්භයන් තිබුණා විය හැකි ය (පරණවිතාන,1963:23). නෙල්ලි ගෙඩියක හැඩය ඇති මෙවැනි හැඩයෙන් යුත් කරඬුවක් එකක්වත් ලංකාවේ හමු වී නැති බව පරණවිතාන පවසයි (එම:23). එහෙත් දෙ වැනි අග්බෝ රජු (ක්‍රි.ව. 604 - 614). ආමලක චෛතිය නමින් එකල ප්‍රසිද්ධ ව තිබුණ ස්තූපයක ඡත්‍ර කරවූ බව චූලවංසයේ සඳහන් වේ (චූ.ව.,42:62). දැදිගම කරවෙහෙරින් මේ වර්ගයේ ධාතු කරඬුවක් ලැබුණු බව රෝලන්ඩ් සිල්වා ප්‍රකාශ කර තිබේ (Silva,1998:36). ඉන්දියාවේ මේ වර්ගයේ ස්තූප ඇති බව චන්ද්‍රා වික්‍රමගේ පවසා ඇත(වික්‍රමගමගේ,1990:43).




**ආමලාකාර ස්තූප ආකෘතිය**

**උපුටා ගැනීම - (úl%u.uf.a" 2000&**

## අණ්ඩාකාර හැඩ ස්තූප

බිත්තරයක හැඩ ඇති ස්තූප මේ නමින් හඳුන්වයි. ඉදිකටු සෑය වැනි ස්තූප මේ වර්ගයට අයත් විය හැකි බව චන්ද්‍රා වික්‍රම ගමගේ ප්‍රකාශ කර ඇත (වික්‍රමගමගේ,1992:43). රුවන්වැලි සෑයෙන් ලැබුණු ධාතු කරඬුව මේ හැඩයෙන් යුක්ත වේ. මෑතකදී

ප්‍රතිසංස්කරණය කරන ලද මිරිසවැටි දාගැබ ද අණ්ඩාකාර හැඩයෙන් යුක්තය (එම:43).




**අණ්ඩාකාර ස්තූප ආකෘතිය**
**උපුටා ගැනීම - (වික්‍රමගමගේ, 2000)**

## චතුරස්‍රාකාර හැඩ ස්තූප

මහායාන බෞද්ධ රටවල ඇති පැගෝඩා ආකෘතියෙන් යුත් ගොඩනැගිලි විශේෂය මේ වර්ගයට අයත් වේ. දොළොස් වැනි සියවසට අයත් පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය නමින් වරදවා හැඳින්වෙන මහල් සතකින් යුත් ස්තූපය මේ වර්ගයට අයත් එකකි (වික්‍රමගමගේ,1990:44). අනුරාධපුර නබා වෙහෙර මේ වර්ගයේ වඩාත් පැරණි නිදසුනකි. මේ වර්ගයේ තවත් ස්තූප දෙකක් අභයගිරි විහාරයේ තිබේ (එම:44). මෙවැනි හැඩයේ ගොඩනැගිල්ලක් වන පොළොන්නරු සත්මහල් ප්‍රාසාදය කාම්බෝජයේ පූජින් ගොඩනැගිල්ලට සමාන බව බෙල් විසින් සිදුකර ඇති සන්සන්දනය අනුව පැහැදිලි වේ (*ASCAR*;1903:16). එම මතය ප්‍රතික්ෂේප කරන පරණවිතාන පූජින් ගොඩනැග්ල්ල



සත්මහල් පහය මෙන් සහා ගොඩනැගිල්ලක් නොවන බව සඳහන් කර තිබේ (පරණවිතාන,1963:88). පරණවිතාන වැඩිදුරටත් පවසන්නේ පොළොන්නරුවේ සත්මහල් පාය සියමේ ලම්ෂුන්හි සත් මහාෂොන් ගොඩනැගිල්ලට සමාන වන බව ය (එම:88). මෙම ගොඩනැගිලි වර්ගය මහායාන බලපෑම මත මෙරටට ලැබුණු හැඩයක් බව ඔහු වැඩැදුරටත් සඳහන් කර තිබේ. චතුස්ස්‍රාකාර හැඩ ස්තූප වර්ගයට අමතර ව අටපට්ටම් හැඩ ස්තූප විශේෂයක් ද ලංකාවේ පැවති බවට අනුරාධපුර පාචීනතිස්ස පබ්බතයෙන් වාර්තාවී ඇත. ප්‍රතිසංස්කරණය කරන ලද යට කොටස තුළ එක් එක් පට්ටම සඳහා දිශා අනුව අෂ්ඨමංගල සංකේත ද තිබුණු බවට සාධක එහි තිබෙන බව වික්‍රමගමගේ පෙන්වා දී ඇත (වික්‍රමග මගේ,1990:45). එසේ ම මෙම වර්ගයට අමතර ව එලාන්ඩාවාකාර හැඩ ස්තූපයක් නැදිගම්පොලින් සොයා ගෙන ඇත. එය ලුණු ගෙඩියක හැඩයෙන් යුක්ත වේ (එම:42). සිලින්ඩරාකාර වර්ගයේ ස්තූපයක් අම්පාර දිස්ත්‍රික්කයේ කුඩුම්බිගල ඇති බව විමල් විජේරත්න පෙන්වා දී ඇති බව වික්‍රමගේ ප්‍රකාශ කර තිබේ (එම:45).



**ඡතුරස්‍රාකාර ස්තූප ආකෘතිය**
**උපුටා ගැනීම - (වික්‍රමගමගේ, 2000)**

මේ ආකාරයේ හැඩවලින් යුතු ස්තූප වර්ග හා ආකෘති ලංකාව තුළින් සොයා ගෙන ඇති අතර මේවා අධ්‍යයනයේ දී වඩාත් පැහැදිලි වන්නේ ඒ ඒ කාලවකවානුව තුළදී රටේ ඇති වූ ආගමික දේශපාලනික හා සමාජ වෙනස්කම් පදනම් කර ගනිමින් එවැනි ස්තූප ආකෘති මෙරට බිහි වී ඇති බව ය.

## ජේතවනාරාම ස්තූපයේ හැඩය

ජේතවනාරාම ස්තූපයේ වාස්තුවිද්‍යාත්මක සැලැස්ම අධ්‍යයනයේදී එය කුමන හැඩයකින් යුක්ත ව පිහිටා තිබුණේ දැයි මූලාශ්‍රය කිසිවක ම නිශ්චිත ව ම කරුණු සඳහන් නොවේ. මහාවංසයේ සඳහන් වන්නේ මහසෙන් රජතුමා ජෝතිවන උයන්හි ජේතවනාරාම කළ බව ය (මව,37:32-33). දහහතර වැනි සියවසේ රචිත ග්‍රන්ථයක් වන සද්ධර්මරත්නාකරය අනුව ජේතවන ස්තූපය මහසෙන් රජු ඉදි කළ බව සඳහන් වේ (සද්රක,307). නමුත් ස්තූපයේ හැඩය කෙබඳු එකක් දැයි මූලාශ්‍රයන්හි සඳහන් නොවේ. මූලාශ්‍රය සාධක නොමැති වුව ද ජේතවනාරාමයේ ස්තූපයේ හැඩය කෙබඳු වී දැයි දැනගැනීමට එවකට පෙර ඉදි වූ ස්තූපයන්ගේ හැඩ පරික්ෂා කිරීමෙන් දැනගත හැකි ය. අනුරාධපුරය තුළින් ප්‍රථම වරට විශාලතම ස්තූපයක් නිර්මාණය කරන ලද්දේ දුටුගැමුණු රජතුමා විසිනි (ක්‍රි.පූ. 161 - 138). රත්නමාලී ස්තූපයේ හැඩය කෙබඳු ආකාරයට තනන ලදැයි යන්න පිළිබඳ මහාවංසයේ සඳහන් වේ. ''**ස්තූපය තැනීම සඳහා එහි සැලැස්ම කෙබඳු දැයි ප්‍රධාන වඩුවාගෙන් විමසන ලදු ව ඔහු විසින් රන්තාලියක් ජලයෙන් පුරවා අතින් දිය ගෙන දියපිට ගැසුවේය. එකල පළිඟු ගුලියක් සමාන වූ මහා දිය බුබුලක් නැංගේය. මෙබඳු සටහනක් ඇත්තක් කරන්නෙමැ**'' යනුවෙන් ප්‍රකාශ කිරීමෙන් රජතුමා එම හැඩයට කැමති වී ඇත (මව,30:12-13). ඒ අනුව මහාථූපය (රත්නමාල දාගැබ) දිය බුබුලක හැඩයෙන් යුක්ත වූ අතර එම හැඩය අර්ධ ගෝලාකාර ගර්භයකින් යුක්ත හැඩයකින් සමන්විත වූ බව මේ අනුව පෙනේ. පැරණි ලක්දිව ස්තූපයන්හි නෂ්ඨාවශේෂයන්ගෙන් ද දැක්වෙනුයේ සාංචි ස්තූපයේ මෙන් මෙම දිවයිනේ පුරාතනයෙහි ඉදිකරන ලද ස්තූපයන්ගේ බුබ්බුලාකාර හැඩය බුද්ධධර්මයේ නිතර හුවා දැක්වෙන ලෝකයේ අනිත්‍යය ස්වභාවය උසස් ලෙස



පිළිබිඹු කෙරෙන සංකේතයක් ලෙසිනි (එම:12). මේ අනුව පැරණි අනුරාධපුරයෙහි ඉදි වූ මුල් ම විශාලතම ස්තූපයේ ආකෘතිය ඊට පසු ඉදි වූ ස්තූප සඳහා භාවිත කරන්නට ඇතැයි ද සිතිය හැකි සාධක තිබේ.

ක්‍රි.පූ. 89 - 77 රජ පැමිණි වළගම්බා රජු විසින් අභයගිරි විහාරය ආරම්භ කිරීමෙන් අනතුරු ව නැවතත් විශාල ස්තූපයක් අභයගිරි විහාරයේ ඉදි කරන ලද බව මූලාශ්‍රයගත තොරතුරුවලින් පෙනේ. මහාවංසයට අනුව වළගම්බා රජු සෝමා දේවි බිසවුන්ගේ බස් අසා සිලා සොබ්බකඩක ස්තූපය, මහා ථූපයට උතුරින් කළ බව සඳහන් වේ (මව,33:88-89). මෙම ස්තූපය දැනට ලංකාරාමය වශයෙන් හඳුන්වන ස්තූපය බව චන්ද්‍රා වික්‍රමගමගේ ගේ මතය වේ (වික්‍රමගමගේ,1995:114). දීපවංසයට අනුව ද මෙම ස්තූපය පළමු වැනි ගජබාහුගේ බව සඳහන් වේ (*Dv*,22:13). කෙසේ වෙතත් අභයගිරි ස්තූපයේ හැඩය කෙබඳු ආකාරයට වූවාදැයි එක ම ග්‍රන්ථයකවත් සඳහන් නොවේ. මහාවංසයේ සඳහන් වන තොරතුරු අනුව දැනට දැකගත හැකි අභයගිරි ස්තූපයේ හැඩය පළමු වැනි පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රතිසංස්කරණය කරන ලද අවස්ථාවේ වූ හැඩය බව සිතාගත හැකි ය. එහි සඳහන් වන ආකාරයට අභයගිරි ස්තූපය එරජු විසින් එකසිය හතලිස් රියනක් උස් කර බඳවා ඇත (මව,78:101-102). එම ප්‍රතිසංස්කරණවලින් පසු වල්බිහි වී තිබූ මෙම ස්තූපයේ හැඩය පිළිබඳ අපට යමක් සිතාගත හැක්කේ ස්මිදර්ගේ සැලසුම් අනුව ය. ස්මිදර් විසින් 1894 දී මෙම ස්ථූපය ගරාවැටී තිබූ අයුරු ඔහුගේ සැලසුම්වලින් ඉදිරිපත් කර ඇත (Smither,1894,P,L:35-42). ස්තූපයේ ගරා වැටී තිබෙන ස්වරූපය අනුව අභයගිරිය එවකට දැකගත හැකි වන්නේ ධාන්‍ය ආකාර හැඩයෙනි. නමුත් 1978 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද කැනීම් හරස්කඩ හා පිළිසකර කිරීම් සඳහා අඳින ලද සැලසුම්වලට අනුව බුබ්බුලාකාර හැඩයක් ගන්නා බව පෙනේ.

ජේතවාරාම ස්තූපයේ හැඩය පිළිබඳ සැලකීමේ දී මෙය ද බොහෝ විට එයට පෙර ඉදිවූ විශාල ස්තූප දෙක වන රුවන්වැලි සෑය හා අභයගිරි ස්තූපයන්හි ආකාරය ගන්නා බව උපකල්පනය කළ හැකි ය. මෙම ස්තූපය ද අවසන් වශයෙන් ප්‍රතිසංස්කරණයට

ලක්කර ඇත්තේ පරාක්‍රමබාහු රජතුමා විසිනි. ක්‍රි.ව. 1153 - 1186 පොලොන්නරුවේ රජ පැමිණි මේ රජු රාජ්‍යත්වයට පත්වීමෙන් අනතුරු ව ජේතවනාරාම ස්ථූපය එකසිය සැට රියනක් උසට කරවූ බව මහාවංසයේ සඳහන් වේ (මව,78:102). නමුත් ස්තූපයේ හැඩය කුමන අයුරකින් වූවාදැයි එහි නිශ්චිත නොවේ. ජේතවන ස්තූපයේ හැඩය කුමන අයුරකින් පිහිටියා දැයි හඳුනාගැනීමට හැකි පුරාවස්තුවක් ජේතවන ස්තූප සලපතර මළුවේ තිබී 1980 දශකයේ සොයා ගෙන ඇත. දැනට ජේතවන විවෘත කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති මෙම පුරාවස්තුව ස්තූපයක ආකෘතිය දක්වන්නක් වේ. එහි දැනට ඉතිරි ව ඇත්තේ පේසා වළළු හා ගර්භය දැක්වෙන කොටස් පමණි. හුණුගල් පාෂාණයෙන් නිර්මාණය කර ඇති මෙම ආකෘතිය අව් වැසි සුළංවලට හසු වීමෙන් ඛාදනයට ලක් වී ඇති අතර, හතරැස් කොටුව හා උපරි ව්‍යුහය කැඩී ගොස් ඇත. එහි ගර්භයේ හැඩය බුබ්බුලාකාර ගන්නා අතර බොහෝ විට මෙය ජේතවන ස්තූප සළපතර මළුව තුළ තිබුණා වූ ස්තූපයේ ආකෘතිය දැක්වෙන්නක් වීමට ඉඩ තිබේ. මේ සඳහා අපට පාදක වන්නේ රුවන්වැලි සෑ ස්ථූප මළුවේ ද මෙවැනි ම කුඩා ස්තූප ආදර්ශයක් අදටත් දැකගත හැකි බැවිනි. මෙම කුඩා ස්තූපය දොළොස් වැනි සියවසේ දී නිශ්ශංකමල්ල රජු කරවූවක් බවත්, එය රුවන්විලි සෑ ස්තූපයේ ආදර්ශයක් බව චන්ද්‍රා වික්‍රමගමගේ සඳහන් කරයි (වික්‍රමගමගේ, 1990:146). ඒ අනුව විමසීමේ දී ලංකාවේ පුරාණ දාගැබ්වල සලපතර මළුව තුළ එවැනි ආකාරයේ කුඩා ස්තූප ආකෘති තිබුණ බවට ද නිදසුනක් ජේතවනයෙන් ද ලැබීම ඉහත අදහස පිළිගත හැකි වීමට බලපාන කරුණකි. ඒ අනුව බොහෝ විට ජේතවන ස්තූපයේ හැඩය මූලාශ්‍රයවල සඳහන් නොවූව ද දැනට හමු වී ඇති මෙම කුඩා ස්තූප ආකෘතියේ හැඩයට තිබෙන්නට ඇතැයි අපට විශ්වාස කළ හැකි ය.

මේ ආදර්ශය හැරුණු විට ස්තූපයේ හැඩය පිළිබඳ අපට කතා කළ හැක්කේ යටත්විජිත යුගයේ තොරතුරු පදනම් කරගනිමින් ය. ඒ අතරින් 1870 වර්ෂයේ දී ලෝර්ටන් (Lowton) විසින් ගනු ලැබූ පැරණි ඡායාරූපයකට අනුව ද ස්තූපයේ හැඩය බුබ්බුලාකාර හැඩයෙන් යුතු වන බව ද පෙනේ. එවකට ස්තූපය



වල්බිහි වී පැවතිය ද එහි වල් වැවී ඇති ස්වරූපය අනුව ස්තූපයේ හැඩය හඳුනාගත හැකි ය.

මින් අනතුරු ව ස්තූපයේ හැඩය පිළිබඳ ව අපට අදහසක් ලබාගත හැක්කේ ජේ.ජී. ස්මිදර්ගේ සැලසුම් මගිනි. 1894 දී ඔහු වාර්තා කර තිබෙන ආකාරයට ගරාවැටී ඇති ජේතවන ස්තූපයේ හැඩය හඳුනාගත හැකි වේ. ස්මිදර් විසින් අඳිනු ලැබූ සැලසුම අනුව ජේතවන ස්තූපය බුබ්බුලාකාර හැඩයෙන් යුක්ත ව දක්වා තිබේ (Smither,1894:P,L.45). එසේ ම 1903 වර්ෂයේ දී ඔටෙල් (Oertel) විසින් අඳින ලද සැලසුම් අනුව ද ජේතවන ස්තූපය බුබ්බුලාකාර හැඩයෙන් යුක්ත ව දක්වා ඇත. (Oertel,1903:No.08). 1980 දශකයේ සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය මගින් ඇරඹි ස්තූප සංරක්ෂණ කටයුතු සඳහා ස්තූපයේ හැඩය පිළිබඳ අධ්‍යයනයක් කර ඇත. ඩිසයින් ගෲෆ් ෆයිව් නැමැති වාස්තුවිද්‍යා ආයතනය විසින් කරනු ලැබූ එම අධ්‍යයනය අනුව එහි පැරණි ව්‍යුහයන් ද සළකා බලා ජේතවන ස්තූපයේ හැඩය බුබ්බුලාකාර හැඩයක් ගන්නා බව සැලසුම් මගින් දක්වා ඇත (PCJA:1995). මෙම තොරතුරු මගින් අපට නිශ්චිත ලෙස ම පෙන්වාදිය හැක්කේ ජේතවනාරාම ස්තූපය ඊට පෙර ඉදි වූ විශාල ස්තූපයන් දෙකෙහි ආකෘතිය අනුගමනය කරමින් බුබ්බුලාකාර හැඩයෙන් යුක්ත ව නිර්මාණය කර ඇති බව ය.

### ජේතවන ස්තූපයේ සැලැස්ම


ඓතිහාසික තොරතුරු අනුව ක්‍රි.ව. තුන් වැනි සියවසින් පසු ව ශ්‍රී ලංකාවේ වාස්තුවිද්‍යාවේ සීඝ්‍ර දියුණුවක් දැකගත හැකි බව පෙනේ. බෞද්ධාගමේ පුනර්ජීවනයත් සමඟ ම ස්තූපය විහාරයක ප්‍රධාන අංගය වූ බව අප ඉහත දී අවධාරණය කර ඇත. ඒ අනුව ස්තූපය ලංකාවේ මුල්බැස ගැනීමෙන් අනතුරු ව වාස්තුවිද්‍යාවේ දියුණුවත් සමඟ ම එහි සැලැස්මට විවිධ අංග එකතු වූ බව පෙනේ. දිව්‍යාවධානයට අනුව ස්තූපයක අංග ලෙස සතර දිසාවේ සෝපාන, ත්‍රිවේදී, අණ්ඩ, යූප යෂ්ටී, ඡත්‍ර යෂ්ටී, ඡත්‍ර, වර්ෂාස්තලි හා මහාමණී දැක් වේ (වික්‍රමගමගේ,1990:47). ශ්‍රී ලංකාවේ ක්‍රි.පූ. තුන් වැනි සියවසේ සිට ක්‍රි.ව. ආරම්භය දක්වා ස්තූපයක අංග ලෙස වංසකතාවල දැක්වෙන්නේ **පුප්ඵධාන, උදර, චතුරස්සචය, ඡත්‍ර** යන අංගයන් ය (මව,30:33).

වරින් වර නවාංග රැසක් ශ්‍රී ලංකාවේ ස්තූපයට ඉන්පසු ව එකතු වී ඇති අතර මූලාශ්‍රයවල සඳහන් වන ආකාරයට ඒවා ස්තූපවලට එක් වී ඇති ශත වර්ෂ පිළිවෙලින් මෙසේ ය.

- ක්‍රි.පූ. පළමු වැනි සියවස - ක්‍රි.ව. පළමු වැනි සියවස - වැලි මළුව, පාදවේදී, කුච්චවේදි, ඡත්ත්‍රානි ඡත්‍ර, ඇත් පවුර
- ක්‍රි.පූ. දෙ වැනි සියවස- ආදි මුඛ, කොත්කැරැල්ල, වාහල්කඩ
- ක්‍රි.ව. තුන් වැනි සියවස - වජ්‍රචුම්බට, හතරැස් කොටුව, පැතිවල මැණික්
- ක්‍රි.ව. පස් වැනි සියවස - තොරණ්
- ක්‍රි.ව. සය වැනි සියවස - හත්ථිවේදී
- ක්‍රි.ව. හත් වැනි සියවසින් පසු - දේවතා කොටුව, කොත්කැරැල්ල, කොත (වික්‍රමගමගේ, 1990:48).

මේ ආකාරයට ස්තූපයේ මුල් සැලැස්ම සඳහා එය ආරම්භ වී ක්‍රි.ව. හත් වැනි සියවසින් පසු යුගය දක්වා විවිධ අංග එකතු වෙමින් ස්තූපයේ සැලැස්ම වර්ධනය වූ බව විද්වතුන් පෙන්වා දී ඇත.


අනුරාධපුර ජේතවනාරාම ස්තූපයේ සැලසුම අධ්‍යයනය කිරීමේදී මෙවැනි අංගයන්ගෙන් යුක්ත වූ ස්තූපයක් තිබුණු බව දැකගත හැකි ය. එහි සැලැස්ම මෙසේ ය.






1. පිවිසුම් දොරටුව
2. වැලිමළුව
3. ඇත් පවුර
4. සලපතර මළුව
5. ආයක
6. පේසා වළළු
7. ගර්භය
8. හතරැස් කොටුව
9. දේවතා කොටුව
10. කොත්කැරැල්ල හා කොත

ඒ අනුව අනුරාධපුර ජේතවන ස්තූපයේ තිබුණා වූ අංගයන් අපට හරස්කඩකින් මෙසේ දැක්විය හැකි ය.




ජේතවන ස්තූපය සඳහා මෙම අංගයන් එක විට එකතු වූ අංග ලෙස සැලකිය නොහැකි බව මූලාශ්‍රයගත තොරතුරු හා පුරාවිද්‍යාත්මක තොරතුරුවලින් පැහැදිලි වී ඇත.

දැනට අනාවරණය කරගෙන ඇති තොරතුරු අනුව ජේතවන ස්තූපයේ පේසා වළළු යනුවෙන් හඳුන්වනු ලබන

ස්තූපාංගය ජේතවනාරාම ස්තූපය ආරම්භයේ සිට ම පැවති බව පෙනේ. ඉන්දියාවේ දී මෙම අංගය මේධි වශයෙන් හඳුන්වා ඇත (පරණවිතාන,1963:13). මහාවංසය එය හඳුන්වා ඇත්තේ පුප්ඵධාන යනුවෙනි (මව,30:51-56). මෙයට අමතර ව **තුන් මහල් පියවසා** යන නාමය ද තුන් වැනි සියවසට අයත් ග්‍රන්ථවල යොදා ඇත (එම:13). එසේ ම වේදිකා භූමි වශයෙන් ද මේවා හඳුන්වා ඇත (රාහුල,1989:123). අනුරාධපුර ස්තූපයන්හි ඇති පේසා වළළු දැනට වර්තමානයේ සිංහලයෙන් ව්‍යවහාර වනුයේ **තුන් මහල් පේසාව** හෙවත් **පේසා වළළු** යනුවෙනි (පරණවිතාන,1963:13). යථෝක්ත නම්වලින් හැඳින්වුණු තුන් මහල් පේසාව විවිධ කාර්යය සඳහා පුරාණයේදී භාවිත කළ බවට ද මූලාශ්‍රය සාධක තිබේ. පාලියෙන් **පුප්ඵාධාන** වශයෙන් හැඳින්වූ මෙහි තේරුම **මල් පුදන අසුන** බැව් පරණවිතානගේ මතය වේ (එම:13). සර් ජෝන් මාර්ෂල් සාංචි ස්තූපයේ එක් පේසාවක් ඇති බවත් එය ප්‍රදක්ෂිණා පථයක් වශයෙන් හඳුන්වන ලද බවත් ප්‍රකාශ කර තිබේ (වික්‍රමගමගේ,1990:50). වල්පොල රාහුල හිමියන්ගේ මතය වන්නේ ද **වේදිකා භූමි** වශයෙන් හැඳින් වූ පේසා වළළුවල බැතිමතුන් වටා යමින් වන්දනාමාන කළ බව ය (රාහුල,1989:123). මෙම කරුණු සනාථ කිරීම සඳහා රාහුල හිමි ඉදිරිපත් කරන තර්ක අතර මිරිසවැටිය හා කණ්ඨක චේතියේ පේසාවන්ට නැගීමට තිබූ පැරණි පියගැට පේළි ඉහත කාරණය සඳහා භාවිත කළ බව ප්‍රකාශ කර ඇත (එම:123). ජේතවනාරාම ස්තූපයේ ද දකුණු පසින් පේසා වලළුවලට නැගීමට තැනූ මෙවැනි ම පඩිපෙළක් 1999 වර්ෂයේ දී ජේතවන ස්තූපයේ පේසා වළළු කැණීමේ දී අනාවරණය කරගත හැකි විය. එම පඩිපෙළට සමානත්වයක් දක්වන පඩිපෙළක ශේෂ දකුණු ආයකය හා බටහිර ආයකය පිටුපසින් ද වාර්තා වී ඇත (මැන්දිස්,1997:8-9). මේ අනුව රාහුල හිමි ඉදිරිපත් කරන තර්කය වන වන්දනා කරුවන්ට ස්තූපයේ පේසා වළළුවලට නැග ඒ වටා යමින් වන්දනාමාන කරන්නට ඇතැයි යන්න පිළිබඳ ව ඉදිරිපත් කර ඇති අදහස ජේතවන ස්තූපයේ පේසා වළළුවලට නැගීමට ඉදිකර ඇති පඩිපෙළින් ද තහවුරු වේ.

ජේතවනාරාම ස්තූපයේ පේසාවේ සිට ගර්භය දක්වා වූ පැරණි කොටස එතරම් වෙනසකට භාජනය නොවී පෙර



තත්ත්වයෙන් ම පැවති බවට නිදසුන් තිබේ. මෙම ස්තූපය අවසන් ප්‍රතිසංස්කරණය කළ බව සඳහන් වන්නේ පළමු වැනි පරාක්‍රමබාහු යුගයේදී ය. එරජු විසින් ස්තූපය රියන් 160 ක් ඉහළට බැඳ වූ බව මහාවංසයේ සඳහන් වේ (මව,78:102). වර්තමානයේ සිදු කරනු ලැබූ පර්යේෂණ අනුව ද පැහැදිලි වී ඇත්තේ මෙම ස්තූපයේ ගර්භය ස්තූපය ඉදිකළ වකවානුව හා එතරම් වෙනසකට භාජනය වී නැති බව ය. විශේෂයෙන් ම මේ සඳහා පෙන්වාදිය හැක්කේ ස්තූපයේ පාදම, පේසා වළළු හා ගර්භය ආශ්‍රයෙන් සිදු කළ පර්යේෂණවලදී පාදමේ සිට එක ම බැම්මකින් තුන් මහල් පේසාව සම්පූර්ණ කිරීමෙන් අනතුරු ව ස්තූපයේ ගර්භය බැඳීම ආරම්භ කර ඇති බවය. (මැන්දිස්,1997:98). ඒ අනුව ස්තූපයේ පාදමේ පරිමාණවල විශේෂ වෙනසක් සිදු වී නොමැති අතර ගර්භය ද මේ අනුව විශේෂ වෙනසකට භාජනය විය නොහැකි බව පෙන්වාදිය හැකි ය.

ජේතවනාරාම ස්තූපයේ උපරි භාගය අධ්‍යනයේ දී කිනම් අංගවලින් යුක්ත වූවාදැයි සිතීමට එතරම් පුරාවිද්‍යාත්මක සාධක නොමැත. ලංකාවේ ස්තූපයේ විකාශනය අධ්‍යයනයේ දී උපරි භාගය එනම් ගර්භයෙන් ඉහළ කොටස තුළ සැළකිය යුතු දියුණුවක් ඇති වූ බව පෙනේ (පරණවිතාන,1963:25). දැනට ස්තූප මුදුනේ ඇති හතරැස් කොටුව යන්නට මහාවංසයේ භාවිත වී ඇත්තේ **චතුරස්වය** (සිව්කොන්) සෑය යන්නයි (මව,31:124). මහාවංසයේ තවත් තැනකත **මුද්ධවේදී, හර්මිකා** යන නම්වලින් ද මෙය හඳුන්වා ඇත (මව,32:05). ඉන්දියාවේ පැරණි බ්‍රාහ්මී සෙල්ලිපිවලින් දැක්වෙන **වේදි, වේදිකා** යන නාමයන්ට ඒවායේ ප්‍රකෘත පර්යාය නාමයන් ද පාවිච්චි කරන ලද්දේ ඉන්දියාවේ පැරණි ස්තූපවල දක්නට ලැබෙන පරිදි ගරාදි වැටක් හැඳින්වීම පිණිස ය (පරණවිතාන,1963:25). **මුද්ධ** යන්න හිස නැතහොත් මුදුන යන අර්ථය ගෙන දේ. එබැවින් **මුද්ධවේදී** යන සමාසයෙන් තේරුම් යන්නේ මුදුන් ගරාදි වැට යන්න ගම්‍ය වේ. එනම් ස්තූප ගර්භය මුදුනේ පිහිටි ගරාදි වැට ඉන් අදහස් කෙරේ (එම:25). දැනට ජේතවනාරාම ස්තූපයේ හතරැස් කොටුවේ සිදු කරන ලද කැනීම්වලින් එහි පැරණි බැම්මට අයත් කොටස් කිහිපයක් 1995 වර්ෂයේදී සොයා ගන්නා ලදි. එහි ස්වරූපය

අධ්‍යයනයේ දී පැහැදිලි වන්නේ චතුරස්‍රාකාර ගඩොල් ගණයේ පැතිවල ගරාදි වැටක ස්වරූපය බදාමයෙන් දක්වා ඇති බව ය (බණ්ඩාර,1995:28-29). මේ ආකාරයට ම අභයගිරි ස්තූපයේ හතරැස් කොටුවේ පැතිවල ගරාදි වැටේ කැටයම් බදාමයෙන් දක්වා තිබේ (වික්‍රමගමගේ,1990:53). කෙසේ වෙතත් ජේතවන ස්තූපයේ මුල් හතරැස් කොටුවේ හැඩය කෙබඳු වී දැයි සෙවීමට මූලාශ්‍රය දත්තවලින් එතරම් පිටුවහලක් නොලැබේ. නමුත් මහාවංසයේ සඳහන් වන මුද්ධවේදී නමින් හැඳින්වෙන ගරාදි වැටක් සහිත වූ හතරැස් වේදිකාවක් ජේතවන ස්තූපයේ තිබුණේ ද යන්න පිළිබඳ ව උපකල්පනය කළ හැකි සඳහනක් වේ. එහි සඳහන් වන ආකාරයට ක්‍රි.ව. 469 - 477 ධාතුසේන රජු දවස මහසෑ තුනෙහි දිරා ගිය ඡත්‍ර අලුත්වැඩියා කළ බව සඳහන් වේ (මව,38:58-565). මහාවංසයේ සඳහන් වන ආකාරයට ක්‍රි.ව. පස් වැනි සියවස අවසාන භාගයේ දී පමණ දී අනුරාධපුර මහ සෑ තුනෙහි ඡත්‍ර තිබූ බව පෙනේ. එසේ නම් ඡත්‍රාවලියක් තිබූ ස්තූපයක ඝණයක් ලෙස නිම වූ හතරැස් කොටුවක් තිබීමට ඉඩ තිබේ දැයි ගැටළු සහගත කරුණක් වේ. එසේ ම ක්‍රි.ව. 576 - 608 රජ වූ පළමු වැනි අග්ගබෝධි රජු රත්‍රං ආලේපිත ඡත්‍රයක් ජේතවන ස්තූපයට කළ බව ද සඳහන් වේ (Mv,42:10,11,26,31).

ලංකාවේ ස්තූපය සඳහා ඡත්‍ර යෙදීම පිළිබඳ මුල් සඳහනක් අපට ලබාගත හැක්කේ මහාථූපය (රත්නමාලී) දාගැබ අවසන් කිරීම පිළිබඳ ව මහාවංසයේ සඳහන් වන විස්තරයෙනි. රත්නමාලි දාගැබ හතරැස් කොටුව දක්වා නංවන ලද කළ දුටුගැමුණු රජුට මාරාන්තික රෝගයක් වැළඳුණි. ඉන් අනතුරු ව දුටුගැමුණු රජුට සෑය නිමකළ බව පෙන්වීමට ඔහු මල් සද්ධාතිස්ස රජු එය නිමකළ බව පෙන්විමට "**සන්නාලියන් ලවා සුදු පිළියෙන් සැට්ටයක් කරවා එයින් වැසසවීය සිත්තරුන් ලවා ගරාදි වැට ද පූර්ණඝට පංතීන් හා පංචාගුලික පංතීන් ද කරවීය. මෙසේ සිතුවම් කරවා වඩුවන් ලවා හුණු දඬුමුවා ඡත්‍රය ද මුද්ධ වෙදිකාවේ කරපත් මුවා හිරු සඳු ද කරවීය**˜ (මව,32:3-6). මේ අනුව රත්නමාලි ස්තූපය ඉදිකළ ක්‍රි.පූ. පළමු වැනි සියවස වනවිට ඡත්‍රය ස්තූපයේ මුද්ධවේදිය මැද තිබූ බව පෙනේ. එයින් පැහැදිලි වන්නේ හතරැස් කොටුව ඝණයක් ලෙස ඉදි නොවී තිබුණු බවයි (මින් පසු යුගවලදී ක්‍රි.පූ.



20 - ක්‍රි.ව. 69 රජ පැමිණි භාතිය රජු "**රත්නමාලි දාගැබේ මුද්ධ වේදිකා හා කුච්ඡවේදිකා යන ගරාදි වැට දෙකක් කරවා ඇත**" (මවටී.:506). ඉන් අනතුරු ව ක්‍රි.ව. 21 - 30 රජ වූ අමණ්ඩ ගාමිණී රජු ද රුවන්වැලි දාගැබේ ද **මුද්ධ වේදිකාව** හා **කුච්ඡ වේදිකාව** තනවා ඇත (මව,35:02). පරණවිතානගේ මතය වන්නේ අවුරුදු 50 කට අඩු කාල සීමාවක දී අමණ්ඩ ගාමිණී රජු අළුත් ගරාදි වැටක් ඉදි කරනු ලබන්නේ මුදුන් ගරාදි වැට ලීයෙන් කරන ලද්දක් නිසා බව ය (පරණවිතාන,1963:27). මෙම කරුණ අනුව පැහැදිලි වන්නේ ක්‍රි.පූ. පළමු වැනි හා ක්‍රි.ව. මුල් සියවස තුළ ඉදි වූ දාගැබ්වල ඡත්‍රයක් හා හතරැස් කොටුව සඳහා ලී භාවිත කළ බවට මූලාශ්‍රයවල සඳහන්ව තිබෙන බව ය.

මූලාශ්‍රයගත තොරතුරුවල සඳහන් ආකාරයට කනිට්ඨතිස්ස රජු ක්‍රි.ව. 165 - 195 ස්තූප අටක ඡත්‍ර ඉදිකර තිබේ (මව,36:33-35). එසේ ම ක්‍රි.ව. 247 - 251 රජ වූ සංඝතිස්ස රජු ද මහා ථූපයට ඡත්‍ර ඉදිකර තිබේ (මව,36:65-66). මේ ආකාරයට සය වැනි සියවස දක්වා ම ස්තූප සඳහා ඡත්‍රකළ බව සඳහන් වේ. ඡත්‍ර පිළිබඳ සඳහන් එසේ වුව ද සිව් වැනි සියයවසින් පසු ඉතිහාස ග්‍රන්ථවල මුද්ධවේදී ගැන කිසිවක් සඳහන් නොවේ (පරණවිතාන,1963:28). ලීයෙන් තැනූ මුදුන් ගරාදි වැට අතහැර දමන ලද්දේ කවර කලෙක දැයි පෙන්වීමට නිශ්චිත සාක්ෂි නැති අතර පරණවිතානගේ මතය වන්නේ අනුරාධපුර අවසාන සමයේ දී එනම් අට වැනි සහ දස වැනි සියවස් අතර කාලයේ දී හතරැස් කොටුවල ගඩොළු කර්මාන්තයේ ගරාදි වැට උන්නත ව දක්වා ඇති බව ය. ඒ අනුව ඔහුගේ මතය වන්නේ මුදුන් ගරාදි වැට සම්බන්ධයෙන් ඉහත කී වෙනස සිදු වූයේ සිව් වැනි සියවසටත් අට වැනි සියවසටත් අතර කාලයේ දී බව ය (පරණවිතාන,1963:28). මෙම තර්කය ඉතා වැදගත් තර්කයක් වේ. විශේෂයෙන් ම ජේතවන ස්තූපය ඉදිකළ වකවානුව ක්‍රි.ව. 4 වැනි සියවසට අයත් කාල පරිච්ඡේදයකි. මහාවංසයේ හෝ වෙනත් වංසකතාවක ජේතවනාරාමයේ හතරැස් කොටුව පිළිබඳ කිසිදු සඳහනක් නැත. කිසියම් රජ කෙනෙකු මේ ස්තූපය සඳහා මුද්ධවේදී හෝ කුච්ඡවේදි කළ බව ද සඳහන් නොවන අතර, ඡත්‍ර යෙදූ බව ක්‍රි.ව. පස් වැනි හා සය වැනි සියවස තුළ දී සටහන් වී ඇත (මව,පරි:38-42).

ස්තූපය ආරම්භ වී විකාශය වීමේ දී මුල දී ලීයෙන් තැනූ ගරාදි වැටක් පැවති බවට තොරතුරු ඉහත පෙන්වා දී ඇත. ඉන් අනතුරු යුගවල දී ගරාදි වැට ලීයෙන් තැනීමට ඇති බවත් ඉතා කෙටි කාලයක් තුළ ඒවා ප්‍රතිසංස්කරණයට බඳුන් කිරීමෙන් පෙනේ. විශාල ස්තූපවල මෙවැනි කටයුත්තක් ඉතා කෙටි කාලයක් තුළ ඉදි කිරීම අපහසු කාර්යයක් වූ බැවින් ජේතවනාරාම ගොඩනැංවූ සිව් වැනි සියවස තුළ දී ස්තූපයේ හතරැස් කොටුව තනිකර ම ඝණයක් ලෙස ගඩොලින් නිමවා ඒ මත ගරාදි වැටේ ස්වරූපය බදාමයෙන් දක්වන්නට ඇතැයි උපකල්පනය කිරීම සාධාරණ ය. 2000 වර්ෂයේ දී ජේතවන ස්තූපයේ හතරැස් කොටුවේ වයඹ මුල්ලේ සිදු කරන ලද කැණීමක දි එහි හතරැස් කොටුවේ නිර්මාණ තාක්ෂණය අධ්‍යයනය කිරීමට කතුවරයාට පිටුවහලක් ලැබුණි. ගර්භය ඉහළ මතුපිට සිට මීටර් 2 1/2 ක් පමණ ගැඹුරට සිදු කරන ලද මෙම පර්යේෂණ කැණීමේ දී හතරැස් කොටුව ඉදිකර ඇති තාක්ෂණය හඳුනාගත හැකි විය. ඒ අනුව හතරැස් කොටුව ඉදිකර ඇත්තේ ගර්භයේ ඉහළ සිට මීටර් 2 ක් ඇතුළතිනි. ගර්භ බැම්ම මතින් ආරම්භ වන හතරැස් කොටුව එකිනෙක ජේලිය ඇතුළට සෙ.මී. 2 ක් පැන්වූ ගඩොල් වරි 12 ක් බැඳ එතැන සිට මීටර් 1 ක් ඍජු ව ගඩොල් වරි 14 ක් ගර්භයේ ඉහළ හතරැස් කොටුවේ අර්ධඃපද්ම බොරදම දක්වා බැඳ තිබේ (මැන්දිස්,2000:23). මේ කරුණ මගින් පැහැදිලි වන්නේ ජේතවන ස්තූපයේ හතරැස් කොටුව ගර්භය ඉහළට බැඳීමෙන් අනතුරු ව තනා ඇති බව ය. ඒ අනුව ජේතවන ස්තූපයේ හතරැස් කොටුවේ ගර්භයට වැසී ඇති පාදමේ එක් පැත්තක දිග මීටර් 28 (අඩි 92. 4 කි). වර්ග අඩි 8537. 76 (පර්චස් 31. 35) ක ප්‍රමාණයක් හතරැස් කොටුව සඳහා යටකර ඇත. මෙවැනි විශාල කර්මාන්තයක් ආක්‍රමණවලින් පසු රජ වන රජ කෙනෙකුට කළ හැකි දෙයක් නොවන බව පැහැදිලි වන අතර, බොහෝ විට මේ ස්තූපය තුළ මෙම හතරැස් කොටුව ආරම්භයේ සිට තිබෙන්නට ඇත. පොළොන්නරු යුගයේ දී පළමු වැනි පරාක්‍රමබාහු රජතුමා ස්තූපය ප්‍රතිසංස්කරණය කිරීමේ දී කැඩීබිඳී ගිය කොටස් නැවත පිළිසකර කරන්නට ඇත. විශේෂයෙන් මෙවැනි ම විශාල ස්තූප දෙකක් වන අභයගිරිය හා රුවන්වැලිය මේ අවධියේ දී ප්‍රතිසංස්කරණයට ලක්වීම නිසා එම යුගයේ අළුතින් එකතු වූ බවට පිළිගත නොහැකි ය.



මහාවංසයේ සඳහන් වන ආකාරයට ජේතවන ස්තූපය ක්‍රි.ව. 5 - 6 සියවස් වන විටත් ඡත්‍ර තිබූ බව සඳහන් වේ. නමුත් මූලාශ්‍රයවල සඳහන් වන ආකාරයට ඡත්‍ර තිබූ බවට පුරාවිද්‍යා සාක්ෂ්‍යය මේ ස්තූපය ආශ්‍රයෙන් මෙතෙක් සොයා ගෙන නොමැත. ඡත්‍රයක් සාදන ලද්දේ කවර ද්‍රව්‍යකින් දැයි වංසකතාවල පල වන්නේ කලාතුරකිනි. එක් තැනක හෝ දෙතැනක ඒවා වටිනා ලෝහවලින් තැනූ බව සඳහන් වේ. එහෙත් ඊට වැඩි හරියක් ලීයෙන් නිම වූ අතර, සමහර ඡත්‍ර ගලින් නිමවා තිබෙන්නට ඇත (පරණවිතාන,1963:32). ගලින් නිමවූ ඡත්‍ර කිහිපයක් අනුරාධපුර රුවන්වැලි සෑ මළුවෙහි හා අභයගිරි ස්තූප මළුවල දැකගත හැකි අතර, මේවා ස්තූපයේ විශාලත්වයට අනුකූලතාවයකින් යුත් ප්‍රමාණයකින් යුක්ත නොවේ. එම ඡත්‍ර බොහෝ විට ස්තූප මළු මත වූ කුඩා ස්තූපවල ඒවා වීමට බොහෝ දුරට ඉඩ තිබේ (එම:32). ක්‍රි.ව. හත් වැනි සියවසින් පසු දිවයිනේ දාගැබ්වල උපරි භාගය සම්බන්ධ ව වැදගත් සංවර්ධනයක් වූ බවට පුරාවිද්‍යාත්මක සාධක තිබේ. මෙය හේතු කරගෙන ස්තූපයන් මත ඡත්‍ර යෙදීම සාමාන්‍ය වශයෙන් ම සම්පූර්ණයෙන් ම නැවතිණි (එම:32).

මෙම ඓතිහාසික තොරතුරු අනුව අනුරාධපුර ජේතවනාරාම ස්තූපයේ ඡත්‍රයක් බොහෝ විට ඝණයක් ලෙස තැනූ හතරැස් කොටුව මත තිබෙන්නට ඇතැයි අපට උපකල්පනය කළ හැකි ය. විශේෂයෙන් ම අනුරාධපුරයේ මිරිසවැටිය, රුවන්වැලිය, අභයගිරිය වැනි මහා ස්තූප මළුවල හමුවන යූපගල නමැති අංගය ජේතවන ස්තූපය ආශ්‍රයෙන් දැකගත නොහැකි ය. පැරණි ථූපවල මෙම යූපගල හර්මිකාව මැද (හතරැස් කොටුව) පිහිටුවා ඒ දෙපස ඡත්‍ර තිබෙන්නට ඇතැයි පරණවිතාන අදහස් කරයි (එම:32). මෙවැනි අංගයන් ජේතවන ස්තූපය මත හෝ මළුව මත හෝ ඒ බිම ආශ්‍රයෙන් මෙතෙක් හඳුනාගත නොහැකි වුයේ යූප ගල නමැති අංග මෙම ස්තූපය ආශ්‍රයෙන් නොපැවති නිසා ද යන්න ප්‍රශ්නාර්ථයක් ගෙන දෙන කාරණයක් වේ. කෙසේ වෙතත් ජේතවන ස්තූපය නිර්මාණය කළ සියවස් කිහිපයක් ඇතුළත එහි උපරි ව්‍යුහය තුළ ද සීඝ්‍ර වර්ධනයක් වූ බව මෙම කරුණු අපට සනාථ කරගත හැකි ය.

අනුරාධපුර මහ දාගැබ් අතරින් උපරි භාගයේ සැහෙන ප්‍රමාණයක් ශේෂ ව පවතින්නේ අභයගිරියේ පමණි. දහ නව වැනි සියවසේ අවසාන භාගය දක්වා ම ජේතවන දාගැබේ උපරි භාගය ද බොහෝ දුරට ආරක්ෂා වී පැවතී ඇත. එය ගරාවැටීමෙන් අනතුරු ව එච්.සී.පී. බෙල්ගේ පරිපාලනය යටතේ පැරණි සැලැස්ම අනුව නැවත තනවා ඇත (පරණවිතාන,1963:33). මීට කලින් අප පෙන්වාදුන් පරිදි ශ්‍රී ලංකාවේ ස්තූපවල ඡත්‍ර කරවීම ක්‍රි.ව. හත් වැනි ශත වර්ෂයේ දී පමණ නතර විය. ඡත්‍ර වෙනුවට කොත්කැරැල්ල යොදා ගන්නා එම ථූප කොටස දේවතා කොටුව බවට පත් කරගෙන තිබේ (වික්‍රමගමගේ,1990:54). ලංකාවේ පාලි වංසකාවන්හි හෝ සිංහල සාහිත්‍ය කෘතිවල හෝ දාගැබේ මෙම කොටස් ගැන සඳහන් නොවේ. ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථයක හතරැස් කොටුවේ මැද සිට රවුම් ව කළ මෙම කොටස **සුරාකෝෂ්ඨ** නමින් හඳුන්වා තිබේ (පරණවිතාන,1963:34). මෙම වචනය **දේවතා කොටුව නමින් සිංහලට** හැරී ඇත්තේ සංස්කෘ භාෂාවට පෙරළීමෙන් බව පැහැදිලි වේ. දේවතා කොටුව මත කොත්කැරැල්ල නම් වූ ගඩොලින් කළ කේතුකාකාර කොටස පිහිටියේ ය. කේතුව ඉහළට විහිදීමේ දී ක්‍රමයෙන් සිහින් වන ආකාරයට තනා ඇත (එම:34). අනුරාධපුර දාගැබ්වල පැරණි කොත් කැරළි සම්පූර්ණයෙන් ආරක්ෂා වී නොමැති හෙයින් ආරම්භයේ දී කොතරම් උසින් යුක්ත වූවා දැයි කිව නොහැකි ය. අභයගිරි දැගැබේ මුදුණ කැඩී ගිය කොත්කැරැල්ල තවමත් අඩි 57 අඟල් 6 ක් උස ය (පරණවිතාන,1963:34). බෙල් විසින් ජේතවන ස්තූපය සංරක්ෂණය කිරීමේදී එම කොත්කැරැල්ල කොතරම් උසකට තිබුණේ දැයි නිශ්චිත නොවේ. නමුත් ඔහු එහි පැරණි ස්වරූපය උපයෝගී කරගෙන මීටර් 16 ක් උසට (අඩි 53) කොත්කැරැල්ල නැවත ගොඩනංවා තිබේ.

ඡත්‍රාවලිය කොත්කැරැල්ලක් බවට විකාශනය වූයේ කවර වකවානුවක දැයි දැක්වීමට නිශ්චිත පුරාවිද්‍යාත්මක සාධක අපට නැත. කේතුකාර කොත් කැරළි සැකසීමේදී එහි පහත පේළිවල ගඩොල් ඉහළ ඒවාට වඩා විශාල වේ. බොහෝ විට පෙදරේරුවන්ගේ දැනගැනීම සඳහා ගඩොල් පේළි සඳහා නියමිත ගඩොල්වල පිළිස්සීමට ප්‍රථම විශේෂ අක්ෂරයෙන් සීල් තැබීම



හෝ පේළි අංකයක් ගඩොල් මත කෙටීම සිදුකර ඇත. මේ බවට සාක්ෂය අභයගිරි දාගැබේ කොත් කැරැල්ලේ සිට බිමට ඇද වැටී තිබූ ගඩොළුවල දක්නට ලැබී තිබේ. එහි අට වැනි සියවසට පමණ අයත් අක්ෂරයෙන් ඒ ඒ පේළිවල අංකය කොටා තිබූ බව පෙනේ (පරණවිතාන,1963:35). මෙයට අමතර ව හත් වැනි හා අට වැනි සියවස අතර කාල පරිච්ඡේදයට අයත් පෙදරේරු සලකුණ අනෙකුත් ස්ථානවලින් ද සොයා ගෙන ඇත. ඒ අනුව ඒවා දාගැබ් කොත්කැරළිවල කාලය දැනගැනීමට නිවැරදි සළකුණු වේ. මෙසේ ලංකාවේ චෛත්‍යවල ලීයෙන් හෝ ගලින් නිම වූ ඡත්‍රාවලිවලට කේතුකාර ගඩොල් කොත්කැරළි බැදීම ආරම්භ වූයේ පස් වැනි සියවසින් පසු ව බවට අපට නිශ්චය කළ හැකි ය. පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍යවලින් අප දැනගන්නා මෙම කාරණා හත් වැනි සියවසින් පසු වංසකතාවන්හි ස්තූපයන්ගේ ඡත්‍ර ගැන සඳහන් නොවීම හා සසැඳේ (එම:35). වංසකතා තොරතුරු අනුව ජේතවනාරාම ස්තූපය සඳහා අවසන් වරට ඡත්‍රයක් කළ බව සඳහන් වන්නේ පළමු වැනි අග්ගබෝධි රජු ක්‍රි.ව. 575 - 608 වේ. මේ යුගය ක්‍රි.ව. හත් වැනි සියවස අවසාන භාගය වේ. ඒ අනුව පරණවිතාන දක්වන තර්කයන් අනුව මහා ථූපවල ඡත්‍ර වෙනුවට කොත්කැරැල්ල යෙදීම හත් වැනි සියවසින් පසු ව සිදු වූ බව පවසන තර්කය පිළිගත හැකි කාරණයක් වේ. නමුත් ජේතවනාරාම විහාරයේ කොත්කැරැල්ල හා සම්බන්ධ කොටස් කුමන රජවරයෙකු යටතේ සිදු වූවාදැයි වංසකතාවලින් සාධක සොයා ගත නොහැකි ය. තුන් වැනි මොග්ගල්ලාන රජු ක්‍රි.ව. 618 - 623 අවසන් වශයෙන් ජේතවන ථූපය සඳහා පිරියම් කටයුතු කළ බව සඳහන් වේ (*Mv*,44:44) ස්තූපයේ අවසන් ප්‍රතිසංස්කරණය පළමු වැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153 - 1186) විසින් සිදුකර ඇති අතර එරජු විසින් ස්තූපය රියන 160 ක් උසට කරවන ලද බව මහාවංසයේ සඳහන් වේ (මව,78:102). පරණවිතානගේ මතයට අනුව මෙම ස්තූපය එවකට රියන් 160 කින් (අඩි 400) යුක්ත විය (පරණවිතාන,1963:07). පරණවිතාන පවසන ආකාරයට ජේතවන ස්තූපය අඩි 400 ක් උස් වුවා නම් ඒ සඳහා අනිවාර්යෙන් ම ඡත්‍රාවලියක් තිබිය නොහැකි ය. එවන් උසකට ඡත්‍ර පේළියක් නැංවීම අපහසු කාර්යයක් වන බැවින් පොළොන්නරු යුගය වනවිට අනිවාර්යයෙන් ම ජේතවන

ස්තූපයේ කොත්කැරැල්ලක් තිබූ බව පෙනේ. බොහෝ විට පස් වැනි සහ අට වැනි සියවස් අතරෙහි දී ජේතවනාරාම ස්තූපයේ කොත්කැරැල්ල තැනීමට ඇතැයි යන නිගමනයට පැමිණීම තර්කානුකූල වේ. කෙසේ වෙතත් 1999 වර්ෂයේ දී ජේතවන ස්තූපයේ නැගෙනහිර ආයකය අභ්‍යන්තරය කැනීම් කිරීමේදී එහි ඉහළ ම පේසාව ඇතුළත මීටර් 5ක් දිග මීටර් 4ක් පළල විශාල හතරැස් කළුගලක් වාර්තා වී ඇත (මැන්දිස්, ලියනගේ, 1999). හුණු කපරාරු කරන ලද පේසාව ඇතුළත මෙවන් ටොන් ගණනක් බර ගලක් තැබීමට කිසිඳු හේතුවක් තිබිය නොහැකි ය. විශේෂයෙන් ම අභයගිරිය වැනි ස්තූපයක දැකිය හැකි ප්‍රමාණයේ යූප ගලක් ජේතවන ස්තූපයට අවශ්‍ය වේ. ස්තූපය නිර්මාණය කරන ක්‍රි.ව. 276 සමයේදී කොත්කැරැල්ල වෙනුවට යූපගලක් තිබූ බව මූලාශ්‍රය සාධක අනුව පෙනේ. එබැවින් මෙම විශාල කළුගල ජේතවන ස්තූපයේ යූපගල තැනීම සඳහා ඉහළට ගෙනයාම ගඩොළු වරියෙන් වරිය බැඳීමේදී සිදු වී ඇති බව පෙනේ. ස්තූපයට යූපගල යෙදීම අත්හැරිය විට මෙම විශාල කළුගල ඉහළට ගෙන යාම අවශ්‍ය නොවූ බැවින් එය ස්තූපයේ තුන් වැනි පේසාව තුළ තබා වසා දමා ඇති බව පැහැදිලි වේ.

ජේතවනාරාම ස්තූපයේ වාස්තුවිද්‍යා සැලැස්මේ කැපීපෙනෙන අංගයක් ලෙස ආයක පෙන්වාදිය හැකි ය. අනුරාධපුරයේ අභයගිරි, ජේතවන, රුවන්වැලි හා දක්ෂිණ ථූපයන් හි ද මිහින්තලේ කණ්ඨක චේතියේ ද ආයක කැටයම් මෙතෙක් දක්නට හැකි ය. මිරිසවැටි දාගැබේ බටහිර ආයකයත් මිහින්තලේ කණ්ඨක චේතියේ ආයක කිහිපයකුත් මේ අතරින් වඩාත් නිරුපද්‍රිත ව පවතී. එහෙත් මෙම ආයක නිර්මාණ සියල්ල එක් ව ගත්කල්හි ඒවායේ නිර්මාණ සැලැස්ම හා කැටයම් ඇතුළු සැරසිළි අංගයනුත් එකිනෙකට එපමණට වෙනස් නොවේ. ආයකවල මිනුම්වල හා සැරසිලිවල ඇති අවශ්‍ය වෙනස්කම් කිහිපයක් හැරුණු කළ අනුරාධපුරයෙහි හා මිහින්තලයේ ඇති ආයක නිර්මාණ මෙසේ එකිනෙකට ඉමහත් ලෙස සදෘශරූපි වීමෙන් පෙනෙන්නේ ආයක නම් වූ දාගැබ් අංගය නිමවීමේදී එක්තරා පොදු සම්මුතියක් ශ්‍රී ලංකාව තුළ පැවතී ඇති වගය (පරණවිතාන, 1963:38). පරණවිතානගේ මතයට අනුව ආයක



යන්න ඉන්දියාවේ අමරාවතී ස්තූපය අනුසාරයෙන් සොයාගත් අංගයක් බව පෙනේ (එම:48-49).

ලංකාවේ ආයක නිර්මාණ කෙබඳු කලෙක සිට පවතින අංගයක් දැයි විමසීමේදී ඒ පිළිබඳ ව විවිධ අදහස් ඇත. බෙන්ජමින් රෝලන්ඩ්ගේ අදහසට අනුව මෙම නිර්මාණය ක්‍රි.ව. තුන් වැනි හා සිව් වැනි සියවස්වලට අයත් වේ. නමුත් පරණවිතානගේ මතය වන්නේ ක්‍රි.ව. දෙ වැනි සියවසට අයත් බව ය (පරණවිතාන,1963:46). අභයගිරි දාගැබේ දකුණු ආයකය ඉදිරියෙන් සොයාගනු ලැබුණු ශිලාලේඛනයක් අනුව කනිට්ඨතිස්ස රජු (ක්‍රි.ව. 226 - 224) විසින් එහි "**චතර අයක**" කරවන ලද බව සඳහන් කර තිබේ (*Ez,vol*.I:225) එසේ ම රුවන්වැලි සෑ ආයකයකින් ලැබුණු ශිලාලේඛනයන් අනුසාරයෙන් ආයක යන අංගය ක්‍රි.ව. 1 - 2 සියවස්වලට අයත් වෙතැයි පරණවිතාන කරුණු දක්වා ඇත (පරණවිතාන,1963:53). ජේ.ජී ස්මිදර්ගේ මතයට අනුව වාහල්කඩ (ආයක) නම් වූ අංගය දාගැබට එක්කරන ලද්දේ දාගැබ නිර්මාණය කරන ලද මුල් ම අවස්ථාවේ නොවන බව ය (Smither,1894:21). මේ ආකාරයට මෙම අංගය කුමන කාලයක ලංකාවේ ස්තූපය සඳහා එකතු වූවා දැයි නිශ්චිත අදහසක් දැක්විය නොහැකි ය. කෙසේ වෙතත් මෙම අංගය ක්‍රි.ව. මුල් සියවස ආරම්භ වීමෙන් අනතුරු ව ස්තූපය සඳහා එකතු වූ අංගයක් බව උපකල්පනය කළ හැකි ය.

අප හමුවේ පවත්නා විශිෂ්ඨ සංවිධානාත්මක සැලැස්මකින් හෙබි ආයක සාකල්‍යයෙන් ම සමවන ගෘහාංගයන් ඉන්දියාවේ දක්නට නොලැබීමෙන් පෙනෙන්නේ ආයක පිළිබඳ සැලැස්ම ලාංකිකයාගේ නිර්මාණයක් බව ය (දිසානායක,1993:19). මෙම ආයක නිමවූවන් හුණු ගලින් හා ගඩොලින් මෙවැනි විශිෂ්ඨ නිර්මාණයක් කිරීමේ දැණුම අත්කර ගන්නා ලදැයි සිතිය නොහැකි ය. මෙම නිර්මාණය ඊට කලින් සිට පැවති මීට සමවන දාගැබ් අංගයක දියුණු අවස්ථාවකට අයත් එකක් යැයි සිතීම අනුචිත නොවිය හැකි ය. මෙම ආයකවලට මූලාදර්ශනයක් වූ දැවමුවා චෛත්‍යාංගයක් මෙම ආයක පිහිටි ස්ථානයේ මුල සිට ම පවතින්නට ඇති අතර ඉන් අනතුරු ව ගලින් හා ගඩොලින් මෙය නිමවන්නට ඇත (එම:20).

චෛත්‍යයක ගඩොළුමය ගර්භයන් සෙල්මුවා යූප ස්ථම්භයන් හැරුණු කර ඡත්‍ර හා සිව්රැස් කොටුවත් පේසා වළළුවල මූලාදර්ශයන් සේ සැළකෙන කුච්ඡවේදි හා මුද්ධාවේදී නම් වූ ප්‍රදක්ෂිණා පථයට යාබද ව පිහිටි ගරාදි වැටවලුත් මුල් කාලීන ස්තූපයන්හි දැවයෙන් නිර්මාණය කර තිබීමෙන් පෙනෙන්නේ දැගැබට සබඳ වූ දැවයෙන් නිර්මාණය කරන ලද කොටස් බව ය. ගර්භයේ අර්ධ වෘත්තාකාර බවත්, යූප ස්ථම්භය සෙල්මුවා නිර්මාණයක් විය යුතු බවට එවකට ඇතැම් විට තිබෙන්නට ඇති සාම්ප්‍රදායික අදහසුත් නිසා දාගැබක යථෝක්ත අංග දැවයෙන් නිම වීමට හැකි වූයේ නැත. එහෙත් ආයක වැනි කුඩා පරිමාණයේ ගෘහාංගයක් ඉතා පහසුවෙන් දැවයෙන් නිර්මාණය කිරිමේ හැකියාවක් සැළකෙන අතර, ඡත්‍ර, හර්මිකා, හා වේදී යනාදී විශේෂ අංගයනුත් දැවයෙන් නිමවූ  බව සලකන කල්හි ආයක ද දැවයෙන් නිමවන්නට ඇතැයි සිතීම අපහසු නොවේ (එම:20).

ආයක නම් වූ දාගැබ් උපාංගය දාගැබට එක්කරන ලද්දේ කවර අභිමතයකින් ද යන්න පිළිබඳ ව විද්වත්හු නානාවිධ අදහස් පළ කරති. ස්මිදර්ගේ මතයට අනුව වාහල්කඩ (ආයක) යනු පේසා වළළුවලට නැගීමට තනා තිබූ පියගැට පෙළවල් සඳහා කරන ලද ආවරණ වේ (Smither,1894:21). පරණවිතානගේ මතය වන්නේ ස්තූපයේ ආයක ඉන්දියාවේ අමරාවතී ස්ථූපයන්හි "**ආයක**" නම් අංගය තුළින් උකහා ගත් බවයි (පරණවිතාන,1963:47-48). ඔහු වැඩි දුරටත් විස්තර කර පෙන්වන ආකාරයට ආයක යන්න දොරටුව ලෙස බර්ජර්ස් විසින් අරුත් බිඳ ඇති අතර, අමරාවතී ස්තූපයන්හි, "ආයක" යන්නෙන් ප්‍රභවය විනැයි සැළකෙන ලක්දිව ස්තූපයන්හි "ආයක" යන්නෙහි අරුත දොරටුව යනු වශයෙන් පිළිගත හැකි බව දක්වයි. අමරාවතී ස්තූපයන්හි පූර්ව 'අ' කාරය භාෂාව කර ලක්දිව ස්තූප විෂයෙහි 'ආයක' ලෙස වහරණු ලැබූ බව අභයගිරි ආයකයෙන් ලැබුණු කණිෂ්ඨතිස්ස රාජ්‍ය කාලයට අයත් ශිලාලේඛනයෙන් පැහැදිලි වේ. වංසකතාවේ මෙම අංගය හැඳින්වීමේලා යෙදෙන '**ආදිමුඛ**' යන්නෙහි අරුත '**ආයක**' ලෙස වහරණු ලැබූ බව අභයගිරි ආයකයෙන් ලැබුණා වූ කණිෂ්ඨ තිස්ස රාජ්‍ය කාලයට අයත් ශිලාලේඛනයෙන් පැහැදිලි කෙරේ. වංසකතාවේ මේ අංගය හැඳින්විමේලා යෙදෙන '**ආදිමුඛ**' යන්නෙහි අරුත ද '**ආයක**' යන්නට දොරටුව යන අරුතට වෙනස් නොවේ. ඒ අනුව ආයක දැගැබට එක් කරන ලද්දේ දාගැබ් පර්වතයක අනුරුවක් බවට පැමිණීමේ අරුතකින් බව අවධාරණය කර තිබේ (එම:54). එසේ ම මහාවංසයේ **වාහල්කඩ** (ආයක) හැඳින්වීම සඳහා එක්තැනක '**ආදීමුඛ**'  යන්න ලේඛකයා අතින් සිදු වූ දෝෂයක් විය හැකි වග පවසන පරණවිතාන එය '**ආදිමුඛ**' කියා නිවැරදි වුවොත් ඉන් පර්වතය යන අරුත ගම්‍යවන බව පවසයි (එම:196354). මේ ආකාරයට විවිධ මතවාද පැවතිය ද මේ ආයක නම් අංගය ලංකාවේ ස්තූපය සඳහා එකතු වූ වඩාත් කලාත්මක සුවිශෙසී අංගයක් වේ.



අනුරාධපුර ජේතවනාරාම ස්තූපය සඳහා ද සතර දිශාවට ම ගොඩනංවන ලද ආයක දැකගත හැකි ය. ජේතවන දැගැබ මුලින් ම ගොඩනංවන කාලය වන විට අභයගිරි දැගැබෙහි ආයක ඉදිකර තිබුණි. මෙම ආයක මුලින් ම ඉදිකරන ලද චෛත්‍යය හා සමකාලීන විය හැකි ය (එම:47). මේ අනුව පරණවිතන අදහස් කරණු ලබන්නේ ජේතවන දැගැබ ඉදි වූ මුල් වකවානුව තුළ දී ම ස්තූපයේ ආයක තිබුණ බවට පිළිගත හැකි බව ය. නමුත් මෙම මතය කෙරෙහි තරමක් විමසීමට ලක්කළ යුතු මතයක් බව පෙනේ. ලිඛිත මූලාශ්‍රය අනුව ජේතවනාරාම ස්තූපය සඳහා එක්කරන ලද අලංකරණ අංග අතර, තොරණ තිබු බව පෙනේ (ක්‍රි.ව. 432 - 433) රජ වූ මිත්‍රසේන රජු ජේතවන ස්තූපය සඳහා **තොරණ** කරවූ බව මහාවංසයේ සඳහන් වේ (Mv,38:10). වංසකතාවේ  සඳහන් වන මෙම තොරණ යන්න කුමක් දැයි මේ වන විටත් නිශ්චය කර ගෙන නොමැත. තොරණ යනු ඉතා අලංකරණ අංගවලින් යුත් උපාංගයක් ලෙස අපට අර්ථ නිරූපණය කළ හැකි ය. ස්තූපයක දැකිය හැකි අලංකරණ අංග අතර, තොරණක ස්වරූපය ගන්නේ ආයකයන් ය. එනම් ආයක තුළ සිතුවම් ඇඳ කැටයම්වලින් හා බොරදම්වලින් සරසා තිබීම ද තොරණක් ලෙස හැඳින්වීමට කාරණයක් වේ. එසේ හෙයින් මහාවංසයේ එන මිත්‍රසේන රජු කරවූ තොරණ යන්න ආයක වීමට ඉඩ ඇතැයි අපට උපකල්පනය කළ හැකි ය.

පරණවිතාන අදහස් කරන ආකාරයට ජේතවන ස්තූපයේ මුල් ඉදිකිරීම් වකවානුව තුළ ආයක තිබූ බවට පිළිගැනෙන මතය

පිළිගත නොහැකි තත්ත්වයක පවතී. ජේතවන ස්තූපයේ බටහිර ආයකය, දකුණු ආයකය හා නැගෙනහිර ආයකය යන ආයක තුන 1996, 1997, 1999 යන වර්ෂවල දී මෙම කතුවරයා විසින් කැනීම්වලට ලක්කරන ලදි . එහි දී අනාවරණය කරගත හැකි වූ දත්ත අනුව ජේතවන ස්තූපය සඳහා ආයක පසු කාලයක දී එකතු වූ අංග වශයෙන් හඳුනාගත හැකි විය. යථෝක්ත කැනීම්වලින් අනාවරණය වූ කරුණු අනුව ජේතවන ස්තූපයේ පේසාවන් ඉදිකිරීමෙන් අනතුරු ව පසු යුගයක දී ආයක ඉදි කිරීම සඳහා පේසාවන් කඩා එම කඩන ලද පේසාවළළු මුහුණත්වලට ආයක එක්කරන ලද බව සොයා ගෙන ඇත (මැන්දිස්,1999:14-17). එහි දී වැඩි දුරටත් පැහැදිලි කරගත හැකි වූයේ ස්තූපයේ පැරණි පේසාවේ හුණු බදාම කපරාරුවේ ඉතුරු වූ කොටස් ද ආයක අභයන්තරයේ දැකගත හැකි වූ අතර ආයක බැම්ම ඒ මත ඉදිකර තිබීම ද කැපීපෙනේ. මෙම කරුණු අනුව පරණවිතාන ප්‍රකාශ කරන තර්කය ජේතවන ස්තූපය ආශ්‍රයෙන් පිළිගත නොහැකි අතර, බොහෝ විට ස්තූපය ආශ්‍රයෙන් මිත්තසේන රජු ස්තූපය සඳහා තොරණ කරවූ බව සඳහන් කරන මහාවංස ප්‍රවෘත්තිය මේ අනුව සත්‍යය වීමට බොහෝ ඉඩ තිබේ. කෙසේ වෙතත් ජේතවන ස්තූපය සඳහා අලංකරණ අංගයන් ලෙස ආයක පසු කාලයක දී ස්තූපය සඳහා එකතු  වූ බව පුරාවිද්‍යා කැනීම් තොරතුරු අනුව පෙන්වාදිය හැකි ය.

ජේතවන සථූපයේ සැලසුමේ මීළඟ අංගය වන්නේ සලපතර මළුවයි. සලපතර මළුව අක්කර 8 ක පමණ සම සතරැස් වේදිකාවක් ලෙස පිහිටයි (රත්නායක,1998:330). මහා චෛති තුනේ (රුවන්වැලි, අභයගිරි, ජේතවන) සලපතර මළු ඇත් පවුරුවලින් කෙළවර වේ (වික්‍රමගමගේ,1990:70). සලපතර මළුවට පිවිසීම සඳහා සතර දිශානුගත ව දොරටු සතරක් යථෝක්ත ස්තූප මළු ආශ්‍රයෙන් දැකගත හැකි ය. ජේතවන ස්තූපයේ සලපතර මළුවේ අලංකරණ අංගයන් වන ඇත් පවුර (ක්‍රි.ව. 432 - 453) රජ වූ මිත්තසේන රජුගේ නිර්මාණයක් ලෙස මහාවංසයේ සඳහන් වේ. (Mv,38:10).

ජේතවන ස්තූපයේ සලපතර මළුවේ එක් පැත්තක දිග මීටර් 180 × 180 ප්‍රමාණයෙන් යුත් ජේතවන ස්තූපයේ සලපතර



මළුව එවකට පැවති බිමෙන් මීටර් 2 සෙ.මී. 40 ක් උස්කර බැඳ ඇති බව පෙනේ. ඒ බව තහවුරු කර ඇති සාධක අතර, ජේ.එස්.එම්.පී.2002 කැනීම් සාධක පෙන්වාදිය හැකි ය. යථෝක්ත කැනීමේ දී සලපතර මළුව ඉදි කිරීම සඳහා ස්තූපයේ ඇත් ප්‍රාකාරය බැඳීමෙන් අනතුරු ව ඇත් පවුරෙන් ඇතුළත ගඩොළු සහ මැටි යොදා ගනිමින් පුරවා අවසන් කළ බව පැහැදිලි වේ (මැන්දිස්,2001) මෙයට අමතර ව සලපතර මළුවට පිටින් වැලි මළුව දැකගත හැකි අතර, එය වටා ප්‍රාකාරයෙන් අවසන් වීමෙන් අනතුරු ව ස්තූපයේ සැලසුම් සම්පූර්ණ කර ඇත.

## 4. 1 ජේතවන ස්තූපයේ නිර්මාණ තාක්ෂණය

ශ්‍රී ලාංකීය වාස්තුවිද්‍යාවට නිර්මාණාත්මක අංගයක් ලෙස ස්තූපය එකතුවීමන් අනතුරු ව එය ගොඩනැංවීම උදෙසා සුවිශේෂී වූ තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිත කළ බවට මූලාශ්‍රගත තොරතුරුවල සඳහන් වන්නේ ඉතා අල්ප වශයෙනි. අනුරාධපුරය ආශ්‍රයෙන් බිහි වූ මහාථූප තුන වන රුවන්වැලි, අභයගිරි, ජේතවන ස්තූප ආශ්‍රයෙන් මූලාශ්‍රයන්හි සඳහන් වන්නේ රුවන්වැලි සෑය ගොඩනැංවීම පිළිබඳ කතා පුවත පමණි. නමුත් අනෙක් විශාල ස්තූප දෙක ගොඩනැංවීම පිළිබඳ වංසකතාවන්හි හෝ වෙනත් කිසිම මූලාශ්‍රය ග්‍රන්ථයක කිසිඳු සඳහනක් නොමැත. එබැවින් මෙම ස්තූපයන්හි ඉදිකිරීම් තාක්ෂණය ගැන අපට සොයාගත හැක්කේ වර්තමාන පර්යේෂණ ඇසුරිනි.

ස්තූප නිර්මාණ තාක්ෂණය පිළිබඳ සෙවීමේ දී ඓතිහාසික වශයෙන් ඒ පිළිබඳ ව සටහන් වී ඇති පුවත් ඉතා වැදගත් වේ. විශේෂයෙන් මහා ථූපය ඉදිකිරීම සම්බන්ධයෙන් මහාවංසයේ එන පුවත අනුව ගඩොලින් බඳින ලද විශාල දාගැබ් එහි කිඳාබැසීම වැලැක්වීම පිණිස අඩිතාලම ස්ථිර ලෙස පිහිටුවීමට සැළකිලිමත් වූ බව සනාථ කරයි (මැන්දිස්,1999:28). මෙම තොරතුරු ඉතා වැදගත් වන්නේ පැරණි ඉංජිනේරුවෝ විශාල ස්තූප ගොඩනැංවීම උදෙසා එහි පහළ සිට ඉහළ කොටස් දක්වා යම්කිසි තාක්ෂණික ක්‍රමයක් අනුගමනය කර තිබීම ඔප්පු වන බැවිනි. රත්නමාලි දැගැබ ඉදි කිරීම සම්බන්ධ ව මහාවංසයේ එන විස්තරය මෙසේ

**ය "වෙසඟපුර පසලොස්වක වීසා නැකත පැමිණි කල්හි මහා සෑය පිණිස ආරම්භ කළේය මහිපල් තෙමේ එහි ගල්ටැබ පහ කරවා අනෙක ප්‍රාකාරයේ ස්ථිර කරනු පිණිස සෑතැන සත්රියනක් තැන වූයේය. අර්ථානාර්ත දැක්වීමේදී දක්ෂ වූ නරේන්ද්‍ර තෙමේ එහි හුණු ගල් යෝධයන් ලවා ගෙන්වා කුළු ගස්වා සුන් කරන ලද ගල් භූමිය ස්ථිර වනු පිණිස සමින් වසන ලද පතුල් ඇත්තා වූ මහ ඇතුන් ලනවා මැඩවීය. අහස් ගඟ හුණු තන්හි සතනයෙන් තෙත් වූ හාත්පස තිස් යොදුන් බිම මැටි සියුම විය. මැටි තොමෝ සියුම් බැවින් වෙඩරු මැටි යයි කියනු ලැබේ. එතැනින් රහත් සාමනේරවරයෝ තුටු මැටි ගෙනාහ. එහි ගල් අත්ලෙහි මැටි ඇතිර වීය. නරේන්ද්‍ර තෙම මැටි මතුයෙහි ගඩොල් ඇතිර වූයේය. පළිඟු අත්ල මත්තෙහි ගල් ඇතිර වීය. සෑම තැන්හි මැටියෙන් කටයුත්තෙහි නීතී නම් මැටි ම විය. නරේන්ද්‍ර තෙම රස ජලයෙන් මිශ්‍ර කළ ගිවුලු මැලියමින් අටගුල් බුල් ලොහොපටක් ඇතිරි ය. ඊ මත්තෙහි තල තෙලින් තෙමන ලද රත් සිරියෙන් සහගුල් බොල් රිදී පටක් ද ඇතිර වූයේය. මහිපති තෙමේ මහාසෑය පිහිටන තන්හි විශේෂයෙන් ප්‍රසන්න වූ සිත් මෙසේ පිරියම් කරවා" (මව,29:8-13).**

මෙම වාර්තාවේ දැක්වෙන රිදීපට වැනි අතිශෝක්ති ගත තොරතුරු පිළිබඳ ව ඇදහිය නොහැකි බව ප්‍රකට ව පෙනේ. නමුත් අතිශෝක්තිය ඉවත ලූ කළ ඉහත සඳහන් විස්තරයෙන් කෙනෙකුට අවබෝධ කළ හැකි පරිදි දුටුගැමුණු රජු එතරම් විසිතුරු සහිත ව මහාථූපයේ අත්තිවාරම දැමූයේ දැයි සොයා ගැනීම දුෂ්කර කාර්යක් උවද එය ස්ථාවරව ශක්තිමත්ව සකස් කර ඇති බව පැහැදිලි වේ (පරණවිතාන,1963:12). කෙසේ වෙතත් අනුරාධපුර මහා දැගැබේ පාදමේ නිර්මාණ තාක්ෂණය පිළිබඳ ව මෙතෙක් අධ්‍යයනයක් සිදුකර නැති අතර ඒ සඳහා දැනට පාදක කරගත හැක්කේ ඉන් පසුව ඉදිකරන ලද ජේතවන ස්තූප ආශ්‍රයෙන් සිදුකර ඇති පර්යේෂණයන් ය. ජේතවන ස්තූපයේ පාදම ආශ්‍රයෙන් සිදු කරන ලද මුල් ම පර්යේෂණ සිදුකර ඇත්තේ බ්‍රිතාන්‍ය ජාතික එච්.සී.පී. බෙල් විසිනි. ඔහු විසින් ස්තූප පාදම සම්බනධ ව සිදු කරන ලද පර්යේෂණවල දී ස්තූපයේ පාදම පඩි සහිත ගබොළු බැම්මකින් යුතු වන බවත්, අත්තිවාරම සලපතර මළුව මට්ටමේ සිට අඩි 26 ක් යට සිට පටන් ගන්නා අතර ගඩොළු



බැම්මට යටින් කොන්ක්‍රීට් තට්ටුවක් අතුරා තිබූ බවත් දක්වා තිබේ (*ASCAR*,1894). ජේතවන ස්තූපයේ පාදමේ ස්වරූපය කෙබඳු ආකාරයකින් යුක්ත දැයි එහි විස්තර නොවන අතර, ස්තූපයේ පාදමේ ස්වරූපය 1980 හා 1990 දශකවල දී සිදුකරන ලද කැනීම්වල දී නිශ්චිත ව අනාවරණය කරගෙන ඇත. ඒ අනුව මහාවංසයේ සඳහන් වන පුවතට සමාන ව මහා දාගැබ් බැඳීමේ දී ස්තූපයන්හි අඩිතාලම ශක්තිමත් ව යොදා ඇති බව ජේතවන ස්තූපය ආශ්‍රයෙන් සිදු කරන ලද පර්යේෂණවල දී මේවන විට අනාවරණය කරගත හැකි වී තිබේ.

සංස්කෘතික ත්‍රිකෝණ ජේතවන ව්‍යාපෘතිය යටතේ 1980 සහ 1990 දශක දෙක තුළ ජේතවන ස්තූපයේ සිදු කරන ලද පර්යේෂණ කැනීම්වල දී ලැබී ඇති දත්ත අනුව ස්තූප පාදම පොළොවේ මව් පාෂාණයේ (Bed rock) සිට ආරම්භ වන බව සොයා ගෙන ඇත. ස්තූපය නිර්මාණයට භාවිත කරන ලද භූමිය මව් පාෂාණය දක්වා හාරා පස් ඉවත් කර එතැන් සිට ස්තූපය බැඳීම ආරම්භ කර ඇත. ස්තූපය ඉදිකර ඇති භූමියේ මව් පාෂාණය සම මට්ටමක නොමැති අතර, යථෝක්ත ආයක ඉදිරිපස මව් පාෂාණයේ පිහිටීම සලපතර මළුවේ මතුපිට සිට මෙසේ දැක්විය හැකි ය.

| දිශාව | සළපතර මළුවේ සිට මව් පාෂාණයට උස |
|---|---|
| උතුර | මීටර් 6.88 |
| නැගෙනහිර | මීටර් 6.25 |
| දකුණ | මීටර් 7.13 |
| බටහිර | මව් පාෂාණය දක්වා කැනීම් කර නැත. |

(මෛත්‍රීපාල,1993:27)

ස්තූපය ඉදිකර ඇති සීමාවේ අක්‍රමවත් ව පවතින පොළවේ පිහිටි මව් පාෂාණය (Bed rock) සමකර ගෙන ස්තූපය ඉදිකිරීම සඳහා යම් තාක්ෂණික ක්‍රම පැරණි පෙදරේරුවන් උපයෝගී කරගත් බව පෙනේ (විශේෂයෙන් ස්තූප අත්තිවාරම දකුණු දිශාවේ දී පිහිටි පොළවෙන් මීටර් 1. 7 ක් පමණ උසින් ආරම්භ කර ඇත. උතුරු දිශාවේ දී අත්තිවාරම මව්පාෂාණයෙන් ආරම්භ

කර ඇති අතර සෑම දිශාවකදී ම මව් පාෂාණයෙන් ආරම්භ නොවන බව පෙනේ. එසේ ම මව් පාෂාණය මට්ටම සමකර ගැනීම සඳහා දකුණු ප්‍රදේශයේ දී මීටර් 1. 7 ක් උසට තද කිරිමැටි තට්ටුවක් දමා තිබීම අත්තිවාරම සමකළ බවට පෙනෙන හොඳ ම නිදර්ශකයක් වේ (මෛත්‍රීපාල,1993:28-29). මෙසේ සකස් කිරීමෙන් අනතුරු ව ස්තූප අත්තිවාරම ඉදිකර ඇත්තේ මෙසේ ය. ගඩොලින් ගඩොලක් පැන්නීමෙන් ගඩොල් වරි 15 ක් ඉදි කර ඉන් අනතුරු ව වේදිකාවක් සකස් කර ඇත. එය මීටර් 2 සෙ.මී. 5 ක ප්‍රමාණයෙන් යුක්ත වන අතර එතැන් සිට ගඩොලින් ගඩොල නැවතත් ඇතුළට පන්නමින් සලපතර මළුව දක්වා ගඩොල්වරි 61 ක් දක්වා ඉහළට ඉදිකර ඇත. ඒ අනුව දකුණු ආයකය අසල දී සලපතර මළුව මතුපිට සිට ස්තූප අත්තිවාරම මීටර් 5 සෙ.මී. 22 ක් ගැඹුරින් ආරම්භ කර ඇත (එම:29).

බටහිර ආයකය ඉදිරිපස සිදු කරන ලද කැනීමේ දී වේදිකාව වැනි කොටසේ සිට සලපතර මළුව දක්වා උස මීටර් 3 සෙ.මී. 80 ක් විය (මැන්දිස්,1998:10). ස්තූප පාදම පොළව අභ්‍යන්තරයේ සිටි මතුපිටට බැඳීමේ දී සෙ.මී. 2 ක අභ්‍යන්තර (ඇතුළතට) ගඩොල් පැන්නුමකින් යුතු ව එය තනා තිබේ (එම,1998:10). සලපතර මළුව දක්වා බැඳ ඇති මෙම බැම්ම එතැන සිට පළමු පේසාව දක්වා මීටර් 4 සෙ.මී. 20 ක් දක්වා පදම ඉහළ මට්ටමේ සිට ස්තූප අභ්‍යන්තරයට ගෙන එතැන සිට ස්තූපයේ පේසා වළළු බැඳීම ආරම්භ කර ඇත. මෙම බැම්ම පිහිටි පාෂාණයේ සිට එක ම ගඩොළු බැම්මකින් යුක්ත ව නිර්මානය කර ඇති බව ද පෙනේ. ඒ සඳහා ඇති සාක්ෂි ලෙස බටහිර ආයකය, නැගෙනහිර ආයකය හා දකුණු ඇතුළත සලපතර මළුව මට්ටම දක්වා සිදු කරන ලද කැනීම්වල දී මෙම බැම්ම මව් පාෂාණයේ සිට නිර්මාණය කර ඇති එක ම බැම්මක් බව අනාවරණය කරගත හැකි විය (මැන්දිස්,ලියනගේ, 1999:01). ඉහත කැනීම්වලට අමතර ව ජේ.එෆ්. ඩික්සන් නමැති ඉංග්‍රීසි ජාතිකයා 1884 දී ජේතවන ස්තූපයේ නැගෙනහිර දිශාවෙන් ගර්භය ඇතුළට කැනීම් කර ස්තූපය මැද සිට පිහිටි පොළවට කැනීම් කර ස්තූප පාදමේ පිහිටීම විමර්ශනය කිරිමට උත්සාහ කර තිබේ. එසේ ස්තූප ගර්භයේ මැද සිට පොළොව අභ්‍යන්තරයට කැනීම් කිරීමේදී ඔහු සලපතර මළුව මට්ටමේ සිට අඩි 13 ක් යටට කැනීම් කරන ලද බව ද සලපතර මළුවට අඩි 13 ක් යටින් හොඳින් සකස් කරන ලද ගඩොල් ඇතුරුමක් ඔහුට හමු වූ බව ද වාර්තාකර ඇත (Ratnayake,1984:Fig 43). මෙම වාර්තාව අනුව ද පැහැදිලි වන්නේ ජේතවන ස්තූපයේ අත්තිවාරම සඳහා ඉතා හොඳ පදනමක් සකසා ඇති බව ය.



ජේතවන ස්තූප අත්තිවාරම ඉදිකිරීම සඳහා භාවිත කර ඇත්තේ ඉතා හොඳින් පුළුස්සන ලද සෙ.මී. 40 × 20 × 5 සෙ.මී. 60 × 20 × 5 ප්‍රමාණයේ ගඩොළු වේ. ගඩොළු වරි එකින් එක ගඩොලක් මත ගඩොලක් තැබීමේ තාක්‍ෂණයට අනුව ඉහළට බැඳීමේ දී ඒවා ඔලුගල් වරි (දික් අතට තබන ගඩොල් පේළි) හා බඩගල් වරි (හරස් අතට බඳින ගඩොල් පේළි) ලෙස බැඳ ඇත (මැන්දිස්, ලියනගේ 1990:06). මේ ආකාරයට ඉතා හොඳ තත්ත්වයේ ගඩොළු සමග සමහර අවස්ථාවලදී එම ගඩොල් වරි අතරට විවිධ ප්‍රමාණවල කුඩා ගඩොළු හා කැබළි ද භාවිත කර ඇති බව නැගෙනහිර ආයකය ඇතුලත කැනීමේදී හඳුනාගැනීමට හැකි වී තිබේ(එම). මෙම ක්‍රමය ස්තූපය ඉදිකිරීම සඳහා යොදනු ලැබූ තාක්ෂණික ක්‍රමයක් වේ. මෙය බොහෝ විට ඉහළින් එන විශාල පීඩනයට ඔරොත්තු දීම සඳහා භාවිත කළ හැකි ඉංජිනේරු තාක්‍ෂණික ක්‍රමයක් විය හැකි බවට උපකල්පනය කළ හැකි ය.

නැගෙනහිර ආයකය ඉහළ සිදු කරන ලද කැනීමේදී ගර්භය අභ්‍යන්තරය සඳහා ගඩොළු බැඳීමේ තාක්‍ෂණය අනාවරණය කරගත හැකි විය. එහිදී පැහැදිලි වූ කරුණක් වූයේ කුස්තුර සඳහා යොදා ඇති තාක්ෂණය හඳුනාගත හැකි වීම ය. එහි ගඩොළු පේළි දෙකක් අතර මි.මී. 5 කටත් අඩු ප්‍රමාණයකට කුස්තුර සඳහා යොදා ගෙන ඇති බදාමයයි, ගඩොල් වරි සම්බන්ධ කිරීමට යොදා ගෙන ඇති මෙම බදාමය ඉතා සියුම් ව තුනීවට හලා ගන්නා ලද සියුම් මැට්ටක් භාවිත කර සකස් කර ගෙන තිබේ. මහාවංසයේ සඳහන් වන **"වෙඩරුමැටි"** හා **"නවනීත මැටි"** යන්න බොහෝ විට මෙවන් සියුම් මැට්ටක් වීමට ඉඩ ඇත. මෙම මැට්ටේ වැලි කැට සංයුතිය ඉතා අඩු ප්‍රතිශතයක් ගන්නා අතර දූවිලි ස්වරූපයකින් යුක්ත වේ. මෙවැනි බදාමයක් බන්ධන මාධ්‍ය ලෙස භාවිත කිරීම නිසා ගඩොළු සහ මැටි මාධ්‍ය දෙක දිගු කාලීන ව එකිනෙකට

ඉතා හොඳ ඉස්තරම් බන්ධනයක් වී තිබෙන බව මෙහිදී හඳුනාගත හැකි විය. එසේ ම පාදමේ සිට ඉහළට ගඩොළු බැම්ම බැඳීම සඳහා මෙම බදාමය මනා ව ගැළපුන බව පෙනේ. මේ ආකාරයට ගඩොලින් ස්තූපයේ පාදම ඉදිකිරීම සඳහා පැරණි පෙදරේරුවන් විසින් විවිධ ප්‍රමාණවල ගඩොළු වර්ග හතරක් භාවිත කර ඇති ආකාරය ද හඳුනාගත හැකි විය. එම ගඩොළු වර්ග හතර පිළිබඳ ව සිදු කරන ලද විමර්ශන අනුව ඒවායේ වර්ණවල හා සංයුතියේ ද වෙනස් තාවයන් දැකගත හැකි ය. මන්සල් වර්ණ සටහනට අනුව එම ගඩොළුවල වර්ණ මෙසේ ය.

1. 2.5 YR 4/8 රතු (ඉතා හොඳ තත්ත්වයේ ගඩොළු)
2. 2.5 YR 5/8 රතු (දඹු ගඩොළු)
3. 5 YR 5/8 කහවන් රතු (තරමක් හොඳ තත්ත්වයේ ගඩොළු)
4. 7.5 YR 5/4 දුඹුරු (දඹු ගඩොළු)

(මැන්දිස්,ලියනගේ,1999:04).

මේ අනුව පැහැදිලිව ම පෙන්වාදිය හැක්කේ ජේතවන ස්තූපය ඉදිකිරීම සඳහා පොළවේ මව් පාෂාණයේ සිට ආරම්භ කරන ලද කවාකාර බැම්ම තුන් මහල් පේසාව දක්වා ක්‍රමයෙන් කවාකාර ආකාරයටම ඉහළට කුඩා වන ලෙස එක ම සම්බන්ධතාවයකින් යුක්ත ව එකම බැම්මක් ලෙස බැඳ ඇති බව පෙන්වාදිය හැකි ය.

යථෝක්ත කරුණු තුලනාත්මක ලෙස මූලාශ්‍රය සමඟ අධ්‍යයනය කිරීමේ දී මහාවංසයේ සඳහන් වන ආකාරයට විශාල ස්තූප ඉදිකිරීමේ දී ශ්‍රී ලාංකීය පුරාණ ඉංජිනේරුවන් එහි පදනම ඉතා ශක්තිමත් ව සකසා ඇති බව පැහැදිලි වේ. රත්නමාලි දැගැබේ පාදම ආශ්‍රයෙන් මෙතෙක් පර්යේෂණ සිදුකර නොමැති උව ද ජේතවන ස්තූපයේ පාදම සම්බන්ධයෙන් මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ අනුව අනිවාර්යෙන් ම රත්නමාලි ස්තූපය ද මව් පාෂාණයේ සිට ආරම්භ වන බව මේ අනුව උපකල්පනය කළ හැකි ය. එසේ ම පිහිටි පොළවේ (මව් පාෂාණයේ) සිට විශාල ස්තූප බැඳ ඇති බවට සාධක අභයගිරි ස්තූපය ආශ්‍රයෙන් ද පෙන්වාදිය හැකි ය. 2001 වසරේදී අභයගිරි ස්තූපයේ සලපතර මළුවේ උතුරු ආයකය අසළ සිදු කරන ලද කැණීමක දී එම භූමියේ මව් පාෂාණය සලපතර මළුවේ සිට සෙ.මී. 50 කටත් අඩු ගැඹුරකින් ආරම්භ වන බව සොයා ගෙන ඇත. ඒ අනුව අභයගිරි ස්තූපය ඉදිකිරීම සඳහා ද මව් පාෂාණය යොදා ගෙන ඇති බව පැහැදිලි වේ. මේ අනුව විශාල ස්තූප ඉදි කිරීම සඳහා භාවිත කළ තාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ මහාවංස විස්තරයේ එන අතිශයෝක්තිය ඉවත දැමූ කළ ඉතා ශක්තිමත් පදනමකින් යුක්ත ව ස්තූප ඉදිකිරීමට පැරැණ්නන් කටයුතු කර ඇති බව මෙම තොරතුරු අනුව පෙන්වාදිය හැකි ය.



ජේතවනාරාම ස්තූපයේ පාදමේ සිට පේසාව දක්වා කොටස් බැඳීම සඳහා ඉහත දැක්වූ ආකාරයේ තාක්ෂණික ක්‍රමයක් පැරැණ්නන් අනුගමනය කර ඇති අතර පේසා වළළුවලින් ඉහළ ගර්භය බැඳීම සඳහා එයට වෙනස් ආකාරයේ තාක්ෂණික ක්‍රමයක් පෙදරේරුවන් විසින් අනුගමනය කර තිබේ. සලපතර මළුවේ සිට අඩි 137 ක් උස ස්තූප ගර්භය එහි පැරණි ඉදිකිරීම්වල දී ගර්භයේ උසට සරිලන ආකාරයේ ගඩොල් බැඳීමේ තාක්ෂණය අනුගමනය කර ඇත. ගර්භයේ පිටත ස්තරයේ සිට එය ක්‍රමයෙන් ගර්භය අභ්‍යන්තරයට විහිදෙන විට ගඩොළු කැබලි හා තවත් ඇතුළට යන විට කුඩා ගඩොළු කැබලි හා පස්වලින් සමන්විත වන වාස්තුවිද්‍යා තාක්ෂණික ක්‍රමයක් අනුගමනය කර තිබේ (ගමලත්,1997:01).

ජේතවන දැගැබේ ගර්භයේ වාස්තුවිද්‍යා ලක්ෂණ පැහැදිලි ව හඳුනාගත හැකි වන පරිදි සාධක හමු වී තිබෙනුයේ එහි බටහිරින් හා නැගෙනහිරිනි. මේ ප්‍රදේශයන්හි පැරණි ගර්භයේ ගඩොල් ගැලවී යෑමෙන් සෑදී තිබූ විශාල ආවාටයන්හි සිදු කරනු ලැබූ කැනීම්වලින් මෙකී විශේෂ වාස්තුවිද්‍යා ලක්ෂණ මතු වී ඇත. ගර්භයේ පැරණි පිටත ව්‍යුහය හොඳින් ආරක්ෂා වී ඇති දකුණු හා උතුරු යන ප්‍රදේශයන්හි පිටත ස්තරයේ තාක්ෂණික ලක්ෂණ පැහැදිලි ව හඳුනාගත හැකි වන අතර ගැඹුරට කැනීම් කළ බටහිර හා නැගෙනහිර යන ප්‍රදේශවලින් එහි අභ්‍යන්තරයේ තාක්ෂණය හඳුනාගත හැකි ය. ඒ අනුව ජේතවන දැගබේ ගර්භය ඉදිකිරීමේ මූලික ලක්ෂණ හා ගෘහ නිර්මාණ ස්තර පහක් ලෙස හඳුනාගැනීමට හැකි වී තිබේ.

01. පැරණි ගෘහ නිර්මාණකරුවන් විසින් ගර්භයේ වැඩ අවසන් කිරීම සඳහා එහි පිටතින් ම යොදා ඇත්තේ හුණු බදාම කපරාරුව ය. එහි වර්ණය, සංයුතිය, හා තත්ත්වය යනාදිය විශ්ලේෂණය කර බැලීමේ දී හුණු බදාම කපරාරුව ගර්භයේ පහළ කොටස්වල හා අඩි 120 ක් ගිය පසු ස්තූපයේ දකුණ හා බටහිර පැතිවලින් දැකගත හැකි ය. මෙකී හුණු බදාම කපරාරුව පරික්ෂා කිරීමේ දී පැරැණ්නන් මෙම දාගැබ සඳහා යෙදූ හුණු බදාමය ස්තර තුනකින් සමන්විත වන බව පෙනේ (එම:02). මතුපිටින් ම ඇත්තේ ඉතා ම තුණී හුණු බදාම ස්තරයකි. එය කපරාරුව නිම කිරීමෙන් සුද මැදීම වශයෙන් පෙදරේරුවන් හඳුන්වන ස්තරය වේ. එහි සම්පූර්ණයෙන් ම දක්නට ඇත්තේ හුණු ය. ඊට වෙනස් කිසිඳු ද්‍රව්‍යයක් මිශ්‍ර කර නොමැත. මීට ඇතුළතින් තිබෙන දෙ වැනි ස්තරය සම්පූර්ණයෙන් ම හුණු වැලිවලින් සමන්විත වේ. මෙය අඟල් 1 ක් පමණ ඝණකමින් යුක්ත ය. ශක්තිමත් බවින් අඩු ස්තරයකි. මෙම ස්තරය තුළින් දැකගත හැකි වූ මතුපිට ස්තරය සමඟ හොඳින් සම්බන්ධ වී තිබේ. මෙහි අඩංගු හුණු හා වැලි හොඳින් අඹරා තිබීම ද දැකගත හැකි ය. මෙයට යටින් තිබූ තුන් වැනි ස්තරය හුණු බදාම කපරාරු වේ. එය විශාල ම ස්තරය වේ. මෙහි ඇතැම් ස්ථානවල ඝණකම අඟල් 2 ක් පමණ විය. එහි සංයුතිය වැලි, හුණු හා විවිධ ප්‍රමාණයේ තිරුවනා පාෂාණවලින් සමන්විතව වේ. සමහර ස්ථානවල මැටි බඳුන් කැබළි ද පවතින බව අනාවරණය විය. මේ කපරාරු ස්තරය ඉතාමත් ශක්තිමත් වන අතර ඉහත සඳහන් කළ දෙ වැනි ස්තරය මේ සමඟ හොඳින් සම්බන්ධ වී තිබේ. මෙම බදාම තට්ටුවේ වර්ණය 10 YR 8/3 දුඹුරු පැහැ වේ (එම,1997:02).

02. ජේතවන දාගැබේ ගර්භයේ පැරණි ඉදිකිරීමේ දෙ වැනි ස්තරය මින් අනතුරු ව දැකගත හැකි ය. හුණු බදාමයට ඇතුළතින් ඇති මෙය වූ කලි ස්ථාවර ගඩොල් බැම්ම යි. පේසාව මට්ටමේ සිට අඩි 130 ක් දක්වා ගර්භයේ සෑම තැනක ම මෙම බදාමයට ඇතුළතින් මෙම ගඩොල් බැම්ම වේ. මෙම ගඩොල් බැම්මේ හොඳ තත්ත්වයේ ගඩොලක් සෙ.මී. 35 × 40 × 5, සෙ.මී 30 × 20 × 5 ප්‍රමාණවලින් යුක්ත වේ. ගඩොල්වල වර්ණය



10 R 5/8 රතු වර්ණයෙන් යුක්ත වන අතර බැම්මේ සෑම ගඩොලක් ම හොඳින් ඇඹරූ මැට්ටෙන් බැඳ තිබේ. ගඩොල් අතර කුස්තුරයක් සෙ.මී. 1/2 ක් 1 ත් අතර ප්‍රමාණයකින් යුක්ත වේ (එම:02). පහළ සිට අඩි 130 දක්වා මේ අන්දමේ ගඩොල්වලින් බැඳ ඉන් පසුව සෙ.මී. 30 × 20, සෙ.මී. 15 × 10 ආදී ප්‍රමාණවලින් යුත් කුඩා ගඩොල් යොදා හතරැස් කොටුව පාමුල දක්වා ගර්භය බැඳ ඇත. මෙසේ භාග ගඩොළු කැබළි ගර්භයේ ඉහළට යොදා ඇත්තේ එතැනට ඉහළින් ගඩොල් වරි මතට එකතු වන බර ඉතා ම අල්ප වීම නිසා ය. පහළ සිට අඩි 130 ක් දක්වා වූ කොටසේ හුණු බදාමයට යටින් ඇති ගඩොළු වරියේ මතුපිට කෙළවරවල් හැඩකර තිබුණි. එය ගර්භයේ හැඩය ලබාගැනීමට කරන ලද්දක් බව පැහැදිලි වන්නේ අභයගිරි ස්තූපයේ ද මෙවැනි පැත්තක් හැඩකරන ලද ගඩොළු වාර්තා වී ඇති බැවිනි.

අඩි 137ක් උස ජේතවන ස්තූප ගර්භයේ පහළ සිට අඩි 70 ක් පමණ වනතුරු දඹු ගඩොළු භාවිතය සිදු වී ඇත්තේ ඉතා ම අල්ප වශයෙනි. එහෙත් එතැන් සිට ක්‍රමයෙන් දඹු ගඩොළු භාවිතය වැඩි කර තිබේ. සමස්ත ගර්භය වටා ම දඹු ගඩොළු භාවිත කර තිබීම දැකිය හැකි ය. ගර්භයේ දකුණු හා නිරිත දිග කොටස්වල වර්ග මීටරයක් තුළ දැකිය හැකි දඹු ගඩොල් ප්‍රධාන වශයෙන් තුන් වර්ගයක් වෙයි. ඒවා මෙසේ ය.

01. 10 YR 4/6 තද කහ පැහැති දුඹුරු (ඉතාම දුර්වල තත්වයේ දඹු ගඩොළු)

02. 10 YR 5/8 කහ පැහැ දුඹුරු (සාමාන්‍ය ශක්තිමත් දඹු ගඩොළු)

03. 2.5 YR 4/6 රතුවන් දුඹුරු (අධික පිලිස්සීමට ලක් වූ දඹු ගඩොළු)

මේ ආකාරයට ගර්භයේ ඉහළට දඹු ගඩොල් භාවිතය වැඩි කරමින් බැම්ම බැඳීමට ඇත්තේ කිසියම් තාක්ෂණික අදහසක් ඇති ව බව පෙනේ (එම:03).

03. මින් අනතුරු ව අප පිවිසෙනුයේ ජේතවනාරාම දැගැබේ ගර්භයේ තුන් වැනි අදියරට ය. ඉහත විස්තර කළ ව්‍යුහයට

ඇතුළතින් මේ තුන් වැනි කොටස විද්‍යමාන වෙයි. මෙම කොටසේ ඉදිකිරීමේ ස්වභාවය අනුව ඒ සඳහා භාග හා මධ්‍යම ප්‍රමාණයේ ගඩොළු භාවිත කරමින් ගර්භය බැඳීම සිදු කර ඇත. මෙම ගඩොළු කැබලි ද හොඳින් පිළිස්සුණු ඒවා වන අතර, වර්ණය 10 R 5/8 රතු වේ. මෙම ව්‍යුහයේ ගඩොළු බැඳීමට කහ පැහැයට හුරු සියුම් ව අඹරාගත් මැට්ටක් භාවිත කර තිබේ. මේ කොටස් සඳහා පැරැණිනන් යොදා ගත් මෙම භාග ගඩොළු අහඹු ලෙස කැඩී බිඳී ගිය හෝ විශාල ගඩොල් කැඩී යාමෙන් ශේෂ වී ගිය භාග ගඩොල් නොවන බව සඳහන් කළ හැකි ය. ඒවා සැබැවින් ම භාග ප්‍රමාණයට සැකසූ ගඩොළු ය. එහෙත් මේවා ගර්භයේ ඉදිකිරීම් සඳහා පිළියෙල කර ගත් ඒවා ද යන්න ගැටළුවකි. එසේ පැවසීමට හේතු වන්නේ සමහර ගඩොළුවල දැකිය හැකි බොරදම් රටා ආදිය අනුව ඒවා දෙ වැනි වර භාවිත කළ බවට සාධක සපයන බැවිනි. මේ කොටසින් විස්තර කෙරෙන ගඩොලින් බැඳි ව්‍යුහය ස්තූපයේ, ගිණිකොන, බටහිර, හා නැගෙනහිර කලාපවලින් ද වාර්තා වී තිබේ. ගරා වැටී විශාල ආවාට සැදී තිබූ කොටස්වලින් මේ ව්‍යුහය පැහැදිලි ව හඳුනාගත හැකි විය (එම:04).

04. ගර්භයේ බටහිර හා නැගෙනහිර දිස්වූ විශාල ආවාට සහිත කලාප දෙකෙහි තවදුරටත් සිදුකළ පුරාවිද්‍යා අධ්‍යයනයන්හි දී ගර්භයේ ගොඩනැංවීම හා තාක්ෂණයේ සිව් වැනි අදියරක් ද හඳුනාගත හැකි විය. මෙ වූකලී මෙතෙක් ශ්‍රී ලංකාවේ පැරණි දාගැබකින් හමු නොවූ අන්දමේ ඉදිකිරීම් ක්‍රමයකි. ගර්භයේ නැගෙනහිර හා බටහිර දෙසින් මීටර් 28 ක් ඉහළින් හමු වූ මෙම ව්‍යුහය ඉහළින් හා ඇතුළට බැඳි කුඩා ගඩොල් බැම් 4 කින් යුක්ත විය. ඒ හැම ගඩොල් බැම්මක් අතර ම කුඩා කුඩා ගඩොල් කැබලි හා පස්වලින් පුරවා තිබුණි. නැගෙනහිර පැත්තෙන් හමු වූ මෙම හරස් බැම්මක දිග මීටර් 19 කි. බටහිර පැත්තේ හමු වූ බැම්මක දිග මීටර් 8 සෙ.මී. 08 කි. ගර්භයේ දකුණු පැත්තෙන් ද මෙවැනි හරස් බැම්මක් දැකගත හැකි විය. මෙම හරස් බැම් ඉදි කර ඇති හැඩය තාරකා ස්වරූපයක් (Star Shape) ගනී. පිටත බැම්ම භාග



ගඩොළුවලින් බැඳ ඇතුළත කොටස් කුඩා කුඩා කැබලිවලින් පුරවා තිබිණ (ගමලත්,1997:04-05). ස්තූප ගර්භයේ ඉදිකිරීම් තාක්ෂණය සම්බන්ධයෙන් පරණවිතානගේ අදහස ද ඉතා වැදගත් වේ. ඔහු පවසන ආකාරයට අනුරාධපුරයෙහි සහ ශ්‍රී ලංකාවේ අනෙක් ස්ථානවල පිහිටි විශාල ස්තූපයන්ගේ ගර්භය නොහොත් උදරයන් ගඩොලින් ඝණ ලෙස සාදා තිබූ බව සාමාන්‍ය පිළිගැනීම යි. එසේ ඇතැම් විශාල දාගැබ්වල කොටස් වශයෙන් ගරා වැටී තිබූ සුන්බුන් ගොඩවල්වල ගඩොළුවලට වඩා දක්නට ලැබෙන්නේ පස් වන හෙයින් මෙකී කරුණ පිළිගැනීම තරමක් දුරට සැක සහිත ය. මෙම පස්වලින් වැඩි කොටසක් ගඩොළු දිරා යමෙන් සැදෙන්නට ඇත (පරණවිතාන,1963:20-21). මේ මගින් ලංකාවේ දාගැබ්වල ගර්භයන් සම්පූර්ණයෙන් ඝන ලෙස ඉදි නොකරන ලදැයි සිතිය හැකි ය. මෙයට ආදර්ශ ලෙස ඉන්දියාවේ සොයාගෙන ඇති ස්තූප බොහෝමයක් මුළුමනින් ම ගඩොලින් ඉදි නොවී තිබේ. ඝණ්ඨා ශාලා නම් ස්ථානයෙහි පිහිටන ලද ස්තූපය ඒක කේන්ද්‍රීය බිත්ති දෙකකින් යුක්ත වේ. එහි බාහිර බිත්තිය ඇතුළු බිත්තියට වඩා ඝණ වේ. බිත්ති දෙක අතර වූ අවකාශය හරස් බිත්ති මගින් කුඩා කොටස්වලට බෙදී ඇති අතර එහි මධ්‍ය එක් පැත්තක අඩි 19 ක් බැගින් වූ සම්පූර්ණ ගඩොලින් ම වූ ඝණයකින් යුක්ත වේ. මෙම බිත්ති අතර පිහිටි අවකාශය පසින් පුරවන ලදී. මථුරාවෙහි පිහිටි ජෛන ස්තූපයෙහි ඒකකේන්ද්‍රීය බිත්ති දෙක මැද සිට විහිදී ගිය හරස් බිත්ති 8 ක් ඡේදනය වී තිබේ. ඒ.එච්. ලෝංහර්ට්ස් විසින් කැනීම් කරන ලද නාගර්ජුණකොණ්ඩ ස්තූපයේ ගර්භයේ මධ්‍යයෙහි මුළුමනින් ම ගඩොලින් නිම වූ ඝනයක් වේ. මෙය ඒක කේන්ද්‍රීය බිත්ති තුනකින් වට වී තිබේ. මේවා මැද සිට විහිදෙන කෙටි හරස් බිත්තිවලින් ද බෙදී ඇත. මේ හැම ස්තූපයක් ම ගඩොලින් බැඳ ඇත්තේ බිත්ති පමණි. අතර වූ අවකාශ පසින් පුරවන ලදි (එම:21).

ලංකාවේ දාගැබ්වල මීට සමාන වූ ඇතුළු බිත්ති යෙදීමේ ක්‍රමයක් අනුගමනය කළ බවට සාක්ෂ්‍ය තිබේ. 1885 දී අනුරාධපුර මහා ථූපය ප්‍රකෘතිමත් කිරීම් ආරම්භ වීමට පෙර

එහි ගර්භයේ දකුණු පාර්ශවයේ විශාල කොටසක් ගරා වැටී තිබුණි. බාහිර බැම්මේ සිට අඩි 20 ක් ඇතුළත බදාම රහිත තවත් බැම්මක් ද වූ බව බෙල් විසින් සොයා ගෙන තිබේ. මෙයට පසු කලකදී ආදී ස්තූපය විශාල කර බැඳවීම නිසා සිදු වූ දෙයක් ලෙස ඔහු එය තේරුම් කරයි. එහෙත් මෙම දැගැබේ මුලින් තිබූ ප්‍රමාණයන් පසු ව විශාල කළ බවක් ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් නොවේ. මෑතක දී කැනීම් කරන ලද මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ බාහිර බැම්මට තරමක් දුරින් ඇතුළු බැම්මක පිහිටා තිබුණි. ඒ දෙක අතර හරස් බිත්ති තිබූ බවට සලකුණු තිබේ. බිත්ති අතර වූ අවකාශ පසින් පුරවන ලදි. ඉහත සඳහන් දාගැබ් දෙකෙහි ම මෙම නිර්මාණ ලක්ෂණ අනුව දාගැබ විශාල කිරීමේ හේතුවෙන් සිදු වූවක් ද නැතහොත් දාගැබ ඉදිකළ ක්‍රමයක් දැයි නියම වශයෙන් දැනගත නොහැකි ය. කෙසේ වුව ද මේ පිළිබඳ ව නිශ්චිත වශයෙන් ම එක් නිදසුනක් වේ. අනුරාධපුරයේ පූර්වාරාමය (පුලියන්කුලම) අසල අක්කර දෙකක පමණ භූමි භාගයක වසා සිටි විශාල ගොඩැල්ලක් තිබේ. 1900 දී බෙල් විසින් මේ ගොඩැල්ල මධ්‍ය කණින ලදී. පස්වලින් පුරවා තිබූ සෘජුකෝණාස්‍රාකාර කොටස්වලින් සැදි බිත්ති එහිදී සොයා ගෙන තිබේ. එසේ ම දක්ෂිණ ස්තූපයේ ගර්භය මධ්‍යයෙහි දළ වශයෙන් සම සතරැස් වූ ගඩොලින් නිම වන ලද සිරස් කුළුණක් වූ බවත්, කරත්ත රෝදයක ගරාදිවල පට්ටමේ ආකාරයට මෙන් බාහිර වාපයේ දී කෙළවර වන ගඩොල් බිත්ති මෙකී කුළුණෙන් විහිදී ගිය බවක් බෙල් සඳහන් කර ඇත (එමඃ 21).

මේ විස්තරවලට අනුව ස්තූප ගර්භයේ ඇතුළත භාග ගඩොළු, ගඩොළු කැබලි හා පස් යොදා ගැනීමත්, හරස් බැමි බැඳීමත්, ජේතවන දාගැබට සුවිශේෂී වූවක් නොවන බව කිව යුතු ය. එය එදා පැවති සාම්ප්‍රදායික තාක්ෂණය වශයෙන් පිළිගැනීම යුක්ති සහගත ය. ජේතවන දැගැබින් මෙයට අදාළ සාධක හමු වීම ද ඒ අනුව වඩා වැදගත් වේ.

05. මීළඟට ජේතවනාරාම ස්තූප ගර්භයේ ඉදිකිරීම් තාක්ෂණය අවසාන අදියර ලෙස අංක 05 වශයෙන් හඳුන්වන ව්‍යුහය



නම් කර ඇත. ගර්භයේ මධ්‍යයට වන්නට හැරී තිබූ විශාල ආවාට තුළින් මේ ව්‍යුහයට අදාළ දත්ත මතුකර ගත හැකි විය. මෙම කොටස පස් හා ගඩොළු කැබලිවලින් සමන්විත වන අතර සිව් වැනි කොටසේ තිබූ පස් හා ගඩොළු කැබලිවලට වඩා තද බවින් යුක්ත විය. ඇත්ත වශයෙන් ම මෙය ජේතවන ස්තූපයේ අභ්‍යන්තර ව්‍යුහය විය යුතු ය. ජේතවනාරාම ස්තූපයේ අභ්‍යන්තර ව්‍යුහය කෙබඳු දැයි දැනගැනීම සඳහා 2000 වසරේ දී ස්තූපයේ හතරැස් කොටුවේ වයඹ මුල්ල පාදම අසලින් කැනීම් කරන ලදී. **ජේ.එස්.ඩී.2000** ස්ථාන නාමය යටතේ සිදු කරන ලද එම කැනීමේදී වඩාත් පැහැදිලි ව ස්තූප අභ්‍යන්තර ව්‍යුහය හඳුනාගත හැකි විය. ඉතා විධිමත් ව හා පරිස්සමින් සිදු කරන ලද මෙම පර්යේෂණ කැණීමේ දී ස්තූප ගර්භයේ මැද කොටස ඉදිකිරීම සඳහා පැරණි වාස්තුවිද්‍යාඥයින් ඉතා කුඩා කුඩා ගඩොල් කැබළි ස්තර අනු පිළිවෙළට විධිමත්ව අතුරා තබා ඇති බව (Layer by Layer) හඳුනාගත හැකි විය. එම කැණීමට අනුව ස්ථූප මධ්‍ය තනිකර ම පස්වලින් පුරවා නැති බව පැහැදිලි ව අවබෝධ කරගත හැකි වූ අතර එම කැනීම් කොටුවේ පාංශු පැතිකඩ පරීක්ෂා කිරීමේ දී දැකගත හැකි වුයේ එම කුඩා කුඩා ගඩොළු කැබළි පස් හා කුඩා ගඩොල් කැබළි ගොඩක් ලෙස දිස්වන බව ය. නමුත් එය පැහැදිලි ලෙස ම ඉතා ක්‍රමානුකූල ව අතුරන ලද ගඩොළු හා මැටි මිශ්‍රණයකින් යුත් බව කැනීම් සැලසුම් අධ්‍යයනයෙන් පැහැදිලි කරගත හැකි විය (මැන්දිස්,2000 :12-13).

මේ ආකාරයේ වාස්තුවිද්‍යාත්මක තාක්ෂණික ක්‍රමයන් ජේතවන ස්ථූප ගර්භය ඉදිකිරීම සඳහා පැරණි වාස්තුවිද්‍යාඥයින් උපයෝගී කරගත් බව පෙන්වාදිය හැකි ය. ජේතවනාරාම ස්තූපයේ සුවිශේෂී අංගයක් වන හතරැස් කොටුව ඉදි කිරීම සඳහා ද වාස්තුවිද්‍යාත්මක තාක්ෂණික ශිල්ප ක්‍රම අනුගමනය කර ඇති බව පර්යේෂණ ඇසුරින් අනාවරණය කරගත හැකි විය. අනුරාධපුරය හා පොළොන්නරුව කේන්ද්‍රගත කරගනිමින් වර්ධනය වූ රජරට රාජධානිය ක්‍රි.ව. 1215 දී සිදු වූ කාලිංඝ මාඝගේ ආක්‍රමණයෙන් පසුව සම්පූර්ණයෙන් ම බිඳ වැටුණු ආකාරය

වංසකතා සාධක අනුව පෙනේ (මව,80:58-80). ක්‍රි.ව. 1215 සිට සිදු වූ මෙම තත්ත්වය නව වැනි ශත වර්ෂය දක්වා ම අනුරාධපුරය ඇසුරින් පැවති අතර, අනුරාධපුර රාජධානියේ පැවති ආගමික ස්ථාන සියල්ලක් ම අත්හැර දැමීම නිසා ගරා වැටීම්වලට ලක්විය. ඒ අතරින් අනුරාධපුර මහාථූප තුනේ කොත් කැරැල්ලේ හා හතරැස් කොටුවේ තිබූ පැරණි කොටස් ස්වාභාවික විපත් හේතුවෙන් ගරාවැටීම නිසා හතරැස් කොටුව පාමුල පැරණි ගර්භය මත සුන්බුන්වලින් සමන්විත ගොඩැලි නිර්මාණය කළේ ය. ජේතවන ස්තූපය ආශ්‍රයෙන් ද මෙවැනි තත්ත්වයක් දැකගත හැකි වු අතර එම තත්ත්වය මුල්වරට වාර්තා කරන ලද්දේ බ්‍රිතාන්‍ය ජාතික වාස්තුවිද්‍යාඥයෙකු වූ ජේ.ජී. ස්මිදර් විසිනි. ඔහු ක්‍රමානුකූල ව එහි තිබූ තත්ත්වය වාර්තාකරණය කර ඇත (Smither,1894:68-69). ඉන් අනතුරු ව බ්‍රිතානය පාලනය යටතේ ජේතවන ස්තූපයේ හතරැස් කොටුව සම්බන්ධ පර්යේෂණ සිදුකර ඇත්තේ එච්.සී.පී. බෙල්, ඔටෙල් ආදී බ්‍රිතාන්‍ය ජාතිකයින් විසිනි. ගරාවැටී තිබූ හතරැස් කොටුවේ පැරණි ව්‍යුහය, යම් තරමකට හඳුනාගනිමින් ඔවුහු එය සංරක්ෂණය කළ බව වාර්තා වේ (*ASCAR*:1891). බ්‍රිතාන්‍යයන් විසින් හතරැස් කොටුව පිළිබඳ වාර්තාගතකරණයක් කෙරුණ ද හතරැස් කොටුවේ ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳව පුළුල් පරික්ෂණ 1980 ඇරඹි සංස්කෘතික ත්‍රිකෝණ ජේතවන ව්‍යාපෘතිය යටතේ සිදු වී ඇත. ඒ අනුව 1995 වසරේ සිට ඇරඹි හතරැස් කොටුවේ අභ්‍යන්තරය හා පිටත කැනීම් කටයුතු මගින් එහි වාස්තුවිද්‍යාත්මක තාක්ෂණය පිළිබඳ අනාවරණය කරගත හැකි විය. ඒ අනුව 1995 වසරේ එතෙක් ගර්භය මත ගොඩැල්ලක් ව තිබූ හතරැස් කොටුවේ දකුණු පස පාමුල කොටස කැනීම් කරන ලදුව යටත්විජිත ඉදිකිරීම්වලට යටින් හතරැස් කොටුවේ පාදමේ අර්ධඃපද්ම බොරදම මතුකර ගැනීමට හැකි වී ඇත (බණ්ඩාර,1995:27). මින් අනතුරු ව හතරැස් කොටු පාදමේ ගර්භය මත කොටස අධ්‍යයනය සඳහා 1996, 1997 වසරවල දී කැනීම් කටයුතු සිදු කරන ලද අතර එහිදී හතරැස් කොටුවේ නිර්මාණ තාක්ෂණය හඳුනාගත හැකි විය (ගම්ලත්,1996:51). ඉහත වසරවලදී ම හතරැස් කොටුවේ අභ්‍යන්තරයේ සිදු කරන ලද කැනීම්වල දී ඒ සඳහා පොදු තාක්ෂණික ක්‍රම හඳුනාගත හැකි



වීම ද වැදගත් වේ. කැනීම් ඒ, බී වශයෙන් සිදුකළ කැනීම්වලදී ස්තූප හතරැස් කොටුවේ පැරණි ඉදි කිරීමට අයත් ගඩොළු ව්‍යුහය හඳුනාගත හැකි විය. එහිදී හතරැස් කොටුව ඉදි කිරීම සඳහා විවිධ ප්‍රමාණවලින් යුත් ගඩොළු භාවිත කර ඇති බව අවබෝධ කරගන්නා ලදි. මෙම ගඩොළු හොඳින් පිළිස්සූ ඒවා වන අතර එම ගඩොළු බැඳීම සඳහා සියුම් ව හලාගත් මැටි භාවිත කර ඇති අතර කොත්කැරැල්ල හා දේවතා කොටුව යටින් වන හතරැස් කොටුවේ මැද කොටස සඳහා භාග ප්‍රමාණයේ කුඩා ගඩොල් භාවිත කර තිබීම ද දැකගත හැකි විය. හතරැස් කොටුව තුළ වූ ගඩොල් බැඳීමේ දී සෙ.මී. 1/2 ක කුස්තුර ඝනකමකින් ගඩොළු බැඳීමේ තාක්ෂණය එලෙසින් ම පවත්වා ගෙන ගිය බව ද පෙනේ (එම:83). හතරැස් කොටුවේ පිටත බිත්තිය ආසන්නයට ගඩොළු බැඳීමේ දී පැරණි ශිල්පීන් විසින් ප්‍රමාණයෙන් විශාල ගඩොළු භාවිත කරමින් බිත්තිය බැඳ තිබීම ද පෙන්වාදිය හැකි ය (එම:83). මේ ආකාරයට බැඳ ඇති හතරැස් කොටුවේ පාදම හා එහි පැරණි ව්‍යුහයේ සම්බන්ධතාවය සෙවීම සඳහා 2000 වසරේ දී සිදුකළ ජේ.එස්.ඩී.2000 කැණීම මගින් හතරැස් කොටුවේ පාදමේ නිර්මාණ තාක්ෂණය හඳුනාගන්නා ලදි.

අනුරාධපුර මහාථූපයන්හි හතරැස් කොටුවල පාදම කෙබඳු වී දැයි මෙතෙක් පුළුල් අධ්‍යයනයන් කර ඇත්තේ ජේතවන ස්තූපයේ හා අභයගිරි ස්තූපයේ පමණි. දැනට අනාවරණය කරගෙන ඇති කරුණු අනුව ලංකාවේ ස්තූප සඳහා හතරැස් කොටුව ඝණයක් ලෙස ඉදිකිරීමේ දී ස්තූප පාදමේ මුල සිට ම හතරැස් කොටුවේ බැම්ම ඝණයක් ආකාරයට ඉදිකර තිබුණේ ද යන්න පිළිබඳ ව විවිධ උගතුන් අදහස් පලකළ ද එයට නිසි පිළිතුරු ජේතවන හතරැස් කොටුවේ පාදම ඇසුරින් සොයා ගත හැකි විය. ඒ අනුව හතරැස් කොටුව පාදම කැනීමේ දී අනාවරණය වූ කරුණු අනුව හතරැස් කොටුව ආරම්භ වන්නේ ස්තූපයේ දැනට දැකිය හැකි පැරණි ගර්භයේ ඉහළ සිට මීටර් 2 ක් ගර්භය ඇතුළතින් බව පෙනේ (මැන්දිස්,2000:22). ඒ අනුව හතරැස් කොටුවේ පාදමේ ස්වරූපය මේ ආකාරයෙන් වේ. මීටර් 2 ක් ගර්භය අභ්‍යන්තරයෙන් පටන් ගන්නා ස්ථාවර ගඩොළු බැම්මක් සෙ.මී. 6 ක ඇතුළතට පැන්නුමකින් යුක්ත ව ගඩොල් වරි 12 ක් බැඳ ඇත. එතැන සිට

මීටර් 1 ක් පමණ වන කොටස ගර්භයේ ඉහළ මට්ටම දක්වා සෘජු ව බැඳ එතැන් සිට මීටර් 1 ක් පමණ වන කොටස ගර්භයේ ඉහළ මට්ටම දක්වා සෘජු ව බැඳ ඇත. එය ගර්භයේ අර්ධඃපද්ම බොරදම දක්වා පැමිණේ. එසේ පැමිණෙන හතරැස් කොටුවේ බැම්ම විශාල ගඩොළු හා කුඩා ගඩොළු හා භාග ගඩොළු යොදා ගනිමින් බැඳ තිබේ. මෙසේ බැඳ ඇති ජේතවන ස්තූපයේ හතරැස් කොටුවේ පාදමේ එක් පැත්තක දිග මීටර් 28 ක් (අඩි 92 අඟල් 4) වන අතර ඒ සඳහා පර්චස් 31. 35 ක් (වර්ග අඩි 8537. 73) භූමියක් යටකර ඇති බව හඳුනාගත හැකි ය(එම23).

මේ ආකාරයට ඉදිකිරීම් තාක්ෂණය හතරැස් කොටුව ආශ්‍රයෙන් දැකගත හැකි අතර මෙතනින් ඉහළ කොටස ද මේ ආකාරයට තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැක්කේ අභයගිරි විහාරයේ දැනට ඉතිරි වී ඇති දේවතා කොටුවේ හා කොත් කැරැල්ලේ ස්වරූපය අධ්‍යයනය කරන විට ය.

## 4. 2 ජේතවන ස්තූපයේ මාණ

ජේතවන ස්තූපයේ මිණුම් පිළිබඳ මුල් ම සාධක අපට සොයාගත හැකි වන්නේ මූලාශ්‍රය ආශ්‍රයෙනි. එහෙත් මූලාශ්‍රයවල සඳහන් වනුයේ මෙම ස්තූපයේ උස පිළිබඳ ව පමණක් වන අතර අනෙකුත් කොටස්හි මිණුම් සෙවීමේ දී ස්තූපය ආශ්‍රයෙන් මෙතෙක් සිදුකර ඇති පර්යේෂණ හා මිණුම්ගත කිරීම්වල ද අගයන් පිළිබඳ ව විමසීමක් සිදුකර ස්තූපය සම්බන්ධ ව නිවැරදි මිණුම්කරණයක් මෙයින් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

මහාවංසයේ දැක්වෙන ආකාරයට ජේතවන ස්තූපය රියන් 160 ක් වූ බව සඳහන් වෙයි (මව,78:102). කෝට්ටේ යුගයේ රචිත පැරකුම්බා සිරිත නම් ග්‍රන්ථයේ දක්වා ඇත්තේ ජේතවන ස්තූපයේ උස රියන් 140 ක් වශයෙනි (පැසි,48). මෙකී රියන පිළිබඳ ව අදහස් දක්වා ඇති සෙනරත් පරණවිතාන පුරාණ වඩු රියන වශයෙන් එය හඳුනාගෙන ඇති අතර එය අඟල් 30 කින් සමන්විත බව ද පෙන්වා දී තිබේ (පරණවිතාන,1963:05). ලංකාවේ පුරාණ වඩු රියන පිළිබඳ සඳහන් වන සඳහනක් සිංහල දළදාවංසයේ



එයි. එහි සඳහන් වන ආකාරයට දෙ වැනි පරාක්‍රමබාහු රජතුමා ශ්‍රී දළදා වහන්සේ සඳහා කළ එක් කරඩුවක් වඩු රියන් දෙකක් උසින් යුක්ත ව නිර්මාණය කළ බව සඳහන් වේ (සිදවං,40). එසේ ම කුරුණෑගල සිව් වැනි පරාක්‍රමබාහු රජ දවස වඩු රියන් 45 ක දිගින් යුතු තොටගමු වෙහෙරේ තිබූ දීර්ඝ ප්‍රාසාදය අලුත්වැඩියා කළ බව ද සඳහන් වේ (එම:45). මේ ආකාරයට පුරාණ ග්‍රන්ථවල සඳහන් මාණ අතර වඩු රියන් ප්‍රධාන තැනක් ගන්නා බව පෙනේ. ඒ අනුව පැරණි වාස්තුවිද්‍යාඥයින් පුරාණයේ භාවිත කර ඇත්තේ වඩු රියන බව පෙනේ.

සෙනරත් පරණවිතානගේ මතයට අනුව පැරණි වඩු රියන අඟල් 30 ක් වේ (පරණවිතාන,1963:05). නමුත් උක්ත අදහස චන්ද්‍රා වික්‍රමගමගේ බැහැර කරන අතර, ඔහුගේ මතය වන්නේ අනුරාධපුරයේ මෙන් ම පොළොන්නරු යුගයේ භාවිත වූයේ අඟල් 24 කින් යුත් වඩු රියනක් බව ය. මේ සඳහා ඔහු ඉදිරිපත් කරන තර්කය වන්නේ දහතුන් වැනි ශත වර්ෂයේ දී රචිත වෛජයන්ත තන්ත්‍රයේ එන තොරතුරුය. ඔහු පැහැදිලි කර ඇති ආකාරයට විතස්තියට අඟල් 12 ක් ඇති බවත්, රියනකට (හස්තයට) විතස්ති දෙකක් වන බැවින් පැරණි වඩු රියන අඟල් 24 වන බව ප්‍රකාශ කර තිබේ (වික්‍රමගමගේ,2001:82). මෙම තර්කය අනුව ද පැරණි වඩුරියන නියම ලෙසින් වර්තමාන අඟල් කිහිපයක් වූවා දැයි නිශ්චිත නොවේ.

පරණවිතානගේ මතයට අනුව පැරණි වඩු රියන අඟල් 30 ක් වූවා නම් ජේතවන ස්තූපයේ උස පිළිබඳ ව මහාවංසයේ සඳහන් වන මිණුම් අනුව එය රියන් 160 ක් අඩි 400 ක් විය යුතු ය. සාමාන්‍යයෙන් ස්තූපයක උස ගණනය කරනු ලබන්නේ සලපතර මළුවේ සිට බැවින් උක්ත උස පිළිබඳ ව වංසකතාවල සඳහන් පුවත් හා පුරාවිද්‍යාත්මක සාධක පදනම් කරගනිමින් ජේතවන ස්තූපයේ උස කෙබඳු දැයි සෙවීම ඉතා ම වැදගත් වේ. ස්තූපයේ උස අධ්‍යයනය කිරීමේ දී එහි පාදමේ පරිධිය ගර්භයේ පරිධිය යන මිණුම් පිළිබඳ ව ද සැළකිලිමත් වීමෙන් මේ පිළිබඳ නිශ්චිත අදහසක් ලබාගත හැකි ය.

සෙනරත් පරණවිතානගේ මතය අනුව ජේතවන ස්තූපය පාදම අඩි 370 ක විෂ්කම්භයකින් යුක්ත බව සඳහන් කරයි

(පරණවිතාන,1963:07). ඔහු පාදම වශයෙන් සලකනු ලබන්නේ පළමු වැනි පේසාව (පහළ ම පේසාව) වශයෙන් හඳුන්වන කොටසේ විශ්කම්භය බව පෙනේ. නමුත් ජේතවන ස්තූපයේ පාදම පරණවිතාන හඳුන්වන පාදම බව පිළිගත නොහැකි ය. එය ජේතවන ස්තූපයේ සලපතර මළුවට යටින් මීටර් 7. 13 ක් පොළොව අභ්‍යන්තරයෙන් ආරම්භ වන බව ඉහත දී ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සලපතර මළුවට යටින් දැකිය හැකි ස්තූප පාදම ආරම්භ වන්නේ ප්‍රථම පේසාවේ සිට ගතහොත් මීටර් 6. 25 ක් පිටතින් කවයක් ආකාරයට ය. එසේ ආරම්භ වන කවාකාර ස්තූප පාදමේ පරිධිය මීටර් 424. සෙ.මී 30 (අඩි 1421 අඟල් 4) පමණ වේ. එවන් පරිධියක් හෙබි පාදමේ විශ්කම්භය වන්නේ මීටර් 135 සෙ.මී. 06 (අඩි 454 අඟල් 2) ක් බව වර්තමානයේ සනාථ කරගෙන ඇත (මැන්දිස්,1998:14-15). එසේ හෙයින් පරණවිතාන මහතා පෙන්වාදෙන ආකාරයට ස්තූප පාදම අඩි 370 ක විශ්කම්භයකින් යුක්ත වන බවට ඉදිරිපත් කර ඇති තර්කය ස්තූප පාදමේ පවතින භෞතික මිණුම් අනුව පිළිගත නොහැකි ය. ඔහු විසින් දැනට පළමු වැනි පේසාව (පහළ පේසාව) හඳුන්වන කොටස උපයෝගී කර ගෙන එහි විශ්කම්භය ලෙස අඩි 370 ලෙස දැක් වුව ද එය ද එසේ නොවේ. දැනට පැරණි ව්‍යුහයන්ට අනුව සංරක්ෂණය කර ඇති ජේතවන ස්තූපයේ පේසා වළළු ආරම්භ වන්නේ ගර්භයේ සිට මීටර් 10 සෙ.මී. 40 ක් දුරිනි. ඒ අනුව පළමු වැනි පේසා වළල්ලෙහි පරිධිය මීටර් 325 සෙ.මී. 28 (අඩි 1089 අඟල් 6) කි. එම පරිධියට අනුව එහි විශ්කම්භය මීටර් 122 සෙ.මී. 64 (අඩි 410. අඟල් 8) කි (එම:14 - 15). ඒ අනුව සෙනරත් පරණවිතාන ඉදිරිපත් කර ඇති මිනුම් පිළිගත හැකි තත්ත්වයක නොමැත්තේ ස්තූපයේ පැරණි පාදම, පේසාවළළු, ගර්භයේ පරිමාණයත් ජේතවන ස්තූපය ඇසුරින් දැඩි වෙනසකට භාජනය නොවී තිබීම මත යි.

ජේ.ජී. ස්මිදර්ගේ මිණුම් අනුව ද ජේතවන ස්තූප පාදමේ විශ්කම්භය ලෙස අඩි 367 දක්වා ඇත (Smither,1894:69). යථෝක්ත කරුණු අනුව උක්ත මිනුම් ද පිළිගත නොහැකි ය තත්ත්වයක පවතී. ස්මිදර් දක්වන ආකාරයට ජේතවන ස්තූපයේ ගර්භයේ විශ්කම්භය අඩි 325 වේ. වර්තමානයේ සිදු කරන ලද මිණුම් කරන කටයුතු අනුව ගර්භයේ පරිධිය මීටර් 320 (අඩි 1072) ක් ලෙස පවතින බව සොයා ගෙන ඇති අතර ඒ අනුව



එහි විශ්කම්භය වන්නේ මීටර් 101 කි. එනම් අඩි 338 අඟල් 3 කි (මැන්දිස්,1998,14-15). ස්මිදර්, පරණවිතාන යන අය විසින් වාර්තාගත කිරිම් සිදු කරන වකවානුවේ දී ජේතවන ස්තූපය ගරාවැටී තිබූ වකවානුවක් බැවින් උක්ත මිනුම්හි යම් යම් අඩුපාඩුකම් තිබීම සිදුවිය හැකි බව අප පිළිගත යුතු ව තිබේ. කෙසේ වෙතත් වර්තමාන පර්යේෂණ ඇසුරෙන් සොයාගත් නව මිණුම් ස්තූපයේ මාණ අධ්‍යයනයේ දී ඉතා වැදගත් බව ද අවධාරණය කළ හැකි ය.

ඉතා විශාල භුමි භාගයක් යටකර ඉදි වී ඇති මෙම දැවැන්ත ස්තූපයේ පේසාවළළු අවස්ථා කිහිපයක දී ප්‍රතිසංස්කරණය වී ඇති බව වංසකතා හා පුරාවිද්‍යා සාධක අනුව ද හඳුනාගත හැකි ය. ඒ අනුව ස්තූපයේ මූලික මිණුම් වෙනස් නොවූ බවට ද පුරාවිද්‍යාත්මක සාධක තිබේ. දැනට සංරක්ෂණය කර ඇති ජේතවන ස්තූපයේ නිරිත දිග කොටසේ පේසාවෙහි දැකිය හැකි හුණු බදාමය හා එහි පහළ බොරදමේ කොටස් ප්‍රතිසංස්කරණයක කොටස් ලෙස පෙන්වාදිය හැකි ය. මෙය බොහෝ විට අවසන් ප්‍රතිසංස්කරණයේ දී සිදු වූ ඒවා වීමට වැඩි ඉඩක් පවතී. ජේතවන ස්තූපයේ අවසන් ප්‍රතිසංස්කරණය පළමු වැනි පරාක්‍රමබාහු රජතුමා සිදුකළ බව මහාවංසයේ සඳහන් වේ (මව,78:102). ස්තූපයේ නිරිත දිග කොටසේ දැකිය හැකි පේසාවේ බොරදම අර්ධඃපද්ම හැඩය ගන්නා අතර, එයට වඩා වෙනස් ආකෘතියක් 1999 ආයක අභ්‍යන්තර කැනීමවලින් සොයා ගෙන ඇත. උක්ත කැනීම්වල දී ආයකයෙන් වැසී තිබූ පේසාවේ පහළ කොටස බොරදමින් තොරව අංශක $90^0$ ක හැඩයෙන් තනා තිබූ අතර එම පේසාවේ හුණු බදාම කපරාරුව හොඳින් ආරක්ෂා වී පැවතින.මෙම පැරණි පේසාවේ කොටස් දකුණු ආයකය හා උතුරු ආයකය තුළ මෙවන විට සංරක්‍ෂණය කර තිබේ. නමුත් නිරිත දිග කොටස තුළදී පේසාවේ පහළට බොරදමක් එකතු වී තිබීම මෙහි ප්‍රතිසංස්කරණයක ප්‍රතිඵලයක් බව පෙනේ (මැන්දිස්,ලියනගේ,1999: 14-15). කෙසේ වෙතත් ආයක ඇතුළත පේසාව හා ආයක පිටතින් පේසාවේ ප්‍රමාණවල වෙනසක් දැකිය නොහැකි අතර පේසාව සඳහා නව අංගයක් ලෙස බොරදම පමණක් එකතු වී ඇත. ජේතවන ස්තූපයේ පේසා වළළුවල මිණුම් සම්බන්ධ ව මුලින් ම අදහස් ඉදිරිපත්


කර ඇත්තේ ජේ.ජී ස්මිදර් ය. ඔහු පෙන්වා දී ඇති ආකාරයට ස්තූපයේ පේසා වළළුවල මිණුම් මෙසේ ය.

| | අඩි-අඟල් | |
|---|---|---|
| I වැනි පේසාව සලපතර මළුවේ සිට උස | - | 69 |
| II වැනි පේසාව සලපතර මළුවේ සිට උස | 11 | 06 |
| III වැනි පේසාව සලපතර මළුවේ සිට උස | 16 | 00 |

(Smither, 1894:69). සලපතර මළුවේ සිට පේසාවළළුවල උස ස්මිදර් ඉහත ආකාරයෙන් දක්වා තිබේ. රෝලන්ඩ් සිල්වා විසින් දක්වා ඇති අදහස් අනුව ජේතවන ස්තූපයේ පේසා වළළු අඩි 17ක් උස වේ (Silva,1998:283). මෙම ග්‍රන්ථයේ කතුවරයා විසින් සිදුකළ මිණුම්වල දී ජේතවන ස්තූපයේ පේසාවල මිණුම් මෙසේය.

| | මීටර් | අඩි | අඟල් |
|---|---|---|---|
| I වැනි පේසාව සලපතර මළුවේ සිට උස | 2.01 | 07 | 00 |
| II වැනි පේසාව සලපතර මළුවේ සිට උස | 3.43 | 11 | 04 |
| III වැනි පේසාව සලපතර මළුවේ සිට උස | 4.68 | 15 | 06 |

සලපතර මළුවේ සිට එක් එක් පේසාවන්ගේ උස මෙසේ හරස්කඩකින් දැක්විය හැකි ය.




මේ අනුව ස්මිදර් හා රෝලන්ඩ් සිල්වා දක්වා ඇති මිණුම් හා වර්තමානයේ දැකිය හැකි පේසාවේ මිණුම් අතර ඇත්තේ



වෙනස්කමක් බව පෙනේ. මෙය ඉහත දී දක්වන ලද ආකාරයට වල්බිහිවී පැවති ස්තූපයක මිණුම් ගැනීමේ දී වූ දෝශයක් බව අප පිළිගත යුතු ය. දැනට දැකිය හැකි ස්තූප පේසාවන් වර්තමාණයේ කැනීම් කිරීමට ප්‍රථම සලපතර මළුවේ සිට අඩි 20 කට වඩා ගොඩගැසුණු සුන්බුන්වලින් වැසී තිබුණි.

දැවැන්ත වට ප්‍රමාණයකින් යුත් ස්තූප පාදමකට සරිලන ගර්භයක් ජේතවන ස්තූපය ආශ්‍රයෙන් දැකගත හැකි ය. මීටර් 320 (අඩි 1072) ක වට ප්‍රමාණයකින් යුත් ස්තූප ගර්භයේ විශ්කම්භය මීටර් 101 (අඩි 338 අඟල් 3) ක් බව ඉහත දී පෙන්වා දී ඇත. යථෝක්ත වට ප්‍රමාණයට සරිලන උසින් ජේතවන ස්තූප ගර්භය පිහිටන බව ද මිණුම් ගතකිරීම් අනුව පෙන්වාදිය හැකි ය. ස්මිදර්ගේ වාර්තා කිරීම් අනුව ජේතවන ස්තූපයේ ගර්භයේ උස අඩි 150 ක් වන බව දක්වා තිබේ (Smither,1894:69). ස්මිදර් දක්වා ඇති පැතිකඩ සැලැස්ම අනුව ඔහු ස්තූපයේ පැවතිය යුතු හැඩය කඩ ඉරිවලින් පෙන්වාදී ඇත (*ibid*:PLXLV). එම සැලැස්මට අනුව ද ඒ වකවානුවේ හතරැස් කොටුවේ පාදම කොටස සුන්බුන් පිරී ඇති බව හඳුනාගත හැකි ය (*ibid*). 1995 - 1998 වසරවල දී ජේතවන ස්තූපයේ හතරැස් කොටුවේ පාමුල සිදුකළ කැනීම්වලදී එහි පාදමේ බොරදම හඳුනාගත හැකි විය. බොරදම හා ගර්භයේ ඉහළ කෙළවර හතරැස් කොටුවට සම්බන්ධ වන ස්ථානය එහි දී නිවැරදි කරගත හැකි වූ බැවින් ගර්භයේ හා හතරැස් කොටුවේ නිවැරැදි මිණුම් ගත කරගැනීමට ඒ අනුව හැකි වී තිබේ. ඒ අනුව සලපතර මළුව සිට හතරැස් කොටුව පාදම දක්වා ගර්භයේ උස මීටර් 42 සෙ.මී. 43 (අඩි 142. අඟල් 1) ක් බව පෙනේ. මෙය ස්මිදර් දක්වන මිණුම්වලට අනුව අඩි 8 අඟල් 9 ට අඩු අගයක් වේ. ජේතවන ස්තූපයේ ගර්භයේ උස සම්බන්ධ ව අදහස් දක්වා ඇති රොලන්ඩ් සිල්වාගේ මතය අනුව ස්තූප ගර්භය අඩි 137 ක් උස වේ (Silva,1988:283). කෙසේ වෙතත් ඔහුගේ මිණුම් හා වර්තමාන මිණුම් අතර ඇත්තේ අඩි 5 ක වෙනසකි. මෙම වෙනස්කම් සඳහා බලපා ඇත්තේ 1890 - 1988 වන විට සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය යටතේ ජේතවන ස්තූපයේ සංරක්ෂණ කටයුතු ආරම්භ කිරීම මත ස්තූපය ඇසුරින් පර්යේෂණ යම් ප්‍රමාණයක් සිදු කරගෙන යන වකවානුවක් වූ බැවින් බව පෙන්වාදිය හැකි ය.

ජේතවන ස්තූපයේ ගර්භයේ ප්‍රමාණයට අනුව එහි දැවැන්ත හතරැස් කොටුවක් ද දැකගත හැකි ය. හතරැස් කොටුව ගර්භයට සම්බන්ධ වන ස්ථානයේ දිග පළල මීටර් 26 සෙ.මී. 30 (අඩි 88. අඟල් 1) කි. හතරැස් කොටුවේ උස ලෙස ස්මිදර් දක්වා ඇත්තේ අඩි 33 කි. එහි මුදුණ ඔහු මැණ ඇත්තේ මළුවේ සිට ගර්භයත් සමඟ එකට ගනිමිනි. මුළු උස ලෙස අඩි 183 ක් ඔහු දක්වා ඇති අතර ගර්භයේ උස අඩි 150 අඩු කළ විට හතරැස් කොටුව අඩි 33 ක් වන බව ස්මිදර්ගේ මිණුම් අනුව පෙනේ (Smither,1894:PL. XLV) හතරැස් කොටුව ඉහළ ජේතවන ව්‍යාපෘති යටතේ සිදුකළ කැනීම්වලදී හතරැස් කොටුවේ උපරිම උස සහිත ස්ථානය දේවතා කොටුව පාමුලින් උතුරු දිශාවෙන් මතුකර ගෙන ඇත. මෙම පැරණි හුණු බදාම කපරාරුව සහිත කොටස බ්‍රිතාන්‍ය යුගයේ නැවත පුරවා තිබූ අතර, මෙම සුන්බුන් ඉවත් කිරීමෙන් පැරණි කොටස මතුකර ගත හැකි විය (ගම්ලත්, 1997:94 - 98). දැනට ද ඉතිරි වී ඇති මෙම පැරණි කොටසේ තොරතුරු අනුව හතරැස් කොටුව මීටර් 11 සෙ.මී. 20 ක් උසකින් යුක්ත බව පෙනේ. එය අඩිවලින් දැක්වෙතොත් අඩි 37. අඟල් 05 කි. බ්‍රිතාන්‍ය යුගයේ මෙම පුරාණ කොටස් අධ්‍යයනය නොකර එහි පැරණි පාදම හා උපරිම උස සොයා නොබලා ප්‍රතිසංස්කරණය කර ඇති බව මේ අනුව පැහැදිලි වේ. රෝලන්ඩ් සිල්වාගේ මතය අනුව ජේතවන ස්තූපයේ හතරැස් කොටුව අඩි 29 ක් වේ (SIlva,1988,282). කෙසේ වෙතත් වර්තමාණ පර්යේෂණ ඇසුරින් එහි නියම උස සොයාගත හැකි වීම ඉතා වැදගත් කරුණක් බව සැළකිය හැකි ය. ජේතවන ස්තූපයේ දේවතා කොටුව සම්බන්ධ ව ස්මිදර් නිශ්චිත මිණුම්කරණයක් නොදක්වන අතර, ඔහුගේ මිණුම අනුව එවකට කැඩී බිඳී ගිය ස්තූපයේ මුළු උස අඩි 232 ක් වශයෙන් දක්වා ඇත (Smither,1894:69).(P.L X LV) බ්‍රිතාන්‍යයන් විසින් සිදු කරන ලද දේවතා කොටුව ප්‍රතිසංස්කරණ කටයුතුවලදී එහි පැරණි ව්‍යුහය උපයෝගී කරගෙන ස්තූපය ප්‍රතිසංස්කරණය කර ඇති බව පෙනේ (*ASCAR*:1892). සැලසුම් හා පැතිකඩ ඇඳ ඉදිරිපත් කර ඇති එම තොරතුරු අනුව වර්තමානයේ දැකගත හැකි උස දක්වා දේවතා කොටුව හා කොත්කැරැල්ල බැඳ තිබේ. එය අඩි 252 ක් දක්වා කළ බව ද එහි සඳහන් වේ (*ibid*).




හතරැස් කොටුව මුදුනේ සිට ආරම්භ වන කොත්කැරැල්ල ස්මිදර් සමය වන විට අඩි 44 දක්වා තිබී ඇත. නමුත් කොත්කැරැල්ල පසු ව කැඩීගිය බැවින් එහි උස නිශ්චිත ව ම ප්‍රකාශ කළ නොහැකි අතර, ස්තූපයේ නියම උස කොපමණ වූවා දැයි සෙවීමේ දී ස්තූප ප්‍රමාණ පිළිබඳ ව පුරාණ මත විමසීම ද ඉතා වැදගත් වේ. ස්තූප ප්‍රමාණ මූලධර්ම පිළිබඳ ව අධ්‍යයනය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාවේ ස්තූප තැනවීම සඳහා අනුමාන මිනුම් ක්‍රමයක් භාවිත වී තිබෙන බව චන්ද්‍රා වික්‍රමගමගේ පෙන්වා දෙයි. ඔහු විසින් හෙන්රි පාකර්, සෙනරත් පරණවිතාන, ගෝවින්ද යන විද්වතුන් ස්තූප ප්‍රමාණ මූලධර්ම පිළිබඳ ව දක්වා ඇති අදහස් සසඳා බලා එහි යම් ප්‍රායෝගික බවත් ඇති බව පෙන්වාදී තිබේ (වික්‍රමග මගේ,1990:134-138). වික්‍රම ගමගේ විසින් මෙම ස්තූප ප්‍රමාණ මූලධර්මය අධ්‍යයනය සඳහා රුවන්වැලි ස්තූප මළුවේ තිබෙන කුඩා ස්තූපයේ පේසා වළළුවල සිට කොත්කැරැල්ල දක්වා මිණුම් සංස්කෘත ශ්ලෝකවල ප්‍රමාණ හා මිණුම් පිළිබඳ ව සසඳා බැලීමට උපයෝගී කරගෙන ඇත. මෙම සැසඳීමට අනුව ලිඛිත සම්ප්‍රදාය හා පුරාවිද්‍යා සාධක අතර අවස්ථා කිහිපයක දී ආසන්නතාවක් දැකිය හැකි බව ඔහුගේ මතය වේ (එම,1990:146). සෙනරත් පරණවිතාන දක්වා ඇති අදහස් අනුව පැරණි දාගැබ් කළවුන් යම්කිසි රීතිමාලාවක් අනුගමනය කළ හැකි බව සිතාගත හැකි යයි සඳහන් කර ඇතත් ඒ කිනම් රීතිමාලාවක් ද යන්න ස්ථිර ලෙස ප්‍රකාශ කර නැත (පරණවිතාන,1963:37).

වික්‍රමගමගේ දක්වන අදහස් අනුව ස්තූපයක තිබිය යුතු ප්‍රමාණ මේ ආකාරයෙන් වේ. ස්තූපයක මළුවේ සිට දේවතා කොටුවේ මුදුණට ඇති උස ප්‍රමාණය එම ස්තූපයේ සමස්ත උසින් 3/4 කි. කොත්කැරැල්ල එම මුළු උසින් 1/4 කි. ගර්භය මළුවේ සිට 1/3 කි (වික්‍රමගමගේ,1990:145). ලිඛිත සම්ප්‍රදාය හා පුරාවස්තු අතර සම විෂමතාවයක් පවතින බව වික්‍රමගමගේ වගුවක් ආශ්‍රයෙන් මෙසේ ඉදිරිපත් කර තිබේ.


| ස්තූපයේ | ලිඛිත සම්ප්‍රදාය | පුරාවස්තු |
|---|---|---|
| 1. ත්‍රිමාල | 1/4+ | 1/5 + |
| 2. අණ්ඩ | 1/3 | 1/2 + |
| 3. චතුරස්‍ර කෝෂ්ඨ | 5/ 8 + | 1/6 + |
| 4. දේවතා කෝෂ්ඨ | 5/8 + | 1/ 23 + |
| 5. දණ්ඩ | 1/4 | 1/3 + |

මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ ස්තූප සඳහා ප්‍රමාණ ක්‍රමයක් හෝ ක්‍රම කිහිපයක් පවතින්නට ඇතැයි සිතිය හැකි බවත්, අද වනවිට ඒවා අවුල් සහගත තත්ත්වයකට පත් ව ඇති බවත් සිතාගත හැති බව ඔහු පවසයි (එම, 1990:198 - 149). මෙම ස්තප ප්‍රමාණ මූලධර්ම හා ජේතවන ස්තූපයේ පුරාණ උස පිළිබඳ ව සෙවීමේ දී වර්තමානයේ එහි පවතින මිණුම් මේ ආකාරයට අපට දළ හරස්කඩ සැලසුමකින් ඉදිරිපත් කළ හැකි ය.






අප විසින් සිදු කරන ලද මිණුම්කරණය අනුව දැනට ජේතවන ස්තූපයේ කැඩී ඇති කොත්කැරැල්ල දක්වා උස මීටර් 77 සෙ.මී. 77 (අඩි 260. අඟල් 5) වේ. ජේතවන ස්තූපයේ හතරැස් කොටුව හා කොත්කැරැල්ල බ්‍රිතාන්‍ය යුගයේ දී ප්‍රතිසංස්කරණය කරන ලද බව වාර්තාවල සඳහන් වේ (*ASCAR*:1892). හතරැස් කොටුව හා කොත්කැරැල්ල සංරක්ෂණයේ දී එහි පැවති පුරාණ ඉදිකිරීම් යම් තරමකට උපායෝගී කරගෙන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සිදුකර ඇති ආකාරය ගරාවැටී තිබූ හතරැස් කොටුව මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ප්‍රතිසංස්කරණය කිරීමේ දී සොයා ගත හැකි විය. ජේවන ස්තූපයේ කොත්කැරැල්ල නැවත සකස් කිරිම සඳහා බෙල් විසින් උපයෝගී කරගෙන ඇත්තේ හතරැස් කොටුව ඉහළ උතුරුපස දේවතා කොටුව පාමුල ඉතිරි වී ඇති පැරණි බදාමය සහිත ව්‍යුහයට අනුව බව පෙනේ. එම පැරණි ව්‍යුහයට අනුව දේවතා කොටුව පාදම පරිධිය මීටර් 46 සෙ.මී. 05 (අඩි 155 අඟල් 07) ක් වන අතර එහි උස මීටර් 7 සෙ.මී. 46 (අඩි 24. අඟල් 09) ක් වේ. දේවතා කොටුවේ ඉහළින් ආරම්භ වන කොත්කැරැල්ලෙහි පහළ පරිධිය මීටර් 34 සෙ.මී. 30 (අඩි 113 අඟල් 09) ක් වන අතර දැනට කොත්කැරැල්ල කැඩී ඇති ස්ථානයේ පරිධිය මීටර් 25 සෙ.මී. 10 (අඩි 84) ක් වේ. කොත්කැරැල්ල ආරම්භ වන දේවතා කොටුව ඉහළ සිට එය කැඩී ඇති ස්ථානය සඳහා උස මීටර් 9 සෙ.මී. 10 ක් (අඩි 30 අඟල් 04) ලම්භ උසක් ද දැකගත හැකි ය. මෙම මාණයන් උපයෝගී කරගෙන කොත්කැරැල්ලේ උපරිමය කෙසේ විය හැකි දැයි අපට මේ ආකාරයට සමරූපී ත්‍රිකෝණ උපයෝගී කර ගෙන ගණනය කළ හැකි ය.



මෙම ගණනය කිරීම් අනුව ජේතවන ස්තූපයේ මුළු උස කොත සමඟ විය යුත්තේ මීටර් 99 සෙ.මී. 69 (අඩි 333 අඟල් 9) ක් බව පෙනේ. දැනට ඇති දත්තයන් අනුව ස්තූපයේ මුළු උස මේ ආකාරයෙන් විය යුතු බව අපට ගණනය කළ හැකි වුව ද මෙම උස පුරාණ අනුපාත මූලධර්ම හා සැසඳේ දැයි විමසිය යුතු ය.

ස්තූප ප්‍රමාණ මූලධර්ම පිළිබඳ ව අදහස් දක්වා ඇති හෙන්රි පාකර්, සෙනරත් පරණවිතාන හා ගෝවින්ද යන තිදෙනාගේ මූලාශ්‍රයන් ඇසුරු කරගෙන වික්‍රමගමගේ ඉදිරිපත් කරන මිණුම් අනුව ස්තූපයක මුළු උස මෙසේ අනුපාතයකට බෙදයි.

| | |
|---|---|
| පේසා තුන | 5 1/2 |
| ගර්භය | 8 |
| හතරැස් කොටුව | 2 1/2 |
| දේවතා කොටුව | 2 |
| කොත්කැරැල්ල | 6 |
| | 24 |

(වික්‍රමගමගේ,1999:137)

ඉහත මූලාශ්‍රයවල එන ප්‍රමාණ මිණුම් අනුව ජේතවන ස්තූපයේ තිබිය යුතු උස වගුවකට මේ ආකාරයට ගත හැකි ය.



| | ජේතවන ස්තූපයේ භෞතික මිනුම් | අනුපාතය 24 අනුව මිනුම් | භෞතික උස අනුපාත සලපතර මළුවේ සිට මිනුම්වලින් සෙවීමේ දී ජේතවන ස්තූපයේ මිනුම් |
|---|---|---|---|
| **පේසා වළළු** | අඩි 15 අඟල් 06 | 5 1/2 | අඩි 6 අඟල් 05 |
| **ගර්භය** | අඩි 142 අඟල් 01 | 8 | අඩි 103 අඟල් 09 |
| **හතරැස් කොටුව**<br>**දේවතා කොටුව** | අඩි 37 අඟල් 5<br>අඩි 24 අඟල් 9 | 2 1/2 | අඩි 36 අඟල් 05 |
| **කොත්කැරැල්ල** | අඩි 113 අඟල් 06 | 6 | අඩි 64 අඟල් 07 |
| **මුළු උස** | **අඩි 331 අඟල් 02** | **24** | **අඩි 235 අඟල් 05** |

මේ අනුව අනුපාත මිණුම් අනුව ජේතවන ස්තූපයේ භෞතික උස නොගැළපෙන බව පෙනේ. වික්‍රමගමගේ පවසන ආකාරයට සංස්කෘතික මූලාශ්‍රයවල සඳහන් වන පහත අනුපාත මිනුම් අනුව ද ජේතවන ස්ථූපයේ උස කෙබඳුදැයි විමසමු.

| **ජේතවන ස්තූපයේ භෞතික උස** | **වික්‍රමගමගේ අනුපාත මිනුම් හා භෞතික මිනුම් අනුව උස** |
|---|---|
| **සළපතර මළුවේ සිට ගර්භය දක්වා උස<br>අඩි 142 අඟල් 01** | ගර්භයේ සිට දේවතා කොටුව දක්වා උස මුළු උසෙන් 3/4 කි ඒ අනුව, අඩි 232 අඟල් 03 |


| | |
|---|---|
| **හතරැස් කොටුව උස අඩි 37<br>අඟල් 05<br>දේවතා කොටුව උස අඩි 24<br>අඟල් 05** | කොත්කැරැල්ල උස 1/4ක් වූ විට, අඩි 77 අඟල් 05 |
| **කොත්කැරැල්ල කොත සමඟ උස අඩි 111 අඟල් 05** | |
| **අඩි 331 අඟල් 02** | **අඩි 309 අඟල් 08** |

ජේතවන ස්තූපය රියන් 160 ක් වූ බව මහාවංසයේ සඳහන් වෙයි (මව,28:102). පරණවිතාන පෙන්වාදෙන ආකාරයට පැරණි වඩු රියන අඟල් 30 ක් බව දක්වා තිබේ (පරණවිතාන,1963:05). ඒ අනුව ජේතවන ස්තූපය අඩි 400 ක් විය යුතු බව ඔහුට අනුව පෙනේ. එහෙත් ස්තූපයේ පවතින භෞතික මිනුම් අනුව ජේතවන ස්තූපයේ උස වනුයේ අඩි 331. අඟල් 02 ක් බව ඉහත දී පෙන්වා දුනිමු. ස්තූපයේ වර්තමාන මිණුම් අතරින් කොත්කැරැල්ල හැරුණු විට අනෙකුත් අංගයන්හි විශාල වෙනසක් සිදු ව නොමැති බව පුරාවිද්‍යා පර්යේෂණ මගින් සනාථ කරගෙන ඇත. ස්තූපයේ පාදම, පේසාව, ගර්භය යන අංගයන්හි විෂ්කම්භය අනුව ද ස්තූපයේ උස අඩි 400 ක් විය නොහැකි බව පෙනේ.


චන්ද්‍රා වික්‍රමගමගේ ඉදිරිපත් කර ඇති මතය වන්නේ ජේතවන ස්තූපය අඩි 320 ක් උසින් යුක්ත බව ය (වික්‍රමග මගේ,2001:82). ඔහු පවසන්නේ පැරණි වඩු රියන අඟල් 24 ක් වන බැවින් එම උස එසේ ගණනය කළ හැකි බව ය (එම: 82). වික්‍රමගමගේ සිය මතය ඉදිරිපත් කිරීමේ දී ජේතවන ස්තූපයේ භෞතික මිණුම් පිළිබඳ සැළකිල්ලක් නොදක්වා පුරාණ මූලාශ්‍රයක තොරතුරු පමණක් පදනම් කරගෙන කරුණු ඉදිරිපත් කර තිබේ. ජේතවන ස්තූපය උපරි ව්‍යුහයට අයත් කොත්කැරැල්ල වර්තමානයේ ප්‍රතිසංස්කරණය කළ ද දේවතා කොටුවේ පාදමේ පරිධිය අනුව එම ප්‍රතිසංස්කරණය කර ඇති කොත්කැරැල්ල ද එතරම් වෙනසක් නොමැති බව පෙන්වාදිය හැකි ය. කෙසේ වෙතත් ජේතවන ස්තූපය අඩි 320 ක උසින් යුක්ත බවට ඔහු



සඳහන් කරන කරුණු ආසන්න වශයෙන් ජේතවන ස්තූපයේ උස පිළිබඳ ව යම් තර්කයක් ගොඩනැගිය හැකි කරුණක් වන බව පෙන්වාදිය යුතු ය. රෝලන්ඩ් සිල්වාට අනුව ජේතවන ස්තූපයේ මුළු උස අඩි 330 ක් බව පෙන්වා දෙයි (Silva,1988:282). නමුත් ස්තූපය අඩි 331 ක් උස බව භෞතික මිණුම් අනුව පිළිගත හැකි ය. එසේ ම වර්තමාන මිණුම්කරණයන් අනුව ස්තූප ප්‍රමාණ මූලධර්මවල ගැළපුමක් ජේතවන ස්තූපය ඇසුරින් දැකගත නොහැකි බව ද පෙන්වාදිය යුතු ය.



ජේතවන ස්තූපයේ හරස්කඩ සැලසුම



ජේතවන ස්තූපයේ හැඩය පැරණි දත්ත ඇසුරෙන්






ස්තූපයේ පාදමේ සිට කොත්කැරැල්ල දක්වා මිනුම් සහ දළ හැඩය සහිත හරස් කැපුම (පරිමාණයට නොවේ)



ස්මිදර් විසින් 1884 දී ගන්නා ලද ඡායාරූපයකි



ජේතවනාරාම ස්තූපය 1884






ජේතවන ස්තූප පාදමේ ඉදිකිරීම් තාක්ෂණය



ජේතවන ස්තූප ගර්භයේ පිටත කවයේ ඉදිකිරීමේ තාක්ෂණය



ජේතවන ස්තූප ගර්භය ඉදිකිරීමේ තාක්ෂණය දැක්වෙන සැලසුම



ජේතවන ස්තූප ගර්භයේ අභ්‍යන්තර ගර්භය ඉදිකිරීමේ තාක්ෂණය





ජේතවන හතරැස් කොටුවේ ඉදිකිරීමේ තාක්ෂණය



ජේතවන පේසාවේ ඉදිකිරීමේ තාක්ෂණය



ජේතවන ස්තූපයේ ඉහළ පේසාවේ වසාදමා ඇති මීටර් 5ක් දිග ශිලා ටැඹ



ජේතවන ස්තූපයේ හතරැස් කොටුවේ ඉදිකිරීම් තාක්ෂණය





ස්තූප සලපතර මළුවේ දකුණු පස ඇති ක්‍රි. පූ. 250 ට අයත් ගඩොල් ස්මාරකය

## 4.3. ජේතවන විහාරයේ වාස්තුවිද්‍යා නිර්මාණ

### ජේතවනාරාමයේ බෞද්ධ ගල් ගරාදි වැට

අනුරාධපුර ජේතවනාරාම ස්තූපයට දකුණු දිශානුගත කොටසේ නරඹන්නන්ට දැකගත හැකි විශේෂ වාස්තුවිද්‍යා නිර්මාණයක් තිබේ. සාමාන්‍ය ජනයා මෙන්ම වියතුන් ද මෙය හඳුන්වන්නේ බෞද්ධ ගල් ගරාදි වැට භූමිය ලෙස ය (Buddist Railing Site). මීටර් 43 × 34 දැවැන්ත ප්‍රමාණයේ මෙම ආයත චතුරස්‍රාකාර ගොඩනැගිල්ල මීටර් 1 සෙ.මී 6 ක් උසට තැනූ ගල් වැටකින් වටකර නිමවා තිබේ. ඉන්දියාවේ භාර්හුට්, සාංචි, අමරාවතී යන ස්තූප වටා දැකගත හැකි ගල් ගරාදි වැටේ ලක්ෂණවලට බෙහෙවින් සමාන ආකාරයට "**තබ**" හා "**සුචි**" යන තිරස් හා සිරස් ක්‍රමයට එකිනෙකට කළුගල් පුරුද්දා මෙය ඉදිකර තිබේ. මෙම සෘජුකෝණාස්‍රාකාර වාස්තුවිද්‍යා නිර්මාණය අභ්‍යන්තරය කුමන කරුණක් සඳහා උපයෝගී වූවා දැයි සෙවීම

වැදගත් වන අතර මෙම කරුණ සාක්ෂාත් කරගැනීම උදෙසා පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික ප්‍රභවයන් ද ද්විතීයික මූලාශ්‍රය කරුණු ද සැළකිල්ලට ගැනීම වැදගත් වේ.

දැනට නටබුන් ව පවත්නා මෙම ගොඩනැගිල්ල පරීක්ෂා කිරීමේ දී දැකගත හැකි වන්නේ මෙහි අභ්‍යන්තරයේ මෙන් ම බාහිර කොටසවල් අවධි කිහිපයක ගොඩනැගිලි සාධක පවතින බව ය. යථෝක්ත ගොඩනැගිලි සංකීර්ණය කුමන කාර්යයක් උදෙසා උපයෝගී වූවා ද යන්න පිළිබඳ ව මුලින් ම අදහස් දක්වා ඇත්තේ ලංකාවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වරයා වූ එච්.සී.පී. බෙල් විසිනි. ඔහු පෙන්වාදෙන ආකාරයට ගල් ගරාදි වැටෙන් වටවී ඇත්තේ චෛත්‍යඝරයකි (වටදාගෙයකි). මෙම අර්ථකථනය සිදුකිරීම සඳහා බෙල් විසින් පාදක කරගෙන ඇත්තේ ඔහු සිදු කරන ලද කැනීම්වලදී හමු වූ පුරාවස්තු හා වාස්තුවිද්‍යා නෂ්ටාවශේෂයන් ය. බෙල් පෙන්වාදෙන ආකාරයට ගොඩනැගිල්ලේ පූජනීය අංගනය වටා ගමන් කළ හැකි ලෙස තනා ඇති මාලක තුන හා එහි ඇති අටැස් හැඩ ශිලා ස්ථම්භ හා ගල් තීරු මෙන් ම පිළිම පාදම් හා පිළිම ආසන ද මෙහි චෛත්‍යඝරයක් තිබූ බව සනාථ කරන සාධක ලෙස හඳුනාගත හැකි බව ය. මෙයට අමතර ව හමු වූ ශිලා ස්ථම්භ ශේෂ උපයෝගී කරගනිමින් බෙල් විසින් මෙම ස්ථානයේ තිබුණ චෛත්‍යඝරයේ මනඃකල්පිත සැලසුමක් පුරාවිද්‍යා පාලන තැනගේ වාර්ෂික වාර්තාවේ දක්වා තිබේ (*ASCAR*:1892).

කතුවරයා විසින් සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව බෙල් විසින් ප්‍රකාශ කර ඇති ඉහත අර්ථකථනය පිළිගත නොහැකි තත්ත්වය පවතී. එය ප්‍රතික්ෂේප කිරීම උදෙසා කරුණු ගණනාවක් ද පෙන්වා දිය හැකිය. එයින් එකක් වන්නේ මෙම ස්ථානයේ චෛත්‍යඝරයක් වූවා නම් එහි චෛත්‍යයක් වූ බවට වන නටඹුන් සාධක තිබිය යුතු ය නමුත් උක්ත ස්ථානයේ එවැනි කිසිදු සාධකයක් දැකගත නොහැකි ය. එහි දැකගත හැකි වන්නේ මීටර් 1 ක් පමණ පළලට ඉදිකර ඇති හතරැස් ගඩොළුමුවා බැම්මක් වේ. එම බැමි හමුවන භූමියේ ස්වභාවය අනුව එහි ස්තූපයක් වූවා නම් අනිවාර්යයෙන් ම ස්තූපයක පාදම හතරැස් නොවන අතර



එහි යම්කිසි රවුම් ස්වාභාවයක් තිබිය යුතු මෙන්ම මධ්‍ය කොටස හිස් ව නොතිබිය යුතු ය. එසේ ම මෙහි දැකිය හැකි ගඩොළුමුවා ඉදිකිරීම් අතර මැද කොටස හිස් අවකාශයක් ආකාරයෙන් තනා ඇත්තේ ඒ වටා පැදකුණු කිරිමේ අරමුණ පෙරදැරි වන බැවින් දාගැබ් තුළ එවැනි ඇතුළත පැදකුණු කිරීමේ චාරිත්‍රයන් ලංකාවේ දාගැබ් ඉතිහාසය තුළින් දැකගත නොහැකිය. ඒ අනුව බෙල්ගේ අදහස පැහැදිලි ලෙස ම නිෂ්ප්‍රභා කළ හැකි ය. එසේ ම බෙල් විග්‍රහ කර ඇති ආකාරයට බුදුපිළිම ආසන මෙන් ම පිළිම පාදම් මෙම ස්ථානයෙන් හමු වීම මෙය චෛත්‍යයක් යන්න නිශ්චිත ව කිව හැකි පුරාවිද්‍යා සාධක නොවේ. විශේෂයෙන් ආසන හා පිළිම මෙන් ම බුදුන් වහන්සේ සංකේතානුසාරයෙන් දැක්වූ නිර්මාණවලට පුරාණ ලක්දිව වැසියන් වන්දනාමාන කළ බව අභයගිරි විහාරයේ ඉපැරණි බෝධිඝරය ලෙස හඳුනාගත හැකි ගොඩනැගිල්ල තුළින් පැහැදිලි වී ඇත. යථෝක්ත ස්ථානය කැනීම් කර ඇති හිටපු පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු වන චාල්ස් ගොඩකුඹුර විසින් මෙම ස්ථානයේ සිරිපතුල් කැටයම් හා ආසන මඟින් බුදුන් වහන්සේ සංකේතවත් කළ බව පෙන්වාදී ඇත (ගොඩකුඹුරඃ1963). එබැවින් බෙල් විසින් දක්වන උක්ත පුරාවිද්‍යා සාධක අනුව චෛත්‍යයක් අසල පමණක් ම පිළිම වන්දනාව ඇතැයි යන්න පිළිගත හැකි කරුණක් නොවේ.

එසේ ම බෙල්ගේ මෙම මතය අනුව පර්යේෂකයකුට නැගිය හැකි තවත් ප්‍රශ්නයක් නම් ඉතා සුවිසල් දාගැබක් ජේතවනයේ මෙවැනි කුඩා දාගැබක් ඉදි කිරීමෙන් මහා දාගැබේ උපයෝගීතාව හීනවන අතර එම දාගැබ ආසන්නයේ තවත් දැගැබක ඉදිකිරීමේ අවශ්‍යතාවයක් මහා විහාර සම්ප්‍රදායේ වර්ධන අවස්ථාවක් පෙන්වන ජේතවන සැලසුමට නොගැළපෙන බව ය. මෙයට අමතර ව මෙය ථූපඝරයක් වූවා නම් එවකට ඉදි ව තිබූ ථූපඝර ආකෘතිය බැහැරලීමක් බොහෝ විට සිදු නොවේ. විශේෂයෙන් ම ථූපාරාමය හා ලංකාරාමය මෙන් ම මිහින්තලේ යන ස්ථානවල ඇති දක්නට ලැබෙන ථූපඝරවල සැලසුම් රවුම් ආකාර වේ. ඉතා සමකාලීන යුගයක ජේතවන විහාරයේ ථූපඝරයක් වූවා නම් එය ද බොහෝ විට රවුම් ආකාර සැලස්මකින් යුක්ත විය යුතු ය. නමුත් ගල් ගරාදි වැට හා අභ්‍යන්තර ගොඩනැගිලි සියල්ල

දිගුහතරැස් වන බැවින් බෙල්ගේ ඉහත අර්ථකථනය පිළිගත නොහැකි තත්ත්වයක පවතී. එසේම ලංකාවේ ඉදිවී ඇති පැරණි ස්තූප තුළ ඉංදියාවේ සාංචි හා භාර්හුට් ආදී දාගැබ් තුළ දක්නට ලැබෙන ආකාරයේ පිටතින් වූ ගල් ගරාදි වැටක සාධක මෙතෙක් හඳුනාගෙන නොමැත.

එසේ ම ජේතවනාරාම බෞද්ධ ගල් ගරාදි වැටෙන් වට වූයේ පිළිම ගෙයක් යන අර්ථකථනය ද දක්වා ඇත. මෙම අර්ථකථනය දක්වා ඇත්තේ හේම රත්නායක විසිනි. 1980 දශකය තුළ සංස්කෘතික ත්‍රිකෝණ ජේතවන ව්‍යාපෘතිය යටතේ ජේතවනාරාම විහාරයේ ගල් ගරාදි වැට භූමිය කැනීම්වලට ලක්කිරීමේ දී හමු වූ සාධක මෙම ස්ථානයේ පිළිම ගෙයක් බව සනාථ කිරීම සඳහා ඔහු උපයෝගී කරගෙන තිබේ. රත්නායක පෙන්වාදෙන ආකාරයට මෙම ගොඩනැගිල්ල අයත් වන ප්‍රදේශය ජේතවනාරාමය පිහිටු වීමට කලින් සිට ප්‍රයෝජනයට ගන්නා ලද ස්ථානයක් ලෙස සැළකිය හැකි බව ප්‍රකාශ කර තිබේ. ඔහුට අනුව ක්‍රි.ව. දස වැනි හා එකොලොස් වැනි ශත වර්ෂවල අනුරාධපුර රාජධානියේ අවසාන කාලය තෙක් පාවිච්චියට ගෙන ඇතැයි අනුමාන කළ හැකි ලක්ෂණවලින් යුක්ත නටඹුන් එහි ඇති බව ඔහු පෙන්වාදී තිබේ. යුග තුනකට අයත් විශාල ප්‍රාකාර 3 ක් මේ මත තිබීමෙන් නිගමනය කළ හැක්කේ ආරම්භයේ සිට ම මෙම ගල් ගරාදි වැට භූමිය ඉතා වැදගත් ශුද්ධ භූමියක් ලෙස සළකා ඇති බව ය. මෙම ගල්ගරාදි වැටෙන් වටවී ඇති ගොඩනැගිල්ල පිළිම ගෙයක් ද බෝධිඝරයක් ද යන්න පිළිබඳ ව මේ වන විට මතභේදයට ලක් වී ඇති කරුණක් බැවින් මේ පිළිබඳ ව මූලාශ්‍රය හා පුරාවිද්‍යා කරුණු කෙරෙහි අවධානයට ලක්කිරීමෙන් යම් පිළිතුරක් ලබාගත හැකි බව හේම රත්නායකගේ මතය වේ. මහාවංසයේ සඳහන් වන පරිදි බුදු පිළිම චාරිත්‍රානුකූල ව අභිෂේක කිරීමේ දී ඉටු කරන ලද යම් පූජා විධියක් සඳහා උපයෝගී කර ගන්නා ලද විශේෂ වර්ගයක පිළිම ගෙයක් ලෙස මෙය හඳුන්වාදීම යථාතත්ත්වයට වඩා උචිත වන්නේ යැයි ඔහු පෙන්වා දී තිබේ. එහි දක්නට ඇති විශාල ප්‍රථිමා තලය කෙරෙහි අවධානය යොමු කර ඇති හේම රත්නායක එය අභිෂේක සඳහා යොදා ගන්නා ලද අති විශාල ප්‍රතිමා තලයක් බව ප්‍රකාශ කර තිබේ. මෙවැනි ප්‍රථිමා තලයක්



මෙතෙක් මෙරටින් ලැබී ඇත්තේ ජේතවනාරාමයෙන් පමණක් බව ද ඔහු සඳහන් කර තිබේ(රත්නායක,1998:336).

මහාවංසයේ ද බුද්ධාභිෂේකය ගැන විස්තර එයි. එහි විස්තර වන ආකාරයට මහායාන බෞද්ධ සම්ප්‍රදායට අනුව දස වැනි බෝධිසත්ත්ව භූමියේ දී පැවැත්වෙන බුද්ධාභිෂේකයන් සහ එසේ අභිෂේක ලත් බුදුවරුන්ට මල්මාලා, රුවන්මාලා, පළඳවා අභිෂේක සිදුකරන බව සඳහන් ව ඇත (මව,38:66-6). එබැවින් බුද්ධාභිෂේකය සිදු කිරීම සඳහා තිබූ ස්ථානයක් වශයෙන් මෙම ස්ථානය රත්නායක හඳුනාගෙන තිබේ. එය එසේ නම් මෙහිදී පැන නගින තවත් ප්‍රධාන ගැටළුවක් වන්නේ ගඩොල්මුවා හතරැස් වේදිකාවෙන් වටකොට එහි මධ්‍යයේ තනා ඇති කුඩා ගඩොල්මුවා නිර්මාණයේ ඇරමුණ කුමක් ද යන්නය. එම ගඩොළුමුවා නිර්මාණය පිළිබඳ ව විමර්ශනය කිරීමේදී එය ඉතා පැහැදිලි ලෙස ම අභයගිරියේ දක්නට ඇති පැසෑණි බෝගෙය අභ්‍යන්තරයේ වන ගඩොළුමුවා නිරිමාණයට සමාන ස්වාභාවයක් උසුලන බැවින් මෙය බුද්ධාභිෂේකය සිදුකළ ස්ථානයක් ද යන්න ගැටළු සහගත වේ. එසේ ම බුද්ධාභිෂේකය සිදු කිරීමට වූ පිළිම ගෙයක් මෙම ස්ථානයේ වූවා නම් මීටර් 43 × 34 ප්‍රමාණයේ දැවැන්ත ගොඩනැගිල්ලක සීමාවක් අවශ්‍යය වන්නේ ඇයි ද යන්න තවත් උභතෝකෝටිකයකි. මූලාශ්‍රයක හෝ ඉපැරණි ලේඛණයක ජේතවනාරාමයේ බුද්ධාභිෂේකය ගැන සඳහන් නොවීම ද මෙම කරුණ පිළිගත නොහැකි තත්ත්වයක් ඇති කරයි. එසේ ම පෙරදී පෙන්වා දී ඇති ආකාරයට ප්‍රථිමා තලයත් හා විවිධ සංකේත බුදුන් වහන්සේ දැක්වීම උදෙසා සමහර දාගැබ් මළුවල මෙන් ම බෝගෙවල් තුළ ද දැකගත හැකි පුරාවිද්‍යා සාධක වශයෙන් වර්තමායේ ද හඳුනාගත හැකි ය. එසේ ම මෙම ගල්ගරාදි වැටට උතුරින් එයට යාබද ව හමුවන ඉතා ආසන්නයේ ම ඇති ගන්ධකුටි හැඩ ගන්නා වාස්තුවිද්‍යා නිර්මාණය තුළ යන්ත්‍ර ගලක් (ගර්භපත්‍රයක්) හා එය ආසන්නයේ ම පිළිමයක පාදමක් හා කැඩීගිය බුදු පිළිමයක පාදමක් දැකගත හැකි ය. මෙම බුදු පිළිමය හා සම්බන්ධ කොටස් බොහෝ විට උක්ත ගොඩනැගිල්ල තුළ පිළිමයක් වූ බව සනාථ කරන පුරා සාධක වේ. එසේ හෙයින් ගල් ගරාදි වැට ඇතුළතින් එක් පිළිම ගෙයක් ද එයට පිටතින් තවත්

පිළිම ගෙයක් තිබීම ද ජේතවන විහාරයේ වාස්තුවිද්‍යා සැලැස්ම අනුව ද විය නොහැකි කරුණකි. ජේතවනාරාමය තුළ ප්‍රධාන පිළිම ගෙවල් දෙකක් දැකගත හැකි අතර ඉන් වඩා පැරණි පිළිම ගෙය ස්තූපයට ගිණිකොණ දිගින් හා පොහොය ගෙයට නැගෙනහිරින් ගඩොලින් ඉදිකර ඇති ගොඩැල්ලක් මත පිහිටා තිබේ. මෙයට අමතර ව ජේතවන විහාරයේ භික්ෂූන් නේවාසික ව සිට ඇති බව ට විශ්වාස කළ හැකි පංචාවාස ගොඩනැගිලි ලෙස විද්වතුන් ව්‍යවහර කරන ඒකක පහකින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණවල එක් ගොඩනැගිල්ලක සමහර අවස්ථාවල පිළිම ගෙවල් තිබූ බවට සාධක දක්නට ඇති අතර ප්‍රධාන පිළිම ගෙයක් තිබිය දී තවත් එවැනිම ප්‍රධාන පිළිම ගෙයක අවශ්‍යතාවය ජේතවන සැලසුම අධ්‍යයනයේ දී එතරම් වැදගත් නොවන බවක් ද පෙනේ. එසේ හෙයින් බෞද්ධ ගල් ගරාදි වැටෙන් වට වූයේ පිළිම ගෙයක් ද යන අදහස ද තව දුරටත් ප්‍රශ්නාර්ථයක් ගෙන දෙන කාරණයක් බව පෙන්වාදිය යුතු ය. ක්‍රි.ව. දස වැනි සියවසට අයත් හතර වැනි මහින්ද රජුගේ ශිලාලේඛනයන් මෙම බෞද්ධ ගල්ගරාදි වැට අසලින් හමු වී තිබේ. එහි සඳහන් පෙළ මෙසේ ය.

"**සිරිසඟබෝ - මහින්ද මහරජහු සත්ලැගු සත් වන හවුරුදුයෙහි සාගුලි මහ හිමියන් නමින් පළවූ අපිස් සතොස් තිස් මහ තෙර නම් පිහිටි දෙනා රජමහ වෙහෙරෙහි රත්නමහා පිරිවෙණ්හි වසන සග්මොක් කාමී උවසුවන් විසින් තුරු මේ දොරටු පැන් මඩියෙහි නවාතැන් නොදෙන ඉසා සෙනෙවිරද් මුල වූ වන සග් මහළු සඟුන් විසින් මේ දොරටු පැන් මඩියෙහි උඩු මහල් යටි මහල 'හිද පැන් කළ තබන භාරයෙහිත් කිසි කවරු පරියායෙකිනුද් නවාතැන් නොදෙන ඉසා..........**" (*Ez*,vol.III :226 - 229).

මෙම ලිපියේ සඳහන් ආකාරයට රත්නමහා පිරිවෙණ යනු ගල් ගරාදි වැටෙන් වට වූ ගොඩනැගිල්ලක් බව කුඹුරුපිටියේ වනරතන හිමි ද පෙන්වාදී තිබේ (වනරතන,1970). එම ශිලාලේඛනයේ එන විස්තර අනුව දොරටු පැන් මඩිය නමැති මහල් ගොඩනැගිල්ලක් ගැන ද එහි විස්තර වේ. පරණවිතාන පෙන්වාදී ඇති ආකාරයට මෙම ගොඩනැගිල්ල තරමක් විශාල ගොඩනැගිල්ලක් වේ (*ibid*:226). මෙමඟින් සිදු වී ඇත්තේ විහාරය



වන්දනාමාන කිරිමට පැමිණෙන පිරිසට විහාරයට ඇතුළුවීමට පෙර ජලයෙන් පිරිසිදු වී විහාරය වන්දනා මාන කිරීමට සැලැස්වීම බව පෙනේ. එය තහවුරු කරගත හැකි වන්නේ මෙම ලිපියේ එන **"භාර"** නම් වචනය මගිනි. පරණවිතාන විග්‍රහ කරන ආකාරයට **"භාර"** යන්නෙන් ජල කළ තබන පිළක් හෝ මැස්සක් අදහස් කරන බව පෙන්වාදී ඇත (*ibid*). ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ ද **භාර** හෝ **භාරය** යනු ජල කළ තැබූ මැස්සක් හෝ පිළක් බව සඳහන් කර තිබේ (ශ්‍රී සුමශකෝ, II:1156). එසේ ම මෙම ශිලා ලිපියේ සඳහන් වන ආකාරයට මෙම ස්ථානයේ නවාතැන් නොදෙන ලෙස දක්වා තිබීමෙන් මෙය සුවිශේෂී ස්ථානයක් බව ද හඳුනාගත හැකි ය.


ශිලාලේඛනයට අනුව දොරටු පැන් මඩිය විශාල ගොඩනැගිල්ලක් බව පෙනේ. ජේතවනාරාම විහාරයේ රත්නමහා පරිවෙණ හෝ සෙනෙවිරද් මූලය මෙන් ම දොරටු පැන් මඩිය නිශ්චිත ලෙස මේ වන තෙක් හඳුනාගෙන නැත. මෙම ගල්ගරාදි වැට අසළින් සෙල්ලිපිය හමු වීම නිසා එය පිහිටා තිබුණේ මෙම ස්ථානය ද යන ගැටළුවක් පැන නැගේ. එසේ ම ආරාමයක පවත්නා **"සේනාසන"** හා **"අසේනාසන"** යනුවෙන් ගොඩනැගිලි වර්ග දෙකක් වූ බව ද සමන්තපාසාදිකාවේ සඳහන් කර ඇත (සපා : පරාජිකා කාණ්ඩය). අභිලේඛනයේ සඳහන් ආකාරයට එහි කිසිවෙකුට නවාතැන් නොදෙන ලෙස සඳහන් වීමෙන් සඳහන් වීමෙන් මෙම ගොඩනැගිල්ල අසේනාසන සණයට අයත් වේ. එසේ ම අප අවධාරණයෙන් පැවසිය යුතු කරුණක් වන්නේ මෙම ගල් ගරාදි වැට පිහිටන භූමිය තුළ පොහොය ගෙය, ධර්ම ශාලාව, පිළිම ගෙය ආදී අතිශයින් ම පූජනීය අංග ඇතුළත් ගොඩනැගිලි පිහිටන බව ය. ඒ අනුව මෙවැනි පැන් මඩියක් මෙම භූමියේ පිහිටීමට ද අවකාශ තිබෙන අතර සෙල්ලිපිය ගරාදි වැට අසලින් හමු වූ කරුණ මත ම එය මෙම ගොඩනැගිල්ල යැයි අපට කව නොහැක්කේ පැන් මඩියක වාස්තුවිද්‍යාත්මක සැලැස්ම නිශ්චිත ලෙස ම මේ වන විට හඳුගෙන නොමැති බැවිනි.

ජේතවනාරාම විහාරයේ ගල්ගරාදි වැටෙන් වටවූයේ බෝධිඝරයක් (බෝගෙයක්) බව සේනක බණ්ඩාරණායකගේ මතය වේ (Bandaranayake,1974:189). ඔහු පෙන්වාදෙන ආකාරයට


ජේතවනාරාම විහාරයේ බෝධිසරය තිබී ඇත්තේ මෙම ස්ථානයේ ය. ගොඩනැගිල්ලේ දැකගත හැකි වාස්තුවිද්‍යා ලක්ෂණ අනුව එම ගොඩනැගිල්ලේ මධ්‍යයේ සිට පිටතට විහිදෙන ජල කාණුව බෝධීන් වහන්සේට ලැබෙන අමතර ජලය පිට වීමට වූ මාර්ගය වන බව පෙන්වා දී ඇත. පුරාවිද්‍යාත්මක සාධක අනුව මෙය බෝධිසරයක් පැවති ස්ථානයක් වශයෙන් පිළිගත හැක්කේ එහි අභ්‍යන්තරයේ ඇති ගඩොළුමුවා නිර්මාණය අභයගිරි විහාරයේ දක්නට ලැබෙන බෝධිසරයට සමානතාවයක් දැකගත හැකි මෙන් ම ඉතා මෑතකදී කැනීම් කර දැනට සංරක්ෂණය කර ඇති ජය ශ්‍රී මහා බෝධිය වටා වූ ගල්ගරාදි වැටට සමානතාවයක් ජේතවනාරාම විහාරයේ ගල්ගරාදි වැට තුළින් ද දක්නට ලැබීම නිසා ජය ශ්‍රී මහා බෝධිසරයට සමාන ගල් ගරාදි වැටක් ජේතවනාරාම බෝධිසරය වටා පවතින්නට ඇති බව සංසන්දනාත්මක ලෙස ද පෙන්වාදිය හැකි ය. එසේ ම මහාවංසයේ සඳහන් වන ආකාරයට අග්බෝ රජු දවස දෙනානකයේ **රජත චුම්භට්ඨ** (රිදි සුඹුලු ගෙය) නම් ගොඩනැගිල්ල හා බෝ ගෙය සඳහා ළිඳක් තැන වූ බව සඳහන් කර තිබේ (මව,41:66-67) 1980 දශකයේදී සිදු කරන ලද කැනීම්වලදී බෝධිසරයට බටහිර පසින් වටාපතක හැඩැති ළිඳක් මතුකර ගැනීමට හැකි වී තිබේ. මෙය අග්බෝ රජු විසින් කරන ලද බෝ ගෙය සඳහා වූ ළිඳ වීමට බොහෝ දුරට ඉඩ තිබේ. එසේ ම දප්පුල රජතුමා විසින් ජේතවනාරාම බෝධිසරයේ රන්මුවා පිළිමයක් තැන්පත් කර වූ බව ද මහාවංසයේ සඳහන් වී තිබේ (මව,49:77-78). මෙම මූලාශ්‍රය විස්තර අනුව පැහැදිලි වන්නේ ජේතවනාරාමයේ බෝධිසරයක් (බෝගෙයක්) වූ බව පැහැදිලි වන බව ය. එසේ ම දීපවංසයේ සඳහන් කරුණක් අනුව මේඝවණ්ණාභය රජතුමා මහා විහාරයට පසු ව ප්‍රධාන භූමියේ බෝධි පරිවාරයට ශිලා වේදියක් කළ බව සඳහන් වේ (*Dv*, XXII:VV). මෙය ඉතා වැදගත් වන්නේ මහා විහාරයට පසු ව ප්‍රධාන භූමියේ ශිලාවේදියක් (ගල් වැටක්) ගැන සඳහන් වන බැවිනි. අනුරාධපුරයේ ඇති මහා විහාර තුනෙන් පැරණි ගල් වැටක සාධක දැනට දැකගත හැක්කේ ජේතවනාරාමයේ හා ශ්‍රී මහා බෝධියේ පමණි. මේඝවණ්ණාභය රජතුමා එම ගල්වැට මහා විහාරයේ නොකරන ලද බව සඳහන් වීමෙන් එය පැහැදිලි ලෙස ම ජේතවනයේ සිදු කරන ලද්ද විය හැකි බව උපකල්පනය



කළ හැකි ය. ඒ අනුව ජේතවනාරාමයේ බෝධිසරය ගල්ගරාදි වැටෙන් වට වූ නිර්මාණය ලෙස පිළිගැනීම වඩාත් තාර්කික වේ. එසේ ම රෝලන්ඩ් සිල්වා ද මෙය බෝධිසරයක් බව ප්‍රකාශ කර ඇත. ඔහු මෙය බෝධිසරයක් බව ප්‍රකාශ කර ඇත්තේ මේ හා සමාන පුරාවස්තු හමු වූ වෙනත් බෝධිසර හා සන්සන්දනය කරමිනි. නිදසුනක් වශයෙන් දෙමටමල් විහාරයේ බෝධිසරය කැනීම්වලදී බෝධිය රෝපණය කළ පාත්තරයට යටින් ගර්භ ගලක් වූ බව ද වෙනත් බෝධිසරයක බෝමළුවේ හිටිපිළිම තිබූ බව ද ඔහු පෙන්වා දී ඇති බැවින් ජේතවනාරාමයේ ඇති මෙම ගල් ගරාදි වැටෙන් වට වූයේ බෝධිසරයක් බව විශ්වාස කළ හැකි ය (කුලතුංග,2001:35). ඒ අනුව ජේතවනාරාමයේ ගල්ගරාදි වැට තුළ ඉදි වූ චතුරස්‍රාකාර ගඩොළුමය වාස්තුවිද්‍යා නිර්මාණය තුළ පූජනීය වස්තුවක් ලෙස බෝධිය තිබෙන්නට ඇති අතර එය වන්දනාමාන කරන බැතිමතුන්ගේ පූජා කටයුතු හා අංගනය වටා පැදකුණු කිරීමට සළසා ඇති ආකාරයෙන් ඉදි වූ ගෘහයක් තිබූ බවට සනාථ වන සාධක වශයෙන් ගල් කණු රාශියක් නටඹුන් දක්නට ඇති අතර ඒ ඔස්සේ පැමිණිය හැකි නිගමනය වන්නේ ජේතවනාරාම බෞද්ධ ගල්ගරාදි වැටෙන් වටවූයේ ථූපඝරයක්, පිළිම ගෙයක් හෝ දොරටු පැන්මඩියක් නොව බෝගෙය විය හැකි බව



ජේතවන විහාරයේ බෝධිසරයේ සැලසුම



ජේතවන විහාරයේ බෝධිසරයේ ගල් ගරාදි වැටේ පැති පෙනුම හා



ජේතවන විහාරයේ බෝධිසරය





ජේතවන විහාරයේ බෝධිසරයේ අභ්‍යන්තරය



ජේතවන විහාරයේ බෝධිසරයේ බටහිර පස ප්‍රවේශ ද්වාරය

## පොහොය ගෙය (උපෝසථඝරය)

ජේතවන විහාරයේ පොහොය ගෙය එහි ස්තූපයට ගිණිකොණ දෙසින් පිහිටා ඇත. ලෝවාමහාපායෙහි මෙන් කැඩී ගිය ගල් කණු රාශියක් තිබීම අනුව මෙය මහල් ගොඩනැගිල්ලක් වූ බව පැහැදිලි ය. එසේ ම මෙහි බිම් සැලැස්ම අභයගිරි විහාරයේ පොහොය ගෙය වූ රත්න ප්‍රාසාදයට යම් ආකාරයකට සමාන වේ (කුලතුංග,2001:42). බෞද්ධ ආරාමයක තිබිය යුතු මූලික පූජනීය අංග අතර පොහොය ගෙය ඉතා වැදගත් වේ. පොහොය ගෙය මෙරටට හඳුන්වා දී ඇත්තේ ක්‍රි.පූ. තුන් වැනි සියවසේදී මිහිඳු මහා හිමියන් විසිනි. මහාවිහාරයේ පූජ්‍ය ස්ථානවල ස්ථානගතවීම දේවානම්පියතිස්ස රජුට පෙන්වන ලද මිහිඳු මාහිමි එහි පූර්ව පූජා ස්ථාන අතර, සංඝකර්ම සඳහා මාලකයක් වෙන් කර ඇත.

**"අහෝසි තිණ්ණං බුද්ධානං තාලෙන හි ඉධ මාලකො**

**නරින්ද සංඝකම්මන්ථං හවිස්සති ඉදානි පි"** (මව,15:25)

මහා විහාර සීමාව තුළ මුල් ම පොහොය ගෙය බිහිවීමෙන් අනතුරු ව එය විහාරයක මූලික අංග අතර කැපීපෙනෙන ගොඩනැගිල්ලක් විය. භික්ෂූන් වහන්සේලාගේ විනයකර්ම පැවැත්වීම සඳහා කම්ම මාලකයක් තුළ අඩ මසකට වරක් රැස්වී පාතිමෝක්ෂය කියවන ස්ථානයත් මෙය විය. ක්‍රි.පූ. දෙ වැනි සියවස පමණ වන විට මහා විහාරයේ පොහොය ගෙය ක්‍රමයෙන් වර්ධනය වූ අතර ක්‍රි.පූ. පළමු වැනි සියවස මැද භාගයේ දී දුටුගැමුණු රජතුමා විසින් මෙය ලෝවාමහාපාය නමින් මහල් නවයකින් යුක්ත ව තනවා ඇති බව සඳහන් වේ (මව,27:04). ලෝවාමහාපාය මහා විහාර වාසී භික්ෂූන්ගේ පොහොය ගෙය විය. මේ ශෝභා සම්පන්න ප්‍රාසාදයේ සතර වාසල දොරටු (ද්වාර කෝෂ්ඨ) සතරක් විය (රාහුල,1989,135).

බුදු සමයෙහි නිජබිම වූ ඉන්දියාවෙහි උපෝසථඝර පිළිබඳ ව පුරාවිද්‍යාත්මක තොරතුරු විරල ය. පැරණි ගන්ධාර දේශයෙහි ජමාල් සර්හි නම් ස්ථානයේ බෞද්ධ විහාරයක නටඹුන් අතර වූ එක් දොරටුවක් සහිත උස් පවුරකින් වට වූ චතුරස්‍රාකාර අංගනයන් උපෝසථඝරයක් වශයෙන් පුෂේ විසින් හඳුනාගෙන



ඇත (හෙට්ටිආරච්චි, 1970:235). මේ අනුව බෞද්ධ ආරාමයක ප්‍රධාන අංග අතර උපෝසථඝරය මුල් තැනක් ගත් බව පෙනේ.

ජේතවනාරාමයේ පොහොය ගෙය පිළිබඳ සඳහනක් හතර වැනි මහින්ද (ක්‍රි.ව. 956 - 972) රජුගේ අභයගරි පුවරු ලිපියේ එයි. එහි සඳහන් වන ආකරයට ඔහු දෙනා වෙහෙර සඳහා දියසෙන් නමින් මහා උපෝසථඝරයක් ඉදිකර ඇත.

**'ළ්හි බද් යට බැහිල්හි මහ හල් කරා උදා අග්බෝ මස්තොටු**

**මි(ති) කසුබ්ගිරි**

**නවකම් කරා (දෙනා) වෙහෙරෙහි (මර)**

**(මිහි මන්හිමුන්ද්හම් පිලිසක්ද දියසෙන් මහපොගෙ**

**යළිත් කරා නන් දැරුවනින් හෙබිනා රන් මෙර් මෙන් (ද)** ...............

(*Ez*.Vol.I:218).

මෙයට අමතර ව මහාවංසයේ සඳහන් වන පුවතක් අනුව ජේතවනාරාමයේ නොයෙක් මහල් ඇති පහයක් (ක්‍රි.ව. 833 - 853) රජ වූ පළමු වැනි සේන රජු විසින් කළ බව සඳහන් වේ.

**"පාසාදං නාම කාරෙසි විහාරෙ ජෙත නාමංත**

**අනෙක භූමිට භූමිතො බුද්ධභූමි ගතාසයො**

**වඩෙත්වා තත්‍ථ කාරෙත්‍ථ සබ්බ සොවණ්ණමයං ජිනං**

**සණ්ඨ පෙත්‍ථවා මහාභොග වසාපෙසිව භික්ඛවො**

**මහා පරිවෙණහි කාරෙසි සුමනො හරං**

**පාසා මග්ග සන්‍දඩ්ඪං නසව්ඤෙඤෙවච විහාරෙන**

(මව,50:65-68).

බුදුබව කරා ගිය ඒ රජ තෙමේ ජේතවන නම් වෙහෙර නොයෙක් මහල් ඇති පහය කරවීය. ස්වර්ණමය වූ ජින පිළිමය කරවා එහි වඩා හිඳුවා මහා භෝග පිහිටුවා එහි භික්ෂූන් වැඩවිය. එම වෙහෙර මත පිරිවෙණෙහි ගින්නෙන් දහන ලද පහය අතිශයින් මනරම් කර කරවීය යනුවෙන් මහාවංස පාඨයේ එයි.

අභිලේඛනයේ සඳහන් වන **දියසෙන් මහ පොහොය ගෙය** සහ වංසකතාවේ සඳහන් වන **නොයෙක් මහල් ඇති පහය** ලෙස

අපට පිළිගත හැකි ස්ථානයක් ලෙස දැනට ජේතවන විහාරයේ දැකිය හැක්කේ වර්තමානයේ පොහොය ගෙය වශයෙන් හඳුන්වන ගොඩනැගිල්ල ම වේ. බෙල් සැලැස්මේ ආරාම "ඒ" වශයෙන් මෙය හඳුන්වා ඇති අතර ඔහු විසින් ජේතවන විහාර භූමියේ ආරම්භ කළ පුරාවිද්‍යා කටයුතුවල දී ප්‍රථමයෙන් ම සිදුකර ඇත්තේ මෙම පොහොය ගෙය පාදාගැනීම වේ. එම වාර්තාවලට අනුව මෙම ගොඩනැගිල්ල තුළ වූ ගල් කණු කැබළි අඩි 6 ක් පමණ උස වී ඇත. ගොඩනැගිල්ල අඩි 100 × 50 වපසරියකින් යුතු බව ද සඳහන් වෙයි. ඔහුගේ මතයට අනුව මෙම ගොඩනැගිල්ලේ බිම් මහල ගබඩා කාමර ලෙස භාවිත කර ඇති බව ප්‍රකාශ කර තිබේ (*ASCAR*, 1892).

සංස්කෘතික ත්‍රිකෝණ ජේතවන ව්‍යාපෘතිය යටතේ සිදුකර ඇති පර්යේෂණවල දී ගොඩනැගිල්ල කේන්ද්‍ර ව සිදුකළ කැණීමක දී පොළව මට්ටමින් මීටර් 2 ක් පමණ ගැඹුරේ දී මෙහි පාදම හමු වී තිබේ. ගල් පුවරු අතුරා ඒ මත ගඩොල් බැම්ම ආරම්භ කර ඇත. බැම්ම සඳහා මැටි බදාම හා පුළුස්සන ලද ගඩොළු භාවිත කර තිබේ. පිටතට විවෘත ව ඇති කොටසේ හුණු බදාමයෙන් කපරාරු කර තිබේ. ගොඩනැගිල්ල ආසන්නයෙන් හමු වූ එක් පසෙක නෙළුම් මල් හා වෘත්තාකාර කොටස් උඩට මතු ව සිටින සේ කැටයම් කර තිබූ හතරැස් ගඩොළු කිහිපයක් ද හමුවී තිබේ. වැදගත් පුරාවිද්‍යා අවශේෂ වන මෙම ද්‍රව්‍යයන් සමඟ ම වර්ණාලේපිත උළු කැබළි යකඩ සහ තඹ ඇණ හමු වීම තුළින් පැහැදිලි වන්නේ මේවා නටඹුන් ස්මාරකයේ කොටස් වන්නට ඇති බව ය (රත්නායක,1993. පළමු වැනි හය මාසික වාර්තාව) දැනට නටඹුන් ව ඇති ස්මාරකයේ ගල් කණු ශේෂ 187 ක් දැකගත හැකි ය. ගොඩනැගිල්ල සඳහා මණ්ඩප දෙකක් නිර්මාණය කර ඇති අතර, ඉන් බටහිර පැත්තේ වූ කුඩා මණ්ඩපය එහි ස්වාභාවය අනුව ඉහළ මහල්වලට නැගීමට තරප්පු පෙළ නිර්මාණය කර තිබූ ස්ථානය වීමට බොහෝ ඉඩ ඇත. උතුරු පසට ප්‍රධාන දොරටුව පිහිටන මෙම ගොඩනැගිල්ල වටා වටපවුරක් ද දැකගත හැකි වේ.

උපෝසථඝරයේ උපයෝගීතාවය අංශ කිහිපයක් යටතේ විග්‍රහ කළ හැකි ය. මහාවංසයේ විස්තර වන ලෝවාමහාපායෙහි ද පහත මාලය ගබඩාවක් ලෙසින් භාවිත වූ බවට සාක්ෂ්‍යය




ලැබේ. එසේ ම එහි භික්ෂූන් වැඩවාසය කළ බව ද සඳහන් වේ. ජේතවන පොහොය ගෙයි පහළ මාලය ද ඒ අයුරින් ම භාවිතයට ගන්නට ඇත (කුලතුංග, 2001:44). ක්‍රි.ව. දොළොස් වැනි සියවස පොළොන්නරුවේ ඉදි වූ බද්ධසීමා ප්‍රාසාදය උපෝසථඝරයෙහි වර්ධිත අවස්ථාවකට සාධක සපයයි. දින 145 කට වරක් භික්ෂූන් වහන්සේලා රැස්වී ප්‍රාතිමෝක්ෂය සඳහා තම තමන් අතින් සිදු වී ඇති ඇවැත් ඇතොත් ඒවායින් නිදහස් වන ස්ථානය උපෝසථඝරයයි. මෙහි රැස්වීම් සපුරා සීමා වන්නේ භික්ෂූන්ට පමණි. බාහිර පුද්ගලයන්ට එහි පිවිසිය නොහේ. ලෝවාමහා ප්‍රාසාදය, බද්ධසීමා මහා ප්‍රාසාදය යන නිදර්ශන ගත් කල්හි ඉහළ මහල්වල ලැගුම් ගන්න භික්ෂූන් වහන්සේලා චාරිත්‍ර විධි මූලාශ්‍රයන්හි දක්වා තිබේ. මේ අනුව බිම් මහල් සහිත උපෝසථඝර බහුකාර්යය ස්වරූපයක් ගනී (ගුණරත්න,1997:110). ජේතවනාරාමයේ උපෝසථඝරයේ ගල්කණුවක පරිධිය මීටර් 2.5 ක් වන අතර ගල් කණුවේ එම වට ප්‍රමාණය අනුව මහල්වලින් යුක්ත වූ බවට සාධක වේ.

ජේතවනාරාම විහාරයේ උපෝසථඝරය එහි සැලැස්ම අනුව අභයගිරි විහාරයේ රත්න ප්‍රාසාදයේ සැලැස්මට සමාන වේ. එහෙත් ගොඩනැගිල්ලේ ප්‍රමාණය අනුව දෙ වැන්න පළමු වැන්නට වඩා බෙහෙවින් කුඩා ය. මෙ අනුව හතර වැනි මිහිඳු රජු කරවූ දියසෙන් නම් උපෝසථඝරය මෙය විය යුතු ය (ලියනගමගේ,1987:38). දැනට ශේෂිත නෂ්ඨාවශේෂ අනුව මහා විහාරයේ ලෝවාමහාපාය, අභයගිරියේ රත්නමහා ප්‍රාසාදය යන උපෝසතඝරවල උපයෝගීතාවන්ට සමාන ගොඩනැගිල්ලක් ලෙස ජේතවනාරාම පොහොය ගෙය ද හඳුනාගත හැකි ය



ජේතවන විහාරයේ පොහොය ගෙය



ජේතවන විහාරයේ පොහොය ගෙය සැලසුම



## පිළිම ගෙය (පඨිමාඝරය)

බුදුන්වහන්සේගේ ප්‍රතිමාව ඇතුළත් පිළිම ගෙය හෙවත් පොදුවේ හැඳින්වෙන විහාරගෙය පන්සලක ප්‍රධාන අංගයක් වේ. පඨිමාඝර හෙවත් පිළිම ගෙය ලංකාවේ ආරාමයක අංගයක් වූයේ කවර කලක සිට දැයි යනු විමර්ශනය කිරීමේදී මහා විහාරය සඳහා මිහිඳු මාහිමියන් පෙන්වාදුන් සැලැස්මේ මහාථූපය හා බෝධිය පිහිටුවීමට සුදුසු තැන් නියම කරන ලද මුත් පඨිමාඝරයක් සඳහා තැනක් නියම කළ බව සඳහන් නොවේ (රාහුල,1989:126). ක්‍රි.පූ. තුන් වැනි ශත වර්ෂයේ දී අශෝක රාජ්‍ය කාලයේ දී ඉන්දියාවේ ද බුදුපිළිම තිබුණ බව දැනගන්නට නැති බව අවධානය යොමු කිරීම ද වැදගත් වේ. සාංචියෙහි හා භාර්හුත්හි පැරණි කැටයම්වල බුදු පිළිමයක් දක්නට නැත. එහිදී උන්වහන්සේ නිරූපණය වන්නේ සිරිපා සටහනක්, ඡත්‍රයක්, ආසනයක් හො බෝධිය වැනි සංකේතවලිනි. ඒ අනුව දඹදිව වැසියන් බුදුපිළිම සෑදීමට හා වැඳීමට පටන් ගෙන ඇත්තේ අශෝක රජ සමයෙන් මෑත කාලයේ බව ඔප්පු වන නිදසුන් රැසක් ම ඇත. මේතාක් රැස්කරගෙන ඇති සාක්ෂ්‍යවලින් දක්නට ලැබෙන ආකාරයට නම් බුදු පිළිමය වැඳීම ආරම්භ වන්නේ ක්‍රි.පූ. පළමු වැනි සියවසේ නැතහොත් ඊට පසු කාලයේ දී යයි කර්න් විසින් පෙන්වා දී තිබේ (එම:126 - 127).

ලංකාවේ බුදු පිළිම ගැන සඳහනක් මහාවංසයේ එයි. එහි සඳහන් වන ආකාරයට ක්‍රි.පූ. තුන් වැනි ශත වර්ෂයේ දී දේවානම්පියතිස්ස රජු ථූපාරාමයෙහි වැඩ හිඳුවන ලද මාහැඟි මනහර පිළිමයක් ගැන සඳහන් වන්නේ මෙසේ ය.

> **"දේවානම්පියතිස්සෙන සො පතිට්ඨාපිතං පුරා**
> **ථූපාරාම උරුසිලාපටිමං චාරුදස්සනං"** (මව,36:128);

මහාවංස පාඨය පිළිබඳ ව අදහස් දක්වන වල්පොළ රාහුල හිමියන් ප්‍රකාශ කර ඇත්තේ මේ පිළිමය දේවානම්පියතිස්ස රජු විසින් කරවන ලද්දක් ද, නැතහොත් ථූපාරාමයේ තිබී හමුවුණු කවදා කෙසේ තනා ඇති දැයි කියන්නට නොදත් පැරණි බුදු පිළිමයක්, යම් ආකාරයකට දේවනාම්පියතිස්ස රජු කරවූ දෙයක් හැටියට පසු කලෙක ඇති වුණු ප්‍රමාදයකින් දක්වන ලද්දේ ද යන

වග නිශ්චය කර කියන්නට නොහැකි බව ය (රාහුල,1989:127). නමුත් වංසකතාවේ සඳහන් **උරුසිලා පඨිමා** යන පිළිමය ඉන්පසු යුගවල දී විවිධ රජ දරුවන් යටතේ පූජනීයත්වයට හා වන්දනීයත්වයට පත් වූ බව පෙනේ (ක්‍රි.ව. 266 - 276). රජ වූ දෙටුතිස් රජු එය ථූපාරාමයෙන් රැගෙන ගොස් පාචිනතිස්ස පබ්බත නම් ආරාමයේ වඩා හිඳුවා ඇත (මව,36:129). (ක්‍රි.ව. 276 - 303) රජ වූ මහසෙන් රජු මෙම පිළිමය එතනින් අභයගිරියට ගෙන ගොස් එහි තැන්පත් කර තිබේ (මව,37:14). (ක්‍රි.ව. 340 - 364) රජ වූ බුද්ධදාස රජු මැණික්වලින් මෙම පිළිමයේ නෙත් අලංකාර කර ඇත (මව,37:123). එසේ ම (ක්‍රි.ව. 459 - 477) රජ වූ ධාතුසේන රජු මෙම පිළිමයට පිළිම ගෙයක් කර පිළිමයේ රැස්වළල්ල හා කෙස්වල නිල්මිණි ඔබ්බවා තිබේ (මව,38:61-64). සිලාමේඝවර්ණ රජ තෙමේ පරණ පිළිම ගෙයි නවකම් කරවා පිළිමය තනා මාණික්‍යයන්ගෙන් අලංකාර කර ඊට කෝළවාපි වැව පූජාකර ඇත (මව,64:68-69). දෙ වැනි සේන (ක්‍රි.ව. 853 - 887) දිරාපත් ව තිබුණ පිළිම ගෙය ප්‍රකෘතිමත් කරවා ඇත (මව,51:77-87).

මහාවංසයේ මෙම ප්‍රතිමාව හැඳින්වීම සඳහා **උරුසිලා පඨිමා** (මව,32:138) **මහාසිලා පඨිමා** (මව,37-123) **සිලාසඹු** (මව,38:61) **සිලාසම්බුද්ධ** (මව,39-7) **සිලාමය බුද්ධ** (මව,44:68) ආදී නානාවිධ නම් භාවිත කර තිබේ. එසේ ම **මහාසල සෙල්පිළිමයක්** පිළිබඳ ව ශිලාලේඛනවල ද සාක්ෂ්‍ය තිබේ. එසේ ම හතර වැනි මිහිඳු (ක්‍රි.ව. 955 - 972) රජුගේ මිහින්තලා සෙල්ලිපියේ **මඟුල් මහා සෙල්පිළිමය** ගැන සඳහන් වේ (*Ez*,Vol.I:92). ඔහුගේ ම ජේතවන පුවරු ලිපියේ **මහාසල පිළිමයක්** ගැන සඳහන් වේ (*ibid*: 218 - 233). මේ අනුව පෙනෙන්නේ ඉතා ගරු බුහුමන් දැක්වූ පිළිමයක් ක්‍රි.පූ. යුගයේ සිට ම ලංකාවේ අනුරාධපුරයේ පැවති ඇති බව ය.

මහාවංසයේ ක්‍රි.පූ. යුගයේ සිට ම මෙම පිළිම ගැන සඳහන් වුව ද පිළිම ගෙවල් පිළිබඳ ව සඳහන් වන්නේ ඊට පසු යුගයක දී බව පෙනේ (ක්‍රි.පූ. 66 - ක්‍රි.ව. 110) රජ වූ වසභ රජු බුදු පිළිම සතරක් කරවා ඒවාට පිළිම ගෙයක් කරවූ බව කියවේ (මව,35:89). ක්‍රි.ව. හතර වැනි සියවසේ පටන් බොහෝ රජවරුන් කරන ලද පිළිම හා පිළිම ගෙවල් සඳහන් වේ (රාහුල,1989:13). පාලි



අට්ඨකථාවල පිළිම ගෙයක් ගැන සඳහන් නොවීම නිසා ක්‍රි.ව. පස් වැනි ශත වර්ෂයට පෙර වංසකතාවල සඳහන් වන පිළිම ගෙවල් පොළොන්නරු සමයේ හා ඉන් පසු ව දක්නට ලැබෙන පිළිම ගෙවල් හා සමාන ද නැතහොත් පිළිමවලට ඉහළින් තනන ලද ආවරණයක් හෙවත් මණ්ඩපයක් පමණක් ද යන වග පැහැදිලි නැත. එහෙත් ඒවා මේ තාක් ලැබී ඇති සාක්ෂ්‍යවලින් පෙනෙන හැටියට නම් පිළිමය අව්වෙන් වැස්සෙන් ආරක්ෂා කිරිම සඳහා කරන ලද හුදු ආවරණ පමණකැයි සිතිය හැකි ය (එම:130). ක්‍රි.ව. පස් වැනි ශත වර්ෂයේ දී අනුරාධපුරයේ තිබූ මහා බුද්ධ ප්‍රතිමාවක් හා ඒ හා සම්බන්ධ කරවා තිබුණු ශෝබා සම්පන්න ප්‍රතිමා ගෘහය ගැන ෆාහියන් ද සඳහන් කර තිබේ. වෙළෙන්දෙක් මෙම බුද්ධ පිළිමයට අවානක් පුද කරනු ෆාහියන් හිමි සියසින් දුටු බව ද එම වාර්තාවේ දක්වා තිබේ(පාදේවා.:102-103).

මේ අනුව පැහැදිලි වන කරුණක් නම් බුදුපිළිමය ලංකාවට ඇබ්බැහි කරන ලද්දේ මහායානිකයන් විසින් දැයි සැක සිතේ. ලංකාවේ බුදුපිළිම වන්දනය ආරම්භ වී යයි සැළකෙන ක්‍රි.පූ. පළමු වැනි සියවසින් පසු ආසන්න සමය තුළ බෝධි වෘක්ෂය හෝ ස්තූපයේ අසල හෝ එලිමහන් ස්ථානයක පිහිට වූ පිළිමයන්ට සෙවණ දී ආරක්ෂාව සැපයූ මඩුවක් හෙවත් මූලික කුටියක ගති ලක්ෂණයන්ගේ ආභාසයෙන් ක්‍රි.ව. පළමු වැනි සියවසින් පමණ පසු සියවස් කිහිපයක් තුළ ප්‍රතිමාඝර නිර්මාණ වූවා විය හැකි ය. නැතහොත් අභයගිරිය මූලික කරගෙන මහායානික සංකල්ප බිහිවීමත් ඒ කරණ කර බුදු පිළිමය බෞද්ධ භක්තිමය අංග අතර ජනප්‍රිය වීම හේතුවෙන් ප්‍රතිමාඝර බිහිවූවා විය හැකි ය. විශේෂයෙන් පාලි අට්ඨ කතාවල පිළිම ගෙය සඳහන් නොවීමට හේතුව වන්ට ඇත්තේ අට්ඨ කතා ලියවුණේ මහායානිකයන්ට තදින් ම විරෝධය පෑ මහා විහාරයේ අනුග්‍රහයෙන් හා ප්‍රමුඛත්වයෙන් නිසා ය. දෘඪ ථේරවාදියෙකු වූ මහාවිහාරිය ආචාර්යවාදයේ උද්යෝගිමත් ආරක්ෂකයා වූ ද බුද්ධඝෝෂාචාර්යයෝ වත් මහායානික කිසිවක් සඳහන් කරන්නට අකමැති වූහ. පිළිම ගැන සඳහන් කරන දෙතැනක දී පවා උන්වහන්සේ ප්‍රධානත්වය දෙන්නේ පිළිමයට නොව එහි නිධන් කර ඇති ධාතූන්ට ය. පිළිම ගෙය ගැන වචනයක් එහි නැත (රාහුල,1989:133). පිළිම ගෙය ප්‍රමාණය හා හැඩහුරුකම කුමක් වුවත් යටත් පිරිසෙයින් ක්‍රි.ව. පස්

වැනි ශත වර්ෂය වන විටත් එය තරමක් විශාල මන්දිරයක් බවට පත් ව තිබුණ බව විශ්වාස කරන්නට මේ අනුව සාක්ෂ්‍යය තිබේ (එම: 133).

ලක්දිව වාස්තුවිද්‍යාවේ සුවිශේෂී අංගයක් ලෙස පටිමාඝරය කැපීපෙනේ. එකිනෙකට වෙනස් ව්‍යුහාත්මක ලක්ෂණයන්ගෙන් සමන්විත පටිමාඝර අනුරාධපුරය හා ලංකාවේ අනෙක් ප්‍රදේශවලින් සොයා ගෙන ඇත. වාස්තුවිද්‍යාත්මක ආකෘති අනුව පිළිමගෙවල් මේ ආකාරයට වර්ග කර දැක්විය හැකි ය.

01. ගන්ධකුටි සම්ප්‍රදාය
    - I. ගන්ධකුටි පටිමාඝර
    - II. චතුර්මුඛ පටිමාඝර
02. ගෙඩිගේ සම්ප්‍රදාය
    - I. ගල් පසුතලයකට යාකළ ගෙඩිගේ ස්වරූපය
    - II. පූර්ණ ගලින් නිර්මාණය කළ ගෙඩිගේ ස්වරූපය
03. ප්‍රසාද සම්ප්‍රදාය
04. ලෙන් විහාර පිළිම ගෙවල්
05. ටැම්පිට පිළිම ගෙවල් වශයෙනි (ලියනගමගේ,ලොකුලියන, 1961:03)

මෙම පිළිමගෙවල් සම්ප්‍රදායන් අතරින් ජේතවනාරාමයේ පිළිම ගෙවල් වර්ග දෙකක් දැකගත හැකි ය. ඒවා නම්,

01. ගන්ධකුටි සම්ප්‍රදායේ පිළිම ගෙය වර්ගය
02. ගෙඩිගේ සම්ප්‍රදායේ පිළිම ගෙය වශයෙන් වර්ග කළ හැකි ය. වාර්තා කිරීමේ පහසුව තකා මෙම පිළිම ගෙවල් දෙක වෙන වෙන ම වාර්තා කරනු ලැබේ.

## ගන්ධකුටි සම්ප්‍රදායේ පිළිම ගෙය

ජේතවනාරාම විහාරයේ ස්තූපයට ගිණිකොණ දෙසින් මෙම ගන්ධකුටි සම්ප්‍රදායේ පිළිම ගෙය පිහිටා ඇත. පොහොය ගෙය (උපෝසථඝරය) ආසන්නයේ ම ඊට නැගෙනහිර පසින් ඇති මෙම පිළිම ගෙය මතුපිට පොළොවෙන් මීටර් 3 සෙ.මී. 10 ක් උසකින් යුත් ගඩොලින් තැනූ වට පවුරකින් වටකරන ලද මළුවක් මත ඉදිකර ඇත. එම මළුවට පිවිසෙන ප්‍රධාන දොරටුව උතුරු පසින් දැකගත හැකි අතර ප්‍රධාන පිළිම ගෙය හා ඊට පරිවාර පිළිම ගෙවල් දෙකක් එම මළුව මත ඉදි වී ඇත. එම මළුවේ දිග මීටර් 68 සෙ.මී. 20 ක් වන අතර පළල මීටර් 46 සෙ.මී. 10 කි.



ගන්ධකුටිය යන පුරාවිද්‍යාත්මක ලක්ෂණයන්ගෙන් යුතු අංගනයෙහි බුදුන් වහන්සේ ජේතවනයෙහි වැඩසිටි මුල් සුවඳවත් කුටිය (ගඳකිලිය) සිහිගැන්වීම හෙවත් ප්‍රතිනිර්මාණය කිරීමේ අර්ථයෙන් යෙදුණ බව නෝමන් ප්‍රකාශ කර ඇත (Norman,1908:108). ගඳකිලිය එසේත් නැතහොත් ගන්ධකුටි යන අර්ථය ගෙන දෙන සඳහනක් අභයගිරි විහාරයේ ක්‍රි.ව. දස වැනි සියවසට අයත් සෙල්ලිපියක එයි. එයින් මහා විහාරයේ පිහිටි පටිමාඝරය ගන්ධකුටි හෙවත් ගඳල් යනුවෙන් හඳුන්වා තිබේ (*Ez*,vol.I:218 - 221)¡ නිශ්චිත වශයෙන් ම බුදුන්ගේ ගන්ධකුටි සම්ප්‍රදාය වාස්තුවිද්‍යාත්මක ව ශ්‍රමණයන් හා මුනිවරුන් විසූ ආශ්‍රම කුටිවලින් පැවතෙන්නක් වේ (Bandaranayake,1974:190). සේනක බණ්ඩාරණායක අනුරාධපුරයේ හා ඒ අවට ඇති විස්සක් පමණ වන පිළිම ගෙවල් අතරින් අඩු තරමින් හයක් පමණවත් නිශ්චිත වශයෙන් ම ගන්ධකුටි සම්ප්‍රදායට සැලසුම් අතර ඇති බව ප්‍රකාශ කර තිබේ (*ibid*). එසේ ම ජේතවන විහාරයේ උපෝසථඝරයට ආසන්න ව අර්ධ පංචායතන සැලසුමක් ලෙස පිහිටි බෙල් සැසුමට අනුව **"එම්"** ආරාම යනුවෙන් නම් කෙරුණ ප්‍රතිමාඝර ත්‍රිත්වයකට අයත් අංක 40 දරණ පිළිමගෙය අනුරාධපුර සහ පොළොන්නරු යුගයන්ගෙන් මේ දක්වා වාර්තා වී ඇති විශාල ම ගන්ධකුටි සම්ප්‍රදායේ පිළිම ගෙය වේ. පැත්තක් අඩි 52 ක් වූ සමචතුරස්‍රාකාර ගර්භගෘහය, ප්‍රවේශ ශාලාව වෙන් කෙරුණ ද්වාරයක් වූ බවට අනුමාන සාධක ඇති අතර මුළු ගෘහය සතු ව ම ගල් කණු 82 ක් දක්නට ඇත. පූජ්‍ය කුටියේ හරිමැද වූ පිළිමය ප්‍රතිමාඝරයේ විශාලත්වයක් ගල් කණු විශාල සංඛ්‍යාවක්, ගඩොල් බිත්තියේ සිහින් බව හා සරල බව ගල් වැට නිසාත් එය දැව සහ සරල පෙදරේරු වැඩ සම්මිශ්‍රිත ගෘහ නිර්මාණ කලාව වූ නිත්‍ය සිංහල සම්ප්‍රදාය ඉතා සත්‍ය සහ පැහැදිලි වූ වූ උදාහරණයක් බව

බණ්ඩාරණායක නිගමනය කරයි (*ibid*: 201). එසේ ම එහි අංක 41 හා 42 ලෙසින් හැඳින්වෙන පරිවාර ප්‍රතිමාඝරයන් ද්වයෙහි අර්ධ උන්නත සත්ත්ව රූප සහිත කැටයමින් යුතු පාදම් ගල් ද විසිතුරු කරන ලද කුළුණු ද ගල් ඇතිරූ ඇතුළත ගෙබිම ද යන සියලු ඉදිකිරීම් ලක්ෂණ එහි පසු සංස්කරණයන් ගැන කරුණු දක්වන අතර, එම පරිවර්තනය පොළොන්නරු යුගයේ සිදු වූවා විය හැකි බව ද ඔහු ප්‍රකාශ කර තිබේ (*ibid*:201- 203).

ඉහත දැක්වූ ආකාරයේ සැලැස්මෙන් යුත් ප්‍රතිමාඝරයක් අභයගිරිය විහාරයේ **එස්**$_{15}$ ඩබ්$_{118}$ ග්‍රිඩ් චතුරස්‍රයට අයත් ව හඳුනාගත හැකි ය. අඩි 24 අඟල් 6ක් දිග අඩි 22 අඟල් 9 ක් පළල වන මෙම ප්‍රතිමාඝරය 1996 - 1997 සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය කැනීම් යටතේ අනාවරණය කරගෙන ඇත (කුරුගල,1998:15) ගන්ධකුටි ප්‍රතිමාඝර පබ්බත විහාරයන්ට සම්බන්ධ වීමෙන් පැහැදිලි වෙනසක් සිදුකර ඇත. සිංහල ගෘහ නිර්මාණ අංගයන් අතරට තරමක් පසු ව පැමිණි එය පශ්චාත් අනුරාධපුර සමාජ ව්‍යුහය තුළ ප්‍රචලිත ව පැවති බෞද්ධ විහාර ආරාම සම්ප්‍රදාය වූ පබ්බත විහාර සඳහා තොළුවිල, පාචීනතිස්සපබ්බත, පන්කුලිය, විජයාරාමය, වෙස්සගිරිය, සීගිරිය ආදී පිළිගත් වාස්තුවිද්‍යාත්මක මූලධර්මයන් අනුගමනය කරමින් ස්ථිර ලෙස එක් වී ඇති අතර පබ්බත විහාරයන්හි මධ්‍ය චතුරස්‍රයේ ස්තූපය හා බෝධිඝරය සමඟ එක් ව ඒවායේ තරාතිරමේ සමානත්වය ඉතා හොඳින් පෙන්නුම් කරමින් බුදුන් අනුස්මරණය කිරීමේ වතාවත් නැතහොත් ත්‍රිකෝණාකාර සම්බන්ධයෙන් නියෝජනයට ද යොදා ඇත (මාරසිංහ,1993:9-14).

මුල් බෞද්ධ ගන්ධ කුටිය ස්තූප අංගණ, චේතියඝර, හෝ බෝධිඝරයෙහි තිබෙන්නට ඇති මුල් ම පිදීම වස් තැන්පත් කෙරුණු මඩු හෝ කුඩා කාමර යයි උපකල්පනය කළ හැකි ය (රාහුල,1989:130). එය ගැමි බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පියාට මුළුමනින් ම නුහුරු වෘත්තාකාර හැඩයට වඩා ගැමි සිංහල සම්ප්‍රදායට වඩාත් සහජ වූ සමචතුරස්‍රාකාර හෝ සෘජුකෝණාස්‍රාකාර හැඩය අනුව තැනීමක් විය (Bandaranayake,1974:210). ඉනික්බිති එහි ඇතැම් මුදුනින් පිටතට නෙරා ඒමක් හෝ ප්‍රවේශ ශාලාවක් සමඟ එම චතුරස්‍රය සමඟ එකතු වීමක් හෝ නැතහොත් කුටියේ ප්‍රධාන



ද්වාරයේ දිගු කිරීමක් හෝ ලෙස සම්භාව්‍යය ගන්ධකුටි සැලැස්ම අනුක්‍රමයෙන් සකස් වූවා විය හැකි ය. සිංහල ගෘහ නිර්මාණ ශිල්පයේ මෙන් ම ඉන්දියාවේ ද පරිවර්තන යුගයක් ලෙස ගැනෙන ලංකාවේ අනුරාධපුරයට පෙර කල ඉන්දියාවේ ගඩොල් හා දැව නිර්මාණයන්ගේ ගල් අත්තිවාරම් සහිත නිර්මාණන්ට නැතහොත් බෞද්ධ ප්‍රධානත්වයෙන් බ්‍රහ්මණ ප්‍රධානත්වයට තල්ලුවීමේ ආරම්භක කාලයට හෙවත් ක්‍රි.ව. හතර - හය සියවස් අතර සමයට යටත් ව එහි අවසන් භාගයේ දී ගන්ධකුටි සැලැස්මේ ආරම්භක සංකල්පය බිහී වී ඇත (*ibid*:210 - 211). සරල භාවයත් ප්‍රමාණ සමතාව හා අලංකාරය දැක්වීම සඳහා විසිතුරු කැටයම්වලට වඩා ආවේණික ස්වරූපය උපයෝගී කරගැනීමක් නිර්මාණ ශිල්ප ක්‍රමය පිළිබඳ ප්‍රධාන ලක්ෂණයක් වූ ගන්ධකුටි ප්‍රතිමාඝරය, ස්වාභාවික සංවර්ධනයන්ට ලක්වීම නිසා හෝ එහි ඇතැම් අංගයන් සංස්කරණයට පාත්‍ර වූ නිසා හෝ විදේශීය බලපෑමක් නිසා එහි මූලාරම්භක ස්වරූපය හඳුනාගත නොහැකි තරම් වෙනසකට ලක් වි නොමැත (පරණවිතාන,1955:81 - 92).


අනුරාධපුර සම්භාව්‍යය මෝස්තරයේ මූලික සැලසුම පොළොන්නරු යුගය දක්වා නො වෙනස් පැවැත්මක් සැලසුම් කර ඇති අතර, එහි උච්චස්ථානය එකොළොස් වැනි හා දෙළොස් වැනි සියවසට අයත් පොළොන්නරුවේ දළඳා මළුවේ පළමු වැනි විජයබාහුගේ සහ නිශ්ශංකමල්ලගේ දළඳා පන්සල හෙවත් අටදාගෙය හා හැටදාගෙය නමින් ප්‍රසිද්ධ අලංකාර සංකීර්ණ සොල්දර සහිත ප්‍රතිමාඝර වේ (*ibid*:203). එහෙත් ගන්ධකුටි සැලැස්ම නුවර කාලය නැතහොත් නූතනය දක්වා ම සිංහල ගැමිගෙය පාදක වූ ඉතා ස්වාභාවික හා දේශීය ක්‍රමයක් කරා ප්‍රගමනය වී ඇති අතර, නුවර යුගයේ දී පූජ්‍ය කුටියත් බොහෝ විට ම ප්‍රමාණයෙන් ඒවා සමාන වූයේ නැත. විශාල ප්‍රවේශ ශාලාව හෝ මණ්ඩපයත් ගොඩනැගිල්ලේ මූලික ගති ලක්ෂණ වී ඇත (කුමාරස්වාමි,1962:118).

ගන්ධකුටි පටිමාඝරය මේ අනුව පැහැදිලි ලෙස ම ක්‍රි.ව. 5 - 7 වැනි සියවස්වලට අයත් විය හැකි බව සේනක බණ්ඩාරණායකගේ මතය වේ (Bandaranayake,1974:213). නිර්මාණාත්මක

වාස්තුවිද්‍යා අංගයක් වූ ගන්ධකුටි පඨිමාඝරය සැලැස්මට අනුව අන්තරාලාය හා ගර්භගෘහය වශයෙන් කොටස් දෙකකකින් යුක්ත වේ. ජේතවන විහාරයේ ඇති පිළිම ගෙවල් සම්ප්‍රදා දෙක අතුරින් වඩාත් පැරණි පිළිම ගෙය මෙම ගන්ධකුටි සම්ප්‍රදායේ පිළිම ගෙය ලෙස හැඳින්විය හැකි ය. බෙල් විසින් ද මෙම නටඹුන් ව තිබූ පිළිම ගෙය ආරාම එම් (M) නමින් නම් කර ඇත. එහි ඔහු ඉදිරිපත් කරන සැලසුම අනුව මෙම පිළිම ගෙය තුළ හිටි බුදු පිළිමයක් තිබී ඇති බව ද සඳහන් කර තිබේ (*ASCAR*:1896). දැනට නටඹුන් ව ඇති මෙම පිළිම ගෙය ගල් කණු ශේෂ 82 ක් දැකගත හැකි අතර ප්‍රධාන පිළිම ගෙය දිග මීටර් 22 සෙ.මී. 10 හා පළල මීටර් 15 සෙ.මී. 50 වේ. පිළිම ගෙය වටා යමින් ද වන්දනා කිරීමට හැකි වන ආකාරයට මෙය තනා තිබුනේ යයි උපකල්පනය කළ හැකි සාධක පවතින බව එහි ඇති නටඹුන් අනුව පෙනේ. මෙහි පාදම සඳහා යොදා ගෙන ඇති පාෂාණ වර්ගය ස්ඵටික හුණුගල් (Crystalime limestone) වේ. ගර්භ ගෘහය තුළ දැකිය හැකි යන්ත්‍රගල (ගර්භ පත්‍රය) මීටර් 1 සෙ.මී. 70 × මීටර් 1 සෙ.මී. 70 ප්‍රමාණ වන අතර නිධන් හොරුන් විසින් විනාශ කරන ලද එම පද්ම පාදමේ ශේෂ පමණක් අද දැකගත හැකි ය. එය ද ස්ඵටික හුණුගල්වලින් තනා තිබේ. සමස්ථයක් ලෙස ගතහොත් පිළිම ගෙයට අයත් පාෂාණ වර්ග ඛාදනයට ලක් වී ඇති අතර, උපයෝගී කරගත් පාෂාණ අනුව මෙය ජේතවනාරාම විහාරයේ මුල් පිළිම ගෙය විය හැකි බව උපකල්පනය කළ හැකි ය. මෙම පිළිම ගෙය පිළිබඳ සඳහනක් මූලාශ්‍රයවල සඳහන් නොවූව ද මහායාන මතවාදය ඇදහූ මහාසේන රජු ඔහු ඉදිකළ විහාරයේ පිළිම ගෙයක් ඉදිකිරීමට ඇතැයි සිතිය හැකි ය. විශේෂයෙන් ම මහාසේන රජුගේ කණිටු පුත් වූ ජෙට්ඨතිස්ස ශෝභා සම්පන්න මනහර බෝසත් පිළිමයක් සිය පිය රජුගේ අණ පරිදි ඇත් දළින් කළ බව සඳහන් වේ (මව,37:102). මේ අනුව අනිවාර්යයෙන් ම පිළිම වන්දනාව එවකට ඇරඹී තිබී ඇති අතර මෙම පිළිම ගෙය මුල් ජේතවනාරාම යුගය හා සම්බන්ධ විය යුතු ය. 2001 වසරේදී පිළිම ගෙය අභ්‍යන්තරයේ ප්‍රධාන ප්‍රවේශ ද්වාරය අසල සිදු කරන ලද පුරාවිද්‍යා කැනීමක දී දැකගත හැකි වූයේ මෙම ප්‍රවේශ ද්වාරයට යටින් පැරණි ගඩොලින් හා මැටි බදාමයෙන් ඉදි කරන



ලද තවත් නටඹුන් වූ ද්වාරයකි. එම නටඹුන් අනුව මෙම ස්ථානය වන්දනීය ස්ථානයක් වූ බවට සාධක සැපයෙන අතර කාලනීර්ණය නොකරන ලද එම ගොඩනැගිල්ල පිහිටීම දෙස බැලීමේ දී ප්‍රධාන පිළිම ගෙය හා සම මට්ටමක් ගනී. එබැවින් මෙහි ප්‍රධාන පිළිම ගෙය වඩාත් පැරණි පිළිම ගෙය ලෙස පිළිගත හැකි ය. සේනක බණ්ඩාරණායකගේ මතය අනුව අනුරාධපුරයේ හමුවන විශාලතම ගන්ධකුටි පිළිම ගෙය මෙය වේ (Bandaranayake, 1974:201). ලොව විශාලතම ස්තූපය තැනූ මහසෙන් රජතුමා එම අරමුණ පෙරදැරි කරගෙන විශාලතම පිළිම ගෙයක් ජේතවනාරාමයේ ඉදි කරන ලද්දේ දැයි මෙම සාධක අනුව විමසීම වැදගත් වේ. කෙසේ වෙතත් එම පිළිම ගෙය ඉදිරිපසින් බටහිරට හා නැගෙනහිරට එකිනෙකට මුහුණ ලා පිහිටි කුඩා ගන්ධකුටි පඨිමාඝර දෙකක් වේ. එහි බටහිර ඇති කුඩා ප්‍රථිමාඝර තුළ වූ ආසනය අනුව කුඩා හිඳි පිළිමයක් එය තුළ වූ බවට සාධක සපයයි. කෙසේ වෙතත් මෙම පරිවාර පඨිමාඝර දෙක මුල් ප්‍රථිමාඝරයට වඩා පසු ලක්ෂණ පෙන්නුම් කරන බව සේනක බණ්ඩාරණායකගේ මතය වේ (*ibid*: 201 - 203). මෙම පිළිම ගෙවල් සඳහා උපයෝගී කරගෙන ඇති ගඩොල් මාධ්‍යය අනුව ප්‍රධාන පිළිම ගෙය වඩා පැරණි එක විය හැකි බව පැහැදිලි වේ. වාස්තුවිද්‍යාත්මක ව ජේතවනාරාම ගන්ධකුටි පිළිම ගෙය ඉතා අලංකාර එකක් වන අතර එය වඩා පැරණි පිළිම ගෙය ලෙසින් හැඳින්විය හැකි ය.



ජේතවන විහාරයේ ගන්ධකුටි ජයිමාසරය

## ගෙඩිගේ සම්ප්‍රදායේ පිළිම ගෙයඃ-

දහ නව වැනි සියවස අග භාගයේ දී එච්.සී. බෙල් විසින් කරන ලද ගවේෂණවලදී ජේතවන විහාර භූමියේ නටඹුන් වූ පිළිම ගෙවල් දෙකක් වාර්තා කර ඇති අතර මෙයින් ස්තූපයට බටහිරින් ඇති පිළිම ගෙය ගෙඩිගේ සම්ප්‍රදායට අයත් වේ (*ASCAR*;1892). ගෙඩිගේ සම්ප්‍රදායට අයත් පිළිමගේ සැලැස්ම තුළ ගර්භගෘහය අන්තරාලය හා මණ්ඩපය යන අංගවලින් සමන්විත ව එය නිමවා ඇත. එසේ ම ගර්භ ගෘහයට පිටතින් ප්‍රදක්ෂිණ පථයක් තනා තිබීම විශේෂ වේ.



බෙල් වාර්තාවලට අනුව ජේතවනාරාමයේ ගෙඩිගේ පිළිම ගෙය එක් පැත්තක දිග අඩි 69 කි. චතුරස්‍රාකාර වූ පිට කාමරයේ පැත්තක දිග අඩි 32 කි. බිත්තිවල ඝනකම අඩි 5 කි. එහි ප්‍රධාන ශාලාවට කවුළු 14 ක් ද අන්තරාලයට කවුළු 3 ක් ද වේ. ගර්භ ගෘහය තුළ පිහිටි බුදු පිළිමයක් තිබෙන්නට ඇති බව ද ඔහු වාර්තා කර ඇත (ASCAR; 1892). දැනට සංරක්ෂණය කර ඇති පිළිම ගෙය දිග පළල මීටර් 39 සෙ.මී. 90 හා පළල මීටර් 29 සෙ.මී. 15 වේ. මෙම පිළිම ගෙය තුළ දැකගත හැකි ගල් උළුවස්ස අඩි 36 ක් උස වන බව හා එයින් අඩි 9 ක් පොළවෙන් යට විහිදී ඇති බව ප්‍රනාන්දු සඳහන් කරයි (ප්‍රනාන්දු,1967:20). දොරබා කැබලිවලට කැඩී බිඳී තිබුණ බැවින් 1930 ගණන්වල දී එම කැබලි එකට සම්බන්ධ කර ඇත. එහි උඩලිපත සොයා ගත නොහැකි ය. ඉතා අලංකාර ලෙස වාත්තු කරන ලද මේ දොරරාමුව අනුරාධපුරයේ තිබෙන දර්ශනවලින් අතිශයින් සිත්ගන්නා නිර්මාණයකි (ලියනගමගේ, ගුණවර්ධන,1987:28). විශාල බිත්තිවලින් යුක්ත ව ගඩොලින් නිර්මාණය කෙරී තිබී ඇති මෙහි බුදු පිළිමය ගඩොලින් හා බදාමයෙන් නිමවා තිබෙන්නට ඇතැයි සැළකිය හැක්කේ එහි අවශේෂ කිසිවක් දක්නට නොමැති හෙයිනි. සොයාගන්නා අවස්ථාවේ නිදන් හොරුන් විසින් විනාශයට පත්කර තිබූ පද්ම පීඨය හා අති විශාල නිදන් වස්තු ගල (ගර්භ පත්‍රය, යන්ත්‍රගල) සංස්කෘතික ත්‍රිකෝණ ජේතවන ව්‍යාපෘතිය විසින් දැනට සංරක්ෂණය කර තිබේ. මෙහි බුදු පිළිමය පසු පස බිත්තියට සම්බන්ධ වී ඇති අතර, එය විහාර ගෙයට ඇතුළු වන සැදැහැවතුන්ගේ නෙත ගැටෙන පරිදි අඩි 35 ක් පමණ උසකින සමන්විත වන්නට ඇතැයි සැළකේ (කුලතුංග,2001:41).

ගොඩනැගිල්ල තුළ වූ බුදු පිළිමයේ ස්වාභාවය අනුව මෙම පිළිම ගෙය ක්‍රි.ව. 9-10 සියවස්වලට අයත් විය හැකි ය. (ලියනගමගේ,ගුණවර්ධන, 1987:228). අනුරාධ සෙනෙවිරත්නගේ මතයට අනුව මෙවැනි වාස්තුවිද්‍යා නිර්මාණයක් අනුරාධපුර යුගයට අයත් නොවන අතර, මෙම නිර්මාණය පොළොන්නරු රාජධානි සමයේ දී පරාක්‍රමබාහු රජු අනුරාධපුර ප්‍රතිසංස්කරණ කටයුතුවල දී සිදු කරන්නට ඇතැයි ප්‍රකාශ කර තිබේ. එසේ ම මෙම ගොඩනැගිල්ල අනුරාධපුරයෙන් මෙතෙක් සොයා ගන්නා

ලද විශාලම ගන්ධකුටි සම්ප්‍රදායේ පිළිම ගෙය බව ද ඔහු සඳහන් කර තිබේ (සෙනෙවිරත්න,1985:129). පොළොන්නරුවේ ඇති ලංකාතිලක පිළිම ගෙය, ථූපාරාම පිළිම ගෙය හා තිවංක පිළිම ගෙය ද ප්‍රදක්ෂිණා පථයක් සහිත ව මේ ආකාරයේ සැලැස්මකින් යුත් ගොඩනැගිල්ලකි. එහි ද ප්‍රදක්ෂිණා පථය තවත් ඉතිරි වී ඇති අතර ජේතවනාරාමයේ ද එවැන්නක් තිබේ (කුලතුංග,2001:41). මූලාශ්‍රය සාධක අධ්‍යයනයේ දී මහාවංසයේ අවස්ථා කිහිපයක දී ජේතවන විහාරයට අයත් වූ **මණිප්‍රාසාද** නම් ගොඩනැගිල්ලක් ගැන සඳහන් කර තිබේ. එය **මණිමේඛලා පහය** (මණිමේඛලා ප්‍රාසාද) නමින් ද එහි විස්තර වේ (මව,53:48 - 49). දෙ වැනි සේන රජු (ක්‍රි.ව. 853 - 887) මණිමේඛලා පහයෙහි බෝසත්පිළිම වැඩ හිඳුවන ලද බව සඳහන් වේ (මව,49:77 - 78) . එසේ ම (ක්‍රි.ව. 946 - 956) රජ වූ සිව් වැනි උදය රජු චෝල ආක්‍රමණිකයන් විසින් විනාශ කරන ලද මෙම **මණිප්‍රාසාදය** නැවත ඉදි කර ඇත (මව,53: 48 - 49). මූලාශ්‍රය කරුණු අනුව **මණිප්‍රාසාද, මණිමේඛලා ප්‍රාසාද** වශයෙන් මෙසේ සඳහන් වන්නේ පිළිම ගෙයක් විය යුතු බව පෙනේ. මහාවංසයේ සඳහන් වන ආකාරයට මෙම මණිප්‍රාසාදයේ පිළිම තැන්පත් කර ඇති බව හැඟ වේ. ප්‍රාසාද වශයෙන් පිළිම ගෙවල් හැඳින්වූ බව ටී.ජී. කුලතුංගගේ මතය වේ (කුලතුංග,2001:21). නමුත් වොල්ටර් මාරසිංහගේ මතය වන්නේ ප්‍රාසාද යන්න භික්ෂූන් වාසය කළ විහාර ශාලාව බව ය (මාරසිංහ,1989:42). මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව එහි අඩංගු ගොඩනැගිලි හා ආරාම ක්‍රි.ව. 7 - 10 සියවස්වලට අයත් යයි සැළකිය හැකි පබ්බත විහාරවල ආදි ම ස්වරූපය පිළිබිඹු කරන බව පෙනේ. ඒ අනුව මෙම ග්‍රන්ථය ක්‍රි.ව. 5 - 7 අතර කාලය තුළ රචිත එකක් ලෙස වෝල්ටර් මාරසිංහ පෙන්වා දෙයි (මාරසිංහ 1989:20).

මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව ප්‍රාසාදය පිළිම ගෙයක් නොවන බව පෙනේ. නමුත් මහාවංසයේ සඳහන් වන මණිප්‍රාසාදය පිළිම ගෙයක් බව එහි ප්‍රතිමා තැන්පත් කර තිබීමෙන් පෙනේ. මණිමේඛලා පහය වශයෙන් ද හඳුන්වන මෙම ගොඩනැගිල්ල බොහෝ විට ජේතවනයේ ගෙඩිගේ පිළිම ගෙය වන්නට ඇති බව ඒ අනුව උපකල්පනය කළ හැකි ය. විශේෂයෙන්




ගොඩනැගිල්ලේ වහලය ද ගඩොලින් ම තනා තිබෙන බැවින් පොළොන්නරුවේ තිවංක පිළිම ගෙය, ථූපාරාම පිළිම ගෙය, ලංකාතිලක පිළිම ගෙය ආදියෙහි උපරි ව්‍යුහය මෙන් වීමට ඉඩ තිබේ. එම ගොඩනැගිලිවල වහළ ගඩොලින් නිම වී ඇති අතර රජකීය කාන්තාවන් ඉණ බඳින මණිමේඛලාවක් ආකාරයෙන් යුක්ත බව එය අධ්‍යයනය කිරීමේදී පෙනේ. ඒ අනුව මහාවංසයේ සඳහන් වන මණිමේඛලා ප්‍රාසාද ගොඩනැගිල්ල ජේතවනාරාම ගෙඩිගේ පිළිම ගෙය විය හැකි යයි මේ අනුව පෙන්වාදිය හැකි ය. විශේෂයෙන් ම මෙහි වහල ද **මිණිමෙවුලක** ආකාරයට නිම වී තිබෙන්නට ඇති බැවින් උක්ත නාම භාවිත කරන්නට උචිත බවක් පවතින බව ද පෙන්වාදිය හැකි ය.





ජේතවන විහාරයේ ගෙඩිගේ සම්ප්‍රදායේ යේ පිළිම ගෙය



ජේතවන විහාරයේ ගෙඩිගේ සම්ප්‍රදායේ පිළිමගේ සැලසුම

## ධර්මශාලාව

අංගුත්තර නිකායට්ඨ කතාවට අනුව බණ කීමටත් බණ ඇසීමටත් ස්ථානයක් විහාරයකට අවශ්‍ය වේ. මෙය **ධම්මමණ්ඩප, ධම්ම ශාලා** නම් වේ.

## ධර්මශාලාව

**ධර්මශාලාව, බණමඩුව** යනාදී වචනවලින් හැඳින්වෙන් භික්ෂූන් වහන්සේ විසින් උපාසක උපාසිකාවන් සඳහා ධර්ම දේශනා පවත්වන ස්ථානයයි. ජේතවනාරාමයේ ද ධර්ම ශාලාවක් පවතින්නට ඇතයි සිතිය හැකි වාස්තුවිද්‍යාත්මක අංගයන් හඳුනාගත හැකි සාධක තිබේ. මෙම ගොඩනැගිල්ල පිහිටන්නේ



ස්තූපයට අග්නිදිග කෝණයෙනි. එනම් පොහොය ගෙයට මඳක් ඉදිරියෙනි. සිව් දිශාවන්ට ප්‍රවේශ සහිත, මධ්‍යයේ සුවිශේෂ වශයෙන් කැටයමින් හා බොරදම්වලින් අලංකාර වත් වූ ගලින් තැනූ උච්ඡාසනයක් සහිත ව මෙම ගොඩනැගිල්ල නිර්මාණය කර ඇත. මෙම වාස්තුවිද්‍යාත්මක අංගයෙහි උපයෝගීතාවය අධ්‍යයනයේදී එහි සිව් දෙසින් ම ප්‍රවේශ සහිත වීම සහ මධ්‍යයේ උච්ඡාසනය සුවිශේෂ වශයෙන් සැළකිල්ලට බඳුන් විය යුතු ය.

මූලාශ්‍රය සාධක අධ්‍යයනයේ දී මේ සම්බන්ධ ව ඉතා වැදගත් තොරතුරක් අනාවරණය කර ගත හැකි ය. බරණැසට වෙළෙඳාමේ ගිය පූර්ණ නම් තරුණ වෙළෙන්දෙක් ධර්මධාතු නම් ග්‍රන්ථයක් ලංකාවට ගෙනාවේය. එය (ක්‍රි.ව. 522 - 535) සිලාකාල රාජ යුගයට අයත් වේ. මෙම රජු මේ පොත හරසරින් පිළිගෙන රජ ගෙදර අසල ගෙයක සුරක්ෂිත කර තබා අවුරුද්දකට වරක් ජේතවනාරාමයට ගෙන ගොස් වසරක් පාසා නොකඩවා මහත් උත්සවයක් පැවැත්වීය (මව,40:38 - 40). මේ පුවත නිකාය සංග්‍රහයේ ද (නිසඃ17), චූල වංසයේ ද සඳහන් වේ (චූවඃ41:37).

මේ අනුව මූලාශ්‍රයන්හි සඳහන් වන ඉහත සඳහන අනුව මෙය වෛතුල්‍යවාදී ධර්මය ඇතුළත් ධර්ම ග්‍රන්ථයක් විය යුතු අතර අනුරාධපුරයේ ආරාම අතර අභයගිරිය හා ජේතවනය මහායාන මතවාදයන්ට ගරුකළ ආයතන බව ඓතිහාසික මූලාශ්‍රයවලින් ද සාක්ෂ්‍ය දරණ හෙයින් ජේතවනාරාමයේ එබඳු ධර්මයක් වන්දනීයත්වයට පත්වීම පිළිබඳ කිසිඳු ගැටළුවක් ඇති නොවේ. එසේ ම ජේතවනාරාමයේ සිදු කරන ලද කැනීම්වලට අනුව මහායානයේ විශේෂ ධර්ම සූත්‍රයක් වන **ප්‍රඥාපාරමිතා** සූත්‍රයේ කොටස් ඇතුළත් රන් පත්තිරු හමු වී ඇත. ගණනින් 13 ක් වූ මෙම රන් පත්තිරු පුස්කොළ පොතක් ආකාරයෙන් බැඳ තිබූ බවට සාධක ද දක්නට ඇත. එසේ හෙයින් නිකාය සංග්‍රහයේ හා මහාවංසයේ සඳහන් **"වෛතුල්‍යවාදී පොත"** මෙය විය හැකි යයි උපකල්පනය කිරීමට හැකියාවක් තිබේ. මූලාශ්‍රය සාධකවල සඳහන් වන ආකාරයට ධර්ම පුස්තකය ජේතවනාරාමයේ තබා වසරක් පාසා උත්සවශ්‍රීයෙන් සැමරූ බව පැවසේ. ප්‍රඥාපාරමිතාව යනු සද්ධර්මපුණ්ඩරීකය, ලලිතවිස්තරය, ලංකාවතරසූත්‍රය වැනි මහායාන බෞද්ධ ආගමේ ඇති පූජනීයත්වයට පත් ස්තූප අතුරින්

එකක් වන අතර, ජේතවන විහාර භූමියෙන් හමු වී ඇත්තේ **ප්‍රඥාපාරමිතාවේ පංචවිංසතිකා සහාශ්‍රිකා පාරමිතා සූත්‍රයයි.** මෙම සූත්‍රය මහායාන බෞද්ධාගමේ පූජනීයත්වයට පත් ධර්ම පර්යාය නමින් හැඳින්වූ සූත්‍රවලින් එකකි (කුලතුංග,2001:58). එසේ නම් සත්කාර සම්මාන කිරීමෙන් උත්සව ශ්‍රීයෙන් සැමරීමටත් යෝග්‍ය වූ පොතක් සඳහා සුදුසු ස්ථානයක් තිබිය යුතු ය. එබඳු උපයෝගීතාවයක් උදෙසා වෙනත් වාස්තුවිද්‍යාත්මක අංගයන් ජේතවන විහාර භූමිය ඇසුරින් හඳුනාගැනීමට නොහැකි ය. එබඳු කටයුත්තක් සඳහා  වාස්තුවිද්‍යාත්මක නිර්මාණ ලක්ෂණ සහිත එක ම ගොඩනැගිල්ල මෙය වේ. මෙම වෛතුල්‍ය ග්‍රන්ථය උත්සව ශ්‍රීයෙන් සැමරූ චාරිත්‍රය සඳහා විශාල ජනකායක් රැස්වන්නට ඇත. ගොඩනැගිල්ලේ පිහිටීම අනුව දකුණු ප්‍රදේශයෙන් හා නැගෙනහිර ප්‍රදේශයෙන් පැමිණි ජනතාවට රැස්වීමට මාර්ග පහසුව පැමිණි ස්ථානයක මෙම ගොඩනැගිල්ල පිහිටා තිබේ.

ඓතිහාසික මූලාශ්‍රයවලට අනුව ඇතුළුනුවර දකුණු ද්වාරයටත් නැගෙනහිර ද්වාරයටත් සබඳ වූ පැරණි මාර්ගයක් මල්වතු ඔය බටහිර ඉවුර දිගේ මෙම ප්‍රදේශය ආසන්නයෙන් තිබී ඇත. එසේ ම ආරාමයේ පිහිටීම අනුව සාමාන්‍ය ජනතාව පැමිණීමේ පහසුව තිබෙන්නේ මේ හරහා ය. මෙසේ රැස් වූ ජනතාවට එක්රොක් වීමට මෙම ගොඩනැගිල්ල ඉදිරිපස ඉතා සුවිසල් විවෘත ආලින්දයක් හා භූමියක් තිබේ. ගොඩනැගිල්ල ප්‍රවේශයට හා ගොඩනැගිල්ලෙන් පිටවීමට දොරටු හතරක් දැකිය හැකි ය. ගල් කණු ශේෂ අනුව උච්ඡාසනය වටේ විවෘත ප්‍රදේශයක් වූ අතර උච්ඡාසනය සඳහා ද වූ විශේෂ ආවරණයක් (උපරි ව්‍යුහයක්) දැවයෙන් පැවති බවට එහි ඉහළ ඇති ගල් කණුවල පාදම් ලක්‍ෂණවලින් සාක්ෂය දරයි.

ගොඩනැගිල්ල ස්ථානගත වී ඇති ස්ථානය සැළකිල්ලට ගැනීමේ ඉංග්‍රීසි යූ (U) හැඩයට සැලසුම් වී ඇති ආරාම සංකීර්ණයේ බොහෝමයක් පූජනීය අංගයන් ස්ථානගත වී ඇත්තේ ස්තූපයේ දකුණු හා අග්නිදිග ප්‍රදේශයේ ය. එයට හේතුව ආරාමයේ ව්‍යාප්තිය සඳහා අවකාශය ප්‍රමාණාතක්මක ව පැවතීම, ජනතාවට සම්බන්ධ වීමේ පහසුව ආදී කරුණු විය යුතු ය. මෙම පූජනීය කලාපයේ ගොඩනැගිලි අතර දැනට හඳුනාගත් පරිදි



පිළිම ගෙය, බෝධිඝරය, පොහොය ගෙය, සන්නිපාත ශාලාව (සභාශාලාව), ධර්මශාලාව ආදිය වේ. අප සඳහන් කරන මෙම ධර්මශාලාවට දකුණින් පැරණි ප්‍රථිමාඝරය වේ. නිරිත දෙසින් සංඝයාගේ විනය කටයුතු සඳහා වෙන්වූ පොහොය ගෙයයි. මේ අනුව ආසන්නයේ ම පවතින සෙසු ගොඩනැගිලි දෙක බුදුන් හා සඟුන් සඳහා වෙන් ව ඇති නිසා මෙම ගොඩනැගිල්ල ධර්මය සඳහා වෙන් වූ යයි සිතීමට අවකාශ තිබේ.

ගොඩනැගිල්ලේ ඉදිකිරීම සඳහා භාවිත කර ඇති පාෂාණ විශේෂය දෙස බැලීමේ දී මෙහි පාදම සඳහා භාවිත කර ඇත්තේ අනුරාධපුරයට ආවේණික නොවන උත්තර මලය රට්ඨයේ (දඹුල්ල හා නාවුල) ප්‍රදේශවල දැකගත හැකි හුණු ගල් විශේෂයක් වන චන්ද්‍රකාන්ත පාෂාණ (Crystalime Lime Stone) වේ. මෙම පාෂාණ වර්ගයේ භාවිතය අනුරාධපුර ස්මාරක ඇසුරින් අධ්‍යයනය කර බලන විට සුවිශේෂ පූජනීය ගොඩනැගිලි සඳහා භාවිත කර ඇති බව පෙනේ. අභයගිරි විහාරයේ පේසාව, වැලිකොන්ද හා එය පාමුල උච්චවේදිය සඳහා ද මෙම පාෂාණ භාවිත කර ඇත. එම විහාරයේ දළඳා ප්‍රදර්ශනය සඳහා භාවිත කරන ලදැයි සැළකෙන ජේතවනාරාමයේ ධර්ම ශාලාවට සමාන ගොඩනැගිල්ල සඳහා ද මහනෙත් ප්‍රසාද මූලය වශයෙන් හඳුන්වන කොටසේ ප්‍රධාන පංචාවාස ගොඩනැගිල්ලේ පසුපස වූ ගන්ධ කුටි හැඩයේ පිළිම ගෙය සඳහා ද ජේතවනාරාමයේ ගන්ධකුටි හැඩයේ පිළිම ගෙය සඳහා ද වෙස්සගිරියේ “බී” පර්වත මස්තකයේ ඇති පිළිම ගෙය සඳහා ද මෙම පාෂාණ භාවිත කර තිබීමෙන්මෙම පාෂාණ වර්ග පූජනීය වාස්තුවිද්‍යා අංග සඳහා භාවිත කළ විශේෂ පාෂාණ වර්ගයක් ලෙස හඳුනාගත හැකි ය.


මෙම පූජනීය ගොඩනැගිල්ල තුළ පෙර සඳහන් පරිදි ධර්ම ග්‍රන්ථය ප්‍රදර්ශනය සිදු වූයේ නම් එය ද සැළකිල්ලට ලක්විය යුතු ය. මහායාන ධර්මයට අනුව මෙවැනි උත්සවයක් ධර්ම ග්‍රන්ථය සජ්ජායනය ආදි සැණකෙළි ස්වරූපයෙන් සිදුවන බව වර්තමාන යේ එම දහම ඇදහීමට ලක්වන රටවල චාරිත්‍ර දෙස බැලීමෙන් පැහැදිලි වේ. එසේ හෙයින් සැණකෙළි ස්වරූපයෙන් ආගමික චාරිත්‍රයක් මහායාන ධර්මය පිළිගත් ජේතවනාරාමය වැනි ආරාමයක සිදුවීම විශ්මයට කරුණක් නොවේ. එසේ

බැලීමේ දී විවෘත ගොඩනැගිල්ලක් එහි මැද උච්චාසනයක් හා එම සුවිශේෂී උච්චාසනය සඳහා වූ වෙන ම වහලක් ආදිය සැළකීමේ දී මූලාශ්‍රයවල සඳහන් වන ජේතවනාරාමයේ උත්සවශ්‍රීයෙන් පැවැත්වූ ධර්ම ග්‍රන්ථ ප්‍රදර්ශනය සඳහා භාවිත වූ ගොඩනැගිල්ල මෙය බව විශ්වාස කළ හැකි අතර එය උපයෝගී කරගෙන මෙම ගොඩනැගිල්ල ධර්ම ශාලාව ලෙස හැඳිනගැනීම වඩාත් නිවැරදි වේ.


ජේතවන විහාරයේ ධර්මශාලාව කැනීම් සිදු කරන අවස්ථාවේ


ජේතවන විහාරයේ ධර්ම ශාලාව සංරක්‍ෂණයෙන් පසුව




ජේතවන විහාරයේ ධර්මශාලාවේ සැලසුම

## සන්නිපාත ශාලාව (සභාශාලාව)

බෞද්ධ ආරාමයක පූජනීය අංග යටතට ගැනෙන ගොඩනැගිලි අතර සන්නිපාත ශාලාව ද ඉතා වැදගත් වේ. ජේතවනාරාම විහාරයේ සන්නිපාත ශාලාව එසේත් නැතහොත් සභාශාලාව වශයෙන් හඳුන්වන ගොඩනැගිල්ල ස්තූපයට දකුණු පසින් බෝධිඝරයට ඊසාන දෙසින් හා පොහොය ගෙය හා ධර්ශාලාවට වයඹ දෙසින් පිහිටා ඇත. මෙම ගොඩනැගිල්ලේ දිග පළල මීටර් 22 × 20 වන අතර, සමචතුරස්‍රාකාර ස්වරූපයක් ගනී. සිව් දිසාවෙන් ඇතුළු විය හැකි දොරටු සතරකින් යුත් මෙම ගොඩනැගිල්ල පාෂාණවලින් කරන ලද කෙටි බිත්තියකින්

වට වී ඇත. ගොඩනැගිල්ල මැද මීටර් 4 × 3 ප්‍රමාණයේ කුඩා මණ්ඩපයක් දැකිය හැකි ය. බෙල් වාර්තාගත කරන ආකාරයට ඔහු මෙය පිළිම ගෙයක් ලෙස හඳුනාගෙන ඇත (*ASCAR*:1892). බෙල් විසින් මෙය පිළිම ගෙයක් වශයෙන් හඳුනාගැනීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ එහි මධ්‍යයේ ඇති ඉහත සඳහන් කළ මණ්ඩප කොටස වැනි කොටසක් නිසා විය හැකි බව උපකල්පනය කළ හැකි ය.

මහාවංසයට අනුව සන්නිපාත ශාලාවක් එසේත් නැතහොත් සභාශාලාවක් පිළිබඳ ව සඳහන් වන්නේ දේවානම්පියතිස්ස රාජ යුගයේදී ය. එම රාජ යුගයේ දී මිහිඳු මාහිමියන් විසින් මහා විහාරයේ පූජනීය අංග ස්ථානගත වීම දැක්වෙන විස්තරයෙහි පැනඹුමළුවට පැමිණි මිහිඳු හිමියන් එම ස්ථානය භික්ෂූන්ට ලැබෙන ලාභයක් බෙදා ගන්නා ස්ථානයක් වශයෙන් හඳුන්වා ඇත (මව,15:38 - 46). මෙම ස්ථානය ආශ්‍රිත කරගෙන මහා විහාරයේ සන්නිපාත ශාලාව බිහි වූ බව මේ අනුව පෙනේ. මෙයින් අපට වැදගත් වන්නේ ලංකාවේ පැරණි ම ආරාමය වන මහා විහාරය තුළ එහි සැලැස්මේ විශේෂිත ගොඩනැගිල්ලක් ලෙස සන්නිපාත ශාලාව හඳුන්වා ඇති බව ය.


සද්ධර්මරත්නාකරයට අනුව මහා විහාරයේ සන්නිපාත ශාලාව වන රංසිමාලකය දුටුගැමුණු රජතුමාගේ නිර්මාණයක් වේ. දුටුගැමුණු මහ රජ රංසිමාලකය ස්ථානයෙහි ලහබත් ගෙය කරවමින් පහත් භූමි ස්ථානයෙහි රත්න ප්‍රාසාදය කරවමින් මෙසේ මහමෙව්නා උයනෙහි මහා විහාරය සිංහ වික්‍රාන්තියෙන් කරවීය යනුවෙන් දක්වා තිබේ (සර,358) සිංහ වික්‍රාන්තියට අනුව රංසිමාලකය සිංහයාගේ වමෝදර පාර්ශවයෙහි දැකගත හැකි ය. මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව ද එහි ආරාම ප්‍රභේද අතර සිංහ වික්‍රාන්ත සැලැස්ම ඇත (මවාවිශාඃ02). මේ පිළිබඳ අදහස් දක්වා ඇති වොල්ටර් මාරසිංහ මහා විහාරයේ මෙම ගොඩනැගිලි ඉදිකිරීමේ කිසියම් සැලැස්මකට අනුව නොවන බවත් එහි එම ගොඩනැගිලි පිහිටා ඇති ආකාරය මෙම ග්‍රන්ථයේ විස්තර වන සිංහ වික්‍රාන්ත සැලැස්මට බොහෝ දුරට සමාන වීම අහඹු සිදු වීමක් බව ද දක්වා තිබේ (මාරසිංහ,1989:14).



කෙසේ වෙතත් මහා විහාරයක මූලික අංග අතර සන්නිපාත ශාලාව කැපීපෙනෙන ගෘහාංගයක් බව මේ අනුව පෙනේ. අභයගරි විහාරයේ ද සන්නිපාත ශාලාවක් දැකගත හැකි ය. මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය යන මහා විහාරවල සන්නිපාත ශාලාවන්හි වාස්තුවිද්‍යාත්මක අංග එක සමාන වේ. චන්ද්‍රා වික්‍රමග මගේ ප්‍රකාශ කර ඇති මතය අනුව මහා විහාරයේ රංසිමාලකයේ මතුපිට ගොඩනැගිලි අවශේෂ පහලොස් වැනි සියවසට අයත් බව පැවසේ (වික්‍රමගමගේ,1995:14). මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය යන විහාරවල සැලසුම අධ්‍යයනයේ දී පැහැදිලි ව පෙනෙන කරුණක් නම් මෙම සභාශාලාව (සන්නිපාතශාලාව) එහි ප්‍රධාන ස්තූපයට දකුණින් පිහිටන බව ය. බොහෝ විට ආරාම භූමියේ හරිමැදින් ඉදිවුණු සභාශාලාව පළලින් ප්‍රසාදය හා සම විය. එය ආයත චතුරස්‍රාකාර වූ අතර එහි දිග පළල මෙන් දෙගුණයක් හෝ තුන් ගුණයක් විය. වහල මැදින් කූඨාකාර එකක් තුනක් හෝ සතරක් විය. සන්නිපාත ශාලාවේ දීර්ඝ පාර්ශවය දිගේ බිත්ති දෙකකින් හෝ තුනකින් යුක්ත වූ මණ්ඩපයක් ඉදිවිය. සභාශාලාවේ ඉදිරිපස හා පසුපස පිළිවෙලින් ලලාටබද්‍රයකින් හා භද්‍රයකින් ශෝභාව විය. යමෙක් ප්‍රධාන දොරටුවෙන් පිටවූ විට, අඩිය තබනුයේ ද්විමුඛයකින් අලංකෘත වූ බරාදයකට ය. බිත්ති සතර සෘජුකෝණී ව විහිදුණ අතර, ප්‍රධාන දොරටුවෙන් හා කුඩා දොරටුවෙන් ඒවා දෙතැනකින් බිඳී ගියේ ය. යන්න මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ සඳහන් වේ (මවාවිශා,47-49). මේ ආකාරයේ වාස්තුවිද්‍යා ලක්ෂණ ජේතවනාරාමයේ සන්නිපාත ශාලාව ඇසුරෙන් ද හඳුනාගත හැකි වීම කැපීපෙනෙන අතර ආරාමයක ඉතා වැදගත් අංගයක් ලෙස මෙය හැඳින්විය හැකි ය.



ජේතවන විහාරයේ සන්නිපාත ශාලාව



ජේතවන විහාරයේ සන්නිපාත ශාලාවේ සැලසුම



## නේවාසික වාස්තුවිද්‍යා අංග

ජේතවාරාම පුරාණ විහාරයේ වාස්තුවිද්‍යා නිර්මාණ අතර පූජනීය නොවන වාස්තුවිද්‍යා නිර්මාණ අතරට

1. දානශාලාව
2. නේවාසික කුටි
3. පොකුණු හා ළිං
4. කැසිකිළි වැසිකිළි හා ජන්තාඝර ආදිය ඇතුළත් වේ.

## දානශාලාව

භික්ෂූන් වහන්සේලා වැඩවාසය කරන ආවාසයන්හි උන්වහන්සේලාගේ පහසුව සඳහා පැවති ගොඩනැගිලි අතර දානශාලාවට ප්‍රධාන තැනක් හිමි වී ඇත. **බත්ත ශාලා, බත්ගේ** ආදී නම්වලින් හැඳින්වෙන දානශාලාව බුදුන් වහන්සේ ජීවමාන ව වැඩ සිටි කාලයේ පටන් ම ආරාමයන්හි තිබූ අංගයක් බවට ද පරාජිකා පාලියේ ද චුල්ලවග්ග නම් වූ විනය ග්‍රන්ථයේ ද සඳහන් වේ (කුලතුංග,2001:44). ශ්‍රී ලංකාවේ බෞද්ධාගම ප්‍රතිෂ්ඨාපනය වීමත් සමඟම ආරාම තුළ සුවිශේෂ අංගයක් ලෙස දානශාලාව කැපීපෙනේ. ශ්‍රී ලංකාවේ මුල් ම දානශාලාව පිළිබඳ තොරතුරු අපට දැකගත හැක්කේ දේවානම්පියතිස්ස රාජ යුගයේදී ය. දේවානම්පියතිස්ස රජු විසින් ක්‍රි.පූ. තුන් වැනි සියවසේ දී මහමෙව්නා උයන මිහිඳු මහ රහතන් වහන්සේට පූජා කිරීමෙන් අනතුරු ව එම උයනේ මෙරට ප්‍රථම ආරාමය වූ තිස්සාරාමය (පසු ව මහා විහාරය) කේන්ද්‍රගත කරමින් දානශාලාව බිහි විය. මහාවංසයේ මහා විහාරයේ දානශාලාව පිහිටන තැන ගැන මිහිඳු හිමියන් උපදෙස් ලබා දී ඇත (මව,15:49 - 50).

මින් පසු ලංකාවේ බිහිවන මහා විහාර සම්ප්‍රදායේ විහාර වන අභයගිරිය, ජේතවනය, මිරිසවැටිය හා දක්ෂිණ විහාරය ආදී සෑම විහාරයක ම මෙම දානශාලා දැකගත හැකි ය. ජේතවනාරාමයේ පිහිටි දානශාලාව මහා විහාරයේ හා අභයගිරි විහාරයේ දානශාලාව තරම් විශාල නොවුව ද සැලසුම

අතින් එය මහා විහාර දානශාලාවට සමානකමක් දක්වයි. ජේතවනාරාම දානශාලාවේ දිග මීටර් 17 සෙ.මී. 8 හා පළල මීටර් 12 සෙ.මී. 6 ක් වේ. එය පිහිටා ඇත්තේ ජේතවන ස්තූපයට නැගෙනහිර දිශාවේ පංචාවාස ගොඩනැගිලි අතර ය. අනුරාධපුර වෙනත් විහාරවල දානශාලාව මධ්‍යයේ දක්නට ඇති ගල් ඇතිරුම පොළව තුළට කිදා බැස ඇතත් ජේතවන දානශාලාව මධ්‍යයේ ඇති ගල් ඇතිරුම පොළොව මට්ටමින් තරමක් ඉහළට ඉදි කර තිබේ. ආයත චතුරස්‍රාකාර වූ මෙම දානශාලාවේ වහළය දරා තිබෙන්නට ඇති ගල් කණු 84 ක් තිබූ බවට සාධක දැකගත හැකි ය. දානශාලාවේ බටහිර පැත්තේ මැද ප්‍රධාන දොරටුවක් හා ඒ දෙපසින් කුඩා දොරටු දෙකක් දක්නට ලැබේ. එහි ප්‍රධාන දොරටුව මීටර් 2 සෙ.මී. 5 ක පළලින් යුක්ත වන අතර, උප දොරටුවල පළල මීටර් 1 සෙ.මී. 25 පමණ වේ. මෙසේ වෙන වෙන ම දොරටු පිහිටා තිබෙන්නට ඇත්තේ දානශාලාවට පෙළට පැමිණෙන භික්ෂූන් වහන්සේලාට බාධාවකින් තොර ව වෙන වෙන ම ඇතුළුවීමට හා පිටවීමට විය යුතු ය (කුලතුංග,2001:47). බෙල් විසින් ද ජේතවන විහාරයේ දානශාලාවේ තොරතුරු වාර්තා කර ඇත (*ASCAR*:1892). එසේ ම දානශාලාවේ පිටුපස කොටසේ දානශාලාවේ අපද්‍රව්‍යය බැහැර වූ ඉතා විධිමත් කානු පද්ධතියක් ද දැකගත හැකි ය.

මහා විහාරය, අභයගිරිය, මිහින්තලය, මිරිසවැටිය හා මහාපාලි දානශාලාවල දැකගත හැකි ආකාරයේ සෙල්මුවා ඔරු (බත්තනාවා) ජේතවනාරාම විහාර දානශාලාවේ නැගෙනහිර පස දැකගත හැකි ය. දිගින් මීටර් 11 ක් වන එහි විශාල බත් ඔරුව හා දිගින් මීටර් 2 සෙ.මී. 5 ක් වන කුඩා කැඳ ඔරුව වශයෙන් මෙම ශිලා ඔරු දෙක කාර්යයන් දෙකක් සඳහා භාවිතයට ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. ජේතවනරාරාමයේ දානශාලාවේ ඇති විශාල ගල් ඔරුවේ ප්‍රමාණය පිළිබඳ ව පර්යේෂණයක් කළ රෝලන්ඩ් සිල්වා එය දළ වශයෙන් ඝණ අඟල් 377000 ක පරිමාවකින් යුක්ත බව ද ඒ අනුව අනුරාධපුර යුගයේ භික්ෂූන් වහන්සේලා භාවිත කළ පාත්‍රාවල ප්‍රමාණය අනුව භික්ෂූන් 3100 කට මෙම දානශාලාවෙන් දානය ලබාගත හැකි බවත් බත් නැව (බත්තනාවා) පිළිබඳ ලිපියක සඳහන් කර තිබේ (කුලතුංග, 2001:48). ක්‍රිස්තු වර්ෂ පස් වැනි




සියවසේ අනුරාධපුරයේ වැඩසිටි ෆාහියන් හිමි මහා විහාරය හා අභයගිරියේ වැඩවාසය කළ භික්ෂූන් සංඛ්‍යාව දක්වා ඇතත් ජේතවනය පිළිබඳ එවැන්නක් දක්වා නැත (එම:48).

ජේතවන දානශාලාවේ භාවිතයට ගන්නට ඇති ඇඹරුම් ගලක් එහි උතුරු දෙසින් පිහිටා ඇත. දානශාලාවේ දකුණු දෙසින් දානශාලාවට සම්බන්ධ වඩා උස මට්ටමකින් යුත් ගොඩනැගිල්ලක් දක්නට ඇත. බෙල් විසින් මෙය ජන්තාඝරයක් ලෙස හඳුන්වා ඇත (*ASCAR*:1892). නමුත් සේනක බණ්ඩාරණායකගේ මතය වන්නේ මෙය දානශාලාවේ මුළුතැන්ගෙය බව ය (Bandaranayake: 1974). දානශාලාව සම්බන්ධ ව මුළුතැන්ගෙවල් තිබූ බව අභයගිරි විහාරයේ දානශාලාවේ ඇති මුළුතැන්ගෙය අනුව ද පෙනේ. එසේ ම පරාජිකා පාලියේ එන පුවතක් අනුව වරෙක භික්ෂුවක් දානශාලාවේ අසුන් ගැනීමේ දී මෝල් ගස් දෙකක් අයිනක තබා එකක් ගැනීමේ දී අනෙක පෙරළී දරුවකුගේ හිසමත වැටී මියගිය පුවතක් ද වංගෙඩියක් පෙරළීමක් පිළිබඳ පුවතක් ද සඳහන් වී තිබේ (කුලතුංග,2001:46). මේ අනුව පුරාණ විහාරයන්හි පැවති දානශාලා පිළිබඳ ව හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව ද මූලාශ්‍රයන්හි තොරතුරු සඳහන්වී තිබේ.

ජේතවන විහාරයේ පැවති දානශාලාව පිළිබඳ ව තොරතුරු මූලාශ්‍රයන්හි ද සඳහන් වේ. මහාවංසයේ සඳහනකට අනුව කාශ්‍යප රජු (ක්‍රි.ව. 915 - 924). ජේතවන විහාරයේ දන්හලට ගමක් පූජාකර ඇත (මව,51:58). ඒ අනුව එම ගමින් ලැබුණ ධාන්‍ය හෝ මුදල් ජේතවන විහාරයේ දානශාලාවේ කටයුතු සඳහා භාවිත කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.



ජේතවන විහාරයේ දානශාලාව



ජේතවන විහාරයේ දානශාලාවේ සැලසුම



## නේවාසික කුටි

අනුරාධපුර පැරණි විහාරාරාම ආශ්‍රයෙන් ජීවත් වූ භික්ෂූන් සඳහා වූ නේවාසික අංග ද සුවිශේෂී නිර්මාණ ලෙස ඉදිකර තිබේ. අනුරාධපුර පාලන අවධියේ දී මහා විහාර සම්ප්‍රදායේ ආරාමයන්හි ද එම සම්ප්‍රදාය පිළිගත් දිවයිනේ වෙනත් ස්ථානයන්හි ද පැවති කුඩා ප්‍රමාණයේ සමහර ආරාමයන්හි ද ආවාස ඉදිකිරීමේ විශේෂ ක්‍රමයක් වූ බව පෙනේ. එනම් චතුරස්‍රාකාර සීමා ප්‍රාකාරයකින් වටවූ බිම්කඩක් ඇතුළත මධ්‍ය ප්‍රධාන ගොඩනැගිල්ලක් හා එහි සතර කොනේ සමසතරැස් පරිවාර ගොඩනැගිලි හතරකින් යුක්ත වූ සැලැස්මක් සහිත ගොඩනැගිලි දැකගත හැකි ය. මෙම ගොඩනැගිලිවලට පිවිසීම සඳහා දොරටු හෝ දොරටු මණ්ඩප තිබෙන අතර සමහර අවස්ථාවලදී අභ්‍යන්තරයේ ජන්තාඝරයක්, පොකුණක්, වැසිකිළි, කැසිකිළි ආදිය ද වේ. මෙම ක්‍රමයේ ගොඩනැගිලි ඒකකයක් විද්වතුන් විසින් විවිධ නම්වලින් හඳුන්වා ඇත (කුලතුංග,1999:67). සෙනරත් පරණවිතාන, එච්.සී.පී. බෙල්, සේනක බණ්ඩාරණායක, චන්ද්‍රා වික්‍රමගමගේ, එස්.බී. හෙට්ටිආරච්චි, ටී.ජී. කුලතුංග ආදී වියතුන් මෙම ගොඩනැගිලි ඒකකය **පාංචාවාස, පංචායතන, පංචකාවාස, ප්‍රාසාද, පිරිවෙණ** යනුවෙන් හඳුන්වා ඇත.

එච්.සී.පී. බෙල් විස්තර කර ඇති ආකාරයට ඉහත කී ගොඩනැගිලි පහකින් යුත් ඒකකය **පංචායතනය** යනුවෙන් නම්කර තිබේ (*ASCAR*:1894). සේනක බණ්ඩාරණායක මෙම ගොඩනැගිලි ඒකකය **පංචායතන** වශයෙන් හඳුන්වා තිබේ (Bandaranayake:1974:278). පරණවිතානගේ මතය වන්නේ ලංකාවේ ශිලාලිපිවල මෙම ගොඩනැගිලි **පචමහා ආවාස** යනුවෙන් සඳහන් කර තිබෙන බව ය. එය පාලි භාෂාවෙන් **පංචමා ආවාස** යනුවෙන් ව්‍යවහාර වී පසු ව **පංචාවාස** යන ව්‍යවහරය සිදු වන්නට ඇතැයි ද ඔහු පෙන්වා දී තිබේ (*Ez*,Vol. IV:283-284). චන්ද්‍රා වික්‍රමගමගේ විසින් ද මෙම ගොඩනැගිලි **පංචාවාස, පංචකාවාස** යන නම්වලින් හඳුන්වා ඇත. (වික්‍රමග මගේ 1992:50). එස්.බී. හෙට්ටිආරච්චිගේ අදහස වන්නේ මේවා **පඤ්චාවාස** යනුවෙන් හැඳින්විය යුතු බව යි. මේ පිළිබඳ අදහස්

දක්වන කුලතුංග **පඤ්චාවාස** යන වචනය කිසිම පැරණි මූලාශ්‍රයක දක්නට නොලැබෙන බව ගොඩනැගිලි සමූහය දෙස බලා මෙම වචනය නිපදවා ගෙන ඇති බැවින් එය තත් ආරාම විශේෂයට නොගැළපෙන නමක් බවත් ප්‍රකාශ කර තිබේ (කුලතුංග,1999:67) එහිදී **පඤ්චක ආවාස** යනුවෙන් වචනයක් සෑදෙන්නේ දැයි සැකයක් තිබේ. **ආවාස පඤ්චකය** යනුවෙන් භාවිත කර ඇත්තේ **පංචාවාස** යන වචනය වෙනුවට බැවින් මෙහි දී අප සැළකිල්ලට ගත යුත්තේ **පඤ්චායතන** හා **පඤ්චාවාස** යන වචන දෙක මෙම ආරාම විශේෂය හැඳින්වීමට කොතෙක් දුරට ගැළපේ ද යන්න ය (එම).

මෙම ගොඩනැගිලි ඒකකය පිළිබඳ ව වැඩිදුරටත් අදහස් දක්වා ඇති කුලතුංග ශිලාලිපිවල **පංච මහා ආවාස** යනුවෙන් දක්වා ඇත්තේ මෙම ගොඩනැගිලි පහකින් යුක්ත ආවාස ඒකක නොවන බව පෙන්වාදී තිබේ. ශිලාලිපිවල එම වචනය යෙදී ඇති සැටි පිරික්සීමේ දී අනුරාධපුර ජේතවනාරාම භූමියෙන් හමු වූ ශිලාලිපියකට අනුව **පංච මහා ආවාසයන්හි** භික්ෂූන්ගේ විනය සම්බන්ධ උපදෙස් දීම පිළිබඳ සඳහනෙහි ඒවා **භික්ෂු ආරාම** හෝ **පඤ්චාවාස** වශයෙන් හඳුන්වන ගොඩනැගිලි ඒකක නොව අනුරාධපුරයේ පැවති මහා විහාරයන් පිළිබඳ ව සඳහනක් බව කුලතුංගගේ මතයයි (එම). අනුරාධපුර යුගයේ මහා ආවාස පහක් ප්‍රචලිත ව තිබූ අතර සද්ධර්මාලංකාරයේ මහා විහාරය, අභයගිරිය, ජේතවනය, මිරිසවැටිය, දක්ෂිණ ගිරිය පඤ්ච මහා ආවාස ලෙස දක්වා තිබේ. නිකාය සංග්‍රහයේ සඳහන් ව ඇත්තේ **"සංඝමිත්‍ර පඤ්ච මහා විහාර වාසීන් වෛතුල්‍යවාදය ගැන්විය නොහී මහසෙන් රජු කරා එළඹ නොයෙක් ලෙස කරුණු කියා''** යන පාඨය පමණි. මේ අනුව ථූපාරාමය ඇතුළත් ව මහා විහාරය, අභයගිරිය, ජේතවනය, දක්ෂිණ විහාරය, මිරිසවැටිය හෝ චේතිය පබ්බත විහාරය මෙම මහා ආවාස වශයෙන් සළකන්නට ඇති බව කුලතුංග පෙන්වාදී තිබෙන අතර ඒවා මහා විහාර මිස ආවාස වශයෙන් සළකන්නට ඇති බව ප්‍රකාශ කර ඇත. කුලතුංග වැඩැදුරටත් පෙන්වාදෙන ආකාරයට ඒවා මහා විහාර මිස ආවාස පහකින් යුක්ත ගොඩනැගිලි ඒකක නොවන බව ද පැහැදිලි කර තිබේ (එම:68). ඒ අනුව මෙම ගොඩනැගිලි ඒකකවලට **පංචායතන, පඤ්චාවාස** යන නම් භාවිතයට සුදුසු නොවන බවත් ඒ සඳහා වඩා සුදුසු වන්නේ පැරණි මූලාශ්‍රයවල සඳහන් වන **පරිවෙණ, ආවාසය** හෝ **ප්‍රසාදය** යන වචනය බව කුලතුංග පෙන්වාදී තිබේ (එම:69-70).



ඉහත විස්තර කරන ලද ගොඩනැගිලි ඒකක ජේතවන විහාරයේ ද දැකගත හැකි වේ. ස්තූපය පිහිටන කේද්‍රීය භූමියට පිටතින් ඇති විවෘත භූමියට අනතුරු ව දැකගත හැකි අංගනය තුළ බටහිර, දකුණු, නැගෙනහිර හා උතුරු දිශාණුගත ව ජේතවන විහාරයේ මෙම **පඤ්චාවාස, පඤ්චායතන** හෝ **පිරිවෙණ්, ප්‍රාසාද** යන ගොඩනැගිලි දැකගත හැකි ය. දැනට සිදු කර ඇති කැනීම්වලට අනුව ජේතවන විහාරයේ මෙම ගොඩනැගිලි ඒකක 16 ක් පමණ හඳුනාගෙන තිබෙන අතර මෙයට වඩා වැඩි ගොඩනැගිලි සංඛ්‍යාවක් තිබෙන බව විහාරයට දකුණු පසින් වන ජනාවාස ප්‍රදේශයේ සිදුකර ඇති මූලික ගවේෂණවල දී පැහැදිලි වී තිබේ.

මූලශ්‍රය අධ්‍යයනය කිරීමේ දී ජේතවන විහාරය සඳහා විවිධ රජ දරුවන් විසින් සිදුකර ඇති ප්‍රදාන අතර පිරිවෙණ් පිළිබඳ සඳහන් තොරතුරු දක්නට ඇත. මේ අතරින් ජේතවනාරාම විහාරයේ වූ **රත්න මහා පිරිවෙණ** ගැන ශිලාලිපියක සඳහන් වේ (*Ez*,Vol.IV:282). මහාවංසයේ සඳහනකට අනුව ක්‍රි.ව. (835 - 853) රජ වූ පළමු වැනි සේන විසින් මහා පිරිවෙණේ ගින්නේ දැවීගිය ගොඩනැගිලි අළුත්වැඩියා කර ප්‍රාකාරයක් ඉදිකළ බව සඳහන් වේ (*Mv*,50:65 - 67). එසේ ම ඔහුගේ ඇමතියෝ සතර දෙනෙක් ජේතවන විහාරයේ **පිරිවෙණ් සතරක්** කරවූ බව ද සඳහන් වේ (මව,53:48-50). එසේ ම (ක්‍රි.ව. 608 - 618) කාලයේ රජ පැමිණි දෙ වැනි අග්බෝ රජු ජේතවන විහාරයේ **රජහුගේ නමැති පිරිවෙණ** ඉදි කර ඇත (මව,44:16 - 22). ක්‍රි.ව. 898 - 914 රජ වූ හතර වැනි කස්සප රජු **සේනාසන නමින් පිරිවෙණක්** ඉදිකළ බව සඳහන් වේ (මව,51:17 - 18). හතර වැනි දප්පුල රජතුමාගේ ඇටවීරගොල්ලෑව සෙල්ලිපියේ සඳහන් ආකාරයට **'සිරිසඟබෝ' නමින් යුත් පිරිවෙණ** සඳහා වෙලන්ගම පූජාකර ඇත (*Ez*,Vol.II:45-46). කුලතුංගගේ අදහස් අනුව මූලාශ්‍රයන්හි **පිරිවෙණ** හො **පරිවෙණ** යනුවෙන් හඳුන්වනු ලබන්නේ භික්ෂූන්

වහන්සේලා වැඩසිටි නේවාසික ස්ථාන බව පැහැදිලි කර ඇති බැවින් මූලාශ්‍රයන්හි ජේතවන විහාරයේ පිරිවෙණ් වශයෙන් සඳහන් වනුයේ නේවාසික කුටි බව පිළිගත හැකි ය. නමුත් මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රයේ පංචාවාස විහාර වශයෙන් හඳුන්වා ඇත්තේ පබ්බතාරාම විහාර වේ (මාරසිංහ,1993:12). එහි පංචාවාස නමින් හැඳින්වෙන ප්‍රධාන ගොඩනැගිලි පහෙන් හතරක් වන **ප්‍රාසාදය, ප්‍රතිමාලය, බෝධිවේශ්මය, සභාශාලාව පිළිබඳ** විස්තරාත්මක තොරතුරු සපයා ඇත (එම).


මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය, මිරිසවැටිය ආදී ස්ථානවල ඇති මෙම ඒකක පහකින් සමන්විත ගොඩනැගිලි ඒකකයන්හි උපයෝගීතාවය ද විමසා බැලීම වැදගත් වේ. මහා විහාර සැලසුම් ආරේ ලැගුම් ගෙවල් සුවිශේෂිත ය. දොරටු පාලක කුටියක් හා කුඩා වූ දොරටුවක් ඇති මාලක හෙවත් අංගනවල ඒවා ගොනු වී ඇත. ඇතුල් ලැගුම්ගේ අංගනය හා පිට පොදු ජන අංගනය යනුවෙන් ඇතුල් බිම කොටස් දෙකකට බෙදිණ. ඇතුල් අංගනය භික්ෂූන් වහන්සේලාට වෙන් වූ කොටස ය. මෙම ලැගුම්ගෙවල්වලට ඒකක පහක් අයත් විය. මැද මහල් සහිත ලැගුම්ගෙයි නායක ස්ථවිරයන් වහන්සේ ලැගුම් ගත්හ. බිම් මහල ඉගැන්වීම් ආදී කටයුතුවලට යොදා ගන්නා ලදි. ඇතැම් අවස්ථාවල මේ ලැගුම්ගෙවල්හි මැදට වන්නට ස්ථානගත කර පුද්ගලික බුදු කුටියක් විය හැකි ගෘහාංගයක් ද විය. පියගැටය පෙළකින් ළඟාවිය යුතු ඉහළ මාලය පොත්ගුල හා ආගමික වූ වෙනත් භාණ්ඩ තැන්පත් කරන ලද කොටස විය හැකි බව උගතුන්ගේ පිළිගැනීම වේ. බිම් මහල නායක ස්ථවිරයන් වහන්සේ විසින් තමන් වහන්සේගේ සාලය ලෙස පාවිච්චි කරන්නට ඇත (සිල්වා,1998:303).

ඇතුල් අංගනයේ සිව් කොණෙහි පිහිටි පරිවාර ඒකක හතරේ බිම් මහලේ භික්ෂුන් වහන්සේලා තෙනමක් ද උඩු මහලේ තවත් තෙනමක් ද ලැගුම් ගන්නට ඇත. මේ අනුව ඒකක හතරේ නායක හිමි විසින් අධ්‍යාපනය දෙනු ලැබුවා වූ භික්ෂූන් වහන්සේලා 24 නමක් පිරිවෙණ් ඒකකයක් තුළ සිටින්නට ඇත. වැසිකිළි හා කැසිකිළි ගෙවල් සාමාන්‍යයෙන් ඇතුල් අංගනයේ පිට බිත්ති අයිනේ හෝ ඇතුල් අංගනයෙන් පිවිසිය හැකි පරිදි



පිට බිත්තියට ඉතා කිට්ටුවෙන් ඉදි කර තිබිණ. ඉදිරිපසින් පිට අංගනයේ සිට ලැගුම්ගේ ඇතුළට එක එල්ලේ ම යොමු වුණ පෙත් මගකි (එම). මේ අනුව ඇතුළ හා පිට අංගනවලින් හෙබි නායක ස්ථිවිරයන් වහන්සේ පරිපාලන නායකත්වය ඉසිලූ සමස්ථ ලැගුම්ගේ ස්වයං සම්පූර්ණ සංකීර්ණයක් විය (එම:304).

මේ අනුව **පංචාවාස** වශයෙන් හෝ **පිරිවෙණ්** වශයෙන් හඳුන්වන ලද ගොඩනැගිලි ඒකක ඉතා පැහැදිලි ලෙස නේවාසික අංග අතරට ගැනෙන අතර එසේ වුව ද ජේතවනයේ හා අභයගිරියේ සමහර පරිවාර කුටි තුළ හා ප්‍රධාන කුටිය තුළ ගර්භපත්‍ර (යන්ත්‍රගල) හා පිළිම පාදම් තිබීමෙන් සමහර ගොඩනැගිලි පිළිම ගෙවල් ලෙස ද භාවිත වූ බව පෙන්වාදිය හැකි ය. කෙසේ වෙතත් රෝලන්ඩ් සිල්වා ඉදිරිපත් කරන ආකාරයට මෙම ගොඩනැගිලි ඒකක මහල්වලින් යුක්ත බව පිළිගත හැකි ය. විශේෂයෙන් ම ජේතවන විහාරය තුළ සිදුකරන ලද කැනීම්වලදී මේ ගොඩනැගිලි වටා වැටී තැන්පත් ව තිබෙන අළු හා අඟුරු ද උළු කොටස් ද තඹ ඇණ ද සළකා බලන විට යම් කාලයක දී උඩු මහල් තිබූ බව හා ඉහළ මහලට නැගීමට තරප්පු පෙළ රැඳවූ ගල් පාදම දක්නට ලැබීමෙන් මේ බව මැනවින් පැහැදිලි වේ. එසේ ම මෙම ගොඩනැගිලි ඒකක සමහරක් සඳහා ගොඩනැගිලි තුනක් එක් කරමින් අර්ධ පංචායතන සැලසුම් ජේතවන විහාරයේ තිබූ බව සේනක බණ්ඩාරණායක ද පෙන්වා දී ඇත (Bandaranayake: 1974: 84).





පංචායතන සැලසුම හා ඡායාරූපය





## 4.4 ජේතවන විහාරයේ සනීපාරක්ෂක කටයුතු :-

මූලාශ්‍රයගත තොරතුරුවල සඳහන් වන ආකාරයට ක්‍රි.පූ. තුන් වැනි සියවසේ දී ඉන්දියාවේ ශ්‍රේෂ්ඨතම නරපතියෙකු වූ අශෝක අධිරාජ්‍යාගේ පුත් මහින්ද මහරහතන් වහන්සේ මෙරටට වැඩම කිරීම සමඟ ලක්දිව බුදු සමය මුල්බැස ගැනීම සිදු වේ. දෙවනපෑතිස් රජු දවස මිහිඳු මහ රහතන් වහන්සේට තිස්සාරාමය පූජාකිරීම සමඟ මෙරට බෞද්ධ ආරාම බිහිවන අතර (තිස්සාරාමය පසුව මහා විහාරය බවට පත් වේ) ඉන් පසු යුගවලදී තවත් බෞද්ධ ආරාම බිහි වේ. ඒ අතර ක්‍රි.පූ. පළමු වැනි සියවස වළගම්බා රජු දවස අභයගිරි විහාරය ද ක්‍රි.ව. තුන් වැනි සියවස මහසෙන් රජු දවස ජේතවන විහාරය ද බිහිවන්නේ මහා විහාර සම්ප්‍රදායේ තවත් විහාර දෙකක් ලෙසිනි. ක්‍රි.ව. පස් වැනි සියවසින් අනතුරු ව උක්ත විහාර සම්ප්‍රදායට වෙනත් ආරක්ගත් පබ්බත ආරාම නමින් යුත් පන්කුලිය, පුලියන්කුලම, පාචිනතිස්සපබ්බත, අශෝකාරාමය, වෙස්සගිරිය ආදි ආරාම බිහිවන අතර ක්‍රි.ව. හය වැනි සියවසින් අනතුරු ව පශ්චිමාරාම නමින් යුත් පධානඝර සම්ප්‍රදායේ බෞද්ධ ආරාම අනුරාධපුරය ඇසුරින් බිහිවීම දැකගත හැකි ය. මේ සියලු ම ආරාම වර්ග අනුරාධපුර රාජධානිය අවසානය දක්වා ම විවිධ

රජ දරුවන් යටතේ සංවර්ධනයට ලක්වී ඇති අතර, එම විහාරවල භාවිත සනීපාරක්ෂක කටයුතු පිළිබඳව විමර්ශනයක් මෙම මඟින් ඉදිරිපත් කෙරේ.


අනුරාධපුර පැරණි ආරාම සඳහා බොහෝ විට ජලය ලබාගෙන ඇත්තේ පොකුණු ඉදකර ඒවාට ජලය රැස්කිරීමෙනි. වියළි දේශගුණයක් පවතින අනුරාධපුර ප්‍රදේශයේ ජලය රැස්කර ගෙන දිගු කලක් තබාගත නොහැකි අතර ජලය දිගු කලක් පොකුණ තුළ රඳවා ගැනීම උදෙසා නළ මාර්ග යොදා ගනිමින් පොකුණු වැව්වලට සම්බන්ධ කර තිබේ. විශේෂයෙන් ම අභයගිරි විහාරයේ ඇති දැවැන්ත පොකුණු වන **ඇත් පොකුණ** හා තවත් විශාල පොකුණක් වන **කුට්ටම් පොකුණ** සඳහා ජලය රැස්කිරීමට එම පොකුණ ආසන්නයේ ම ඇති වැව්වලට සම්බන්ධ කර තිබේ. පුරාවිද්‍යා කැනීම් මඟින් අනාවරණය කරගෙන තිබෙන දත්ත අනුව මේ විශාල පොකුණු ඔස්සේ කුඩා පොකුණුවලට ජලය බෙදා හැර තිබේ. පරිභෝජන අවශ්‍යත සඳහා ජලය වැව්වලින් ලබාගැනීමේ දී වැවෙන් පැමිණෙන ජලය පොකුණු තුළට මුදාහැර ඇත්තේ යම් සනීපාරක්ෂක ක්‍රමයක් යටතේ ය. ඇත් පොකුණ හා කුට්ටම් පොකුණ යන පොකුණු දෙක තුළ ම පොකුණේ පසෙකින් පිරිපහදුවක් ඉදිකර තිබේ. මෙම පිරිපහදුව නිසා වැව්වල සිට පැමිණෙන ජලය තුළ වන අපද්‍රව්‍යය හා රොන්මඩ පිරිපහදුව තුළ තැන්පත් වී අපවිත්‍ර ජලය පෙරී පොකුණ තුළට යාමට සළස්වා ඇත. එසේ ම පොකුණ තුළ එකතු වන අපද්‍රව්‍යය හා රොන්මඩ සහිත ජලය පිටකිරීම සඳහා පොකුණ පතුලේ භූගත නළ මාර්ගවලට සම්බන්ධ විවර තිබෙන බව කුට්ටම් පොකුණ තුළ හා රන්මසු උයන තුළ ඇති පොකුණු තුළින් අනාවරණය වීම අනුව පැරැණ්නන් විසින් සනීපාරක්ෂක කටයුතු සඳහා දක්වා ඇති උනන්දුව පැහැදිලි වේ.

ජේතවනාරාමයේ පොකුණු හෝ ළිං සඳහා ජලය රැගෙන යාමේ දී බහුල වශයෙන් භාවිත කර ඇත්තේ මැටි නළ වේ. මේ මැටි නළ ජල නළ භාවිතය මඟින් ද ජලය යම් පිරිසිදු වීමකට ලක්වී ඇති බව කිව යුතු ය. ජලයේ ඇති විවිධ රසායනික ද්‍රව්‍යය (විශේෂයෙන් ම මිනිස් සිරුරට අහිතකර කැල්සියම් කාබනේට්) මැටි නළ තුළට උරා ගැනීම මගින් එක්තරා ආකාරයක පිරිපහසු



වීමක් (Filter) සිදුවීම පිළිගත හැකි තත්ත්වයකි. ඒ අනුව පැරණ්නන් ආරාමවල ජල පරිභෝජනයේ දී එය යම් සනීපාරක්ෂක ක්‍රමයක් යටතේ භාවිතයට ගත් බව මේ අනුව පෙන්වාදිය හැකි ය. ජේතවනාරාමයේ ළිං හා පොකුණු කිහිපයකට ම මේ ආකාරයට ජලය නළ මාර්ගවලින් රැගෙන විත් ඇති බව පර්යේෂණවලදී සනාථ කර තිබේ.

ජේතවනාරාමයේ සංඝාරාමයන් තුළ විධිමත් ව ඉදිකළ කැසිකිළි හා වැසිකිළි පද්ධති දැකගත හැකි වේ. මේවා සනීපාරක්ෂක කටයුතු සඳහා භාවිත කළ එක් අංශයක් වේ. භික්ෂූන්ගේ විනය නීති අතර ද බහිස්‍රාවීය ද්‍රව්‍යය මඟින් පරිසරයට හානි නොපැමිණිය යුතු බව දක්වා තිබේ. විනය පිටකයේ සඳහන් වන ආකාරයට තණකොළ හා ජලය පිරිසිදු වන ආකාරයෙන් ඒ මත කෙළ හෝ මල මුත්‍රා ආදිය නො දැමිය යුතු බව දන්වා තිබේ. (කුලතුංග,2001:51). එය බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉතා ඉහළින් පිළිගත් බව පැරණි ආරාමවල කැසිකිළි හා වැසිකිළි ඉදිකර තිබෙන ශිල්ප ක්‍රමය තුළින් පැහැදිලි වේ. ජේතවන විහාරය ආශ්‍රිතව සිදු කරන ලද කැනීම්වලදී කැසිකිළි අනාවරණය කරගෙන තිබේ. එම කැසිකිළි අභ්‍යන්තරයේ වන කැසිකිළි ගලක් නිර්මාණය කර ඇති අතර, එම ගල් පුවරුවක් සාමාන්‍යයෙන් අඩි 2 1/2× 2 1/2 ප්‍රමාණයෙන් යුක්ත වේ. කැසිකිළි ගල ඉදිරිපසින් අලංකාර කොරවක්ගල් කැටයමක් දැකගත හැකි අතර එම කොරවක් ගල ද විවිධ කැටයමින් අලංකාර කර තිබේ. විශේෂයෙන් ම බටහිර ආරාමයේ හමුවන කැසිකිළි ගල් තුළ විමාන ආදී කැටයම් දක්නට තිබෙන අතර, මෙය බොහෝ විට අපවිත්‍ර තැනක යොදා තිබෙන්නේ අනිත්‍ය සංකල්පයන්ගෙන් විය යුතු ය. මෙම මුත්‍රාගල් තුළ තිබෙන මුත්‍ර පිටකිරීමට තිබෙන විවරය මීළඟට සම්බන්ධ වන්නේ ගලට යටින් පොළොව අභ්‍යන්තරයට යොමු කර ඇති මුට්ටි පෙළකට හෝ මුට්ටියකට ය. මෙම මුට්ටි පෙළ තුළ වැළි, අඟුරු, ගඩොල් කැබළි ආදී ද්‍රව්‍යය පුරවා තිබෙන අතර මුත්‍රා මහ පොළොවට මුදාහැර ඇත්තේ මුට්ටි තුළින් පෙරී පිරිසිදු ජලය ලෙස එකතු වීමට ය. මෙය අපේ පැරැණ්නන් පරිසරයට හා සිය වටපිටාවට දැක් වූ ලැදියාවත්, එමගින් සනීපාරක්ෂාව සඳහා සිය කටයුතු පිළිබඳ ව දක්වා ඇති සැළකිල්ලක් මනා ව පිළිබිඹු වන අවස්ථාවක් ලෙස පෙන්වාදිය හැකි ය.



ජේතවන විහාරයේ ජන්තාඝරයේ සැලසුම



ජන්තාඝරයේ නාන කොටුව





ජේතවන විහාරයේ පොහොය අසළ ඇති ජන්තාඝරය



ජේතවන විහාරයේ කැසිකිලි සඳහා භාවිත කළ පිරිපහදු ක්‍රමවේදය

මෙයට අමතර ව ජේතවන විහාරයෙන් හමු වී ඇති වැසිකිළි ද සකස් කර ඇත්තේ අපද්‍රව්‍යය වලකට යොමු වන ආකාරයට ය. අභයගිරි විහාරයේ හමු වී ඇති සමහර වැසිකිළි ගල් බදාමයෙන් කපරාරු කර තිබෙන බව අනාවරණය කරගෙන ඇති අතර, වැසිකිළි ද දියුණු තත්ත්වයට තිබී ඇති බව පෙනේ. මේවා අපේ පැරණි ආරාම තුළ සනීපාරක්ෂාව සඳහා යෙදූ විශේෂ අවස්ථා ලෙස ඉදිරිපත් කළ හැකි ය. ජේතවන විහාරය තුළ ද වැසිකිළි කිහිපයක් වාර්තා වුව ද ඒවා බොහෝමයක් විනාශ වී ඇති බව පෙනේ.

අනුරාධපුර පැරණි බෞද්ධ ආරාම තුළ දැකගත හැකි සනීපාරක්ෂක ක්‍රම අතර, තවත් අංශයක් ලෙස ජන්තාඝර පෙන්වාදිය හැකි ය. ජන්තාඝර යනු උණු පැන් නානගෙය වේ. ජන්තාඝරයේ ආරම්භය බුද්ධ කාලයේ සිදු වූ බව බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථවලින් හෙළි වේ. බුද්ධ කාලයේ විසූ භික්ෂූන් වහන්සේලා රසවත් ආහාර ගනිමින් ව්‍යායාම නොකිරීම නිසා රෝගාබාධවලට ලක්වීම නිසා ජීවක කොමාරභච්ච වෛද්‍යවරයාගේ උපදෙස් පරිදි බුදුන් වහන්සේ විසින් ජන්තාඝරවත් අනුගමනය කරන ලෙස අනුදැන වදාළ බව පාලි මුක්ත විනය විනිශ්චය සංග්‍රහයේ හා චුල්ලවග්ගපාලියේ සඳහන් වේ. ශ්‍රී ලංකාවේ බෞද්ධ ආරාම තුළ ද ජනතාඝර දැකගත හැකි වීමෙන් ලංකාවේ භික්ෂූන්ගේ වත්පිළිවෙත් අතරට මෙම සනීපාරක්ෂක ක්‍රමය ක්‍රියාත්මක වන බව පෙනේ. දොළොස් වැනි ශත වර්ෂයේ රචිත අභිදානප්පදීපිකාවේ මෙම ගොඩනැගිලි **අග්ගිශාලා** වශයෙන් හඳුන්වා ඇත. එහි විස්තර වන ආකාරයට මෙම වාස්තුවිද්‍යා අංගය උණු දිය නෑමට භාවිත කළ ස්ථානයක් ලෙස දක්වා තිබේ. සුමංගල ශබ්ද කෝෂයට අනුව මෙම ගොඩනැගිලි හඳුන්වා ඇත්තේ **ගිණිහල්ගෙය** ලෙසය. අග්නිශාලා හෝ ගිණිහල්ගෙය යන දෙක එක ම ගොඩනැගිල්ල බව සාරත්ථදීපනයට අනුව පැහැදිලි වන බැවින් ජන්තාඝරය යනු උණු පැන් නානගෙය ලෙස විස්තර කිරීම වඩාත් යෝග්‍ය වේ (කුලතුංග,2001:52).

මජ්ජිම නිකායට අනුව ඖෂධ වර්ග චූර්ණ කර ඇඟ ගල්වා උණු දිය ස්නානය කිරීම මෙහි සිදු වී තිබේ. එසේ ම ඖෂධ වර්ග චූර්ණයන් සෑදීම සඳහා ජන්තාඝර තුළ ඇඹරුම් ගල් තිබුණ බව



ජේතවන පොහොය ගෙය අසල ජන්තාඝරය තුළින් ද අභයගිරි විහාරයේ සමාධි පිළිමයට පිටුපස ජන්තාඝරය තුළින් ද වාර්තා වී තිබේ. අභයගිරියෙන් වාර්තා වූ ඉහත ජන්තාඝර තුළ ජලය උණුකළ බවට සාධක ලෙස උදුන් කිහිපයක් හමු වීම ඉතා ම වැදගත් සාධකයක් වේ. බෙහෙත් ගල්වා උණු දිය නෑම සඳහා ජන්තාඝරය මධ්‍යයේ ගල්වලින් තැනූ පැන් කොටුවක් තනා තිබේ. මෙම පැන් කොටුව තුළ ස්නානයෙන් පසු ව එකතු වන අපවිත්‍ර ජලය ඉතා විධිමත් ව තැනූ කානු පද්ධතියක් ඔස්සේ ජන්තාඝරයේ පිටතට ගෙන ගොස් ඇති අතර අභයගිරියේ වාදු මූලයේ හමු වී ඇති ජන්තාඝරයේ අපවිත්‍ර ජලය පිටතට රැගෙන විත් ඇත්තේ පාෂාණවලින් තැනූ වලකට ය. එසේ ම ජේතවන විහාරයේ පොහොය ගෙය අසළ ජන්තාඝරයේ අපවිත්‍ර ජලය ජන්තාඝරයෙන් පිටතට යොමු කර ඇත්තේ ද පාෂාණ පුවරුවලින් තැනූ වළකට ය. මෙය ඉතා ම වැදගත් සනීපාරක්ෂක ක්‍රමයක් වන අතර, ස්නානයෙන් පසු අපවිත්‍ර ජලය එකවිට පොළොව මතට මුදා නොහැර එය පරිසරයට හිතකාමී ලෙස පරිසර සමතුලිතත්ත්වයට ගැළපෙන ආකාරයට භාවිත කිරීම විශිෂ්ඨ ආදර්ශයක් ලෙස බෞද්ධ ආරාම තුළින් හමු වන නිදර්ශනවලින් පැහැදිලි වන බව පෙන්වාදිය හැකි ය.

විනය ග්‍රන්ථවල සඳහන් වන ආකාරයට ජන්තාඝරයක් තුළ තිබිය යුතු අංග ජේතවනාරාම ජන්තාඝර තුළින් ද දැකගත හැකි ය. ජේතවනාරාමය තුළින් දැනට ජන්තාඝර තුනක් හඳුනාගත හැකි ය. ඒවා බොහොමයක් නේවාසික අංගනය තුළ පිහිටන අතර එක් ජන්තාඝරයක් පොහොය ගෙය අසළ පිහිටයි. ඒ පිළිබඳ විමසීම ද ඉතා වැදගත් වේ. පෝයකර්ම සිදු කිරීම සඳහා ජලයේ උපයෝගීතාවය පූර්වකෘත්‍ය නමින් හඳුන්වයි. විනය පිටකය අනුව පෝය කර්ම කිරීමට මත්තෙන් පැන් කෙණ්ඩියක් යොදා ගැනීම විනය ප්‍රඥප්තියකි (බණ්ඩාර,1999:01). විනය කර්ම සිදු කරනු ලබන්නේ පෝයසීමාව තුළ ය. එසේ නම් මෙවැනි පූජනීය සීමාවක් තුළ ජේතවන විහාරයේ ජන්තාඝරයක් පිහිටන්නේ ඇයි? මෙම ජන්තාඝරය තුළ අදටත් දැකගත හැකි ආකාරයේ ඇඹරුම් ගල් එමෙන් ම ජල භාජන තැබූ ගලින් තැනූ දඟර ආදිය ද තිබේ. මේ පිළිබඳ ව අදහස් දක්වන බණ්ඩාර මෙසේ සඳහන් කරයි. කුල

කුමරෙකු පැවදි කිරීමේදී හිස මුඩුකර සිවුරු දැරීමට මත්තෙන් නැවීම සිදු කරයි. මෙය ආගමික පවිත්‍රතාව සංකේත කරන්නකි. මෙවැනි කටයුතු පුරාණ යුගයේ දී පොහොය ගෙය ආසන්නයේ සිදු කරන්නට ඇතැයි ජේතවන විහාරයේ පොහොය ගෙය අසල වන ජන්තාඝරය තුළින් පැහැදිලි වේ (එම). මෙම ගොඩනැගිල්ලේ ස්වරූපය දෙස බැලීමේ දී මෙම ස්ථානයේ ප්‍රව්‍රජ්ජ හා අධිශීල යන අභිෂේක දෙක ම සිදු කිරීමට ඇතැයි හැඟේ. පැවිදි බවට පත්වන්නකු මෙතෙක් ජීවිතය පුරා කරගසා ගෙන ආ දුක් කන්දරාව පසෙක ලන්නට යත්න දරන්නෙකි. උපසම්පදා ආරක්ෂකයෙකු **නාග** යන උප පදයෙන් හඳුන්වනු ලබයි. එය ජීවිතයේ උත්තරීතර භූමියකට උරුමකම් කීමට දරණ ප්‍රයත්නයක මූලාරම්භයයි. වර්තමානයේ ද උපසම්පදා විනය කර්මය උත්කර්ෂවත් ලෙස පවත්වන්නකි (එම). මහායානික බෞද්ධ අදහස් ක්‍රියාත්මක වූ ජේතවන අභයගිරි යන විහාරයන්හි එය විශේෂයෙන් ම ඉහළ තලයක පැවතුනාට සැක නැත. වර්තමානයේ ද මල්වතු, අස්ගිරි උභය විහාරවල උපසම්පදා විනය කර්මය උත්කර්ෂවත් පූජනීය උත්සවයක් බවට පත් වේ. මෙහි දී **නාගයාට** සළුපිළි ආභරණ පළන්දා රජෙකු බවට (ඔටුණු නොපළන්) පත්කරනු ලබයි. එහි පරමාර්ථය ලෞකික වස්තූන් කෙරෙහි උපසම්පදාව ලබන්නා තුළ කළකිරීම ඇති කරවීමයි (එම). මේ අනුව ජේතවන විහාරයේ පොහොය ගෙය සීමාව තුළ ස්ථානගත වන ජන්තාඝරය බොහෝ විට උපසම්පදා ප්‍රව්‍රජ්ජ අභිෂේකය සඳහා යොදා ගත් එකක් යයි. උපකල්පනය කළ හැකි ය.

## 4.5 ජේතවන විහාරයේ ජල කළමණාකාරණ කටයුතු

ශ්‍රී ලංකාවේ ජල කළමණාකරණයේ මූලය සෙවීමේ දී එය පූර්ව ඓතිහාසික සංස්කෘතික අවධිය දක්වා ඈතට දිවෙන බව පෙනේ. ක්‍රි.පූ. 2000 - ක්‍රි.ව. 300 දක්වා කාලයක් අතර ශ්‍රී ලංකාව තුළ මුල් බැසගෙන තිබුණ බවට විකිරණමාන දින නියමයන් ලබා දී ඇති යථෝක්ත සංස්කෘතික වකවානුව තුළ ජීවත් වූ ප්‍රජාව අතින් නිම කරන ලද වේලි බැඳ ජලය රැස්කළ බවට මූලික සාධක තිබේ. ක්‍රි.පූ. 7 - 4 සියවස්වලට දින නිර්ණයක් ලැබී ඇති ඉබ්බන්කටුව ප්‍රෝටෝ ඓතිහාසික ජනාවාසය ආසන්නයේ ඇති



ඉඳමොරලුව වැව පුංචි දඹුල්ල කන්දෙන් ගලා එන ජලය රැස් කිරීමට එකී ජනාවාසයේ මිනිසුන් ඉදි කරන ලද මූලික වැවැක් බව පුරාවිද්‍යා පර්යේෂණ අනුව සනාථ කරගෙන ඇත. එසේ ම පොම්පරිප්පු හා යාන් ඔය නිම්නයේ හා අනුරාධපුර අභයවැව (වර්තමාන බසවක්කුලම), තිසාවැව මෙකී යුගය තුළ දී මූලික ජල කළමණාකරණ ආරම්භ කරනු ලැබූ ස්ථාන බවට පිළිගනු ලැබේ. මේ යුගයේ විසූවන් සිය කෘෂිකාර්මික කටයුතු සඳහා මෙන් ම එඬේර කටයුතු සඳහා මෙසේ ජලය එක් රැස්කර ගැනීම උදෙසා වැව් තැනීම ආරම්භ කරන ලද අතර, එය ශ්‍රී ලංකාවේ ජල කළමණාකරණයේ මූලාරම්භක යුගය ලෙස පෙන්වාදිය හැකි ය.

ක්‍රි.පූ. තුන් වැනි සියවසින් අනතුරු ව අනුරාධපුරය ඇසුරින් ඇතිවන බෞද්ධාගමේ පුනර්ජීවය සමඟින් නගුල් කෘෂි කර්මාන්තයේ කලඑළි බැසීම මහා පරිමාණ අයුරින් සිදු වූ අතර ඒ සඳහා අවශ්‍ය ජලය ලබාදීම උදෙසා විශාල වාරි කර්මාන්ත එනම් මහා පරිමාණ වැව් බිහිවීම දැකගත හැකි ය. මෙකී සාධක ඔස්සේ ඇතිවන ජල කළමණාකාරණය මහා විහාර බිහිවීම සමඟ භික්ෂූන්ගේ අවශ්‍යතා සඳහා විහාර ආශ්‍රිත ව සිදු වනු දැකගත හැකි ය. විශේෂයෙන් ම මහා විහාරය, අභයගිරිය, ජේතවනය යන විහාර ත්‍රිත්වය තුළ දැකගත හැකි නටඹුන් වූ පොකුණු, ළිං, හා ජලටැංකි විහාර අභ්‍යන්තරයේ වූ මනා ජල කළමණාකරණ ලක්ෂණ කියාපාන ජීවී සාධක වේ.

අනුරාධපුර ජේතවනාරාම විහාරයේ බෞද්ධ ගල් ගරඳි වැට ප්‍රදේශයෙන් හමු වූ හතර වැනි මහින්ද රජුගේ පුවරු ලිපියක ජේතවනාරාම විහාරය හඳුන්වා ඇත්තේ **දෙනා රජ මහා වෙහෙර** ලෙස බව පරණවිතාන පෙන්වා දී ඇත (*Ez*,vol.I:218). උක්ත විහාරය ක්‍රි.ව. 276 - 303 ලංකාවේ රජ පැමිණි මහාසේන රජුගේ නිර්මාණයක් වන අතර ඉන් අනතුරු ව රජ පැමිණි විවිධ රජදරුවන්ගේ අනුග්‍රහය මත විවිධ වාස්තුවිද්‍යා අංග එකතු වෙමින් සංවර්ධනය වූ විහාරයක් බව වංසකතා හා අභිලේඛන ආදී මූලාශ්‍රයන් අනුව ද පැහැදිලි වේ. උක්ත විහාරය ඇසුරින් ජල කළමණාකරණ කටයුතු පිළිබඳ විමසුමක් කළහොත් දෙනා වෙහෙරෙහි ජල කළමණාකරණය පහත සඳහන් වන ප්‍රධාන අංග කිහිපයක් යටතේ සිදු වී ඇති බව පෙන්වාදිය හැකි ය.

I. භූමියට ලැබෙන වැසි ජලය කළමණාකරණය

i. පානීය අවශ්‍යතා

ii.ස්නාන ආදී අවශ්‍යතා

II. පරිභෝජනය සඳහා ජල කළමණාකරණය

i. පානීය අවශ්‍යතා

ii. ස්නාන අවශ්‍යතා

III. පූජනීය කටයුතු උදෙසා ජල කළමණාකරණය

IV. පාරිසරික උෂ්ණත්වය සමතුලිත කිරීම සහ අලංකරණය සඳහා ජලය කළමණාකරණය කිරීම

ජේතවනාරාම විහාරය සැලසුම් කර ඇත්තේ එහි ඇති දැවැන්ත ස්තූපය කේන්ද්‍ර කරගත් කේන්ද්‍රීය සැලසුමකට අනුව බව පෙනේ. ස්තූපය ඉදිකර ඇත භූමිය එවකට පැවති භූමියෙන් මීටර් තුනක් පමණ උස්කර ඉදිකර ඇති අතර, වැළි මළුවෙන් පිටත භූමිය පහත් විවෘත භූමියක් වේ. ඉන් අනතුරු ව වන පූජනීය හා නේවාසික අංග ඇතුළත් භූමිය ද මදක් උස්කර ඉදිකර ඇත්තේ උස් පහත් වන මාලක ස්වභාවයකට වේ. මේ ක්‍රමයට භූමිය නිර්මාණය කිරීමට මූලික වී ඇත්තේ ඊසාන දිග මෝසම් වර්ෂාව සමයට ඇද හැළෙන අධික වර්ෂාව නිසා එකතු වන විශාල ප්‍රමාණයක් ජලය විහාර භූමියෙන් පිටතට රැගෙන යාමට බව පැහැදිලි වේ. විශේෂයෙන් ම ස්තූප සලපතර මළුව ඔස්සේ ගලා එන ජලය එහි ඇති දැවැන්ත ගල් පීලි ඔසුසේ වැලි මළුවට පැමිණ වැලි මළුවෙන් ඒවා පිටතට නිකුත් කිරීමට විශේෂිත කාණු යොදා ඇති බවට සාධක තිබේ. එම ජලය විවෘත භූමියට එකතු වන අතර, විවෘත භූමියට පිටතින් ඇති පංචාවාස ඇතුළු නේවාසික අංගයන්ගේ හා බෝධිඝරය, පිළිම ගෙය, ධර්මශාලාව ඇතුළු පූජනීය අංගනයන් තුළ වන ජලය පාෂාණවලින් තැනූ පිහිළි ඔස්සේ විවෘත භූමියට එකතු ව විහාර භූමියෙන් ඉවතට යාමට සළස්වා ඇත. මෙය ඉතා විධිමත් ජල කළමණාකරණ කටයුත්තක් වන අතර, එමඟින් විහාර භූමිය තුළ අනවශ්‍ය ජලය රැඳීතිබීම වැළැක්වීමට යෙදූ විධිමත් ක්‍රමයක් බව ද පෙන්වාදිය හැකි ය. විහාරයේ වැඩ සිටි භික්ෂූන්ගේ පරිභෝජන අවශ්‍යතා



සඳහා අංග දෙකක් ඔස්සේ ජලය කළමණාකරණය කර තිබීම විශේෂ වේ. එම අංග දෙක නම්,

I. පානීය අවශ්‍යතා

II. ස්නාන ආදී අවශ්‍යතා සඳහා ය.

මේ කටයුත්තේ දී ජලය රඳවා ගැනීමට පොකුණු හා ළිං මෙන් ම ජලටැංකි ඉදිකර භාවිත කළ බවට සාධක සොයා ගෙන තිබේ. දැනට සිදු කෙරී ඇති කැනීම් ඔස්සේ ජේතවනාරාම විහාරය ඇසුරින් පරිභෝජනය සඳහා භාවිත කළ පොකුණු තුනක් ළිං පහක් හා ජලටැංකි හතරක් පිළිබඳ ව සාධක සොයා ගෙන තිබේ. මෙයින් පානීය අවශ්‍යතා සඳහා භාවිත එක් පොකුණක් විහාරයේ දානශාලාව අසල වන අතර එය දිගින් මීටර් 07 කි. එම පොකුණට බැසීම සඳහා නිර්මාණය කර ඇති පඩි පෙළ අනුව එය පානීය අවශ්‍යතා සඳහා භාවිත කළ බව නිගමනය කළ හැකි ය. එසේ ම ස්තූපයට උතුරු දෙසින් ඇති මීටර් 99 ක් දිග හා මීටර් 30 ක් පළල අති දැවැන්ත පොකුණ භික්ෂූන්ගේ ස්නාන කටයුතු සඳහා භාවිත කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

පානීය ජල අවශ්‍යතා සපුරාගැනීම උදෙසා වූ ළිං කිහිපයක් ද ජේතවනාරාම විහාරය ඇසුරින් හඳුනාගත හැකි ය. එම ළිං වටාපතක හැඩය හා යතුරක් හැඩය ගන්නා අතර ළිඳ තුළට බැස යා හැකි ආකාරයට පඩිපෙළ තනා තිබීමෙන් ජලය අඩුවන කාල පරිච්ඡේදවල දී ජලය ලබාගැනීමට ගත් පියවරක් ලෙස එසේ ඉදිකර තිබීම හඳුනාගත හැකි ය. එසේ ම දානශාලාව අසලින් හමු වූ ඌරා කැට ළිඳ ද පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමට ඉදි කරන ලද ළිඳක් වන අතර ස්තූපයට බටහිර පස පංචාවාස සංකීර්ණ තුළ දැකිය හැකි පාෂාණ යොදා තැනූ හතරැස් හැඩැ ළිං දෙක ද පානීය ජල අවශ්‍යතා සඳහා ඉදි කරන ලද ඒවා බව පෙනේ.

එසේ ම බටහිර පස පංචාවාස සංකීර්ණය තුළ වන වැසිකිළි කැසිකිළි ආදිය සඳහා ජලය ලබාගැනීමට ද වහලයක් යෙදූ ජලටැංකි තනා ඇති බව කැනීම් මගින් අනාවරණය කරගෙන ඇ.ත.

විහාරයේ වූ පූජනීය අවශ්‍යතා සඳහා ජලය ලබාගැනීමට භාවිත කරන ලද පොකුණු හා ළිං දැකගත හැකි වීම ද කැපීපෙනේ. ජේතවනාරාමයේ බෞද්ධ ගල් ගරාදි වැට තුළ වූ බෝධිය සඳහා ජලය ලබාගත් බවට විශ්වාස කළ හැකි වටාපතක හැඩැති ගඩොලින් තැනූ ළිඳක් එම ගල්ගරාදි වැට අසළ වන අතර මහාවංසයේ සඳහනකට අනුව එය දෙ වැනි අග්ගබෝධි රජු බෝගෙය සඳහා තැන වූ ළිඳ වීමට බොහෝ ඉඩ තිබේ (මව,41:66 - 67). එසේ ම පොහොය ගෙය, සන්නිපාත ශාලාව, ධර්මශාලාව අසළ වන චතුරස්‍රාකාර පොකුණ බොහෝ විට පූජනීය කටයුතුවලට අවශ්‍ය ජලය ලබාගැනීමට එම ස්ථානවල ඉදි කරන ලද නිර්මාණයක් ලෙස පෙන්වාදිය හැකි ය. මෙකී මූලික කාරණා පිරිමසා ගන්නා අතරතුර වියළි කලාපයේ පරිසර උෂ්ණත්වයත්, විහාරයේ නිර්මිත පරිසරයත් අලංකරණය කරගැනීමට ද පොකුණු හා ළිං ඉදිකිරීම මඟින් සිදුකර ඇති බව ද පෙන්වාදිය හැකි ය.

## නිර්මාණ තාක්ෂණය

ජේතවනාරාම විහාරයේ ජල කළමණාකරණ කටයුතුවලදී භාවිත කර ඇති ළිං, පොකුණු හා ජලටැංකි ඉදිකිරීම සඳහා භාවිත කර ඇති ප්‍රධාන ම මාධ්‍ය වන්නේ පාෂාණ හා ගඩොළු වේ. මෙයින් ඉදිකිරීම උදෙසා භාවිත කර ඇති පාෂාණයේ ද වෙනස්කම් ඇත. අති දැවැන්ත පොකුණු වන ස්තූපයට උතුරින් පිහිටන තිඹිරි පොකුණ ඉදි කිරීම සඳහා සෙ.මී. 80 x 50 x 30 ප්‍රමාණයේ කලු ගල් කුට්ටි භාවිත කර ඇති අතර මෙම තාක්ෂණය අභයගිරි විහාරයේ ඇත් පොකුණ සඳහා ද යොදා ගෙන තිබේ. පොකුණේ පහළ සිට ඉහළට නිර්මාණය කිරීමේ දී එක් ගල් පේළියක් ඊළඟ ගල් පේළියෙන් පිටුපසට පැන්නීම සඳහා සෙ.මී. 5 ක පමණ පිටතට බැම්ම ඉදිකිරීම කැපීපෙනේ. ජේතවනාරාම තිඹිරි පොකුණ සඳහා ජලය ස්වාභාවික උල්පත් මඟින් ලැබී ඇති අතර අද පවා ඉතා වියළි කාලගුණ තත්ත්වයන්වල දී ද මෙම පොකුණේ ජලය නොසිඳී තිබීම එයට කදිම නිදසුනකි.

දානශාලාවට පිටුපසින් ඇති පොකුණ ඉදිකිරීම සඳහා භාවිත කර ඇත්තේ පාෂාණ කණු හැඩයට සකස් කරගත් දිග ගල් කණු ස්වරූපයේ ඒවා වේ. එය තිඹිරි පොකුණට වඩා වෙනස් ආකාරයට නිර්මාණය කර ඇති අතර පොකුණ අභ්‍යන්තරයේ සිට සෙ.මී. 25 ක පිටතට පැන්නුමකින් යුක්ත ව ගල් පේළි එක මත එක තබා ඉදිකර ඇත. එම නිසා පොකුණ අභ්‍යන්තරයට කුඩාවට ද ඉහළට ඒමේ දී විශාල ආකාරයටත් නිර්මාණය වීම පොකුණේ අලංකාරණයට වැදගත් වී ඇත. මෙම පොකුණ සඳහා ජලය ලබාගෙන ඇත්තේ මැටි නල යෙදූ ජල මාර්ගයකින් බව කැනීම් කටයුතුවලදී පැහැදිලි විය.



වර්තමාන කෞතුකාගාරය හා පොහොය ගෙය අසළ පිහිටන පොකුණ මෙකී පොකුණු දෙකට ම වඩා වෙනස් ආකාරයට නිර්මාණය කර ඇත. එකී පොකුණ අභ්‍යන්තරයට බැස යාහැකි ආකාරයට නිර්මාණය කර ඇති අතර ඒ සඳහා ගල් පුවරු භාවිත කිරීම කැපීපෙනේ. පොකුණ පහළ සිට ඉහළට නිර්මාණය වීමේ දී තට්ටු තුනක් ආාකාරයට දැකගත හැකි අතර පොකුණ තුළට බසින පඩිපෙළ දොරටු මණ්ඩප කැටයමින් අලංකාර කර ඇත. එහි මුරගල තුළ පුන්කලස තිබීමෙන් සෞභාග්‍යය සංකේතවත් වන බව විශ්වාස කළ හැකි ය. කැනීම්වලදී පොකුණ පතුලේ තිබී ලක්ෂ්මී දෙවඟන හා ලෝකඩවලින් නිර්මිත ජලජ සත්වයින් ගල් පෙට්ටියක තැන්පත් කර පොකුණ අභ්‍යන්තරයේ තබා තිබී හමුවී ඇත. මෙය යම් අභිචාරමය කටයුත්තක් උදෙසා භාවිත වූවක් යැයි ද විශ්වාස කළ හැකි ය.

ජේතවනාරාමය ඇසුරින් වන ළිං දෙකක් ගඩොල් යොදා ඉදිකර ඇති අතර, එහි හැඩය රවුම් ආකාර ගනී. ළිඳට බැසයාමට තැනූ පඩිපෙළ නිසා මතුපිට ළිඳ සිට බලන්නෙකුට එය වටාපතක හැඩ හා යතුරක හැඩ ගන්නා බව දිස් වේ. මෙම ළිං දෙක ම බාහිර නළ මාර්ග ඔස්සේ ජලය පැමිණ ඇති අතර, ළිඳට ජලය වැටීමට තිබූ ස්ථානය අලංකාර මකර හිසකින් අලංකාර කර තිබූ බව කැනීම් වාර්තාවල සඳහන් වේ. එහි වැඩිදුරටත් විස්තර වන ආකාරයට මෙම ළිං කපරාරු කර තිබීම ද කැපීපෙනේ. ජේතවනාරාම විහාරයේ පානීය ජල අවශ්‍යතා සඳහා භාවිත ළිං අතර පාෂාණ පුවරු යොදා ගෙන නිර්මාණය කරන ලද ළිං ද වන අතර එයින් එක් ළිඳක් වහලයකින් ආවරණය වූ බවට සාධක තිබේ. ළිං සඳහා බාහිරින් ජලය රැගෙනවිත් ඇති බව පෙනේ.

මෙයට අමතර ව වැසිකිළි කැසිකිළි සංකීර්ණ අසල දැකගත හැකි ගඩොලින් හා පාෂාණ පුවරුවලින් නිර්මාණය කර ඇති ටැංකි සඳහා වහලක් යොදා සකසා ඇති අතර ඒවා සියල්ල ම සුදු හුණු කපරාරුවෙන් කපරාරු කර තිබූ බවට සාධක ඇත. මේ සඳහා ජලය පුරවා තබා ගන්නට ඇතැයි විශ්වාස කළ හැකි අතර නේවාසික අවශ්‍යතාවයන්ට භාවිත කළ ජල කළමණාකරණ අංගයන් ලෙස ද පෙන්වාදිය හැකි ය. වසර 1600 කට වඩා පැරණි ජේතවනාරාම විහාරයේ ජල කළමණාකරණ කටයුතු අපේ ඓතිහාසික තාක්ෂණයේ මහගු අවස්ථාවක් පෙන්නුම් කරන සාධක ලෙස පෙන්වාදිය හැකි ය.



ජේතවන විහාරයේ ඇති යතුරක හැඩැති ළිදක්



ජේතවන විහාරයේ චතුරස්‍රාකාර පොකුණක්

**පස් වැනි**
**පරිච්ඡේදය**

# වාස්තුවිද්‍යා නිර්මාණයන්හි අලංකරණ අංග

ජේතවනාරාම විහාරයේ නටඹුන් ගොඩනැගිලි බොහෝමයක අලංකරණ අංග සඳහා,

- සඳකඩ පහණ
- මුරගල
- කොරවක්ගල
- බොරදම්

ආදිය භාවිත කර ඇත. විස්තර කිරීමේ පහසුව තකා මේ එක් එක් අංගය පිළිබඳ ව වෙන වෙන ම සාකච්ඡා කරනු ලැබේ.

## 5.1 සඳකඩ පහණ

ගොඩනැගිල්ලකට පිවිසෙන පියගැට පෙළ පාමුල තිබෙන කැටයම් සහිත හෝ රහිත අර්ධකවාකාර පුවරුව සඳකඩ පහණ නමින් හැඳින්වේ. සඳකඩ පහණේ මුල් ස්වරූපය භාරතයෙන් දැනට ලැබී ඇති නාගර්ජුන කොණ්ඩයේ සිංහලාරාමයෙන් දැකිය හැකි ය. ඒ අනුව සමහර විට ඉන්දියානු ආභාසය ඇති ව මෙම සඳකඩ පහණ නිර්මාණය වන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය (ගොඩකුඹුර,1982:9). ලංකාව ආශ්‍රිත ව ඇති සඳකඩ පහණ් පිළිබඳ ව ලිඛිත මූලාශ්‍රය සාධක බොහෝ ප්‍රමාණයක් තිබේ. ධම්මපදට්ඨ කතාවේ (ක්‍රි.ව. පස් වැනි සියවස) **සෝපාන** ලෙසින් ද ධම්පියා අටුවා ගැට පදයෙහි (ක්‍රි.ව. දස වැනි සියවස) **පියගැට** වශයෙන් ද දොළොස් වැනි සියවසෙහි රචිත අමාවතුරෙහි ද **අඩසඳ පහණ** වශයෙන් ද දහතුන් වැනි සියවසෙහි රචිත

සද්ධර්මාලංකාරයෙහි ද **සඳකඩපහණ** වශයෙන් ද මෙම අලංකාර නිර්මාණ අංගය හඳුන්වා තිබේ.

සමන්තපාසාදිකාවේ **පටික** යන්නට තේරුම් දී ඇත්තේ පඩිපෙළ මුල ඇති අඩ සඳ හැඩයේ ගල ...... එනම් අඩ්ඪචන්ද **පාෂාණ** යන පාලි වචනයෙනි. දොළොස් වැනි සියවසෙහි රචිත සමෝහවිනෝදනී නම් විනය ටීකාවෙහි අඩ්ඪ චන්ද පාෂාණ යන්නට පඩිපෙළෙන් ඇතුළට පැන්නෙන හෝ පඩි පෙළින් වැසෙන ලෙස හෝ පිහිට වූ වක්‍රාකාර ගල් පුවරුවක් මේ නමින් හඳුන්වා ඇති බව පෙනේ (එම). මහාවංසයේ සඳහනකට අනුව පඩිපෙළක මුල පිහිටි ගල් පුවරුව **පාටිකය** නමින් හඳුන්වා ඇත (මව,1:61). මහාවංසටීකාවට අනුව විස්තර කර ඇත්තේ **අඩ්ඪ චන්ද පදගන්ධික** අඩ සඳේ හැඩයට සැදුණු ගල වශයෙනි (මවටී.:76).

පුරාවිද්‍යාත්මක සාධක වශයෙන් පැරණි ම සඳකඩ පහණ දක්නට ලැබෙනුයේ භාරතීය කැටයම් කලා නිර්මාණවල ය. ක්‍රි.පූ. 2 - 1 ශත වර්ෂවලට අයත් සුංග බෞද්ධ කලාවේ කැටයම් රහිත සඳකඩ පහණ භාවිත වූ බවට සාධකයක් ජග්ගයියාපේටයෙන් හා සාතවාහන කාලයට අයත් පද්ම මෝස්තර සහිත සඳකඩ පහණ් අමරාවතී ස්තූප කැටයම් අතර දක්නට ලැබීමෙන් පැහැදිලි වේ (වික්‍රමගමගේ, 1995: එලක 21 - 22).

ලංකාවේ පැරණි ම සඳකඩ පහණ් ලෙස පුරාවිද්‍යාඥයින් දක්වා ඇත්තේ ලිපි සහිත සඳකඩ පහණ් ය (Bandaranayake: 1974: 382). එසේ ම පුරාවිද්‍යාත්මක සාධක අනුව තවත් සඳකඩ පහණ් කිහිපයක කාලය පෙන්වාදිය හැකි ය. අභයගිරි ස්තූප මළුවේ සඳකඩ පහණ ක්‍රි.පූ. පළමු වැනි හා ක්‍රි.ව. තුන් වැනි සියවස් අතරට ද මැදිරිගිරිය පිළිම ගෙය සඳහා යොදා ඇති සඳකඩ පහණ ක්‍රි.ව. 3 - 5 සියවස් අතර හා සීගිරිය සිංහ පාදයේ සඳකඩ පහණ ක්‍රි.ව. 5 - 7 සියවස්වලට අයත් බව බණ්ඩාරණායකගේ මතය වේ. (Bandaranayake,1974:378). ක්‍රි.ව. හතර වැනි සියවසට අයත් සෙල්ලිපි සාධක සහිත සඳකඩ පහණක් මහා විහාරයේ රංසිමාලකය ප්‍රදේශය කැණීමේ දි සොයා ගෙන ඇත (පුවිදෙඉ,1962/63:13).



දැනට සිදුකර ඇති පර්යේෂණවලට අනුව පියගැට පෙළේ පඩි ගල හෙවත් **පාටිකය** සඳකඩ පහණේ ආරම්භක අවස්ථාව වූ බව චාර්ල්ස් ගොඩකුඹුරගේ මතය වේ (ගොඩකුඹුර, 1982:09). ආයත චතුරස්‍රාකාර ගල් පුවරුව වූ පියගැට පන්තියේ පහත් ම පඩි පෙළ මදක් විශාල කර තැබීමෙන් එය භාවිතයට පැමිණ ඇති අතරේ මෙහි දෙ වැනි පියවර ලෙස ආයත චතුරස්‍රාකාරයෙහි දෙකොන මදක් වක්‍ර ව යොදා ගැනීම බවත් ඔහුගේ මතය වේ (එම). සඳකඩ පහණේ වර්ධනාත්මක ස්වරූපය පිළිබඳ ව අදහස් දක්වන සේනක බණ්ඩාරණායක සඳකඩ පහණ අලංකාර කිරීමට භාරතයෙන් ලබාගත් මෝස්තර කිහිපයක් උපයෝගී කරගෙන තිබුණත් එහි මූලික අදහස හා ආකෘතිය ස්වාධීන නිර්මාණ වූ එහි දියුණු සංවර්ධන ඉතිහාසයෙන් ඔප්පු වේ. ප්‍රාදේශික හා අසල්වැසි සම්ප්‍රදායන් අතර සම්බන්ධන්ධතා ද එකී සම්ප්‍රදායික ස්වශක්ති හා ස්වාධීනත්වය ද, විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම පිණිස යොදාගත හැකි හොඳ ම නිදසුනකි (බණ්ඩාරණායක,1977:28-31) අනුරාධපුර, සීගිරිය, හත්තකුච්චි වැනි ස්ථානවලින් පමණක් ආකෘතිමය වශයෙන් වෙනස් වන කැටයම් රහිත සඳකඩ පහණ් 40 කට නොඅඩු ව ලැබී ඇති අතරර ඒවා කිසියම් වර්ධනාත්මක පියවරකට පෙළගැස්විය හැකි උවත් අවුරුදු 700 - 1000 ක් පමණ කාල පරිච්ඡේදයක දී මෙවැනි වර්ධනාත්මක පියවරක් අනුගමනය කළා යයි සිතීම පවා අසීරු බවත් අමරසේකර පෙන්වා දී තිබේ (අමරසේකර, 1991:01).

මේ වන විට ප්‍රකාශයට හා ප්‍රසිද්ධියට පත් වී ඇති සඳකඩ පහණ දෙස බැලීමේදී යුගයෙන් යුගයට ආකෘතියෙහි පමණක් නොව ශිල්පීය වශයෙන් ද නිර්මාණ අර්ථ පූර්ණතාවෙන් ස්වාධීන ලක්ෂණ පෙන්නුම් කරන බව අනුරාධපුරයේ සඳකඩ පහණ්වල හා එහි සමාන ලක්ෂණ පොළොන්නරුව හා ඉන් අනතුරු ව මහනුවරට අයත් සඳකඩ පහණ්වල දැකිය හැකි ලක්ෂණයන් ගෙන් පිළිබිඹු වේ. අනුරාධපුරයේ පැවති චාම් සරළ කැටයම් වෙනුවට පොළොන්නරු යුගය වන විට විසිතුරු බවක් මෙන් ම සංකීර්ණ ගැඹුරු කැටයම් ද දක්නට ලැබේ. මොනරා, කුකුළා වැනි සත්ත්ව රූප ද එයට එකතු වේ. සඳකඩ පහණ සම්බන්ධ මුළු කලාවේ ම වස්තු විෂය ශ්‍රී ලංකාවේ නටඹුන් අතර

සැඟවී තිබේ. ඩී.ටී. දේවේන්ද්‍ර සඳකඩ පහණ ගොඩනැගිලි දොරටු සැකසීමට යොදාගත් උපායක් ලෙස දක්වා තිබේ (වික්‍රමගමගේ, 1994:7). පරණවිතානගේ මතයට අනුව සඳකඩ පහණ තුළින් භවචක්‍රය නිරූපණය වන බව ප්‍රකාශ කර ඇත. මේ අයුරින් සඳකඩ පහණේ වර්ධනය පිළිබඳ සාකච්ඡා කරන උගතුන් විසින් ආයත චතුරස්‍රාකාර පාටිකාවේ සිට ක්‍රමයෙන් අඩසඳ දක්වා වර්ධනය වී කැටයම් භාවිතයෙන් උසස් නිර්මාණයක් වූ ආකාරය පෙන්වා දී ඇත. එසේ ම ආගමික ස්ථාන ආශ්‍රයෙන් ඇති සඳකඩ පහණ දෙස බැලීමේ දී එම ගොඩනැගිල්ලේ උපයෝගීතාවය අනුව ආකෘතිමය වශයෙන් යම් යම් වෙනස් කම්වලට භාජනය වූ සඳකඩ පහණ් දක්නට ලැබේ.

අනුරාධපුර යුගයේ මුල් වකවානුව අයත් යැයි සලකනු ලබන සඳකඩ පහණ් බොහොමයක් හුණුගල් හෝ හුණුගල් පුවරු යොදා සකස් කළ ඒවා වේ. මෙයට ම සමගාමී ව තද ගලින් කළ සඳකඩ පහණ් හත්පිකුච්චි විහාරයෙන් ද කළුගල් පුවරු සඳකඩ පහණ් අභයගිරියෙන් හා ජේතවනයෙන් ද හමු වේ. එම සඳකඩ පහණ්  අඩසඳ ගන්නා හැඩයට වඩා අඩකවයකට කිට්ටු හෝ කවාකාර වේ. මේවායේ කැටයම් බහුල නොවේ. බොහෝ විට පද්ම මෝස්තරය දැකිය හැකි අතර ඇතැම් තැනක සියුම් රටාව සහිත සත්ත්ව රූප ද  දක්වා ඇත.  සැස්සේරුව හා ජේතවනයේ මෙවැනි සඳකඩ පහණ් දෙකක් දක්නට ඇත. එසේ ම එහි පටිකාශේෂ හෝ ප්‍රක්ෂේපණ ද දක්වා ඇත. ඇතැම් විට හුණු ගල්වල ස්වරූපය අනුව එසේ සකස් කිරීමට අපහසු වී ඇත (අමරසේකර, 1997:7). අනුරාධපුර යුගයේ දී ක්‍රමයෙන් දියුණු වන සඳකඩ පහණ් පිළිබඳ තොරතුරු මහා විහාරය, අභයගිරිය, ජේතවනාරාමය ආදී විහාර ද එයට පරිබාහිර ව පිහිටන පැරණි විහාරාරාම තුළින් ද දක්නට පුළුවන් වේ. පොළොන්නරු යුගයේ දී  ආකෘතිමය හා නිර්මාණාත්මක වශයෙන් වෙනස් වන සඳකඩ පහණ  දඹදෙණි කෝට්ටේ  හා මහනුවර යුගවල දී එහි හැඩය හා අන්තර්ගතය අතින් තවත් පියවර කිහිපයක් අනුගමනය කර ඇති බව පෙනේ.



## ජේතවනාරාම විහාරයේ සඳකඩ පහණ්

ජේතවනාරාම ආරාම සංකීර්ණයේ දැනට සංරක්ෂණය කර ඇති හා නොමැති ගොඩනැගිලි ආශ්‍රයෙන් සඳකඩ පහණ් 100 කට අධික සංඛ්‍යාවක් දක්නට ලැබේ. එම සඳකඩ පහණ් පිළිබඳ ව සිදු කරනු ලැබූ විමර්ශනයේ දී එහි නිර්මාණාත්මක ස්වරූපය අනුව වර්ග වශයෙන් ද මෝස්තර අනුව ද වර්ග කිරීමක් සිදු කරන ලදි. ඒ අනුව ප්‍රධාන වර්ග 4 කට අයත් සඳකඩ පහණ් ජේතවන විහාරයේ දක්නට ලැබේ. ඒවානම්,

1. ආයත චතුරස්‍රාකාර වර්ගය
2. ප්‍රක්ෂේපණ සහිත කවාකාර වර්ගය.
3. කැටයම් රහිත කවාකාර වර්ගය.
4. කැටයම් සහිත කවාකාර වර්ගය .

### 1. ආයතචතුරස්‍රාකාර වර්ගය

ආයත චතුරස්‍රාකාර වර්ගයේ සඳකඩ පහණ පටිකාව වශයෙන් හැඳින්වෙන බව මූලාශ්‍රය සාධක ඇසුරින් හඳුනගත හැකි බව චාර්ල්ස් ගොඩකුඹුරගේ අදහස වේ (ගොඩකුඹුර, 1982:09) ජේතවනාරාම යේ මෙම ආයත චතුරස්‍රාකාර සඳකඩ පහණ් වර්ග කිහිපයක් ගොඩනැගිලි ආශ්‍රයෙන් දැකගත හැකි ය. ඒවා මෙසේ ය.

1.1 ආයත චතුරස්‍රාකාර පාටිකය
1.2 ආයත චතුරස්‍රාකාර දෙකෙලවර නැමුණු පාටිකය
1.3 ප්‍රක්ෂේපණ සහිත කවාකාර පාටිකය
1.4 ප්‍රක්ෂේපණ සහිත චතුරස්‍රාකාර පාටිකය වශයෙනි.

### 1.1 ආයත චතුරස්‍රාකාර පාටිකය

මෙම සඳකඩ පහණේ වර්ගය ජේතවනාරාම විහාරයේ දොරටුවල හා ගොඩනැගිලිවලට යොදා තිබෙනු දක්නට ලැබේ. ප්‍රධාන සැලසුමේ (එෆ් 40) පංචාවාස ගොඩනැගිල්ල තුළ මෙම

සඳකඩ පහණ පඩිගලට සමාන්තර ව පිහිටා ඇති අතර එයට පිටතින් එන පුවරු දෙකක් දෙපසින් එයට සම්බන්ධ කර තිබේ (ඊ 35 ඒ). එහිදී එම පාටිකාව දෙපසින් මුරගල යොදන අවස්ථාවල මැද කැපුමකින් පාටිකය තුළට සම්බන්ධ කර ඇත (ඊ 37). පාටිකය මත මුරගල තබා ඇති අවස්ථාවක් (ඊ 23) ඇසුරින් දැකගත හැකි ය.

## 1.2 ආයක චතුරස්‍රාකාර දෙකෙළවර නැමුණු පාටිකය

ඉහත සඳහන් කළ පාටිකය දෙකෙළවර මදක් නැවුණු ආකාරයෙන් සකස් කරගත් අයුරු පැහැදිලි වෙයි. මෙය සඳකඩ පහණේ ඊළඟ වර්ධනාත්මක අවස්ථාවක් බව පෙනේ. මෙවැනි පුවරු දෙකක් ප්‍රධාන සැලසුමෙහි (කේ 35) සහ (අයි 14) ගොඩනැගිලිවලින් දැකගත හැකි ය. මේවා මුල් අවස්ථාවේ දී ආරම්භක පියගැට සඳහා යොදාගත් ආකාරය පැහැදිලි වේ. එහි නිර්මාණාත්මක ස්වභාවය රළු ස්වභාවයක් ගන්නා බව ද පෙනේ.


## 1.3 ප්‍රක්ෂේපණ සහිත දෙකෙළවර කවාකාර පාටිකය

පාටිකයෙහි තවත් ඉදිරි පියවරක් මෙම ප්‍රක්ෂේපණ සහිත කවාකාර පුවරුවලින් පෙන්වාදිය හැකි ය. ජේතවන විහාරයේ ගොඩනැගිලි මෙන් ම දොරටු සඳහා ද මෙම සඳකඩ පහණ භාවිත කර තිබේ. දෙපස ඉතිරි කර හෝ පඩිගලට සමාන්තර ව හෝ පිහිටා තිබෙන ආකාරයට සකස් කර මදක් ඉදිරියට දක්වා ඇති මෙය පාටිකයෙන් සඳකඩ පහණට පරිවර්තනය වීමේ මුල් පියවරක් ලෙස වික්‍රමගමගේ හා අමරසේකර පෙන්වා දී ඇත (වික්‍රමගමගේ,1995; අමරසේකර 1991) ජේතවනාරාම විහාරයේ සැලසුමේ දක්වා ඇති (ඩී හා ඊ) පංචාවාස සංකීර්ණවල උප ගොඩනැගිලිවල ද (ඊ 26) ගොඩනැගිල්ල තුළ ද මෙම වර්ගයේ සඳකඩ පහණ් දැකිය හැකි ය.



## 1.4 ප්‍රක්ෂේපණ සහිත චතුරස්‍රාකාර පාටිකය

මෙම වර්ගයේ පාටිකා ප්‍රධාන සැලසුමේ බී(2), ඊ(27), ඩී(14), පිළිම ගෙය ඉදිරි පස (49) ගොඩනැගිල්ල තුළින් ද දැකිය හැකි ය. මෙය ඉහත වර්ගයෙන් වෙනස් වන්නේ වඩාත් ඉදිරියට යොදා ඇති පුවරු කොටසිනි. මෙය ඉහත වර්ගයේ පටිකාවේ වර්ධිත අවස්ථාවක් බව වික්‍රමගමගේගේ මතය වේ (වික්‍රමගමගේ,1995:) මෙයට අමතර ව දාර සහිත ලීස්තර ද යෙදූ වර්ගය මිරිසවැටියේ දක්නට ලැබෙන බව ද ඔහුගේ මතයයි (එමඃ එලක 34).




ආයත චතුරස්‍රාකාර වර්ගයේ සඳකඩ පහණ් ආකෘති

## 2. ප්‍රක්ෂේපණ සහිත කවාකාර වර්ගය

මෙම සඳකඩ පහණ් වර්ගය ප්‍රක්ෂේපණ සහිත ව කවාකාර ව සකසාගෙන ඇත. බහුල වශයෙන් ගොඩනැගිලි සඳහා මේ වර්ගය භාවිත කර ඇත. මෙම වර්ගයේ සඳකඩ පහණ් ජේතවනාරාම විහාරය ඇසුරින් වර්ග කිහිපයක් හඳුනාගත හැකි ය.

2.1 ප්‍රක්ෂේපණ සහිත කවාකාර

2.2 ප්‍රක්ෂේපණ සහිත වළයාකාර

2.3 දිගටි ප්‍රක්ෂේපණ සහිත වළයාකාර

2.4 ප්‍රක්ෂේපණ සහිත පියුම් මෝස්තර වශයෙනි.

### 2.1 ප්‍රක්ෂේපණ සහිත කවාකාර

මෙහි හැඩය හා ආකෘතිය ගෙන බැලීමේ දී ප්‍රක්ෂේපණ සහිත ව කවාකාර ව මනා ව සකසා ඇත. මෙය බොහෝ විට මුල් පාටිකයෙන් ඉතිරි කර ගැනීමක් ලෙස සඳකඩ පහණ්වල වර්ධනය පිළිබඳ අදහස් දක්වන පුරාවිද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇත. ප්‍රක්ෂේපණය මුරගලට ඇතුළුවන ආකාරයට ද ඇතැම් තැනක පියගැට පෙළ සමාන්තර ව නමා ඇත. චන්ද්‍රා වික්‍රමග මගේ පෙන්වා දී ඇත්තේ කවාකාර හැඩයේ සඳකඩ පහණ් යොදා ගැනීමේ දී දෙපස ඇතිවන හිඩැස පිරවීමට මෙය සිදුකර ඇති බව ය (වික්‍රමගමගේ,1995: එලක 53). උක්ත හැඩයේ සඳකඩ පහණ් ජේතවනාරාමයේ ඇති (ඒ 14, 15) 'බී' ආරාම මණ්ඩපය, 'ඩී' 4(28), 'ඩී' 16(45), 'ජී' (71), 'එච්' (76), අයි 18(83), 'අයි 21(85), 'ජේ' 93, 'කේ' 39(6), කේ (97), ස්තූප මළුව (99) එෆ් 41(65), 'එෆ්' 42(66) යන ස්ථානවල දැකගත හැකි ය.

### 2.2 ප්‍රක්ෂේපණ සහිත වළයාකාර

ඉහත සඳහන් කළ සඳකඩ පහණ් වර්ගයට වෙනස් වනුයේ මැදින් උඩට යන වළයාකාර ස්වභාවයෙනි. මෙම සඳකඩ පහණ ජේතවනාරාමයෙහි පංචාවාස ගොඩනැගිලි හා අර්ධ පංචාවාස ගොඩනැගිලිවල දැකගත හැකි ය. එනම් ඒ'(13), 'ඩී' 19(48), එෆ්'43(67), 'ජේ' 28(88) වේ.

### 2.3 දිගටි ප්‍රක්ෂේපණ සහිත වළයාකාර වර්ගය


මෙහි දක්නට ඇත්තේ ප්‍රක්ෂේපණයේ දිගටි බව හා මැදින් වළයාකාර බව පමණි. ප්‍රක්ෂේපණ කොටස දිගට යොදා ගන්නට ඇත්තේ පියගැට පෙළෙහි පුළුල්කම නිසාත් දෙපස හිඩැස් ව



තැබීම වළක්වා ගැනීම පිණිස බව සිතිය හැකි ය. දිගටි කවයක් තිබීම මෙහි විශේෂ ලක්ෂණයකි. ජේතවනාරාමයේ පංචාවාස 'ඩී' සංකීර්ණයේ මෙවැනි සඳකඩ පහණක් දැකගත හැකි ය.

### 2.3 ප්‍රක්ෂේපණ සහිත පියුම් මොස්තර

මෙම සඳකඩ පහණ්වල මධ්‍ය පියුම් රටාවකින් අලංකාර කර ඇත. මෙම සඳකඩ පහණේ පාටිකා ශේෂය සහිත ඉහළ ලීස්තර කොටසේ පහත ම පියගැට සම්බන්ධ කිරීම පිණිස ක්‍රමයෙන් උස්වන ආකාරයට දක්වා ඇත. මෙම සඳකඩ පහණ ආරාම 'සී' (2), 'අයි' (17), 'බී' (16), 'සී' 2(26), 'ජේ' 26(17), 'අයි' 17(86), ගොඩනැගිලිවල දැකගත හැකි ය (වික්‍රමගමගේ, 1995:එලක 37).




ප්‍රක්ෂේපණ සහිත කවාකාර වර්ගයේ සඳකඩ පහණ් ආකෘති

## 03. කැටයම් රහිත කවාකාර වර්ගය

කැටයම් රහිත කවාකාර වර්ගයේ සඳකඩ පහණ අනුරාධපුරයේ පැරණි විහාරාරාමවල බහුල ලෙස දැකිය හැකි වර්ගයකි. ජේතවනාරාම භූමියේ මෙම වර්ගයේ සඳකඩ පහණ් උප වර්ග 4ක් දැකගත හැකි ය.

3.1 කැටයම් රහිත  අඩ කවයකට අඩු වර්ගය

3.2 කැටයම් රහිත අඩ කව වර්ගය

3.3 කැටයම් රහිත අඩ කවයකට වැඩි වර්ගය

3.4 කැටයම් රහිත දෙකෙළවර කෝණාකාර වර්ගය වශයෙනි.

### 3.1 කැටයම් රහිත  අඩකවයකට අඩු වර්ගය

මෙම වර්ගයට අයත් සඳකඩ පහණ 'බී' ආරාම සංකීර්ණයේ දොරටුවේ දැකගත හැකි ය.

### 3.2 කැටයම් රහිත අඩකව වර්ගය

මෙම සඳකඩ පහණ කැටයම් රහිත ව දැකගත හැකි වුව ද මෙහි ආකෘතිය පසු ව මෝස්තර සහිත ව වැඩි දියුණු වූ සඳකඩ පහණ්වල ආකෘතියට බලපා ඇති බව උපකල්පනය කළ හැකි ය. ඇතැම් සඳකඩ පහණ්වල දෙකෙලවර මදක් කෝණාකාර ස්වරූපයක් ද දක්නට ලැබේ. මෙවැනි සඳකඩ පහණ ආරාම 'ඒ' ගල් ගරාදි වැට අසල (1,2), සන්නිපාත ශාලාව (4,5, 7), 'බී' 5(19), 'සී' 3(27), 'සී' 5(29), 'සී' 7, 'ඒ' (31, 32, 33), 'ඩී' 14, 'ඩී' 17(40), 'ඊ' 28(56), 'එච්' (11) 'සී' දොරටුවල මණ්ඩපය (34, 35, 36), 'ඩී' බැම්ම අසල (51, 52) 'එච් බැම්ම අසල (78), 'අයි' (19), දානශාලාව (89, 90) ආදියෙහි දැකගත හැකි ය.

### 3.3 කැටයම් රහිත අඩකවයකට වැඩි වර්ගය


මෙවැනි හැඩයේ ආකෘති පංචාවාස ගොඩනැගිලිවල දක්නට ලැබේ. ආරාම 'ජී' (2), 'ජී' 3(73), 'ජේ' (29), දානශාලාව (91), 'එච්' 8(75), 'ඊ' 35(59), 'ඊ' (62) ආදියෙහි දැකිය හැකි වේ.

### 3.4 කැටයම් රහිත දෙකෙළවර කෝණාකාර වර්ගය

මෙහි දක්නට ලැබෙන විශේෂත්වය නම් දෙපස කෝණාකාර බව ය. මෙවැනි ආකෘතියකින් යුත් සඳකඩ පහණක් හොරණ රජමහා විහාරයේ ඇති බව චාර්ල්ස් ගොඩකුඹුර ප්‍රකාශ



කර තිබේ (ගොඩකුඹුර,1982:28-32) ජේතවනාරාමයේ පංචාවාස ගොඩනැගිල්ලක මෙය දැකගත හැකි ය.




කැටයම් රහිත කවාකාර වර්ගයේ සඳකඩ පහණ ආකෘති

## 4. කැටයම් සහිත කවාකාර වර්ගය

කැටයම් හෝ රේඛා මගින් අලංකාර කරන ලද සඳකඩ පහණක් මෙම වර්ගයට අයත් වේ. නිර්මාණාත්මක ස්වරූපය අනුව මේවා ද ජේතවනාරාමය ඇසුරින් වර්ග කර පෙන්විය හැකි ය.

4.1 දාර හෝ රේඛා සහිත සඳකඩ පහණ

4.2 පියුම් පෙති මෝස්තර සහිත සඳකඩ පහණ

4.3 පුවරු යොදා සකස් කළ සඳකඩ පහණ

4.4 පියුම් හා සත්ත්ව මෝස්තර සහිත සඳකඩ පහණ

4.5 පිටත තීරුවේ මෝස්තර සහිත සඳකඩ පහණ වශයෙනි.

## 4.1 දාර හෝ රේඛා සහිත සඳකඩ පහණ්

මෙම ආකෘතියේ සඳකඩ පහණ්වල දාර හෝ රේඛා වශයෙන් දැකගත හැකි කොටස් තුනකින් යුක්ත වේ. මෙම මණ්ඩල තුන තුළ මධ්‍ය කවය උස්වන අතර දෙ වැනි කවය ක්‍රමයෙන් පහත් වන අයුරින් දැක්වෙයි. මෙම හැඩයේ සඳකඩ පහණ් ජේතවනාරාම විහාරයේ බෝධිඝරය අසල (3), එම් 39(98), ජේ 25(85), එම් 39, පිළිම ගෙයට ප්‍රවේශ වන (40, 41, 42) ඉදිරි දොරටුවල දැකගත හැකි ය.

## 4.3 පුවරු යොදා සකස් කළ සඳකඩ පහණ්

මෙවැනි හැඩයේ සඳකඩ පහණ් ජේතවන ස්තූපයේ සලපතර මලුවට පිවිසෙන දොරටු අශ්‍රිත ව හඳුනාගත හැකි ය. මෙය කවාකාර හැඩයක් ගන්නා අතර කවාකාර බව රැකගැනීම සඳහා අදියර තුනකට අයත් වන ලෙස ගල් පුවරු තබා ඇත. සඳකඩ පහණ සකස් කරගැනීමට මධ්‍යයේ පුවරු තුනක් තබා ඉන් පිටත නැවත වෘත්තාකාර සේ එලක පුවරුවලින් යුක්ත වේ. ඉන් අනතුරු ව දැකගත හැකි තීරුවල ද ඉහත ආකාරයෙන් සකසා ගෙන ඇත. මෙය ඉතා විශාල වන සඳකඩ පහණක් නිසා මෙය මෙසේ සකස් කර ගන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. අභයගිරි දාගැබ් මලුවේ ද මෙවැනි සඳකඩ පහණක් දක්නට ලැබේ.


## 4.4 සත්ත්ව මෝස්තර සහිත සඳකඩ පහණ

මධ්‍යයේ පියුම් මෝස්තර හා සත්ත්ව රූප සහිත සඳකඩ පහණ මේ වර්ගයට අයත් වේ. එහි මධ්‍ය තුළ විකසිත පද්ම මෝස්තරයෙන් පිටත තීරුව හිස් ව තබා ඇත. ඉන් අනතුරු ව තීරුව වමේ සිට දකුණට දිවෙන සේ අශ්වයා, ගවයා, සිංහ, හා ඇතා ආදී වශයෙන් දක්වා ඇත. මෙවැනි සඳකඩ පහණ් දැනට ජේතවන කෞතුකාගාරය ඉදිරිපස ගොඩනැගිල්ල තුළ ප්‍රදර්ශනයට තබා තිබේ.



## 4.5 පිටත තීරුවේ මෝස්තර සහිත සඳකඩ පහණ

ප්‍රධාන සැලසුමේ 'ඩී' ආරාම සංකීර්ණයේ ගොඩනැගිල්ලක් තුළ මෙය දැකගත හැකි ය. මෙහි අවසාන කවයේ ගිණිදළු රටාව සමාන ව විහිදෙන ආකාරයට දක්වා ඇත. දකුණට බර ව ගිණිදැල් විහිදෙන ලෙස මෙය සකස් කර ඇත. මේ ආකාරයේ සඳකඩ පහණ් වර්ග ජේතවන විහාරය ආශ්‍රයෙන් අනාවරණය කර ගැනීමට හැකි විය.




කැටයම් සහිත කවාකාර වර්ගයේ සඳකඩ පහණ් ආකෘති

## 5.1 මුරගල

පඩිපෙළක අග යෙදූ ලී පුවරුව හෝ ගල් පුවරුව ලිස්සා ඒම වැළැක්වීමට යෙදූ ලී කොටසක් හෝ කුඤ්ඤ ගල පසු ව විසිතුරු රුවින් යුතු දොරටුපාල ගල් බවට පෙරළුන බව චාර්ල්ස් ගොඩකුඹුරගේ මතය වේ (ගොඩකුඹුර, 1982:01). ශ්‍රී ලංකාව ආශ්‍රිත ව මුරගල් පිළිබඳ ලිඛිත සාධක බෙහෙවින් අඩු ය. එසේ වුවත් දොරටුපාල රූපයක් ගැන සඳහනක් සමෝහවිනෝදනී නම් විභන්ග අටුවාවෙහි සඳහන් වී තිබේ. එහි සඳහන් වන ආකාරයට එක් ළදරු භික්ෂුණියක් සිතුල්පව් වෙහෙරෙහි පොහොය ගෙයි දොරටුපාල රුවක් බලමින් සිටිය දී ඇයට රාගයක් ඉපිද මියගිය

පුවතක් පිළිබඳ ව සඳහන් වී තිබේ (එම). චන්ද්‍රා වික්‍රමගමගේ දක්වා ඇති අදහස වන්නේ මුරගල යනු පඩිපෙළ අග රැඳී පුවරුව ලිස්සා ඒමට තබන ලද කුඤ්ඤයක් නොවන බව ය. මුරගල කොරවක්ගල් දොරටු සැලැස්මේ අලංකාරය හා අංග සම්පූර්ණත්වය සඳහා වූ අවශ්‍ය අංගයක් ලෙස යොදන ලද්දක් බව වික්‍රමගමගේ පෙන්වා දී ඇත (වික්‍රමගමගේ, 1995:23).

කෙසේ වුව ද දැනට ලංකාවෙන් ලැබී ඇති මුරගල් පිළිබඳ ව සිදු කරන ලද අධ්‍යයන අනුව මුරගල තුළින් යම්කිසි විකාශයක් සිදු වී ඇති බව උගතුන් පෙන්වා දී තිබේ. ඒ අනුව මුරගල් වර්ගීකරණයක් මේ ආකාරයට දක්වා තිබේ.

01. දෙකොණ හැඩ ගන්වන ලද හතරැස් ගල් පුවරුව

02. මුදුනේ ගැටියක් සහිත ව සකසන ලද මුරගල

03. පුන්කලස එක් වූ මුරගල

04. ශංක පද්ම රූප හා වාමන රූප එකතු වූ මුරගල

05. දිසාපාලක රූප එක්වූ මුරගල

06. මකර තොරණක් එකතු වූ මුරගල වශයෙනි

(වික්‍රමගමගේ,1995:23).

මුරගලේ පළමු පියවර කැටයම් රහිත මුදුණේ දෙකොණ හැඩ ගැන්වූ දිගු හතරැස් මුරගල වේ. කාලය අතින් වඩාත් පැරණි වේ. මෙහි දෙ වැනි පියවරේදී වර්ධනයකුත් දැකිය හැකි ය. මුරගල මුදුණේ ගැටියක් වීම මෙහි දැකිය හැකි ය. තුන් වැනි අවස්ථාව පුන්කලස එකතු වීමයි. සෞභාග්‍යය, සශ්‍රීකත්වය හා ජයග්‍රහණය සංකේතවත් කරන පුන්කලස ලංකාවේ මංගල වස්තුවක් මෙන් ම ගොඩනැගිලිවලට අලංකාරය ගෙන දෙන්නෙකි. මුරගලේ හතර වැනි අවස්ථාව ලෙස සංඛ පද්ම රූප එක්වීම දැකිය හැකි ය. පැරණි මුරගල්වල සංඛ පද්ම යෙදූ බහිරවයන්ගේ හිස තනා ඇත. මෙහි පස් වැනි අවස්ථාව සතර වරම් දෙවියන්ගේ රූප වේ. **ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ**, සහ **වෛශ්‍රවණ** වේ. මුරගලේ දිශාව නියෝජනය කිරීමට සිව්පා රූප යොදා ගෙන ඇත. පසු කාලීන ව දිසාපාලක මහ රජුන්ගේ රූප ඔවුන්ගේ භාර්යාවන්



සමගින් මුරගල වේ. දිසාපාලක මහ රජුන් සමභංග හෝ ත්‍රිභංග ඉරියව්වෙන් ඔසවන ලද දකුණු අතින් පුන්කලස් ද ඉගටියෙහි රඳවන ලද වමතින් මල් කොළ සහිත අත්තක් හෝ මල් දුන්නක් රැගෙන රජ ඇඳුම් හා සියලු රාජාභරණවලින් සැරසී සිටින බව පෙනේ. මෙසේ දිසා පාලක මහ රජවරුන්ගේ මුරගලට එක් වූවාට පසු කලින් බහිරවයෝ මහ රජවරුන්ගේ සේවකයන් බවට පත් වූහ (එම:23).

## 5.2 ජේතවනාරාමයේ මුරගල්

ජේතවනාරාම පුරාණ විහාරය ඇසුරින් සිදු කරන ලද විමර්ශනයේ දී මුරගල් 115 ක් පමණ හඳුනාගන්නා ලදි. එම මුරගල්වල නිර්මාණය අනුව එවා කොටස් කිහිපයක් යටතේ මෙසේ වර්ග කළ හැකි ය.

1. දෙකොණ හැඩ ගන්වන ලද සෘජුකෝණාස්‍රාකාර කැටයම් රහිත මුරගල
2. මුදුණ ගැටියක් සහිත දෙපස හැඩ කරන ලද සෘජුකෝණාස්‍රාකාර පහළ පිටතට කට්ටයක් බේරූ කැටයම් රහිත මුරගල
    - 2.1. මුදුණ ගැටියක් රහිත දෙපස හැඩකරන ලද සෘජුකෝණාස්‍රාකාර ඉදිරිපස කට්ටයක් බේරූ මුරගල
    - 2.2. මුදුණ ගැටියක් සහිත දෙකොන හැඩ ගන්වන ලද සෘජුකෝණාස්‍රාකාර කැටයම් රහිත මුරගල
    - 2.3. මුදුණ ගැටියක් සහිත දෙපස හැඩ කරන ලද පහළ බොරදම්වලින් යුත් සෘජුකෝණාස්‍රාකාර මුරගල
3. මුදුණ අර්ධ වෘත්තාකාර හඩැති කැටයම් රහිත මුරගල
    - 3.1. මුදුණ අර්ධ වෘත්තාකාර පහළ එක්පසක් පිටතට වක් වූ කැටයම් රහිත මුරගල
4. පුන්කලස එක් වූ මුදුණ ගැටියක් සහිත සෘජුකෝණාස්‍රාකාර පහළ බොරදම් සහිත මුරගල

4.1. පුන්කලස එක් වූ පහළ බොරදම් සහිත මුදුණ ගැටියක් රහිත මුරගල

4.2. පුන්කලස එක් වූ මුදුණ අර්ධ කවාකාර මුරගල

5. ශංඛ පද්ම රූප එකතු වූ මුරගල

6. දිසාපාලක රූප එකතු වූ මුරගල

6.1. නාගපෙන පහක් සහිත දිසාපාලක රුව සහිත මුදුණ රවුම් මුරගල

6.2. නාගපෙන හතක් සහිත දිසාපාලක රුව සහිත මුදුණ රවුම් මුරගල

6.3. නාගපෙන නවයක් සහිත දිසාපාලක රුව සහිත මුදුණ රවුම් මුරගල

6.4. නාගපෙන එකතු වූ දිසාපාලක රුව සහිත මුදුණ් උල් සහිත මුරගල

**01. දෙකොණ හැඩ ගන්වන ලද සෘජුකෝණාස්‍රාකාර කැටයම් රහිත මුරගල**

ජේතවනාරාම විහාරයේ මෙම හැඩයේ මුරගල් ආරාම සී (1) ගොඩනැගිලිවල දැකගත හැකි ය. ප්‍රධාන සැලසුමට අනුව (එෆ්) පංචාවාස සංකීර්ණයේ (එෆ් 44) ඩී ආරාම සංකීර්ණයේ ආදී ආරාම ගොඩනැගිලිවල දැකගත හැකි ය. මෙම මුරගල ඉහළ දෙකොණ හැඩගන්වා ඇති අතර සෘජුකෝණාස්‍රාකාර හැඩයක් ගනී.

**02. මුදුණ ගැටියක් සහිත දෙපස හැඩකරන ලද සෘජුකෝණාස්‍රාකාර කැටයම් රහිත පහළ පිටතට කට්ටයක් බේරූ කැටයම් රහිත මුරගල**

මෙම හැඩයේ මුරගල තුළ මුදුණ ගැටියක් සහිත වන අතර දෙපස හැඩකර ඇත. එහි පහළ කට්ටයක් පිටතට බේරා ඇත. මෙම මුරගල් ආරාම එෆ් (45) හා ස්තූපයේ නැගෙනහිර ද්වාර මණ්ඩපය ස්තූපයේ දකුණු පියගැට පෙළ ආදී ස්ථානවල දැකගත හැකි ය.



**2.1 මුදුණ ගැටියක් සහිත දෙපස හැඩ කරන ලද ඉදිරියට පමණක් කට්ටයක් බේරූ කැටයම් රහිත මුරගල**

මුදුණ ගැටියක් සහිත දෙපස හැඩ කරන ලද මෙම මුරගලෙහි පහළ ඉදිරිපස පමණක් කට්ටයක් බේරා ඇත. මෙම හැඩයේ මුරගල් ජේතවන ස්තූපයේ බටහිර ද්වාර මණ්ඩපයේ දැකගත හැකි ය.

**2.2 මුදුණ ගැටියක් සහිත දෙකොණ හැඩගස්වන ලද කැටයම් රහිත සෘජුකෝණාස්‍රාකාර මුරගල**

මෙම හැඩයේ මුරගල්වල මුදුණේ ගැටියන් දැකගත හැකි ය. ඉහළ දෙපස හැඩකර ඇති සෘජුකෝණාස්‍රාකාර හැඩයක් මෙහි දැකගත හැකි ය. ජේතවනාරාම ආරාම සංකීර්ණයේ 'සී' (1), 'බී' (3), 'අයි' (20), බෝධිඝරයේ නැගෙනහිර ප්‍රාකාරයේ, 'ඩී' පංචාවාස සංකීර්ණයේ ස්තූපයේ උතුරු ද්වාර මණ්ඩපයේ ද 'එච්' (39), 'එෆ්' (38), 'බී' (41), 'අයි' (217, 'ජේ' (25), 'ඒ' (04), 'ඊ' (23) පිළිම ගෙය අංක 01 හි මෙම මුරගල් දැකගත හැකි ය.

**2.3 මුදුණ ගැටියක් සහිත දෙපස හැඩ කරන ලද කැටයම් රහිත බොරදම්වලින් යුත් මුරගල**

මෙම හැඩයේ මුරගල තුළ මුදුණ ගැටියක් සහිත ව දෙපස හැඩ ගන්වා ඇත. කැටයම් රහිත වේ. පහළ කොටස බොරදම්වලින් අලංකාර කර ඇත. මෙම මුරගලක් දානශාලාවට උතුරින් ප්‍රවිෂ්ටයේ දැකගත හැකි ය. එය ම 'ඒ' සංකීර්ණයේ පොකුණක දැකගත හැකි ය.

**03. මුදුණ අර්ධ වෘත්තාකාර හැඩ කැටයම් රහිත මුරගල**

මෙම හැඩයේ මුරගල් ජේතවනාරාම විහාරයේ දැකගත හැකි ය. මුරගල මුදුණේ හැඩය අර්ධවෘත්තාකාර වන අතර කැටයම් රහිත වේ. 'සී' පංචාවාස සංකීර්ණයේ නැගෙනහිර දිශාවේ ගල් උළුවස්සක 'සී' (6), 'බී' (3), බෝධිඝරයේ නැගෙනහිර ප්‍රාකාරය යන තැන්වල ද මෙම මුරගල දැකගත හැකි ය.

### 3.1 මුදුණ අර්ධ වෘත්තාකාර මුරගල පහළ එක් පසක් වක්ව නිර්මාණය කරන ලද කැටයම් රහිත මුරගල

මෙම හැඩයේ මුරගල් මුදුණ් රවුම් වේ. එහි එක් පසක් මුදුණ් කොටසට වඩා පිටතට පන්නා ඇත. එය වක් වූ ආකාරයට වේ. මෙම 'ඊ' පංචාවාස සංකීර්ණයේ අංක 28 ගොඩනැගිල්ල තුළ දැකිය හැකි ය.

### 04. පුන්කලස එක් වූ මුදුණ ගැටියක් සහිත සෘජුකෝණාස්‍රාකාර මුරගල

මෙම හැඩයේ මුරගල මුදුණ ගැටියක් සහිත එහි මැද පුන්කලස කැටයම් කර ඇත. සෘජුකෝණාස්‍රාකාර වේ. ආරාම 'ජී' සංකීර්ණයේ ගොඩනැගිල්ලක 'ඒ' ආරාම සංකීර්ණයේ පොකුණෙහි දැකගත හැකි ය. මුරගලේ පහළ බොරදම කැටයම වේ.

### 4.1 පුන්කලස එක් වූ මුදුණ ගැටියක් රහිත පහළ බොරදම් කැටයමින් යුත් සෘජුකෝණාස්‍රාකාර මුරගල

මෙම හැඩයේ මුරගල පෙර සඳහන් කරන ලද මුරගලට වඩා වෙනස් වන්නේ මුදුණේ ගැටියක් නොමැතිකම පමණි. මෙවන් මුරගලක් ස්තූපයේ දකුණු ද්වාර මණ්ඩපයේ දැකගත හැකි ය.

### 4.2 මුදුන අර්ධ කවාකාර පුන්කලස එකතු වූ මුරගල

මෙම හැඩයේ මුරගල් ජේතවන බෝධිඝරය තුළ ඇත. මෙහි විශේෂත්වය වන්නේ දිගටි හැඩ මෙම මුරගලේ පුන්කලසට පළා පෙත්ත එකතු වී තිබීමයි.

### 05. ශංඛ පද්ම රූප එකතු වූ මුරගල

මෙම කැටයම සහිත එක ම මුරගලක් ජේතවනාරාම විහාරයේ පොහොය ගෙය පිවිසුම ද්වාර මණ්ඩපයේ දැකගත හැකි ය. එය සෘජුකෝණාස්‍රාකාර හැඩයෙන් යුක්ත වේ.

### 06. දිසාපාලක රූප එකතු වූ මුරගල

මෙම කැටයම එකතු වූ මුරගල් ජේතවනාරාම විහාරය ඇසුරින් දැකගත හැකි ය. මෙම කැටයමේ ස්වභාවය අනුව වර්ග හතරක් තිබේ.



### 6.1 නාගපෙන පහක් සහිත දිසාපාලක රුව එකතු වූ මුරගල

මෙම මුරගලේ මුදුණේ හැඩය රවුම් වන අතර දිසාපාලක රුවෙහි නාගපෙන පහක් දැකගත හැකි ය. මල් දුන්නක් එක් අතකින් හා අනෙක් අතින් පුන්කලසක් ද දැකගත හැකි ය. දිසාපාලක රුව පාමුල වාමන රූපයක් දැකගත හැකි අතර මුරගල පසෙක කණුවක් මත සිංහ, ඇත්, අශ්ව, වෘෂභ ආදී රූප වේ. නාගපෙන පහ සහිත මුරගල් 'බී' (2), 'අයි' ආරාම සංකීර්ණය, 'ජේ' ආරාම සංකීර්ණයේ 'කේ' (30), 'කේ' ආදී ගොඩනැගිලිවල දැකගත හැකි ය.

### 6.2 නාගපෙන හත සහිත දිසාපාලක රුව එකතු වූ මුදුණ රවුම් මුරගල


ඉහත මුරගලෙහි ආකෘතියට බොහෝ සමාන වන අතර එහි වෙනස වන්නේ නාගපෙන හතක් එකතු වී තිබීමයි. මෙම කැටයම් සහිත මුරගල් ජේතවනාරාමයේ ආරාම 'ඩී' (8), 'ඊ' (24), 'සී' (6) ගොඩනැගිලිවල දැකගත හැකි ය.

### 6.3 නාගපෙන නවයක් සහිත දිසාපාලක රූප එකතු වූ මුදුණ රවුම් මුරගල

ඉහත ආකෘති දෙක ම සමාන වන අතර විශේෂය වන්නේ නාගපෙන නවයක් එකතු වීමයි. මේ හැඩයේ මුරගල් ආරාම 'කේ' (36) ගොඩනැගිල්ල තුළ දැකගත හැකි ය.

### 6.4 නාගපෙන එකතු වූ දිසාපාලක රුව සහිත මුදුණ උල් හැඩයක් සහිත මුරගල

මෙම මුරගලේ එක ම විශේෂත්වය වන්නේ මුදුණ අර්ධ වෘත්තාකාර නොවී උල් හැඩයකට සකසා තිබීමයි. මෙම මුරගලක් 'ඊ' ආරාම සංකීර්ණයේ අංක 24 ගොඩනැගිල්ල තුළ දැකගත හැකි ය. ජේතවනාරාම විහාරයේ දැකගත හැකි මුරගල් එහි නිර්මාණාත්මක ස්වරූපයන් අනුව මේ ආකාරයේ වර්ග කිරීමකට ලක්කළ හැකි ය.



ජේතවනාරාමයේ මුරගල්

## 5.3 කොරවක්ගල

දොරටුවල පඩිපෙළ දෙපස පළමුවෙන් ගඩොලින් කරන ලද කොරවක් බැමි තිබූ බවට සාධක දඹුල්ලේ සෝමාවතී චෛත්‍යයේ කැනීම්වලින් සොයාගෙන ඇත (වික්‍රමගමගේ, 1995:29). මෙයට අමතරව කොක්එබේ වදකහගලහින්න විහාරයේ හා කුළුමීමාකඩ ද මෙවැනි ගඩොලින් තැනූ කොරවක්ගල් වේ. ගොඩනැගිලි සෑදීම පිණිස ගඩොල්වලින් පසු ව ගල් භාවිත කිරීම සමඟ ම කොරවක්ගල කැපීපෙනෙන ලක්ෂණයන්ගෙන් යුක්ත විය (එම). කොරවක්ගල විකාශන අවස්ථා කිහිපයකි.

1. සරළ ලෙස පඩිපෙළේ හැඩය අනුව නැමී හා වක සහිත ව හෝ තනි ගලෙන් තැනූ කොරවක් ගල්
2. ඉහත හැඩ සහිත කොරවක් ගල් සඳහා ජ්‍යාමිතික රේඛා යෙදීම



3. ලියවැල එක් වූ කොරවක් ගල
4. මකර කට හා ලියවැල එක් වූ කොරවක් ගල (එම)

පරණවිතානගේ මතයට අනුව ලියවැල එක්වීම සශ්‍රීකත්වයේ ලක්ෂණයක් ලෙස සැලකේ. මකර කටින් නිරූපණය වන්නේ කාලය නමැති මකරා මිනිසා ගොදුරු කරගැනීම බවත් පසු ව ඇත් හොඬය එයට අන්තර්ගත කිරීමෙන් ජලය නිරූපණයට උත්සහ කිරීමක් විය හැකි බව ඔහු ප්‍රකාශ කර තිබේ (සය වැනි වෙ. 18:34 - 356). මකර කටින් නිකුත්වන ලියවැල, මකරාගේ දිව ලෙස බැලූ බැල්මට පෙනේ. එය මකර කටින් විහිදී යන ආකාරය දැක්වීමෙන් අදහස් කරන්නට ඇත්තේ සුන්දර වස්තු වුව ද විනාශය ජන්ම කර ඇති බව ය. මකරා කාලය සංකේතවත් කරන අතර කාලය විසින් සුන්දර වස්තු කා දමන බව වික්‍රමගමගේ මතය වී තිබේ (වික්‍රමගමගේ,1995:29). ඔහුගේ අදහස්වලට අනුව ඒ ඒ සංස්කෘතියට අනුව මකරා අර්ථවත් වේ. බෞද්ධ පිළිගැනීමට අනුව මකරා යනු කාලයයි. ආදී බෞද්ධ ත්‍රිපිටක ග්‍රන්ථවල මකරා ගැන සඳහන් වේ (එම).

අනුරාධපුර හා ලංකාවේ අනෙකුත් පැරණි බෞද්ධ විහාරවල දොරටු මණ්ඩප කැටයම් අතර කොරවක් ගල ඉතා ම කලාත්මක අංගයක් ලෙස දක්නට ලැබේ. යුගයෙන් යුගයට කොරවක් ගල් ආශ්‍රිත ව සිදු වූ විවිධ නිර්මාණාත්මක වෙනස්කම් ද මේ අතර කැපීපෙනේ. අනුරාධපුර යුගයේ මකර රුවට වඩා පොළොන්නරු යුගයේ මකර රුව සතුන් කිහිප දෙනෙකුගේ සංකලනයෙන් යුත් එකක් වූ බව පෙනේ. එසේ ම දඹදෙණි රාජධානි සමයේ දී එයට ඇත් රුව ද ගම්පොළ යුගයේ දී ගජසිංහ රුව ද කොරවක් ගලට එක් වීම මෙයට හොඳ ම උදාහරණ ලෙස වික්‍රමගමගේ පෙන්වා දී ඇත (එම: 31 - 32).

අනුරාධපුර යුගයට අයත් ජේතවනාරාම විහාරය තුල ඇති පාෂාණයෙන් තැනූ පැරණි කොරවක් ගල් පහත සඳහන් ආකාරයෙන් වර්ග කර පෙන්විය හැකි ය,

1. තනි ගල් පුවරුවක් ලෙස තනා ඇති නැමි රහිත කොරවක් ගල

2. පඩිපෙළක හැඩය අනුව සරල ලෙස තැනූ එක් රේඛාවක් පමණක් මතුකර පෙන්වූ නැමි සහිත කැටයම් රහිත කොරවක් ගල
   2.1. පඩිපෙළේ හැඩය අනුව තැනූ එක් රේඛාවක් පමණක් මතුකර පෙන්වූ නැමි සහිත කොරවක් ගල
   2.2. පඩිපෙළේ හැඩය අනුව ජ්‍යාමිතික රේඛා කිහිපයක් එක් වූ නැමි සහිත කොරවක් ගල
3. කැටයම් රහිත රේඛාව පමණක් ඇති නැමි හා වක සහිත කොරවක් ගල
   3.1. කැටයම් සහිත රේඛා කිහිපයක් එකතු වූ නැමි හා වක සහිත කොරවක් ගල
4. ලියවැල හා මකර රුව එකතු වූ කොරවක් ගල
   4.1. මකර හිස මුදුණේ ගැටියක් සහිත කොරවක් ගල
   4.2. මකර හිස මුදුණේ ගැටියක් නොමැති කොරවක් ගල
   4.3. මත්ස්‍ය මකරා එක් වූ කොරවක් ගල
5. මකර රුව හිස හා පැත්තෙන් සිංහ රුව එක් වූ කොරවක් ගල

**01. තනිගල් පුවරුවක් ලෙස තනා ඇති නැමි රහිත කොරවක්ගල**

ජේතවනාරාම විහාරයේ කොරවක් ගල් අතර, සුවිශේෂී හැඩයේ කොරවක් ගල් ලෙස තනිගල් පුවරුවක් ලෙස හතරැස් හැඩයේ නිර්මාණය කර ඇති කැටයම් රහිත කොරවක්ගලක් දානශාලාවට නැගෙනහිර පස වූ අංක 32 ගොඩනැගිල්ල දැකගත හැකි ය. මෙහි විශේෂත්වය වන්නේ කොරවක්ගල හා මුරගල එකම ගල් පුවරුවක් තුළින් නිර්මාණය කර තිබීමයි.

**02. පඩිපෙළේ හැඩය අනුව සරල ලෙස තැනූ නැමි සහිත කැටයම් රහිත කොරවක්ගල**

පඩිපෙළේ හැඩය අනුව සරල ලෙස කැටයම් රහිත නැමි කොරවක්ගල් විශාල ප්‍රමාණයක් ජේතවනාරාම විහාරය ආශ්‍රයෙන් දැකගත හැකි ය. මෙම කොරවක් ගල ගොඩනැගිලිවල ප්‍රමාණ



අනුව විවිධ ප්‍රමාණවලින් දැකගත හැකි ය. එවැනි හැඩයේ කොරවක් ගල් 'සී' හා 'ඩී' ආරාම සංකීර්ණ අතර වූ දොරටු මණ්ඩපය තුළ 'ඩී' ආරාම සංකීර්ණයේ, 'සී' ආරාම සංකීර්ණයේ උතුරු ප්‍රවේශය, 'ඊ' ආරාම සංකීර්ණය, 'එෆ්' ආරාම සංකීර්ණය (38), 'එෆ්' (41), 'කේ' (35), 'කේ' (41), 'එල්' (2), 'එල්' (16) යන ආරාමවල දැකගත හැකි ය.

**2.1 පඩිපෙළේ හැඩය අනුව එක් රේඛාවක් පමණක් මතුකර පෙන්වූ නැමි සහිත කොරවක්ගල**

මෙම වර්ගයේ නිර්මාණ ලක්ෂණ ඉහත කොරවක් ගල් ආකෘතියට ම සමවන අතර, මෙහි විශේෂත්වය වන්නේ කොරවක් ගලේ ඉහළ එක් රේඛාවක් පමණක් මතුකර තීරුව පෙන්වා තිබීම යි. මෙවැනි හැඩයේ කොරවක් ගල් ජේතවනාරාම විහාරයේ නැගෙනහිර පස (දානශාලාවට නැගෙනහිරින්) පිහිටන පොකුණේ දකුණු පිවිසුමේ දැකගත හැකි ය.

**2.2 පඩිපෙළේ හැඩය අනුව ජ්‍යාමිතික රේඛා කිහිපයක් එක් වූ නැමි සහිත කොරවක්ගල**

ඉහත කොරවක් ගල් ආකෘතියට ම සමවන නිර්මාණයක් වන මෙම කොරවක් ගලෙහි විශේෂත්වය වන්නේ කොරවක් ගලේ ඉහළ රේඛා කිහිපයකින් සටහන් කර තිබීමයි. එය ජ්‍යාමිතික හැඩයට අනුව කර ඇති අතර එවැනි කොරවක් ගල් ආරාම අංක 'ඊ' (35) 'ඒ', 'එෆ්' (43), පිළිමගේ අංක 01, ස්තූපයේ ද්වාර මණ්ඩපය දානශාලාවට නැගෙනහිර අංක 31 හා බෝධිඝරයේ උතුරු පිවිසුම් දොරටුවේ දැකගත හැකි ය.

**03. කැටයම් රහිත රේඛාව පමණක් ඇති නැමි හා වක සහිත කොරවක්ගල**

මෙම කොරවක් ගල මකර රුව එක් වීමට ප්‍රථම නිර්මාණය වූ කොරවක් ගලක් බව උපකල්පනය කළ හැකි ය. කොරවක් ගල් ආකෘතිය අනුව එහි මකර කොරවක් ගලට සමාන තත්ත්වයක් පෙන්වුව ද එහි මකර රුව හෝ කැටයම් නොමැත. නමුත් එහි ඉහළ මකර රුවේ ලියවැලට සමාන ආකාරයෙන් රේඛාවක් කැටයම් කර ඇත. මෙවැනි ආකෘතියේ කොරවක් ගල්

ජේතවනාරාම විහාරයේ ආරාම 'බී' (14), 'ඩී' (8), 9 'ඒ' පිවිසුම, 'ඊ' (26), 'එෆ්' (40) පිළිමගේ අංක 01 (40) යන ගොඩනැගිලි තුළ දැකගත හැකි ය.

**3.1 කැටයම් සහිත රේඛා කිහිපයක් එකතු වූ නැම් හා වක සහිත කොරවක්ගල**

මෙම කොරවක් ගල තුළ මකර රුව එක් නොවී ඇති අතර කොරවක් ගල් නැම් හා වක හැඩයට රේඛා කිහිපයක් කැටයම් කර ඇත. මකර රුව කොරවක් ගලට එක් වීමට ප්‍රථම ව නිර්මාණය වූ කොරවක් ගලක් ලෙස මෙය හඳුනාගත හැකි අතර මෙවැනි හැඩයේ කොරවක් ගල් ජේතවනාරාම විහාර ආරාමයේ ආරාම 'එච්' (10), 'ජී' (1), 'එච්' (9), 'අයි' (20), 'අයි' (21) යන ගොඩනැගිලිවල දැකගත හැකි ය.

**4. ලියවැල හා මකර රුව එක් වූ කොරවක්ගල**

ජේතවනාරාම විහාරයේ මෙම හැඩයේ කොරවක් ගල් තුළ දැකගත හැකි විශේෂ ලක්ෂණය නම් ලියවැල මකර රුවට එක් වී තිබීමයි. මෙම මකර රුව එක් වූ කොරවක් ගල තුළින් ද ආකෘති තුනක් ජේතවනාරාම විහාරය ඇසුරින් හඳුනාගත හැකි ය. ඒවා නම්,

**4.1 මකරහිස මුදුනේ ගැටියක් සහිත කොරවක්ගල**

මෙම කොරවක් ගල් මකර රුව මුදුනේ ගැටියක් දැකගත හැකි යිවීම විශේෂ ලක්ෂණයකි. මකර මුවින් ලියවැල නික්මෙන අතර මකර රුව අලංකාර ව කැටයම් කර ඇත. මෙවැනි ආකාරයේ කොරවක් ගල් ආරාම 'එල්', 'ඩී' (12), 'ඩී' (23), 'ජේ' (26) යන ගොඩනැගිලි තුළ දැකගත හැකි ය.

**4.2 මකර හිස මුදුණේ ගැටියක් නොමැති කොරවක් ගල**

මෙම කොරවක් ගල් පෙර සඳහන් කොරවක් ගල් ආකෘතියෙන් වෙනස් වන්නේ මකරාගේ හිස මුදුනේ ගැටියක් නොමැති විම මත ය. මෙම ආකෘතියේ කොරවක් ගල් ආරාම 'කේ' (39), 'බී' (2), 'ඊ' (35) ගොඩනැගිලිවල දැකගත හැකි ය.




**4.3 මත්ස්‍ය මකරා එක් වූ කොරවක්ගල**

ජේතවනාරාම විහාරය ඇසුරින් හමු වූ සුවිශේෂී කොරවක් ගල් ලෙස මෙම කොරවක් ගල පෙන්වාදිය හැකි ය. මෙහි ආකෘතිය මකර මුඛය හා මත්ස්‍ය මුඛය සම්බන්ධ කර නිර්මාණය කර ඇති අතර මකරාගේ කට ගොඩනැගිල්ල ඇතුළු පැත්තට යොදා ඇත. මෙම හැඩයේ කොරවක් ගල් ජේතවනාරාමයේ ධර්මශාලා ගොඩනැගිල්ල තුළින් දැකගත හැකි ය.


**05. මකර හිස හා කොරවක්ගල පිට පැත්තේ සිංහ රුව කැටයම් කරන ලද කොරවක්ගල**

අලංකාරය අතින් ඉතා ම අගනා කොරවක් ගල් ලෙස මකර හිස ලියවැල හා පිටත සිංහරුව කැටයම් කරන ලද කොරවක් ගල පෙන්වාදිය හැකි ය. ජේතවනාරාම විහාරය ඇරසුරින් මෙම වර්ගයේ එක් කොරවක් ගලක් පමණක් හමු වී ඇති අතර එය ආරාම එල් සංකීර්ණයෙන් වාර්තා වෙයි.

ජේතවනාරාම විහාරය ඇසුරින් හමු වූ කොරවක් ගල් ආකෘති අනුව වර්ග පහක් නියෝජනය වන බව පෙන්වාදිය හැකි ය.




තනිගල් පුවරුවක් ලෙස තනා ඇති නැම් රහිත කොරවක්ගල




පඩිපෙළේ හැඩය අනුව සරල ලෙස තැනූ නැම් සහිත කැටයම් රහිත කොරවක්ගල




පඩිපෙලේ හැඩය අනුව එක් රේඛාවක් පමණක් මතුකර පෙන්වූ නැම් සහිත කොරවක්ගල




කැටයම් රහිත රේඛාව පමණක් ඇති නැම් හා වක සහිත කොරවක්ගල







කැටයම් රහිත රේඛාව පමණක් ඇති නැමි හා වක සහිත කොරවක්ගල



ලියවැල හා මකර රුව එක් වූ කොරවක්ගල



මකරහිස මුදුනේ ගැටියක් සහිත කොරවක්ගල



මකර හිස හා කොරවක්ගල පිට පැත්තේ සිංහ රුව කැටයම් කරන ලද කොරවක්ගල

## 5.4 ජේතවනාරාම විහාර සංකීර්ණයේ බොරදම්

ජේතවනාරාම ආරාම සංකීර්ණයේ වාස්තුවිද්‍යා නිර්මාණයන්හි අලංකරණ අංග අතර බොරදම් කැපීපෙනෙන කලාත්මක අංගයකි. භාරතීය පුරාණ වාස්තුවිද්‍යාවේ බොරදම්වලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. සිරස් අතට පිහිටි සමතල පෘෂ්ඨයකින් නිර්ගම වූ එනම් ඉදිරියට නෙරා සිටින හෝ ප්‍රවේශ වන ඇතුළට ගිලා බැස ඇති අලංකරණ විශේෂය වාස්තුවිද්‍යාවේ බොරදම් නමින් හැඳින්වේ. නිතර ම ගොඩනැගිල්ලක පිටතින් යෙදෙන මෙම අලංකරණවලින් ඉටු වූ ප්‍රධාන මෙහෙය නම් එම ගොඩනැගිල්ලට සෞන්දර්යාත්මක පෙනුමක් ලබා දීම



වේ(මාරසිංහ,1994:18).

බොරදමින් අලංකෘත වන ප්‍රධාන වාස්තුවිද්‍යාත්මක අංග පහක් හඳුනාගත හැකි ය. ගොඩනැගිල්ලක අධිෂ්ඨානය ප්‍රාකාරයක බිත්තියක මුහුණත ප්‍රතිමාවක් පිහිටුවා ඇති ආසන හා ගොඩනැගිල්ලක උපරි භාගය සරසා සිටින පඤ්ජර ඒවා වේ (එම). බොරදම් අතර ප්‍රධාන බොරදම හා උප බොරදම් වශයෙන් වර්ග දෙකකි. ප්‍රධාන බොරදම් උසින් වැඩි ය. සෙසු බොරදම්වලින් ඉදිරියට නෙරා සිටී. ඇතුළට නෙරා සිටින එක ම ප්‍රධාන බොරදම නම් **ගල** හෙවත් **කන්ධර** යයි. උප බොරදම් ප්‍රධාන දෙකකට මැදි ව සිටී. ප්‍රධාන බොරදම් සියල්ල ගණනින් දහයකි. එයින් හතරක් ඍජු රේඛීය මුහුණතකින් යුක්ත ය. මුහුණතින් යුත් බොරදම හතර උපාන හෙවත් **උපපාදුක**, **ජගතී කණ්ඨ** හෙවත් **ගල**, **පට්ටිකා** යනුවෙන් හැඳින්වේ (එම).

වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුයව බොරදම් යෙදිය යුතු පිළිවෙල හා වර්ග කිහිපයක් පැරැණ්නන් විසින් භාවිත කර ඇත. ගොඩනැගිලි අධිෂ්ඨාන වර්ග හයක් විස්තර කරන මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ග්‍රන්ථයේ අධිෂ්ඨානවලට අයත් වන බොරදම් රටාවන් හා බොරදම් ප්‍රමාණය ද දක්වා ඇත. එහි පළමු වැනි හා දෙ වැනි අධිෂ්ඨානවලට අයත් වන බොරදම් රටා දහ අටක් ද තුන් වැනි අධිෂ්ඨානය අයත් බොරදම් රටා දහසයක් ද හතර වැනි අධිෂ්ඨානය සඳහා බොරදම් රටා දහ අටක් ද පස් වැනි අධිෂ්ඨානය සඳහා බොරදම් රටා දහ නවයක් ද හය වැනි අධිෂ්ඨානය සඳහා බොරදම් රටා දහ හතරකින් ද යුක්ත වන බව දක්වා තිබේ (මාරසිංහ,1995:25).

පැරණි ගෘහ නිර්මාණකරණයේ දි අධිෂ්ඨානය උස් බවින් යුක්ත වීම නිසා එහි පිටත කිසියම් රටාවක් මගින් ඉතාමත් සෞන්දර්යාත්මක අගයක් ගොඩනැගිල්ලට ලබාදීමට බොරදම් භාවිත කළ බව පෙනේ. බොරදම්හි රටාවන් අධ්‍යයනය කිරීමෙන් එහි වර්ධනාත්මක අවස්ථාවක් හඳුනාගැනීම ද ඉතා වැදගත් වේ. බොරදම් රටාවන්හි වර්ගීකරණය මුලින් ම ආරම්භ කරනු ලැබුවේ අයර්ටන් විසිනි. බටහිර ආරාම කැනීම් කිරීමේ දී ගොඩනැගිලිවල දක්නට ලැබුණ පාද බොරදම් මගින් කිසියම් වාස්තුවිද්‍යාත්මක

ලක්ෂණ හඳුනාගැනීමට ඔහු උත්සාහ දරා ඇත. බොරදම් වර්ගීකරණය තවදුරටත් දියුණු කරනු ලැබුවේ හොර්කාට් විසිනි. ඔහු පබ්බත විහාර ආශ්‍රයෙන් බොරදම් වර්ග කිරීමටත් එයින් කළ කාලනිර්ණය දීමටත් උත්සාහ දරා ඇත. සේනක බණ්ඩාරණායක විසින් ද අනුරාධපුර හා පොළොන්නරු යුගවල බොරදම් රටා අධ්‍යයනය කර ඇත (Bandaranayake,1974: 382).

ජේතවන විහාරයේ බොරදම් අධ්‍යයනයේ දී අධිෂ්ඨානවල පිහිටීම බොරදම්වල ස්වභාවය හා ආකෘතිය සැළකිල්ලට ගෙන මෙම අධ්‍යයනය සිදු කිරීමට හැකි වුවත් මෙහි දී පැන නැගී ඇති ගැටළුවක් වන්නේ කාලයාගේ ඇවෑමෙන් සමහර ගොඩනැගිලි තුළ ව්‍යාකූලත්වයක් සහිත බොරදම් පසුකාලීන ක්‍රියාකාරීත්වයන් සමඟ යොදා තිබීම වේ. කෙසේ වෙතත් ජේතවන විහාරය ඇසුරින් බොරදම් රටා හයක් හඳුනාගත හැකි විය.

### 5.4.1 පළමු වැනි බොරදම් රටාව

මෙම බොරදම් රටාව අයත් වන්නේ ජේතවනාරාම විහාරයේ ගල් ගරාදි වැට සඳහා භාවිත කර ඇති බොරදම් රටාව මය. මෙම බොරදම් රටාව තුළ පහත සඳහන් බොරදම් දැකගත හැකි ය.

- වාජන සහිත පියන් ගල
- ගරාදි (තුන් ඇදණු වේදිය)
- පට්ටිකා
- කපෝත
- ආලිංග (තුන්පොට ආලිංග)
- ජගති
- උපාන වශයෙනි.

මෙම බොරදම් අතරින් කපෝතය හා ආලිංග යන බොරදම් සහිත හුණුගල් පුවරු කොටස් දෙකක් ශ්‍රී මහා බෝ මලුවේ දක්නට ලැබේ. ජේතවනාරාම බෝධිසරයේ බොරදම සඳහා මෙම ආදර්ශය මූලාදර්ශ වන්නට ඇති බව සිතේ. එසේ ම මෙම බොරදම් රටාවට සමාන තවත් නිදර්ශකයක් කතරගම කිරිවෙහෙරේ ඇතුළ් මළුවේ



ප්‍රාකාරයේ දක්නට ලැබේ (පුවිදෙපාවා,1960:VI). එහි විස්තර වන ආකරයට අවධි හයකට අයත් ඉදිකිරීම් කතරගම කිරිවෙහෙර සලපතර මළුවෙන් සොයා ගෙන ඇත. එමෙන් ම මැදිරිගිරිය වටදාගෙය ආසන්නයෙන් ගල් තලාවක් මත පිහිටි දාගැබක මළුවේ දක්නට ඇති ප්‍රාකාරයේ මෙම බොරදම් රටාව ම අනුග මනය කර ඇත (පුවිදෙපාවා,1968:VII). මෙම ස්ථාන සියල්ලක් ම පූජනීය අංග නිරූපණය වන බව ඓතිහාසික හා පුරාවිද්‍යා සාධක තහවුරු කරන බැවින් අනුරාධපුර මුල් යුගයේ සිට පැවති බොරදම් රටාවක් බව මේ අනුව අනාවරණය වේ.

### 5.4.2 දෙ වැනි බොරදම් රටාව

දෙවන බොරදම් රටාවට අයත් බොරදම තුළ දක්නට ලැබෙනුයේ,

- උපාන
- කපෝත
- අධඃකම්ප
- කණ්ඨ
- උර්ධව කම්ප
- පට්ටිකා අර්ධ වෘත්ත කම්ප

යන බොරදම් වෙයි. මෙම බොරදම් රටාව ජේතවනාරාමයේ වාහල්කඩ, ධර්මශාලාව, සන්නිපාතශාලාව යන ස්ථානවල දැකගත හැකි ය.

ඉහත බොරදම් අතරින් පාද බොරදම්වල දී වෘත්තාකාර කපෝතයක් හා ඍජු කෝණාස්‍රාකාර උපානය හා පට්ටිකාන් අනුරාධපුර මුල් කාලීන ගෘහ නිර්මාණ ලක්ෂණයන් බව බණ්ඩාරණායකගේ මතය වේ (Bandaranayake,1974:322). ධර්මශාලාවේ පහළ හා සන්නිපාත ශාලාවේ මණ්ඩපයේ බොරදම හුණුගල් භාවිත කර තනා ඇති අතර ගොඩනැගිල්ලේ පරිබාහිර බැම් නයිස් හා ග්‍රැනයිට් පාෂාණයෙන් නිර්මාණය කර ඇත.

### 5.4.3 තුන් වැනි බොරදම් රටාව

ජේතවන විහාරයේ ගොඩනැගිලිවල දක්නට ලැබෙන තුන් වැනි බොරදම් රටාව තුළ අන්තර්ගත වන්නේ,

- උපාන
- ආලිංග
- අර්ධ පද්ම
- වේත්‍ර
- කුමුද
- අර්ධඃකම්ප
- කණ්ඨ
- උර්ධව කම්ප
- පද්ම
- වාජන

පට්ටිකා යන බොරදම් අඩංගු රටාවක් මෙම බොරදම් රටාව යටිකුරු කළ පියුම් රටා සහිත අධිෂ්ඨාන තුළ දක්නට ලැබේ. මෙහි අර්ධඃපද්ම හා කුමුද කැපී පෙනෙන ප්‍රධාන බොරදම් දෙකක් වේ. මෙම අර්ධඃපද්ම බොරදම් වර්ගය පශ්චාත් අනුරාධපුර ආරාමයන්හි බහුල වශයෙන් දක්නට ලැබෙන බව බණ්ඩාරණායකගේ මතය වේ. (Bandaranayake,1974: 315 - 317). මෙම බොරදම් රටාව ඊ (35), පිළිම ගෙය (37) යන ගොඩනැගිලිවල දක්නට ඇත.

මෙහි අර්ධඃපද්ම බොරදම් කොටස් දෙකක් දැකගත හැකි ය.

I. පැතිරුණු ස්වභාවය

II. එක්වර ම ඉහළට එසවුණු ස්වභාවය

මෙම බොරදම් රටාව තුළ ඇති කුමුද යන බොරදම් රටාව අධිෂ්ඨානයක ඉදිරියට නෙරා සිටි නිර්ගම වූ ප්‍රධාන බොරදමකි. මෙහිදී ආකාර දෙකක් දැකගත හැකි ය.

I. අර්ධ කවාකාර වූ හැඩය



II. මුදුණ තිරස් වූ හැඩය යනුවෙනි.

අර්ධ කවාකාර හැඩය දොරටුවලින් තිරස් වූ හැඩය ගොඩනැගිලිවල දී බහුල ව යොදා ඇත. ඇතැම් තැනක කුමුදෙහි මුදුණත සිහින් රේඛා තුනක් ද දක්වා ඇත. මෙය අයි (17) දොරටුව උපෝසථඝරය හා දාගැබ් දොරටු මණ්ඩපවල දැක්වෙන අතර කුමුද අෂ්ටාස්‍ර කුමුද හෙවත් වෘත්ත කුමුද යන සණයට අයත් එකකි. අර්ධඃපද්ම හා කුමුද යන බොරදම් අංග දෙක ම නෙළුම් පෙති රටාවෙන් යුක්ත ව ධර්මශාලා ගොඩනැගිල්ලේ මධ්‍ය මණ්ඩපයේ දැකිය හැකි ය. මෙය 8 - නව වැනි සියවස්වලට අයත් බව බණ්ඩාරණායකගේ මතයයි (Bandaranayake,1974: 316). ගඩොල් ගොඩනැගිලි අධිෂ්ඨානයන්හි මුදුන් බොරදම් රටාව හඳුනාගැනීමට තරම් ශේෂ වූ ගොඩනැගිලි ජේතවනාරාමයේ නොමැති තරම් ය. බෙල්ගේ සැලසුම්වල දී මතුපිට කොටස් දැක්වෙන අතර ඒවා එක සමාන කොටසක් බව පෙන්වයි (ASCAR,1892).

### 5.4.4 හතර වැනි බොරදම් රටාව

මෙම බොරදම් රටාව තුළින් නියෝජනය වන බොරදම් වන්නේ

- උපාන
- ජගතී
- ආලිංග
- කපෝත
- වාජන
- අර්ධඃකම්ප
- කණ්ඨ
- උර්ධව කම්ප
- පට්ටිකා

මෙම බොරදම් රටාව 'ඩී' (8), 'ඩී' (12), 'ඩී' (16), 'එෆ්' (41),

'එච්' (9), පිළිම ගෙය (40), (42) යන වාස්තුවිද්‍යා නිර්මාණවල දැකගත හැකි ය. පිළිම ගෙය (40),(42) යන නිර්මාණවල කණ්ඨ කොටසේ කැටයම් ඵලක රාමු ද දක්නට හැකි ය. එහි සිංහ රූපය දැක්වෙන අතර බණ්ඩාරණායකගේ මතය වන්නේ මෙම ගොඩනැගිලි ක්‍රි.ව. දස වැනි සියවසට පමණ අයත් බව ය (Bandaranayake,1974: fig 122).

### 5.4.5 පස් වැනි බොරදම් රටාව

මෙම බොරදම් රටාව තුළින් දැකගත හැකි බොරදම් වර්ග වන්නේ,

- උපාන
- ජගතී
- කුමුද
- කණ්ඨ
- පට්ටිකා යන බොරදම් රටා ය.

මෙය දෙ වැනි හා තුන් වැනි බොරදම් රටාවෙන් වෙනස් වනුයේ ජගතියට හා කුමුද යන බොරදම්වලට මූලිකත්වය ලබාදීම නිසා ය. කුමුද බොරදම ආකාර දෙකකින් දැකගත හැකි ය. එය කවාකාර හා මුදුණ තිරස් හැඩගත් ස්වභාවයක් ගනී. සේනක බණ්ඩාරණායක පවසන ආකාරය මෙම බොරදම් රටාව ක්‍රි.ව. 8, 9 සියවස්වලට අයත් වේ. එසේ ම පන්කුලිය, විජයාරාමය, ඇතුළුනගර යන ස්ථානවල ඇති ගොඩනැගිලිවල ද මෙම බොරදම් රටාව දැකගත හැකි බව ඔහු පවසයි (Bandaranayake,1974:fig122). ජේතවනාරාමයේ ආරාම 'ඩී', 'එෆ්', 'ජී', 'එච්' යන සංකීර්ණවල මෙම බොරදම් රටාව දැකගත හැකි ය.

### 5.4.6 සය වැනි බොරදම් රටාව

මෙම බොරදම් රටාව තුළ,


- උපාන
- ජගති
- කණ්ඨ



- පට්ටිකා

යන බොරදම් රටා දක්නට ලැබීම තුළින් ගොඩනැගිල්ලේ පාදමට සෘජුකෝණාස්‍රාකාර බවක් ලබා දී ඇත. දොරටු හා කුඩා මණ්ඩප වැනි ගෘහ සඳහා මෙම බොරදම් රටාව ජේතවනාරාමයේ භාවිත කර ඇත. 'සී' (1), 'ã' (19), 'ඊ' (29) තුළ මෙම බොරදම් රටාව දැකගත හැකි ය. බණ්ඩාරණායක පවසන ආකාරයට බටහිර ආරාම, රිටිගල යන ආරාමවල මෙම බොරදම් රටා දැකගත හැකි වේ (Bandaranayake,1974).

මේ ආකාරයට ජේතවනාරාම විහාරයේ අඩංගු බොරදම් රටා හයක් දැකගත හැකි ය. සමස්තයක් ලෙස මේ සියලු ම අංග ගොඩනැගිල්ලේ අලංකාරය ඔප් නැංවීම උදෙසා නිර්මාණය කර ඇති බව පැහැදිලි වේ.



**ජේතවන විහාරයේ විවිධ ගොඩනැගිලිවල දක්නට ලැබෙන බොරදම් වර්ග**

## පරිශීලනය කරන ලද ග්‍රන්ථ හා ලිපි නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍ර

**ථූපවංසය,** 1996, සංස්. එච්.එම්. මොරටුවගම, පිටකෝට්ටේ, රත්න මුද්‍රණ ශිල්පියෝ.

දීපවංසය,1959, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

**නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය,** 1984 .,සංස්. බන්දුසේන ගුණසේන, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**මහාබෝධිවංසය,** 1891., සංස්. පී. සාරානන්ද හිමි, කොළඹ, ශාස්ත්‍රාලෝක මුද්‍රණාලය.

**සද්ධර්මරත්නාකරය,** 1955.,සංස්. කළපළුවාවේ දේවානන්ද ස්ථවිර, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

**සමන්තපාසාදිකා,** 1900., සංස්. යූ.එස්.ඩබ්. ධර්මකීර්ති, කොළඹ, ග්‍රන්ථාලෝක මුද්‍රණාලය.

**සද්ධර්මාලංකාරය,** 1954.,සංස්. මකුළුදූවේ පියරතන හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

**සිංහල බෝධිවංසය,** 1951 ., සංස්. වී. අමරමෝලි, කොළඹ, වැලම්පිටිය, ශ්‍රී ලංකා ප්‍රකාශන.

**බෝධිවංස ගැටපදය,** 1957., සංස්. රත්මලානේ ධර්මාරාම හිමි, ලංකා බෞදධ මණ්ඩලය.

**පැරකුම්බා සිරිත,** 1934., සංස් සිල්වා සී. ඇම්. ඩී ගුණසේන සහ සමාගම කොළඹ

**මහා බෝධිවංසය,** 1939., සංස් ඉන්ද්‍රසුමන ඩී. විද්‍යාවිලාස මුද්‍රණාලය අලුත්ගම

**මහාවංසය** (සිංහල) 1996 ., සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි; දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ, නුගේගොඩ, ගංගොඩවිල, සීමාසහිත දීපානි ප්‍රකාශන පෞද්ගලික සමාගම.



**මහාවංසය** (පාලි) 1959.,සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

**මජ්ජිම නිකායට්ඨ කථා** ( පපඤ්චසූදනී), සංස් ධර්මාරාම හිමි විද්‍යා සාගර මුද්‍රණාලය කොළඹ

**රසවාහිනී,** 1896, සංස්. සරණතිස්ස හිමි, කොළඹ, විද්‍යාසාර මුද්‍රණාලය.

**වංසත්ථප්පකාසිනී** (මහාවංස ටීකාව),1994., සිංහල අනුවාදය අකුරටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ; කැළණිය විශ්වවිද්‍යාලය.

**ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය,** 1999.,ඩබ්.සෝරත හිමි, මරදාන, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**සිංහල විශ්ව කෝෂය,** 1970., IV කාණ්ඩය සංස් හෙට්ටිආරච්චි ඩී. ඊ, සංස්කෘතික දෙපාර්තුමේන්තුව

**දාඨාවංසය,** 1956, සංස් ආනන්ද එම්, සරසවි මුද්‍රණාලය ගම්පහ

**Chulavamsa,** 1929 ., eds .W.Geiger, London, Pali Text Society.

Depavamsa**,** 1879., tr.H.Oldenbarg: Edinburgh.

Fa- Hsien, 1957.,**A Record of Buddhist Countries** ,tr.Liyang-his:Oxford.

**Mahavamsa,** 1912., Tr.W.Giger, London, Oxford University Press.

**Ancient Inscription of Ceylon,** 1883., eds. E. Muller, Trubber: London.

**Archaeological Survey of Ceylon,** 1892., (Annual Report) by H.C.P. Bell, Government Printer: Ceylon.

1893 - (*ASCAR Report*) By H.C.P. Bell, Government Printer: Ceylon

1904 - (*ASCAR Report*) By H.C.P. Bell, Government Printer: Ceylon

1909 - (*ASCAR Report*) by H.C.P.Bell, Government Printer: Ceylon

1924 - (*ASCAR Report*) By A.M. Horcart, Government Printer: Ceylon

1950 - (ASCAR Report) By S. Paranavitana, Government Printer: Ceylon 1960 - (Annual Report) by C.E. Godakubura, Government Printer: Ceylon

1978 - (*ASCAR Report*) by Raja De Silva, Government Printer: Ceylon

**Ancient Ceylon No. 1**, 1972**,** eds. and published by the commissioner of Archaeology Department, Colombo

**Ancient Ceylon No. 2,** 1972, eds. and published by the commissioner of Archaeology Department, Colombo

**Ancient Ceylon No. 5,** 1985, eds. and published by the commissioner of Archaeology Department, Colombo

**Ancient Ceylon No. 6**, 1986, eds. and published by the commissioner of Archaeology Department, Colombo

**Epigraphia Zeylanica vol. I,** 1912, London, Oxford University Press.

**Epigraphia Zeylanica vol. II,** 1928, London, Oxford University Press.

**Epigraphia Zeylanica vol. III,** 1933, London, Oxford University Press.

**Epigraphia Zeylanica vol. IV,** 1944, London, Oxford University Press.

**Inscription of Ceylon Vol. I,** 1970, Colombo, Department of Archaeology.

**Inscription of Ceylon Vol. II,** 1983, Colombo, Department of Archaeology.

**Epigraphical Notes No. 13,** 1991, Colombo , Department of Archaeology.

**Epigraphical Notes No. 1-18,** 1991, Colombo, Department of Archaeology.




## ද්විතීයික මූලාශ්‍ර


අදිකාරී, ජී. 2005, ප්‍රාග් ඓතිහාසික උරුමය කළමනාකරණය 20-23 **පුරාතන,** මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, කෙළඹ.

අමරසේකර, ඒ.ඒ.ඩී. 1999, කැටයම්කරණය දක්වා ශ්‍රී ලංකාවේ සඳකඩ පහණ් වර්ධනය 1 - 9 **පර්යේෂණ සඟරා අංක 04** ,පුරාවිද්‍යා අධ්‍යනාංශය කැළිණිය විශ්වවිද්‍යාලය.

අදිකාරම්, ඊ. vi. 1969, **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය**

එල්ලාවල, හේම 1968, **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය**, කොළඹ, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

කරුණානායක, ආර්.එම්. 1967, පුග ශ්‍රේණිය හා මුදල්, **ගයිගර් සමරු කලාපය,** සංස්. ලබුහේන්ගොඩ චන්ද්‍රරතන , ධාරා පාලි සඟරා සම්පාදක මණ්ඩලය, 90/21,ඇවෙන්ඩැල් පාර, කොළඹ, 10, 67-76.

කුලතුංග, ටී.ජී.1998,**25 වන හය මාසික පුරාවිද්‍යා කැනීම් වාර්තාව,** අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය.

1998, පඤ්චාවාස 67-**70 සංස්කෘතික පුරාණය 3 වෙළුම 1** කලාපය, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය.

1999, අභයගිරි ස්තූපය හා ආරාම සංකීර්ණය, **අපේ සංස්කෘතික උරුමය (ද්විතීය භාගය)**, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය : 313-219.

2001,**අනුරපුර මහා විහාරය**, කර්තෘ ප්‍රකාශනයකි, නාවින්න,තරංජී ප්‍රින්ටර්ස්.

2001, **අනුරපුර ජේතවන විහාරය**, කර්තෘ ප්‍රකාශනයකි, නාවින්න, තරංජී ප්‍රින්ටර්ස්.

කුරුගල, ජේ. යූ. එස්. 1998, ශ්‍රී ලාංකික බෞද්ධ ප්‍රතිමාසරයේ ගන්ධ කුටි සම්ප්‍රදාය 11-19 **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව 3 වන කලාපය,** ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය මධ්‍යම සංස්කෘතික අරමුදල.

ගමලත්, ඩී. පී. 1997, ජේතවන ස්තූප ගර්භයේ ඉදිකිරීම් තාක්‍ෂණය 1-8 **සංස්කෘතික පුරාණය 2 වෙළුම 8 කලාපය** මධ්‍යම ංස්කෘතික අරමුදල සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය කොළඹ.

ජේතවන ස්තූප ගර්භයේ හා හතරැස් කොටුවේ ඉදිකිරීම් තාක්‍ෂණය **අප්‍රකාශිත කැණීම් වාර්තාව**, ජේතවන ව්‍යාපෘතිය, අනුරාධපුර.

ගොඩකුඹුර, සී. 1982, **සඳකඩ පහණ්** පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව කොළඹ.

තම්බයියා,පී. 1963, **ලංකාවේ වර්ෂාපනතනය**, සමන් ප්‍රකාශකයෝ. කොළඹ.

දැරණියගල, සිරාන් උපේන්ද්‍ර. 1990,පුරාවිද්‍යා කැණීම් 1890-1990 **පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය** (ශත සංවත්සරය), පළමු වෙළුම, පරි. කේ.බී. ඒ.එඩ්මන්, කොළඹ, රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව.

2000,ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා පූර්ව ඓතිහාසික ජනාවාස, **චිරන්තන ඓතිහාසික අධ්‍යයන සඟරාව අංක 04**, සංස්. ධම්මිකා මනතුංග සහ වෙනත් අය, ඊ.එම්.අයි.ජී. ඒකනායක, 74 ඒ/ 51, රද්දොළුවඃ සෙන්ට්‍රල් ගාර්ඩ්න්ස්ඃ76,95.

දිසානායක, සිසිර. 2009, **ජේතවන ස්තූප නැගෙනහිර ද්වාරය අසළ පර්යේෂණ කැණීම (අප්‍රකාශිතයි)**, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජේතවන ව්‍යාපෘතිය.

පරණවිතාන, සෙනරත්.1963, **ලංකාවේ ස්තූපය** රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුව කොළඹ.

බණ්ඩාරණායක, එස්. 1977, සඳකඩ පහණ් වර්ධනය **දිනමිණ වෙසක් කලාපය** ලේක්හවුස් ප්‍රකාශන කොළඹ.

බලගල්ලේ, ජී. 1995, **අෂ්ඨායතන හෙවත් අටමුල** 445-455 අපේ සංස්කෘතික උරුමය ප්‍රථම භාගය මධ්‍යම සංස්කෘතික අරමුදල සංස්කෘතික හා ආගමික කටයුතු ආමාත්‍යාංශය කොළඹ.

බණ්ඩාර, ටී. 1995, **ජේතවන ස්තූපයේ හතරැස් කොටුව කැනීම් වාර්තාව** අප්‍රකාශිතයි ජේතවන ව්‍යාපෘතිය අනුරාධපුර

බණ්ඩාර, ආර්. 1999, **අභිෂේක පූජෝත්සව සනාථ කෙරෙන පුරාවිද්‍යාත්ක සාධක** අප්‍රකාශිතයි ජේතවන ව්‍යාපෘතිය අනුරාධපුර.



බාලසූරිය,වි. 2000- 2001,මල්වතු ඔය වම් ඉවුර ගවේෂණය, **ජේතවනාරාරම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2000**, සංස්.සුදර්ශන් සෙනෙවිරත්න; පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයඃ 5-17.

බාලසූරිය, අයි. 2001, හාල්පානු ඇළ ගවේශණය, **ජේතවනාරාරම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2001** සංස්.සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

මනමේන්ද්‍රආරච්චි, කේ. එන් හා ජී. අදිකාරී. 2014, **අනුරාධපුර පුරා ජෛව විවිධත්වය හා වර්තමාන ජෛව විවිධත්වය**, ජෛව විවිධත්ව ලේඛම් කාර්යාලය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය.

මාරසිංහ, ඩබ්. 1993, **මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර**, නුගේගොඩ, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්.

1994, පුරාතන වාස්තු ශාස්ත්‍රයේ බොරදම් භාවිතය 18-22 **සංස්කෘතික පුරාණය 1 වෙළුම 8 කලාපය** මධ්‍යම සංස්කෘතික අරමුදල සංස්කෘතිකහ ා ආගමික කටයුතු අමාත්‍යාංහය කොළඹ.

මැන්දිස්,ටී. 1997, **ජේතවන ස්තූපයේ බටහිර ආයකය පර්යේෂණ කැනීම** මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

1998, **ජේතවන ස්තූපයේ බටහිර ආයකය පර්යේෂණ කැනීම** මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

මැන්දිස්,ටී. හා එස්. ලියනගේ, 1999, **ජේතවන ස්තූපයේ නැගෙනහිර ආයකය පර්යේෂණ කැනීම**, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

මැන්දිස්,ටී.2008, ජේතවන සුද්දගේ වත්ත ප්රයේෂණ පුරාවිද්‍යා කැනීම, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2000**, 37-51සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

2008, ජේතවන ස්තූප සලපතල මළුව පර්යේෂණ පුරාවිද්‍යා කැනීම, 58-74. **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2001**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

2008,ජේතවන ස්තූප සලපතල මළුව පර්යේෂණ හා පුරාවිද්‍යා කැනීම, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2002**, 20-42 සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

2008,ජේතවන ස්තූප දකුණු වැලිමළුව පර්යේෂණ පුරාවිද්‍යා කැනීම, **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2003**, 23-37සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක,, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

2008,ජේතවන ස්තූප උතුරු වැලි මළුව පර්යේෂණ පුරාවිද්‍යා කැනීම,22-28 **ජේතවන ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2004**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ .

2005/ 2006,ඉතිහාසයෙන් සැඟවුණු ප්‍රාග් ජේතවන අවධිය, 8-12 **වැලිපිළ පුරාවිද්‍යා සඟරාව (හය වැනි කලාපය)**, සංස්.ඩී.තුසිත මැන්දිස් සහ ආර්.පී. ජයතිලක, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

2009, ජේතවන ස්තූප සලපතල මළුව හා වැලිමළුව ආශ්‍රිත පුරාවිද්‍යා පර්යේෂණ කැනීම් ඇසුරෙන් හෙළිවන පූර්ව ජනාවාස තොරතුරු,13-2 **ජේතවන ස්තූප පුරාණය (සමරු කලාපය)** සංස්.පියතිස්ස සේනානායක, කොළඹ,මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ.

මැන්දිස්,ටී. සහ එස්. දිසානායක, 2008,ජේතවන බෝධිඝරය අසළ පර්යේෂණ කැනීම 2007,1-30 **ජේතවන වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2007**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කොළඹ .



මැන්දිස්, ටී. 2017, කොක්එබේ මෙගලිතික සුසාන භූමිය ආශ්‍රිත කැනීම, **මධ්‍ය යාන් ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව, 128-179** පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ,

රත්නායක,එච්. 1998,ජේතවන ස්තූපය හා ආරාම සංකීර්ණය, **අපේ සංස්කෘතික උරුමය (ද්විතීය භාගය)**, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, ආගමික කටයුතු අමාත්‍යාංශය.

රාහුල හිමි, ඩබ්, 1985,**ලක්දිව බුදු සමයේ ඉතිහාසය**, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ලබ්රෝයි, ජේ.එෆ් සහ තවත් අය 1964, **ලංකා විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය**, 1.1, කැළණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

රාජපක්ෂ, ඒ.එස්.ටී. 2000, ජේ. එස්. පී.11 පර්යේෂණ කැනීම **ජේතවනාරාම ව්‍යාපෘතිය වාර්ෂික පුරාවිද්‍යා වාර්තාව 2000**, සංස්. සුදර්ශන් සෙනෙවිරත්න සහ පියතිස්ස සේනානායක, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය. කොළඹ.

වත්තල, එස්. 1989, **අනුරාධපුර විහාරරාම**, මධ්‍යම සංස්කෘතික අරමුදල, ආගමික කටයුතු අමාත්‍යාංශය. කොළඹ

වනරතන, කේ.1970, **අනුරපුර නටඹුන්** ,මාතර

ලියනගමගේ, අමරදාස සහ රණවීර ගුණවර්ධණ. 1965, **අනුරාධපුර යුගය**, කැළණිය, කැළණිය විශ්වවිද්‍යාලය.

වික්‍රමගමගේ, චන්ද්‍රා. 1995,අභයගිරි සම්ප්‍රදාය,111-114 **අපේ සංස්කෘතික උරුමය (ප්‍රථම කාණ්ඩය)**, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල කොළඹ .

ජේතවනාරාම සම්ප්‍රදාය 137-143, **අපේ සංස්කාතික උරුමය (ප්‍රථම කාණ්ඩය)** සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය කොළඹ.

වික්‍රමගමගේ චන්ද්‍රා. 1990, **ස්තූප**, තරංජි ප්‍රින්ටර්ස් නාවින්න මහරගම

1995, **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු** , තරංජි ප්‍රින්ටර්ස් නාවින්න, මහරගම

වික්‍රමසිංහ, සුගත්. 1999, මහාවිහාරය හා මහා සීමාව ,**වැලිපිළ පුරාවිද්‍යා සඟරාව (තුන්වන කලාපය)**, සංස්.ගොඩමුණේ පඤ්ඤාසීහ හිමි සහ පත්බේරියේ ඥාණාලෝක හිමි, ඒකාබද්ධ පුරාවිද්‍යා උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

විජයසූරිය,විමල. 1995, මහාවිහාර සම්ප්‍රදාය, **අපේ සංස්කෘතික උරුමය, (ප්‍රථම භාගය)**, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා අගමික කටයුතු අමාත්‍යාංශයඃ69-83.

සිරිවීර,ඉන්ද්‍රකිර්ති 2001, **රජරට ශිෂ්ටාචාරය සහ නිරිත දිග රජධානිය**, මරදාන, දයාවංශ ජයකොඩි සහ සමාගම.

සිල්වා, රෝලන්ඩ්.1998, අනුරාධපුර නගරය හා තදාශ්‍රිත ආගමික සිද්ධස්ථානවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ, **අපේ සංස්කෘතික උරුමය (ද්වීතය භාගය)**, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයඃ295-312.

සෙනෙවිරත්න, සුදර්ශන්. 1987, ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජන සම්මිශ්‍රණය පිළිබඳ ව අධ්‍යයනයක් "බරතවරු”, **යාත්‍රා** (කලාප අංක 1),67-84 පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ලංකා සමාජ ගවේෂණ සංගමය,

1994, **ශ්‍රී ලංකාවේ ලෝහ තාක්ෂණයේ ආරම්භය**, සංස්කෘතික දෙපාර්තුමෙන්තුවේ ප්‍රකාශනයක්

1996, උත්තර මලය රට්ඨයේ ප්‍රාථමික යකඩ යුගයේ ඛනිජ සම්පත් පරිහරණයේ ඓතිහාසික පුරාවිද්‍යාව,184-199 **ඓතිහාසික මහනුවර**, මහනුවර, ශ්‍රී සුමංගල විද්‍යාලයීය බෞද්ධ සංගමය.

1996, **පර්යන්ත ප්‍රදේශය හා ආන්තික ප්‍රජාවෝ, ශ්‍රී ලංකාවේ මුල් අයස් සමයේ ද්‍රව්‍යය හා සමාජ සැදුම් පිලිබඳ විකල්ප තේරුම් කිරීමක් කරා**, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය.

හෙට්ටිආරච්චි, ඒ. එස්. 1984, **මහවැලිවංශය**, කොළඹ.

හෙට්ටිආරච්චි, vi. එස්. 1996, **අනුරාධපුර මහා විහාරය** ශ්‍රී ලංකා සංස්කෘතික පර්යේෂණ ආයතනය

හෙට්ටි ආරච්චි ඩබ් එස් 1986 -අනුරාධපුර මහා සීමාව,19-38, **Ancient Ceylon No 6**, Journal of the Archaeological Survey Department of Sri Lanka .eds , pub. by the commissioner of Archaeology Department. Colombo

Bandaranayake, S.1974,**Sinhalese Monastic Architecture : The Viharas of Anuradhapura**, Leiden: E.J.Brill.

M.Meegaskumbura;N.Baenerts;D.J.Gower;R.Pethiyagoda;K. Roelants;a.Mannert;M.Wilkinson;M.M.Bahir;K.



Manamendra,Arachchi;P.K.L.Ng.C.J.Schneider;O.Vanoomen & M.C.Milinkovitch. 2004 - Local endemism Within the Western Ghats-Sri Lanka Biodiversity Hotspot. **Science**.306: 479-481.

Brohier, R.L1934 , **Ancient Irrigation Works in Ceylon**.3 Vol. Colombo, Survey Department.

Cooray, P.G. 1984, **An Introduction to the Geology of Sri Lanka** (Ceylon), Colombo,National Museums of Sri Lanka.

Deraniyagala,P.E.P. 1958 -,**The Pleistocene of Ceylon**.Sri Lanka, Colombo, National Museums.

Deraniyagala, S.U. 1972, The Citadel of Anuadhapura: Excavation in the Gedige area, **Ancient Ceylon 2**; 48-165

1972,Archaeological Survey to Investigate South East Asian Prehistoric Presence in Ceylon Occasion paper No.1 (ed).W.G. Solhaeim & S.U. Deraniyagala **Ancient Ceylon** August 1972.

1992, **The Prehistory of Sri Lanka**; an Ecological Perspective, Colombo, Archaeological Survey Department.

2004,**Pre historic basis for the rise of Civilization in Sri Lanka and Southern India**, Second vesak commemoration Lecture.Chennai:Tamil Nadu.

2007,The Pre history and Proto history of Sri Lanka .**The Art and Archaeology of Sri Lanka**, Central Cultural fund: Ministry of Cultural Affairs.

Hettiaratchy, S.B.,1988, Abayagiri Vihara Project Anuradhapura. **Eleventh Report of the Archeological Excavation at the Abyagira Vihara Complex**.(January 1987-June 1987). Central Cultural Fund, Colombo.

Jayasuriya, M.H.F, 1995, L.Premathilake.,R.Silva **Manjusri Vastuvidyasastra**, Bibliotheca Zeylanica series, TheArchaeological Survey of Sri Lanka and The central Cultural Fund.

Narasimhaiah ; P.S. SriRaman 2004 , A Neolithic culture in south Karnataka , **Indian Pre history and Proto histoty,** Directorate of Archaeology Musium Government of Karnataka.

Ortel,F. O. 1903, **Report of the Restoration of Ancient Monuments at Anuradhapura Ceylon,** Colombo.

Panabokke, C.R.1979, the Natural Soil as a Governing factor the Sri Lanka

Parker,H. 1909 **Ancient Ceylon**, London Lucca & co. Ltd

Paranavitane,S.1936, **The Excavation in the Citadel of Anuradhapura**, Memories of the Archaeological Survey of Ceylon, Colombo.

1970, **Inscription of Ceylon**, Vol I, Colombo, Department of Archaeology.

1983, ***Inscription of Ceylon***, Vol II, Colombo, Department of Archaeology.

Posshel, G.1990, **Scientific dates for South Asian Archaeology**, University of Pennsylvania, Asian Section, University Museum, Occ.Publ. 1

Perera N.H 2010, **Prehistoric Sri Lanka**, BAR Internatiional Series 2142

Premathilake, T.R; and Epitawatta 2003, **Late quaternary Vegetation, Climate and Land - Use History of the Horton plains**, Central Sri Lanka, Abstract, Department of quaternary Research, Stockholm University.

Ragupathy, P.1987, **Early Settlements in Jaffna**: An Archaeological Survey. Mrs.T. Ragupathy. Madras.

Rajan, K. 1990, New light on the Megalithic Cultural of the Kongn Region, Thamilnadu, **Man and Environment** 15(1): 93-102

Rathnayake, H.1984, Jetavanaramaya Project Anuradhapura: **First Archaeological Excavation and Research Report**. Ministry of Cultural affairs. Central Cultural Fund, Colombo.



1994,**Jetavana Stupa and Monastery Complex**: The Cultural Triangle UNISCO CCF: 64-85

Rathnayake, H & R. Perera 1984, Classification of Pottery. In Jetavanaramaya Project- Anuradhapura, **First Archaeological Excavation and Research repor**t (January - June 1982 Ministry of Cultural Affairs, Central Cultural Fund, Colombo.

Seneviratne, S. 1984,The Archaeology of the Megalithic - Black and Red Ware Complex in Sri Lanka, 237-305**Ancient Ceylon No. 5**. Department of archaeology, Colombo

1985, The Baratas: A case of Community Integration in Early Historic Sri Lanka.49-53, In James Ratnum Festscrift, Amarasingha A.R.B. & S.J. Sumanasekara Bandara (Eds) UNESCO Sri Lanka Colombo.

1989, Pre State Chieftain and Servants of the State: A case study of the parumuka. **The Sri Lanka Journal of Humanities**. Vol XV.No.1 & 2, 99-131, Univercity of Peradeniya

1990,The Location Significations' of Early Iron Age Site in Intermediary Transitional Eco - Systems.123-140, **The settlement Archaeology of the Sigiriya Dambulla region**, eds. Senaka Bandaranayake et.al. Colombo: Gunaratne, Offset et. Al.

1994,The Ecology and Archaeology of the Seruwila: Copper Magnetite prospect North- East Sri Lanka114-146 **The Sri Lanka Journal of Humanities**. Vol xxi (1&2), Univercity of peradeniya

1996,Peripheral Regions and Marginal Communities: Towards an Alternative Explanation of Early Iron age Maternal and social Organization in Sri Lanka 265-312**Tradition Dissent and Ideology: Essay in Honor of Romila Thapar**, eds. K. Campakalakshmi and S.Gopal, Oxford University Press. Delhi.

Silva, R.1979, A Proposal for the Layout of the Ancient City of Anuradhapura Ceylon,315-319 **Ancient Ceylon** No. 3, Department of Architicy, Colombo.

1982, Lessons of town planning from Ancient Ceylon**, Ceylon Institute of Architects Journal**, Vol I, Colombo :8.

1988 ,Religious **Architecture in Early and Medieval Sri Lanka, A Study of the Stupa, Bodhigara, Uposathagara and Patimaghara**, Bruk: Krips Repro Meppel.

Smither, J.G. 1984, **Architectural Remains Anuradhapura, Sri Lanka The Dagabas and certain other Ancient Ruined structures Measured, Drawn and Described** Riv.ed, C. Wicramasinghe 1992- archaeology of Sri Lanka Culture.